# පපඤ්චසූදනී මජ්ඣිම පණ්ණාසකය

ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා !

**එවමෙමසුතං** යනු කන්‍දරක සූත්‍රයයි. එහි **චම්පායං** යනු එනම් ඇති නුවරෙහි. එනුවර උයන් පොකුණු ආදියෙහි ඒ ඒ තැන්හි චම්පක වෘක්ෂයෝම ගැවසී තිබුණාහ. ඒනිසා චම්පා යනුවෙන් වහරට පැමිණියේය. **ගග්ගරාය පොක්ඛරණියා තීරෙ** යනු ඒ ගග්ග නගරයට නුදුරෙහි ගග්ගාරානම් මෙහෙසියක විසින් කණවන ලද බැවින් ගග්ගරා යනුවෙන් ලද වහර ඇති පොකුණක් ඇත. ඒ පොකුණු තෙර හාත්පස නිල් ආදී පස්වණින් යුත් මලින් සැදුණු මහා චම්පක වනයක් ඇත. භාග්‍යවතුන් වහන්සේ ඒ මල්සුවඳින් සුවඳවත් වූ චම්පක වනයෙහි වැඩ වසන සේක. ඒ සඳහා ගග්ගරා පොකුණු තෙරයයි කියන ලදී. **මහතා භික්ඛුසංඝෙන සද්ධිං** යනු ගණනනොදක්වන ලද මහ භික්සඟන සමග පෙසෙසා යනු ඔහුගේ නමයි. **හත්ථාරොහ පුත්තො** යනු ඇතරුපුත් **කන්‍දරකොච පරිබ්බාජකො** යනු කන්‍දරකො යනු එනම් ඇති වැසුණු පරිබ්‍රාජක **අභිවාදෙත්වා** යනු සවණක්ගන බුදුරැස් අතරට පිවිස පහන් ලාරසෙහි ගිලෙන්නාක් මෙන් රන්වන් උතුම් රෙදිකඩක් විහිදුවා හිස සිට පොරවන්නාක් මෙන්, පැහැ සුවඳයුත් චම්පක මල් මුදුනෙහි සිට මැනැවින් වසන්නාක් මෙන්, මහමෙර පාමුලට එළඹෙන පුන්සඳ මෙන් භාග්‍යවතුන් වහන්සේගේ සක් ලකුණින් සැදුණු ලාවන් පුල් පියුම්හි සිරියගත් පා වැඳ යන අර්ථයි. **එකමන්තං නිසීදි** යනු හිඳීම් දොස් සයින් විරහිත එක් හිස් තැනක හුන්නේය. **තුණ්හීභූතං තුණ්හීභූතං** යනු යම් යම්

තැනෙක සිට බලයිද ඒ ඒ තැනින් තුෂ්ණීභාවයම විය යන අර්ථයි. එහි වනාහි එක් භික්ෂුවගේ වත් අත් සෙලවීමක් හෝ පා සෙලවීමක් හෝ නැත. සියල්ලෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහිම ගෞරවයෙන් ද, තමාගේ ද හික්මුණු බැවින් ද ඔවුනොවුන් කථානොකරන්නාහු යටත්පිරිසෙයින් උගුරපාදන හඩක් වත් නොකරන්නාහු මැනවින් සිටවූ ඉන්ද්‍රඛීලයන් මෙන් හුදෙකලා තැනක ඇති මහසමුදුර ජලය මෙන් සිරුරින්ද නිශ්චලවූවාහු මනසින් නොවිසුරුණු රත් වලාකුළුමෙන් මහමෙර වන් භාග්‍යවතුන් වහන්සේ පිරිවරා හුන්හ. මෙසේ හුන් පිරිස දක පිරිවැජියාට මහත් සතුටු සොම්නසක් උපන්නේය. උපන් සොම්නස ඇතුළු හද තුළම හිඳුවීමට නොහැක්කේ ප්‍රිය සංවාදයක් ඇතිකළේය. ඒ නිසා **අච්ඡරියං** භොති ආදිය කීය. එහි අන්ධයා පර්වතයට නගින්නාක් මෙන් නිතරම නොවේනුයි **අච්ඡරිය** නම්, මේ නම් ශබ්ද නයයි. මෙ වනාහි අටුවා නයයි. අසුරු ගැසීමට යෝග්‍යනුයි අච්ඡරිය නම් අසුරු පැහැරීමට යුතුය යන අර්ථයි නොවුවිරූ දෙයක් වූයේනුයි **අබ්භුතං** මේ දෙකම විස්මයට සම වචනයි. ඒ වනාහි ගරහනු පිණිසවූ අසුර ගැසීමය, පසසනු පිණිසවූ ඇසුරගැසීමය යනුවෙන් දෙවැදෑරුම වෙයි. එහි මොග්ගල්ලාන, ආශ්චර්යය, මොග්ගල්ලාන අද්භූතය. යම්හෙයකින් ඒ හිස් මිනිසා අතින් ගෙන ගෙනඑනු ලබන්නේය. යනු මෙහි ගරහනු පිණිසවූ අසුරගැසීමය. නන්දමාතාවනි ආශ්චර්යය, නන්දමාතාවනි, අද්භූතය. යම් තැනෙක සිත් ඉපදවීමක්ද පිරිසිදු කෙරෙන්නේය. මෙය පසසනු පිණිසවූ අසුර ගැසීමකි. මෙහිද මෙයම අදහස් කරන ලදී. මෙය වනාහි පසසන්නේ මෙසේකීය. **යාවඤ්චිදං** යනු මෙහි ඉදං යනු නිපාතමාත්‍රයකි. යාව යනු පමණ පිරිසිදීමකි. යම්තාක් මනාසේ ප්‍රතිපාදිතද, යම් පමණකින් ප්‍රතිපාදිත ද, එහි ගුණය නසන්නට නොහැකිය. ඉක්බිති මෙය ආශ්චර්යයක්මය මෙය අද්භූතයක්මයයි කියන ලද්දේ වෙයි. **එතපරමංයෙව** යනු මෙසේ මැනවින් ප්‍රතිපාදිත වූයේ මේ භික්‍ෂුසංඝයාය, ඒ භික්‍ෂු සංඝයාටම ප්‍රධාන කොට ඇත්තේනුයි. එතපරම නම් වේ. යම්සේ මෙය ප්‍රතිපදිතද, එසේ ප්‍රතිපාදිත කොට පිළියෙලකළහ. මෙයින් වැඩියක් නොවේ යන අර්ථයි. දෙවැනි නයෙහි මෙසේ පිළියෙල කරන්නාහුය. එයින් වැඩියක් නොවේයයි යොදාගතයුතුය. එහි **පටිපාදිතො** යනු ආභිසමාචාරික වත ආදිකොට මනාසේ ප්‍රතිවිරුද්ධ නොවන ප්‍රතිපත්තියෙහි යොදනලදී. එසේනම් මේ පිරිවැජියා අතීත අනාගත බුදුවරුන් දක්වන්නේ ඇයි? මොහුට

තුන්කල් දන්නා නුවණ ඇත්තේද? නැත. නයග්‍රාහයෙහිම සිට යම් ආකාරයකින් මේ භික්ෂු සංඝයා දමනය වී විනීතවී උපශාන්තවී වැඩ හුන්නේද, අතීත බුදුවරු ද මෙයම ප්‍රධාන කොට පිළිපැද්දාහුය. අනාගත බුදුවරු ද පිළිපදින්නාහුය, මීට ඉහළින් පැළිපැදීමක් නැතැයි හඟිමින් අනුමානයෙන් මෙසේ කීය. **එවමෙතං** **කන්දරක** යනු හුදු ගැළපුමයි. භාග්‍යවතුන් වහන්සේ ඒ අසා කන්දරක ඔබ භික්ෂු සංඝයා උපශාන්තයයි කියහි මේ භික්ෂුසංඝයා උපශාන්ත වීමට කරුණ ඔබට නොපැහැදිලිය. ඔබ සමතිස් පෙරුම් පුරා කුසල්මුල් මුහුකුරුවා බෝමැඩ සර්වඥතාඥානය ප්‍රතිවේධ නොකෙළෙහිය, මා විසින් වනාහි පාරමිතා පුරා ඥාතර්ථචර්යාව, ලෝකාර්ථචර්යාව හා බුද්ධි චර්යාව කෙළවරට පමුණුවා බෝමැඩ සර්වාඥතාඥානය ප්‍රතිවේධ කරන ලදී. මාහට මොවුන්ගේ උපශාන්තභාවයට හේතුව පැහැදිලියයි දක්වීමට මේ දේශනාව ආරම්භකළ සේක.

**සනතිහි** **කන්දරක** යනු මෙයද හුදු ගැළැපුමකි. භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් පහළවිය. මේ පිරිවැජියා මේ භික්ෂුසංඝයා උපශාන්තයයි කියයි. මේ භික්ෂුසංඝයා හිතාමතාම කුහක බැවින් ඉරියවු තබාගනිමින් සිතින් උපශාන්ත නොවීම උපශාන්ත බවක් පෙන්වන්නේ නොවේ. මෙහි භික්ෂුසංඝයා අතර පිළිවෙත් පුරමින්ම පිළිවෙත් පුරා මුදුන්පත් කරගත් භික්ෂුහු ද ඇත. එහි පිළිවෙත් පුරා මුදුන්පත් කරගත්තාහු තමන් විසින් ප්‍රතිවේධකරගත් ගුණයන්ගෙන්ම උපශාන්ත වූවෝය. පිළිවෙත් පුරමින්ම මතුමතුයෙහි මාර්ග විදර්ශනාවෙන් උපශාන්තවූවෝය. මෙයින් මිදුණාහු ඉතිරි සතිපට්ඨානයන්ගෙන් උපශාන්ත වූවෝය. ඒනිසා මොවුන්ගේ උපශාන්තභාවයට හේතුව දක්වන්නෙමියි මේ මේ කරුණින් මේ භික්ෂු සංඝයා උපශාන්ත වූයේයයි දක්වන්නට **සනතිහි** **කන්දරක** යනාදිය කීසේක.

එහි **අරහනෙතා** **ඛීණාසවා** යනාදියෙහි යමක් කියයුතුනම් එය මූලපරියාය සූත්‍ර වර්ණනා යෙහිම කියන ලදී. **සෙබපටිපදං** යන්නද එහිම විස්තර කරන ලදී. **සනතතසීලා** යනු සතතසීලයයි. නිරන්තරසීලයයි. **සනතවුත්තිනො** යනු එයටම වෙනත් වචනයකි. නිරන්තර ජීවිතය යන

අර්ථයද හෝ වෙයි. ඒ සන්තත සිලයෙහි සිටම ජීවිකාව කෙරෙති. දුස්සීල මරණයකට නොපැමිණෙත් යන අර්ථයි නිපකා යනු නුවණින් යුත් ප්‍රඥාවන්තයෝය. නිපක වුත්තිනො යනු ප්‍රඥවෘත්ති ඇත්තෝය. ප්‍රඥාවෙහි සිට ජීවිකාව කෙරෙත්. යම්සේ ඇතැම් කෙනෙක් සසුනෙහි පැවිදිව ද ජීවිත හේතුවෙන් අගෝචරස්ථාන සයෙහි හැසිරෙත්. වෛශ්‍යාවන්ට ගොදුරු වෙත්. වැන්දඹුවන්ට, රාගයෙන් මත්වූ ගැහැණුන්ට, නපුංසකයන්ට සුරාසැල්වලට භික්ෂුණීන්ට ගොදුරු වෙත්. රජුන් සමග, රජ ඇමතින් සමග, තීර්ථකයන් සමග, තීර්ථක ශ්‍රාවකයන් සමග, නුසුදුසු ගිහි සංසර්ගයෙන් ද එක්ව වසත්. වෙදකම් කරත්, දූතකර්ම කරත්, පණිවිඩ ගෙනයාම කරත්. ගෙඩිපළත්, හොරි වණවලට තෙල් දෙත්, ළයවිරේක දෙත්, උදරවිරේක දෙත්, නශ්‍ය තෙල් සිඳිත්, බොන තෙල් සිඳිත්, උණගස් දෙත්, පතුදෙති. මල්දෙති, නහනසුනුදති. දැහැටි දෙති. මුවදෝනා පැන් දෙති. දැහැටි දෙති. බොරු බස් දොඩති. දරුවන් නළවති. පයින්ගොස් පණිවිඩ දෙති යන විසි එක් වැදෑරුම් නොසිරිතින් ජීවිකාව කරන්නාහු නුනුවණ පැවැත්ම නම් වෙයි. ප්‍රඥාවෙහි නොපිහිටා ජීවිකාව කරත්. එයින් පසු කලුරිය කොට ශ්‍රමණයක්ෂයෙක්ව ඔහුගේ සඟලසිවුරද ගිනිගත්තේ, මහත්සේ ගිනිගත්තේ යයි කියන ලද ක්‍රමයෙන් මහත් දුක් අනුභව කරයි. මෙබන්දන් නොවී ජීවිතහේතු නිසාවත් සිකපද නොඉක්මවමින් සිව් පිරිසිදුසිල්හි පිහිටා හැකි පමණින් බුද්ධ වචනය ඉගෙන රථවිනීත ප්‍රතිපදාව, මහා ගොසිංග ප්‍රතිපදාව, මහා සුඤ්ඤතා ප්‍රතිපදාව, අනඞ්ගණ ප්‍රතිපදාව, ධම්මදායාද ප්‍රතිපදාව, නාලක ප්‍රතිපදාව, තුවටක ප්‍රතිපදාව චන්‍ද්‍රෝපම ප්‍රතිපදාව යැයි මේ ආර්ය ප්‍රතිපදාවන් පුරමින්, සිව්පසයෙන් සතුටුවීම, භාවනාවෙහි ඇල්ම ආර්යවංශ ප්‍රතිපත්තියෙහි කායසාක්ෂීව රැලෙන් වෙන්ව ගිය ඇතකුමෙන්, රැලෙන් පිටමංකළ සිංහයකු මෙන් කඹයෙන් නොබැඳි මහනැවක් මෙන් ගමන් කිරීම් ආදියෙහි එකලාව වසන්නේ විදර්ශනා එළවාගෙන අද අද රහත් බව පැමිණේයයි පැවති උත්සාහ ඇතිව වාසය කරත් යන අර්ථයි. සුපතිට්ඨිත චිත්තා යනු සතර සතිපට්ඨානයෙහි මනාව තැබූ සිත් ඇතිව, සෙසු සති පට්ඨාන කථා යට විස්තර කරන ලද්දේමය. මෙහි වනාහි ලෞකික ලෝකෝත්තර මිශ්‍ර සතිපට්ඨාන කියන ලදී, මෙපමණකින් භික්ෂු සංඝයාගේ උපශාන්තභාවය කියන ලද්දේ වෙයි.

යම්තාක් **සුපඤ්ඤත්තා** යනු යම්තාක් මනාව තබන ලද්දේ මනාව දේශනාකරන ලද්දේ. **මයමපිහිහනෙන** යනු මෙයින් මෙතෙමේ තමා කරන බව දක්වයි. භික්‍ෂු සංඝයාද ඔසවා තබයි. මේ මෙහි අදහසයි. ස්වාමිනි ගිහියන්වූ අපි - පෙ - එළඹගත් සිත් ඇත්තෝව වසමු. භික්‍ෂු සංඝයාට වනාහි මෙය කෘෂිකර්මයද, බීජද, වියගහද නගුලද නගුල්තලයද වෙයි. ඒ නිසා භික්‍ෂු සංඝයා සැම කල්හි සතිපට්ඨානය පිහිට කොට ඇත්තේ වෙයි, අපි නම් කලින් කල අවසරයක් ලැබ එය මෙනෙහි කරමු. අපිත් කරන්නෝ වෙමු. සැම අයුරින් විසිරිගිය කර්මස්ථානයෙන් නොවේ. **මනුස්ස ගහණෙ** යනු මිනිසුන්ගේ අදහස් බහුල බැවින් ගහණ බව, අදහසටද මොවුන්ගේ කෙලෙස් බහුල බැවින් ගහණබව දතයුතුය. අම්හිරි විශ්වාසය කඩකිරීම්හිද මේ ක්‍රමය මැයි. එහි අපිරිසිදු අර්ථයෙන් කසලබවය, කෛරාටික අර්ථයෙන් විශ්වාසය නොතැබිය හැකිබවද දතයුතුය. **සත්තානං හිතාහිතං ජානාති** යනු මෙසේ කෙලෙස් කසටින් කෛරාටික කම් ඇති මනුෂ්‍යයන්ගේ හිත අහිත ප්‍රතිපදාව යම්සේ භාග්‍යවතුන් වහන්සේ දන්නාසේක්ද **යදිදං පසවො** යනු මෙහි සියලු සිව්පා ජාතීහු පසවෝ යයි අදහස් කරන ලදහ. **පහොමි** යනු හැකිවෙමි. **යාවතකෙන අනනරෙන** යනු යම්පමණ ක්ෂණයකින්. **චමපං ගතාගතං කරිසසති** යනු අස්ගාලෙහි සිට චම්පාවෙහි නගරද්වාරය තෙක් යාමද ඊමද කරන්නේය, **සාඨෙය්‍යානි** යනු කපටි බැව්, **කටෙය්‍යානි** යනු කුළු බැව්, **වඞ්කෙය්‍යානි** යනු වංකබැව්, **ජිම්හෙය්‍යානි** යනු විකෘතිබැව්. **පාතුකරිසසති** යනු ප්‍රකාශකරන්නේය. දක්වන්නේය. ඔහු විසින් ඒවා එපමණ වෙනසකින් දක්වන්නට නොහැකිය. එහි යම්කිසි තැනෙක සිටිනු කැමැත්තහුට. මිනිසුන්ට භය සහිත යම්තැනකට පෙරටුව ගොස් වංචා කොට සිටින්නෙමියි අදහසක් ඇති නොවේ. සිටිනු කැමැති තැනෙකම සිටවූ කණුමෙන් පා සතර නිශ්චලව තබා සිටියි. මෙය සඨනම්. යම්කිසි තැනෙක සිරුරමත තිබුණු දෙයක් කපා හෙළන්නට කැමති යමෙකුට මිනිසුන්ට භය සහිත ඒ තැනට පළමුව ගොස් වංචා කොට හෙළන්නෙමියි අදහසක් ඇතිනොවේ. එතැනම කපා හෙළයි. මෙය කූට නම් යම් තැනෙක මගින් ඉවත්ව නැවතී හරස් මගට යාමට කැමැත්තහුට මිනිසුන්ට භයසහිත ඒතැනට පළමුව ගොස් වංචාකොට මෙසේ කරන්නෙමියි අදහසක් ඇති නොවේ. එහිදීම මගින් ඉවත්ව නැවතී හරස් මගට පැමිණේද මෙය වංක නම් වරෙක වමෙන්ද, වරෙක දකුණින්ද, වරක් කෙළින් මගෙහි යන්නට කැමති යමෙකුට මිනිසුන් බිය ඇතිකරන ඒ ස්ථානයට කලින් ගොස් වංචා

කොට මෙසේ කරන්නෙමියි අදහසක් ඇති නොවේ. එහිම වරක් වමෙන්ද වරක් දකුණින්ද වරක් කෙළින් මගින්ද යයි. එසේ බෙට් හෝ මුත්‍රහෝ විසුරවනු කැමැත්තහුට මෙතැන හොඳින් මටය, මිනිසුන්ගෙන් ගැවසුණේය. රමණීයය. මෙතැන එබඳු දෙයක් කරන්නට යුතුනැත. කලින් ගොස් පිළිසන් තැනක කරන්නෙමියි අදහසක් පහළ නොවේ. එහිම කරයි. මෙය ජිම්හ නම් මෙසේ මේ සිව්වැදෑරුම් වූද කාර්යය සඳහා කියන ලදී. **සබ්බානි තානි සාඨෙය්‍යානි කූටෙය්‍යානි වඞ්කෙය්‍යානි ජිම්හෙය්‍යානි පාතු කරිස්සති** යනු මෙසේ කරන්නේ ඒ සඨ ආදී ඒ සටකපටකම් පහළකරන්නම්. මෙසේ හරකුන්ගේ නොගැඹුරු බව දක්වා දැන් මිනිසුන්ගේ ගහණ බව දක්වන්නේ **අම්භාකංපන භන්තෙ** ආදිය කීය. එහි දසා යනු ගෙතුළ උපන්නෝ, හෝ මිල ගෙවා ගෙන ආවෝ හෝ යුදබිමේදී අල්ලාගනු ලැබූවෝ හෝ තමා දාසභාවයට පැමිණියාහු පෙසසා යනු පණිවිඩකරුවෝ. **කම්මකරා** යනු බත්වැටුපින් යැපෙන්නෝ, **අඤ්ඤථාව කායෙන** යනු වෙනත් අයුරෙකින් කයින් හැසිරෙත්. වෙනත් අයුරකින් වචනයෙන්ද, මොවුන්ගේ වෙනත් අයුරෙකින් සිත පිහිටියේ වේයයි දක්වයි. හි සම්මුඛවූ යමෙක් ස්වාමීන් දැක පෙරගමන් කරත්, අතින් බඩුගනිත්, මෙය අතහැර මෙය ගන්නාහු ඉතිරි ආසන පැනවීම තල් වැටින් පවන් සැලීම පා දෙවීම ආදී සියලු කිස කරත්, ඉවත බැලූ කල්හි තෙල් ගෑවත් නොබලත් සියයක් වටිනා දහසක් වටිනා වැඩ පිරිහීයන කල්හි නැවතී බලන්නටවත් නොකැමති වෙත්. මේ කයින් වෙනස් අයුරකින් කයින් හැසිරෙත් නම් යම් කෙනෙක් අබිමුවෙහිදී අපගේ ස්වාමියාය අපගේ ආර්යයාය ආදිය කියා පසසති. අනබිමුවෙහිදී නොකිය යුත්තක් නම් නැත. යමක් කැමතිවෙත්ද එය කියත් මේ අඤ්ඤථා වාචාය සමුදාචරනති නම් වේ.

**චත්තාරො මෙ පෙසස පුග්ගලා** යනු මෙයද හුදු ගැළපීමකි. මේ දාසයා, ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ මෙසේ මිනිසුන් බහුල තැන මෙසේ මිනිස් කසටයෙහි මෙසේ මිනිස් කපටබව ඇතිකල්හි සත්වයන්ට හිත අහිතදේ දනීයයි කීසේක. මුලදීද පුද්ගලයෝ තිදෙන අහිත ප්‍රතිපදාවට එළඹුණාහුය. මත්තෙහි ඉතිරි සතරවැන්නා හිත ප්‍රතිපදාවට පිළිපන්නේ ය. මම මෙසේ සත්වයන්ට හිත අහිත දේ දනිමියි දක්වන්ට මේ දේශනාව ඇරඹුසේක. යට කන්දරකගේ කථාව සමග යොදන්ට වටී. එහෙයින් කියන

ලදී. යාවඤ්චිදං භොතා ගොතමෙන සම්මා භික්ඛු සංඝො පටිපාදිතො යනුවෙන් ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට පෙර පුද්ගලයන් තිදෙන හැර, මත්තෙහි සිව්වැනි පුද්ගලයාට හිත ප්‍රතිපදාවෙහිම පිළියෙලකරමියි දක්වනසේක් මේ දේශනාව ඇරඹූසේක. **සන්තො ඉමං සංවිජ්ජමානා** යන පදයටම තවත් වචනයකි. **සන්තා හොන්ති සමිතා වූපසන්තා** යනු මෙහි නිරුද්ධවූවාහුය. ශාන්තවූවාහුයයි කියන ලදී. සන්තා එතෙ විහාරා අරියස්ස විනයෙ වුච්චන්ති යනු මෙහි නිවීගියාහු, **සන්තො හවෙ සබ්භි පවෙදයන්ති** යනු මෙහි පණ්ඩිතයෝය. මෙහි වනාහි විද්‍යාමාන වන්නාහු, ලබාගත හැක්කාහු යන අර්ථයි. තමාගේ තාපයට සුදුසු **අත්තපරිතාපනානු යොගං** නම් අනුන් තවානුයි **පරන්තපො** නම් අනුන්ගේ පරිතාපනයට සුදුසු **පරපරිතාපනානුයොගං** නම් දිට්ඨෙවධම්මෙ යනු මෙම අත්බවෙහි නිච්ඡාතො යන තන්හි ඡාත යනු තෘෂ්ණාවයි. එය ඔහුට නැත්තේ නුයි **නිච්ඡාතො** සියලු කෙලෙසුන් නිවුබැවින් **නිබ්බුතො** ඇතුළත දවන කෙලෙස් නැතිබැවින් සිසිල්වූයේ **සීතිභූතො** ධ්‍යාන මාර්ගඵල නිර්වාණ සැප විඳීනුයි **සුඛපටිසංවෙදී, බ්‍රහ්ම භූතෙන අත්තනා** යනු ශ්‍රේෂ්ඨවූ තමා විසින්. **චිත්තං ආරාධෙති** යනු සිත සදයි. පුරවයි, ගනී, පහදවයි යන අර්ථයි. **දුක්ඛපටික්කූලං** යනු දුකට විරුද්ධව සතුරුව සිටි, දුක නොපතන යන අර්ථය. **පණ්ඩිතො** යනු මෙහි සිව්කරුණෙකින් පණ්ඩිතයෙක් යයි නොකිය යුතුය. සිහිය එළැවීමෙහි කටයුතු කෙරේනුය පණ්ඩිතයෙක් යයි කියන්නටවටී **මහාපඤ්ඤො** යනු මෙයද මහත් අර්ථයෙක්හි අල්ලාගනී ආදී වශයෙන් මහා ප්‍රඥාලක්ෂණය සමග නොකිය යුතුය. සතිපට්ඨානයෙන් අල්ලාගත් ප්‍රඥාවෙන් යුක්ත බැවින් මහාප්‍රාඥයයි කීමට වටී. **මහතා අත්ථෙන. සංයුත්තො ආගමිස්ස** යනු මහත්වූ අර්ථයෙන් යුතුව ගියේ වන්නේය. සෝවාන් ඵලයට පැමිණෙන්නේය යන අර්ථයි. මාර්ගඵල උපනිශ්‍රය ඇති යම්කෙනෙකුට බුදුන් හමුවෙහිදී පවා ඔවුන්ට අන්තරාය සිදුවන්නේ ඇයි. එසේය සිදුවේය. බුදුන් උදෙසා නොවේ. එසේවුවත් කාර්යපරිහාණිය නිසා හෝ පාපමිත්‍රතාව නිසා හෝ වෙයි. එහි කාර්යපරිහාණිය වීම නම් යමහෙයකින් ධර්මසේනාපතින් වහන්සේ ධනඤ්ජානි බ්‍රාහ්මයාගේ අදහස දූන ධර්මය නෙදෙසු සේක්නම් ඒ බමුණා සෝවාන් වූවෙක් වන්නේය. කාර්ය පරිහාණිය නිසා මෙසේ වෙයි. පාපමිත්‍රතාවෙන් ද වෙයි. ඉදින් අජාත සත්තු දෙව්දත්ගේ වචනය ගෙන පියා මැරීමේ කර්මය නොකෙළේනම් සාමඤ්ඤඵල සූත්‍රය දෙසු දිනයෙහිම සෝවාන් වූවෙක් වන්නේය. ඔහුගේ

වචනය ගෙන පියා මැරීමේ කර්මය කළබැවින් එසේ නොවීය. පාපමිත්‍රතාවෙන් මෙසේ වෙයි. මේ උපාසකයාගේ කාර්ය පරිහාණිය විය. දේශනාව අවසන්වීමට කලින් නැගිට ගියේය.

අපිච භික්ඛවෙ එත්තාවතාපි පෙසෙසා හත්ථාරොහපුතෙතා මහතා අතෙථන සංයුතෙතා යනු කවර මහත් අර්ථයෙන්ද යත්, ආනිසංස දෙකින්. ඒ උපාසකයා සංඝයා කෙරෙහි ප්‍රසාදය ලැබීය. සතිපට්ඨානය පුහුණුවීම පිණිසද ඔහුට අලුත් න්‍යායක් උපන්නේය. එහෙයින් කියන ලදී. මහතා අතෙථන සංයුතෙතා යනුවෙන්, කන්දරක වනාහි සංඝයා කෙරෙහි ප්‍රසාදයම ලැබීය. එතසස භගවා කාලො යනු ධර්මය කියන මොහුට සිව් පුඟුලන් බෙදීමේ කාලයයි. ඔරබභිකාදිසු උරබභා යනු එළුවෝය එළුවන් නසානුයි ඔරබ්භිකො ඌරන් ආදීන්හිද මෙමක්‍රමයයි. ලුදෙදායනු දරුණු. කර්කශ, මචඡඝාතකො යනු මසුන් බඳනා කෙවුළා බන්ධනාගාරිකො යනු හිරගේ පල්ලා කුරූර කමමනතා යනු දරුණු ක්‍රියා ඇත්තාහු, මුද්ධාභිසිතෙතා යනු ක්ෂත්‍රිය අභිෂේකයෙන් මුදුනෙහි අභිෂේක කරන ලද්දහු. පුරත්ථිමෙන නගරසස යනු නගරයෙන් පෙරදිගින්, සන්ථාගාරං යනු යඥශාලාවයි. ඛරාජිනං නිවාසෙත්වා යනු කුර සහිත අඳුන් දිවිසමක් පොරවා, සපපතෙලෙන යනු ගිතෙලින්ද තෙලින්ද. ගිතෙල් හැර ඉතිරිවන කිසියම් තෙලක් වේද එය තෙල්යයි කියනු ලැබේ. කණ්ඩුවමානො යනු නිය සිඳුණු බැවින් කැසියයුතු කල්හි එයින් කසමින්, අනනත රහිතාය යනු බුමුතුරුනුනැති බැවින්, සරූපවචඡාය යනු සමාන පැටවුන් ඇති ඉදින් එළදෙන ස්වේත වර්ණනම් වස්සාද ශ්වෙත වර්ණය ඉදින් දුඹුරු නම්, රතුනම් වස්සා ද එවැනියයි මෙසේ සරූපවචඡානි සොළුවමාන යනු ඒ රජ තෙමේ මෙසේ කියයි. වචඡතරායනු තරුණ වස්සකු බැවින්, පාගාගෙන ගිය බලවත් වස්සෝ වචඡතරිසු යන තන්හිද මේ ක්‍රමයයි. බරිහිසත්ථාය යනුවටකරනු පිණිසද යඥභූමියෙහි එළනුපිණිසද වේ. සෙස්ස යට තන්හි තන්හි විස්තර කරන ලද බැවින් නොගැඹුරු මය.

**පළමුවැනි කන්දරක සූත්‍රයයි.**

# 02

**එවමෙමසුතං** යනු අට්ඨකනාගර සූත්‍රයයි. එහි **බෙලුව ගාමකෙ** යනු විසාලානුවර දකුණු පස නුදුරෙහි බෙලුවනම් ගමක්ඇත. එය ගොදුරුගම් කොට යන අර්ථයි. **දසමො** යනු ඔහු වනාහි ජාතිගෝත්‍ර වශයෙන්ද, උත්තමකුල ගණනින්ද දසවැනි තැනට ගැණේ නුයි එයට දසම යනුවෙන් නමක් හටගත්තේය. **අටඨකනාගරො** යනු අටඨක නුවර වැසි **කුකකුටාරාමො** යනු කුකකුට සිටුවිසින් කරවන ලද අරම **තෙන භගවතා - පෙ - අකඛාතො** යනු මෙහි සංක්ෂේප අර්ථයයි. යම් ඒ භාග්‍යවත් කෙනෙක් සමතිස් පෙරුම්පුරා සව් කෙලෙස් බිඳ අනුත්තර සමබෝධිය අවබෝධ කරගත් සේක්ද ඒ භාග්‍යවතුන් විසින් ඒ ඒ සතුන්ගේ ආසය අනුසය **ජානතා** අත්ලෙහි තැබූ ඇඹුලක් මෙන් සියලු දතයුතු දහම **පසසතා**, තවද පූර්වනිවාස ආදීන්ගෙන් ජානතා, දිවැසින් **පසසතා** ත්‍රිවිද්‍යාවෙන් හෝ ෂට් අභිඥා වන්ගෙන් **ජානතා** සියලු තන්හි අප්‍රතිහත සමන්ත චක්ෂුසයෙන් **පසසතා** සියලු දහම් දැක්මෙ සමත් නුවණින්. **ජානතා** සියලු සතුන්ගේ චක්ෂුපථය ඉක්මවාගිය තිරොකුඩ්ඩ ආදිකොට ගියාවූද රූප අතිපරිශුද්ධවූ මසැසින් ද **පසසතා** තමාට හිත සදන සමාධියට පාතලය වූ දේශනා ප්‍රඥාවෙන් **පසසතා** සතුරන් නැසුහෙයින් ප්‍රත්‍යයාදීන්ට සුදුසු බැවින් **අරහතා** මැනැවින් සියලු සත්‍යයන් අවබෝධ කළහෙයින්. **සමමා සමබුදෙධන**, අන්තරායික ධර්මයන් **ජානතා** දන්නා බැවින් නෛර්යානික ධර්ම දක්නා බැවින් කෙලෙස් සතුරන් නැසූ බැවින් අරහතා අර්හත්වූ, සියලු දහම් මැනවින් අවබෝධ කරගත් බැවින්, **සමමා සමබුදෙධන** යනු මෙසේ චතුර්වෛශාරද්‍ය වශයෙන් කරුණු සතරෙහි ස්තුති කරනු ලැබූ බැවින් **අත්‍ථිනුබො එකො ධමෙමා අකඛාතො** යනු **අභිසංඛතං** යනු කරන ලද උපදවන ලද, **අභිසංචෙතයිතං** යනු සිතන ලද මැනවින් කල්පනා කරන ලද. **සොතතථයිතො** යනු හේ ඒ සමථ විදර්ශනා ධර්මයෙහි සිටියේ. **ධමමරාගෙන ධමම නන්දියා** යනු පද දෙකින් සමථ විදර්ශනාවන්හි ඡන්දරාගය කියන ලදී. සමථ විදර්ශනාවන්හි සියල්ලෙන් සියල්ල ඡන්දරාගය පතුරුවන්නට හැක්කේ රහත්වූයේ නම් වේ. නොහැක්කේ අනාගාමී වෙයි. හෙතෙමේ සමථවිදර්ශනාවන්හි ඡන්දරාගය ප්‍රහීණ නොකළ බැවින් චතුර්ධ්‍යාන චේතනාවෙන් සුද්ධාවාසයෙහි උපදී. මෙය

ආචාර්යවරුන්ගේ සමාන කථාවෙකි. විතණ්ඩවාදියා මෙසේ කීය. තෙනෙව ධම්මරාගෙන යනු වචනයෙන් සිදුවන අකුසලයෙන් සුද්ධාවාසයෙහි උපදියි යනුවෙන් මෙහෙතෙමේ සූත්‍රයක් ගෙනෙවයි කිවයුතුය. ඒකාන්තයෙන් අනෙකක් නොදක්නේ මෙයම ගෙනෙන්නේ ය. ඒනිසා කිවයුතුයි. මේ සූත්‍රය ගෙන ආයුතු අර්ථ ඇත්තේද, ගෙන ආ අර්ථ ඇත්තේද. ඒකාන්තයෙන් ගෙන එන ලද අර්ථ ඇත්තේ යයි කියයි. එවිට මෙසේ කිවයුතුයි. මෙසේ ඇතිකල්හි අනාගාමිඵල කැමැත්තහු විසින් සමථවිදර්ශනාවන්හි ඡන්දරාගය කළයුතු වන්නේ ය. ඡන්දරාගය උපදවාගත්විට අනාගාමිඵලය ප්‍රතිවේධ කරන ලද්දේ වන්නේ ය. සූත්‍රය මා විසින් ලබන ලද්දේ යයි යම්කිසිවක් නොදක්වන්න. ප්‍රශ්නය කථාකරන්නහු විසින් ආචාර්යයන් ළඟ උගෙන අර්ථ රසය අවබෝධ කොට කියන්නට වටී. අකුසලයෙන් ස්වර්ගයෙහි වත් කුසලයෙන් අපායෙහි වත් ඉපදීමක් නම් නැත. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ කියන ලදී. මහණෙනි. ලෝභයෙන් උපන් කර්මයෙන්, දෝෂයෙන් උපන් කර්මයෙන්, මෝහයෙන් උපන් කර්මයෙන් දෙවියෝ නොපැනෙත්. මිනිස්සු පැනෙත් කිම වෙනත් කිසියම් සුගතීහු වෙත්ද? ඉක්බිති මහණෙනි, ලෝභයෙන් උපන් කර්මයෙන් දෝෂයෙන් උපන් කර්මයෙන් මෝහයෙන් උපන් කර්මයෙන් නිරය පැනෙයි තිරිසන් යෝනිය පැනෙයි. ප්‍රේත විෂය පැනෙයි. කිම කිසියම් අන් දුගතියක් වේද. මෙසේ පැනවිය යුතුය. ඉදින් දන්නේ නම් දනීවා. නොදන්නේනම්. යව. උදෑසනම විහාරයට පිවිස කැඳ බොවයි යැවිය යුතුය. යම්සේ මේ සූත්‍රයෙහි මෙසේ මහාමාලුඞ්ක්‍යයා වාදයෙහි ද මහා සතිපට්ඨානයෙහිද කායගතාසති සූත්‍රයෙහිද සමථ විපස්සනාව කියන ලදී. එහි මේ සූත්‍රයෙහි සමථ වශයෙන් යන්නහුගේද විදර්ශනා වශයෙන් යන්නහුගේද සමථ ධූරයම ධූරය වේ. මහා මාලුඞ්ක්‍ය වාදයෙහි විදර්ශනාවම ධූරයයි. මහාසතිපට්ඨානය විදර්ශනා වෙන් උසස්යයි කියන ලදී. කායගතාසති සූත්‍රය සමථයෙන් උසස්ය. අයං බො ගහපති - පෙ - එකධම්මො අක්ඛාතො යනු එක් ධර්මයක් අසනුලැබුවහු විසින් මෙයද ඒකධර්මයයි මෙසේ ඇසීම් වශයෙන් කියන ලද බැවින් එකොළොස්දහම් එකධම්ම නම් විය. මහාසකුලුදායි සූත්‍රයෙහි පරිච්ඡේද දහනවයක ප්‍රතිපදාවශයෙන් ඒකධර්ම නම් විය. මෙහි එකොළොසක් විමසීම් වශයෙන් ඒකධර්ම යි පැමිණියේය. අමෘත ඉපදවීම් අරුතින් හෝ සියල්ලම ඒකධර්ම යයි කියන්ට වටී. නිධිමුඛං ගවෙසන්තො යනු නිධානය සොයන්නේ. සකිදෙවා යනු එක්

ප්‍රයෝගයකින්ම, එක් ප්‍රයෝගයකින් එකොළොස් නිධන් පිළිබඳ අධිගමය වන්නේ කෙසේද. මෙහි ඇතැම් කෙනෙක් වනයෙහි නිධන් සොයමින් හැසිරෙති. ඔවුන්ගේ එක්තරා අර්ථයෙහි හැසිරෙන පුද්ගලයෙක් ඒ දූක මිතුරෙනි ඔබ කුමක් නිසා හැසිරෙහු දැයි අසයි. හේ ජීවිකාවෘත්තිය සොයමියි කීය. අනිකා එසේනම් මිතුර එන්න. එක්ගලක් පෙරළවයිකීය. ඔහු එය පෙරළා උඩින් උසින් තැබුවාවූද ලෙන්වල එකිනෙක ගැටී තිබුණාවූද කළගෙඩි එකොළොසක් දකී. මෙසේ එක් ප්‍රයෝගයකින් එකොළොසක අධිගමය වන්නේය. **ආචරියධනං පරියෙසිස්සන්ති** යනු අන්‍ය තීර්ථකයෝ යමකු සමීපයෙහි ශිල්ප උගනිත්ද, ඔහුට ශිල්ප උගෙනීමට පෙරාතුවද, පසුවද අතරතුරෙහිද ගෙන් පිටතට ගෙනවුත් ධන දෙති, යමකුගේ ගෙහි නැත්නම් ඔවුහු ඥාතීන් සොයායති. එසේත් නොලබන්නාහු පිඬුසිගා හැසිර හෝ දෙත්මය. ඒ සඳහා මෙය කියන ලදී. මම කුමක් කරම්ද? බැහැරියෝ නම් අනෛර්යානිකවූ සසුනෙහිද ශිල්ප මාත්‍රය පමණක් දෙන්නහුට ධනය සොයත්. මම වනාහි නෛර්යානික ශාසනයෙහි එකොළොස් වැදූරුම් අමා උපදවන ප්‍රතිපදාව දෙසන ආචාර්ය වරයාට පූජාවක් කිම නොකරන්නෙම්දැයි කියයි. **පචෙචක දුසස යුගෙන අචඡාදෙසි** යනු එක්එක් භික්ෂුවට එක් එක් වස්ත්‍ර යුගලයක් බැගින් දුන්නේය යන අර්ථයි. ව්‍යවහාර වචනය මෙහි මෙසේ වෙයි. ඒ නිසා හැඳගන්නැයි කියන ලදී. **පඤචසතං විහාරං** යනු පන්සියයක් වටනා පන්සලක් කරවිය යන අර්ථයි සෙස්ස හැමතැන නොගැඹුරුමය.

දෙවැනි අටඨකනාගර සූත්‍රයයි.

## 2.1.3

**එවමෙමසුතං** යනු සෙබ සූත්‍රයයි. එහි නවං සනථාගාරං යනු අලුතින් කරවන ලද සන්ථාගාරං එක් මහාශාලාවකි යන අර්තයි. යුද්ධකාලආදියෙහි රජවරු මරණයට ළංවූ කල්හි එහි සිට මෙපමණ කෙනෙක් දෙපසින් යවු. මෙපමණ කෙනෙක් ඇතුන් පිටනගිවු. මෙපමණ කෙනෙක් අශ්වයන් පිටනගිවු. මෙපමණ කෙනෙක් රියවල යවුයයි මෙසේ වින්‍යාස කරත්. වැට බඳිත් ඒ නිසාත් ස්ථානය සන්ථාගාරයයි කියනු ලැබේ.

යොදවන ස්ථානයෙහි සිට පැමිණ යම්තාක් ගෙවල අමුගොම පිරිබඩ ගැනීම් ආදිය කරත්ද ඒතාක් දෙතුන් දිනක් ඒ රජවරු එහි තනිව වෙසෙත්නුයි සන්ථාගාර නම් ඒ රජුන්ගේ අර්ථානුශාසනා සහිත ගෙයනුයි සන්ථාගාර නම් ඔවුහු වනාහි ගණරජවරුය. ඒනිසා හටගත් කාර්යය එක් අයකුට යැයි නොබෙදේ, සියල්ලන්ගේ කැමැත්ත ලැබීම අවශ්‍යය. ඒනිසා සියල්ලෝ එහි රැස්ව උපදෙස් ගනිත්. අර්ථානුශාසනය සහිතවූ අගාරයනුයි සන්ථාගාරයයිද ඒනිසා කියන ලදී. යම්හෙයකින් ඔවුහු එහි රැස්ව මෙකල සීසාන්ට සුදුසුය මෙකල වපුරන්ට සුදුසුය. මේ ආදි ක්‍රමයෙන් ගෘහවාසයෙහි කටයුතු සම්මන්ත්‍රණය කෙරෙත්. ඒනිසා ගෘහවාසයෙහි අඩුපාඩුකම් මෙහිදී දිගහරිත්නුයි සන්ථාගාර නම් **අචිරකාරිතං** යනු ලී වැඩ සිතුවම් ගල්වැඩ ආදිවශයෙන් සුසැදි දෙව් විමනක් මෙන් අලුතින් නිමවන ලදී, **සමණෙනවා** යනු මෙහි යම්හෙයකින් ගෘහවාස්තු පිළිගන්නා කාලයෙහිම දෙවියෝ තමන්ගේ වසනතැන් ගනිති. ඒ නිසා දෙවියන් යයි නොකියා **සමණෙනවා බ්‍රාහමණෙනවා කෙනචිවා මනුසසභූතෙන** යයි කියන ලදී. **යෙන භගවා තෙනුපසංකමිංසු** යනු සන්ථාගාරය නිමාවීයයි අසා යමු එය බලන්නෙමුයි ගොස් දොරකොටුවෙහි පටන් සියල්ල බලා මේ සන්ථාගාරය දෙව් විමනක් මෙන් අතිශයින් මනරම්ය. සිරිමත්ය. කවරකු විසින් පළමුව පරිභෝජනය කරනලද්දේ අපහට බොහෝකලක් හිතසුව පිණිස වන්නේදැයි සිතා අපගේ ඥාති ශ්‍රේෂ්ඨයාට පළමුකොට දෙනු ලබන කල්හිද. ශාස්තෘතන් වහන්සේට සුදුසු ලෙස දක්ෂිණාවක් වශයෙන් දෙනුබලන කල්හිද ශාස්තෘන්වහන්සේටම සුදුසුයයි ඒ නිසා පළමුව ශාස්තෘන් වහන්සේ වළඳවන්නෙමු. භික්ෂුසංඝයාගේ පැමිණීම සිදු කරන්නෙමු. භික්ෂුසංඝයා පැමිණිකල්හි ත්‍රිපිටක බුද්ධ වචනයම පැමිණියේම වන්නේය. ශාස්තෘන් වහන්සේ ලවා තුන්යම්රැය අපට ධර්ම කථා කියවන්නෙමු. මෙසේ තුනුරුවන් විසින් පරිභෝග කළ දෙය පසුව අපි පරිභෝග කරන්නෙමු. මෙසේ අපට දිගුලකලක් හිතසුව පිණිස වන්නේයයි සනිටුහන් කොට එළම්යාහුය. **යෙන සන්ථාගාරං තෙනුපසංකමිංසු** යනු එදවස වනාහි සන්ථාගාරය ඕනෑම රාජකුලයන්ට පෙන්වනු පිණිස දෙව්විමනක් මෙන් සරසන ලද්දේවෙයි. මනාසේ පිළිදගුම් කරන ලද්දේ බුදුන්ට සුදුසුසේ කොට ආසන නොපවන ලද්දේය. බුදුවරුනම් අරණ්‍යය පිළිබඳ අදහස් ඇත්තාහුය. අරණ්‍යයෙහි විසීමට කැමැත්ත ඇත්තෝය. ඇතුළුගම වසන්නෝ හෝ නොවසන්නෝ හෝ, ඒනිසා භාග්‍යවතුන් වහන්සේගේ සිත දැනගෙනම

අසුන් පනවන්නෙමුයි සිතා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට එළැඹියාහුය. දූන් කැමැත්ත ලැබ අසුන් පනවනු කැමැත්තාහු සන්ථාගාරය ඇති තැනට එළැඹියාහුය. **සබ්බසන්ථරිං සන්ථාගාරං සන්ථරිත්වා** යනු යම්සේ සියල්ල අතුරුවා නම් වේද එසේ එය අතුරුවා සියල්ලට පළමුව ගොම සියලු මංගල අවස්ථාවල සුදුසුය. හුණුපිරියම් කළද, බිම අමුගොමින් ගාවා පිරිසිදු බව දූන යම්සේ පාතැබුතැන පාසලකුණ පෙනේද එසේ සිව්දගඳින් අලේපකොට මත්තෙහි නන්වන් පැලලි එලා ඒවා මත්තෙහි කෙඳි සහිත කොමුපිළි ආදී කොට ඇති ඇත්වැසුම් අස්වැසුම් දිවිවැසුම් රන් වැසුම් හිරුවැසුම් විසිතුරුවැසුම් ආදී නන් ඇතිරිලිවලින් ඇතිරිය යුතු සියලු අවකාශයන් අතුරාලූහ. එසේ හෙයින් කියන ලදී **සබ්බසන්ථරිං සන්ථාගාරං සන්ථරිත්වා** යනුවෙන්ද **ආසනානි පඤ්ඤපෙත්වා** යනුවෙන්ද මධ්‍යස්ථානයෙහි මඟුල්ටැඹ නිසා මහාර්ඝවූ බුද්ධාසනය පනවා එහි යම්යම් මෘදුවූද මනොරම්‍යවූද තවත් ඇතිරිලිවේද ඒ ඒ ඇතිරිලි නැවත අතුරා භාග්‍යවතුන් වහන්සේට ලෝහිත වර්ණවූ මනෝඥ පෙනුම ඇති කොට්ටයක් තබා මත්තෙහි රනින් හා රිදියෙන් තරු මැසූ විසිතුරු වියනක් බැඳ ගඳදුම් මල්දම් පත්දම් ආදියෙන් අලංකාර කොට හාත්පස දොළොස් රියන් තැන මල්වැල් කරවා තිස්රියන් පමණ තැන් පටතිරයෙන් වටකරවා පසුපස බිත්තිය නිසා භික්ෂුසංඝයාට පලක් බැඳ හිඳිනා පුටු ඇඳිපුටු ඇඳපුටු පනවා මතුයෙහි සුදු ඇතිරිලි අතුරා පෙරදිග බිත්තිය නිසා තමාට කෙඳිසහිත බුමුතුරුණු අතුරා හංස පිහාටු ආදියෙන් පුරවාලූ කොට්ට තැබ්බවූහ. මෙසේ වෙහෙස නොබලා මුළු රැය දහම් අසන්නෙමුයි. අසුන් පනවා යයි මේ සඳහා කියන ලදී. **උදකමණිකං** යනු මහ බඳක් ඇති දියසැළිය, **පතිට්ඨපෙත්වා** යනු මෙසේ භාග්‍යවතුන් වහන්සේද භික්ෂුසංඝයාද රුචිපරිදි අත් හෝ දොවන්නාහුය, පා හෝ මුව හෝ සෝදන්නාහු යයි ඒ ඒ තැන මිණිවන් ජලය පුරවා සුවඳ පිණිස නොයෙක් මල් ද, ජලය සුවඳවත් කරන සුණුද බහා කෙසෙල් පත්‍රයෙන් වසා තැබ්බවූහ, පතිට්ඨපෙත්වා යනු මේ සඳහා කියන ලදී. තෙලපප දීපං **ආරොපෙත්වා** යනු රිදී රන් මුවා දඬු ඇති පහන් තුළ යවනයන් විසින් කොටන ලද රූප ආදියෙහි අත තැබූ රන්රිදී මුවා කබල් ආදියෙහි තෙල්පහන් දල්වා යන අර්ථයි. යෙන **භගවා තෙනුපසංකම්ංසු** යනු මෙහි වනාහි ඒ ශාක්‍ය රජවරු සන්ථාගාරය පමණක් නොව යොදුනක් පමණ වට ඇති කිඹුල්වත්හි නගර වීථීන්ද හමදවා ද්වජ ඔසවා ගෙදොරවල පුන්කලස්ද කෙසෙල් ගස්ද

තබ්බවා මුළු නුවර පහන් දූලින් විසිරුණු තරු ඇතිසේ කොට කිරිබොන දරුවන්ට කිරිපොවවූ, ළදරු කුමරුන් වහවහා අනුභවකරවා නිදිකරවවූ. උස්හඬින් කථා නොකරවූ අද එක් රැයක් ශාස්තෲන් වහන්සේ ඇතුළුගම වසන සේක. බුදුවරුනම් අල්පශබ්දයට කැමැත්තෝ වෙතියි. බෙර හසුරුවා තමන් දඬුවැටපහන් ගෙන භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි තැනට එළඹියාහුය. **අථඛො භගවා නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛු සංඝෙන යෙන සන්ථාගාරං තෙනුපසඞ්කමි** යනු ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ කල් දන්නා සේකැයි මෙසේ කල් දූන්වූවිට භාග්‍යවතුන්වහන්සේ ලාරසින් සතරත් කෝවිළාර පුෂ්පවර්ණයෙන් යුත් රත් දෙපොට සිවුර කතුරින් නෙළුම්මලක් කපන්නාක්මෙන් සකසා තෙමඬුලු වසමින් හැඳපෙරව රත් දම්වැලින් නෙළුම් මල් කලඹක් වටකරන්නාක් මෙන් විදුලිය සිරිගත් කාබහන බැඳ රත් ම්බිලියකින් ඇත්කුඹ වසන්නාක් මෙන් රියන් සියයක් උස රත් ඇගෑයකට පබළු දූලක් එලන්නාක් මෙන් රන්සෑයෙන් රත් කම්බිලි වැස්ම ඉවත්කරන්නාක් මෙන්, ගමනෙහි යෙදුණු පුන්සඳ රත් වලාකුළින් වසන්නාක් මෙන් රන්පව් මත උණුවූ ලාරස ඉසින්නාක් මෙන් චිත්‍රකුට පර්වත මුදුන විදුලියෙන් වටකරන්නාක් මෙන්ද, සක්වළ, මහමෙර යුගන්ධර සහිත මහපොළොව සොලවා ගත් නුගපලවන් උතුම් රත් පාංශුකුල චීවරය පොරවා ගඳකිලි දොරින් නික්මුණු සේක. රත් ගුහාවෙන් සිංහයකු මෙන් ද උදයපර්වත මුදුනින් පූර්ණචන්ද්‍රයා මෙන් ද නික්ම ගඳකිලි අභිමුඛයෙහි වැඩසිටිසේක. ඉක්බිති උන්වහන්සේගේ සිරුරින් මේකුළු මුවින් විදුලිය කලප්මෙන් රැස් නික්ම රන්රස දහරාවෙන් නෑවී රන්පැහැගත් පත්‍රමල් පල වෙළෙප් මෙන් ආරාමයෙහි වෘක්ෂයන් සැදීය. එකෙණෙහිම තමතමාගේ පාසිවුරු ගෙන මහාභික්ෂුසංඝයා භාග්‍යවතුන් වහන්සේ පිරිවැරූහ. පිරිවරා සිටි භික්ෂුහු එබඳු වූහ. අල්පේච්ඡ වූහ. සන්තුෂ්ට වූහ. වෙන්වූහ. නොඇලුණෝ වූහ. ඇරඹූවීර්ය ඇත්තෝ වූහ. සිව්වදන් ඉවසන්නෝ වූහ. චෝදනා කරන්නෝවූහ. පාපයට ගරහන්නෝ වූහ. ශීලසම්පන්න වූහ. සමාධි සම්පන්න වූහ. ප්‍රඥාවිමුක්ති විමුක්තිඥාන දර්ශන සම්පන්නවූහ. ඔවුන් විසින් පිරිවරන ලද භාග්‍යවතුන් වහන්සේ රත් කම්බිලියෙන් වටකරන ලද්දහු මෙන් රත් බඳ ඇතිව රත් පියුම් ලැහැබට වන් රත් නැවක් මෙන් ප්‍රවාල වේදිකාවෙන් වට කරන ලද්දහු මෙන් රත් පහය බැබළවූ සේක. සාරිපුත්ත මොග්ගල්ලාන ආදී මහතෙරහුද මේවන් පාංශුකුල චීවර පොරවා මැණික් සන්නාහයන් හැඳගත් මහ ඇතුන්මෙන්

මනතෙරවරු පිරිවැරූහ. වැමැරූ රාග ඇත්තෝ, බිඳලූ කෙලෙස් ඇත්තෝ ලිහූ අවුල් ඇත්තෝ, සිඳලූ බැඳීම් ඇත්තෝ කුලයෙහි හෝ ගණයෙහි නො ඇලුණෝය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමාද වීතරාගීව වීතරාගීන් විසින්, වීතදොසීව වීතදෝසීන් විසින් වීත මෝහීව වීත මෝහීන් විසින් තෘෂ්ණානැතිව තෘෂ්ණා නැත්තවුන් විසින්, තමා බුදුවැ බහුශ්‍රැත බුදුවරුන් විසින් පිරිවරන ලදසේක. පෙත්තෙන් වැසුණු කෙසුරුමෙන්, කෙසුරින් වැසුණු කෙමිය මෙන්. අටදහසක් ඇතුන් විසින් පිරිවරන ලද ඡද්දන්ත හස්තිරාජයා මෙන්, අනූදහසක් හංසයන් විසින් පිරිවරන ලද ධෘතරාෂ්ට්‍ර හංසරාජයා මෙන්, සේනාංගයන්ගෙන් පිරිවරන ලද, චක්‍රවර්ති රජු මෙන්, දේවසමූහයා විසින් පිරිවරන ලද ශක්‍රදේව රාජයා මෙන්, බ්‍රහ්මසමූහයා විසින් පිරිවරන ලද හාරිත මහා බ්‍රහ්මයා මෙන්, තරුගණයා විසින් පිරිවරන ලද පූර්ණචන්ද්‍රයා මෙන් අසමවූ බුද්ධ වේශයෙන් අපරිමාණවූ බුද්ධ විලාශයෙන් කපිලවස්තුවට යන මාර්ගයට පිළිපන් සේක. ඉක්බිති උන්හන්සේගේ සිරුරෙහි ඉදිරිපසින් රන්වන් රශ්මියක් නැගී රියන් අසූවක් තැන ගති. සිරුර පසුපසින්, දකුණත පැත්තෙන් වම් අත පැත්තෙන් රන්වන් රස් නැගී රියන් අසූවක් තැන් ගති. ඉහළින් කේශාන්තයේ සිට සියලුකෙස් රැලිවලින් මොනර ගෙලවන් රශ්මිය නැගී ගුවන්තලයෙහි රියන් අසූවක් තැන ගති. යට පාතලයන්ගෙන් පබළුවන් රස් නැගී ඝන පොළොවෙහි රියන් අසූවක් තැන ගති. මෙසේ හාත්පස රියන් අසූවක් පමණ තැන සවණක් බුදුරැස් බබලමින් රන්දඬුවැටපහනින් නික්ම අහසට පැනනැගි දූලක් මෙන් සිව්මහදිව් මහමෙයින් නික්මුණු විදුලිය මෙන් දිවගියේය. සියලු දිසාවෝ රන් සපුමලින් විසුරුවනු ලබන්නාක් මෙන් රන්කළයෙන් නික්මුණු රන් දිය දහරින් ඉසින්නාක් මෙන් දිගහරනා ලද රෙද්දෙන් වට කරන ලද්දක් මෙන් වේරම්බ වාතයෙන් ඔසවන ලද කිණිහිරි මල්රොනින් ගැවසුණාක් මෙන් පෙනුණාහ. භාග්‍යවතුන් වහන්සේගේ අසූඅනුව්‍යංජනව්‍යාමප්‍රභා දෙතිස් උතුම් ලකුණින් දිලිසෙන සිරුර නැගුණු තරුවක් මෙන් විකසිත වුණු පියුම් වනයක් මෙන් පිපීවැනීගිය යොදුන් සියයක්වූ පරසතුමලක් මෙන් පිළිවෙළින් තබනලද, දෙතිස් චන්ද්‍රයන්ගේ දෙතිස් සූර්යයන්ගේ දෙතිස් චක්‍රවර්තීන්ගේ දෙතිස් දේවරාජයන්ගේ දෙතිස් මහාබ්‍රහ්මයන්ගේ ශ්‍රීය අබිබවමින් මෙන් බැබලුණාහුය. යම්සේ එය දස පාරමීන්ගෙන් දස උප පාරමීන්ගෙන් දසපරමත්ථ පාරමීන්ගෙන් පූරන ලද සමතිස් පාරමිතාවන්ගෙන් අලංකෘත කල්ප සිය දහසකට වැඩි සතර අසංඛෙය්‍යක්

හි දූන් දන්. ඊකිසිල්, කළ කලණදම් මේ අත් බැව්හි එක්තැන්ව විපාක දෙන්ට තැනක් නොලැබ බාධා වුවාක් මෙන් විය. නැව් දහසක බඩු එක් නැවකට පටවන කලක් මෙන්. ගැල්දහසක බඩු එක් ගැලකට පටවන කලක් මෙන්. ගංගා විසිපහක දිය කඳ බිඳ මුවදොරදී එකට රැස්වූ කලක් මෙන්ද විය. මේ බුදුසිරියෙන් බබලන්නාවූ භාග්‍යවතුන් වහන්සේගේ පෙරටුව නොයෙක් දහස්ගණන් දඬුවැට පනත් එසවූහ පසුපසින්ද එසේය. වම්පසද දකුණුපසද. දූසමන් සපු මලිගිය රතුපුල් නිලුපුල් මුනමල් සිඳුවර මලින්ද. නිල්කහආදි වර්ණයන්ගෙන්ද යුතු සුවඳ සුන්නෙන් ද චාතුර්ද්වීපික මේසයෙන් විසුරුවන ලද වැසිදහරා මෙන් විසිරී ගියාහුය. පසඟතුරු හඬින්ද බුදුන් දහම් සඟුන් ගුණ යුත් තුති ගොසින්ද සියලුදිග් පිරවූහ. දේව මනුෂ්‍ය නාග සුපර්ණ ගන්ධර්ව යක්ෂආදීන්ගේ ඇස් අමාපැනක් මෙන් ලැබීය. මෙතැන් සිට පද සියයකින් පෙද දහසකින් පදසිය දහසකින් ගමන් වැණුම කීම වටනේය. මෙහි ඒ ආරම්භය පමණි.

> එවං සබබඞග සමපනෙනා - කමපයනෙතා වසුනධරං
> අහෙඨ යනෙතා පාණානි - යාති ලොක විපායකො.

මෙසේ සියලු අංගයෙන් යුතු - ලෝකනායකයාණෝ
දෙරණ කම්පාකරමින් - පණැතියන් නොවෙහෙසා වැඩම කරති.

> දකඛිණං පඨමං පාදං - උඩ්ධරනෙතා නරාසභො
> ගචඡනෙතා සිරි සමපනෙනා - සොභතෙ දිපදුතත මො

දකුණු පා පළමුව ඔසවා - සිරිසම්පතින් වඩනා
උන්වහන්සේ බබලති.

> ගචඡතො බුදධ සෙටඨසස - හෙටඨාපාදතලං මුදු
> සමං සමඵුසතෙ භුමිං - රජසානුපලිමපතී

ගමනෙහි යෙදෙන බුදුරදුන්ගේ මුදුසුමුදු සිරිපතුල
සමසේ පොළොව සිපගනී එහෙත් දූවිලි නොගෑවේ.

නිනනං ඨානං උනනමති - ගච්ජනෙත ලොකනායකෙ
උනනතංච සමං හොති - පඨවීච ආචෙතනා

උන්වහන්සේ වඩනාකල - වළගොඩැලි සමවෙයි
සිත් පිත් නැතිවුවද - මහපොළොව සමතලවෙයි

පාසාණා සකඛරා චෙව - කඨලා ඛාණුකණටකා
සබෙබ මගගා විවජෙජනති - ගච්ජනෙත ලොකනායකෙ

ලෝක නාථයන් වහන්සේ වඩනාකල
ගල්කැට කටු කොහොල් සියල්ලම මගින් ඉවත්වෙයි.

නාතිදුරෙ උද්ධරති - නාච්චාසනෙන ච නික්ඛිපං
අඝට්ටයනෙතා නීයාති - උභොජාණු ච ගොප්ඵකෙ

වැඩි ඈතිනුත් වැඩිළගිනුත්
පියවර නොතබති. දණහිස් ඇස්වට නොගැටේ.

නාති සීඝං පක්කමති - සමපනන චරණො මුනී
නචාති සනිකං යාති - ගච්ජමානො සමාහිතො

විජ්ජාචරණයෙන් යුත් උන්වහන්සේ,
සමාහිතසිත් ඇත්තහු ඉතාවේගයෙන්ද ඉතාසෙමින්ද නොවඩිති

උද්ධං අධොච තිරියං - දිසංච විදිසං තථා
න පෙක්ඛමානො සො යාති - යුගමත්තංහි පෙක්ඛති

උඩද යටද සරසද
අවට දෙස්ද නොබලති  දුර බලති වියගසක් පමණ.

නාගවික්කනත චාරො සො - ගමනෙ සොභතෙ ජිනො
චාරුං ගච්ජති ලොකගගො - හාසයනෙතා සදෙව කෙ

ඇත්ගමනින් වඩනා
ගමන නොබනේය. දෙවියන් සහිත ලෝකය
සතුටුකරමින් වඩනා ගමන සොඳුරුය.

උසභරාජාව සොභනෙතා - චතුචාරීව කෙසරී
තොසයනෙතා බහු සතෙන - පුරසෙට්ඨමුපාගමීති

වෘෂභරාජයකු මෙන්ද සිංහරාජයකු මෙන්ද
බොහෝ සතුන් තුටුකරමින් පුරවරයට වැඩිසේක.

මේනම් වර්ණනා කාලයයි. මෙබඳුකාලවල බුද්ධ ශරීර වර්ණනා හෝ ගුණවර්ණනා හෝ ධර්ම කථිකයාගේ උත්සාහයට ප්‍රමාණවේ. වෙන් වෙන්වූ පදයෙන් හෝ ගාථා බන්ධනයෙන් හෝ යම් පමණ හැකිවේද, එපමණක් කිවයුතුයි. නොකිවයුත්තක් නොකිය යුතුය. බුදුවරුනම් ගුණ ඇත්තෝය. බුදුවරුම නිරවශේෂයෙන් කීමට අසමර්ථයහ. අන් අය ගැන කියනුම කවරේද මේ ශ්‍රීවිලාශයෙන් අලංකාර කොට පිළියෙල කරන ලද ශාක්‍ය පුරයට පිවිස භාග්‍යවතුන්වහන්සේ පහන් සිත් ඇති ජනයා විසින් ගඳදුම් සුවඳ සුනු ආදියෙන් පුදනු ලබමින් සන්ථාගාරයට පිවිසි සේක. එහෙයින් කියනලදී. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳපෙරව පා සිවුරු ගෙන භික්ෂු සංඝයා සමග සන්ථාගාරය යම්තැනෙකද එතැනට පිවිසිසේකැයි. භගවනතං යෙව පුරකඛතවා යනු භාග්‍යවතුන් වහන්සේ පෙරටු කොට එහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා ද උපාසකවරුන්ද මැද වැඩ හුන්සේක් සුවඳ පැනින් නහවා දුහුල් සුඹුළුවකින් දිය සිඳුවා දැහිඟුලින් මැද රන් පලසකින් වෙළන ලද පීඨයෙහි තැබූ රන් රන් පිළිමයක් මෙන් අතිශයින් බැබලුණුසේක. මේ වනාහි පෞරාණිකයන් ගුණ කියන ආකාරයයි.

ගනතවාන මණ්ඩලමාලං - නාගවිකකනත වාරණො
ඔභාසයනෙතා ලොකගෙගා - නිසිදි වරමාස නෙ

ඇත් ගමනින් යන ඇතකුමෙන් වටමළුවට වැඩම කොට
හාත්පස බබුළුවමින් උතුම් අසුනෙහි හුන්සේක

නභිං නිසිනෙනා වරදමම සාරථී -
දෙවාතිදෙවො සත පුඤ්ඤලක්ඛණො
බුද්ධාසනෙ මජ්ඣ ගතො විරොචතී -
සුවණ්ණ නෙක්ඛං විය පණ්ඩුකම්බලෙ

තරදම්සැරී, දෙවියන්ට දෙවි වූ සියක් පින් ලකුණින් හෙබි උන්වහන්සේ බුදුඅසුන් මැද වැඩහුන් කළ පඬුවන් සළපටක එතූ රන් අබරණක් මෙන් බබලති.

නෙක්ඛං ජම්බොනදසෙසව - නික්ඛිත්තං පණ්ඩුකම්බලෙ
විරොචති වීත මලො - මණි වෙරොචනො යථා

පඬුවන් සළුපටක එතූ දඹරන් අබරණක් සේ
නිමල වෙරෝචන මැණිකක්සේ බබලති.

මහා සාලොව සමුපුලෙලා - නෙරු රාජාවලඞකතො
සුවණ්ණ යූපසංකාසො - පදුමො කොකාසකො යථා

පිපුණු සල්රුකක් මෙත් ලකල මහමෙර මෙන්
රන්මුවා යාගකණුවක් මෙන් රන් පියුමක් මෙන් බබලන සේක

ජලනෙනා දීප රුක්ඛොව - පබ්බතග්ගෙ යථාසිඛී
දෙවානං පාරිචජත්තොව - සබ්බ ඵුලෙලා විරොචථ

දැල්වෙන පහන් රුකක් මෙන් කඳුමුදුනැ ගිනි මෙන්.
පරසතු රුක මෙන් සුපිපී බැබලුණු සේක.

කාපිලවත්ථවෙ සක්‍යෙ බහුදෙවරත්තිං ධම්මියා කථාය යනු මෙහි ධර්මකථා නම් සන්ථාගාර අනුමෝදනා ඇතුළත් ප්‍රකීර්ණක කථා යයි දත යුතුය. එදා භාග්‍යවතුන් වහන්සේ ආකාස ගංගාව ගලාබසින්නාක් මෙන් පෘථුවියෙහි ඕජාව ඇදගන්නාක් මෙන් මහා දඹගස හිස මතට ගෙන සොලවන්නාක් මෙන් යොදුනක් පමණවූ මීවදය චක්‍ර යන්ත්‍රයෙන් මිරිකා මී පැණි පොවන්නාක්මෙන් කපිලවාස්තුවාසී ශාක්‍යයන්ට හිතසුව එළවන

ප්‍රකීර්ණක කථා වදාළ සේක. මහරජ මේ ආවාසදානය මහත්ය, ඔබගේ නිවස මා විසින් පරිභෝග කරනලදී. භික්ෂුසංඝයා විසින් පරිභෝග කරන ලදී. මා විසිනුත් භික්ෂු සංඝයා විසිනුත් පරිභෝග කරන ලද්දේ යනු ධර්මරත්නය විසින්ද පරිභෝග කරන ලද්දේමයයි ත්‍රිවිධ රත්නයන් විසින් පරිභෝග කරන ලද්දේ නම්වෙයි. ආවාස දානය දුන්කල්හි සියලු දන් දුන්නේම වෙයි. බිම පන්සලකත් කොළමණ්ඩපයකත් ආනිසංස පිරිසිඳින්නට නොහැක්කේ යයි නන්නයින් විසිතුරු බොහෝ ධර්මකථා කියා

**සීතං උණ්හං පටිහනති - තතො වාළමිගානි ච**
**සිරිංසපෙච මකසෙ - සිසිරේ චාපි වුට්ඨියො**

සීතලද උණුසුමද වල්සතුන් ද සපුන්ද
මකුණාන්ද වැස්සද වළහයි

**තතො වාතාතපො ඝොරො - සඤ්ජාතො පටි හඤ්ඤති**
**ලෙන ත්ථඤ්ච සුඛත්ථඤ්ච - ඣායිතුඤ්ච විපස්සිතුං**

හටගත් ගොරබිරම් වාතය
හිරුකිරණ වළහයි.
රැකවරණය සුවය සඳහාද දැහැන් වැඩුමට විදසුනටද සුදුසුය.

**විහාරදානං සංඝස්ස - අග්ගං බුද්ධෙන වණ්ණිතං**
**විහාරෙ කාරයෙ රම්මෙ - වාසයෙත්ථ බහුස්සුතෙ**

සඟුනට පිදෙන වෙහෙර දානය උතුම්යයි බුදුරදුන් විසින් වණත ලද්දේය
රමණීය වෙහෙරක් කරවා - ඇසුපිරුතැන් ඇත්තවුන් එහි වස්වන්න.

**තෙසං අන්නඤ්ච පානඤ්ච - වත්ථ සෙනාසනානිච**
**දදෙය්‍ය උජුභූතෙසු - විප්පසන්නෙන චෙතසා**

ඔවුන්ට අහර පැන් වත් සෙනසුන්
මනාව පහන්වූ සිතින් උජුගුණ ඇත්ත වුන් කෙරෙහි පිරිනමන්න

**තෙ තස්ස ධම්මං දෙසෙන්ති - සබ්බදුක්ඛාපනූදනං**
**යංසො ධම්මං ඉධඤ්ඤාය - පරිනිබ්බාති අනාසවොති**

ඔවුහු සියලු දුක් නස්නා දහම් දෙසති.
ඒ දහම් දත් තැනැත්තේ කෙලෙස්නසා පරිනිවන් පායි.

මෙසේ මෙයත් ආවාසදානයෙහි ආනිසංසයකි. මෙයත් ආනිසංසංයකියා බොහෝ රැයට අතිරේකව දෙයම්රැය ආවාස ආනිසංසකථාව වදාළ සේක. එහි මේ ගාථාද සංග්‍රහයට ඇතුළුව ප්‍රකීර්ණක ධර්ම දේශනාව සංග්‍රහ නොවේ.

**සන්දස්සෙති** යනු ආදිය කියන ලද අර්ථ ඇත්තේමය **ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි** යනු ධර්මකථාවක් කියවනු කැමත්තේ දැන්වීය. එසේනම් කුමක් හෙයින් ශාරිපුත්‍ර මොග්ගල්ලාන මහා කස්සප ආදී අසූමහ තෙරුන් සිටිද්දී භාග්‍යවතුන් වහන්සේ ආනන්ද තෙරුන්ට භාර කළ සේක්ද පිරිසගේ අධ්‍යාශය වශයෙනි, ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ බහුශ්‍රැතයන් අතර අග්‍රය මනා ශබ්ද ඇති පදයෙදුම් ඇති මිහිරි දහම් කතා කීමට දක්ෂය ශාක්‍යයන් අතර ප්‍රකටය. කැපී පෙනෙති. ශාක්‍ය රජුන් විසින් විහාරයට ගොස්ද ධර්ම කථා ඇසුවිරුය. අන්තඃපුර වාසීහු ඔවුන්ගේ අභිරුචිය පරිදි විහාරයට යන්ට නොලබති. ඔවුන්ට මෙසේ අදහසක් පහළවිය. භාග්‍යවතුන් වහන්සේ මදක් දහම් කථා පවත්වා අපගේ උතුම්නැයාවූ ආනන්ද හිමියන්ටම භාරකරන්නේ නම් මැනවි යන ඔවුන්ගේ අධ්‍යාශය වශයෙන් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද හිමියන්ටම භාරදුන් සේක. **සෙඛො පටිපදො** යනු පිළිපන් ඒ සේඛ ශ්‍රමණයා ඔබට වැටහේවා. එළැඹේවා. **තස්ස පටිපදං දෙසෙහී** යනු ප්‍රතිපදාවෙන් පුද්ගලයා නියම කොට දක්වයි. කුමක්නිසා භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතිපදාව නියම කළසේක්ද? බොහෝ කරුණු නිසාය. මේ ශාක්‍යයෝ මංගල ශාලාවෙන් යහපත් දෙයක් අපේක්ෂා කරති. වෘද්ධියක් කැමතිවෙති. මෙයද සෙඛ ප්‍රතිපදාවයි මාගේ සස්නෙහි මංගල ප්‍රතිපදාවයි වැඩෙන එකම ප්‍රතිපදාවයයි

මේ ප්‍රතිපදාව නියම කළසේක. හුන් බොහෝ සේඛයෝ තමන් අවබෝධ කරගත් තැන කියනු ලබන කල්හි වෙහෙසට පත්නොවීම මනාසිහියෙන් සලකාබලන්නාහුය යනුවෙන්ද මේ ප්‍රතිපදාව නියම කළසේක. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝද සේඛ ප්‍රතිසම්පදාවටම පැමිණීම තමා අවබෝධකරගත් ප්‍රත්‍යක්ෂ ස්ථානයෙහි කියන්නාහු වෙහෙසට පත්නොවී දැන්වීමට හැකිවන්නාහු යයිද මේ ප්‍රතිපදාව නියම කළසේක. සේඛප්‍රතිපදාවෙහි ශික්ෂාත්‍රයක් අන්තර්ගතය. එහි අධිශීල ශික්ෂාව කීවිට සියලු විනය පිටකය කීවානම් වේ. අධි චිත්ත ශික්ෂාව කීවිට සියලු සූත්‍රපිටකය කීවා නම් වේ. අධිපඤ්ඤා ශික්ෂා පදය කීවිට සියලු අභිධර්ම පිටකය කීවානම් වේ. ආනන්ද තෙරුණුවෝද බහුශ්‍රතය. ත්‍රිපිටකධරය තුන් පිටකයන් සමග ත්‍රිවිධ ශික්ෂාවන් කීමට දක්ෂයහ. මෙසේ කීකල්හි ශාක්‍යයන්ට මංගලයක්ම වේ. වෘද්ධියක්ම වන්නේයයි මේ ප්‍රතිපදාව නියම කළසේක. පිටයීමෙ ආගිලායති යනු කුමක් නිසා වෙහෙසට පත්වේදයත්. සවසක් ප්‍රධන් වීර්ය කරන භාග්‍යවතුන් වහන්සේට මහත් දුකක් ඇතිවිය. ඉක්බිති උන්වහන්සේට මහලුකල පිටෙහි වාතයක් හටගත්තේය. මෙයම හේතුවක් නොවේ. භාග්‍යවතුන් වහන්සේ උපන් වේදනාව මැඩපවත්වා සතියක් හෝ දෙකක් එක්ම පර්යංකයකින් හිඳින්ට හැකිවන්නාහුය. සන්ථාගාරශාලාව නම් සිව්ඉරියව්වෙන්ම පරිභෝග කරන්නට කැමත්තෝ වූහ. එහි පා දෝනා තැන් සිට ධර්මාසනය තෙක් වැඩමකළහ. එපමණ තැන් නිමවිය. ධර්මාසනයට පැමිණ මඳක් සිට වැඩහුන් සේක. එපමණ තැන යාම දෙකක් ධර්මාසනයෙහි වැඩහුන්සේක. එපමණතැන් හිඳීම අවසන් විය. දැන් දකුණු පසින් මඳක් නිදාගත් කල්හි නිදාගැනීම සම්පූර්ණ වේයයි මෙසේ සිව්ඉරියව්වෙන් පරිභෝජනය කිරීමේ කැමැත්ත විය. උපාදින්නක ශරීරය වෙහෙසට පත්නොවේයැයි කිවයුතුය. ඒනිසා බොහෝ කලක් නිදාගැනීමෙන් හටගත් වෙහෙස ගෙන මෙසේ කීය. **සංඝාටිං පඤ්ඤාපෙත්වා** ගනු සන්ථාගාරයෙහි එක් පසෙක ඒ රජවරු පටතිරයකින් වට කරවා කැපවූ කුඩා ඇඳක් පනවා කැප ඇතිරිල්ලෙන් අතුරා මත්තෙහි රන්තරු ගඳමල්දම්වලින් සැදුම්ලත් වියනක් බැඳ සුවඳ තෙලින් පිරූ පහනක් තැංවූහ. ශාස්තෲන් වහන්සේ ධර්මාසනයෙන් නැගී මඳක් ගිමන්හැර මෙහි නිදන්නේනම් මැනැවැයි. මෙසේ අපගේ මේ සන්ථාගාරය භාග්‍යවතුන් වහන්සේ විසින් සිව් ඉරියව්වෙන් පරිභෝග කරන ලද්දේ දිගුකලක් හිතසුව පිණිස වන්නේය. ශාස්තෲන් වහන්සේද ඒ සඳහාම එහි

සඟලසිවුර පනවා සැතපුණුසේක **උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා** යනු මෙපමණ කල් ඉක්මවා නැගිටින්නෙමියි නැගිටීමේ සංඥාව සිත තබා **මහා නාමං සක්කං ආමන්තෙසි** යනු මොහු වනාහි එකල්හි ඔවුන්ගේ පිරිසෙහි ජ්‍යෙෂ්ඨයාය. ප්‍රධානියාය. ඔහු එක්වූ කල්හි සෙසු පිරිසද එකතුවූවාද වෙතියි තෙරණුවෝ ඔහුම ඇමතූහ. **සීලසම්පන්නො** යනු සීලයෙන් යුක්තවූයේ. සිල් සහිතවූයේ පිරිපුන් සිල් ඇත්තේ යන අර්ථයි. **සද්ධම්මෙහි** යනු සොඳුරු දහමින් සාධුජනයන්ගේ හෝ සත්පුරුෂයන්ගේ ධර්මයන්ගෙන් **කථඤ්ච මහානාම** යනු මෙයින් මෙපමණ තැනින් සේඛ ප්‍රතිපදාවෙහි මාතෘකා තබා පිළිවෙළින් විස්තර කරනුකැමැත්තේ මෙසේ කීහ. එහි **සීලසම්පන්නො** ආදිය මහණෙනි සීල සම්පන්නව වසවූයයි ආකඞ්ඛෙය්‍ය සූත්‍ර ආදියෙහි කියන ලද පරිදි දතයුතුය.

**කායදුච්චරිතෙන** යන ආදී තන්හි ද්විතීයාර්ථයෙහි කරණ විභක්තියි. ලජ්ජා කටයුතු කාය දුශ්චරිතාදිය ගැන ලජ්ජාවේ පිළිකුල් කෙරේ යන අර්ථ භය නිර්දේශයෙහි හේතු අර්ථයෙහි කරණ විභක්තියි. බියට හේතුවූ කායදුශ්චරිතාදීන්ගෙන් ඔත්තපති බිය වේය. යන අර්ථයි **ආරද්ධවිරියො** යනු ඇරඹූ වීර්ය ඇත්තේ, පසු නොබෑ සිත් ඇත්තේ, **පහානාය** ප්‍රහාණය පිණිස, **උපසම්පදාය** ලැබගැනීම පිණිස ථාමවා යනු වීර්ය ශක්තියෙන් යුක්තවූයේ **දළ්හපරක්කමො** යනු ස්ථිර පරාක්‍රම ඇත්තේ, **අනික්ඛිත්ත ධුරො කුසලෙසු ධම්මෙසු** යනු කුසල් දහම්හි නොතැබූ බර ඇත්තේ. පසුනොබෑ වීර්ය ඇත්තේ **පරමෙන** යනු උතුම් **සතිනෙපක්කෙන** යනු සිහියෙන්ද බුද්ධිමත් බැවින්ද කවරහෙයින් සිහිය බෙදා දැක්විය යුතු තැන ප්‍රඥාව පැමිණියේද. සතියෙහි බලවත් බව පෙන්වීම පිණිසය, ප්‍රඥාවෙන් වෙන්වූ සතිය දුබලවෙයි. එකට එක්වූ විට බලවත්වෙයි. **චිරකතම්පි** යනු තමා විසින් හෝ අනුන් විසින් කයින් බොහෝ කලක සිට කරන ලද සෑමළුවත් ආදී අසුමහා වත් පිළිවෙත් පිරීමයි. **චිරභාසිතම්පි** යනු තමා විසින් හෝ අනුන් විසින් බොහෝ කලක සිට වචනයෙන් කියන ලද සකසා උදෙසීම උදෙසවීම් ධර්මයට පෙළඹීම ධර්ම දේශනාවන්ට අදාළ විස්තර, අනුමෝදන් විය යුතුය. ආදී වශයෙන් පවත්වන ලද වචීකර්මය. **සරිතා අනුස්සරිතා** යනු කයින් බෝකලක් කළ, **කායො** නම් කාය විඤ්ඤත්තියයි බෝකල් කියූ වදන් නම් **වචීවිඤ්ඤත්තියයි** ඒ රූපද්වයම ඉන්හට ගන්නා චිත්ත චෛතසික අරූපයයි මේ රූපාරූප ධර්ම මෙසේ

ඉපිද මෙසේ නිරුද්ධවූහයි සිහිකරයි. නැවත නැවත සිහිකරයි. සති සම්බොජ්ඣංගය ඇතිකරයි යන අර්ථයි. බොජ්ඣංගයෙන් ඇතිකරන සතිය මෙහි අදහස් කරනලදී. ඒ සතියෙන් මෙය වරක් සරණයෙන් සිහිකරනු ලැබ නැවත නැවත සරණයෙන් නැවත නැවත සිහි කරන ලද්දේ යයි දත යුතුය. **උදයත්ථගාමිනියා** යනු පංචස්කන්ධයන් උදයව්‍යයට යන හටගැනීම හා ව්‍යයවීම අවබෝධකර ගැනිමට සමත්, **අරියාය** යනු විෂ්කම්භන වශයෙන්ද සමුච්ඡේදවශයෙන්ද කෙලෙසුන්ගෙන් දුරස්ව සිටීම පිණිස පිරිසිදුවීම පිණිස **පඤ්ඤාය සමන්නාගතො** යනු විදර්ශනා ප්‍රඥවෙන් ද මාර්ග ප්‍රඥවෙන්ද යුත් නිබ්බෙධිකාය යනු එයම පැලීයන **නිබ්බෙධිකා** යයි කියනු ලැබේ. එයින් යුක්තය යන අර්ථයි. එහි මාර්ග ප්‍රඥාව සමුච්ඡේද වශයෙන් නොපැලුණු වීරු ලෝභස්කන්ධය දෝෂ මෝහ ස්කන්ධය බිඳෙන්නේය පැලෙන්නේය. යනු නිබ්බධිකානම, විදර්ශනා ප්‍රඥාව තදඞ්ග වශයෙන් බිඳලන මාර්ග ප්‍රඥාවෙන් ප්‍රතිලාභ ඇති කරවන බැවින්ද **විපස්සනා නිබ්බෙධිකා** යයි කියන්නට වටී. **සම්මා දුක්ඛක්ඛයගාමිනියා** යනු මෙහිද මාර්ගප්‍රඥව මනාහේතු ක්‍රමයෙන් සසරදුක ගෙවමින් යානුයි **දුක්ඛක්ඛයගාමිනී**, දුක් නැති කරන මාර්ග ප්‍රඥාව ලබාගැනීමට හේතුවන නිසාද දුක්ඛක්ඛය ගාමිනී යයි දතයුතුය.

**ආභිචෙතසිකානං** යනු උසස්සිත, ශ්‍රේෂ්ඨසිත, හා බැඳුණු **දිට්ඨ ධම්ම සුඛ විහාරානං** යනු සැමවැදුණු හැම මොහොතකම සැපලැබීමේ හේතුන්, **නිකාමලාභී** යනු කැමතිකැමති කෙණෙහි සමවැදුණු, **අකසිරලාභී** යනු බොහෝ ලැබීම්ඇති ප්‍රගුණභාවය නිසා එකෙක් කැමති කැමති කෙණෙහි සමවදින්ට හැකිවෙයි සමාධියට බාධකවූ ධර්මයන්ද වෙහෙසක් නැතිව විනාශ කිරීමට නොහැකිවෙයි. හේ තමාගේ අකැමැත්තෙන් වහාම නැගී සිටියි. පිරිසිදීම් ආකාරයෙන් සමවත් තබාගැනීමට නොහැකි වෙයි. මෙය **කිච්ඡලාභී** අපහසුවෙන් ලැබෙන්නේ **කසිරලාභී** කරදර සහිතව ලබන්නේ නම් එකෙක් කැමති කැමති ක්ෂණයකම සමවැදීමට සමත්වෙයි. සමාධියට බාධකවූ ධර්මයන්ද වෙහෙසක් නැතිවම විනාශකරදමයි. හේ පිරිසිදීම් වශයෙන්ම නැගී සිටීමට සමත්වෙයි. මෙය **අකිච්ඡලාභී** අපහසුවක් නැතිව ලබන්නේ අකසිරලාභී කරදර රහිතව ලබන්නේ නම් අයං වුච්චති **මහානාම අරිය සාවකො සෙඛො පාටිපදො** යනු මහානාම මේ ආර්ය ශ්‍රාවකයා නම් සේඛ පිළිවෙත් ඇත්තේය. විදර්ශනා ගර්භය සඳහා

වර්ධමානක ප්‍රතිපදාවෙන් යුක්තවුයේයයි දක්වයි. **අපුචචණ්ඩකාය** යනු කුණුනොවූ බිජු ඇති බැවින් **භබ්බො අභිනිබ්බිදාය** යනු ඥානය ප්‍රභේදනය කිරීමට හැක්කෙකි. **සමෙබාධාය** යනු ආර්ය මාර්ය සඳහා, **අනුත්තරසස යොගකෙඛමසස** යනු අර්හත්වය අනුත්තරය යෝගක්ෂේම නම් වේ. එය අවබෝධ කරනු පිණිස හැක්කේ යයි දක්වයි මෙහි යමක් අර්ථ දීපනය පිණිස උපමා ගෙනහැර දක්වනු ලැබීද, එය චෙතොඛීලසූත්‍රයෙහි කියූ ක්‍රමයෙන් දතයුතුය. හුදෙක් එහි ඒ කිකිළියගේ බිජුවල ත්‍රිවිධ කාර්යයක් කිරීම මෙන් මේ භික්ෂුවගේ උත්සාහයෙන් කරන පසළොස් අංගයකින් යුක්තභාවය යන යම් ඒ උපමා සංසන්දනයක් ආයේද එය මෙහි මෙසේ සීලසම්පන්න වේය ආදි වචනයෙන් ඒ කිකිළියගේ බිජුවල ත්‍රිවිධ කාර්යයක් කිරීම මෙන් මේ භික්ෂුවගේ සීලසම්පන්න භාවය ආදී පසළොස් ධර්මයන්ගෙන් යුක්තවූ බවයයි. මෙසේ යොදා දත යුතුය. සෙස්ස සියලුතැන කියනලද පරිදිමය. **ඉමං යෙව අනුතතරං උපෙඛාසති පාරිසුද්ධිං** යනු මේ ප්‍රථමධ්‍යානාදීන් ගෙන් අසදෘශවූ උතුම්වූ චතුර්ථධ්‍යානයෙන් උපන් උපෙඛාසති පාරිසුද්ධි නම්වේ. **පඨමා අභිනිබ්බිදා** යනු ප්‍රථම ඥානභේදයයි. ද්විතීය ධ්‍යානාදියෙහිද මේ ක්‍රමයයි. කුකුළුපැටවා එක්වරක් මව්කුසින්ද එක්වරක් අණ්ඩකෝෂයෙන්දැයි දෙවරක් උපදී. ආර්ය ශ්‍රාවකයා ත්‍රිවිද්‍යාවෙන් තෙවරක් උපදී. පෙර විසුකඳ පිළිවෙළ වසන අන්ධකාරය දුරුකර පෙර විසු කඳ පිළිවෙළ දන්නා නුවණින් පළමුව උපදී. සතුන්ගේ චුතිප්‍රතිසන්ධිසන අන්ධකාරය දුරුකොට දිවැස් නැණින් දෙවැනිව උපදී. චතුරාර්යසත්‍යය වසන අන්ධකාරය දුරුකොට ආශ්‍රවක්ෂය ඥානයෙන් තෙවැනිව උපදී.

**ඉදමපිසස හොති චරණසම්ං** යනු මෙය ද සිල්වත් භික්ෂුවකගේ චරණ නම් වේ යන අර්ථයි. චරණය නම් බොහෝය. අනේකවිධය ශීලාදී පසළොස් ධර්මයෝ, එහි මෙයද එක් චරණයකි යන අර්ථයි, පදාර්ථ වශයෙන් එයින් හැසිරේ නොගිය විරූ දිශාවට යානුයි චරණ නම්. සියලු තැන මේ ක්‍රමයයි. **ඉදමපිසස හොති විජ්ජාය** යනු මේ පෙරවිසු කඳ පිළිවෙළ දන්නා ඥානය එයට විද්‍යාව වේනුයි අර්ථයි විජ්ජානම් බොහෝය. අනේකවිධය, විදර්ශනාඥාන ආදී ඥාන අටකි. එහි මෙයද ඥානයකි. එකම විද්‍යාවයි යන අර්ථයි. පදාර්ථ වශයෙන් විනිවිදගොස් එයින් දනීනුයි විජ්ජානම් සියලු තැන මේ ක්‍රමයයි. **විජ්ජා සමපනෙනා ඉතිපි** යනු පසළොස් ධර්මයන් ගෙන් මෙසේද චරණ **සමපනෙනා** වෙයි. ඒ දෙකින්ම මෙසේද

විජ්ජාචරණ සම්පන්නො වෙයි සනං කුමාරෙන යනු පොරාණක කුමරුවිසින් බොහෝ කලෙක පටන් කුමාරයයි ප්‍රසිද්ධවූ ඔහුගෙන් ඔහු වනාහි මිනිස් ලොව පඤ්ච චූලක නම් කුමාර කාලයෙහි ධ්‍යාන උපදවා නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ බඹලොව උපන්නේය. ඔහුට ඒ අත්බැව ප්‍රියවිය. මනාපවිය. ඒනිසා එබඳුම අත් බැවකින් හැසිරේ. ඒනිසා ඔහු සනංකුමාර යයි හඳුන්වති. ජනෙතස්මිං යනු උපතලැබූ ප්‍රජාවෙහි යන අර්ථයි. යෙ ගොත්ත පටිසාරිනො යනු යම් ජනකෙනෙක් එහි මම ගෞතමය. මම කස්සපයැයි එහි ගෝත්‍රය කියත්ද ලෝකයෙහි ගෝත්‍ර කියන්නවුන් අතර ක්ෂත්‍රියයා ශ්‍රේෂ්ඨය. අනුමතා භගවතා යනු මාගේ ප්‍රශ්න ව්‍යාකරණය සමග සසඳා දේශනා කරන ලද්දේයයි අම්බට්ඨ සූත්‍රයෙහි භාග්‍යවත් බුදුරදුන් විසින් අම්බට්ඨය, මමද එසේ කියමි,

**ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං - යොගොත්ත පටිසාරිනො**
**විජ්ජාචරණ සම්පන්නො - සොසෙට්ඨො දෙවමානු සෙ**

කුලගොත් විචාරණ
ජනයන් අතර
කැත් කුලය ශ්‍රේෂ්ඨය
විජ්ජා චරණයෙන් යුත් තැනැත්තේ
දෙව්මිනිසුන් අතර ශ්‍රේෂ්ඨය.

මෙසේ කියන භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද්දේය. අනුමෝදන් වන ලද්දේය. සාධු සාධු ආනන්ද යනු භාග්‍යවතුන් වහන්සේ මුලපටන් නිද්‍රාවට නොඑළඹ මේ සූත්‍රය අසා ආනන්ද විසින් සේඛ ප්‍රතිපදාවෙන් කුළුගන්නා ලද්දේයයි දැන නැගිට පළක් බැඳ වැඩහුන් සේක් සාධුකාර දුන් සේක. එපමණකින්ම මේ සූත්‍රය බුද්ධභාෂිතයක් යයි නම් ලැබීය. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

**තුන්වැනි සේඛ සූත්‍රයයි**

## 2.1.4

එවමෙමසුතං යනු පොතලිය සූත්‍රයයි. එහි අඞගුත්තරාපෙසු යනු අංගයෙහි එම ජනපදය මහී නමැති නදියට උතුරින් ඇති ජලයයි ඒවාට ඇති ආසන්නතාව නිසා උත්තරාපො යනුවෙන් කියනු ලැබේ. කවර මහීගංගාවක උතුරින්ද ඒ ජලය මහාමගීයගේ මේ එහි උත්පත්තිකථාවයි. මේ ජම්බුද්වීපය දසදහසක් යොදුන් පමණවේ. එහිද සාරදහසක් යොදුන් පමණ පෙදෙසක් ජලයෙන් යටවී සමුද්‍රයයි ප්‍රසිද්ධවිය. තුන්දහසක් යොදුන් පමණ තැන මිනිස්සු වසත්. තුන් දහසක් යොදුන් පමණ තැන හිමාලය පිහිටියේය. එය උසින් යොදුන් පන්සියයකි. මුදුන් අසූහාරදහසින් සැදුණේය. හාත්පසින් ගලාබස්නා නදීන් පන්සියයකින් විචිත්‍රය. යම් තැනෙක අයම් විතරින්ද ගැඹුරින්ද පනස් පස් යොදුන්ය. යොදුන් එකසිය පණසක් වටා අනෝතත්තවිල කණ්ණමුණ්ඩවිල, රථකාරවිල, ඡද්දන්තවිල කුණාල විල. මන්දාකිනී සීහප්පපාත යන සත්මහ විල් පිහිටියේය. ඉන් අනෝතත්තවිල සුදර්ශනකූට, චිත්‍රකූට කාළකූට ගන්ධමාදන කූටය කෛලාස කූට යන මේ පස් කුළ පවුවලින් පරිකෙව් කරන ලද්දේය. එහි සුදර්ශන කූටය රන් මුවාය. දෙසිය යොදුනක් උසය. ඇතුළත වක්‍රය කවුඩු තුඩකට සමානය. ඒ විලම වසා සිටියේය. චිත්‍රකූටය රුවන් මුවාය. කාළ කූටය අඳුන් මුවාය. ගන්ධ මාදන කූටය සානු ඇත්තේය. අභ්‍යන්තරයෙහි මුං පැහැයගනී. මූලගන්ධ, සාරගන්ධ, ෆේග්ගු ගන්ධ, තචගන්ධ, පපටික ගන්ධ, රසගන්ධ, ඡත්තගන්ධ, ප්‍රජඵගන්ධ, ඵලගන්ධ, ගන්ධගන්ධ යන මේ දස ගඳින් ගැවසුණු නානාප්‍රකාරවූ ඖෂධ ගැවසී ගත් කළුවර දෙපෝදා හිරුමෙන් අඟුරුමෙන් දිලිසෙමින් සිටී. කෛලාශ කූටය රිදී මුවාය සියල්ල මෙන් උසින්ද සලකුණින් ද සමානය විලම වසා සිටී. ඒ සියල්ල දේවානුභාවයෙන්ද වැසි වසී එහි ගංගාද ගලාබසී. ඒ සියලුජලය අනෝතත්ත විලටම පිවිසේ. සඳහිරු දකුණින් හෝ උතුරින් ගමන් කරමින් පර්වත අතුරින් එහි එලිය කරයි. කෙළින් යමින් එසේ නොකරයි. ඒ නිසාම එයට අනෝතත්ත යයි නමක් හටගනී. එහි මනහර පඩිපෙළද මස් කසුබුවන් නැති පළිඟුවන් ජලයද ඇත. නාන තොටුද මැනවින් පිළියෙලකොට ඇත. බුදු පසේබුදු රහත්හුද ඍද්ධිමත් ඍෂිවරු යම්තැනෙක නහත්ද දෙවියෝද යක්ෂයෝද උයන් කෙළි කෙළිත්ද, එහි සතර පසෙහි සිංහමුඛ හස්තිමුඛ අශ්වමුඛ, වෘෂභමුව. යන සිව් මුඛයෝ වෙති, යමෙකින් සිව්නදීහු ගලා

බසිත්ද. සිංහ මුඛයෙන් නික්මුණු ගංගා තීරයෙහි සිංහයෝ බහුතරවෙති. හස්තිමුව ආදියෙන් නික්මුණු ගංගා තීරවල පිළිවෙළින් හස්ති අශ්ව වෘෂභයෝද වෙති. පෙරදිගින් නික්මුණු නදිය අනෝතත්ත විල තෙවරක් පැදකුණු කොට ඉතිරි ගංගා තුන අනුව පැමිණ පෙර දිග හිමවත් පවුවෙන් අමනුෂ්‍ය පථයට ගොස් මහ සමුද්‍රරට පිවිසෙයි. අපර දිගින් හා උතුරු දිගින් නික්මුණු නදීහුද එසේම පැදකුණු කොට අවරදිග හිමාලයෙන්ම උතුරු හිමාලයෙන්ම අමනුෂ්‍ය පථයට ගොස් මහ සමුද්‍රරට පිවිසෙයි. දකුණු දිගින් නික්මුණු නදිය එය තෙවරක් පැදකුණු කොට දකුණු දිගින් ඍජුව ගල්තලාව මතුපිටින් සැට යොදුනක් ගොස් පර්වතයෙහි වැදී නැගී වටින් ගව්තුනක් පමණ ජලදහරා බවට පත්වී උසින් සැට යොදුනක් ගොස් තියග්ගළ නම් ගලෙහි වැටී පාෂාණය ජල දහරෙහි වේගයෙන් බිඳී එහි පණස් යොදුනක් පමණ වූ තියගගළ නම් පොකුණක්විය. පොකුණෙහි ඉවුර බිඳ ගලට පිවිස සැට යොදුනක් ගියේය. එයින් ඝන පෘථුවිය බිඳ උමගින් සැට යොදුනක්ගොස් වින්ධ්‍යා නම් තිරිසන්? පර්වතයෙහි වැදී අල්ලෙහි පසැඟිලිවත් දහරා පසක්ව පවත්නේ තෙවරක් අනෝතත්ත විල පැදකුණුකොට ගියතැන ආවර්ත ගංගා යයි කියනු ලැබේ. ඍජුව ගල්තලාව මතින් සැටයොදුනක් ගිය තැන කණ්හගංගානම් අහසින් සැට යොදුනක් ගියතැන ආකාසගංගා නම් තියගගල පාෂාණයෙහි පණස් යොදුනක් අවකාශයෙහි සිටි තියගගළ නම් පොකුණයි. ඉවුර බිඳ පාෂාණයට පිවිස සැට යොදුනක් ගිය තැන බහල ගංගා නම් උමගින් සැට යොදුනක් ගිය තැන උමමගග ගංගා යයි කියනු ලැබේ. වින්ධ්‍යා නම් තිරිසන් පවුවෙහි හැපී දහරපසක්ම පැවතිතැන ගංගා, යමුනා, අචිරවතී සරභූ මහී යනුවෙන් පස් අයුරකින් ප්‍රසිද්ධ විය. මෙසේ මේ පස්මහා නදීහු හිමවතින් ගලා බසිත් ඒ අතරින් යම් ගංගාවක් පස්වැනි වීද එය මහී නම්. මෙහි එය මහාමහි යයි අදහස් කරන ලදී. ඊට උතුරින් යම් ජලයක් වේද ඒවාට නුදුරුබැවින් ඒ ජනපදය අංගුත්තරාප යැයි දත යුතුය. ඒ අංගුත්තරාප ජන පදයෙහි, ආපණං නාම යනු ඒ නියම්ගමෙහි විසිදහසක් ආපණ ශාලා වෙන්කොට තිබිණ. මෙසේ එය ආපණ බහුල බැවින් ආපණ යනුවෙන්ම ප්‍රසිද්ධව ගියේය. ඒ නියම්ගමට නුදුරෙහි ගංතෙර සෙවනින් ගහණවූ රමණීය බිම් කඩක් මහාවන ලැහැබක් වීද එහි භාග්‍යවතුන් වහන්සේ වැඩවසනසේක. ඒනිසාම මෙහි වසන තැන නියම නොකරන ලද්දේයයි දත යුතුයි.

**යෙනඤ්ඤද තරො වනසණ්ඩො තෙනුපසඞ්කමි** යනු භික්ෂුසංඝයා වසනතැනට යවා පෝතලිය ගෘහපතියා සඳහා හුදෙකලාවම එළැඹීසේක. **පොතලියොපි ඛො ගහපති** යනු පොතලියයයි නම් ඇති ගෘහපතියා, **සම්පනනවාසන පාපුරණෙ** යනු පිරිපුන් ඇඳුම් හා වැසුම් ඇත්තේ, එක් දික් දහවලු ඇති සළුවක් හැඳ එකක් පෙරවූයේ යන අර්ථයි. **ආසනානි** යනු පර්යංක පුටු පැදුරු පුටු ආදිය යටත් පිරිසෙයින් අතුකැබැල්ලක් වුවද ආසනයයි කියනු ලැබේ. **ගෘහපතිවාදෙන** යනු ගෘහපති යන මේ වචනයෙන්, **සමුදාචරති** යනු ව්‍යවහාර කරයි. **භගවනතං එතදවොච** යනු තෙවැනිව ගෘහපති යන වචනය ඉවසන්ට නොහැක්කේ භාග්‍යවතුන්වහන්සේට මේ **තයිදං** හොගොතම යන ආදිවචනය කීය. එහි **නචජනනං** යනු සුදුසුනොවේ. **නපපතිරූපං** යනු සාරූප්‍ය නොවේ. **ආකාරා** යනු ආදී සියල්ලම කාණෙ යන්නට තවත් වචනය. දිගු දහවලු සහිත වස්ත්‍ර දැරීම කෙස් රවුල් නිය තබා ගැනීම් සියල්ල ගිහි ලක්ෂණය ඔහුගේ ගිහිබව කරත්නුයි ආකාරා. ගිහි ලකුණින් සලකුණු කරන ලද බැවින් ලිඞ්ගා ගිහිබව හඳුනාගැනීමේ නිමිත්ත බැවින් නිමිත්තායි කියන ලදී. **යථා තං ගහපතිසස** යනු යම්සේ ගෘහපතියාගේ ආකාර ලිංග නිමිත්ත වේනම් එසේම ඔබටත් ඒනිසා මම මෙසේ ව්‍යවහාර කරමියි දක්වයි. ඉක්බිති ඔහු යම් කරුණකින් ගෘහපතිවාදය නොඉවසයිද එය ප්‍රකාශකරන්නේ **තථාහිපන** මෙ ආදිය කීය. **නියාාතංයනු** පවරන ලද්දේය. **අනොවාදී අනුපවාදී** යනු දරුවෙනි, සීසාවූ වපුරවූ වෙළඳමෙහි යෙදෙවූ ආදි ක්‍රමයෙන් අවවාද දෙන්නේ ඔවාදී නම් වෙයි. ඔබ නොම සීසාවූ නොම වපුරවූ. වෙළදාමේ නොම යෙදෙවූ කෙසේ ජීවිකාව කරවුද අඹුදරුවන් පෝෂණය කරවුද ආදී ක්‍රමයෙන් උපවාද කරන්නේ උපවාදී නම් වෙයි. මම ඒ දෙකම නොකරමි. ඒනිසා මම එහි **අනොවාදී අනුපවාදි** යයි දක්වයි. **සාසචඡාදන පරමො විහරාමි** යනු ආහාර සහ ඇඳුම් පමණක් පරම කොට වෙසෙමි. ඉන් වැඩියක් නොපනමියි පෙන්වයි. **ගිද්ධිලොභො පහාතබ්බො** යනු ගිජුවූ ලෝභය අත්හළයුතුය. **අනිඤ්දරොසො** යනු. වැරදි නොසොයන්නාහු. ගැටුම්නැත්තාහු **නිඤ්දරොසො** යනු වැරදිසෙවීම. ගැටීම, **වොහාර සමුචෙඡදාය** යනු එහි **වොහාරො** යනු ව්‍යවහාර වොහාරය පැනැවීමද වචනයද චේතනාවද එහි

**යොහි කොචි මනුසෙසසු - වොහාරං උපජීවති**

**එවං වාසෙට්ඨජානාහි - වාණිජො සො නබ්‍රාහමණො**

යමෙක් මිනිසුන් අතර - වෙළදාමෙන් යැපේද
වාසෙටය් දැනගනුව - ඔහු වෙළෙන්දකු මිස බමුණෙක් නොවේ.

මෙය ව්‍යවහාර වොහාර නම්වේ. සඞ්ඛා, සමඤ්ඤ පඤ්ඤතති වොහාර යනුවෙන් මෙය පඤ්ඤත්ති වොහාර නම්. ඒ ඒ අයුරින් වහරයි. ස්පර්ශනොකරයිනුයි මෙය වචන වොහාර නම් අටඅරිය වොහාර. අටඅනරිය වොහාර යනුමෙහි මෙය චේතනා වොහාරනම්. මෙය මෙහි අදහස්කරන ලදී, යම්හෙයකින් හෝ පැවිදිවූ කල්හි පටන් ගිහිය යන චේතනාවක් නැත්තේද ශ්‍රමණයෙක්ය යන චේතනාව වෙයි. ගිහියයි වචනයක් නැත. ශ්‍රමණයයි වචනයක් වෙයි ගිහියයි පැනැවීමක් නැත. ශ්‍රමණයයි පැනැවීමක් වෙයි. ගිහි යයි ව්‍යවහාරයක් නැත. ශ්‍රමණයා හෝ පැවිද්දා හෝ යන ව්‍යවහාරයක් වෙයි. ඒනිසා ඒ සියල්ලම ලබයි.

**යෙසං බො අහං සංයොජනානං හෙතු පාණාතිපාතී** යනු මෙහි පාණාතිපාතයම සංයෝජනයයි. පාණාතිපාතයට හේතුයි පානාතිපාත ප්‍රත්‍යයෙන් පාණාතිපාතී නම් වෙයි. පාණාතිපාත යන්ගේ බොහෝ බැවින් **යෙසං බො අහං** යනුවෙන් කියන ලදී. **තෙසානං සංයොජනානං** යනු මම ඒ ප්‍රාණාතිපාතී බන්ධන **පහානාස සමුචෙඡදාය පටිපනෙනා** යනු මේ අපාණාතිපාත සංඛ්‍යාත සීලසංවරයෙන් ප්‍රහාණය. පිණිස සමුච්ඡේදනය පිණිස පිළිපන් **අත්තාපි මං උපවදෙය්‍ය** යනු කුහුඹුවකුපවා ජීවිතයෙන් වෙන්නොකරන සසුනෙහි පැවිදිව ප්‍රාණාතිපාත මාත්‍රයෙන් වෙන් කිරීමට නොහැක්කෙමි. ආත්මභාවයම මාහට චෝදනා කරයිනම් මාගේ පැවිද්දෙන් ඇති ඵලය කිම. **අනුවිච්ච විඤ්ඤූ ගරහෙය්‍යුං** යනු මෙබඳු සසුනෙහි පැවිදිව ප්‍රාණාතිපාත මාත්‍රයෙන් වෙන්වීමට නොහැකිවෙයි. මේ පැවිද්දෙන් ඇති ඵලයකිම යැයි තුලනය කොට විනිවිදබලා අනෙකුත් උගත් පඩිවරු ගරහත්නම්. **එතදෙවබොපන සංයොජනං එතං නීවරණං** යනු දස සංයෝජනයන්හිද පංචනීවරණයන්හිද අසම්පූර්ණවූද එය අටනීවරණ යයි දේශනාවශයෙන් සසරෙහි බැඳෙන අර්ථයෙන් යහපත යන අර්ථයෙන්ද සංයෝජන යැයිද නීවරණයයිද කියන ලදී. **ආසවා** යනු ප්‍රාණඝාතය හේතුවෙන් එක් අවිජ්ජාසවයක් උපදී. **විඝාත පරිළාහා** යනු මැරීමද තැවීමද. එහි විඝාත ග්‍රහණයෙන් කෙලෙස් දුක්ද විපාකදුක්ද ගන්නා ලදී. මේ ක්‍රමයෙන් සියලු තන්හි අර්ථ දත යුතුය. මෙය විශේෂයයි. **තෙසාහං**

සංයොජනානං පහානාය යනු මේපදයෙහි මෙයින් දුන් දාන සංඛ්‍යාත කායික සීලසංවරයෙන් ද සත්‍යවාචා. සංඛ්‍යාත වාචසික සීල සංවරයෙන්ද අපිසුණාවාචා සංඛ්‍යාත වාචික සීල සෘවරයෙන්ද අගිද්ධි ලෝභ සංඛ්‍යාත මානසික සීල සංවරයෙන් අනිඥරොස සංඛ්‍යාත කායික වාචසික සංවරයෙන් අක්‍රොධ උපායාස සංඛ්‍යාත මානසික සීල සංවරයෙන් අනතිමාන සංඛ්‍යාත මානසික සීල සාවරයෙන් ප්‍රහාණය පිණිස සමුච්ජේදනය පිණිස පිළිපන්නේයි මෙසේ සියලුවාරයන්හි යෙදීම් කළයුතුය.

අත්තාපි මං උපවදෙය්‍ය අනුවිච්ච මං විඤ්ඤූ ගරහෙය්‍යුං යනු මේ පදයන්හි තණ සුලක් පවා ගෙන නොදුන් දෙය නොගන්නා සසුනෙහි පැවිදිව අදිනනාදාන මාත්‍රයෙන් වෙන්වන්ට නොහැක්කෙමි. මාගේ පැවිද්දෙන් කවර ඵලයෙක්දැයි මෙසේ මාහට මාගේ අත්ම භාවයට උපවාද කෙරේ. මෙබඳු සසුනෙහි පැවිදිව ආදින්නාදාන මාත්‍රයෙන්පවා වෙන්වන්ට නොහැක්කේය. මේ පැවිද්දෙන් ඇති ඵලය කිමැයි මෙසේ දැන උගත්තු ගර්හා කෙරෙන්නම් හාස්‍යය අපේක්ෂාවෙන් හෝ විහිළුව කැමැත්තෙන් හෝ මුසාවාද නොකියන සසුනෙහි පැවිදිව සැම අයුරින්ම කේළාම් කීමක් නැති සසුනෙහි පැවිදිව අල්පමාත්‍ර වූ ද කෑදර ලෝභයක් නොකරන සසුනෙහි පැවිදිව කතුරෙන් අඟපසග කපනු ලබන කල්හිද අනුන්ට නින්දා ක්‍රෝධ මාත්‍රයක් නොකරන සසුනෙහි පැවිදිව කණු කටු ඇනෙන කල්හිත් ක්‍රෝධයක් ද්වේශයක් නොකරන සසුනෙහි පැවිදිව අධිමාන මාත්‍රයකින් වත් මානයක් නොකරන සසුනෙහි පැවිදිව අතිමාන මාත්‍රයක් වත් අත්හැරීමට නොහැක්කෙමි. පැවිද්දෙන් මට ඇති ඵලය කිමෙක්දැයි මෙසේ තමාම මට උපවාදකරන්නේය. මෙබඳු සසුනෙහි පැවිදිව අතිමාන මාත්‍රයක් වත් අත්හරින්ට නොහැක්කේය මොහුට පැවිද්දෙන් ඇති ඵලය කිමෙක්දැයි මෙසේ දැන උගත්හු ගරහත්නම්යයි මෙසේ සැමවර යෙදීම් කළයුතුය. ආසවා යනු මේ පදයෙහි නුදුන් දෙය ගැනීමෙන් කාමාසවය දිට්ඨාසවය අවිජ්ජාසවය යයි ආශ්‍රව තුනක් උපදී. මුසාවාද හේතුවෙන්ද පිසුණාවාචා හේතුවෙන් ද එසේය, ගිජු ලෝභය හේතුවෙන් දිට්ඨාසවයත් අවිජ්ජාසවයත් උපදී, නින්දාරෝස හේතුවෙන් අවිජ්ජාසවය උපදී. එසේම ක්‍රෝධඋපායස හේතුවෙන්, අතිමානය හේතුවෙන් භවාසව හා අවිජ්ජාසවයන ආශ්‍රවදෙක උපදීයයි මෙසේ ආශ්‍රව උත්පත්තිය දතයුතුය. මේ අටවරෙහි අමතක

නොවීම පිණිස නැවත මේ සංක්ෂේප විනිශ්චයයි. පෙරකියූ සතරෙහි වෙන්වීමට නොහැක්කෙමියයි, කිවයුතුයි. පසුව කියූ දෙයෙහි අත්හැරීමට නොහැක්කෙමියි, පාණාතිපාත නින්දා රෝස කෝධ උපායාසයන්හි එක්ම අවිජ්ජාසමයම වෙයි. අදින්නාදාන මුසාවාද පිසුණාවාචාහිදී කාමාසව දිට්ඨාසව අවිජ්ජාසව උපදී, ගිජු ලෝභයෙහි දිට්ඨාසව අවිජ්ජාසව උපදී. අතිමානයෙහි භවාසව දිට්ඨාසව උපදී. ප්‍රාණාතිපාත නොකිරීම දුන්දෙය ගැනීම කායිකසීලයයි. මුසා නොබිණීම පිසුණනොකීම වාචසික සීලයයි, අනිඳුරොසය හැර ඉතිරිතුන මානසික සීලයයි. යම්හෙයකින් කයින්ද ගටය රොස්වෙයි. වචනයෙන්ද ගටය රොස්වෙයි ඒනිසා අනින්දාරෝසය දෙනුතැකට යයි කායිකසීලයද වාචසික සීලයද වෙයි. මෙපමණකින් කුමක් කියන ලද්දේද. පාතිමොක්ඛ සංවර සීලය, ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි පිහිටි භික්ෂුවගේ සැක පහ කරනු වශයෙන් ගිහී වොහාර සමුච්ජේදය කියන ලද්දේයැයි දතයුතුය. විස්තර දේශනාව සඳහා ඔහු දක්ෂය යන පදයට එක් කරන්නේය යන මෙය සමග සම්බන්ධය දත යුතුය. මෙයද කියන ලද්දේවෙයි. මේ සුනඛයා ළංවේනම් ඔහු සමීපයට දමන්නේය යන අර්ථය. **අට්ඨිකඞ්කලං** යනු කලවාඇටය හෝ කොඳු ඇටය හෝ හිස්කබලහෝ එය මස් නැති බැවින් සැකිල්ලයයි කියනු ලැබේ. **සුනිකනතිකතතං** යනු යම්සේ මනාව කපන ලද්දේද එසේ කපන ලද්දේය. සුරාදමන ලද්දේය. එහි ඇලීගිය යම් මාංශයක් වේද ඒ සියල්ල සුරාදමා ඇටපමණක්ම කරන ලද්දේය යන අර්ථයි. එහෙයින් කියන ලදී. **නිමමංසං** යනුවෙන්, ලේ ගැවී සිටී එහෙයින් කියන ලදී **ලොහිතමකඛිතතං** යනුවෙන් **බහුදුකඛා බහුපායාසා** යනු දිට්ඨිධමමික සමපරායික දුකින් බහුදුක්ඛා උපායාස කිලෙසයන්ගෙන් බහුපායාසා, **යායං උපෙඛා නානතතා නානතතසිකා** යනු යමක් මේ පස්කම්ගුණ අරමුණු වශයෙන් නානාප්‍රකාරවේද ඒවාම අරමුණු නිශ්‍රිත බැවින් **නානතත සිකායයි** කියනු ලැබේ. පස්කම් ගුණ මධ්‍යස්ථය එය හැරදමා, **එකතතා එකතතසිතා** යනු චතුර්ථධ්‍යාන මධ්‍යස්ථය එය ද දවසක් පාසා එක් අරමුණක උපදින බැවින් ඒකස්වභාව ඇත්තේය එයට එක් අරමුණක් ඇසුරුකොට ඇතිබැවින් එකත්තසිත නම්වේ. **තත්‍ථ සබ්බසො ලොකාමිසූපාදානා අපරියෙසා නිරුජ්ඣනති** යනු යම්තැනක චතුර්ථධ්‍යාන මධ්‍යස්තතාවෙන් යම් මධ්‍යස්ථානයකට පැමිණ ඒ නිසා සියල්ලෙන් සියල්ල අපරිශේෂයෙන් ලෝකාමිෂ සංඛ්‍යාත පංචකාමගුණ ආමිෂ නිරුද්ධවෙයි. **පංචකාම ගුණාමිසා** යනු කාමගුණ අරමුණු කරගත්

ඡන්දරාගයෙන් ග්‍රහණ අර්ථයෙන් ඒවාම උපාදානයයි කියන ලදී. **තමෙව උපෙබං භාවෙති** යනු ඒ ලෝකාමිස උපාදානයන්ට ප්‍රතිපක්ෂ වූ චතුර්ථධ්‍යාන මධ්‍යස්ථතාවම වර්ධනය කෙරේ.

**උඩෙඩයා** යනු උඩටපැන යන්නේය. **අනුපතිත්වා** යනු ලුහුබැඳ, **විගනචෙඡයුං** යනු මුවතුඩු ඩැහැගනිමින් යන්නාහුය. **විරාජෙයුං** යනු මාංශපේශී තියෙන් කඩා හෙළන්නාහුය. **යානං පොරොසෙයාං** යනු පිරිමින්ට සුදුසු යානය, **පවර මණිකුණඩලං** යනු නානාප්‍රකාර උතුම් මිණි කොඩොල්ද, **සානිහාරනති** යනු තමාගේ බඩු ගනිත්, **සමපනනඵලං** යනු මිහිරිපල. **උපපනනඵලං** යනු ඵලයෙන් උපන් බොහෝ පල **අනුතතරං** යනු උතුම් පැහැපත් උපක්ලේශනැති, **ආරකාඅහංහනෙන** යනු පෘථිවියෙන් අහසමෙන් සමුද්‍රයෙහි මෙතෙරින් එතෙර මෙන් මම මහත් ඈතින් සිටිමි, **අතාජානීයෙ** යනු ගිහි ව්‍යෝහාර සමුච්ඡේදයට හේතුව නොදන්නාවුන්, **ආනීය භොජනං** යනු පෙරාතුවනො දන්නවුන් විසින් අනුභව කළයුතු භෝජනය සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

## සිවුවැනි පෝතලිය සූත්‍රයයි

## 2.1.5

**එවමෙමසුතං** යනු ජීවකසූත්‍රයයි. එහි **ජීවකසස කොමාරභචචසස අමබවනෙ** යනු මෙහි ජීවත් වේනුයි ජීවකනම්, කුමරුවිසින් පෝෂණය කරනලද්දේයයි **කොමාරභචචනම්** යම්සේ කීයේද දරුවෙනි කපුටන් විසින් වට කොට සිටින මෙය කුමක්ද දේවයන් වහන්ස දරුවෙකි. දරුවෙනි ජීවත්වේද දේවයන් වහන්ස ජීවත්වෙයි. දරුවෙනි එසේ නම් ඒ දරුවා අනතඃපුරයට ගෙනගොස් පෝෂණය කරවන්ට කිරි මවුන්ට දෙවූ. ඔහුට ජීවත්වන්නේයයි ජීවකයයි නමක් තැබූහ. කුමරු විසින් පෝෂණය කරන ලද්දේනුයි කොමාරභච්ච යයි නමක් තැබූහ. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් ජීවකවත්‍ථුක්ඛන්ධකයෙහි දක්විණ. එහි විනිශ්චය කථාවෙද සමන්ත පාසදිකා නම් විනය අටුවාවෙහි කියන ලදී. මේ ජීවක වනාහි එක්කලෙක භාග්‍යවතුන් වහන්සේගේ තුන් දොසින් ලෙඩවුණු ශරීරය සුළු

විරේකයක් කොට සීවෙය්‍යක රෙදිදෙකක් දී වස්ත්‍රානුමෝදනාව අවසන සෝවාන් පෙළෙහි පිහිටා මෙසේ සිතීය. මා දවසට දෙතුන්වරක් බුදු උවටැනට යායුතුයි. මේ දෙවුරම බොහෝ ඈතය. මාගේ අඹ උයන වඩාත් ආසන්නය. මෙහි භාග්‍යවතුන් වහන්සේට විහාරයක් කරවන්නේනම් මැනැවැ හේ ඒ අඹවනයෙහි රාත්‍රිස්ථාන දිවාස්ථාන ලෙන් කුටි මණ්ඩප ආදිය සාදා භාග්‍යවතුන් වහන්සේට සුදුසු ගඳකිළියක් කරවා අඹවනය රියන් දහඅටක් උස තඹපට වණින් පවුරකින් වට කරවා බුදුපාමොක් බික් සඟනට සිවුරු සමග බතින් සතප්වා දක්ෂිණෝදකය වත්කොට විහාරය පැවරීය. ඒ සඳහා කියන ලදී. කෝමාරභච්ච ජීවකගේ අඹවනයෙහි යැයි. **ආරභන්ති** යනු ඝාතනය කරත්. **උද්දිස්සකතං** යනු උදෙසා කරනලද, **පටිච්චකම්මං** යනු තමන් සඳහා කරනලද නැතහොත් **පටිච්චකම්මං** යනු නිමිතිකොට කිරීම යන්නට සමාන වචනයකි. සඳහා කරන ලද කර්මයක් මෙහි ඇතැයි මස් සඳහා කිරීම යයි කියන ලද්දේවෙයි. යමෙක් මෙබඳු මසක් අනුභවකෙරේද හේද ඒ කර්මයට දායාද වෙයි. වධකයාට මෙන් ඔහුටද ප්‍රාණඝාතකර්මය වෙය යන්න ඔවුන්ගේ විශ්වාසයයි. **ධම්මස්සච අනුධම්මං ව්‍යාකරොන්ති** යනු භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද කරුණට අනුකරණයක් කියත් මෙහි කාරණය නම් ත්‍රිකෝටිපරිශුද්ධ මත්ස්‍යමාංශ අනුභවයයි. අනුකරණය නම් අනුකරණය නම් ත්‍රිකෝටි පරිශුද්ධ මත්ස්‍ය මාංශ පරිභෝගයයි. අනුකරණය නම් මහජනයාට එසේ ප්‍රකාශකිරීමය. භාග්‍යවතුන් වහන්සේ උදෙසා කළ දේ යම්හෙයකින් පරිභෝග නොකරන සේක්ද ඒනිසා ඒ කරුණ කිසිසේත් නොවේ. තීර්ථකයන් එසේ ප්‍රකාශකිරීම අනුකරණය නොවේ. **සහධම්මිකො වාදානුවාදෙ** යනු අනුන් විසින් කියන ලද කරුණින් සකාරණව තොපගේ වාදය හෝ අනුවාදය උගතුන් විසින් ගර්හා කළයුතු කරුණ කිසියම් අප්‍රමාදී වූවකුට නොපැමිණෙන්නේඇයි මෙය කියනලදී. කිමෙක්ද සියලු ආකාරයෙන්ම තොපගේ වාදයෙහි ගැරහියයුතු කරුණක් නැද්ද. **අබ්භාචික්ඛන්ති** යනු අභිභවනය කොට කියත් **ඨානෙහි** යනු කරුණින් **දිට්ඨං** නම් භික්ෂුන් සඳහා මුවන් මසුන් මරා ගනු ලබන දෙය දිට්ඨනම් **සුතං** නම් භික්ෂුන් සඳහා මුවන් මසුන් මරා ගන්නාලදයි ඇසූ **පරිසඞ්කිතං** යනු දුටුසැකකළදෙය ඇසූසැක කළයුතු දෙය ඒ දෙකින්ම මිදුණු සැකකළයුතු දෙය යැයි තුන්වැදෑරුම්වේ. මෙහි වනාහි සර්ව සංග්‍රාහික විනිශ්චයයි. මෙහි භික්ෂුහු මිනිසුන් දැල් උගුල්ගත් අත්ඇතිව ගමින් නික්මෙන්නවුන් හෝ වනයෙහි ඇවිදින්නාවුන් දකිති. දෙවැනි දවසයෙහි ඒ

ගමට පිඬු පිණිස පිවිස ඒ භික්ෂූන්ට මත්ස්‍ය මාංශ සහිත පිණ්ඩපාතය ගෙන එත් ඔවුහු මේ භික්ෂුන් සඳහා කරන ලද්දකැයි දැකීමෙන් සැක කරති. මෙය දිට්ඨ පරිසංකිත නම්, එය ගැනීම නොවටී. යමක් එසේ සැක නොකටයුත්තක් නම් එය ගැනීම වටී. ඒ මිනිස්සු ස්වාමීනි කුමක්නිසා නොගන්නේ දැයි විමසා ඒ බව අසා ස්වාමීනි මෙය භික්ෂුන් සඳහා නොකරන ලද්දේය. තමා සඳහා හෝ රජුගේ සේවයෙහි නියුක්තයන් සඳහා කරන ලද්දේයයි ඉදින් කියත්ද එය කැපය භික්ෂූහු දැල් උගුල් ආදිය අතැතිව ගමෙන් නික්මෙන්නවුන් හෝ වනයෙහි හැසිරෙන්නවුන් නොදකිත්ද එහෙත් අසත්ද දෙවැනි දින ඒ ගමට පිඬු පිණිස පිවිසි ඒභික්ෂූන්ට මත්ස්‍ය මාංශ සහිත පිණ්ඩපාතය ගෙන එත්, ඔවුහු භික්ෂුන් සඳහා කරන ලද්දේයි ඇසීමෙන් ඒගැන සැකඋපදවති. මෙය සුතපරිසඞ්කිත නම්. එය ගන්ට නොවටී. යමක් පරිසංකිත නොවේද එය ගන්ට වටී. යම්හෙයකින් ඒ මිනිස්සු ස්වාමිනි කුමක් හෙයින් නොගන්නේදැයි විමසා ඒ බව දැන ස්වාමීනි මෙය භික්ෂුන් සඳහා කරන ලද්දේ නොවේ. තමන්විසින් තමන් සඳහා හෝ රාජපුරුෂයන් සඳහා කරන ලද්දේයයි කියති. එය කැපය. නොදකිත්ද නොඅසත්ද එහෙත් ගමට පිඬුපිණිස පිවිසි භික්ෂූන්ට පාත්‍රය ගෙනගොස් මත්ස්‍යමාංශ සහිත පිණ්ඩපාතය බෙදා ගෙනඑත් මෙය භික්ෂූන් සඳහා කරන ලද්දේ නොවේදැයි ඔවුහු සැක පහළකරති. මෙය තදූභය විමුත්තපරිසඞ්කිත නම් මෙයද ගන්ට නොවටී. යමක් මෙසේ අපරිසංකිතද එය වටී. යම් හෙයකින් ඒ මිනිස්සු ස්වාමීනි කුමක්නිසා නොගන්නේදැයි විමසා ඒ බව අසා ස්වාමීනි මෙය භික්ෂුන් සඳහා කරන ලද්දක් නොවේ අප විසින් තමන් සඳහා හෝ රාජ පුරුෂයන් සඳහා හෝ කරන ලද්දේය. පැවති මස හෝ කැප සරුප් පරිදිම ලැබ භික්ෂුන් සඳහා සම්පාදනය කරන ලද්දේයයි කියත්. එය කැපය මියගියවුන්ගේ ප්‍රේතකෘත්‍ය පිණිස හෝ මගුල්ආදිය සඳහා කරන ලද දෙයෙහිද මේ ක්‍රමය මැයි යම් යම් දෙයක් භික්ෂුන් සඳහාම නොකරන ලද්දේද, යම් තැනක ඒකමතික වෙත්ද ඒ සියල්ල කැපය යම් හෙයකින් එක් විහාරයක භික්ෂුන් උදෙසා කරන ලද්දේ වේනම් ඔවුහු තමන් සඳහා කරන ලදබව නොදනිත්ද, අන් අය දනිත්ද ඔවුන්ට නොවටී. අන් අයට වටී අන්‍යයෝ නොදනිත් ඔවුහු නම් දනිත්. ඔවුන්ට නොවටී. ඔවුහුද තමන් සඳහා කරන ලද්දේයයි දනිත්, සියලු දෙනට නොවටී. සියලු දෙන නොදනිත් සියලු දෙනට වටී. සහ ධම්මිකයන් පස්දෙනකු අතුරින් කිසිවකු සඳහා හෝ උදෙසා පණ නසා ඔහුගේ පාත්‍රය

පුරවා දෙයි. හෙතෙමේද තමා සඳහා කළ බව දනිමින්ම ගෙන අන්භික්ෂුවකට දෙයි. හේ ඔහු කෙරෙහි ශ්‍රද්ධාව නිසා වළඳයි. ඇවැත කාහටද දෙදෙනාටම ඇවැත් නොවේ. යමෙකු උදෙසා කරන ලද්දක් ඔහු නොවැළඳූ බැවින් ඇවැත් නැත. අනෙකාට නොදන්නා බැවින් ඇවැත්නැත. කැප මස් පිළිගැනීමෙන් ඇවැත් නැත. උදෙසා කරන ලද්දේ වූ වද නොදැන වළඳා පසුව දැන ඇවැත් දෙසීමේ කාර්යයක් නැත අකැප මසක් නොදැන වැළඳුවකු විසින් පසුව ඒබව දැන ඇවැත් දෙසිය යුතුය. උදෙසා කරන ලදැයි දැන වළඳන්නහුට ද ඇවැත් සිදුවේ. අකැප මසක් නොදැන වැළඳුවහටද ඇවැත්මය. ඒනිසා ඇවැතට බිය වන්නකු විසින්ද රුව සලකන්නකු විසින්ද විමසාම මස් පිළිගත යුතුය. වළඳන කල්හි විමසා වළඳන්නෙමියි හෝ ගෙන විමසාම වැළඳිය යුතුය. කුමක් හෙයින්ද? දැනගත නොහැකි බැවිනි. වළස් මස උඟුරු මසට සමානය. දිවිමස් ආදිය මුවමස් හා සමානය. ඒ නිසා විමසා ගැනීමම වටනේයයි කියත්

**අදිට්ඨං** යනු භික්ෂූන් සඳහා මරා ගන්නාවිට නොදුටු. **අසුතං** යනු භික්ෂුන් සඳහා මරා ගන්නා ලද්දේයයි නොඇසූ, **අපරිසඞ්කිතං** යනු දිට්ඨ පරිසංකිතආදී වශයෙන් සැක නොකළ. **පරිභොගනතිවදාමි** යනු මේ තුන් කරුණින් පිරිසිදු වූයේ ත්‍රිකෝටි පරිශුද්ධ නම්වේ. එය පරිභෝග කිරීම වනයෙහි හටගත් ආහාරයට ගතහැකි ශාඛ පරිභෝග කිරීම හා සමානය. දෙයක් වළඳන මෛත්‍රී විහාරී භික්ෂුවට දෝෂයක් හෝ වරදක් හෝ නැත. ඒ නිසා එය වැළඳිය යුතුය යයි කියමි යන අර්ථයි. දැන් එබඳු වූ මෙත්තා විහාරී භික්ෂුවකටත් පරිභෝජනය කිරීමේ නිවැරදිබව දක්වන්ට ඉධ ජීවක භික්ඛු යනාදිය කීහ. එහි කිසිවක් නියම නොකොට භික්ඛුයයි කියන ලදී. එසේනම් තමන්ම සඳහා මෙය කියන ලද්දේයයි දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින්, මහා වච්ඡගොත්ත සුත්‍රයෙහි චඞ්කී සුත්‍රයෙහි හා මේ සුත්‍රයෙහි දැයි තුන් තැනෙක තමන් සඳහාම දේශනා කරන ලදී.

**පණීතෙන පිණ්ඩපාතෙන** යනු යට අනඞ්ගණ සුත්‍රයෙහි යම්කිසි මාහැඟි පිණ්ඩපාතයක් වේද එය ප්‍රණීත පිණ්ඩපාතයැයි අදහස් කරන ලදී. මෙහි මාංශ වැළඳීමම අදහස් කරන ලදී. **අගථිතො** යනු තෘෂ්ණාවෙහි නොගැලුණේ **අමුච්ඡිතො** යනු තෘෂ්ණා මූර්ඡණාවෙන් මුසපත් නොවූයේ, **අනජ්ඣාපන්නො** යනු නොවැටී සියල්ල අළලා එක් පහරින්ම ගිලිනු

කැමැත්තේ මෙන් නො වන්නේ ය යන අර්ථයි. **ආදීනවදස්සාවී** යනු එක්රැයකින් උදරපටලයෙහි පැසී නවදොරින් නික්මෙන්නේය යන ක්‍රමයෙන් ආදීනව දන්නේ, **නිස්සරණ පඤ්ඤො පරිභුඤ්ජති** යනු මෙහි අර්ථය නම් ආහාර පරිභෝගයැයි ප්‍රඥාවෙන් පිරිසිඳ වළඳයි යනුයි. **අත්තබ්‍යාබාධාය වා චෙතෙති** යනු ආත්ම දුක පිණිසයයි සිතයි. **සුත මෙතං** යනු පෙර මා විසින් මෙය අසනලදී. මෙය මාගේ ඇසීම් මාත්‍රය මැයි දක්වයි. **සචෙ බො තෙ ජීවක ඉදං සන්ධාය භාසිතං** යනු ජීවකය, මහා බ්‍රහ්මයාගේ විෂ්කම්භන ප්‍රහාණයෙන් ව්‍යාපාද ආදිය ප්‍රහීණ කරන ලදී. එයින් ඔහු මෛත්‍රී විහාරී නම්යැ. මගේ වනාහි සමුච්ඡේද ප්‍රහාණයෙනි, යම්හෙයකින් ඔබට මේ සඳහා කියන ලද්දේද එසේ කල්හි ඔබගේ මේ වචනය අනුදනිමි යන අර්ථයි හේ එය පිළිගත්තේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට සෙසු බ්‍රහ්මවිහාර වශයෙන්ද මත්තෙහි දේශනාව වර්ධනය කරන සේක් **ඉධජීවක භික්ඛු** ආදිය වදාළ සේක. එය නොගැඹුරු අරුත් ඇත්තේ ම ය. **යොබොජීවක** යනු මේ මෙහි හුදු ගැළපීමයි. භාග්‍යවතුන් වහන්සේ මෙතැන දොර වසන සේක. සත්වයන් කෙරෙහි දයාව දක්වනසේක. යම්හෙයකින් යමකුට මෙසේ අදහසක් ඇතිවිය හැකිය. එක් රස පිණ්ඩපාතයක් දී කල්පසියදහසක් සග සැපත් ලබති. යම් කිසිවක් කොට අනුන් මරා හෝ රස පිණ්ඩපාතයක් දිය යුතුය. එය වළක්වමින් **සොබොජීවක තථාගතංවා ජීවක** යමෙක් තථාගතයන් සඳහා ආදිය වදළ සේක. **ඉමිනා පඨමෙන ඨානෙන** යනු මේ පැනවීම් මාත්‍රයෙන්ම පළමු කරුණින්, **ගලප්පවේධකෙන** යනු යොතින් ගෙල බැඳ කැඩුණේ වෙව්ලන ගෙලෙන් **ආරභියමානො** යනු මරනු ලබන්නේ, **අකප්පියෙන ආසාදෙති** යනු වළස් මස් හෝ ඌරුමස් යැයි දිවිමස් මුවමස් යැයි කවා ඔබ මහණ අකැප මසක් කන ලද්දේ යයි ගැටෙයි. යමෙක් දුර්භික්ෂ ආදීන් හි හෝ ලෙඩ නැතිකිරීම සඳහා හෝ වළස් මස ඌරුමස මුවමස් යයි කියා හිතාධ්‍යාශයෙන් කවත්, මෙය ඔවුන් සඳහා නොකියන ලදී. ඔවුන්ට බොහෝ පින්ම වෙයි. **එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි භික්ඛු සංඝඤ්ච ධම්මඤ්ච** යනු මේ එලයට පැමිණි, දත් සසුන් ඇති, දුටු සත්‍ය ඇති ආර්ය ශ්‍රාවක තෙමේ මේ ධර්ම දේශනාවට පිවිසෙමින් ප්‍රසාදය උපදවා ධර්ම කථාවට ස්තුති කරන්නේ මෙසේ කීය. සෙස්ස සියලුතැන් නොගැඹුරු මය.

**පස්වැනි ජීවක සූත්‍රයයි**

## 2.1.6

**එවමෙමසුතං** යනු උපාලි සූත්‍රයයි. එහි **නාලන්දායං** යනු එනම් ඇති නගරයෙහි ඒ නගරය ගොදුරුගම් කොට **පාවාරිකම්බවනෙ** යනු දුසසපාවාරික සිටුගේ අඹ වනයෙහි, එය කාගේ උයනක් විද, හේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව අසා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණේ ඒ උයනෙහි කුටි ලෙන් මණ්ඩප ආදියෙන් සැදුණු විහාරයක් කරවා භාග්‍යවතුන් වහන්සේට පැවරීය. ඒ විහාරය ජීවක අඹ උයන මෙන් පාවාරික අම්බ වන යැයි ප්‍රසිද්ධියට පත්විය. එම පාවාරික අඹ වනයෙහි වැඩ වසන සේක යන අර්ථයි. **දීඝ තපස්සී** යනු දිග බැවින් මෙසේ ලදනම් ඇත්තේ. **පිණ්ඩපාත පටික්කන්තො** යනු පිණ්ඩපාතයෙන් පසු පැමිණියේ ශාසනයෙහි මෙන් බාහිර ආයතනයෙහි පිණ්ඩපාතයයි ව්‍යවහාරයක් නැත.

**පඤ්ඤපෙති** යනු දක්වයි තබයි. **දණ්ඩානි පඤ්ඤාපෙති** යනු මෙය නිගණ්ඨ සමයෙන් විමසන සේක් මෙසේ ඇසූසේක. **කාය දණ්ඩං වචීදණ්ඩං මනො දණ්ඩං** යනු මෙහි මුල් දණ්ඩද්වය ඔවුහු අචිත්තක යයි පනවති, යම්සේ සුළඟ හමනවිට අතු සෙලවෙයි. ජලය සැලෙයි. එහි සිතක් නැත. මෙසේ කාය දණ්ඩය ද අචිත්තක වෙයි. යම්සේ සුළඟ හමනවිට තල්වැට ආදිය ශබ්ද කරයිද ජලය ශබ්දකරයිද. එහිද සිතක් නැත. මෙසේ වචීදණ්ඩය ද අචිත්තකම වේයයි මේ දණ්ඩද්වය අචිත්තකයයි පනවත්. සිතවනාහි මනො දණ්ඩයයි පනවති. ඉක්බිති ඔහුට භාග්‍යවතුන් වහන්සේ වචනයක් ප්‍රතිස්ථාපනය කරනු කැමති සේක් **කිංපන තපස්සී** යන ආදිය වදාළසේක. **කථාවත්ථුස්මිං** යනු මෙහි කථාවම කථාවත්ථුවයි. කථායෙහි පිහිටුවීය යන අර්ථයි. භාග්‍යවතුන් වහන්සේ කුමක්නිසා මෙසේ කළසේක්ද, මෙතෙමේ මේ කථාව රැගෙන ගොස් තමාගේ ශාස්තෲවූ මහා නිගණ්ඨයාට දන්වන්නේ ය. ඔවුන්ගේ අසල උපාලි ගෘහපතියා හුන්නේ මේ කථාව අසා මට වාදයක් ආරෝපණය කිරීමට පැමිණෙන්නේ ය. මම ඔහුට ධර්ම දේශනා කරන්නෙමි. හේ තෙවරක් සරණ යන්නේ ය. අනතුරුව ඔහුට චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කරන්නෙමි. හේ සත්‍ය ප්‍රකාශනය අවසන සෝවාන් පෙළෙහි පිහිටන්නේ ය. අනුන්ට සංග්‍රහ පිණිසම මා විසින් පාරමිතා පූරන ලද්දේය යන අර්ථය දකිමින් මෙසේ කළසේක. කම්මානි

පඤ්ඤපෙසි යනු මෙය නිගණ්ඨයා බුදුසමයෙන් විචාරන්නේ කායකම්ම, වචීකම්ම මනොකම්ම යයි කීය. මෙහි කායද්වාරයෙහි ආදාන ගහණ මුඤ්චන චෝපනත්වයට පත් අෂ්ටකාමාවචර කුසල චේතනා දොළොස් අකුසල චේතනා යනුවෙන් චේතනා විස්ස කාය කම්ම නම් කායද්වාරයෙහි ආදාන ආදියට නොපැමිණ වචීද්වාරයෙහි වචන භේදයට පමුණුවමින් උපන් එම චේතනා විස්ස වචීකම්මනම්. උභයද්වාර චොපනයට නොපැමිණ මනෝ ද්වාරයෙහි උපන් විසිනවයක්වූ කුසලාකුසල චේතනා මනො කම්ම නම් එසේවුවද සංක්ෂේපයෙන් ත්‍රිවිධ කාය දුශ්චරිත කාය කම්ම නම් චතුර්විධ වචී දුශ්චරිත වචීකම්ම නම් ත්‍රිවිධ මනෝ දුශ්චරිත මනො කම්ම නම්, මේ සූත්‍රයෙහි කර්මධුරය ඊළග සූත්‍රයෙහි, පුණ්ණ, මේ කර්ම සතර මා විසින් තමාම දැන සාක්ෂාත් කොට දන්නා ලද්දේයයි මෙසේ එන ලදදේ චේතනා ධුරයයි. යම් තැනක පැවති චේතනා කණ්හ කණ්හ විපාක ආදි භේදය ලබයි. නිර්දේශවාරයෙහි ව්‍යාපාද සහිතවූ කාය සංකාරය රැස් කෙරේනුයි ආදී ක්‍රමයෙන් එය කියන ලද්දේමය. කාය ද්වාරයෙහි පැවති දේ මෙහි කාය කම්ම යනුවෙන් අදහස් කෙරිණ. වචීද්වාරයෙහි පැවැත්තේ වචී කර්මද මනෝ ද්වාරයෙහි පැවැත්තේ මනො කර්මද වේ. ඒනිසා කියනලදී. මේ සූත්‍රයෙහි කර්ම ද ධුරය ද, අනන්තර සූත්‍රයෙහි චේතනා ද යනුවෙන් භාග්‍ය කර්මය ද කර්මයයි පනවන සේක මේ සූත්‍රයෙහි මෙන්. චේතනාව ද එසේය. මහණෙනි මම චේතනාව කර්මයයි කියමි. සිතා කර්ම කෙරේනුයි. චේතනාව මුල්වන බැවිනි. මෙහි අකුසලයට පැමිණ කාය කම්ම, වචීකම්ම මහත්යයි කියන්නේ වෙහෙසව පත් නොවේ. කුසලයට පැමිණ මනොකම්ම මහත් යයි කියන්නේද වෙහෙසව පත් නොවේ එසේම මව මැරීම ආදි කර්ම සතර කයින්ම උපක්‍රම කොට කයින්ම කරයි. නිරයෙහි කල්පයක් සිටිනා සංඝභේද කර්මය වචී ද්වාරයෙන් කරයි. මෙසේ අකුසලයට පැමිණ කාය කාර්මය වචී කර්මය මහත් යයි කියන්නේ වෙහෙසව පත්නොවේ. මේ එක් ධ්‍යාන චේතනාවක් කල්ප අසූසතර දහසක් සගසැපත් ගෙනදෙයි. එක්ම මාර්ග චේතනාව සියලු අකුසල් නසා අර්හත්වය ගන්වයි. මෙසේ කුසලයට පත්ව මනෝ කර්මය මහත්යයි කියන්නේ වෙහෙසට පත්නොවේ. මෙතැන භාග්‍යවතුන් වහන්සේ අකුසලයට පැමිණ මනෝකර්මය මහාසාවද්‍යයයි කියමින් නියත මිථ්‍යාදෘෂ්ටිය සඳහා කියන සේක. එහෙයින් කියන ලදී මහණෙනි මෙසේ මහා සාවද්‍ය වන්නාවූ අන් එකදු දහමක් මිථ්‍යාදෘෂ්ටිය තරම් නොදකින්නෙමි. මහණෙනි වැරදි මිථ්‍යා දෘෂ්ටිය ප්‍රධාන කොට

ඇත්තේයයි දූන් නිගණ්ඨයාද තථාගතයන් වහන්සේ ගියමගට පිළිපන්නේ කිසිදු අර්ථ නිෂ්පත්තියක් නොදකින්නේ ආයුෂ්මත් ගෞතමයනි කිමෙක්ද ආදිය කීය.

බාලකිනියා යනු උපාලිට වනාහි බාලක ලොණකාර ගාම නම් ගමක් ඇත. එයින් අයබදු ගෙන මිනිස්සු ආවාහුය. හේ එවු සගයනි අපගේ ශාස්තෘ මහානිගණ්ඨයාණන් බලන්නෙමුයි ඒ පිරිස විසින් පරිවරන ලද්දේ එහි ගියේය. ඒ සඳහා කියනලදී. **බාලකිනියාපරිසාය** යනු බාලකගමෙහි වසන්නවුන් විසින් යන අර්ථයි. **උපාලිපමුඛාය** උපාලි ජ්‍යෙෂ්ඨකොට ඇති. එහෙත් **බාලකිනියා** යනු ලාබයන් කැමති බැවින්ද බාලයන් බහුල බැවින්ද යන අර්ථයි. **උපාලි පමුඛාය** යනු උපාලි ගෘහපතියාම පමණක් එහි මඳක් නුවණ ඇත්තේය. හේ ඒපිරිසට ප්‍රධානයාය ජ්‍යෙෂ්ඨයාය. එහෙයින්ද **උපාලිපමුඛාය** යන්න කියන ලදී. **හඤ්ද** යනු යෝජනාර්ථයෙහි නිපාතයි. **ඡවො** යනු ලාමක, **ඔළාරිකසස** යනු මහත්වූවහුට **උපනිධාය** යනු ළඟතබා මෙය කියන ලද්දේවෙයි කායදණ්ඩ සමීපයෙහි තබා, මෙය මහත්ය මෙය මහත්මයයි බලමින් ලාමකවූ මනෝදණ්ඩය බබලයිද කොතැනින් බබලයිද නොබබලයිද ළඟතැබීම පමණක්ම ප්‍රමාණවත් නොවේ යයි දක්වයි. **සාධු සාධු භනෙත තපසසී** යනු දීඝ තපස්සීට සාධුකාර දෙන්නේ **භනෙත** යනුවෙන් නාථපුත්‍රයා අමතයි. ස්වාමීනි මෙය මට රුචි නොවේ ස්වාමීනි මෙය රුචිය ස්වාමීනි මෙය මට රුචිනොවේ. **මායාවී** යනු මායාකාරයා ආවටට **නියාමනති** යනු දවටා ගන්නා මායම **ආවටෙතී** යනු දවටා වටකොට ගනී. **ගචඡතවං ගහපති** යනු කුමක් හෙයින් මහානිගණ්ඨයා ගෘහපති වෙත තෙවරක් දක්වාම යවාද දීඝතපස්සී වනාහි පසුබාන්නේ ම ය. මහා නිගණ්ඨයා විසින් භාග්‍යවතුන් වහන්සේ සමග එක් නගරයක් නිසා වාසයකළද භාග්‍යවතුන් වහන්සේ නොදුටුවිරුය. හේ ශාස්තෘන් වහන්සේ සමග වාද කරන්නෙමියි ප්‍රතිඥා දෙන්නෙකි. හේ ඒ ප්‍රතිඥාව ඉවත නොලා බුදුන් දැක්මෙහි අභව්‍යය ඒ නිසා මොහු බුදුන් දැකීම නොලද බැවින් දසබලයන් වහන්සේගේ දර්ශන සම්පත්තියද නෛර්යානික කථා ඇතිබවද නොදන්නේ තුන්වරක් දක්වා යවන්නේමය. දීඝ තපස්සී නම් කලින් කල භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ සිටියි හිඳියි ප්‍රශ්නද අසයි. හේ තථාගතයන්ගේ දර්ශන සම්පත්තියද නෛර්යාණික කථා ඇති බවද දනියි. ඉක්බිති ඔහුට මෙසේ සිතිණ මේ ගෘහපතියා නුවණැත්තේය. ශ්‍රමණ

ගෞතමයන් වෙත ගොස් දැක්මෙහි පැහැදෙන්නේය. නෛර්යාණික කථා අසාද පැහැදෙන්නේ ය. ඉන්පසු නැවත අපගේ සමීපයට නො එන්නේ ය. ඒනිසා තෙවරක් දක්වා පසුබා සිටී. **අභිවාදෙත්‍වා** යනු වැඳ තථාගතයන් වහන්සේ දැක ප්‍රසන්න වූවෝද අප්‍රසන්න වූවෝද බෙහෙවින් වඳිත්මය සුළුපිරිසක් නොවඳිති. ඒනිසා බොහෝ උසස් කුලයෙහි උපන්නේ ගිහිගෙය වසන්නේද වැඳිය යුත්තේ මය. මේ ගෘහපතියා පහත් බැවින්ම වැන්දේය. දර්ශනයෙහි පැහැදුණේය.

**ආගමානුබ්බිධා** යනු මෙහි පැමිණියා නොවේද, **සාධු සාධු භනෙත තපසසී** යනු දීඝතපස්ස සාදුකාරදෙන්නේ ස්වාමීනියි භාග්‍යවතුන්වහන්සේ අමතයි. **සචෙච පතිට්ඨාය** යනු දහයියා ගොඩක සිටවූ කණුවක් මෙන් (නොවී) නොසැලී වචීසත්‍යයෙහි පිහිටා **සියා නො** යනු අපට වන්නේ ය. **ඉධ** යනු මෙලොව **අසස** යනු වන්නේ ය. **සීතොදක පටික්ඛිතෙනා** යනු නිගණ්ඨයෝ සතුන් ඇතැයි සංඥාවෙන් සිසිල්දිය ප්‍රතික්ෂේප කරති. ඒ සඳහා මෙය කියන ලදී. **මනො සත්තානාම දෙවා** යනු මනසෙහි සත්වයෝ ලැගසිටිති. **මනො පටිබද්ධා** යනු යම්හෙයකින් මනසෙන් බැඳුණේ ව කලුරිය කරයි. ඒනිසා මනෝ සත්ව දෙවියන් අතර උපදිතියි දක්වයි. ඔහුට පිත්තජ්වර රෝගය වන්නේ ය. ඒ නිසා ඔහුට උණුදිය බීමට හෝ අත්පා දෝවනය පිණිස හෝ සිරුර සොදා ගැනීම පිණිස හෝ ගෙන එන්නට නොවටී රෝගය වඩාත් බලවත්විය. සිසිල් ජලය සුදුසුය. එවිට රෝගය සුවවෙයි. මොහු වනාහි උණුදියම පරිහරණය කරයි. සිතින් සිසිල් දිය බීමට කැමැත්තේද පරිභෝජනය කිරීමටද කැමැත්තේය. ඔහුගේ මනෝ දණ්ඩය එහිදීම බිඳෙයි. ඔහු කායදණ්ඩය හා වචීදණ්ඩය රක්නෙමියි සිසිල්දිය බොනු කැමැත්තේද පරිභෝග කරනු කැමැත්තේද සිසිල්දිය මට දෙවුයයි කියන්ට උත්සාහ නො කරයි. ඔහුට මෙසේ රකින ලද්දේවුවද කාය දණ්ඩ වචීදණ්ඩ ද චුති හෝ ප්‍රතිසන්ධි අපේක්ෂාකරන්ට නො හැක්කේය. මනෝ දණ්ඩය බිදුණේද චුතියත් ප්‍රතිසන්ධියත් අපේක්ෂා කෙරේමය. මෙසේ ඔහුට භාග්‍යවතුන් වහන්සේ කායදණ්ඩ වචීදණ්ඩ දූර්වලය ලාමකය මනෝ දණ්ඩයම බලවත්ය මහත්යයි කියවා පීය. ඒ උපාසකයාට මෙසේ සිතිණ. මූර්ජාවශයෙන් සිහිය නැතිවූවන්ට ආශ්වාස ප්‍රශ්වාස නො පවතී. චිත්ත සන්තතිය පැවති මතින්ම ඔවුහු මළාහුයයි නොකියත්. යම් කලෙක ඔවුන්ගේ සිත නො පවතීද එකල්හි මළානම්වෙයි. මේවා ඉවතට

ගෙනගොස් දවාලවූ යයි කිවයුතු බවට පත්වෙති. භය දණ්ඩය අක්‍රිය වෙයි යෙදවිය නොහැකිවෙයි. වචී දණ්ඩයද එසේය සිතින්ම ඔවුන්ගේ චුතියද ප්‍රතිසන්ධියද වෙයි. එහෙත් මනෝ දණ්ඩයම මහත්ය. බිඳී ගියද චුතිප්‍රතිසන්ධිය අපේක්ෂා කරන බැවින් මෙයම මහත්ය. අපගේ මහා නිගණ්ඨයාගේ කථාව අනෛර්යාණිකයයි සැලකීය. භාග්‍යවතුන් වහන්සේගේ විචිත්‍රවූ ප්‍රශ්න විසැඳීම අසනු කැමැත්තේ අනුමත කරන්නේ පමණක් නොවේ. **නබො තෙ සනධීයති** යනු ඒවා නොගැටේ **පුරිමෙනවා පච්ඡිමං** යනු කායදණ්ඩය මහත්යයි මේ පූර්ව වචනයෙන් දැන් මනෝදණ්ඩය මහත්ය යන මේ වචනය **පච්ඡිමෙනවා පුරිමං** යනු ඒ පසුවදනින් මේ පෙරවදන නොගැටේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ඔහුට වෙනත් කරුණුද ගෙනහැර දක්වන සේක් කිම කුමක් හැඟීදැයි ආදිය වදළ සේක.

එහි **චාතුයාම සංවර සංවුතො** යනු ප්‍රාණඝාත නොකරයි. ප්‍රාණඝාත නොකරවයි. ප්‍රාණඝාතය අනුමතකරන්නේ නොවේ. නුදුන් දෙය නොගනී. නොදුන් දෙය නොගන්වයි. නුදුන් දෙය ගැනීම අනුමත කරන්නේද නොවේ. බොරු නොකියයි. බොරු නොකියවයි. බොරු කීම අනුමත කරන්නේද නොවේ. පඤ්ච කාමගුණයට ආසිංසන නොකරයි. පඤ්චකාම ගුණයට ආසිංසන නොකරවයි. පංචකාම ගුණයට ආසිංසනය කිරීම අනුමත නොකරන්නේද වේ. මේ සතර වැදෑරුම් සංවරයෙන් සංවරවූයේ මෙහි **භාවිත** යනු පංචකාම ගුණයෝය. **සබ්බවාරිවාරිතො** යනු වැළැක්වූ සියලු ජලය ඇත්තේ ප්‍රතික්ෂේප කළ සියලු සිසිල් දිය ඇත්තේ යන අර්ථයි. හේ වනාහි සිසිල් ජලයෙහි සත්තු ඇතයන හැඟීම ඇත්තෙකි. ඒනිසා එය පරිභෝග නොකරයි. නැතහොත් සියලු ජලයෙන් වැළකුණේ යයි සියලු පාපවාරණයෙන් වාරිත පාප නම්වේ. **සබ්බවාරියුතො** යනු සියලු පාපවාරණයෙන් යුතුය. **සබ්බවාරි ධුතො** යනු සියලු පාප වාරණයෙන් සොලවාහළ පාප ඇත්තෝය. **සබ්බවාරිඵුටො** යනු සියලු පාපවාරණයෙන් ස්පර්ශකරන ලද්දේය. **ඛුද්දකෙ පාණෙ සංඝාතං** ආපාදෙති යනු කුඩා ප්‍රාණීන් වධයට පමුණුවයි. හේ වනාහි ඒකින්ද්‍රිය ප්‍රාණ ද්විඉන්ද්‍රිය ප්‍රාණ යයි පනවයි. වියලිදඬු පරඬැල් ගල්කැට බොරළු පණ ඇත්තවුන්යයි පනවයි. එහි කුඩා දියබිඳු කුඩා ප්‍රාණීහුය. මහත් දිය බිඳු මහාප්‍රාණීහුයයි හැඟීම ඇත්තේය. ඒ සඳහා මෙය කියන ලදී. **කිසම්ං පඤ්ඤපෙති** යනු එහි කිනම්

කොටස් පනවයිද **මනොදණ්ඩසම්ං** යනු ස්වාමීනි මනෝදණ්ඩ කොටසෙහි මෙ උපාසකයා වනාහි කථා කරන්නේම තමාද සැලකීය. අපගේ මහානිගණ්ඨයා අසංචේතනික කර්මය අල්ප සාවද්‍යය. සංචේතනික කර්මය මහා සාවද්‍යයයි පනවා චේතනාව මනෝ දණ්ඩ යයි පනවයි. මොහුගේ කථාව අනෛර්යාණිකය භාග්‍යවතුන් වහන්සේගේ කථාව නෛර්යාණිකය.

**ඉද්ධා** යනු සමෘද්ධිමත් **ඵී** යනු අතිශයින් සමෘද්ධිමත් සියලු සම්පතින් පිරුණාක් මෙන්, **ආකිණ්ණ මනුස්සා** යනු ජනයාගෙන් ගැවසුණු, **පාණා** යනු ඇත්අස් ආදි තිරිසන්ගත සතුන් මෙන්ම ස්ත්‍රීපුරුෂ දරුවන් ආදී මනුෂ්‍ය ජාතියට අයත්වූවෝ **එකමංසඛලං** යනු එක්මස් රැස **පුඤ්ජං** යනු එයටම තවත් වචනයකි. **ඉද්ධිමා** යනු ආනුභාව සම්පන්න. **චෙතොවසිපත්තො** යනු සිතෙහි වසඟබවට පත් **භස්මං කරිස්සාමි** යනු අළුකරන්නෙමි. **කිංහි සොභති එකා ඡවා නාලන්දා** යනු ඒ ගෘහපතියා මෙයද කියමින් ශරීරය සෝදාගෙන මිනිසුන් පනහක් එකම නාලාන්දාව එකම මස්රැසක් කිරීමට නොහැකිවෙත්. ඍද්ධිමත් තැනැත්තා හුදෙකලාව එකම ශ්‍රද්ධාවෙන් අළුකිරීමට සමර්ථ ය. අපගේ මහා නිගණ්ඨයාගේ කථා අනෛර්යාණිකය භාග්‍යවතුන් වහන්සේගේ කථා නෛර්යාණික යයි සැලකීය.

**අරඤ්ඤං අරඤ්ඤභූතං** යනු ගමක් නොවී අරණ්‍යයක්මවී අරණ්‍යය විය. **ඉසීනංමනොපදොසෙන** යනු ඍෂීන් සඳහා කරන ලද කෝපයෙන් ඒ කෝපය නොඉවසන දෙවියන් විසින් ඒ රටවල් විනාශ කරනලදී. ලෞකික ඍෂිවරු ශ්‍රද්ධා ඇතිකරගෙන විනාශවූහයි නො හඟිත් ඒනිසා මේ ලෝකවාදයෙහි සිටම මේ වාදාරෝපණය කරන ලද්දේ යයි දත යුතුය. මෙහි දණ්ඩකී ආරණ්‍ය ආදීන්යෙහි මෙසේ අරණ්‍යවූ බව දත යුත්තේය.

සරභඞ්ග බෝධිසත්වයන්ගේ පිරිස අති විශාලත්වයට ගිය කල්හි කිසවච්ඡ නමැති තවුසා බෝධිසත්වයන්ගේ අතවැසියාවැ විවේක වාසය පතමින් පිරිස හැර ගෝදාවරී නදියෙන් කලිඟු රට දණ්ඩකී අරණ්‍යයෙහි කුම්භපුර නම් නගරය නිසා රජුගේ උයනෙහි විවේකය පුරුදු කරමින් වසයි. සේනාපතියා ඔහුගේ උපස්ථායකයාය. එකල්හි එක් ගණිකාවක් රථයට

නැග ගැහැණුන් පස්දෙනෙකු පිරිවර කොට නගරය බබුලුවමින් හැසිරෙයි. මහජනයා ඇයම බලමින් පිරිවරා හැසිරේ. නුවරවීදි ප්‍රමාණවත් නොවේ. රජ තෙමේ වාකවුළුව හැර සිටියේ ඇය දැක ඒ කවරෙක්දැයි විචාළේය. දේවයන් වහන්ස ඒ ඔබගේ නගරසෝභිනියයි. හේ ඊර්ෂ්‍යා කරමින් කිමෙක්ද මැයගෙන් නගරය හොබනේද. (තමා) බබලන්නේ යයි තනතුර කපාහැරපිය. ඈ එතැන් සිට එක එකා සමග සමහන්ව තනතුර අපේක්ෂාවෙන් එක්දවසක් රජඋයනට පිවිස සක්මන්මග කෙළවර එල්ලෙන එලකය නිසා ගල්පුවරුවෙහි හුන් තවුසා දැක මෙසේ සිතුවාය. මේ තවුසා කිලිටිය. අඳුනින් සැරසුණේද නොවේ. දළි රවුළු බෙහෙවින් වැඩී ඇත. මුව වසා ගෙන රැවුලින් උරය වැසීඇත. කිසිලිදෙක බෙහෙවින් වැඩී ඇත. ඉක්බිති ඇයට දොම්නස ඇතිවිය. මම එක් කරුණක් සඳහා හැසිරෙමි. මේ කාලකණ්ණියා දක්නාලදී. ඇස් දොවන්නට ජලය ගෙනඑවු. ජලය දැහැටි ගෙන්වාගෙන දැහැටිකා තවුසාගේ සිරුරෙහි කෙළබෙටි හළා මුව සේදූජලය තවුසාගේ හිසමත ඉස මාගේ මේ යම් ඇස්වලින් කාලකණ්ණියකු දක්නා ලද්දේද ඒ ඇස් වල පාපය සෝදාහරින ලදී. පවාහිතො යනු නික්මගිය එදවස රජතුමාද සිහිය ලැබ. දරුවෙනි නගරශෝභිනිය කොහිදැයි ඇසීය. දේවයන් වහන්ස මේනගරයෙහිම සිටී ඇයට නියම ස්ථානය දෙවුයයි තනතුර දෙවීය. ඇය පෙර කළ යහකම් නිසා ලද තනතුර තවුසාගේ සිරුරෙහි කෙළගැසීම නිසා ලබන ලද බවට හැඟීමක් ඇතිකරගත්තාය. ඉන් කිහිප දවසකට පසු රජතෙමේ පුරෝහිතයාගේ තනතුරද ආපසු ගත්තේය. හේ නගර ශෝභිනිය වෙත ගොස් සොහොයුරිය කුමක් කොට තනතුර ආපසු ලබුවා දැයි ඇසීය. බමුණ, අන්කිසිවක් කිරීමට නැත. රජුගේ උයනෙහි අඳුන් නොගෑ කාලකණ්ණි හොර තවුසෙක් සිටී. ඔහුගේ සිරුරට කෙළ ගසන්න තනතුර ලබන්නේ යයි කීවාය. සෙහොයුරිය මම එසේ කරන්නෙමියි ඔහු සමීපයට ගොස් අය කියූ අයුරින් සියල්ලකොට නික්ම ගියේය. රජතෙමේද එදවස සිහිලැබ දරුවෙනි බමුණා කොහිදැයි ඇසීය. දේවයන් වහන්ස මේ නගරයේම සිටී මා විසින් නොවිමසා කරන ලද්දකි. ඔහුට එම තනතුර දෙවුයයි දෙවීය. ඔහුද පින්පලයෙන් ලැබ තවුසාගේ සිරුරෙහි කෙළගැසීම නිසා ලබන ලද්දේයයි හැඟීමක් කළේය. ඉන් දින කීපයක් ඉක්මගිය තැන රජුගේ ප්‍රත්‍යන්තය කිපිණ. රජ ප්‍රත්‍යන්තය සංසිඳවමියි සිව්රඟ සෙනග සමග නික්ම ගියේය. පුරෝහිතයා ගොස් රජු

ඉදිරියෙහි සිට මහරජතුමනි ජයවේවායි කියා මහරජ කුමනි ඔබ ජය පිණිස යන්නහු දැයි ඇසීය. එසේය බමුණ. එසේ කල්හි රජඋයනෙහි අඳුන් නොගෑ එක් කාලකණ්ණි හොර තවුසෙක් වසයි. ඔහුගේ සිරුරෙහි කෙළගසන්න. රජ තෙමේ ඔහුගේ වචනය ගෙන ගණිකාව විසින්ද ඔහුවිසින්ද කරන ලද දෙය ඒ අයුරින් සියල්ල කොට අන්තඃපුර ස්ත්‍රීන්ටද මේ හොර තවුසාගේ සිරුරෙහි කෙළ ගසවු යයි අණ කළේය. ඉන්පසු අන්තඃපුරද අන්තඃපුර පාලකයෝද එසේ කළහ. ඉක්බිති රජතෙමේ උයන් දොරටුවෙහි රැකවල් තබ්බවා රජු සමග නික්ම ගියාහු. සියලු දෙනම තවුසාගේ සිරුරට කෙළ නොගසා නික්මෙන්ට නොලබවුයයි අණ කළේය. ඉක්බිති සියලු බළකායද සෙනෙවියෝද ඒ ක්‍රමයෙන්ම තවුසාගේ හිසමතුයෙහි කෙළද දැහැටිද මුවසේදූ ජලයද ගැලූහ. කෙළද දැහැටිද සියලු සිරුර වසාසිටියේය. සෙන්පතියා සියලු දෙයට පසුව අසා මාගේ ශාන්තෘන් වහන්සේ භාග්‍යවත්ය. පුණ්‍යක්ෂේත්‍රය ස්වර්ගයට යන ගිණිපෙළය. මෙසේ ගැහැට කළාහුයයි රත්වූ හදවත් ඇත්තේ මුවින් ආශ්වාස කරමින් වේගයෙන් රජ උයනට පැමිණ එසේ ව්‍යසනයට පත් ඍෂිවරයා දැක කිසිල්ල බැඳ දැතින් දැහැටි දඬු ඉවත් කරවා ඔසවා හිඳුවා දිය ගෙන්වාගෙන නහවා සියලු ඔසු වලින් හා සිව් දැගදින්ද සිරුර තෙමා සියුම් සළුවෙන් හිස ඉදිරියේ ඇඳිලි බැඳ සිටියේ මෙසේ කීය. ස්වාමීනි මිනිසුන් විසින් කරන ලද්දේ අයුත්තකි. මොවුන්ට කුමක්වන්නේද සෙනෙවිය දෙවියෝ තුන් කඩකට බිඳීගොස්ය. ඇතැම්හු රජු නසන්නෙමුයි කියති. ඇතැම්හු පිරිස සමග රජු නසන්නෙමුයි කියති. ඇතැමෙක් රජුගේ විජිතය මුළුමනින් නසන්නෙමුයි කියති මෙසේ කියා තවුසා අල්පමාත්‍රවුද කෝපයක් නොකොට ලෝකයට ශාන්තියම වේවායි කියන්නේ මෙසේ කීය.

අපරාධයක් වෙයි. වරද දෙසිමට දන්නහුට ප්‍රකෘතියෙන්ම වෙයියයි සේනාපති නීතිය සිහිකොට රජු සමීපයට ගොස් රජුවැඳ මෙසේ කීය. මහ රජතුමනි, ඔබ විසින් නිරපරාධීවූ මහත් ඍද්ධි ඇති තවුසා කෙරෙහි කරන ලද අපරාධය බැරෑරුම් කර්මයකි. දෙවියෝ තෙකොටසක්ව බෙදී ගියාහුය. මෙසේ කියතියි සියල්ල දන්වා ක්ෂමා කරවූ කල්හි ප්‍රකෘති තත්ත්වයට පත්වෙයි. රට නොනසන්න මහරජතුමනි තවුසා කමා කරවුව මැනවැයි කීය. රජ තෙමේ තමා කෙරෙහි දොසක් කරන ලදැයි දැක මෙසේ කියයි. කමා නොකරවන්නෙමියි කීය. සෙන්පතියා තෙවරක් දක්වා අයැද නොකැමති

වන්නහුට මෙසේකීය. මහරජතුමනි මම තවුසාගේ බල දනිමි. ඔහු අභූතවාදියෙක් නොවේ. කිපුණේද නොවේ. සත්වයන් කෙරෙහි දයාවෙන් මෙසේකීය. මහරජතුමනි ඔහු කමාකරවා ගනුමැනවි. කමා නොකරවමි. එසේනම් සේනාපති තනතුර අනෙකකුට දෙනුමැනව. මම ඔබගේ අණ පවත්නා තැන නොවසන්නෙමි. එසේනම් ඔබගේ කැමැත්තෙන් යව මම මාගේ සේනාපතියකු සොයාගන්නෙමි. ඉන්පසු සේනාපතියා තවුසා සමීපයට පැමිණ වැඳ ස්වාමිනි කථාකිරීමට එළඹෙමියි කීය. සේනාපතිය, යමෙක් ඔබගේ වචනය අසත්ද ඒ සියලු දෙන බඩු බාහිරාදිය ධනය දෙපාසිව්පාවුන් රැගෙන දින සතක් ඇතුළත පිටත රාජ්‍ය සීමාවට යව. දෙවියෝ අතිශයින් කිපියෝය. ඒකාන්තයෙන් රටට පීඩාවක් කරන්නාහුය. සේනාපතියා එසේ කළේය. රජතෙමේ ගියමතින්ම සතුරන් මර්දනය කොට ජනපදය සන්සිඳවා පැමිණ, ජයකඳවුර පිහිටි තැන හිඳ නගරය පිළිදඟුම් කරවා ඇතුළුනුවරට පිවිසියේය. දෙවියෝ පළමු කොට ජලවැස්සක් වැස්වූහ. මහජනයා සතුටු සිතැත්තෝවූහ. හොරතවුසා අපරාධ කළ කල්පටන් අපගේ රජුට වෘද්ධියක්ම විය. සතුරන් මර්දනය කළේය. පැමිණි දිනයෙහිම වැසි වැස්සේය. දෙවියෝ නැවත සමන්මල් වැස්සක් වැස්වූහ. මහජනයා වඩාත් සතුටු සිතැත්තෝවූහ. දෙවියෝ නැවත ඔසු වැස්සක් වැස්වූහ. ඉන්පසු කහවණු වැස්සක් වැස්වූහ. ඉන්පසු කහවණු ගැන්මට නොයන්නහු යයි හැඳින්නාහු අත්පළඳනා පා පළඳනා ආදී භාණ්ඩ වැස්සක් වැස්වූහ. මහජනයා සත්මහල්පාමතින් බැස අබරණ පළිඳින්නාහු සතුටු සිත් ඇත්තෝ වූහ. හොර තවුසා මත කෙළ හැළීම සුදුසුය. ඔහු මත කෙළ හැළූ තැන්පටන් අපගේ රජුට වෘද්ධියක්ම විය. සතුරන් මැඩීම කරන ලදී. පැමිණි දිනයෙහි පටන් වැසි වැස්සේය. ඉන්පසු සමන්මල් වැස්ස කහවණු වැස්ස වටනාභාණ්ඩ වැස්ස යැයි වැසි සතරක් ඇතිවිය. තුටු වදන් කියමින් රජුට පාපයක් කරන ලද්දේයයි අනුමත කළාහුය. එසමයෙහි දෙවියෝ එක්දහර දෙදහර ආදී නානාප්‍රකාර ආයුධ මස් ලොඹුව මත මස් කපන්නාක් මෙන් මිනිසුන් මත හෙළූහ. ඉන් අනතුරුව ගිනිදලුනැති දුම්නැති කිණිහිරිමල් වණින් යුතු අඟුරු හෙළූහ. ඉන් අනතුරුව කුළුගෙවල් තරම් ගල් ඉන් අනතුරුව මිටින් ගත්කල අත ඉතිරිනොවන තරම් සියුම් වැලි වස්වමින් බඹ අසුවක් උස තලයක් කළහ. රජු ජයගත් තැන, කිසවච්ඡ තවුසා, සේනාපතියා මාතුපෝසකාරාමය යන මනුෂ්‍ය වූවෝ පමණක් නිරෝගී වූහ. ඒ කර්මයෙහි

සම්බන්ධ නොවූ සෙසු තිරිසනුන්ට පැන් බොන තැන්හි පැන් නැතිවිය. තණ උලාකන තැන තණ නැති විය. ඔවුහු යම් තැනක ජලයද යම් තැනෙක තණද තිබේ නම් ඒ කොහිදැයි යන්නාහු සත්වැනිදවස නොපැමිණි කල්හිම පිටත රාජ්‍ය සීමාවට පැමිණියහ. ඒනිසා සරභංග බෝසත්හු මෙසේ කීහ.

**කිසංහි වච්ඡං අවිකිරිය දණ්ඩකී**
**උච්ඡින්න මූලො සජනො සරට්ඨො**
**කුක්කුළනාමෙ නිරයම්හි පච්චති**
**තස්ස ඵුලිඞ්ගානි පතන්ති කායෙ**

ජනයා සහිතරට මුල් සිඳගත්
දණ්ඩකී රජ කිස වච්ජ තවුසා එලවා දමා
කුක්කුල නම් නිරයෙහි පැසේ
ඔහුගේ ඇඟ මතට ගිනි අඟුරු පතිතවේ.

මේ අයුරින් දණ්ඩකීරඤ්ඤය අරණ්‍යයක් වූ බව දත යුතුය. කලිඟු රටෙහි නාලිකීර රජු රජකරවන කල්හි හිමවතෙහි පන්සියයක් තවුසෝ ස්ත්‍රීගන්ධය නොදන්නාහු, අඳුන් වන් ජටා ඇත්තාහු වැහැරි සිවුරු දරන්නාහු වන මුල්පල අනුභව කරන්නාහු වී බොහෝ කලක් ගෙවා ලුණු ඇඹුල් සෙවුනා පිණිස මිනිස්වාසයට බැස පිළිවෙළින් කලිඟුරට නාළිකීර රජුගේ නරගයට පැමිණියාහු ජටා අඳුන් දිවිසම් වැහැරි සිවුරු තබා පැවිද්දන්ට අනුරූප වූ සංයත භාවය දක්වන්නාහු පිඬුපිණිස නගරයට පිවිසියාහුය. මිනිස්සු බුදුන් නූපන් කල්හි තවුස් පැවිද්දන් දැක පැහැදුණාහු හිඳිනාතැන් සංවිධානය කොට අතින් භික්ෂාභාජන ගෙන වඩා හිඳුවා භික්ෂාව සකස්කොට දුන්හ. තවුසෝ කරන ලද බත් කිස ඇත්තාහු අනුමෝදනාව කළහ. මිනිස්සු පහන්සිතින් පින්වතුන් වහන්සේ කොහි යත්දැයි විමසූහ. ඇවැත්නි පහසුකම් ඇති තැනකටයයි කීහ. ස්වාමීනි අන්තැනකට යාමෙන් ප්‍රයෝජනයක් නැත. රජුගේ උයනෙහි වසනු මැනව. අපි උදෑසන අහර ගෙන අවුත් දහම් කතා අසන්නෙමු. තවුසෝ ඉවසා උයනට ගියාහුය. මිනිස්සු පාතරාසය අනුභව කොට පිරිසිදු වස්ත්‍ර හැඳ දහම්

කතා අසන්නෙමුයි කණ්ඩායම් සැදී උයන පිහිටි දෙසට ගියාහුය. රජතෙමේ මතුමහලෙහි සිට එසේ යන්නවුන් දැක උපස්ථායකයාගෙන් ඇසිය. කොල්ලනි නගරවැසියෝ පිරිසුදුවත් හැඳ පිරිසිදු උතුරු සළු ඇතිව උයන දෙසට යති. කිමෙක්ද එහි සැණකෙළියක් හෝ නාටකයක් ඇත්තේදැයි නැත දේවයන් වහන්ස, මොවුහු තවුසන් හමුවෙහි දහම් අසනු කැමැත්තෝ යති. එසේනම් කොල්ලනි මමද යන්නෙමි. මා සමග යත්වා. ගොස් හෙතෙමේ ඔවුන්ට මෙසේ දැන්වීය. රජතුමාද යනු කැමතිය. රජු පිරිවරා යමු යයි. නුවරවැස්සෝ ප්‍රකෘතියෙන්ම සතුටු සිතැතිව අපගේ රජතුමා ශ්‍රද්ධාව නැත්තෙකි. නොපැහැදුණේය. දුශ්ශීලය තවුසෝ ධාර්මිකයහ. ඔවුහු පැමිණ රජතුමාද ධාර්මික වන්නේ යයි වඩාත් සතුටුසිත් ඇත්තෝ වූහ. රජතෙමේ නික්ම ඔවුන් විසින් පිරිවරන ලද්දේ උයනට ගොස් තවුසන් සමග පිළිසඳර කොට එකත්පසෙක හුන්නේය. තවුසෝ රජුදැක විස්තර කීමෙහි දක්ෂවූ එක් තවුසකුට රජුට ධර්මය කියන්නැයි සංඥාවක් දුන්හ. තවුසා පිරිසබලා පඤ්ච වෛරයෙහි ආදීනවද පඤ්ච සීලයෙහි ආනිසංසද කියන්නේ පණ නොනැසිය යුතුය නොදුන් දෙය නොගතයුතුය. කාමයන්හි වැරදිලෙස නොහැසිරිය යුතුය. බොරු නොකිය යුතුය. පරපණනැසීම නම් නිරයට ගෙනයන්නකි. තිරිසන් යෝනියෙහි උපදින්නට හේතුය. ප්‍රේත විෂයට ගෙන යන සුලුය. අදිනනාදානාදිය ද එසේය. පරපණ නසන්නා නිරයේ පැසී මනුෂ්‍ය ලෝකයට පැමිණ විපාක වශයෙන් අල්පායුෂ්ක ඇත්තේවෙයි අදින්නාදානය අල්පභෝග ලැබීමට හේතුය. මිථ්‍යාචාරය බොහෝ සපත්නීන්ගේ වෛරයට හේතුය. මුසාවාදය අභූත චෝදනා ලැබීමට හේතුය. මද්‍යපානය උමතුබවට පත්වීමට හේතුයයි පංච වෛරයන්හි ආදීනව කීය. රජ තෙමේ ප්‍රකෘතියෙන්ම සැදැහැනැත්තේය. දුශ්ශීලය දුශ්ශීලයාට සීලකථාව වැරදි කථාවකි. කණෙහි හුලක් යවන්නාක් මෙන් වෙයි. ඒනිසා හේ මෙසේ සිතීය. මම මොවුන් පිළිගන්නෙමියි පැමිණියේ වෙමි. මොවුහු පැමිණිතැන්පටන් මටම ගටන්නාහු විදින්නාහු පිරිස් මැද කියති. මොවුන්ට කළයුත්ත කරන්නෙමි. හේ දහම් කථාව අවසානයෙහි ආචාර්යවරුනි හෙට දිනයෙහි මාගේ ගෙහි භික්ෂාව ගනුමැනවැයි පවරා ගියේය. හේ දෙවැනි දින මහත් මහත්වූ සැළි ගෙන්වා අසුචියෙන් පුරවා කෙසෙල් පතින් කට බන්දවා ඒ ඒ තැන තැබ්බවීය. ගන මී තෙලෙහි නාගබල ආදී සෙවල මුදුනෙහි පුරවා හිණිමත තැබ්බවීය. එහිම බැඳුණු

කිසිලිඇති මහාමල්ලයන් අතින් මුගුරු ගන්වා තබා මෙසේ කීය. කුළුතවුසෝ බෙහෙවින් මා වෙහෙසටපත් කරවූහ. ඔවුන් පහයෙන් බස්නා කලට සැළිවලින් සෙවල හිණිමත විසුරුවා හිස් මුගුරින් පොලා බෙල්ලෙන් ගෙන හිණ මත දමවූ හිණිපාමුල නපුරු බල්ලන් බැන්දවීය. තවුසෝද ගෙට රජගෙහිදී වළඳන්නෙමුයි ඔවුනොවුන්ට අවවාද දුන්හ. ඇවැත්නි රජගෙයනම් සැක සහිතය බිය සහිතය. පැවිද්දන් විසින් සදොර අරමුණෙහි සංයත විය යුතුය. දුටු දුටු අරමුණෙහි නිමිති නොගතයුතුය. චක්ෂුද්වාරයෙහි සංවරය එළඹවා ගත යුතුය. ඊළඟ දිනයෙහි පිඩුපිණිස හැසිරෙන වේලාව සලකා වැහැරි සිවුරු හැඳ අඳුන් දිවිසම ඒකාංශකොට ජටාකලාපය තබා පාත්‍රය ගෙන පිළිවෙළින් රජගෙදරට නැගුණාහ. රජ නැඟුණු බව දැන අසුචි සැළි මුවින් කෙසෙල් කොළ ඉවත්කරවීය. දුර්ගන්ධය තාපසයන්ගේ නාස්පුඩු විනිවිද ගොස් මොළය කඩාවැටෙන ආකාරයක් විය. මහතවුසා රජු දෙස බැලීය. රජ තෙමේ පින්වත්නි මෙහි ඇතිපමණ අනුභව කරනු, රැගෙනද යනු ඔබට මෙය සුදුසුය. ඊයේ මම ඔබ පිළිගන්නෙමියි ගියෙමි. ඔබ මටම ගටා විද පිරිස් මැද කීවාහුය. ඔබට මෙය සුදුසුය. අනුභව කරනුයි මහතවුසාට හැන්දෙන් අසුචි පිරිනැමීය. තවුසා චීචීයි කියන්නේ නැවතුණේය. ඔබ මෙපමණකින් යවයි හිණිපෙත මුදුනෙහි සෙවල විසුරුවා මල්ලයන්ට ඉඟියක් දුන්නේය. මල්ලයෝ මුගුරුවලින් හිස්පලා ගෙලෙන් ගෙන හිණිපෙතට දැමූහ. එකෙක්වත් හිනිපෙතෙහි සිටින්ට නොහැකිවිය. පෙරලෙමින් හිණිපෙත මුලටම පැමිණියාහුය. පැමිනි පැමිණි අය සැඩ බල්ලෝ පටපට යනුවෙන් සපා කෑහ. යමෙක් නැගිට පලායයිද ඔහුද වළෙහි වැටෙයි එහිදීද බල්ලෝ ලුහුබැඳ කත්මය. මෙසේ ඔවුන්ගේ ඇට සැකිලිම ඉතිරිකළහ. මෙසේ රජතෙමේ තපස් ගුණයෙන් යුතු පන්සියයක් තවුසන් එක්දිනකින්ම ජීවිතයෙන් වෙන් කළේය. ඉක්බිති ඔහුගේ රටෙහි දෙවියෝ පෙර පරිදි වැසිනවයක් වැස්වූහ. ඔහුගේ රාජ්‍යය සැට යොදුනක් උස වැලිතලාවෙන් වසාපුහ. සරභඞ්ග බෝධිසත්වයෝ එහෙයින් මෙසේකීහ.

යො සඤ්ඤතෙ පබ්බජිතෙ අවඤ්ඤය
ධම්මං භණනෙත සමණෙ අදෙසකෙ
තං නාළිකීරං සුනඛා පරත්‍ථ
සඞ්ගම්ම ඛාදන්ති විචාදමානංති

දහම් දෙසනා නිදොස් මහණුන්
දමුණු පැවිද්දන් රැවටු ඒ නාළිකීර රජු
පරලොව සුනඛයෝ එක්ව වෙවුලද්දීම කා දමති.

මෙසේ කළිඟුරට අරණ්‍යවූ බව දත යුතුය. අතීතයෙහි බරණැස් නුවර දිට්ඨමංගලිකා නම් හතළිස් කෙළක් ධනය ඇති සටුහුගේ එකම දියණියකෙනෙක්වූහ. ඇය දකුම්කලුය. ප්‍රසාද ජනකය ඇය රූප භෝග සම්පත් කුලසම්පත් ඇති බොහෝ දෙනකුවිසින් පතනු ලැබුවාය. යමෙක් ඇය තෝරාගනු පිණිස දන්වා එව්නම් ඒ දැක ඔහුගේ ජාතියෙහි හෝ අත්පා ආදියෙහි හෝ යම් තැනෙක දෝසයක් ආරෝපණය කොට කවරෙක්ද මේ නොදන්නා මිනිසා, අචලස්සණයෙක් ආදිය කියා එලවාදමවු මොහු යයි එලවා දමා මෙබන්දක් නම් දුටුවෙමි ඇස් දෙවින්ට දිය ගෙනෙවු යයි සෝදාදමයි. දුටු දුටු දේ විප්‍රකාරයට පත්කොට එලවාදමවතියි ඇයට දිට්ඨමංගලිකායයි නමක් ඇතිවිය. මුලනම් අතුරුදහන් විය. ඈ එක් දවසක් ගඟෙහි දිය කෙළි කෙළින්නෙමියි තොට සරසවා බොහෝ කෑයුතු දෑ පියයුතු දෑ ගැල්පුරා බොහෝ ගඳමල් ආදිය ගෙන වසනලද යානයක නැග ඥාති ගණයා විසින් පරිවරන ලද්දි ගෙන් නික්මුණාය. එසමයෙහි බෝසත්හු සැඩොල් කුලයෙහි උපන්නාහු පිටනුවර සම්ගෙයක වෙසෙත්. ඔහුට මාතංගයයි නමක්විය. හේ සොළොස්වසර ඇත්තේව කිසියම් කරුණක්නිසා ඇතුළුනුවරට පිවිසෙනු කැමැතිව එක් නිල් රෙදිකඩක් හැඳ එකක් අතැබැඳ එක් අතකින් පැසද එක් අතකින් සීනුව ගෙන ආර්යයෙනි ඉවත්වන්න මම සැඩොලෙක්මියි දන්වනු සඳහා එය වයමින් පහත් සිතක් පෙරදැරි කොට ගෙන දුටුදුටුවුන් නමදිමින් නුවරට පිවිස මහ මගට පිළිගන්නේ ය. දිට්ඨමංගලිකා ගණ්ටා නාදය අසා තිරය අතරින් බලන්නි දුරදීම ඔහු එනු දැක ඒ කිමෙක්දැයි ඇසුවාය. මැතිනියෙනි ඒ මාතංගය කුමන අකුසලයක් අපකළාටද, මේ කුමන විපාකයක්ද, මට එළඹ සිටියේ විනාශයක් නේද යපහත් වැඩකට යන්නී සැඩොලකු දැක්කෙමි. සිරුර ගසාදමා පිළිකුල් කරන්නී කෙළ ගසා කිරිමවුන්ට මෙසේ කීවාය. ඉක්මනට ජලය ගෙනෙන්න. සැඩොලෙක් දක්නා ලද්දේය. ඇස් හා නම කියූ මුවත් සෝදාහරින්නෙමියි දොවා රථය නවත්වා සියලු පිළියෙල කළදේ ගෙට පිවිසවා පහයට නැංගාය. සුරා සොඬහුද ඇයගේ උපස්ථායකයෝද

දිටඨමගෙලිකා කොහේද මේ වෙලාවටත් නොපැමිණෙන්නේ ඇයිදැයි අසන්නාහු ඒ පුවත අසා සුරාමස් ගඳමල් ආදි සත්කාර බොහෝය. සැඩොලා නිසා අනුභවකරන්ට නොලැබීමු. සැඩොලා ගනිවු යයි ගියතැන් සොයා නිරපරාධීවූ මාතංග පණ්ඩිතයාට තර්ජනය කොට එම්බල මාතංගය, තා නිසා මේ මේ සත්කාර විඳින්නට නොලැබීමුයි කෙහෙවල්ලෙන් ගෙන බිම හෙළා දණ වැලමිටි ගල් ආදියෙන් ගසා මළේයයන හැඟීමෙන් පාදයෙන් ගෙන අදින්නාහු කසල ගොඩට හැර දැමූහ. මහසත්හු සත් ලැබ අත්පා පිරිමැද මේ දුක කා නිසා ඇතිවීදැයි සිතන්නාහු අන් කිසිවකු නොව දිටඨමංගලිකා නිසා ඇතිවිණ. මම පුරුෂයෙකුනම් ඇය පාමුල හෙලන්නෙමිය සිතා වෙව්ලමින් දිටඨමංගලිකාගේ නිවස දෙර ළඟට ගොස් දිටඨමංගලිකා ලැබුණොත් නැගිටින්නෙමි. නොලැබුණහොත් මෙහිම මරණයයි ගෙම්දුලෙහි වැද හොත්හ. එසමයෙහි දඹදිව මේ ධර්මතාව වෙයි. සැඩොලකු කිපී යමකුගේ ගෙදොර ඉදිරියේ මළේනම් යමෙක් ඒ ගෙයි වසත්ද සියල්ලෝ සැඩොල්වෙති. ගෙමැද  මළකල්හි සියලු ගෙවැසියෝද. දොරටුවෙහි මළකල්හි දෙපස ගෙවල්වල වැසියෝද. මිදුලෙහි මළ කල්හි දූලේ ගෙවල් සත සත බැගින් දාහතරක වැසියෝද සියල්ලෝ සැඩොල් වෙති. බෝසත්හු ගෙම්දුලෙහි වැදහොත්තාහුය. ස්වාමීනි මාතංග ඔබ වහන්සේගේ ගෙමුදුලෙහි වැටී ඇතැයි සිටුවරයාට දැන්වූහ. කොල්ලනි යවු කුමනකරුණක් නිසාදැයි කියා මේ මස්සදී ඔසවා ගනිවු. ඔවුහු ගොස් මේ මස්ස ගෙන නැගිටුවයි කීහ. හේ මම මස්සක් සඳහා නිපන්නේ නොවෙමි. දිට්ඨමංගලිකා නිසා නිපන්නේ වෙමියි කීය. දිට්ඨ මංගලිකාගේ දෝෂය කුමක්ද ඇයි ඇයගේ දොසක් නො දක්නාහුද නිරපාධීවුමම ඇයගේ මිනිසුන් විසින් ව්‍යසනයට පත්කරනු ලැබීමි. ඇය ලැබුණොත් නැගිටින්නෙමි නොලැබ නොනැගිටින්නෙමියි. ඔවුහු ගොස් සිටුවරයාට දැන්වූහ. සිටුවරයා දුවගේ දොස දැන යවු එක් කහවණුවක් දෙවුයයි යැවීය. කහවණුව නොකැමැත්තෙමි කන්‍යාවම කැමැත්තෙමියි කීය. ඒ අසා සිටුවරයාද සිටුබිරියද අපගේ එකම ප්‍රිය දියණියෝය. ප්‍රවේණිය ගෙනයන අන් දරුවෙක් නැතැයි සංවේගයට පත්වුවාහු දරුවනි යවු. කිසියම් අපගේ අසහනකාරී අයෙක් මේ ජීවිතය නැති කරන්නේය මොහු මළකල්හි අපි සියලු දෙන නැසුණෝ වෙමු. ඔහුට ආරක්ෂාව සපයවුයයි පිරිවරා ආරක්ෂාව සපයා කැඳබත් යැවූහ. බත්ද ධනයද යැවූහ. හේ සියල්ල ප්‍රතික්ෂේප කළේය.

මෙසේ එක්දිනක් ගෙවී ගියේය දෙදවසක්, තුන්දවසක් සිව්දිනක් පස්දිනක් ගෙවීගියේය. ඉන්පසු ගෙවල් සතක සතක වැස්සෝ නැගී අවුත්, අපි ඔබ නිසා සෙඩොලුන්වන්නට නොහැක්කෙමු. අප නොනසවු තොපගේ දූරියදී මොහු නැගිටුවවුයයි කීහ. ඔවුහු සියයක් දහසක් මුදල් යැවුහ. හේ ප්‍රතික්ෂේප කළේමය. මෙසේ සදිනක් ගෙවී ගියේය. සත්වැනි දිනයෙහි දූලේ ගෙවල් දහහතරක වැස්සෝ රැස්ව අපි සැඩොලුන් වන්නට නො හැක්කෙමු. ඔබ අකමැත්තෙන් වුවද, අපි ඔහුට දූරිය දෙන්නෙමුයි කීහ. මවුපියෝ සෝහුලින් ඇහුණාහු විසඟුව ඇඳමත වැටුණාහ. දූලේ ගෙවල් දහහතරක වැස්සෝ පහයට නැග සුපිපි කිණිහිරිමල් සහිත අත්තක් කඩන්නාක්මෙන් ඇයගේ සියලු අබරණ ගළවා නියෙන් සීමාන්තය සදා කෙස් බැඳ නිල් සළුවක් අන්දවා අතෙහි නිල් රෙදි කඩක් වෙළා කන්වල ඊයම් තෝඩු පළඳවා තල්කොළ ගොටුවක්දී පහයින් බස්වා දැතින්ගෙන ඔබගේ සැමියා ගෙනයවයි බෝසතුන්ට දුන්හ. නිලුපුල් මලක් වුවද මහත් බරෙකැයි නොඉසිළූ සුකුමාල දූරිය නැගී සිටුව (උට්ඨාහි) ස්වාමීනි යමුයි කීවාය. බෝසත්හු වැතිර සිටිමින්ම මෙසේ කීහ. මම උපට්ඨාහ නම් නොවෙමි. එසේනම් කුමක් කියම්ද ස්වාමීනි. මාතංග ආර්යයන් වහන්ස නැගී සිටිනු මැනැවැයි කියව. ඈ එසේ කීවාය. තිගේ මිනිස්සු මා නැගී සිටීමට නොහැක්කකු කළාහයි. බාහුවෙන් ගෙන නගාසිටුවාපුවයි. ඈ එසේ කළාය. බෝසත්හු නැගිටින්නාක්මෙන් පෙරළී බිමවැටී දිට්ඨමංගලිකාව විසින් නසනලද්දේ වෙමි පළමුව මිනිසුන් ලවා මා තලවා දූන් තමාම තලතියි කෑගැසීය. ආර්යයන් වහන්ස කුමක් කරම්දැයි දැතින් ගෙන නැගී සිටින්නැයි නැගිටුවා හිඳවුවාය. (ගච්ඡාම) යමු ස්වාමීනි ගච්ජයෝනම් කැලෑවේ වෙති. අපි මනුෂ්‍යයෝය. තිගේ මිනිසුන් විසින් අතිශයින් තලනු ලැබීමි. පයින් යාමට නොහැක්කෙමි. පිට තබා මා ගෙන යවයි ඈ නැමී පිට දුන්නාය. බෝසත්හු පිටට නැගුණාහ. ස්වාමිනි කොහි ගෙනයම්ද පිටනුවරට ගෙනයව. ඈ පෙරදිග දොරටුවට ගොස් ස්වාමීනි මෙහි ඔබගේ වසනතැන වේදැයි ඇසුවාය. මේ කොතැනද, ස්වාමීනි පෙරදිගු දොරටුවයි. පෙරදිග දොරටුවෙහි සැඩොල්පුත්තු වසන්නට ලබතියි වසනතැන නොකියාම සියලු දොරටුවෙත ඇවිද්දවුහ. කුමක් හෙයින්ද යත්. භවාග්‍රය තෙක් පැමිණි ඇයගේ මානය හෙළන්නෙමියි. මහජනයා උද්ඝෝෂණය කළහ. ඔබවැනි කෙනෙකුහැර අනෙකෙක් මැයගේ මානය බිඳදමුවෙක් නැතැයි ඈ පැසුළු දොරට පැමිණ ස්වාමීනි මෙහි ඔබගේ වසන තැනදැයි ඇසුවාය. මේ

කොතැනද ස්වාමීනි මේ පැසුළු දොරය. මේ දොරින් නික්මී සම්ගෙය බලමින් යව ඈ එහිගොස් මෙසේ ඇසුවාය. ස්වාමීනි මේ සම්ගෙය ඔබගේ වසනතැනද එසේය. පිටින් බැස සම්ගෙයට පිවිසියේය. එහි හත්අටදවසක් වසන්නාහු සර්වඥභාවය ගවේෂණය කරන්නාවූ වීර්යවත් පුද්ගලයා මෙතෙක් දිනයන්හි ජාති මිශ්‍රණයක් නොකළේය. මහා කුලයෙහි දියණියන් යම්හෙයකින් මා නිසා මහත් යසසට නොපැමිණේද, මම සිව්විසි බුදුවරුන්ගේ අතවැසියෙක් නම් නොවෙමි. මැයගේ පාදොවුනා ජලයෙන් සියලු දඹදිව රජුන්ගේ අභිෂේක කෘත්‍යය කරන්නෙමි. නැවත මෙසේ සිතීය. ගිහිගෙයිවසමින් එය කිරීමට නොහැකිවන්නෙමි. පැවිදිව හැකිවන්නෙමි සිතා ඇය ඇමතීය. දිට්ඨමංගලිකාවෙනි. අපි පෙර තනිව හැසිර කර්මාන්තයක් කර හෝ නොකර ජීවත්වීමට හැකිවිය. දැන්වනාහි අඹුන් පෝෂණයට පිළිපන්නෝ වෙමු. කර්මාන්තයක් නොකොට ජීවත් වීමට නොහැකිය. මා එන තෙක් නොකළකිරෙව යි අරණ්‍යයට පිවිස සොහොන් ආදියෙහි වැරහැලි එකතුකොට ඇඳුමක් හා පොරෝනාවක් කොට ශ්‍රමණ පැවිද්දෙන් පැවිදිව එක්ව හැසිරෙන්නේ ලබනලද කාය විවේක ඇත්තේ කිසුණු පිරියම් කොට අටසමවත් පස් අභිඥ උපදවා දැන් දිට්ඨමංගලිකාවට අවශ්‍ය පරිදි වීමට මට හැකියයි බරණැස දෙසට ගොස් සිවුර පෙරවා පිඬු පිණිස හැසිරෙන්නේ දිට්ඨමංගලිකාවගේ ගේ ඉදිරිපසට ගියේය. ඈ දොරළඟ සිටියහු නො හඳුනන්නී නොකැමතිවන්න ස්වාමීනි මේ සැඩොලන්ගේ වසනතැනකැයි කීවාය. බෝසත්හු එහිම සිටියහ. ඈ නැවත නැවතත් බලන්නී හැඳින අතින් ළයට ගසා හඬමින් පාමුල වැටී මෙසේ කීවාය. ස්වාමීනි එබඳුසිතක් තිබිණි නම් කුමක්හෙයින් මා මහත්වූ යසසින් පහතට දමා අනාත කළසේක්දැයි නානාප්‍රකාරයෙන් වැළප ඇස්පිසිමින් නැගිට භික්ෂා භාජනය ගෙන ගෙතුළ හිඳුවා භික්ෂාව දුන්නාය. මහාපුරුෂයා බත්කිස නිමවා මෙසේ කීය. දිට්ඨමංගලිකාවනි සෝකනොකරව. නොවැළපෙව, මම තිගේ පාදොවුනා ජලයෙන් සියලු දඹදිව රජුන්ගේ අභිෂේක කෘත්‍යය කරවන්ට සමත් වෙමි. මාගේ මේ එකම වචනය කරන්න. නුවරට පිවිස මාගේ සැමියා සැඩොලෙක් නොවේ. මාගේ සැමියා මහාබ්‍රහ්මයා. යයි කැගසමින් සියලු නුවර හැසිරෙන්න. මෙසේ කීකල්හි දිට්ඨමංගලිකා ස්වාමීනි මම ස්වභාවයෙන්ම මුව දොසින් ව්‍යසනයට පත්වීමි. මෙසේ කියන්නට නොහැකිවෙමියි කීවාය.

බෝධිසත්වයන් වහන්සේ මාගේ ගෙහි වසන තී බොරුබසක් ඇසුවිරුද, මම එදාත් බොරු නොකියමි දූන් පැවිදිව කියනුම කවරේද. මම සත්‍යවාදී පුරුෂයෙක්මියි කියා අද අටවක දිනයයි කී මෙයින් සත්දිනක් ගියතැන පොහෝ දිනයෙහි මාගේ ස්වාමීවූ මහාබ්‍රහ්මයා සඳමඩල බිඳගෙන මාගේ සමීපයට එන්නේයයි සියලු නුවර උද්ඝෝෂණ කරවයි කියා ගියහ. ඈ ඒ අදහා තුටුපහටුව දක්ෂ වී උදේහවා නුරට පිවිස එසේ උද්ඝෝෂණය කළාය. මිනිස්සු අතින් අත පහරා බලවූ අපගේ දිටඨමංගලිකා සැඩොල්පුත්‍රයාා මහා බ්‍රහ්මයා කරතියි සිනා නගන්නාහු විහිළුකරත්. දෙවන දිනයෙහිද එසේම උදේහවා පිවිස මාගේ ස්වාමීවූ මහාබ්‍රහ්මයා සඳමඩල බිඳගෙන මාගේ සමිපයට එන්නේයයි උද්ඝෝෂණය කළාය. බමුණෝ මෙසේ සිතූහ. මේ දිටඨමංගලිකාව අතිශයින් දක්ෂව මෙසේ කියයි. සමහරවිට මෙය වන්නේය. එවු අපි දිටඨමංගලිකා වසන තැන පිළිදගුම් කරන්නෙමුයි සම්ගෙහි පිටුපස මුළුමනින් තලවා වැලි විසුරුවාලූහ. ඈද පොහෝදිනයෙහි උදෑසන නුවරට පිවිස අද මාගේ සැමියා එන්නේ යයි උද්ඝෝෂණය කළාය. බමුණෝ මෙසේ සිතූහ. මෑ දුර දෙයක් නොකියයි. අද මහා බ්‍රහ්මයා එන්නේ යයි වසන තැන සංවිධානය කරන්නෙමුයි සම්ගෙය හමදවා කොළපැහැ පත්‍ර එළා මාහැඟි පුටුවක් තබා අලුත් වස්ත්‍රයෙන් වටකොට මත්තෙහි රෙදි වියනක් බන්දවා ගඳමල්දම් එල්ලවාපූහ. ඔවුන් පිළිදගුම් කරද්දීම සූර්යයා බැසගියේය. ඉක්බිති මහාපුරුෂයා සඳ නැගුණු මතින්ම අභිඥාපාදක ධ්‍යානයට සමවැදී නැගිට කාමාවචර සිතින් පිරියම් කොට ඍද්ධි චිත්තයෙන් දොළොස් යොදුන් බ්‍රහ්මාත්මභාවය මවා අහසට නැගී සඳවිමන තුළට පිවිස වනාන්තයෙන් නැගී එන සඳ බිඳගෙන සඳවිමන අතහැර පෙරටුව සිට මහජනයා මා දකිත්වායි අධිෂ්ඨානකළේය. මහජනයා දූක පින්වත්ති. දිටඨමංගලිකාවගේ වචනය සත්‍යයයි මහාබ්‍රහ්මයා එන්නේය. මහාබ්‍රහ්මයා පුදන්නෙමුයි ගඳමල්දම් ගෙන දිටඨමංගලිකාවගේ ගෙය පිරිවරා සිටගත්හ. මහාපුරුෂයා මතුමතින් සත්වරක් බරණැස වටාගොස් මහජනයා දුටුබව දූන දොළොස් යොදුන් ආත්මභාවය හැරදමා මිනිස් පමණම මවා මහජනයා බලාසිටියදීම සම්ගෙයට පිවිසියේය. මහජනයා අපගේ මහා බ්‍රහ්මයා බැස්සේය තිරයක් ගෙනෙවුයයි නිවස මහතිරයෙන් වටකොට පිරිවරා සිටියාහුය. මහා පුරුෂයාද සිරියහන මැඳ හුන්නේය. දිටඨමංගලිකා අසල සිටියාය. ඉක්බිති ඇයගෙන් මෙසේ ඇසීය. දිටඨමංගලිකාවෙනි මේ ඔබගේ ඍතුසමයද එසේය ආර්යයෙනි. මා දූන් පුත්‍රයා ගනුවයි ඇඟිල්ලෙන්

නාභිමණ්ඩලය ස්පර්ශ කළේය. ස්පර්ශයෙන් ඇයට ගැබක් පිහිටියේය. දිටඨමංගලිකා මෙහි මෙපමණකින් ඔබගේ පා දොවුනා ජලය සියලු දඹදිව රජුන්ගේ අභිෂේක ජලය වන්නේය. ඔබ සිටුවයි කියා බ්‍රහ්මාත්ම භාවය මවාගෙන මහා ජනයා බලා සිටියදීම නික්ම අහසට නැග සඳමඬලටම පිවිසියේය. ඈ එතැන්සිට බ්‍රහ්මප්‍රජාපතී නම්වූවාය. පාදොවුනා ජලය ලබන්නෝ නැත. බමුණෝ බ්‍රහ්මප්‍රජාපතිය ඇතුළුනුවර වස්වන්නෙමුයි රන්සිවිගෙයක නංවා සත්වැනි කෙළවර තෙක් අපිරිසිදු ජාතිකයාගේ සිවිගෙය ගන්ට නොදුන්හ. සොළොස් ජාතිමත් බමුණෝ ගත්හ. සෙස්සෝ ගඳමල් ආදියෙන් පුදන්නාහු නගරයට ප්‍රවේශකරවා පින්වත්නි බ්‍රහ්මප්‍රජාපතියට අපිරිසිදු ගෙහි වසන්ට නොහැකිය. ඉඩමක් ගෙන ගෙයක් කරන්නෙමු එය කරවනු ලබන තෙක් මණ්ඩපයෙහි වසාවායි මණ්ඩපයෙහි වස්වාලූහ. එතැන්පටන් ඈසට පෙනෙන දුරසිට වඳිනු කැමැත්තෝ කහවණුවක් දී වඳින්ට ලබති. ඇසෙන දුරින් සිට වඳිනු කැමැත්තෝ සියයක්දී ලබති. අසල ප්‍රකෘති කථාව ඇසෙන තැන සිට වඳිනු කැමැත්තෝ දහසක් දි ලබති. පාපුටුවෙහි හිසතබා වඳිනු කැමැත්තෝ පන්සියයක් දි ලබති. පාදෙවූ දිය පතන්නෝ දස දහසක්දී ලබති. පිටනුවර සිට ඇතුළුනුවර මණ්ඩපය තෙක් එන ඇය ලැබූ ධනය පමණක් කෝටි සියයක් පමණවිය. සියලු දඹදිව කැළඹිණ. එතැන්පටන් සියලු රජවරු බ්‍රහ්ම ප්‍රජාපතියගේ පාදෙවූදියෙන් අත්සෙස් කරන්නෙමුයි සියදහසක් එවා ලැබුවාහුය. මණ්ඩපයෙහි වසත්දීම ප්‍රසූතිය සිදුවිය. මහාපුරුෂයා නිසා ලද කුමරා ප්‍රසාදජනකවිය ලක්ෂණ සම්පන්න විය. බ්‍රහ්මයාට පුතෙක් උපනැයි සියලු දඹදිව ඒකකෝලාහලවිය කුමාරයාට කිරි මැණික් මිල වේවායි ඒ ඒ තැනින් ගෙන ආ ධනය කෝටි සියදහසක් විය. මෙපමණකින් නිවසක්ද පිහිටුවනලදී. කුමරුට නම් තැබීම කරන්නෙමුයි නිවස අලංකාරකර මණ්ඩපයෙහි උපන්බැවින් මණ්ඩව්‍ය යයි නමක් තැබූහ. කුමරුසුවයෙන් වැඩෙමින් ශිල්ප උගන්නා වයසට පත්වූයේ සියලු දඹදිව ශිල්පදන්නෝ ඔහුගේ සමීපයට පැමිණ ශිල්ප උගන්වති. කුමරු ඥනවන්තය ප්‍රඥාවන්තය ඇසූ ඇසූ දෙය මුතු අමුණන්නාක් මෙන් උගනී. ගත්ගත් දේ රන් කළයක බැහූ තෙලක් මෙන් සිටී. යම්තාක් වචනයෙන් පැනනැගුණු දක්ෂතාවක් ඇත්ද එයින් අනුග්‍රහ ලැබූවෝ නම් නැත. බමුණෝ ඔහු පිරිවරා හැසිරෙත්. හේද බ්‍රාහ්මණ භක්තිකයෙක්විය. ගෙහි අසූදහසක් බමුණෝ නිතර අහර අනුභවකරත්. ඔහුගේ ගෙයද දොරකොටුසතක් ඇති මහගෙයක් විය. ගෙවදනාමගුලෙහිදී දඹදිව් වැසියන්

එවූ ධනය කෝටි දහසක් පමණවිය. බෝසත්හු කුමරු ප්‍රමාදීද අප්‍රමාදීදැයි ආවර්ජනා කළහ. ඉක්බිති කුමරු භක්ති බ්‍රාහ්මණකයකු විණැයි යන පුවතදැන යම් තැනෙක දුන් දෙය මහත් ඵල වේ නම් එය ඔහු නොදනී. ඔහු දමනය කරන්නට යමියි සිවුර පොරවා භික්ෂාභාජනය ගෙන, දොරකොටු අතිශයින් බාධක සහිතය. කොටුවෙන් ඇතුළුවීමට නොහැක්කේ යැයි අහසින් ගොස් අසූ දහසක් බමුණන් අනුභව කරන තැන හිස් මිදුලෙහි බැස්සේය. මණ්ඩව්‍යකුමරාද රන් හැන්දක් ගෙන්වාගෙන මෙහි ව්‍යඤ්ජන දෙවු මෙහි බත්දෙවු යයි වළඳවන්නේ බෝසතුන් දැක දඬුකඩකින් පහරලත් නයකුමෙන් කිපී. මේ ගාථාව කීය.

කුතොනු ආගච්ඡසි රුම්මවාසී
ඔතල්ලකො පංසුපිසාචකොව
සඞ්කාර චොළං පටිමුඤ්ච කණ්ඨෙ
කො රෙ තුවං හොසි අදක්ඛිණෙයෙවා

වැරහැලි හැඳගත් තෝ
කොහිසිට ආවෙහිද
මහලු පිශාචයෙක් මෙන්
ගෙලෙහි කසල රෙදිකඩ බැඳ
අරූපී තෝ කවරෙක්ද?

ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ නොකිපී ඔහුට අවවාදකරන්නාහු මෙසේ කිහ.

අන්නං තවයිදං පකතං යසස්සී
තං ඛජ්ජරෙ භොජ්ජරෙ පිය්‍යරෙ ච
ජානාසි මං ත්වං පරදත්තූපජීවී
උත්තිට්ඨ පිණ්ඩං ලභතං සපාකො ති.

යසස් ඇත්තව,
මනාසේ සැකසූ ඒ අහර
හපන්න කන්න බොන්න
මා අනුන් දෙන දෙයින් යැපෙන
සැඩොලකු බව දැනගන්න
ඉඳුල්බත් පිඬක් ලැබුණහොත් මැනවි.

හෙතෙමේ මෙය ඔබ වැන්නන්ට පිළියෙල නොකරන ලද්දේ යයි දක්වන්නේ මෙසේ කීය.

**අනනං ම මයිදං පකතං බ්‍රාහමණානං**
**අත්ත ත්ථියං සද්දහතො මමයිදං**
**අපෙහි එතෙතා කිමවඩ්ඪිතොසි**
**නමාදිසා තුය්හං දදන්ති ජම්මා ති.**

අත්වැඩ අදහන
මගේ මේ අහර
සැකසුණේ බමුණන්ට
මෙතැන සිටින්නේ කිම
ඉවත්වනු මෙතැනින්
උපතින් මවැන්නෝ
නොදෙති තොපවැන්නන්ට දන්

ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ දානය නම් ගුණ ඇති හෝ නැති ඕනෑම අයකුට දිය යුතුය. යම්සේ නිම්නයෙහිද සමතලයෙහිද තැබූ බිජුවට පෘථුවි රසයද ආපොරසයද ලැබ ඇතිවේද එසේ නිෂ්ඵල වන්නක් නම් නැත. මනා කෙතක වපුළ බිජුවටක් මෙන් ගුණවතුන් වෙත මහත්ඵල වෙතියි දක්වන්ට මේ ගාථාව කීසේක.

ඵලෙච නිනෙනච වපනති බීජං
අනූප ඛෙතෙත ඵලමාසසානං
එතාය සඬ්ධාය දදාහි දානං
අප්පෙව ආරාධයෙ දක්ඛිණෙය්‍යෙ ති.

උස්පහත් බිම්වලද - කෙත් අසලද
බිජුවට වපුරති අස්වනු කැමැත්තෝ
දන්ලැබිය යුත්තන් කිහිපදෙනකුට වුවද
ඇරයුම් කොට සැදැහැයෙන් දන්දෙන්න

ඉක්බිති කුමරු ක්‍රෝධයෙන් යටපත් කරනු ලැබ කවරෙක් මේ මුඩු මහණාට එන්නට දෙන ලද්දේදැයි දොර රැකවලුන්ට තර්ජනය කොට

**ඛෙත්තානි මය්හං විදිතානි ලොකෙ**
**යෙසාහං බීජානි පතිට්ඨපෙමි**
**යෙ බ්‍රාහමණා ජාතිමන්තූපපන්නා**
**තානීධ ඛෙත්තානි සුපෙසලානි ති.**

ලොව ඇති කෙත් මා දත් ඒවාය
ඒ කෙත්වල වපුරමි බිජුවට
මා කැමති කෙත් නම්
ජාතිසම්පන්න බමුණෝය.

ගාථාව කියා මේ නින්දිත පුද්ගලයා උණපත්තෙන් තලා ගෙලෙන්ගෙන දොරකොටු සතම ඉක්මවා ගෙනගොස් පිටතට ගෙනයවු යයි කීය. ඉක්බිති මහාපුරුෂයා ඔහුට මෙසේ කීය.

**ගිරිංනඛෙන ඛණසි - අයො දන්තෙහි ඛාදසි**
**ජාතවෙදං පදහසි - යො ඉසිං පරිභාසසිති.**

නියෙන් ගිර සාරව දතින් යකඩ සපව
ගින්දරට පිවසෙව ඉසිවරුන් ගරහන ඔබ

මෙසේ කියා යම්හෙයකින් මොහු මාගේ අතින් හෝ පයින් ගන්වා දුකක් උපදවා ගන්නේනම් බොහෝ අකුසල් කරගන්නේ යයි සත්වයන් කෙරෙහි අනුකම්පාවෙන් අහසට නැගී ඇතුළුවීපියට බැස්සේය. භාග්‍යවතුන් වහන්සේ සර්වඥභාවයට පැමිණ ඒ අර්ථය ප්‍රකාශ කරන සේක් මේ ගාථාව වදාළසේක.

**ඉදං වත්‍වාන මාතඞගො - ඉසි සච්චපරක්කමො**
**අන්තලික්ඛස්මිං පක්කාමි - බ්‍රාහමණානං උදික්ඛතංති.**

සත්‍යයෙන් පරයත් ඉක්මන මාතංග ඉසිවරයා
මෙසේ කියා බමුණන් බලාසිටියදී අහසින් ගියේ නොපෙනී.

එකෙණෙහිම නුවර රක්නා දෙව්වරුන්ගේ දෙටුදෙව්රජ මණ්ඩව්‍යගේ ගෙල හැරවීය. ඔහුගේ මුහුණ පෙරළී පසුපසට හැරිණ. ඇස් හැරවිණ මුවින් කෙළ ගලයි. සිරුර තදවිය හුලක් මත හින්දවූවාක් මෙන්විය. අසූදහසක් පිරිවර යක්ෂයෝ අසූදහසක් බමුණෝද එසේ කළහ. වේගයෙන් ගොස් බ්‍රහ්මප්‍රජාපතියට දැන්වූහ. ඈ කඩිසරව අවුත් ඒ විප්‍රකාරය දැක මේ ගාථාව කීවාය.

**අවෙඨිතං පිට්ඨිතො උත්තමඞගං**
**බාහං පසාරෙති අකම්මනෙය්‍යං**
**සෙතානි අක්ඛීනි යථා මතස්ස**
**කො මෙ ඉමං පුත්තමකාසි එවන්ති.**

හිස පිටුපසට හැරවිණි
වැඩෙහි යෙදවිය නොහැකි අත් දිගහරියි.
මළමිනියක මෙන් ඇස් සුදුය
මපුතුට මෙසේ කෙළේ කවරෙක්ද?

ඉක්බිති ඈයව මෙසේ දැන්වූහ.

ඉධාගමා සමණො රුම්මවාසී
ඔතලලකො පංසු පිසාව කොව
සඞ්කාර චොළං පරිමුඤ්චව කණ්ඨේ
සොතෙ ඉමං පුත්ත මකාසි එවංති

වැරහැලි හැඳගත් මහණෙක්
මහලු පිශාචයෙක් මෙන් මෙහි විත්
කසල රෙදිකඩ ගෙලෙහි බැඳ
පුතුට මෙසේ කළේය.

ඒ බව අසාම ඈ මාගේ යසදායක ආර්යයන් වහන්සේ අනුකම්පාවෙන් පුත්‍රයාගේ ප්‍රමාදීබව දැන ආසේක් වණැයි දත්තාය. ඉන්පසු උපස්ථායක යන්ගෙන් මෙසේ ඇසුවාය.

කතමං දිසං අගමා භූරිපඤ්ඤො
අක්ඛාථ මෙ මාණවා එත මත්ථං
ගන්ත්වාන තං පටිකරෙමු අච්චයං
අප්පෙව තං පුත්තං ලභෙමු ජීවංති.

ඒ මහපැණැතියා කොයිදෙස ගියේද
දරුවෙනි කියවුමට ඔහුවෙත ගොස් අපි
කළපව් හැර ගනිමු පුතු පණ පිටින් ලබනෙමු

ඔවුහු මෙසේ කීහ.

වෙහාසයං අගමා භූරිපඤ්ඤො
පථද්ධුනො පණ්ණරසෙව චන්දෙ
අපි චාපි සො පුරිමං දිසං අගඤ්ජි
සච්චප්පටිඤ්ඤො ඉසි සාධුරූපො ති.

ඒමහ පැණැතියා පසළොස් වක් සඳ මගින්
අහසින් ගියේ වෙයි. සත්‍යවු ප්‍රතිඥ ඇති
සාධුවරයෙක් බඳු ඉසිවරයා පෙරදිග බලා ගියේ වෙයි.

මහා පුරුෂයාද මහවීදියෙහි බට තැන්පටන් මාගේ පාසලකුණ ඇත් අස් ආදීන්ගේ මෙන් අතුරුදන් නොවේවා දිටඨමංගලිකාවට පමණක් පෙනේවා අන්‍යයකුට නොවේවායි අදිටන් කොට පිඬු පිණිස හැසිර යැපෙන පමණ මුසුබත් ගෙන පිටව යන ශාලාවෙහි හිඳ වළදා ඉඳුල්බත් සුඟක් පාත්‍රයෙහිම තැබීය. දිටඨමංගලිකාද පහයෙන් බැස මහවීදියට එන්නී පා සලකුණ දැක මේ මාගේ යසදායක ආර්යයන් වහන්සේගේ පාදයයි පා අනුව ගොස් වැඳ මෙසේ කීවාය. ස්වාමීනි ඔබගේ දාසයා විසින් කරනලද අපරාධය වෙනුවෙන් මට සමාව දුනමැනව. ඔබ වහන්සේ ක්‍රෝධයට පත් වුවෙක් නොවෙත්මය. මාගේ පුත්‍රයාට ජීවිතය දෙනු මැනැවැයි මෙසේද කියා

**අවෙඨිතං පිටඨිතො උත්තමඞ්ගං**
**බාහං පාසා රෙති අකම්මනෙය්‍යං**
**සෙතානි අක්ඛීනී යථා මතස්ස**
**කො මෙ ඉමං පුත්තමකාසි එවංති**

හිස පිටුපසට හැරවිණි
වැඩක නොයෙදිය හැකි අත් දිගහරියි.
මළමිණියක මෙන් ඇස් සුදුය
මපුතුට මෙසේ කෙළේ කවරෙක්ද?

යන ගාථාව කීවාය. මහාපුරුෂයා මෙසේ කිය. අපි මෙබඳුදේ නොකරමු. පැවිද්දකුට හිංසා වෙහෙස කරනු දැක පැවිද්දන් කෙරෙහි ගෞරවය ඇති භූතයක්ෂ දේවතාවන් විසින් කරන ලද්දේ වියහැකිය. ස්වාමීනි හුදෙක් ඔබ වහන්සේට සිතෙහි කෝපයක් නොවේවා. දෙවියන් විසින් කරන ලද්දේ වේවා. ස්වාමීනි දේවතාවෝ වනාහි (සුබමාපයා) පහසුවෙන් පෙර තත්ත්වයට පැමිණෙති. එසේවුවත් ස්වාමීනි මම කෙසේ

පිළිපදින්නෙමිද. එසේනම් ඔබට ඖෂධයක් කියන්නෙමි. මාගේ පාත්‍රයෙහි වළඳා ඉතිරිවූ බත් ඇත. එහි දිය සුඟක් ඉස ඉන් සුඟක් ගෙන ඔබගේ පුත්‍රයාගේ මුඛයට දමන්න. එසේ කරන්නෙමියි බත්ගෙන මහා පුරුෂයා වැඳ ගොස් එපරිද්දෙන් කළාය. මුවෙහි දැමූ පමණින් දෙටු දෙව්රජ ස්වාමීන් තමාම බෙහෙත් කරද්දී අප විසින් කළහැකි කිසිවක් නැතැයි කුමරු පිටත්කර හැරියාහ. හේ පෙරළී කිසිදුකකට නොපැමිණි විරූවකු මෙන් ප්‍රකෘති ස්වරූප ඇත්තේවිය. ඉක්බිති මව ඔහුට මෙසේ කීවාය. බලන්න දරුවා ඔබගේ කුලුපග හිරිඔතප් නැත්තවුන්ගේ විකාරය. ශ්‍රමණයෝ නම් එබන්දෝ වෙත්. දරුව ශ්‍රමණයන් වළඳවන්න. ඉන්පසු ඉතිරිය දියසැළියෙහි දමා සොලවා බමුණන්ගේ මුවතුළ දැම්මවීය. යක්කු එකෙණෙහිම විසිරී පළාගියහ. බමුණෝ පෙරළී නැගුණාහු කුමක් අපගේ මුවෙහි දමන ලද්දේදැයි ඇසුහ. මාතංග ඍෂිවරයාගේ ඉඳුල් බත්ය ඔවුහු සැඩොලාගේ ඉඳුල් අපට කවනු ලැබීය. අපි දැන් අබ්‍රාහ්මණයෝ වීමු. දැන් බමුණෝ නොවෙමු. ශුද්‍රයෝ වෙමු. මේ බමුණෝයයි එකතුවීමක් නොදෙන්නේ. යයි ඉන් පළාගොස් මැද රටට ගොස් මෙධ්‍ය රජුගේ නගරයෙහි අගගාසනතික නම් බමුණෝ අපි වෙමුයි රජගහ නුවර බුදිත්. එසමයෙහි බෝධිසත්වයන් වහන්සේ පාපනිග්‍රහය කරනසේක් මානය ඇත්තවුන් මද නැත්තවුන් කරමින් හැසිරෙති. ඉක්බිති ජාතිමන්ත තවුසා නම් අපහා සමානය. ජාතියෙන් නොවේයයි අන්‍යයන් කෙරෙහි ඉගියක්වත් නොකරයි. බෝසතුන් වහන්සේ ඔහු ගංතෙර වසනු දැක මොහුගේ මානය දුරුකිරීම කරන්නෙමියි එහි ගියහ. ජාතිමන්ත තවුසා ඔහුගෙන් මෙසේ ඇසීය. ජාතිමතෙක්ද? ආචාර්යය මම සැඩොලෙක්මි. ඉවත්වෙව සැඩොල ඉවත්වෙව සැඩොල යටිගඟ වසව උඩු ගඟෙහි ජලය ඉඳුල් නොකරව මැනව ආචාර්යය ඔබ කියූ තැන වසන්නෙමියි යටි ගඟ වසන්නේ ගංජලය උඩුගඟට ගලාවායි අධිෂ්ඨාන කළේය. ජාතිමන්ත තවුසා උදෑසනම ගඟට බැස ජලයෙන් සෝදයි. ජටාව දොවයි. බෝසත්හු දැහැටි කමින් කෙළ පිඩ දියෙහි හෙළයි. දැහැටි දඬුවද එසේම පා කර හරියි. යම්සේ එය අන් තැනක නොරැඳී තවුසාගේම ජටාවෙහි රැඳේද එසේ අධිෂ්ඨාන කළේය. කෙළද දැහැටි දඬුවද තවුසාගේ ජටාහෙිම රැදෙයි. තවුසා මේනම් සැඩොලාගේම වැඩෙකැයි විපිළිසරව ගොස් මෙසේ ඇසීය. එම්බල සැඩොල, මේ ගංගාවේ ජලය තාවිසින් උඩුගඟට යාම සිදු කරන ලද්දේද. එසේය ආචාර්යය එසේනම් තෝ යටිගඟ නොවසව. උඩුගඟ වසව. මැනවි ආචාර්යය ඔබ විසින් කියන ලද තැන

වසන්නෙමියි එහි වසන්නේ ඍද්ධිය නැවත සන්සුන් කළහ. ජලය පෙරගිය පරිදිමවිය. තවුසා නැවත එම ව්‍යසනයටම පැමිණියේය. හේ නැවත ගොස් බෝසතුන් විමසීය. එම්බල සැඩොල තෝ ගංගාවෙහි ජලය කලක් උඩුගඟට යන්නක්ද කලක් යටිගඟට යන්නක් ද කරයිද එසේය ආචාර්යය සැඩොල තෝ සුබ විහරණ ඇති පැවිද්දන්ට සැපසේ වසන්ට නො දෙහිය. මින් සත්වැනි දවසෙහි තාගේ හිස සත්කඩකට පැළේවා. මැනව ආචාර්යය, මම සූර්යයාට නැගෙන්නට ඉඩ නොදෙන්නෙමි. ඉක්බිති මහසත් තෙමේ මෙසේ සිතීය. මොහුගේ ශාපය මොහුගේම හිසමත වැටෙන්නේය. ඔහු රකිමියි සත්වයන් කෙරෙහි දයාව ඇති බැවින් දෙවන දවසෙහි සූර්යයාට නැගෙන්නට ඉඩ නොදුන්නේය. ඍද්ධිමත්හුගේ ඍද්ධිවිෂය අචින්ත්‍යය එතැන්පටන් අරුණෝද්ගමනයක් නොපැනේ. දිවා දින් රෑ පිරිසිඳීමක් නැත. කෘෂි වණික් කර්මයන්හි යෙදෙන්නෙක් නම් නැත. මිනිස්සු මේ යක්ෂාවේශයක් වේදේ මේ භූත දේවතා නාග සුපර්ණ ආවේශයක් දෝයි උපද්‍රවයට පත්වූහ. කුමක් කළයුතුදැයි සිතන්නාහු රජකුලය නම් මහත් ධාන්‍ය ඇත්තකි. ලෝකයාට යහපතක් සිතන්ට හැක්කේයයි එහි යමුයි රජගෙදරට ගොස් ඒ බව දැන්වූහ. රජතෙමේ අසා බියපත්වූවද නොබියවූ අයුරක් පෙන්වා දරුවෙනි, බිය නොවවූ මේ කාරණය ගංතෙරවැසි ජාතිමන්ත තවුසා දන්නේය. ඔහු විමසා නිසැක වන්නෙමුයි අර්ථයෙහි හැසිරෙන කිහිප දෙනකු සමග තවුසා කරා එළඹ කරනලද පිළිසඳර ඇත්තේ ඒ බව විමසීය. තවුසා මෙසේ කීය. එසේය මහරජ එක් සැඩොලෙක් ඇත. හේ මේ ගංගාවේ ජලය කලක් යටිගඟටත් කලක් උඩුගඟටත් යවයි. මා විසින් ඒ බව කියා ඇත. ඔහුගෙන් විමසනුමැනවි. ඔහු ඒ බව දන්නේය. රජතෙමේ මාතඞග ඍෂිවරයා සමීපයට ගොස් ස්වාමීනි, ඔබවහන්සේ අරුණ නැගෙන්නට නො දෙවුදැයි විමසීය. එසේය මහරජ, කුමක් නිසාද ස්වාමීනි, ජාතිමන්ත තාපසයා පැමිණ මා වැඳ කමාකරනු ලැබූකල්හි දෙන්නෙමි මහරජ. රජතෙමේ ගොස් ආචාර්යයෙනි මෙසේ තවුසා කමා කළමැනැවැයි කීය. මහරජ මම සැඩොලා නොවඳිමි ආචාර්යයෙනි එසේ නොකළ මැනවි. ජනපදයෙහි යහපත බලනු මැනවි. හේ නැවත ප්‍රතික්ෂේප කළේමය. රජ බෝසතුන් කරා එළඹ ආචාර්යයෙනි කමා කරවන්ට නොකැමති යයි කීය. තමා නො කරවූ කල්හි මම සූර්යයාමුදා නොහරිමි. රජ මොහු කමා කරවන්ට නොකැමතිය. මොහු කම) නොකළ කල්හි සූර්යයා නොමිදෙයි. අපට මේ තවුසාගෙන් ඇති

එලය කිම ලෝකය බලන්නෙමුයි. දරුවෙනි මේ තවුසා ගනිමු තමා අත්පාගෙන මාතංග ඍෂිවරයාගේ පාමුලට පමුණුවා වැදහොවවා ජනපදයට දයානුකම්පාව නිසා කමා කරවයි කීය. මම වනාහි කමා කෙළ යුත්තකුට කමා කරමි. එසේ වුවත් මොහුගේ කථාව මොහු මතට වැටෙන්නේය. මා සූර්යයා මුදාහළවිට සූර්ය රශ්මිය මොහු මත වැටෙන්නේය. එවිට ඔහුගේ හිස සත් කඩකට පැලෙන්නේය. මොහු ඒ ව්‍යසනයට පත්නොවේවා. මෙහිදී ඔබ මොහු ගෙල පමණ ජලයෙහි බස්වා මහමැටි පිඩක් ඔහුගේ හිසමත තබවු. එවිට මම සූර්යයා මුදා හරින්නෙමි. සූර්ය රශ්මිය මැටිපිඩ මතවැටී එය සත් කඩකට බිඳෙන්නේය. ඉන්පසු ඔහු මැටි පිඩ ඉවත්කර දියෙහි ගිලී අන් තොටකින් නැගී සිටිනුයයි ඔහුට කියන්න. එසේ ඔහුට යහපත වන්නේය. ඒ මිනිස්සු එසේ කරන්නෙමුයි එසේ කළහ. ඔහුටද එසේම යහපත සිදුවිය. හෙතෙමේ එතැන්පටන් ජාතියනම් වැදගත් නොවේ. පැවිද්දන්ගේ අභ්‍යන්තරයෙහි ගුණයම වැදගත් යයි ජාති ගෝත්‍රමානය හැරදමා මාන තැන්තෙක් විය. මෙසේ ජාතිමන්ත තවුසා දමු කල්හි මහාජනයා බෝසතුන්ගේ ශක්තිය දත්හ. මහා කෝලාහලයක් විය. රජතෙමේ තමාගේ නගරයට එනලෙස බෝසතුන් අයැදීය. මහසත්හු පිළිණදී ඒ අසුදහසක් බමුණන් දමනය කරන්නෙමි. ප්‍රතිඥාවද මුදන්නෙමියි මෙයින් රජුගේ නරගයට වැඩියහ. බමුණෝ බෝසතුන් දකම පින්වත්නි මේ මහා චෞරයා පැමිණසිටී. දූත් මොහු මේ සියලු දෙන මාගේ ඉඳුල්බත් කා නොබමුණන් වුහයි අප ප්‍රසිද්ධියට පත් කරන්නේය. එසේ අපට මෙහිද විසුමක් නොවන්නේය. උපක්‍රමශීලීව ඉවත්කරන්නෙමුයි රජු වෙත එළඹ මෙසේ කීහ. මහරජතුමනි. මේ සැඩොල් පැවිද්දා සාධුරූප ඇත්තෙකැයි නොසිතනු මැනවි. මේතෙමේ මහාබලවත් මන්ත්‍රයක් දනී. පොළොව ගෙන එය අහස කරයි. ආකාශ පෘථුවිය දුර සිට ගෙන ළංකරයි. අසල ගංගාව නවත්වා උඩුගගට යන්නක් කරයි. කැමැත්තේනම් පොළොව ඔසවා හෙළන්නට හැක්කේය. අනුන්ගේ සිතනම් සැමකල්හි ගන්නට නොහැකිය. මෙතෙමේ මෙහිදි ප්‍රතිෂ්ඨාවක් ලැබේනම් ඔබ වහන්සේගේ රාජ්‍යයද නසන්නේය. ජීවිතයට අන්තරායක් හෝ වාසයට විනාශයක්හෝ කරන්නේය. මහරජතුමනි අපගේ වචනය පිළිපදින්න. අදම මොහු ඉවත් කිරීමට වටනේය. රජවරුනම් අනුන් විශ්වාස කරන්නෝය. මෙසේ මොහු බොහෝ දෙනකුට කියන ලද ක්‍රමයෙන්ම

නිෂ්ඨාවට ගියේය. බෝසත්හුද නුවර පිඬුපිණිස හැසිර ජලපහසුකම් ඇති තැනෙක මුසුබත් වළඳා රජ උයනට ගොස් නිරපරාධී බැවින් නිසැකවුවාහු මඟුල්ගල් තලයෙහි හුන්හ. අතීතයේ සතළිසක්ද අනාගතයේ සතලිසක්ද වශයෙන් අසූකල්පයක් සිහිකිරීමට සමත් ඥානයට ආවර්ජණය නොවූ බැවින් මොහොතක් කල්හි සිහිය ප්‍රමාණවත් නොවීය. රජතෙමේ අනිකකු නෙඅණවා තමාම ගොස් ආවර්ජනය නොවූ බැවින් ප්‍රමාදයෙන් හුන් මහාපුරුෂයා කඩුවෙන් පහරා දෙකඩ කළේය. මේ රජුගේ විජිතයෙහි අටවරක් ලෝහ මුසු වැස්සක් වැස්සේය. නවවරක් මඩ වැසි වැස්සේය මෙසේ මොහුගේ රටෙහිද වැසි නවයක් වැටිණ. ඒ රජද පිරිස් සහිතව මහානිරයෙහි උපන්නේය. සංකිච්ච පණ්ඩිතයා එයින් කීය.

**උපහච්ච මනං මෙජ්ඣා - මාතඞ්ගස්මිං යසස්සිනෙ**
**සපාරි සජ්ජො උච්ජිනෙනා - මෙජ්ඣාරඤ්ඤංතදා අහුති.**

යසස්වී මාතංග කෙරෙහි
මෙජ්ඣරජ සිත් පහරා
පිරිවර සමග නැසුණු බැවින්
මෙජ්ඣාරණ්‍යය ඇතිවිය.

මෙසේ මෙධ්‍යාරණ්‍යය අරණ්‍යවූ බව දතයුතුය. මාතංග ඍෂිවරයාගේ වශයෙන් එම මාතංගා රණ්‍යය යයි කියන ලදී.

**පඤ්හ පටිභානා** යනු ප්‍රශ්න විසඳීම්. **පච්චනීකාතබ්බං** යනු විරුද්ධ කළයුතු. **අමඤ්ඤිස්සං** යනු විෂමභාගය ගන්නාක් මෙන්විය යන අර්ථයි. **අනුවිච්චකාරං** යනු අනුව දැන සිතා තුලනය කොට කළයුත්ත කරවයි කියන ලද්දේ වෙයි. **සාධුහොති** යනු සොඳුරු වෙයි. ඔබවැන්නවුන් මා දැක මා සරණ යන කල්හි නිගණ්ඨයකු දැක නිගණ්ඨයකු සරණ යන කල්හි කිමෙක්ද මේ උපාලි, දුටුදුටුදේම සරණ යතියි ගර්හාව උපදී. ඒනිසා අනුව දැන කිරීම ඔබ වැන්නවුන්ට මැනැවැයි දක්වයි. **පටාකං පරිහරෙය්‍යුං** යනු ඔවුහු වනාහි මෙබඳු ශ්‍රාවකයකුලැබ අසුවල් නමැති රජහෝ රාජමහා මාත්‍රයෙක් හෝ සිටුවරයෙක්හෝ අපගේ සරණගිය ශ්‍රාවකයෙක් වීයයි පතාකාවක් ඔසවා නගරයෙහි ඝෝෂාකරමින් ඇවිදිත් ඒනිසා අපගේ මහත්බව පහළවන්නේය. යම්හෙයකින් මම මොවුන්ගේ සරණ ගියෙම්දැයි විපිළිසරක් උපදීනම් එයද

හේ මොවුන් මාගේ සරණ ගිය බව බොහෝ දෙනෙක් දනිති. දැන් දූක නැවැත්වීමට යයි නැති කොට ආපසු නොයන්නේය. ඒනිසා පටාකප් පරිහරෙය්‍යුං යයි කීය. ධපාන භූතං යනු පිළියෙල කළ ළිඳක් මෙන් සිටි. කුලං යනු ඔබගේ නිවස දාතබ්බං මඤ්ඤෙය්‍යාසි යනු පෙර මිනිසුන් දසදෙනකු විසිදෙනකු සැටදෙනකු වුවත් පැමිණි කල්හි දූක නැතැයි නොකියා දෙයි. දැන් මා සරණ ගිය කාරණය නිසාම මොවුන්ගේ දියයුතු දෙය නොසිදින්න පැමිණිය ඔවුන්ට දිය යුතුමයයි ඔවදන්දෙයි. සුතංමෙතං භනෙත යනු කොතැනින් අසන ලද්දේද, නිගණ්ඨයන් සමීපයෙන්, ඔවුහු කුලගෙවලදී මෙසේ පවසත් අපි පැමිණි යම්කිසිවකුට දියයුතුයයි කියමු. ශ්‍රමණ භවත් ගෞතමයෝ මටම දන් දියයුතුයයි - පෙ - අනිකුත් ශ්‍රාවකයන්ට දුන් දූය මහත් ඵලයයි කියතියි ඒ සඳහා මේ ගෘහපතියා සුතංමෙතං මා විසින් එය අසන ලදී යයි කීය. ආනුපුබ්බිකථං යනු දානයට පසු ශීලය, ශීලයට පසු ස්වර්ගය. ස්වර්ගයට පසු මාර්ගය මෙසේ අනු පිළිවෙළ කථාව, එහි දාන කථාව යනු මේ දානය නම් සැපයන්ගේනි දානයයි. සම්පත්තීන්ගේ මුලාරම්භයයි. භෝගයන්ගේ ප්‍රතිෂ්ඨාවයි. නොමග ගියහුගේ ක්ෂේම භූමියයි. ආරක්ෂක ස්ථානයයි. යන ස්ථානයයි. සරණයි. මෙලෝ පරලෝවල දානයහා සමාන ආරක්ෂාවක් ප්‍රතිෂ්ඨාවක් අරමුණක් පිළිසරණක් සැඟවෙන තැනක් ගමනක් ආධාරයක් නැත. මෙය වනාහී ආරක්ෂා අර්ථයෙන් රුවන් මුවා සිහසුනක්වන් ප්‍රතිස්ථාන ආර්ථයෙන් මහපොළොව හා සමය. ආරණම් අර්ථයෙන් එල්බෙන කඹයක් හා සමය. මෙය දුකින් එගොඩ කරන අරුතින් නැවක්ය. අස්වසන අර්ථයෙන් සංග්‍රාම ශූරයෙකි. භයින් ආරක්ෂාකරන අර්ථයෙන් මැනවින් සැකැසුණු නගරයකි. මසුරුමල ආදියෙන් නොතැවරුණු අර්ථයෙන් නෙළුම් මලකි. ඒවා දවාලන අර්ථයෙන් ගින්දරය. ළංවිමට අපහසුය යන අර්ථයෙන් ආශීර්විෂයෙකි. නිර්භීතව බාදනය තරන අර්ථයෙන් සිංහයෙකි. බලවත්ය යන අර්ථයෙන් ඇතෙකි. මංගල සම්මතය යන අර්ථයෙන් ධවල අශ්වයෙකි. භූමිය සරුකරන අර්ථයෙන් වලාහක අස්රජකි. දානය නමැති මෙය මා ගිය මඟයි. එය මාගේම වංශයයි. දස පෙරුම්දම් පුරන මාවිසින් වේලාම මහායාගය, මහා ගෝවින්ද මහා යාගය, මහා සුදර්ශන මහායාගය. වෙස්සන්තරමහා යාගය ආදී නොයෙක් මහා යාග පවත්වනලදී. සාවකු වූ මා විසින් දිලුණු ගිනිකඳන් තමා නිවාදමන්නාහු විසින් පැමිණි යාචකයන්ගේ සිත ගන්නාලදී. දානය වනාහි ලෝකයෙහි ශක්‍රසම්පත් දෙයි. මාරසම්පත්,

බ්‍රහ්මසම්පත්. චක්‍රවර්ති සම්පත් ශ්‍රාවක පාරමී ඥානය පච්චෙක බෝධි ඥානය අභිසම්බෝධි ඥානය දෙයි. මේ ආදී වශයෙන් දානයෙහි ගුණ යුත් කථාවයි. දානය දෙන්නේ සීලය සමාදන් වීමටද හැක්කේ කුමක්නිසාදඃ ඒනිසා ඉන්අනතුරුව සීලකථාව කීයඃ සීලකථාවයනු ඃ සීලය නම්වූ මෙය ආරක්ෂාවයි ප්‍රතිෂ්ඨාවයි අරමුණයි ක්ෂේමසථානයයි. සැගවෙන ස්ථානයයි ගමනය පිළිසරණය සීලයනම් වූ මෙය මාගේ වංශයයි. මම සංඛපාල රජකල්හි, භූරිදත්ත නාරජ කල්හි, චම්පෙය්‍යනාරජ කල්හි සීලව නාරජ කල්හි මාතුපොසක ඇත්රජකල්හි ඡද්දන්ත ඇත් රජ කල්හි යනුවෙන් අනන්තවූ ආත්මභාවයන්හි සිල් පිරුවෙ. මෙලෝ පරලෝ සම්පත්තීන් අතර සීලය සමාන ආරක්ෂාවක් නැත. සීලය හා සමාන ප්‍රතිෂ්ඨාවක්නැත අරමුණක්නැත. ක්ෂේමස්ථානයක් නැත. සැගවෙන තැනක් නැත. ගමනක් නැත. පිළිසරණක් නැත. සීලාලංකාරය සමාන අලංකාරයක් නැත. සිල්මල් සමාන මලක්නැත. සිල් සුවඳ සමාන සුවඳක් නැත. සීලාලංකාරයෙන් අලංකෘතවූ සිල්මල් පළඳනාවක් සිල් සුවඳ ආලේපනයක් දෙවියන් සහිත ලෝකය බලන්නේ තෘප්තියට නොයයි. මේ ආදිය සිල්ගුණයුත් කථාවයි. මේ වනාහි සීලය නිසා මේ ස්වර්ගය ලබතියි දක්වන්ට සීලයෙන් අනතුරුව සග්ග කථාව කීය. සගගකථායනු මේ ස්ර්ගය වනාහි ඉෂ්ටය කාන්තය මනාපය, මෙහි නිතරම සන්තෝෂයයි නිතර සම්පත් ලබත්. චාතුර්මහා රාජික දෙවියෝ අනූ ලක්‍ෂයක් අවුරුදු දිව්‍යසැප සහ දිව්‍ය සම්පත්, තාවතිංසදෙවියෝ තිස් කෝටි සැට ලක්‍ෂයක් අවුරුදුද ලබත්. මේ ආදී ස්වර්ගගුණ යුතු කථාව, ස්වර්ග සම්පත් කියන්නාවූ බුදුවරුන්ගේ මුව සමත් නොවේ. කියන ලද්දේද වෙයි. මහණෙනි නොයෙක් ආකාරයෙන් සගග කථා තියන්නේ වුවද බුදුවරුන්ගේ මුව සමත් නොවේ. මෙසේ සගගකථාවට පොළඹවා ඇතු අලංකාරකොට උගේ සොඬ සිඳලන්නාක්මෙන් මේ ස්වර්ගය ද අනිත්‍යය. ස්ථිරනැත එහි ඡන්දරාගය නොකටයුතුයයි දක්වනු පිණිස කාමයෝ අල්පාස්වාද ඇත්තෝය. බොහෝ දුක් ඇත්තෝය. බොහෝ උපායාස ඇත්තෝය මෙහි ආදීනවද බොහෝ යයි ආදී ක්‍රමයෙන් කාමයන්ගේ ආදීනවය පහත්ය. කෙලෙස් සහිතයයි කීහ. එහි ආදීනවො යනු දෝෂයයි. ඔකාරො යනු පහත්ය. ලමක බවෙන් යුතුය. සඞ්කිලෙසො යනු ඒවායින් සත්වයන්ගේ සංසාරයෙහි කිළිටිවීමය. යම්සේ කියන ලද්දේද. පින්වත්නි සත්වයෝ කිළිටිවෙතියි මෙසේ කාමාදිනවයෙන් තර්ජනය කොට නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංස ප්‍රකාශ කළහ.

කලලචිත්තං යනු රෝගී නොවූ සිත **සාමුක්කංසිකා** යනු තමා විසින්ම උසස්සේ සලකනලද, තමාවිසින්ම උදුරා ගත් ස්වයම්භූ ඥානයෙන් දුටු අනන්‍ය සාධාරණයන අර්ථයි. ඒ කුමක්ද? ආර්යසත්‍ය දේශනාවයි. එහෙයින් කියනලදී. දුක, දුකහටගැනීම දුකනැතිකිරීම දුක නැතිකිරීමේ මාර්ගය, විරජං වීතමලං යනු රාගරජස් ආදීන්ගේ අභාවය විරජයි. රාගමල ආදීන්ගේ පහවූ බැවින් වීතමල නම් **ධම්මචක්ඛුං** යනු ඉහත බ්‍රහ්මායු සූත්‍රයෙහි මාර්ග තුනට. චූලලරාහුලොවාද සූත්‍රයෙහි ආශ්‍රවක්ෂයට මේ නමයි. මෙහි සෝතාපත්ති මාර්ගය අභිප්‍රේතයි. එහි උත්පත්ති ආකාර දක්වනු පිණිස. **යං කිඤ්චි සමුදය ධම්මං සබ්බංතං නිරොධධම්මං** යනුවෙන් කීය. එය නිරෝධය අරමුණුකොට කෘත්‍ය වශයෙන් මෙසේ එය සියලු සංඛත ධර්මයන් අවබෝධ කරන්නාටද උපදී. ආර්ය සත්‍ය ධර්මය මොහු විසින් දක්නාලද්දේය යනුවෙන් දිට්ඨධම්මො සෙසු පදයන්හිද මෙම ක්‍රමය මැයි. විචිකිච්ඡාව මොහු විසින් එතර කරන ලද්දේ නුයි **තිණ්ණවිචිකිච්ඡො** විගතවූ කථංකතා මොහුට නුයි **විපාතකථංකථො** විශාරද බවට පත්වූයේනුයි **වෙසාරජ්ජං පත්තො.** ශාස්තෘශාසනයෙහි කිනම් තැනද, ඔහු ගේ පරප්‍රත්‍ය නැත. අන්‍යයාගේ ශ්‍රද්ධාව පිණිස මෙහි නොපවතීනුයි **අපරප්පච්චයො.** සිතින් පිළිගනිමින් අතිශයින් සතුටුව වචනයෙන් ප්‍රශංසාකරමින් **අනුමොදිත්වා ආචරාමි** යනු වසාතබමි. **අනාවට්ටං** යනු නොවසා නොතබනලද්දේ. විවෘත කරනලද්දේ හෙළිදරවූ කරනලද්දේ. **අසෙසාසි බොදිසතපසසී** යනු හෙතෙමේ ඔහු ගියකල්පටන් පණ්ඩිතවූ ගෘහපතියාද ශ්‍රමණ ගෞතමයෝද දර්ශන සම්පන්න වූවෝ නෛර්යාණික කථා ඇත්තාහු ඔහු දර්ශනයෙහිද පහන්වන්නේය ධර්ම කථාවෙහිද පහදින්නේය. පැහැදී සරණ යන්නේය. යන ලද්දේ සරණ යන්නේය ගියේ පමණක් නොව යොමුකළ කන් ඇත්තේම හැසිරෙයි. ඒනිසා පළමුකොටම ඇස්විය. **තෙනහි සම්මා** යනු බලවත් ශෝකයෙන් මැඩුණේ මෙහිම සිටුවයි යන වචනය අසාද යන අර්ථය නොසලකන්නේ දොරටුපල්ලා සමගින් සල්ලාපයෙහි යෙදේමැයි. **මජ්ඣිමාය ද්වාරසාලාය** යනු යම් ගෙයක දොරකොටු සතක් සියලු අභ්‍යන්තරයෙන්ද සියලු බාහිරයෙන්ද පටන් සිව්දොරකොටු යමක පහක් ඇත්ද එයින් තෙවැන්න. යමක තුනක් ඇත්ද එහි දෙවැනි දොර කොටුව මැදදොර කොටුව නම්, එක් දොර කොටුවක් ඇති ගෙයක මධ්‍යස්ථානයෙහි මඟුල්ටැඹ නිසා මැද දොර ශාලාව වේද එම ගෙහි දොරකොටුසත

පසක්යයිද කියන ලදී. අගගං යනු ආදිවූ සියලු එකිනෙක වෙනත්වචන යං සුදං යනු මෙහි යං යනු යම් නාථපුත්‍රයා සුදං යනු නිපාත මාත්‍රයෙකි. **පරිගගහෙත්වා** යනු එම උතුරුසළුවෙන්ම උදරය වටා බැඳ ගෙන, **නිසීදාපෙති** යනු ආචාර්යය, වහා ආචාර්යය වහා යයි මහ තෙල් කළයක් තබන්නාක් මෙන් හිඳුවයි. **දනෙතාසි** යනු කිම මෝඩයෙක් වූයේද යන අර්ථයි. **පටිමුකෙකා** යනු හිස වටකොට ගනුලැබූයේ බිජුවට ගෙනයන්නෙකැයි ආදි දුකුළා වදන්ද, ඇතිව උපස්ථායකයාගේ වෙනස් අසුරෙකින් උපන් බලවත්ශෝක ඇති බැවින් මෙය කියම්යි නොසලකාම කියයි. **භද්දිකා භනෙතා ආවට්ටනී** යනු නිගණ්ඨයා රැවටීමම නිසා උපාසකයා කියයි. තමා අවබෝධකරගත් සෝවාන් මග **තෙනහි** යනු නිපාත මාත්‍රයක්මය. ස්වාමීනි මම ඔබවහන්සේට උපමාවක් කරන්නෙමි. මෙසේ අර්ථවෙයි හේතු අර්ථය හෝවෙයි යව කරුණකින් තොපගේ සසුන අනෛර්යාණිකද මාගේ ශාස්තෘ වරයාගේ සසුන නෛර්යාණිකය ඒ කරුණින් ඔබට උපමාවක් කරන්නෙමියි කියන ලද්දේ වෙයි. **උපවිජඤඤ** යනු වදනකල් පැමිණියේය. **මකකටචඡාපකං** යනු වඳුරුපැටියා **කිණිත්වා** **ආනෙහි** යනු මිලදී ගෙනව. ආපණවල අවිඥානකවූද සවිඥානකවූද වඳුරු ආදී කෙළිබඩු විකුණත්. ඒ සඳහා මෙය කියන ලදී. **රඤජිතං** යනු සනසනවූ පීතවර්ණ ආලේපන අලංකාරණ බඩු ගෙන අලංකාර කොට දෙනලද දෙයට කැමති වෙමි යන අර්ථයි. **ආකොටිතපච්චාකොටිතං** යනු තලන ලද ද පෙරළා නැවත නැවත තලනලද ද **උභතොභාග විමට්ටං** යනු මැණික් ගලින් දෙපස මනාසේ මට කොට ගටා උපදවාගත් සම **රංගකඛමොබො** යනු සවිඥානකවූද අවිඥානකවූද සායම් බොයි. ඒනිසා මෙසේ කීය. **නො ආකොටනකඛමො** යනු සවිඥානක වූවහුට කොටන එලකයෙහි තබා කුසෙහි තලනුලැබූවහුගේ කුස බිඳෙයි. මොළය නික්මෙයි. අවිඥානකය කඩකඩව යයි. ඒනිසා මෙසේ කීය. **නො විමජජනකඛමො** යනු සවිඥානකවූ දෙය මැණික් ගලින් මදිනු ලබනවිට ලොම් නැති බවට සම නැති බවට පැමිණේ අවිඥානකය සුණුවිසුණු බවට පැමිණෙයි. ඒනිසා එය රඞගකඛම යයි කිය. **බාලානං** යනු බාලයන් බුද්ධිහීනයන්ට රංගක්ෂමය රාගමාත්‍රයට දනවයි ප්‍රියවෙයි. නුවණැත්තන්ට නම් නිගණ්ඨවාදය හෝ අන් හෝ භාරත රාමායණාදී නිරර්ථක කථාමාර්ගය අප්‍රියම වෙයි. **නො අනුයොගකඛමො** නො **විමජජ නකඛමො** යනු ගැළැපීමක් හෝ විමර්ශනයක් නො ඉවසයි

බොල් කොටා සහල් සෙවීම මෙන් කෙසෙල් ගසෙහි අරටුව සොයන්නාක් මෙන්ද ශූන්‍ය වෙයි. තුච්ඡ ම වෙයි. **රඞ්ගකම්මො චෙව පණ්ඩිතානං** යනු සිව්සස් කතා නුවණැත්තන්ට ප්‍රියවෙයි. වස් දහසක් ඇසුවද තෘප්තිය නොයයි. ඒනිසා මෙසේ කීය. බුදුවදනම වනාහී යම් යම් අයුරකින් බැසගන්නේද මහසමුදුර මෙන් ගැඹුරුම වෙතියි අනුයොගකම්ම ද, විමජ්ජන කම්මද වෙතියි කීය. **සුණාහි යසසානං සාවකො තසස ගුණෙ සුණාහි** යනු භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කියන්ට අරඹනලදී. **ධීරසස** යනු ධීරං යනු පාණ්ඩිත්‍යයයි. 'යා පඤ්ඤා පජානනා - පෙ - සම්මා දිට්ඨි යම් ප්‍රජානන ප්‍රඥාවක් වේද - පෙ - සම්මාදිට්ඨියයි' - එයින් යුක්තවූ ධාතුආයතන පටිච්චසමුප්පාද ඨානාඨාන පිලිබඳ දක්ෂවූ පණ්ඩිතයාගේ මම සව්වෙක් වෙමි. හේ මාගේ ශාස්තෘවරයා යයි මෙසේ සියලු පදයන්හි සම්බන්ධය දත යුතුය. **පහිනන බිලසස** යනු බිඳුණු පංච චෙතොඛිල ඇති සියලු පුහුදුන් දිනුහ. දිනති, දිනන්නෝය යනුවෙන් විජයා නම්. යම් කෙනෙක් මච්චුමාර කිලෙසමාර දේවපුත්තමාර වෙත්ද ඔවුන් දිනනලද්දේ, මෙයින් දිනන ලද්දේය යයි විජයනම් භාග්‍යවතුන් වහන්සේය. උන්වහන්සේගේ **විජිත විජයසස අනිසසස** යනු කෙලෙස් දුකින් ද විපාක දුකින්ද නිදුක්වූවහු ගේ, **සුසම චිතතසස** යනු දෙවදත්ත, ධනපාල අංගුලිමාල රාහුල තෙරුන් ආදීවූ දෙව්මිනිසුන් අතර මනාසේ සමසිත් ඇති, වුද්ධ සිලස්‍ය යනු වඩනලද ආචාර ඇති, **සාධුපඤ්ඤසස** යනු සොඳුරුපැණ **වෙසසනතරසස** රාගාදී විසම තැන් තරණය කොට සිටි **විමලසස** පහවූ රාගමල ඇති, **තුසිතසස** තුටුසිත් ඇති **වනත ලොකාමිසසස** - වැමැරූ කාම ගුණ ඇති, මුදිතස්ස - මුදිතා විහරණ වශයෙන් මුදිතවූ, පුනරුක්තියක් මය නැතහොත් ප්‍රශංසා වශයෙන් එකම ගුණය නැවත නැවත කියා මයි. **කතසමණසස** ශ්‍රමණභාවය කරන ලද. ශ්‍රමණධර්මය මස්තක ප්‍රාප්ත කරන ලද්දහුම යන අර්ථයි. **මනුජසස** ලෝකව්‍යවහාර වශයෙන් එක් සත්වයකුට නරසස පුනරුක්තියයි. අන් අයුරකින් කියන කල්හි එක් එක් ගාථාවට දසගුණයක් නොපොහොනේය **වෙනයිකසස** සත්වයන් හික්මවන්නවූ **රුචිර ධමමසස** - පවිත්‍ර ධර්මයම **පභඞ්කරසස** - ආලෝකය ඇති කරන්නවූ **විරියසස** වීර්ය සම්පන්නවූ **නිසභසස** උසභ වසභ නිසභ යනතන්හි සැමතැන අප්‍රතිසම නොවන අර්ථයෙන් නිසභයාගේ, **ගමභීරසස** ගැඹුරු ගුණයෙහි. නැතහොත් ගුණයන්ගෙන් ගැඹුරු වූ **මොනපපතතසස** ඥානයට පැමිණි, වේදසස වේද යනු ඥනයයි එයින් යුක්තවූ **ධමමට්ඨසස** ධර්මයෙහි

පිහිටියවූ **සංවුතතතසස** වැසූ ආත්ම ඇති **නාගසස** සිව් කරුණින් නාගවූවහුට, **පනතසෙනාසනසස** හුදෙකලා ශයනාසන ඇති **පටිමනත කරසස** ප්‍රතිමන්ත්‍රණ ප්‍රඥාවෙන් යුක්තවූ **ධොතසස** ධොතයයි කියනු ලබන්නේ ඥානයවයි. එයින් යුක්තතාවූ නැතහොත් සොලවා හළ කෙලෙස් ඇත්වූ **දනතසස** දමුණු **ඉසිසතතමසස** විපසසි ආදී ඉසිවරුන් සඳෙන උදෙසා සත්වැන්නාවූ **බ්‍රහමපපතතසස** ශ්‍රේෂ්ඨත්වට පත්වූ **නහාතකසස** කෙලෙස් සෝදාහළ **පදකසස** අක්ෂර ආදිය ගළපා ගාථාපද බන්ධනයෙහි දක්ෂවූ **විදිත වෙදසස** මැනවින් දත් නැණ ඇති. **පුරිඳදසස** සියල්ලට පළමුව ධර්මදානය දෙන්නාවූ **සකකසස** සමර්ථවූ **පතති පතතසස** පැමිණිය යුතු යම් ගුණවේද ඒවාට පැමිණියාවූ **වෙයාා කරණසස** විස්තර කොට අර්ථය පැහැදිලි කරන්නාවූ භාග්‍යවතුන් වහන්සේවිසින් අව්‍යාකෘත වූ ත්‍රිපිටක ධර්ම පදයක් නම් නැත. සියල්ලෙහිම අර්ථ කියන ලදී. **විපසසිසස** මැනවින් බලන්නාවූ **අනභිනතසස** රහත්වූ, **නො අපනතසස** දූෂිත නොවූ **අනනුගතනතරසස** ක්ලේශයන් විසින් අනුගමනය නොකරනලද **අසිතසස** නොබැඳුණු **භූරිපඤ‌ඤසස** භූරියනු පෘථුවියයි. ඒ පෘථුවිය හා සමාන මහත්වූ විපුලවූ පැතුරුණු ප්‍රඥාවෙන් යුක්තවූ. මහා **පඤ‌ඤසස** මහා ප්‍රඥාවෙන් යුක්ත වූ **අනුපලිතතසස** තෘෂ්ණා දෘෂ්ටි ලේපයන්ගෙන් නොතැවරුණු **ආහුණෙයාසස** ළඟට ගෙන එනුලබන පූජාවන් පිළිගන්ට සුදුසුවූ **යකඛසස** ආනුභාව දර්ශන අර්ථයෙන් ද අදෘශ්‍යමාන අර්ථයෙන් ද භාග්‍යවතුන් වහන්සේ යක්ෂ නමැ ඒනිසා **යකඛසස** යනු කිය මහතො මහත්වූ **සාවකොහමසමි** මම මෙබඳුගුණ ඇති ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවක වෙමි. උපාසකයකුට සෝවාන් මගින්ම පටිසම්භිදාවෝ පැමිණියාහුය. මෙසේ පටිසම්භිදා විෂයෙහි සිට පද සියයකින් දසබලයන්වහන්සේගේ කෙලෙස් ප්‍රහාණයෙහි ගුණ කියන්නේ ගෘහපතිය. අපි කවරකුහට ශ්‍රාවකබව දරමුදැයි ප්‍රශ්නයෙහි අර්ථය විසඳලීය. **කදාසඤ‌ඤදළහා** කවදා සම්පිණ්ඩනය කරන ලද්දේද, ඔහුට මෙසේ සිත්විය. මොහු දැන්ම ශ්‍රමණ ගෞතමයන් කරා ගොස් පැමිණියේවනැ. කවදා මොහු විසින් මේ ගුණ පිඩුකරන ලද්දේද, ඒනිසා මෙසේ කීය. **විචිත්‍රමාලං ගණ්ඨෙයා** තමාද දක්ෂ බැවින් මල්නානාවර්ණ ඇති බැවින්ද එක්කොට නටු වෙන්කොට විසිතුරු මල්දමක් ගොතන්නේය. **එවමෙවබො** මෙහි නොයෙක්මලින්යුත් මල්රැසක් මෙන් නානාවිධවූ ගුණයන්ගෙන් භාග්‍යවතුන් වහන්සේගේ මහමෙර පමණවූ ගුණරැස දැකිය

යුතුය. උපාලිගෘහපතියා දක්ෂ මල් කරුවකුමෙන් මල්කරුවකුගේ විචිත්‍රමල් ගෙතීමක්මෙන්, උපාලි ගෘහපතියාගේ තථාගතයන් වහන්සේ පිළිබඳවූ විචිත්‍ර මල්දම් ගෙතීම ද එසේවෙයි. **උණ්හ ලොහිතං මුඛතො උග්ගඤ්ජි** ඒ භාග්‍යවතුන් වහන්සේගේ සත්කාර නොඉවසන්නහුට මෙසේ සිත්විය මේ ගෘහපතියාගෙන් දැන් ප්‍රයෝජනයක් නැත. අප විසින් හෙට පටන් පනහක් හැටක් මිනිසුන් ගෙන මොහුගේ ගෙට පිවිස අනුභව කරන්නට නොලබන්නෙමි. මාගේ බත්කුඹ බිඳුණේය. ඉක්බිති උපස්ථායකයාගේ වෙනස්වීම නිසා බලවත් ශෝකයක් උපන. මේ සත්වයෝ තමතමාගේ වශයෙන් සිතත්. ඔහුට ඒ ශෝකය උපන් කල්හි අභ්‍යන්තරය උණුසුම් විය. ලේ උණුවිය. එය මහාවාතයෙන් විසිරීයාමට මුදුනෙහි තැබූ සායමක් මෙන් පාත්‍රයක් පමණ මුවින් නැගුණේය. නිඳන්ගත ලේ වමනය කොට ජීවත් වියහැක්කේ සුළු පිරිසකට පමණි. නිගණ්ඨයා එහිම දණින් වැටුණේය. ඉක්බිති ඔහු පල්ලැක්කිය කින් පිටනුවරට ගෙනගොස් සිවිගෙයකින් ගෙන පාවානුවරට ගියාහුය. ඔහු නොබෝකලෙකින් පාවාහිදී කළුරිය කළේය.

මේ සූත්‍රයෙහි උග්ඝටිතඤ්ඤ පුද්ගලයාගේ වශයෙන් ධර්මදේශනාව නිම කරන ලදී.

**සවැනි උපාලි සූත්‍රයයි.**

## 2.1.7

**එවමෙමසුතං** යනු කුක්කුරවතිය සූත්‍රයයි. එහි **කොලියෙසු** යන එනම් ඇති ජනපදයෙහි. එයද හුදෙක් කොලනගරයෙහි පිහිටි කෝලිය රජකුමරුන්ගේ නිවාසස්ථානය බැවින් මෙසේ කියනු ලැබේ. ඒ කෝලිය ජනපදයෙහි **ගලිද්දවසනං** ඒ නියම්ගම නිර්මාණය කරනලද කල්හි පීතවර්ණ වස්ත්‍ර හැඳගත් මිනිස්සු නැකැත් කෙළි කෙළියහ. ඔවුහු නැකැත් කෙළි කෙළවර ගඟ අසල නියම්ගමට නම් තබන්නේ හලිද්දවසන යයි නමක් කළහ. එය ගොදුරුගම කොට වාසය කෙරේ යන අර්ථයි. මෙහි විහාරයයි කිසිවක් නියමිත කොට නැත. එහෙත් බුදුවරුන්ට සුදුසු සෙනසුනෙහිම වාසය කළසේකැයි දතයුතුයි.

ගොවතිකො ගවයකුමෙන් හැසිරෙන්නෙක් හිසෙහි අං තබා වලිගයක් බැඳ එසේ හැසිරෙන්නියක සමග තණ කමින් හැසිරේ. අචෙලකො නග්න. නිර්වස්ත්‍ර සෙනියො ඔහුගේ නම කුකකුරවතිකො බල්ලකුමෙන් හැසිරෙන්නා සියලු සුනඛ ක්‍රියා කරයි. මේ දෙදෙනාම වැලිකෙළියේ පටන් යහළුවෝය. කුකකුරොව පලිකුජ්ජිත්වා සුනඛයා නම් ස්වාමීයාගේ සමීපයෙහි හිඳිමින් දෙපසින් බිම සූරා සුනඛ හඬින් බුරමින් හිඳියි. මෙතෙමේද සුනඛක්‍රියා කරන්නෙමියි භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුව දෙඅතින් බිම සූරා හිස සලමින් බුඃබුඃ හඬ නගා අත්පා හකුළුවා සුනඛයකු මෙන් හුන්නේය. ඡමානික්ඛිත්තං බිම තැබූ. සමත්තං සමාදිණ්ණං සම්පූර්ණ කොට ගන්නා ලද. කාගති කවර නිෂ්පත්තියක්ද කො අභිසම්පරායො මරණින් මතු කවර තැනක ඉපදුණේද අලං ඔහුට අප්‍රිය වෙතියි තෙවරක් පසුබායි කුකකුරවතං සුනඛවූතසමාදානය. භාවෙති වඩයි. පරිපුණ්ණං අනූන අබ්බොකකිණ්ණං නිරතුරු කුකකුරසීලං - සුනඛහැසිරීම කුකකුරචිත්තං අදපටන් සුනඛයින් විසින් කළයුතුදෑ කරන්නෙමියි මෙසේ උපන් සිත. කුකකුරාකප්පං සුනඛයන්ගේ ගමන ආකාරයක් ඇත. සිටින ආකාරයක් ඇත. හිඳින ආකාරයක් ඇත. නිදන ආකාරයක් ඇත. මළමුත්‍ර පහකරන ආකාරයක් ඇත. අන් සුනඛයන් දැක දත් විරවා ගමන්කරන ආකාරයක් ඇත. මෙය කුකකුරාකප්ප නම්. එය කරයි යන අර්ථයි. දෙවො ශක්‍රසුයාම ආදීන්ගෙන් එක්අයෙක්. දෙවඤ්ඤතරො ඔවුන්ගේ දෙවැනි තෙවැනි ආදී තැන්වල සිටින එක්තරා දෙවියෙක් මිච්ඡාදිට්ඨි අදේවලෝකවලට යන මගම දෙව්ලොවට යන මගයයි ගෙන උපන් බැවින් එය ඔහුට මිථ්‍යාදෘෂ්ටිය නම් වේ. අඤ්ඤතරගතිං වදාමි ඔහුට නිරයෙන් බැහැර හෝ තිරිසන්යෝනියෙන් බැහැර අතික් ගමනක් නැත. ඒනිසා එසේකීය. සමපජ්ජමානං දෘෂ්ටියෙන් මුසු නොවී සපල වූයේ නම් නාහං භනෙත එතං රොදාමි ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් මට කියන ලදද, මම භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකාශය ගැන නොහඬමි නො වැළපෙමි. අදෝනා නොකියමි යන අර්ථයි මෙසේ සකර්මක වශයෙන් අර්ථය දත යුතුය. කඳුළු හෙළන මතින් නොවේ.

මතංවා අමම රොදනති - යො වා ජීවං න දිසසති
ජීවනතං අමම පසසනති - තසමා මං අමම රොදසීති.

මැණියනි,
මියගිය අයකුගැන හඬත්
යමෙකුට ජිවත් වන්නකු නොපෙනේද
මැණියනි,
ජිවත්වන්නකු බලත්,
ඒ නිසා මාගැන හඬයිද?

මෙයද මෙහි යෙදුමෙකි. **අපිච මෙඉදං හනෙන** එසේවුවත් ස්වාමීනි මා කුක්කුරව්‍රතය බොහෝකලක් අනුගමනය කළත් එහි නියැලී සිටියත් දියුණුවක් නැත. නියැලී නො සිටියත් මෙසේ මෙපමණ කල් මාවිසින් කරන ලද දෙය හිස් වීයයි තමාගේ විපත්තිය සිහිකරමින් හඬමි ස්වාමිනි. **ගොවතං** ආදිය කුක්කුරව්‍රත ආදියෙහි කියනලද ක්‍රමයෙන්ම දතයුතුය. **ගොකප්පං** - ගවආකල්පය සෙස්ස සුනඛ ආකල්පයෙහි කියන ලද පරිදිමය. යම්සේ එහි අන් සුනඛයන් දුක කන් ඔසවා ගමන් කරන ආකාරය දතයුතුය. සෙස්ස එබඳුය. **චත්තාරිමානි පුණ්ණ කම්මානි** මේ දේශනාව ආරම්භ කළේ කුමක් නිසාද, මේ දේශනාව එක්තරා කර්ම කිරීම් වශයෙන් පැමිණියේය. මෙහිද කර්මචතුෂ්කයෙහි කියනලද කල්හි මොවුන්ගේ ක්‍රියාව ප්‍රකට වන්නේයයි මේ දේශනාව ආරම්භ කළසේක. එසේවුවත් මේ කර්ම චතුෂ්කයම දෙසනු ලබන කල්හි මොවුහු හඳුනා ගන්නෝ යයි ඉන් එකෙක් සරණ යන්නේය එකෙක් පැවිදිව රහත්බවට පැමිණෙන්නේ යයි මෙයම මොවුන්ට සත්ප්‍රායයයි දැනද මේ දේශනාව ආරම්භකළසේක. එහි **කණ්හං** යනු කාළවර්ණ. දශ අකුශල කර්ම පථ කර්මයයි. **කණ්හවිපාකං** අපායෙහි උපදින බැවින් කාළ වර්ණ විපාකයි. **සුක්කං** සුදුවන් දශකුශල කර්මපථ කර්මයි. **සුක්කවිපාකං** ස්වර්ගයෙහි උපදින බැවින් සුදුවිපාක. සුක්කං මිශ්‍ර කර්මය **කණ්හ සුක්කවිපාකං** සුඛදුක්ඛ විපාක මිශ්‍රකර්මය කොට අකුශලයෙන් තිරිසන් යෝනියෙහි මගුල් ඇත් ආදී තන්හි උපන්නේ කුසළින් පැවති සැපවිඳී කුසලින් රජකුලයෙහිද උපන්නේ අකුසලින් පැවති දුක් විඳී. **අකණ්හං අසුක්කං** කර්මක්ෂය කරන චතුර්මාර්ග චේතනා කර්මය අදහස් කරන ලදී. එය යම්හෙයකින් කණ්හ වේ ද කණ්හවිපාකදෙයි. යම්හෙයකින් සුක්කවේද සුක්ක විපාකදෙයි. උභය විපාකයම නොදෙන බැවින් අකණ්හ අසුක්ක විපාක ඇතිවන නිසා **අකණ්හං අසුක්කං** යයි කියන ලදී. මෙය

වනාහි උද්දේසයෙහි අර්ථයයි. නිර්දේශයෙහි **සව්‍යාපජ්ජං** දුක්සහිත, කාය සංස්කාර ආදීන්හි කාය ද්වාරය ග්‍රහණකිරීම් ආදිවශයෙන් බාධිත තත්වයට පත් දොළොස් අකුසල චේතනාවෝ සබ්‍යාපජ්ජ කාය සංඛාර නම් වෙති. වචීද්වාරයෙහි හනු සෙලවීම් වශයෙන් වචීභේදයෙහි පැවති එම දොළොස් වචීසංඛාර නම්, උභය බාධිත තත්වයට නොපැමිණ රහසින් සිතන්නාහුට මනෝද්වාරයෙහි පැවති මනෝ සංචාරනම් මෙසේ තුන්දොරෙහිම කාය දුශ්චරිත ආදී භේද ඇති අකුසල චේතනාවෝම සංස්කාරයයි දතයුතුය. මේ සූත්‍රයෙහි චේතනා ධුරය උපාලි සූත්‍රයෙහි කර්මය නම් වේ. අභිසඞ්ඛරිත්වා කෙටිකොට පිඬුකොට, යන අර්ථයි. **සව්‍යාපජ්ඣං ලොකං** දුක්සහිත ලෝකයෙහි උපදිත්, **සව්‍යා පජ්ඣා ඵස්සා ඵුසන්ති** දුක්සහිත විපාක ස්පර්ශ ස්පර්ශකරයි. **එකන්තදුක්ඛං** නිරතුරුදුක භූතා හේතු අර්ථයෙහි පංචමී වචනයි. භූත කර්මයෙන් උපන් සත්වයාගේ උත්පත්තිය වෙයි. මෙය කියන ලදී. සත්වයෝ යම්බඳු කර්මයක් කරත්ද එබඳුමවූ කර්මයකින් කර්මස්වභාව වශයෙන් ඔවුන්ගේ උත්පත්තිය සිදුවෙයි එහෙයින් කියනලදී. **යංකරොති තෙන උපපජ්ජති** යනුවෙන්. මෙහි **වතෙන** යනු කර්මයෙන් මෙන් යයි කියන ලදී. උත්පත්තිය නම් විපාකයෙන් සිදුවෙයි. යමකින් විපාකයට කර්මය හේතුවේද එයින් ඒ මුලහේතුවූ කර්මයෙන් උපදී. මේ මෙහි අර්ථයි. **ඵස්සා ඵුසන්ති** යම් කර්ම විපාකයකින් උපන්නේ ඒ කර්ම විපාකය ස්පර්ශයෝ ස්පර්ශකරති. **කම්මදායාදා** කර්මදායාදය කර්මයම ඔවුන්ගේ දායාද භාණ්ඩයයි කියම්. **අව්‍යාපජ්ඣං** නිදුක්වූ මේවාරයෙහි කායද්වාරයෙහි පැවති කාමාවචර කුසල චේතනා අට කායසංඛාර නම්වේ. වචීද්වාරයෙහි පැවැතියේ වචී සංඛාරනම්. මනෝද්වාරයෙහි පැවති එම අටද, යට ධ්‍යාන චේතනාතුනද අව්‍යාපජ්ඣ මනෝ සංඛාර නම් ධ්‍යාන චේතනා කාමාවචර වූණාවේ අව්‍යාපජ්ඣ මනෝ සංඛාරවූයේ ඇයි. කසිණ සැදෙන කල්හි සහ කසිණ සෙවුනා කල්හි ලැබෙන බැවිනි.

කාමවචර චේතනාව ප්‍රථමධ්‍යාන චේතනාව සමග ගැටුණු විට ද, චතුර්ථධ්‍යාන චේතනාව තෘතීයධ්‍යාන චේතනාව සමග ගැටුණු විට දැයි තුන්දොරදී කාය සුචරිත ආදි භේදයෙන් කුසල චේතනාවම සංඛාර වේයයි දතයුතුය. **සෙය්‍යථාපි මනුස්සා** ආදී තැන්වල මිනිසුන්ට නම් කලකදී සැපයද, කලකදී දුකද ප්‍රකටම ය දෙවියන් අතර භූම්‍යස්ථ දෙවියන්ටද

එසේය. විනිපාතිකයන් අතර විමාන ප්‍රේතයින්ට කලකදී සැපද කලකදී දුකද වෙතියි දතයුතුය. ඇත්ආදී තිරිසන් ගතිකයන්ටද ලැබේමය. **තත්‍ර** ඒ කර්ම තුනෙහි, **තසස පහානාය** යා චෙතනා එය නැතිකිරීම පිණිස මාර්ගචේතනාව කර්ම වී මාර්ග චේතනා වඩා පවිත්‍ර ධර්මයක් නම් නැත. මෙය කර්මචතුෂ්කයට පැමිණ දොළොස් කුසල චේතනා කණ්හනම් වේ. ත්‍රෛභූමක කුසල චේතනා වන්ට සුක්ක නම්වේ. මාර්ගචේතනාව අකණ්හ අසුක්කයයි කියැවිණ **ලභෙය්‍යාහං භනෙත** අනෛර්යණික පියාපත් යොදා ආත්මවිඩාවටපත්ව සුක්ඛ නදී තෙර බොහෝ කලෙකින් නහන්නෙමියි පෙරළෙමින් මෙන් බොල් කොටන්නාක් මෙන් කිසි අර්ථයක් සැදණේනැත. තමා යෝගයෙහි යෙදෙන්නෙමි මැනවැයි සිතා මෙසේ කීය. ඉක්බිති භාග්‍ය වතුන් වහන්සේ ඛන්ධකයෙහි කිසියම් තීර්ථක පරිවාසයක් පනවනලද්දේද පෙර යම් අන්‍යතීර්ථක වුවකු මේ සසුනෙහි උපසම්පදා වියයුතුයයි අපේක්ෂාකරමි. ස්වාමීනි ඒ මම සංඝයා වෙත සිව්මසක් පරිවාසය අයැදසිටිමි ආදී ක්‍රමයෙන් සමාදන්ව වාසය කරයි. ඒ සඳහා යොබොසෙනිය **අඤ්ඤතිත්ථිය පුබ්බො** යනාදිය කීය. එහි **පබ්බජ්ජං** යන වචනයෙහි සිළිටිබව නිසා කියනලදී. පරිවාසයෙහි නොවැසම පැවිද්ද ලබයි. උපසම්පදාපේක්ෂක නොකල්හි ගම්වැදීම ආදී අටවත් පුරන්නෙකු විසින් පරිවාසයෙන් විසිය යුතුය. **ආරද්ධචිත්තා** අටවත් පිරීමෙන් තුටුසිත් ඇති මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් මේ තීර්ථක පරිවාසය සමන්ත පාසාදිකා නම් විනය අටුවාවෙහි පබ්බජ්ජා වර්ණනාවෙහි කියන ලද ක්‍රමයෙන් දතයුතුය.

**අපිචමෙත්ථ** එසේවුවත් මා විසින් මෙහි, **පුග්ගලවෙමත්තතා** විදිනා පුද්ගල නානත්වය දන්නාලදී. මේ පුද්ගලයා පරිවාසයට සුදුසුය, මොහු පරිවාසයට නුසුදුසුය යයි මෙය මට ප්‍රකටයයි දක්වයි. ඉන්පසු සෙනිය මෙසේ සිතීය. අහෝ බුද්ධශාසනයෙහි ආශ්චර්යය යම් තැනෙක මෙසේ ගටා කොටා යුතුදේම ගනිත්, අයුතුදේ අත්හැර දමත් ඉන්පසු වඩා සුදුසු තැනැත්තා පැවිද්දට හටගත් උත්සාහ ඇත්තේ, **සචෙභනෙත** ආදිය කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ තියුණු ආශාව ඇතිබව දැන සේනිය පරිවාසයට නොසුදුසුයයි වෙනත් භික්ෂුවක ඇමතූසේක. 'භික්ෂුව යව, සේනිය නහවා පැවිදිකරවා ගෙන එන්න. හේ එසේ කොට ඔහු පැවිදිකරවා

භාග්‍යවතුන් වහන්සේ සමීපයට කැඳවාගෙන ආයේය. භාග්‍යවතුන් වහන්සේ සඟගණ මැද හිඳ උපසම්පදා කළසේක. එහෙයින් කියන ලදී. **අලත්ථ ඛො අචෙලො සෙනියො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදන්ති.** **අචිරූපසම්පන්නො** යැයි උපසපන්වී නොබෝ කලෙකින්ම, **වූපකට්ඨො** වස්තුකාම ක්ලේශකාමයන් ගෙන්ද කයින්ද සිතින්ද වෙන්වූයේ **අප්පමත්තො** කමටහන්හි සිහිය නොහරින්නේ, **ආතාපී** කායික චෛතසික සංඛ්‍යාතවූ වීර්ය නමැති අව්වෙන් තැවෙන්නේ **පහිතත්තො** කයෙහිද ජීවිතයෙහිද අපේක්ෂානැති බැවින් යවන ලද ආත්ම ඇත්තේ විසුරුවාහළ ආත්මභාව ඇත්තේ, **යස්සත්ථාය** යමක් සඳහා **කුලපුත්තා** ආචාර කුලපුත්‍රයෝ **සම්මදෙව** හේතු ඇතිව කරුණු ඇතිවද, **තදනුත්තරං** ඒ අනුත්තර වූ, **බ්‍රහ්මචරිය පරියොසානං** මාර්ග බ්‍රහ්මචර්යාවගේ පර්යවසානයවූ රහත්ඵලය. ඒ සඳහා කුලපුත්‍රයෝ පැවිදිවෙත්. **දිට්ඨෙව ධම්මෙ** මේ අත්බැවෙහිම, **සයං අභිඤ්ඤා සච්ඡිකත්වා** තමාගේම ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට අපරප්‍රත්‍යයඳන යන අර්ථය. **උපසම්පජ්ජවිහාසි** පැමිණ සම්පාදනය කොට විසීය එසේ වාසයකරන්නේම ජාතිය ගෙවීණ - පෙ - මැනවින් දත්තේය. මෙසේ ඔහුට ප්‍රත්‍යවේක්ෂණ භූමිය පෙන්වා අර්හත්වය කුළුගන්වා දේශනාව නිමවන්ට **අඤ්ඤතරො ඛොපනායස්මා සෙනියො අරහතං අහොසි** යයි කියන ලදී. එහි **අඤ්ඤතරො** යනු එකෙක් **අරහතං සුහොසි** - රහතුන්ගෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකවූ රහතන්වහන්සේගේ ආභ්‍යන්තරිකයෙක් විය යනු මෙහි අභිප්‍රායයි. සෙස්ස සියලු තැන නොගැඹුරු ම වේ.

## සත්වැනි කුක්කුරවතිය සූත්‍රයයි

## 2.1.8

**එවමෙම සුතං** යනු අභය සූත්‍රයයි. එහි **අභය** යනු ඔහුගේ නමයි **රාජකුමාරො** බිම්බිසාරගේ පුත්‍රයා. **වාදං ආරොපෙහි** දොස් නගව. **නෙරයිකො** නිරයෙහි උපදින්නා. **කප්පට්ඨො** කල්පස්ථායී **අතෙකිච්ඡො** බුදුවරුන් දහසක් විසින්ද පිළියම් කිරීමට නොහැකි. **උග්ගිලිතුං** අන්තදෙක මුදා කියන්ට නොහැක්කේ ගිලීමටවත් එළියට ගැනීමටවත් නොහැකිවිය. **ඔගිලිතුං** ප්‍රශ්නකිරීමෙහි දොස් ඇතිකොට ආපසු ගැනීමට නොහැක්කේ

ගිලගැනීමට. ඇතුළට ප්‍රවේශ කිරීමට නොහැකිවිය. **එවං භනෙත** නිගණ්ඨයා මෙසේ සිතීය. ශ්‍රමණ ගෞතම තෙමේ මාගේ සච්චන් බිඳුවා ගනී. මම එක් ප්‍රශ්නයක් නගන්නෙම් නම් මැනවි. යමක් විචාරන ලද්දේ ශ්‍රමණ ගෞතම තෙමේ දණින් නැමී හුන්නේ නැගිට ගැනිමට නොහැකි වන්නේයයි හේ අභයගේ ගෙයින් ගෙනා බත්ඇත්තේ සිනිඳු බොජුන් බුදිනේ බොහෝ ප්‍රශ්න එකතු කොට මෙහි ශ්‍රමණ ගෞතම තෙමේ මෙනම් දොසක් දක්වයි. මෙහි මේ දොසක් දක්වතියි සියල්ළ හැරදමා සිව්මසක් ඇවෑමෙන් මේ ප්‍රශ්නය ඇසීමෙහි හෝ විසඳීමෙහි දොසක් දක්වන්ට නොහැකිය. මෙය ඔවටටකසාර නම් කවරෙක්නම් මෙය ගෙන ශ්‍රමණ ගෞතමට වාද නගන්නේද. ඉන්පසු අභය රාජකුමාරයා නුවණැත්තේය. ඔහු හැකිවන්නේය. ඔහුට උගන්වාලම්යි නිඡ්ඨාවට ගොස් උගන්වාලීය. හේ වාදකිරීමේ කැමැත්ත ඇතිබැවින් ඔහුගේ වචනය පිළිගෙන **එවං භනෙත** යි කීය. **අකාලොබො අජ්ජ** මේ ප්‍රශ්නය සිව්මසෙකින් ගොඩනගනලද්දකි. එහි මෙයගෙන මෙය විසඳන්නේ දිවාභාගය ප්‍රමාණවත් නොවන්නේයයි සිතන්නේ මෙසේත් සිතීය. සොදානි හෙට, **අතනවතුත්‍ථො** කුමක් හෙයින් බොහෝදෙනකු සමග නිමන්ත්‍රණය නොකළේද. ඔහුට මෙසේ සිතිණ. බොහෝ දෙනකු හුන්කල මදක් අලසවනවිට අන් සූත්‍රයක් අන්කරුණක් අන් එබඳු උදාහරණයක් ගෙනවුත් දක්වයි. මෙසේ ඇතිකල්හි කලහයක් හෝ කෝලාහලයක් හෝ වන්නේ ය. එසේවුවත් හුදෙකලාවම ඇරයුම් කරන්නෙම්. මෙසේත් මට අපහසක් ඇතිවන්නේය. මේ අභය තෙමේ භාග්‍යවතුන්වහන්සේ දිනපතා භික්ෂූන් සියයක්හෝ ඒ දහසක් සමග හැසිරෙනු දකත් හුදෙකලාවට ඇරයුම් කරන්නේය. ඔහු මසුරෙක් යැයි මෙසේ දෝෂයක් නොවන්නේයයි තවත් තිදෙනකු සමග තමා සිව්වැනි කොට ඇරයුම් කළේය. **තනබෙවතථ රාජ කුමාර එකංසෙන** රාජකුමාරය මෙහි ප්‍රශ්න නිශ්චය වශයෙන් විසඳීමක් වෙයි. තථාගතයන් වහන්සේ මෙබඳු වචනයක් කියන සේක් විය හැකිය නොකියන සේක්ද විය හැකිය. කියු කරුණින් අර්ථය දක කියන සේක නොදක්නා සේක් නොකියනසේකැයි අර්ථයි. මෙසේ භාග්‍යවතුන්වහන්සේ නිගණ්ඨයා විසින් සිව්මසකින් ගොතන ලද ප්‍රශ්නය අසනිවාතයෙන් පර්වත කූටය සුනුවිසුණු කරන්නාක් මෙන් එක් වචනයෙකින්ම සුණුවිසුනු කළසේක. **අනස්සුංනිගණ්ඨා** නිගණ්ඨයෝ නැසුණෝය. **අඩෙක නිසිනෙතා** හොති

කලවාහි හුන්නේ වෙයි. ව්‍යාජහේතු වාදීහු වාදය ගොඩනගමින් කිසියම් ඵලයක් හෝ මලක් හෝ පොතක් ගෙන හිඳගනිති. ඔවුහු තමන්ට ජය ලබුණුවිට අනෙකා යටපත් කරති. අනෙකාට ජය ලැබුණුකල්හි ගෙඩිය කන්නාක් මෙන්, මල තලාදමන්නාක් මෙන් පොත මේ කියවන්නාක්මෙන් කැලඹීමක් පෙන්වති. මොහු මෙසේ සිතීය. සම්මා සම්බුදු රජාණන් වහන්සේ බට සංග්‍රාම ඇත්තෙකි. පරවාදීන් මර්ථනය කරන්නෙකි. යම්හෙයකින් මට ජය ලැබුණොත් එය කුසලයකි. නොවේනම් දරුවා රිදවා හඬවන්නෙමි. ඉන්පසු බලන්න පින්වත්නි මේ දරුවා හඬයි නැගිටුවවු පසුව දැනගත්තෙමු යි දරුවගෙන හුන්නේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි රාජකුමාරයාට වඩා සියගුණයෙන් දහස් ගුණයෙන් උතුම් වාදියෙකි. මොහුට මේ දරුවාටම උපමා කොට වාදය බිඳින්නෙමියි සිතා තං කිං මඤ්ඤසි රාජකුමාර ආදිය වදාළසේක. එහි මුඛෙ ආහෙරය්‍යාතා මුවෙහි තබන්නේ ය. ආහරෙය්‍යස්‍යාහං මම ඔහු ඉවතගෙන යන්නෙමි. ආදකෙනෙව ප්‍රථම ප්‍රයෝගයෙන්ම අභූතං නොවූ අර්ථය අතච්ඡං සත්‍ය නොවූ, අනත්ථසංහිතං අනර්ථ සහිත, වර්ධනයක් නැති අප්පියා අමනාපා ප්‍රියනොවූයේ මනාපනොවූයේ. මේ ක්‍රමයෙන්ම සියලුතන්හි අර්ථය දත යුත්තේය. එහි අප්‍රිය පක්ෂයෙහි පළමුවැනි වචනය නොසොරු සොරුයයිද අදාසයා දාසයයිද, දුෂ්ප්‍රයුක්තනොවූ දෙය දුෂ්ප්‍රයුක්තයයිද පැවති තාගතයන් වහන්සේ එය නොකියන සේක. දෙවැනි වචනය සොරාම සොරායයි අදිවශයෙන් පැවති. එයද තථාගතයන් වහන්සේ නොකියන සේක. දැන් තෙවැනි වචනය කියන සේක. නොකළ පින් ඇතිබැවින් දුගි දුර්වර්ණ වූයේ අල්පේශාඛ්‍ය වූයේ. මෙහි සිටත් නැවත පිනක් නොකරහිද. දුතියකච්චතවාැරයෙහි කෙසේ සතර අපායෙන් මිදෙන්නේද. මෙසේ මහජනයාගේ අර්ථපිළිගැනීමෙන් (ධර්මය පිළිගැනීමෙන්) අනුශාසනය පිළිගැනීමෙන් කියයුතු වචනය තත්‍රකාලඤ්ඤ තථාගතො එහි තුන්වැනි ප්‍රකාශනයෙහි ඒ වචනය ප්‍රකාශකරන කල්හි ඒ ඒ අයුරින් කාලයදන්නේ වෙයි. මහජනයා ග්‍රහණය කරන කාලය දැන ඒ අයුරින් ප්‍රකාශ කෙරේ යන අර්ථයි. ප්‍රිය පක්ෂයෙහි ප්‍රථම වචනය අස්ථානීය කථානම්. එය එසේ දතයුතුය එක් ගම්වැසි මහලු මිනිසකු නගරයට පැමිණ ආපානශාලාවෙහි සුරාබොන විට ඔහු රවටනු කැමති බොහෝ ධූර්තයෝ ඔහු සතුටු කොට ඔහු සමග සුරා පානය කරන්නාහු මොහුගේ ඇඳුම් පැළඳුම්ද. අත ඇති බඩුද සියල්ල ගන්නෙමුයි සිතා කතිකා කළහ. එක්එක් අත්දුටු කථාවක් කියමු.

යමෙක් එය බොරුවක් යයි කීයේද. කියූ දෙය නො අදහාද ඔහු දාසයකුකොට ගන්නෙමුයි ඒ මහල්ලාගෙන් ඇසුහ. යහළුව ඔබටද මෙය රිසියෙයි. එසේ වේවා එක් ධූර්තයෙක් මෙසේකීය. පින්වත. මගේ මවට මා කුසට පැමිණිකල්හි දිවුල් කෑමේ දොළදුකක් ඇතිවිය. ඈ වෙනත් දිවුල් ගෙනෙන්නකු නොලබන්නී මාම යැවූවාය. මම ගොස් ගසට නැගීමට නොහැකිව තමාම තම පාදයෙන් ගෙන මුගුරක් මෙන් ගස මුදුනට විසි කෙළෙමි. ඉක්බිති අත්තෙන් අත්තට පැන ගෙඩි ගෙන ගසින් බසින්නට නොහැකිව ගෙට ගොස් ඉනිමගක් ගෙනවුත් බැස මව සමීපයට ගොස් ඒ ගෙඩි මවට දුනිමි. ඒවා සැළිතරම් විශාලය. ඉන්පසු මගේ මව විත් එක් අසුනක හිඳ ගෙඩි හැටක්ම කනලදී. මා විසින් එක් උකුලකින් ගෙන ආ ගෙඩිවලින් ඉතිරිවූ ගෙඩි කුලසහිත නම් ගම කුඩා මහලු අයට දුන්නාය. අපගේ ගෙය සෙළොස් රියන්ය. සෙසු පිරිකරභාණ්ඩ ඉවත්කොට දිවුල් ගෙඩි වලින්ම වහලය දක්වා පුරවන ලදි. ඉන් ඉතිරිවූ ගෙඩි ගෙන දොරකඩ ගොඩගැසුහ. එය අසූරියන් උස පර්වතයක් මෙන් විය. කිමෙක්ද මෙබන්දක් ඔබට ඇදහිය හැකිද? ගැමි මහල්ලා නිහඬව හිඳ සියලු කථා අවසන විමසන ලදුයේ මෙසේ කීය. මිතුරෙනි මෙසේ වන්නේය. රට මහත්ය. මහත්බව නිසා ඇඳහිය හැකියි. ඔහු කියූ පරිද්දෙන්ම සෙස්සන් විසින්ද එබඳුම වූ නිෂ්කාරණ කතා කියුකල්හි මෙසේ කීය. මිතුරනි. මගේ කථාවද අසනු ඔබගේ පමණක් කුල මහා කුල නෙවෙයි. අපගේ කුලයත් මහාකුලයකි. අපගේ අනිකුත් කෙත් අතර ඉඹුල්කෙත වඩා විශාලය. මෙහි නොයෙක් සිය දහස් ගණන් වපසරිය ඇති කෙත මැද එක් මහා ඉඹුල් ගසක් ඇත. අසූරියනක් උසය. එහි අතු පහක් තිබේ. ඒ අතර ඉතිරි අතුවල ගෙඩි හට නො ගත්තේය. පෙරදිග අත්තෙහි මහා සැළියක තරම් එක් ගෙඩියක් විය. එහි පැති හයක්විය. පැති හයෙහි එක් පැත්තක පුළුන් කැටි හයක් පිපිණ. මම රැවුලකපා නා විලවුන් ගල්වා කෙතට ගොස් ඒ ඉඹුල් කැටි පිපී තිබෙනු දක සිටගෙනම අත දිගු කොට අල්ලා ගතිමි. ඒ පුළුන් කැටි ශක්ති සම්පන්න දාසයෝ හය දෙනෙක් වුහ. ඒ සියල්ලෝ මා තනිකොට පළාගියහ. මෙපමණ කලක් ඔවුන් නොදකිමි. අද දිටිමි. ඒ මිනිස්සු ඔබලාය. උඹ නන්ද, උඹ පුණ්ණ, උඹ වඩ්ඪමාන, උඹ ජන්ත, උඹ මංගල උඹ සෙට්ඨීයයි නැගිට නැගිට හිඳගෙන හුන්ඔවුන්ගේ කෙහෙවලු වලින් අල්ලා ගෙන සිටියේය. ඔවුහු අප දාසයෝ නොවෙමුයි කීමට පවා නොහැකිවුහ. ඉක්බිති ඔවුන් ඇදගෙන විනිශ්චය

ශාලාවට පමුණුවා ලකුණු තබා දිවි ඇතිතෙක් දාසයන් කොට පරිභෝග කළේය. තථාගතයන් වහන්සේ මෙබඳු කථා නොකියති. දෙවැනි වචනය ආමිෂ ලබා ගැනීම සඳහා චාටු කම්‍යතාවයි. දවසකින් හෝ නානාප්‍රකාර වූ අනුන්ගේ ස්තුති කථාද, චෝරකථා, රාජකථා ආදී ආකාරයෙන් පැවති තිරම්ඡාන කථාද තථාගතයන් වහන්සේ නොකියති. තෙවැනි වචනය ආර්ය සත්‍ය නිඃශ්‍රිත කථාය. එය අවුරුදු සියයක් ඇසුවද නුවණැත්තෝ තෘප්තියට නොපැමිණෙති. මෙසේ තථාගතයන් වහන්සේ සියලු අප්‍රිය වචන කථා නොකරති. ප්‍රියවචනද කථා නොකරති. තෙවැන්න තෙවැන්න මයැයි කියයුතු අවස්ථාව නො ඉක්මවා කියති. එහි තෙවැනි අප්‍රිය වචනය සඳහා යට දහරකුමාර උපමාව ආයේයැයි දතයුතුය.

උදාහුඨානසොචෙතං නැතහොත් ඨානුප්පත්තිඤාණ යෙන් එකෙණෙහිම එය තථාගතයන් වහන්සේට වැටහේදැයි අසයි. සඤ්ඤතො දත්, පෙනුණු, ප්‍රකට ධම්මධාතු ධර්මස්වභාවය, සර්වඥතාඥනයට මේ සමවචනයෙකි. එය භාග්‍යවතුන් වහන්සේ විසින් හොඳින් ප්‍රතිවේධ කරණ ලදී. උන්වහන්සේගේ අතපත්‍ය. ඒනිසා උන්වහන්සේ යම්දෙයක් කැමති වන සේක්ද එය එකෙණෙහිම වැටහේ. සෙස්ස සියලු තැන නොගැඹුරුමය. මේ ධර්ම දේශනාව නෙය්‍ය පුද්ගල වශයෙන් අවස් කරන ලද්දේය.

### අටවැනි අභයරාජ කුමාර සූත්‍රයයි.

### 2.1.9

එවමෙමසුතං යනු බහුවෙදනීය සූත්‍රයයි. තත්‍ර පඤ්චකඞ්ගො ථපති පංචකඞ්ග යනු ඔහුගේ නමයි. වෑපොරෝ කණිතහුල් මුගුරු කළුනුල් නැළිය යන අංග යන්ගෙන් යුත් බැවින් ද ඔහු පංචඞ්ගයයි ප්‍රකට විය. ථපති වඩුදෙටුවා උදායී පණ්ඩිත උදායී තෙරණුවෝ පරියායං කරුණ දෙවපානන්ද දෙවපි ආනන්ද - ආනන්ද දෙකක් - පරියායෙන කරුණින් මෙහිද කායික චෛතසික වශයෙන් දෙක දතයුතුය. සුඛා ආදී වශයෙන් තුනකි. ඉන්ද්‍රිය වශයෙන් සුඛින්ද්‍රිය ආදි කොට ඇති පස, ද්වාර වශයෙන් චක්ඛුසම්ඵස්සජා ආදීකොට ඇති සය, උපවිචාර වශයෙන් ඇසින් රූපයක් දැක සොම්නස

දනවන රූපයක් ළඟ හැසිරේය ආදී වූ දහඅට, ගෙහසිත සොම්නස් සය. ගෙහසිත උපේක්ෂා සය නෛෂ්ක්‍රම්‍යසිත උපේක්ෂා සය. යන තිස්හය අතීතයෙහි තිස්හයක්ද, අනාගතයෙහි තිස්හයක්ද, වර්තමානයෙහි තිස්හයක්ද, යනුවෙන් එකසිය අටක්වූ වේදනාව දතයුතුය. **පඤ්ච බොඉමෙ ආනන්ද කාමගුණා** මෙය තනි ගැළපීමයි. එපමණක් නොව දෙකක් ආදිකොට ඇති වේදනාවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලදහ. පිළිවෙළින් එක් වේදනාවක්ද කියන ලදී. එය දක්වන්නේ පඤ්චකඞ්ග වඩුදෙටුවාගේ වාදයට උපස්තම්භවීමට මේ දේශනාව ආරම්භ කළසේක. **අභික්කන්තතරං** සුන්දර තර **පණීතතරං** ප්‍රණීතතර මෙහිද චතුර්ථධ්‍යානයෙහි පටන් අදුකඛමසුක වේදනාවයි. එයද ප්‍රණිතාර්ථයෙන් සුඛ යයි කියන ලදී. නිරෝධය අවෙදයිත සුඛ වශයෙන් සුඛ නම් වීය. පංචකාම ගුණ වශයෙන් ද අටසමවත් වශයෙන්ද උපන් සුඛය වෙදයිත සුඛ නම් නිරෝධය අවෙදයිත සුඛ නම් මෙසේ වේදයිත සුඛය වෙදයිත සුඛ නම්, නිරෝධය අවෙදයිත සුඛ නම් මෙසේ වෙදයිත සුඛය හෝ වේවා අවෙදයිත සුඛය හෝ වේවා නිදුක් බැවින් සුඛාර්ථයෙන් එකම සුඛයම උපන. **යත්‍ථයත්‍ථ** යම් යම් තැනක **සුඛං උපලබ්භති** වේදයිත සුඛය හෝ අවෙදයිත සුඛය හෝ ලබයි. **තනතං තථාගතො සුඛසම්ං යෙව පඤ්ඤපෙති** ඒ සියල්ල තථාගතයන් වහන්සේ නිදුක් බැව් සැපයෙහිම පනවනසේක. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ නිරෝධ සමාපත්තිය ශීර්ෂ කොට නෙයාපුද්ගල වශයෙන් අර්හත්වය කුළුගන්වා දේශනාව නිමැවුසේක.

## නවවැනි බහුවේදනීය සූත්‍රයයි

## 2.1.10

**එවමෙමසුතං** යනු අපණ්ණක සූත්‍රයයි. එහි **චාරිකං** අතුරිත චාරිකාවය **අත්‍ථි පන වො ගහපතියොයි** කුමක් නිසා ඇසුද ඒ ගම කැලෑවට ඇතුළුවන තන්හි පිහිටියේය. නොයෙක් ආකාර මහණ බමුණෝ දිවාකල මග ගොස් සවස වසනු පිණිස ඒ ගමට එති ඒ මිනිස්සු ඔවුන්ට ඇඳපුටු අතුරා පාදොවා තෙත පිසදා කැප පැන් ආදිය දී දෙවැනි දවසෙහි පවරා දන් දෙති. ඔවුහු පහන් සිතින් ඔවුන් සමග පිළිසඳර කථාකරමින් මෙසේ කියත්.

ගෘහපතිවරුනි, ඔබලා විසින් කිසියම් දර්ශනයක් ගන්නා ලද්දේද නැත ස්වාමීනි ගෘහපතියෙනි දර්ශනයක් නැතිව ලෝකය ඉදිරියට ගෙනයනු නොලැබේ. එක් දර්ශනයක් කැමතිවී කමා කොට ගන්ට වටී ලෝකය ශාස්වතය යන දර්ශනය ගන්නැයි කියා ගියාහුය. පසුදිනෙක තවත් අය පැමිණියහ. ඔවුහුද එසේම ඇසූහ. ඔවුහු ස්වාමීනි පසුගිය දිනවල ඔබවැනිවූ ශ්‍රමණ බ්‍රාහ්මණ යෝ පැමිණ ලෝකය ශාස්වතය යන දර්ශනය මේ දර්ශනය අපලවා ගන්වා ගියහුයයි දැන්වූහ. මෝඩයෝ කුමක් දනිත්ද මේ ලෝකය බිඳෙයි උච්ඡේද දර්ශනය ගනුවයි ඔවුහුද උච්ඡේද දර්ශනය ගන්වා ගියාහුය. මේ උපායෙන් තවත් අය එකච්චසස්සත වාදයද, තවත් අය අන්තානන්තවාදයද තවත් අය අමරාවික්ඛෙප විවාදය දූයි දෙසැටක් මිසදිටු උගන්වා ලූහ. ඔවුහු එක් දෘෂ්ටියකවත් පිහිටා සිටීමට නොහැකි වූහ. සියලු දෙනට පසුව භාග්‍යවතුන් වහන්සේ වැඩිසේක. උන්වහන්සේ ඔවුන්ට හිතපිණිස විචාරන සේක් **අත්‍ථිපන වො ගහපතයො** ආදිය වදළසේක. එහි ආකාරවතී කරුණු සහිත සහේතුක **අපණ්ණකො** නොවිරුදූ දෙමගක නොයන නිශ්චිතව ගන්නා පුද්ගලයා **නත්‍ථි දින්නං** ආදී දසවත්‍ථුක මිච්චාදිට්ඨියයි. යට සාලෙය්‍යක සූත්‍රයෙහි විස්තර කරන ලදී. එසේම එයට ප්‍රතිවිරුද්ධවූයේ සම්මා දිට්ඨියයි. **නෙක්ඛම්මෙ ආනිසංසං** යමක් ඒ අකුසලයෙන් නික්මුණු බවෙහි ආනිසංසයයි යමෙක් පවිත්‍රපක්ෂ වේද විශුද්ධ පක්ෂ වේද එය නොදකිත් යන අර්ථයි.

**අසද්ධම්ම සඤ්ඤත්ති** නොවූ විරුධර්ම හඳුන්වාදීම. **අත්තානං උක්කංසෙති** මාහැර තමාගේ දර්ශනය අන්‍යයන් ලවා ගැන්වීමට හැක්කේ අන් කවරෙක්දැයි තමා ඔසවා තබයි. **පරංවම්භෙති** මෙපමණක් ජනයා අතරේ එකෙක්වත් තමාගේ දර්ශනය අනුන්ලවා ගන්වන්ට නොහැක්කේ යයි මෙසේ අනෙකා යටට දමයි. **පුබ්බෙව** බොපන පෙර මිථ්‍යා දර්ශනය ගන්නහුගේ සුසිල්වත්බව හීන වූයේ වෙයි. දුසිල්බව එළඹ සිටියේ වෙයි. **එවමස්සිමෙ** මෙසේ මොහුට සිතෙයි. මේ මිථ්‍යාදෘෂ්ටි ආදීහු නැවත නැවත සත් වරක් ඉපදීම් වශයෙන් ඒ මිථ්‍යාදෘෂ්ටි ප්‍රත්‍යයෝය නොයෙක් පාපී අකුශල ධර්ම උපදී නම්වේ. **තත්‍ර** ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ලබ්ධිවල **කලිග්ගහො** පරාජය ගැනීම **දුස්සමත්තො සමාදිණ්ණො** නොගතහැකි ස්පර්ශකළ නොහැකි එකං **සමත්‍ථිත්වා තිට්ඨති** එක් අත්තයක් එක් කොටසක්

තමාගේ වාදයට පතුරුවා අබිබවා සිටී. සචෙ බො නත්‍ථි පරලොකො මෙසේ ඇතිකල්හිම සුවපත්බව ගෙනදෙන්නේ වෙයි. **රිඤ්චති** අත්හරියි. **සද්ධම්මසඤ්ඤං** සිදුවූ දේ හඳුන්වාදීම කටගගාහො ජයග්‍රහණය **සුසමත්තො සමා දිණ්ණො** මනාව ගනුලැබුයේ මනාව ස්පර්ශකරන ලදුයේ **උබයංසම්විරිත්වා තිට්ඨති** උභයාන්තය, උභය කොට්ඨාසය ස්වකීය වාදයද පරවාදයද පතුරුවා අබිබවා සිටී. **සචෙබො අත්‍ථිපරලොකො** මෙසේ ඇති කල්හිද යම්හෙයකින් නැත්නම්. එසේ ඇති කල්හිද සුවපත්බව ගෙන දෙයි. අනුන්ගෙන් ද ඒකාංශ උභයාංශයන්හි මේ ක්‍රමයෙන්ම අර්ථය දතයුතුය. **කරොතො** තම අතින් කරන්නහුම **කාරයතො** අණ දී කරවන්නහුට. **ජින්දතො** අනුන්ගේ අත්ආදිය සිඳින්නහුම, **පචතො** දණ්ඩෙන්. පෙළන්නහුට තර්ජනය කරන්නහුට හෝ **සොචයතො** අනුන්ගේ බඩුගෙනයාම් ආදියෙන් ඇතිවන ශෝකය, තමාම කරන්නහුටද අනුන්ලවා කරවන්නහුටද, **කිලමයතො** ආහාර නොගෙන සිටීම බන්ධනාගාර ප්‍රවේශය ආදියෙන් තමා වෙහෙසන්නහුට ද අනුන් ලවා වෙහෙස කරවන්නහුට. **ඵන්දතො ඵන්දපයතො** අන්‍යයා පනින පනින විට බඳින කල්හි තමාද පනින්නහුටද අනුන් ලවා පන්න වන්නහුටද. **පාණමතිපාතයතො** පණ නස්නනහුටද නසවන්නහුටද මෙසේ සියලුතැන කාරණකාරණ වශයෙන්ම අර්ථ දත යුතුය. **සන්ධි** ගෘහසන්ධිය. **නිල්ලොපං** මහා කොල්ලකෑමක් **එකාගාරිකං** එක් ගෙයක්ම වටකොට කොල්ලකෑම **පරිපන්ථෙ** පැමිණි පැමිණියවුන් කපනු පිණිස මාර්ගයෙහි සිටින්නහුට **කරොතො න කරීයතිපාපං** කිසියම් පාපයක් කරමියි හැඟීමෙන් කරන්නහුද පාපයක් නොකරයි. පාපයක් නැත සත්වයෝ වනාහි කරමුයි මෙසේ හැඟීම් ඇත්තෝ වෙති. යන අර්ථයි. **ඛුරපරියන්තෙන** දැලිපිහි තලයක් හා සමාන තලයකින් හෝ දැලිපිහිතලයෙන් හෝ **එකමංසඛලං** එක්මස් රැසක් **පුඤ්ජං** එයටම සමාන වචනයකි. **තතො නිදානං** එක්මස් රැසක් කිරීමේ හේතුව දකුණු තෙර මිනිස්සු කර්කශය දරුණුය. ඔවුන් සඳහා **හනන්තො** ආදිය කියන ලදී. උතුරු තෙර ශ්‍රද්ධා ඇත්තෝවෙති. පහන්වූවෝය. බුද්ධමාමකයෝය. ධර්ම මාමකයෝය සංඝමාමකයෝය. ඔවුන් සඳහා **දදන්තො** ආදිය කියන ලදී. එහි **යජන්තො** මහායාගය කරන්නේ **දමෙන** ඉන්ද්‍රිය දමනයෙන් උපොසථ කර්මයෙන් **සංයමෙන** සීල සංයමයෙන් **සච්චවාචෙන** සත්‍ය වචනයෙන් **ආගමො** පැමිණීම වෙතියි අර්ථයි. සැම අයුරින්ම පව්පින් කිරීමම ප්‍රතික්ෂේප කරති. ශුක්ල පක්ෂයෙහිද කියුක්‍රමයෙන් දත යුතුය. මෙහි සෙස්ස පෙරවාරයෙහි

කියනලද පරිදිවේ. **නත්ථිහෙතු නත්ථි පච්චයො** මෙහි පච්චයො යනු හේතු අර්ථයෙහි වචනයකි. දෙකින්ම විද්‍යාමානවූ දෙයම කාය දුශ්චරිත ආදි සංකිලේස හේතුවද කාය සුචරිතාදිය විසුද්ධිහේතුවද ප්‍රතික්ෂේප කරති. **නත්ථිබලං නත්ථි විරියං නත්ථි පුරිසථාමො නත්ථි පුරිස පරක්කමො** සත්වයන් කිළිටි කිරීමට හෝ පිරිසිදු කිරීම හෝ බලය හෝ වීර්යයහෝ පුරුෂයකු විසින් කළයුතු පුරුෂ ශක්තියක් හෝ පුරුෂපරාක්‍රමයක් හෝ නැත. **සබ්බෙසත්තා** ඔටුවෝ ගොන්නු කොටළුවෝ ආදීවූ සියලු සතුන් දක්වති. **සබ්බෙපාණා** එක්ඉන්ද්‍රියයක් ඇති ප්‍රාණියා, ඉන්ද්‍රිය දෙකක් ඇති ප්‍රාණියා ආදිවශයෙන් කියති. **සබ්බෙභූතා** අණ්ඩ කෝෂ වස්තිකෝෂවල ඇතිවූවන් සඳහා කියති. **සබ්බෙජීවා** සහල් යව තිරිඟු ආදිය සඳහා කියත්. ඒ අතර වේවා වැඩෙන බැවින් ජීවසංඥාව ඇත්තෝය. **අවසා අබලා අවිරියා** ඔවුන්ට තමන්ගේ වසඟත්වක් හෝ බලයක් හෝ වීර්යයක් නැත **නියති සඞ්ගති භාව පරිණතා** මෙහි නියාති නියති සංයති යනු සත්ව ජාතීන් සය ගේ ඒ ඒ තැන ගමන් කිරීම. **භාවො** යනු ස්වභාවයයි. මෙසේ නියතියෙන්ද සංගතියෙන්ද ස්වභාවයෙන්ද පරිණතවූවාහු නානාප්‍රකාර බවට පත්වූවාහුය. යමකින් එසේ විය යුතු නම් එසේම වෙයි. යමකින් නොවිය යුතුනම් එය නොවේ යයි දක්වයි. **ඡසෙසවාගි ජාතිසු** ඒ සත්ව ජාතීන්හි සිට සැපද දුකද විඳගනිති. අන් සුඛ දුක්ඛ භූමියක් නැතැයි දක්වති. එහිද අභිජාතිනම් කණ්හ සත්ව වර්ග, නීලසත්ව වර්ග, ලෝහිත සත්ව වර්ග, හලිද්ද සත්ව වර්ග, සුක්ක සත්ව වර්ග. පරමසුක්ක සත්ව වර්ග යනුවෙන් එහි පක්ෂීන් මරන්නා ඌරන් මරන්නා, වැද්දා, මසුන් මරන්නා, සොරා, සොරුන්මරන්නා. මොවුන් හෝ අන් කිසි කෙනෙක්වේත්ද, කෲර කර්මාන්ත ඇත්තෝ වෙත්ද මේ කණ්හාභිරතිනම් භික්ෂූහු නීලාභිජාතියයි කියති. ඔවුහු සිව්පසයෙහි කටු බහා අනුභව කරති. **භික්ඛුව කණ්ටක වුත්ති කො** මෙය වනාහි ඔවුන්ගේ පාළියෙහි එන ආකාරයයි. නැතහොත් කටුකපිළිවෙත් ඇත්තාහු මෙනම් වෙති. ඇතැම්හු පැවිද්දෝයයි කියති. ශ්‍රමණ යෝ කටුක පිළිවෙත් ඇත්තෝය යන්න එහි පාළියයි. ලොහිතාභිජාති නම් නිගණ්ඨයෝ ය. එක් සළුවක් ඇත්තෝ යයි කියති. මොවුහු පළමුකී වර්ගදෙකින් වඩාත් සුදුය. ගිහියෝ නිර්වස්ත්‍ර ශ්‍රාවකයෝය. හලිද්ද ජාතියයි කියති. මෙසේ තමන්ගේ ප්‍රත්‍යදයකයන් නිගණ්ඨයන් විසින්ද ජ්‍යෙෂ්ඨතර කරත්. නන්ද වච්ඡ සංකිච්ච මේ සුක්කාභිජාති යයි කියති. ඔවුහු පළමුකී සතර වර්ගයන් හි වඩා සුදුවූවෝය. ආජීවකයන් පරම සුක්කාභිජාතියයි කියති. ඔවුහු සියල්ලන්ට වඩා සුදුය.

මෙහි සියලු සත්වයෝ පළමු කොට පක්ෂීන් මරන්නෝ ආදීහු වෙති ඉන් පිරිසිදු වන්නෝ ශාක්‍ය ශ්‍රමණයෝ වෙති. ඉන් පසු පිරිසිදුවන්නෝ නිගණ්ඨයෝය. ඉන් පසු ආජීවක ශ්‍රාවකයෝය. ඉන්පසු නන්ද ආදීහුය. ඉන්පසු ආජීවකයෝය. මෙය ඔවුන්ගේ ලබ්ධියයි ශුක්ල පක්ෂය කියන ලද විරුද්ධාර්ථයෙන් දතයුතුය. මෙහිද සෙස්ස පළමුවර කියන ලද පරිදිවේ. මේ තුන් දෘෂ්ටීන් අතර නාස්තික දෘෂ්ටිය විපාකය ප්‍රතික්ෂේප කරයි. අක්‍රිය දෘෂ්ටිය කර්මය ප්‍රතික්ෂේප කරයි අහේතුක දෘෂ්ටිය දෙකම ප්‍රතික්ෂේපකරයි. මෙහි කර්මය ප්‍රතික්ෂේප කරන්නහු විසින් ද විපාකය ප්‍රතික්ෂේපිතය. විපාකය ප්‍රතික්ෂේප කරන්නහු විසින් ද කර්මය හා විපාකය යන දෙකම ප්‍රතික්ෂේප කරන්නෝ වෙති. යම් කෙනෙක් ඔවුන්ගේ ලබ්ධිය ගෙන රාත්‍රි ස්ථානයෙහි දිවාස්ථානයෙහි හිඳ සජ්ඣායනයකරත්ද, විමසා බලත්ද ඔවුන්ට දුන්දෙයෙහි විපාකනැත. යාගකළ දෙයෙහි විපාක නැත. කරන්නා නොකරනු ලබයි. පාපයක් නැත. හේතුවක් නැත ප්‍රත්‍යයක්නැතැයි එහිදී මිථ්‍යාසතිය පිහිටයි. සිත එකඟවෙයි. ජවනසිත් දුවයි. ප්‍රථම ජවනයෙහිද ප්‍රතිකාර කළ හැක්කෝ වෙති. දෙවැන්න ආදියෙහිද එසේය. සත්වැන්නෙහි බුදුවරුන් විසින් වුවද ප්‍රතිකාර කළනොහැකිය. නොනවතින්නෝය. අරිට්ඨ කටු හා සමානය. එහි යමෙක් එක් දර්ශනයකට බසී. යමෙක් දෙකකට බසී. යමෙක් තුනක බසී. එකකට බැස්සත් දෙකතුනකට බැස්සත් නියත මිථ්‍යාදෘෂ්ටිකයෙක්ම වෙයි. පත්වූ තැනැත්තා ස්වර්ග මාර්ගයෙහි හැසිරීමටද මෝක්ෂ මාර්ගයෙහි හැසිරීමටද නුසුදුසුය. ඒ ආත්ම භාවයට අනතුරුව ස්වර්ගයට යාමටද නුසුදුසුය. මෝක්ෂය ගැන කියනුම කවරේද වටකණුවා නමැති මේ සත්වයා පොළොව රකින්නෙකි. ඔහු එක් අත්බැවකදි නියත වේද නැතහොත් අන් අත් බවකදී නියත වේද? එක් අත්බැවකදීම නියතවෙයි. ආසේවන වශයෙන් භවාන්තරයෙහිද ඒ ඒ දෘෂ්ටිය කැමති වේමය. මෙබඳු පුද්ගලයකුට බෙහෙවින් භවයෙන් නැගිටීමක් නම් නැත.

තසමා අකල්‍යාණ ජනං - ආසී විස මිවොරගං
ආරකා පරිවජ්ජෙය්‍ය - භූති කාමො විචක්ඛණො

ඒනිසා, අයහපත් ජනයාද
සර්පයා මෙන්ම උරගයාද
සැප කැමති දක්ෂයා
දුරින් දුරු කරන්නේය.

**නත්ථි සබ්බසො ආරුප්පා** අරූප බ්‍රහ්ම ලෝකයක් සර්වාකාරයෙන්ම නැත. මනොමයා ධ්‍යාන සිතින් හටගත් **සඤ්ඤමයා** අරූපධ්‍යාන සංඥාවෙන් **සඤ්ඤමය, රූපනංයෙව නිබ්බිදය විරාගාය නිරෝධාය පටිපනෙනා හොති** මොහු ලාභී හෝ වෙයි තාර්කියෙක් හෝ වෙයි. ලාභී නම් රූපාවචරධ්‍යාන ලාභී, ඔහු රූපාවචරයෙහි සැකයක් නැත. අරූපාවචර ලෝකයෙහි ඇත. ඒ මම අරූපාවචර ඇතැයි කියන්නවුන්ටද, නැතැයි කියන්නවුන්ටද සවන් දෙමි. ඇතනැත යන්න නොදනිමි. චතුර්තධ්‍යාන පදනම් කොට අරූපාවචරධ්‍යානය උපදවන්නෙමි. යම්හෙයකින් අරූප ලෝක ඇත්නම් එහි උපදින්නෙමි. යම්හෙයකින් නැත්නම් රූපාවචර බ්‍රහ්මලෝකයෙහි උපදින්නෙමි එසේ මට අපණ්ණක ධර්මය අපණ්ණකව අවිරුද්ධවම වන්නේය. එසේ පිළිපදියි. තාර්කිකයා වනාහි නොලැබූ ධ්‍යාන ඇත්තේ වෙයි. ඔහුටද රූපධ්‍යාන යෙහි සැකයක් නැත. අරූප ලෝකයෙහි සැකයක් ඇත. ඒ මම අරූප ලෝකයක් ඇතැයි කියන්න වුන්ටද, නැතැයි කියන්නවුන්ටද සවන්දෙමි. ඇත නැත යන්න නොදනිමි. කිසුණු පිරියම් කොට චතුර්ථධ්‍යානය උපදවා එය පදනම් කොට අරූපාවචර ධ්‍යානය උපදවන්නෙමි. යම්හෙයකින් අරූපවචර ලෝකයක් ඇත්නම් එහි උපදින්නෙමි. යම්හෙයකින් නැත්නම් රූපාවචර බ්‍රහ්ම ලෝකයෙහි උපදින්නෙමි. මෙසේ මට අපණ්ණක ධර්මය අපණ්ණකවද අවිරුදධ වන්නේ නම්. එසේ පිළිපදී **භවනිරොධො** නම් නිර්වාණයයි **සරාගාය සනතිකෙ** රාගවශයෙන් සංසාරයෙහි ඇලෙන්නහුගේ සමීපයෙහි. **සංයොගාය** තෘෂ්ණාවශයෙන් යෙදීම පිණිස. **අභිනන්‍දනාය** තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සතුටු වීම පිණිස, **පටිපනෙනා හොති** මොහුද ලාභී හෝ වෙයි තාර්තිකයෙක් හෝ වෙයි. ලාභී නම් අෂ්ට සමාපත්තීලාභී. ඔහුට අරූපාවචර ලෝකයෙහි සැකයක් නැත. නිර්වාණයෙහි සැකයක් ඇත. ඒ මම නිරෝධයක් ඇතැයිද නැතැයිද අසමි. තෙමේ නොදනි, සමාපත්තිය පාදක කොට විදර්ශනාව වඩන්නෙමි. යම්හෙයකින් නිරෝධයක් වේනම් රහත්

බවට පැමිණ පිරිනිවන් පාන්නෙමි. එසේ නොවන්නේනම් අරූප ලෝකයෙහි උපදින්නෙමියි මෙසේ පිළිපදියි. තාර්කිකයා වනාහි එක් සමාපත්තියකවත් ලාභියෙක් නොවේ. අරූප ලෝකයෙහි ඔහුට සැකයක් ඇත. භවනිරෝධයෙහි සැකයක් ඇත. ඒ මම නිරෝධයක් ඇතැයිද නැතැයිද අසමි. තෙමේ නොදනී. කිසුණු පිරියම් කොට අෂ්ට සමාපත්ති උපදවා සමාපත්තියට පාදකවූ විදර්ශනාව වඩන්නෙමි. ඉදින් නිරෝධයක් වන්නේනම් රහත්බවට පත්ව පිරිනිවන් පාන්නෙමි. නොවන්නේ නම් අරූපලෝකයෙහි උපදින්නෙමියි එසේ පිළිපදී. මෙහිදී මෙසේකීය අත්ථිදිනනං ති ආදිනි තාව අපණ්ණකාති භවනතු නත්ථිදිනනංති ආදිනි පන කථං අපණ්ණකානිති ග්‍රහණ වශයෙන් ඒවා වනාහි අපණ්ණක අපණ්ණකයැයි ගනුලැබූ බැවින් අපණ්ණක නම් විය. චතතාරොවෙ මෙය හුදු ගැළපීමයි. නාස්තිකවාදය. අක්‍රියවාදය, අහේතුක වාදය අරූප ලෝකයක් නැත නිරෝධයක් නැතැයි මෙසේ කියන්නෝද යන දෙදෙනාද යන මේ පස් පුගුලෝ ද යව තුන් පුගුලෝද වෙති. අස්තිකවාද ආදිය පසකි. එක් සිව්වැනි පුද්ගලයෙක්ද වෙයි. මේ අර්ථය දක්වීම පිණිස භාග්‍යවතුන් වහන්සේ මේ ධර්ම දේශනාව ආරම්භ කළසේක. එහි සියල්ල අර්ථ වශයෙන් නොගැඹුරුමය.

**දසවැනි අපණ්ණක සූත්‍රයයි**

**ප්‍රථම වර්ගය නිමියේය.**

## 2.2.1

**එවමෙමසුතං** යනු අම්බලට්ඨික රාහුලොවාද සූත්‍රයයි. එහි **අඹලට්ඨිකායං විහරති** වෙළුවන විහාර ප්‍රත්‍යන්තයෙහි පධානඝර කොටසෙහි විවේක කාමීන්ගේ වාසය පිණිස කරවනලද අම්බලට්ඨික නමින් යුතු ප්‍රාසාදයෙහි විවේකය විඳිමින් වාසය කරනසේක. කණ්ටක නමැත්තා උපන්කලපටන් තීක්ෂ්ණය. මෙසේම මේ ආයුෂ්මත් තෙමේද සත්වයස් සාමණෙර කල්හිම විවේකය විඳිමින් එහි වාසය කළේය. **පටිසල්ලානා වුට්ඨිතො** ඵලසමාපත්තියෙන් නැගිට, **ආසනං** මෙහි ස්වභාවයෙන්ම පැනවූ අසුන් ඇත. එය ගසාදමා තැබීය **උදකධානෙ** දියබඳුනෙහි **උදකට්ඨානෙ** - දිය තබනතැන යනුවෙන්ද පාඨයක් ඇත. **ආයසමන්තං රාහුලං ආමන්තෙසි** අවවාද දෙනු පිණිස ඇමතූසේක. භාග්‍යවතුන් වහන්සේ විසින් රාහුල තෙරුන්ට බොහෝ ධර්මදේශනා පවත්වන ලදී. සාමණේර ප්‍රශ්න තෙරුන්ටම කියන ලද ඒවාය. එසේම රාහුලසංයුක්තය, රාහුලොවාද සූත්‍රය. චුල්ලරාහුලොවාද සූත්‍රය මේ අම්බලට්ඨික රාහුලොවාද සූත්‍රය යනුවෙන් මේ ආයුෂ්මත් තෙමේ සත් වයස් කල්හි භාග්‍යවතුන් වහන්සේ සිවුරු කොණින් ගෙන ශ්‍රමණයන් වහන්ස මට දායාද දෙනු මැනවැයි දායාද ඉල්ලමින් භාග්‍යවතුන් වහන්සේ ධම්ම සේනාපති සාරිපුතත තෙරුන්වෙත පමුණුවා පැවිදි කරන ලද්දේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කුඩාදරුවෝනම් යුතුදේත් අයුතුදේත් කියති. මොහුට අවවාද දෙමියි රාහුල කුමරුන් ඇමතූසේක රාහුල ශ්‍රමනයකු විසින් තිරිසන් කතා කීම නොවටී ඔබ කියනවානම් මෙබඳු කථාවක් කරන්න. සම්බුදු වරුන් විසින් අත් නොහරනා ලද දස ප්‍රශ්න, පනස්පස් විසඳුම් එක් ප්‍රශ්නය. එක් උද්දේශය එක් ව්‍යාකරණය. එකනම් කිම. සියලු සත්වයෝ ආහාරය නිසා පවතින්නෝය. - පෙ- දහය නම් කිම. දස අංගයන්ගෙන් යුත් රහතන් වහන්සේයයි කියනු ලැබේ යයි මේ සාමණේර ප්‍රශ්නය වදාළසේක නැවත මෙසේ සිතූසේක කුඩා දරුවෝ නම් සුරතල් බොරු කියන්නෝ වෙති. නොදුටුදේ අප විසින් දක්නා ලද්දේය. දුටුදේ නොදක්නා ලද්දේ යයි කියති. මොහුට ඔවදන් දෙමියි ඇසින් බලාද හඳුනාගනු පිණිස පළමුකොටම දියකළ සතරේ උපමාවෝද, දෙවනුව ඇත් උපමා දෙකද, ආදාස උපමාවද පෙන්වා මේ සූත්‍රය වදළසේක. සිව්පසයෙහි තෘෂ්ණාව ඉවත්කිරීම පංචකාම

ගුණයෙහි ඡන්දරාගය හැරදැම්ම කලණමිතුරන් ආශ්‍රයෙහි මහත් බවද දක්වා රාහුල සූත්‍රය වදළසේක. පැමිණි පැමිණි තැන භවයන්හි ඡන්දරාගය නොකළයුතුයයි මහා රාහුලෝවාද සූත්‍රය වදළසේක එහි රාහුල සූත්‍රය මෙනම් කල්හි කියන ලද්දේ යයි නොකිවයුතුය එය නිරන්තර අවවාද වශයෙන් කියන ලද්දකි. රාහුලසංයුත්තය සත්වස් වයස්කල් පටන් ආවශ්‍යක භික්ෂුකාලය දක්වා දෙසන ලදී. මහා රාහුලොවාද සූත්‍රය ආවශ්‍යක භික්ෂු කාලයෙහි දෙසන ලදී. කුමාර ප්‍රශ්නය හා මෙම අවබලටඨිකා රාහුලොවාද සූත්‍රය සත්වස්වයස් සාමණේර කාලයෙහි දෙසනලදී. එයින් රාහුලොවාද සූත්‍රය නිරන්තර අවවාද වශයෙන්ද රාහුල සංයුත්තය තෙරුන්ගේ විදර්ශනාගර්භ ග්‍රහණය පිණිසද, මහාරාහුලොවාද සූත්‍රය ගෙහසිත ඡන්‍දරාගය නැති කිරීම පිණිසද චූල්ලරාහුලෝවාද සූත්‍රය තෙරුන්ගේ පසළොස් විමුක්ති මුහුකුරායන ධර්මය මුහුකුරා ගිය කල්හි රහත්බව ගන්වනු පිණිස දෙසන ලදී. මේ සඳහා රාහුල තෙරුන් වහන්සේ භික්ෂුසංඝයා මැද තථාගතයන් වහන්සේගේ ගුණ කියන්නාහු මෙසේ කීහ.

> **කිකීව බීජං රක්ඛෙය්‍ය - චමරීවවාලමුත්තමං**
> **නිපකො සීල සම්පන්නො - මමං රක්ඛී තථාගතො ති.**

කිරලිය බිජුවට මෙන්ද
සෙමර මුවා උතුම් වලිගය මෙන්ද
නුවණැති සිල්වත්
තථාගතයන් වහන්සේ
මා රැකගත් සේක.

සාමණේර ප්‍රශ්නය අයුතුවදන් අත්හැර දැමීම පිණිසද, මේ අම්බලටඨිකා රාහුලොවාද සූත්‍රය සම්ප්‍රජාන මුසාවාදය නොකරනු පිණිසද දෙසන ලදී. එහි පස්සසිනො දක්නේ නොවෙහිද? **පරිත්තං** මඳක්. **යාමණ්ඩස්සං** මහණදම **නික්කුජ්ජිත්වා** යටිකුරු කොට. **උක්කුජ්ජිත්වා** උඩුකුරුකොට **සෙය්‍යථාපි රාහුල රඤ්ඤෝනාගො** මේ උපමාව සම්පජාන මුසාවාදයෙහි සංවරනැත්තහුට උපමා දක්වනු පිණිස දෙසන ලදී. එහි ඊසාදන්තො රිය දඬුවක්වන් දළ ඇති. **අබබූළ්හාවා** අතිශයින් වැඩුණු ආරෝහ සම්පන්න.

අභිජාතො සුජාත ජාති සම්පන්න සඞගාමාවචරො සංග්‍රාමයට බටවිරූ **කම්මං කරොති** ආ ආවුන් පෙරළා පමුණුවයි. ඉදිරිපස ඉදිරිපස කයින් ලෑලි ලීකැබලි පවුරුතෙක් පමුණුවයි. පසුපසින් හා හිසින් කරන කර්ම නම් නියම කොට එක් ප්‍රදේශයක් මර්දනය කරන්නෙමියි නැවතී බලයි. මෙපමණකින් සියයක් දහසක් වුවද දෙකඩ කොටලයි. කණින් කරන කර්මනම් ආ ආ ඊතල කන්වලින් පහරදී හෙළීමයි. දන්ත කර්ම නම් විරුද්ධ ඇතුන් අසුන් ඇතරුවන් අසරුවන් පාබළයන් විද දැමීමයි. නගුටින් කරන කර්ම නම් නගුටෙහි බැඳුණු දික් කඩු යෂ්ටි ආදියෙන් හෝ යමුගුරින් හෝ කඩා බිඳ දැමීමයි. **රක්ඛතෙව සොණ්ඩං** සොඬය මුවෙහි බහා රැකගනී. **තත්‍ථ** එහි ඒ ඇතුගේ කාර්යයෙහි **අපරිච්චත්තං** අත් නොහළ අනුන්ට ජය අපට පරාජය දකියයි සිතයි. **සොණ්ඩායයි කම්මං කරොති** යමුගුරක් හෝ කිහිරි මොහොලක් හෝ ගෙන හාත්පස දහඅට රියනක් තැන මඩී. පරිච්චත්තං අත්හළ දූන් ඇතුන් යෝධයන් ආදින් කෙරෙහි කොතැනින් හෝ බිය නොවේ. අපට ජය අනුන්ට පරාජය දක්නේයි හඟියි. **නාහං තස්ස කිඤ්චි පාපං** ඔහුට දුකුළාඇවැත් ඉක්මවීමෙ හෝ මව්මැරීම් ආදී කර්මයන්හි හෝ කිසි පාපයක් නොකට යුතුය යන්නක් නම් නැත. **තස්මා තිහ** මෙ යම් හෙයකින් සම්පජාන මුසාවාද කියන්නකුට නො කළ හැකි පාපයක් නම් නැත. එහෙයින් එයින්ද වෙයි. **හස්සායපි** විසුළු කැමති බවනිසා හෝ බොරු නොකියන්නෙමියි හික්මිය යුතුය. **පච්චවෙක්ඛනත්‍ථො** බැලීම පිණිස. මුවෙහි යම් වරදක් වේද එය දැකීම පිණිස යයි කියන ලද්දේ වෙයි. පච්චවෙකඛිත්වා **පච්චවෙක්ඛිත්වා** බලා බලා **සසක්කං කරණීයං** නිශ්චිතවම නොකළ යුතුය. **පටිසංහරෙය්‍යාසි** නොපැවැතිය යුතුය. නොකළයුතුය. **අනු පදජ්ජෙය්‍යාසි** දියයුතුය. **උපඤ්ඤමෙහය්‍යාසි** නැවත නැවත කරන්නෙහිය. **අට්ටිතබ්බං** බියෙන් පීඩාවෙන් වියයුතුය. **හරායිතබ්බං** ලජ්ජාවියයුතුය. **ජිගුච්ඡිතබ්බං** අසුචි දුටුවාක් මෙන් පිළිකුල උපදවාගත යුතුය. **අහොරත්තානු සික්ඛී** රෑද දවල්ද හික්මෙමින්, මනෝ කර්මයට දේශනාවස්තුවක් නොවන හෙයින් මෙහි දෙසියයුතුයයි නොකියන ලදී. කොපමණ තැනක් කායකර්ම වාක්කර්ම පිරිසිදු කළයුතුද, කොපමණ තැනක් මනෝ කර්ම පිරිසිඳ කළයුතුද, කායකර්ම වාක්කර්ම නම් බතට පෙර එක්වරක් පිරිසිදු කළයුතුය. බත්කිස නිමවා දිවාස්ථානයෙහි හුන්නහු විසින් අරුණුනැගෙන වේලේ පටන් මෙතැන හිඳගැනීම දක්වා මේ අතරතුර අනුන්ට අප්‍රියවූ මාගේ

කායකර්මයක් හෝ වාක්කර්මයක් ඇත්තේ දැයි හැරීබැලිය යුතුයි. ඉදින් ඇතැයි දනීද දෙසිය යුතු දෙයක් වේනම් දෙසිය යුතුය. හෙළිකළයුත්තක් වේනම් හෙළිකළ යුතුයි. ඉදින් නැත්නම් ඒනිසාම ප්‍රීති ප්‍රමෝදයෙන් වාසය කළ යුතුය. මනෝකර්මය නම් එක් පිණ්ඩපාත තැන පිරිසිදු කළයුතුය. අද පිණ්ඩපාතය වළඳන තැන රූපආදින්හි ඡන්දයක් හෝ රාගයක් හෝ වෛරයක් මට ඇත්තේද ඉදින් ඇත්නම් නැවත එසේ නොකරන්නෙමියි සිතින්ම අධිෂ්ඨාන කළයුතුය. ඉදින් නැත්නම් එම ප්‍රීතිප්‍රමෝදයෙන්ම වාසය කළයුතුය. **සමණාවා බ්‍රාහමණාවා** බුදුවරු හෝ පසේ බුදුවරුහෝ තථාගත ශ්‍රාවකයෝ හෝ, තසමාතිහ යම්හෙයකින් අතීතයෙහිද මෙසේ පිරිසිදු කළාහුය. අනාගතයෙහිද පිරිසිදු කරන්නාහුය. දැනුත් පිරිසිදු කරත් ඒනිසා ඔවුන් අනුව නික්මෙන්නාවූ ඔබ විසින්ද මෙසේ හික්මිය යුතුය යන අර්ථයි. සෙස්ස සියලුතැන නොගැඹුරුමය, භාග්‍යවතුන් වහන්සේ මේ ධර්ම දේශනාව භාවාග්‍රයතෙක් උස්වූ රුවන් රැසෙහි යෝග්‍ය මැණික් කඳකින් කුළු ගන්වන්නාක් මෙන් නෙය්‍යපුද්ගල වශයෙන් නිමවා වදාළ සේක.

## පළමුවැනි අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයයි.

## 2.2.2

**එවමෙමසුතං** යනු මහාරාහුලොවාද සූත්‍රයයි. **තථා පිටයීතො පිටයීතො අනුබනධි** දර්ශනය අත්නොහැර ගමන නොනවත්වා පසුපසින් ඉරියව් අනුබැඳුමෙන් අනු බැන්දේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පියවරෙහි පියවර තබමින් ලැසිගමනින් පෙරටුව පෙරටුව වඩනාසේක රාහුල හිමියෝ බුදුහිමියන්ගේ පා අනුව පසුපසින් වඩිති. එහිදී භාග්‍යවතුන් වහන්සේ සුපිපි සල්වනයක් මැද සිට යහපත් බිමකට බැසීමට නික්මුණු උතුම් මත් ඇතකු මෙන් බැබලුණු සේක. රාහුලභද්‍ර උතුම් හස්තියාගේ පසුපසින් නික්මුණු ඇත්පැටවකු මෙන් විය. භාග්‍යවතුන් වහන්සේ සවස්යාමයෙහි මැණික් ගුහාවකින් නික්මී ගොදුරට පිළිපන් කේශර සිංහයකු මෙන් වුහ. රාහුලභද්‍ර සිංහරාජයා ලුහුබඳමින් නික්මුණු සිංහ පෝතකයකු මෙනි. භාග්‍යවතුන් වහන්සේ මැණික් පව්වක් වැනි වන ලැහැබින් එන මහ දත්ඇති මහා ව්‍යාඝ්‍රයෙකු වැන්න. රාහුලභද්‍ර

ව්‍යාඝ්‍රරාජයා අනුව යන ව්‍යාඝ්‍ර පෝතක යකු වැන්න භාග්‍යවතුන් වහන්සේ සිම්බලි පොකුණින් නික්මුණු ගුරුළු රජුවැන්න. රාහුලභද්‍ර ගුරුළුරජු පසු පසින් නික්මුණු ගුරුළු පොව්වකු වැන්න. භාග්‍යවතුන් වහන්සේ චිත්‍ර කූට පර්වතයෙන් ගුවන්තලයට පියැඹූ ස්වර්ණහංස රාජයකු වැන්න. රාහුලභද්‍ර හංසරාජයා අනුව පියාඹන ස්වර්ණ හංස පෝතකයකු වැන්න. භාග්‍යවතුන් වහන්සේ මහ සයුරෙහි පාවෙන මහරන් නැවක් වැන්න. රාහුලභද්‍ර රන් නැවට සම්බන්ධව පසුපසින් බැඳි පහුරක් වැන්න. භාග්‍යවතුන් වහන්සේ චක්‍ර රත්න ආනුභාවයෙන් ගුවන් තලයට සැපත් සක්විති රජුවැන්න. රාහුලභද්‍ර රජු අනුව සැපත් පුත්‍රරත්නය වැන්න. භාග්‍යවතුන් වහන්සේ වලාකුළු නැති අහස්තලයට පිළිපන් චන්ද්‍රයා වැන්න. රාහුලභද්‍ර චන්ද්‍රයාගේ මගට පිළිපන් පරිශුද්ධ ඕසධී තාරකාව වැන්න. භාග්‍යවතුන් වහන්සේද මහාසම්මත ප්‍රවේණියෙහි ඔක්කාක රාජවංශයෙහි උපන්හ. රාහුලභද්‍ර එසේය. භාග්‍යවතුන් වහන්සේද රාහුල භද්‍රද සක්ගෙඩියක දමූ කිරක් සේ සුපරිශුද්ධ ජාති ඇති ක්ෂත්‍රිය කුලයෙහි උපන්හ. භාග්‍යවතුන් වහන්සේද රාහුල භද්‍රද රාජ්‍යය අත්හැර පැවිදිවූවෝය. භාග්‍ය වතුන් වහන්සේගේ ශරීරය දෙතිස් මහ පුරිස් ලකුණින් ප්‍රතිමණ්ඩිතය. දෙව්නුවර නැගූ රුවන් තොරණක් වැන්න. සැමතැන මල් පිපුණු පරසතු රුකක් මෙන් අතිමනෝහරය. රාහුලභද්‍රගේ ශරීරයද එසේය. මෙසේ දෙදෙනම අභිනීහාර සම්පන්නය. දෙදෙනම රජකුලයෙන් පැවිදිවූවෝය. දෙදෙනම ක්ෂත්‍රිය සුකුමාරය. දෙදෙනම රන්වන්ය. දෙදෙනම උපලක්ෂණ සම්පන්නය. එක් මගකට පිළිපන්නෝය. පිළිවෙළින් යන්නාවූ චන්ද්‍රමණ්ඩල දෙකෙහි, සූර්ය මණ්ඩල දෙකෙහි, ශක්‍ර සුයාම සන්තුසිත පරනිර්මිත වසවර්ති මහා බ්‍රහ්ම යන්...... දෙදෙනාගේ ශ්‍රීය අබිබවන්නාක් මෙන් බැබලුණහ. එහිදී ආයුෂ්මත් රාහුල හිමියෝ භාග්‍යවතුන් වහන්සේගේ පසුපසින් යන්නාහු තථාගතයන් වහන්සේගේ පාතලයෙහි සිට කේශාන්තය දක්වා බැලූහ. හේ භාග්‍යවතුන් වහන්සේගේ බුද්ධ වේශයෙනි විලාසය දැක දෙතිස් මහා පුරුෂලක්ෂණයෙන් විචිත්‍රවූ ශරීරයක් ඇති බඹයක් වටකළ ප්‍රභා මණ්ඩලයක් ඇති, විසිරීගිය රන් සුණු මැදට පැමිණියාක් මෙන්ද විදුලියෙන් වෙළාගත් රන් පව්වක් මෙන්ද. යන්ත්‍ර සූත්‍රයන්ගෙන් ඇදගෙන යන්නාවූ රුවනින් විචිත්‍ර වූ රන් ඇහැයක් මෙන්ද පංසුකුල චීවරයෙන් වැසුණද රන් කම්බිලියෙන් වැසුණු රන්පව්වක් මෙන්ද, පබළුවැලින් විසිතුරුවූ රන්

ඇඟෑයක් මෙන්ද, චීන පිටිසුන්නෙන් පිදුණු ස්වර්ණ චෛත්‍යක් මෙන්ද, ලාරසින් තවරන ලද කනක යූපස්තම්භයක් මෙන්ද, රන්වලාවන් අතරට පැමිණි එකෙණෙහි නැගුණු පුන්සඳමෙන්ද, භාගයවතුන් වහන්සේ බබලන සේක. සමතිස් පෙරුම් දමින් සැදුණු ආත්මභාවයෙන් ශ්‍රී සම්පත්තිය පුදුමය යයි සිතුහ. ඉන්පසු තමාදෙසද බලා මමද හොබිමි. ඉදින් භාග්‍යවතුන් වහන්සේ සිව්මහ දිවයින්හි සක්විති රජය කළසේක්නම්, මට පරිනායක තනතුර දෙනු ඇත. මෙසේ ඇති කල්හි දඹදිව් තලය අතිශයින් බැබලෙන්නට තිබුණියි ආත්මභාවය ඇසුරින් ගෙන සිත ඡන්දරාගය ඉපදවීය. භාග්‍යවතුන් වහන්සේද පෙරටුව යමින් මෙසේ සිඳසේක. රාහුලගේ ආත්ම භාවය දූන් සම්මස් ලෙයින් පිරිපුන්ය. ඇලුම් කළයුතු රූපාරම්මණ ආදිය කෙරෙහි සිත පැන ගන්නා කාලය එළඹියේය. කුමක් බහුල කොට රාහුල දූන් කල්ගෙවයිද ඉක්බිති ආවර්ජණය සමගම පහන් දියෙහි මසකු මෙන් පිරිසිදු ආදසතලයෙහි මුවමඩල මෙන්ද ඔහුගේ ඒ සිතෙහි උපන්දෙය දුටුසේක. මේ රාහුල මාගේ පුත්‍රයාව මාගේ පසුපසින් එමින් මම ලස්සනය, මාගේ වර්ණායතනය ප්‍රසන්නයැයි ආත්ම භාවය ඇසුරු කොට ගේහසිත ඡන්ද රාගය උපදවා ගත්තේය. වැරදි පොටකට පැන වැරදිමගකට එළඹ නුසුදුසු තැනක හැසිරෙයි මංමුලාවූ මගියකු මෙන් නොයායුතු දෙසකට යයි. ඔහුගේ මේ ක්ලේශය අභ්‍යන්තර යෙහි වැඩෙමින් ආත්මාර්ථය පවා යථා පරිදි දකින්ට නොදෙයි. පරාර්ථයද උභයාර්ථයද දකින්ට නොදෙයි. ඉන් නිරයෙහි ප්‍රතිසන්ධි ගන්වන්නේය. තිරිසන් යෝනියෙහිද ප්‍රේත විෂයෙහිද අසුරකායෙහිද පිරිස් අතරෙහිද මව්කුසයෙහිද අනවරාග්‍ර සංසාරයෙහි හෙළන්නේය. මේ වනාහි

අනත්ථජනනො ලොභො - ලොභො චිත්තප්පකොපනො
භයමන්තරතො ජාතං - තං ජනො නාව බුජ්ඣති
ලුද්ධො අත්ථං නජානාති - ලද්ධො ධම්මං නපස්සති
අන්ධනතමං තදා හොති- යං ලොභො සහතෙ නරං

අයහපත ඇතිකරන ලෝභය ලෝබියා යහපත නොදනී
සිතේ කොව ඇතිකරන ලෝභය ලෝබියා දහමද නොදකී

ඇතුළතින් හටගත් බිය ලෝබය මිනිසා පෙළනවිට
මිනිසා අවබෝධ කර නොගනී එදා ගනදුර ඇතිවෙයි.

යම්සේ නොයෙක් රත්නයන්ගෙන් පිරුණු මහනැවක් බිඳුණු ලෑලි අතරින් ජලය ඇදීඑනවිට මොහොතක්වත් බලාපොරොත්තු තැබිය නොහැකි බවට පත්වෙයි. මහත් වේගයකින් එහි සිදුරු වසා දමන්ට වටී. එසේම මෙයද අපේක්ෂා නොකළ යුත්තකි. යම්තාක් මේ ක්ලේශය අභ්‍යන්තරයෙහි ශීල රත්නයන් විනාශ නොකෙරේද එකෙණෙහිම එයට අවමන් කරන්නෙමියි අදහසක් ඇතිකරගත්සේක මෙබඳු තැන්වලදී බුදුවරුන්ට නාගවිලෝකනය නම් දෙයක් ඇතිවෙයි. එහෙයින් පෙරළුරන් පිළිමයක් මෙන් සියලු සිරුරින්ට පෙරළා සිටිසේක් රාහුලභද්‍ර ඇමතූ සේක. **අථඛොභගවා අපලොකෙත්වා** ආදිය කියනලදි.

එහි **යං කිඤ්චිරූපං** ආදිය සර්වාකාරයෙන් විශුද්ධිමාර්ගයෙහි ඛන්ධ නිදෙදසයෙහි විස්තර කරන ලදී. **නෙතං මම** ආදිය මහා හත්ථිපදොපම සූත්‍රයෙහි කියන ලදී. **රූපමෙම නුඛො භගෙන** කුමක් නිසා විචාරයිද. ඔහුට සියලු රූපය මාගේ නොවේ. රූපය මම නොවෙමි. ඒ මගේ ආත්මය නොවේ යයි අසා භාග්‍යවතුන් වහනසේ සියලු රූපය විදර්ශනා ප්‍රඥවෙන් මෙසේ දැකියයුතුයයි වදාරන සේක. වේදනා ආදියෙහි දී කෙසේ පිළිපැදියයුතුද යන න්‍යායයක් ඇතිවිය. ඒනිසා ඒ න්‍යායයෙහි සිට විචාරයි. ආයුෂ්මත් රාහුල න්‍යාය දක්ෂයෙකි. මෙයද නොකළයුතුයයි කීකල්හි මෙයද නොකළ යුතුය මෙයද නොකළ යුතුයයි කීකල්හි මෙයද නොකළ යුතුය මෙයද නොකළ යුතුයයි න්‍යාය සියයකින්ද න්‍යාය දහසකින්ද තේරුම් ගනී. මෙය කළයුතුයයි කීකල්හිද මෙම න්‍යායයි. මේ ආයුෂ්මත්හු ශික්ෂාකාමීය. උදෑසනම ගඳකිළි මිදුලෙහි පාත්‍රයක් පමණ වැලි විසුරුවත්. අද සම්මා සම්බුදුන් හමුවෙහි අද මාගේ උපාධ්‍යායයන් හමුවෙහි මෙපමණ ඔවදන් ලබමි මෙපමණ අවමන් ලබමියි. සම්මා සම්බුදුන් වහන්සේද අග්‍රස්ථානයෙහි තබන සේක් මහණෙනි මාගේ ශික්ෂාකාමී ශ්‍රාවක භික්ෂූන් අතර යමෙක් අග්‍රවේද ඒ රාහුලයයි ශික්ෂාවෙහිම අග්‍රකොට තැබූ සේක. ඒ ආයුෂ්මත්හුද භික්ෂුසංඝයා මැද එම සිංහනාදයම කළහ.

සබ්බමෙතං අභිඤ්ඤාය - ධම්මරාජා පිතාමම
සම්මුඛා භික්ඛු සංඝස්ස - එතදග්ගෙ ඨපෙසිමං
සික්ඛාකාමානහං අග්ගො - ධම්ම රාජේන ථොමිතො
සද්ධා පබ්බජිතානඤ්ච - සහායො පවරො මම
ධම්මරාජා පිතාමය්හං - ධම්ම රක්ඛො ච පෙත්තියො
සාරි පුත්තො උපජ්ඣායො - සබ්බං මෙ ජිනසාසනං

මාගේ පියවූ දම්රදාණන් වහන්සේ
මේ සියල්ල දැන
බික් සඟන හමුවෙහි මා
අගතන්හි තැබූසේක

මම ශික්ෂකාමීන් අතර
අග්‍රවෙමි
දම්රදාණන් විසින් පසයන ලද්දෙමි
සැදැහැයෙන් පැවිදිවූවන්ට
උතුම් සහායක යෙක්ද වෙමි.

මපියා දම් රදය
දම් රැකිද පිය පස ද වෙති
මාගේ උපාධ්‍යායයන් වහන්සේ
සැරියුත් තෙරුණුවෝය.
මේ සියල්ල මට බුදුසසුනය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට හුදෙක් රූපයම පමණක් නොව වේදනා ආදියද මෙසේ දතයුතුයයි තසමා රාහුල යනාදිය වදළසේක. කොනජ්ජා අද කිමෙක්ද. තෙරුන්ට මෙසේ සිතිණ. සම්මා සම්බුදුන් වහන්සේ මාගේ ආත්මභාවය ආශ්‍රිතවූ ඡන්දරාගය දැන ශ්‍රමණයා විසින් මෙබඳු විතර්කයක් නොකළයුතුයයි පර්යාය කථාවක් නොකළසේක. නැවත මෙබඳු විතර්කයක් නොකළ යුතුයයි යව මහණ රාහුලට කියන්නැයි දූතයකු නොයැවූ සේක. හමුවෙහිම සිට බඩුසහිත සොරකු කෙසින් ගන්නාක් මෙන් හමුවෙහිදී සුගතොවාදය දුන්සේක. සුගතොවාදය වනාහි කල්ප

අසංඛෙය්‍යකින් ලැබිය නොහැක්කකි. මෙබඳු බුදුකෙනකුගේ හමුවෙහි අවවාද ලැබ කවර නුවණැත්තෙක් අද පිඬු පිණිස ගමට පිවිසෙන්නේදැයි ඉක්බිති මේ ආයුෂ්මත්හු අහරකිස හැර එහි හිඳිමින් සිටිමින් අවවාද ලබන ලද්දේ එයින්ද නැවත අවුත් එක්තරා රුක්මුලක හුන්හ. භාග්‍යවතුන් වහන්සේද ඒ ආයුෂ්මතුන් නවතිනු දක රාහුල මේ ඔබගේ පිඬුපිණිස ගමට පිවිසෙන්නේදැයි ඉක්බිති මේ ආයුස්මත්හු අහරකිස හැර එහි හිඳිමින් සිටිමින් අවාද ලබන ලද්දේ එයින්ද නැවත අවුත් එක්තරා රුක්මුලක හුන්හ. භාග්‍යවතුන් වහන්සේද ඒ ආයුස්මතුන් නවතිනු දක. රාහුල මේ ඔබගේ පිඬු පිණිස හැසිරෙන වේලාවය නොනවතින්නැයි නොකී සේක. කුමක්නිසාද? උන්වහන්සේට මෙසේ සිතිණ. අද කායගතාසති නමැති අමෘත භෝජනය වළඳන්නැයි අද්දසාබො ආසමා සාරිපුත්තො භාග්‍යවතුන් වහන්සේ වැඩිකල්හි පසුව යමින් දුටහ. මේ ආයුෂ්මතුන්ට හුදෙකලාව වාසය කරන විට එක් වතකි. භාග්‍යවතුන් වහන්සේ සමග වෙසෙනවිට අන්වතකි. යම් කලෙක දැගසව්වෝ හුදෙකලාව වසත්ද එකල්හි උදෑසනම සෙනසුන හැමද සිරුර පිළිදගුම් කොට, සමාපත්තිය නගාගෙන වැඩහුන්නාහු තමන්ගේ සිතැඟි පරිදි පිඬු පිණිස යත්. තෙරවරු භාග්‍යවතුන් වහන්සේ සමග වාසය කරනවිට මෙසේ නොකරත්. එකල්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා පළමු පිඬු පිණිස වඩනා සේක. උන්වහන්සේ වැඩිකල්හි තෙරුන්වහන්සේ තමන්ගේ සෙනසුනින් නික්ම බොහෝ දෙනකු වසන තැන සියලු දෙනම සතුටු කිරීමට හැක්කේ හෝ වේවා නොහැක්කේ හෝවේවායි ඒ ඒ තැනට ගොස් නොහමළ තැන් හමදිති. ඉදින් කසල ඉවත් කර නැත්නම් එය ඉවත් කරති. පැන් තැබිය යුතු තැන පැන් කලයක් නැත්නම් පැන් කළයක් තබති. ගිලනුන් ළගට ගොස් ඇවැත්නි ඔබට කුමක් ගෙන එන්නද, ඔබ කැමති කුමකටදැයි අසති. අවශ්‍ය කරුණ භික්ෂුන් ළගට ගොස් ඇවැත්නි ඇලීගැලීවසන්න. නොකලකිරෙන්න බුදුසසුන පිළිවෙත් සරුවුවකැයි ඔවදන් දෙති. එසේ කොට සියලු දෙනට පසුව පිඩු පිණිස යති. යම්සේ සක්විති රජ කිසියම් තැනකට යන්නට කැමැත්තේ සේනාවන් පිරිවරන ලද්දේ නික්මුණේයයි පුත්‍රරත්නය සෙනග සංවිධානය කොට පසුව නික්මෙයි. මෙසේම සද්ධර්ම චක්‍රවර්තිවූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා පළමුව නික්මෙන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ පුත්‍රරත්නය වූ ධර්ම සේනාපතින් වහන්සේ මේ කටයුතු ඉටුකොට

සියල්ලන්ටම පසුව නික්මෙති. එසේ නික්මුණු උන්වහන්සේ එදවස එක්තරා රුක් මුලක හුන් රාහුලභද්‍ර දුටහ. එහෙයින් කියනලදී. පච්ඡා ගච්ඡනෙතා අද්දස යැයි. එසේනම් ආනාපානසතියෙහි නියුක්ත කරවුයේ ඇයි. හිඳ සුදුසු බැවිනි. තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මොහුට රූපකර්මස්ථාන කියාදෙන ලද්දේයයි ආවර්ජනය නොකරම යම්හෙයකින් මොහු අවලාසන බැඳ හුන් බැවින් හුදෙකලාව හිඳිම කර්මස්ථානයට සුදුසුයයි සිතා මෙසේ කීහ. එහි ආනාපානසතිං ආශ්වාස ප්‍රශ්වාසයන් අල්ලාගෙන එහි චතුර්ථධ්‍යාන පඤ්චකධ්‍යාන උපදවා විදසුන් වඩා රහත්බව ගනී යයි දක්වයි. මහප්ඵලා හොති කෙතරම් මහත්ඵල වේද මෙහි භික්ෂුව ආනාපාන සතියෙහි අනුයුක්තවූයේ එක් ආසනයෙකින් හිදගෙනම සියලු ආශ්‍රවයන් ගෙවා රහත්බවට පැමිණෙයි. එසේ නොහැකිවන්නේ මරණ අවස්ථාවෙහි සම සීසී එසේ නොහැකිවන්නේ දෙව්ලොව ඉපදී ධර්ම කථික දිව්‍ය පුත්‍රයාගේ ධර්මය අසා රහත්බවට පැමිණෙයි. එයින් නොහැක්වුයේ බුදුන් නුපන් කල්හි පච්චෙක බෝධිය අවබෝධකරයි. එය අවබෝධ නොකරන්නේ බුදුන් හමුවු කල්හි බාහිය තෙරුන් ආදීන් මෙන් වහා අභිඥලබන්නේවෙයි. මහත්ඵල මෙසේය. මහානිසංස යනු එයට වෙනත් වචනයකි. එය කියන ලදී.

**ආනාපාන සතීයසස - පරිපුණ්ණාසුභාවිතා**
**අනුප්‍රබ්බං පරිචිතා - යථා බුදෙධන දෙසිතා**
**සොමං ලෝකං පභාසෙති - අබ්භාමුත්තොව චන්දිමා**

| | |
|---|---|
| යමකුගේ ආනාපාන සතිය | හේ මේලෝකය |
| පරිපුන්ද සුභාවිතද | වලාකුළින් මිදුණු සඳමෙන් |
| බුදුන් දෙසු පරිදි | බබලවයි. |
| පිළිවෙළින් පුරුදු කරන ලදද. | |

මේ මහත්ඵල භාවය දක්නා තෙරුන් වහන්සේ සද්ධිවිහාරිකයා එහි යොදවති. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රූප කර්මස්ථානයද. තෙරුන්වහන්සේ ආනාපාන සතියද යන කර්මස්ථාන දෙකම කියා ගියහ. රාහුලභද්‍ර විහාරයෙහිම තනිවුයේය. භාග්‍යවතුන් වහන්සේ ඔහු තනිවූ බව

දන්නා නමුත් තමාම කෑයුතුදෙයක් පියයුතු දෙයක් ගෙන ගියේ නැත. ආනන්ද තෙරුන් අතද යැව්වේනැත. පසේ නදී මහරජු අනේපිඩු ආදීන්ට සංඥාවක් කළේද නැත. සංඥාමාත්‍රයක් ලැබ ඔවුහු දන්කදක් එළවන්නාහුය. භාග්‍යවතුන් වහන්සේ මෙන්ම සැරියුත් තෙරුන්වහන්සේද කිසිවක් නොකළාහු ය. රාහුලහිමියෝ නිරාහාරව සුන්බත් වූහ. ඒ ආයුෂ්මතුන් වහන්සේට, භාග්‍යවතුන් වහන්සේ මා විහාරයෙහි තනිවූ බව දැන ගෙනත් තමා ලද පිණ්ඩපාතය තමාම නොගෙන ආසේක. අනිකකු අත එව්වේද නැත. මිනිසුන්ට සංඥවක්ද නොකළසේක. උපධ්‍යායයන් වහන්සේද මා තනිවූ බව දන්නාහු ඒ අයුරින්ම කිසිවක් නොකළහයි සිතක් වත් නූපන. ඒ හේතුවෙන් අවමානයක් හෝ අභිමානයක්හෝ කොයින් ඇතිවන්නේද. භාග්‍යවතුන් වහන්සේ විසින් කියාදෙන ලද කර්මස්ථානයම පෙරබත් කල්හිද පසුබත්කල්හිද මෙසේ රූපය ආනිත්‍යය. දුකය, අසුභය අනාත්මයැයි ගිනි දල්වන්නාක්මෙන් නිරතුරුව සිත්හි තබා සවස්යාමයෙහි මෙසේ සිතූහ. මම උපාධ්‍යායයන් වහන්සේ විසින් ආනාපාන සතිය වැඩිය යුතුයයි කියන ලද්දෙමි. උන්වහන්සේගේ වචන නොකරන්නෙමි. ආචාර්ය උපාධ්‍යායයන්ගේ වචනය නොකරන්නා දූර්වචයෙක්වෙයි දූර්වච රාහුල උපාධ්‍යායන් වහන්සේගේ වචනයද නොකරතියි ඇතිවන ගර්හාවට වඩා කර්කශවූ පීඩාවක්නම් නැතැයි භාවනාවිධානය විමසනු කැමැතිව භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගියහ. එය පෙන්වන්ට අථබො ආයසමා රාහුලො ආදිය කියන ලදී. එහි **පටිසලලානා** හුදෙකලාබවින්, **යංකිඤ්චිරාහුල** යනුවෙන් කුමක්නිසා භාග්‍යවතුන් වහන්සේ ආනාපාන සතිය විමසන ලදුව රූප කර්මස්ථානය වදළසේක්ද, රූපයෙහි රූපයෙහි ඡන්දරාගය නැතිකරනු පිණිසය. උන්වහන්සේට මෙසේ සිතිණ. රාහුලගේ ආත්මභාවය නිසා ඡන්දරාගය උපන. යවදීද ඔහුට සංක්ෂේපයෙන් රූප කර්මස්ථානය කියන ලදී. දූන් ඔහුට දෙසාළිස් අයුරෙකින් ආත්ම භාවය හැරදමා විනාශකොට ඒ ආශ්‍රිත ඡන්දරාගය නූපදිනා ස්වභාවයට පත්කරන්නෙමි. ඉක්බිතිව ආකාශ ධාතුව කුමක් හෙයින් විස්තර කරන ලද්දේද. උපාදා රූපය නොවේ. ඒනිසා මේ අයුරින් එය පෙන්වනු පිණිස ආකාශධාතුව විස්තරකරන ලදී. එසේ වුවත් ආධ්‍යාත්මික ආකාශයෙන් පිරිසිඳුණු රූපයද ප්‍රකට වෙයි.

ආකාසෙන පාරිවජ්ජනනං - රූපං යාති විභූතතං
තසෙසව ආවිභාවත්‍ථං - තං පකාසෙසි නායකො

අහසින් පිරිසිඳුණු
රූපය ප්‍රකට බවට යේ
එය හෙළිකරනු පිණිසම
බුදුරදහු එය පැවසුහ.

මෙහි පළමු සිව් ධාතුවල යමක් කියයුතුද එය මහාහත්‍ථිපදොපම සූත්‍රයෙහි කියන ලද්දේමය. ආකාසධාතුයං ආකාසගතං ආකාශ භාවයට ගිය. උපාදිණ්ණං තෘෂ්ණාවෙන් ගන්නා ලද ස්පර්ශකරන ලද ශරීරයෙහි පිහිටි යන අර්ථයි. කණ්ණච්ඡිද්දං මස් ලේ ආදියෙන් ස්පර්ශ නොවූ කන් සිදුර, නාසාච්ඡිද්දං යනාදියෙහිද මේ ක්‍රමය මැයි. යෙනච යම් සිදුරෙකින්, අජ්ඣෝහරති ඇතුළට පිවිසවයි. දිව බැඳුණු තැන සිට උදර පටලය තෙක් මිනිසුන්ගේ වියතක්හා අඟල්හතරක් සිදුරුවූ තැනක් වේයි. ඒ සඳහා මෙය කියන ලදී. යත්‍ථච යම් අවකාශයෙක, සන්තිට්ඨති පිහිටයි. මිනිසුන්ගේ මහත්වූ පෙරහන් පමණවූ උදරපටලනම් දෙයක් නැත. ඒ සඳහා මෙය කියන ලදී. අධො භාගා නිමකඛති අධෝමාර්ගයෙන් නික්මෙයි. රියන් තිස් දෙකක් පමණ විසි තැනෙක වංකවූ බඩවැලක් ඇත. ඒ සඳහා මෙය කියන ලදී. යංවා පන අඤ්ඤම්පි මෙයින් සියුම් සියුම් සම්මස් ආදිය අතරට ගිය රෝම කූප ආකාරයෙන්ද සිටි අවකාශය දක්වයි. සෙසු අර්ථයද පඨවිධාතු ආදියෙහිදී කියූ අයුරින් දතයුතුය. දැන් ඔහුගේ තාදිභාව ලක්ෂණ කියාදෙමින් පඨවීසමං ආදිය කීහ. ඉටුඅනිටු දෙයෙහි නොඇලෙන්නේ ද්වේශ නොකරන්නේ තාදීනම් වේ. මනාපාමනාපා නම් ලෝභ සහගත සිත් අටෙහි යෙදුණු දේ මනාපා නම්. දෙස සහගත සිත් දෙකෙහි යෙදුණු දේ අමනාපා නම්. නපරියාදය ඨස්සනති යනු මේ ස්පර්ශ ඉපදී තොපගේ සිත මිටතුළට දමන්නාක් මෙන් වටින්ගෙන සිටින්ට නොහැකි වන්නාහුය. මම බබලමි. මාගේ වර්ණායතනය ප්‍රසන්න යැයි නැවත ආත්මභාවය නිසා ඡන්දරාගය නුපදින්නේය. ගතං ආදීන්හි අසුචිබවට පත් අසුචිමය සියලු තන්හි මෙසේය. නකත්‍ථචි පතිට්ඨිතො පෘථුවි පර්වත වෘක්ෂ ආදීයෙහි එකකවත් නොපිහිටියේය. ඉදින් පෘථුවියෙහි පිහිටියේ වේනම් පෘථුවිය

බිඳීයනවිට ඒ සමගම බිඳෙන්නේය. පර්වතය වැටෙන විට ඒ සමග වැටෙන්නේය. ගස සිඳීයනවිට ඒ සමගම සිඳෙන්නේය. මෙත්තං රාහුල යැයි කුමක් නිසා ඇරඹුසේක්ද? තාදිභාවයෙහි හේතුව දක්වනු පිණිසය. යට තාදිභාවලක්ෂණය දක්වන ලදී. මම තාදීමෙන් වෙමියි අහේතුකව වන්නට නොහැකිය. මම උසස්කුලයෙහි උපන්නේ නොවෙම්ද බහුශ්‍රැත නොවෙම්ද ලාභීද නොවෙම්ද රාජරාජ මහාමාත්‍ය ආදීහු මා ආශ්‍රය නොකරත්ද මමතාදී වෙමියි මෙම කරුණුවලින් කවරෙක් නම් තාදී නම් වේද? මෙත්තාභාවනාදියෙන්ම වෙතියි තාදීභාවයට හේතු දැක්වීම පිණිස මේ දේශනාව ආරම්භ කළසේක. එහි භාවයතො උපචාරයව හෝ අර්පණාවට පැමිණෙන්නහුට. සො බ්‍යාපාදො සත්වයන් කෙරෙහි යම් කෝපයක් වේද එය ගෙවීයන්නේය. විහෙසා අත්ආදියෙන් සත්වයන්ට කරන හිංසනය, ආරති නොඇලීම, හුදෙකලා සෙනසුන්හිද අධිකුශල ධර්මයන්හිද උකටලීව, පටිඝො කිසියම් තැනක ඇති එළවාදමන ක්ලේශය, අසුභභාවනා ද නමින් මෙය විස්තර වශයෙන් විසුද්ධිමග්ගයෙහි කියන ලදී. රාගො පංචකාමගුණයන්හි ඇති රාගය අනිච්ච සඤ්ඤං අනිච්චානු පස්සනාව සමග එක්වඋපන් සඤ්ඤාව විදර්ශනාවම හෝ මේ අසඤ්ඤාවද සඤ්ඤා අර්ථයෙන් සඤ්ඤායයි කියන ලදි. අස්මිමානො රූපාදීන්හි වෙමියි ඇතිකරගන්නා මානය. දූන් තෙරුන් විසින් අසනලද ප්‍රශ්නය විස්තර කරමින් ආනාපානසතිං ආදියකීහ. එහි කර්මස්ථානයද කර්මසථාන භාවනාවද පාළි අර්ථයද ආනිසංස කථාව සමග සියල්ල සියලු ආකාරයෙන් විසුද්ධිමගගයෙහි අනුසසති නිර්දේශයෙහි විස්තර කරන ලද්දේ වෙයි. මේ දේශනාව භාග්‍යවතුන් වහන්සේ නෙය්‍ය පුද්ගල වශයෙන් නිමවා වදාළ සේක.

දෙවැනි මහාරාහුලොවාද සූත්‍රයයි

## 2.2.3

එවමෙමසුතං යනු මාලුඞ්ක්‍යසූත්‍රයයි. එහි මාලුඞක්‍යපුත්තස්ස එනම් ඇති තෙරුන් වහන්සේගේ ඨපිතානි පටික්ඛිත්තානීති දිට්ඨී ගතානි නාම න බ්‍යාකාතබ්බානි මෙසේ තැබූ හා ප්‍රතික්ෂේප කළ තථාගතො සත්වයා.

**තංමෙනරුච්චති** ඒ අව්‍යාකරණය මට රිසි නොවේ. **සික්ඛං පච්චක්ඛාය** ශික්ෂාව පිළිකෙව් කොට **කො සන්තො කං පච්චාචික්ඛසි** යාචකයා යාචිතයා ප්‍රතික්ෂේප කෙරේනම් යාචිතයා යාචකයා ප්‍රතික්ෂේප කරන්නේය. ඔබ යාචකයෙක් නොවෙති. යාචිතයෙක්ද නොවෙති හේ දූන් ඔබ කවරෙක් වූයේ කවරකු ප්‍රතක්ෂේප කෙරෙහිද යන අර්ථයි. **විද්ධො අස්ස** පරසේනාවෙහි සිටියකු විසින් විදින ලද්දේ වන්නේය. **ගාළ්හ පලෙපනෙන** ඝන ලේපයෙන් **භිසක්කං** වෙද **සල්ලකත්තං** හුලෙන් කැපීම, සල්ලකත්තිය යනුවෙන්ද සූත්‍රපාඨයකි. **අක්කස්ස** අක්ක පොතුගෙන දුනුදිය සදත් ඒ නිසා අක්කස්ස යයි කියන ලදී. **සණ්ඨස්ස** උණ පතුරින් **මරුවා** බීර **පණ්ණිනං** පොත්තෙන්ම කරත්. එහෙයින් කියනලදී. **යදිවා මරුවාය යදිවා බීර පණ්ණිනො** යැයි **කච්ඡං** පර්වත වල තණබිම් වල හා ගංගාතණබිම්වල හටගත්, **රොපිමං** රෝපණය කොට වඩනාලද උණවනයෙන් උණගස් ගෙන කරනලද, **සිථිලහනුනො** එනම් පක්ෂියාගේ **රොරුවස්ස** කලු සිංහයාගේ **සෙමහාරස්ස** වඳුරාගේ **එවංනො** මේ දෘෂ්ටිය ඇතිකල්හි නොවේ යන අර්ථයි.

**අත්ථෙව ජාති** මේ දෘෂ්ටිය ඇතිකල්හි බ්‍රහ්මචර්ය වාසයක් නැත ජාතිය ඇත. ජරාමරණද එසේම ඇතැයි දක්වයි. **යෙසාහං** යමකුගේ මම **නිඝාතං** උපඝාතය. විනාශය මාගේ ශ්‍රාවකයෝ එහි කලකිරී මෙහිම නිර්වාණයට පැමිණෙන්නාහුය යන අභිප්‍රායයි. **තස්මාතිහ** යම්හෙයකින් මෙය අව්‍යාකෘතය මා විසින් චතුස්සත්‍යය ප්‍රකාහ කරන ලදී. ඒනිසාය යන අර්ථයි. **නහෙතං මාලුඞ්ක්‍ය පුත්ත අත්ථසංහිතං** මේ දෘෂ්ටිගතය මේ ප්‍රකාශය හේතු සහගත නොවේ. **න ආදිබ්‍රහ්මචරියකං** බ්‍රහ්මචර්යයාගේ ආදිමාත්‍රයක් වත් පූර්වභාගයෙහි ශීලමාත්‍රයක්වත් නොවේ. **නිබ්බිදාය** ආදිතන්හි සංසාරයෙහි කලකිරෙනු පිණිස හෝ නො ඇලීම පිණිස හෝ සංසාර නිරෝධය පිණිස හෝ රාගාදීන් නැතිකරනු පිණිස හෝ දත යුතු දහම් දැනගැනීම සඳහා හෝ චතුර්මාර්ග සංඛ්‍යාත අවබෝධය පිණිස හෝ අසංඛතවූ නිර්වාණය සාක්ෂාත් කිරීම පිණිස හෝ නොවේ. **එතංහි** මේ සිව්සස් විවරණය **ආදිබ්‍රහ්මචරියකං** බ්‍රහ්මචර්යාවට ප්‍රථමයෙන් වූ පූර්වපදස්ථානයයි. සෙස්ස කියන ලද විපක්ෂක්‍රමයෙන් දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව

නෙයා පුද්ගලයාගේ වශයෙන් නිමවාවදාළසේක.

## තෙවැනි මාලුඩ්ක්‍ය සූත්‍රයයි

## 2.2.4

එවමෙමසුතං යනු මහාමාලුඩ්ක්‍ය සූත්‍රයයි. එහි ඔරමභාගියා කාමභවයෙහි උත්පත්තිය සඳහා හේතුවන්නාවූ පහළ කොටස්, **සංයෝජනානි** බැඳුම් **කසස** බො **නාම** කිසියම් දෙවියකුගේ හෝ මනුෂ්‍යයකුගේ **දෙසිතානි ධාරසි** කිමෙක්ද ඔබම හුදෙකලා වූයෙහිද අන් කිසිවෙක් නොවේද **අනුසෙති** ප්‍රහීනනොකළ බැවින් තීදයි. නිදන්නේ සංයෝජන නම් වේ. මෙහිදීද භාග්‍යවතුන් වහන්සේ විසින් සංයෝජනයට විමසන ලදී. තෙරුන් විසින්ද සංයේජනයම ප්‍රකාශකරන ලදි. මෙසේ ඇති කල්හිද ඔහුගේ වාදයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් දෝෂාරෝපණය කරනලද්දේය. ඒ කුමක් නිසා විය හැකිද? තෙරුන්ට එබඳු ලබ්ධියක් ඇති නිසාය. මේ කාගේ ලබ්ධියද පුරුදුකළ කෙණෙහිම කෙලෙසින් යුක්ත වූයේ නම් වෙයි. අන් ක්ෂණයෙහි සංයුත්ත නොවේ. භාග්‍යවතුන් වහන්සේ විසින් දොස් පවරනු ලැබුයේ ඒනිසාය.

ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ සිතූහ. භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂු සංඝයාට ධර්මය දේශනා කරන්නෙමියි තමන් වහන්සේගේ ස්වභාවය අනුවම මේ ධර්ම දේශනාව අරඹන ලදී. එය මේ අනුවණ භික්ෂුව විසින් වැරදිලෙස කියනලදී. මම භාග්‍යවතුන් වහන්සේ අයැද භික්ෂුන්ට ධර්මය දේශනා කරන්නෙම් නම් මැනවියි එසේ කළහ. එය දක්වන්ට **එවං වුතෙත ආයසමා ආනනෙද** ආදිය කියන ලදී. එහි **සකකාය දිටඨි පරෙතෙන** සත්කාය දෘෂ්ටිය අනුවගිය. **නිසසර ණං** දෘෂ්ටි නිස්සරණය නම් නිර්වාණයයි. එය යථාස්වරූපයෙන් නොදනී. **අපපටි විනතා** දුරුනොකරන ලද. ඉවත් නොකරන ලද **ඔරමභාගිය සංයෝජනං** යට කොටසෙහි සංයෝජන නම් වේ. සෙසු පදවල මෙම ක්‍රමයමැයි. ශුක්ලපක්ෂය නොගැඹුරු අරුත් ඇත්තේමය. **සානුසයාපහීයතියයි** කීමෙන් මෙහිදී ඇතමෙක් සංයෝජනය අනිකක්ය, අනුසය අනිකක්යැයි කියති.

ව්‍යඤ්ජන සහිත බත යයි කීකල්හි බතින් අන්‍යවූ ව්‍යංජන වන්නාසේ සානුසයා යන වචනයෙන් පරියුට්ඨාන සක්කාය දිට්ඨියෙන් අන්‍යවූ අනුසයක් වියයුතුයයි යන්න ඔවුන්ගේ ලබ්ධියයි. ඒවා සසීසං පාරුපිත්වා ආදීතැන්වලින් ප්‍රතික්ෂේප කළ යුතුය. හිසෙන් වෙන්වූ පුරුෂයෙක් නැත. යම්සේ වීනම්, එයම සංයෝජනයයි. එයම අනුසයයි. මෙසේ ඇතිකල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් තෙරුන් වහන්සේගේ තරුණ උපමාවට දොස් ජ්වරුම දූරාරෝපිතයක් වෙයිද දූරාරෝපිතයක් නොවේ. කුමක් හෙයින්ද? මෙසේ ලබ්ධිගත්හෙයිනැයි විස්තර කරනලදී. ඒනිසා ඒ ක්ලේශය බැඳීම් අර්ථයෙන් සංයෝජනයි. ප්‍රහීණ නොකළ අර්ථයෙන් අනුසයයි. මේ අර්ථය සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් අනුසය සහිතව ප්‍රහීණ වන්නේයයි මෙසේ කියන ලදැයි දත යුතුය. තචං ඡෙත්වා ආදී තන්හි මෙය උපමා සංසන්දනයයි. සම සිඳීම මෙන් විදර්ශනාව දතයුතුය. හරය සිඳීම මෙන් මාර්ගය දතයුතුය. ප්‍රතිපදාව ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වූ සේ ගැනීම වටී. **එවමෙතෙ දට්ඨබ්බා** මෙබඳු පුද්ගලයෝ මෙසේ දතයුත්තෝය. **උපධිවිවෙකා** උපධිවිවේකයෙන්. මෙයින් පඤ්චකාමගුණ විවේකය කියන ලදී. **අකුසලානං ධම්මනං පහානාය** මෙයින් නීවරණ ප්‍රහාණය කියනලදී. **කාය දුට්ඨුල්ලානං පටිප්පසසද්ධියා** මෙයින් කයෙහි අලසබවෙහි සංසිඳීම කියන ලදී. **විවිචෙචව කාමෙහි** උපධිවිවේකයෙන් කාමයන්ගෙන් වෙන්වී. **විවිචච අකුසලෙහි** අකුසල් දම් ප්‍රහාණයෙන් කාමුකත්වය සංසිඳීමෙන්ද අකුසලං යන්ගෙන් වෙන්ව **යදෙව තත්‍ථ හොති** එහි සමාපත්තිය තුළ සමාපත්තික්ෂණයෙහිද සමාපත්තියෙන් පැනනැගුණු යම් රූපාදි ස්වභාව සමූහයක් වේද. **තෙධම්මෙ** රූපගතය ආදී ක්‍රමයෙන් කියනලද ඒ රූපාදී ධර්මයන්. **අනිච්චතො** අනිත්‍යවශයෙන් **දුක්ඛතො** දුක්වශයෙන්, **රොගතො** ආදීතන්හි ආබාධ අර්ථයෙන් රෝගවශයෙන්, ඇතුළත දෝෂ අර්ථයෙන් **ගණ්ඩතො** නොපිවිසි අර්ථයෙන්ද දුක් උපදවන අර්ථයෙන්ද **සල්ලතො**, දුක් අර්ථයෙන් **අඝතො**, රෝග අර්ථයෙන් **ආබාධතො**. තමාගේ නොවන අර්ථයෙන් **පරතො**. බිඳවැටෙන අර්ථයෙන් **පලොකතො** බලනැති අර්ථයෙන් **සුඤ්ඤතො** ආත්ම නොවන අර්ථයෙන්. **අනත්තතො** එහි අනිච්චතො පලොකතො යන පදදෙකින් අනිත්‍ය ලක්ෂණය කියන ලදී. දුක්ඛතො ආදී පදසයෙන් දුඃඛලක්ෂණය කියන ලදී. පරතො සුඤ්ඤතො අනත්තතො යන තුන් පදයෙන් අනාත්ම ලක්ෂණය කියන ලදී. සොතෙහි

ධම්මෙහි හේ ඒවායින් මෙසේ ත්‍රිලක්ෂණය ආරොපණය කොට සමාපත්තිය තුළ දුටු පංචස්කන්ධ ධර්මයන්ගෙන්, චිත්තං පටිවාපෙති සිත හකුළාගනී, මුදයි. ඉවතටගනී. උපසංහරති විදර්ශනා චිත්තය වනාහි ශ්‍රවණවශයෙන් ස්තුති වශයෙන්, පර්යාප්ති වශයෙන් ප්‍රඥප්තිවශයෙන් ශාන්තවූ නිර්වාණයයි මෙසේ අසංඛතවූ අමතවූ ධාතුවෙන් එක්රැස් කරගනී. මාර්ගචිත්තය නිවන අරමුණුකරණ වශයෙන් මෙය ශාන්තය මෙය ප්‍රණීතයයි එසේ නොකියයි. මේ ආකාරයෙන් එය අවබෝධකරන්නේ එහි සිත එක් රැස්කරගනී යන අර්ථයි. සො තත්‍ථ ඨිතො ඒ ත්‍රිලක්ෂණය අරමුණුකරගත් විදර්ශනාවෙහි සිටියේ. ආසවානං ඛයං පාපුණාති අනුක්‍රමයෙන් සිව්මග වඩා පැමිණෙයි. තෙනෙව ධම්ම රාගෙන සමථ විදර්ශනා ධර්මයෙහි ඡන්දරාගයෙන්. සමථ විදර්ශනාවන්හි සැම අතින් ඡන්දරාගය වැළඳගැනීමට හැකි පුද්ගලයා රහත්බවට පැමිණේ. නොහැකි පුද්ගලයා අනාගාමී වන්නේය. යදෙව තත්‍ථ හොති වෙදනාගතං මෙහිදී රූපය නොගන්නා ලදී. කුමක් හෙයින්දයත් ඉක්මගොස් ඇති බැවිනි. මෙය වනාහි යට රූපාවචර ධ්‍යානයට සමවැද රූපය ඉක්මවා ගොස් අරූපාවචර සමවැදුණේයයි සමථවශයෙන්ද මෙයින් රූපය ඉක්මිණ. යට රූප ස්පර්ශ කොට ඉක්මවාගොස් දැන් අරූපය ස්පර්ශකරතියි විදර්ශනා වශයෙන්ද එයින් රූපය ඉක්මිණ. අරූප ලෝකයෙහි සැම අතින්ම රූපයක් නැතැයි ඒ සඳහාද මෙහිදී රූපය නොගන්නාලදී. අථ කිඤ්චරහි කුමක් අසම්දැයි අසයි. සමථවශයෙන් යන්න හුට චිත්ත ඒකාග්‍රතා ධුරයක් වෙයි. එය චෙතො විමුත්ත නම්. මෙහිදී තෙරුන්ට සැකයක්නැත මෙය රසසහිත ස්වභාවයක්මය. සමථවශයෙන්ම යන්නවුන් අතර එකෙක් චෙතො විමුත්ත නම් වේ. එකෙක් පඤ්ඤාවිමුත්ත නම්වේ. විදර්ශනා වශයෙන් යන්නවුන් අතරද එකෙක් පඤ්ඤා විමුත්ත නම් වේ. එකෙක් චෙතො විමුත්ත නම් වේ එත්‍ථකිං කාරණං විමසයි. ඉන්‍ද්‍රිය වෙමත්තතංවදාමි ඉන්ද්‍රිය නානාත්වයයි කියමි. මෙය කියන ලද්දේවෙයි. ආනන්ද ඔබ දසපෙරුම්දම් පුරා ඒ සියල්ල අවබෝධ කරගත්තෙත් නොවෙහි ඒනිසා එය ඔබට ප්‍රකට නොවේ. මෙහි ඉන්ද්‍රියනානාත්වය හේතුවයි. සමථවශයෙන් යන්නවුන් අතර එක් භික්ෂුවකට චිත්තේකාග්‍රතාව පෙරටුව වෙයි. හේ චෙතො විමුත්ත නම්වේ. එක් භික්ෂුවකට ප්‍රඥාවපෙරටුවවෙයි. හේ පඤ්ඤාවිමුත්තනම් වේ. එක් භික්ෂුවකට චිත්තේකාග්‍ර තාව පෙරටුව වෙයි. හේ චෙතො විමුත්ත නම් වේ. අග්‍රශ්‍රාවක දෙනම සමථ විපසසනා ධුරයෙන් අර්හත්වයට පත්වූවෝය. ඔවුන්

අතර ධම්මසේනාපති පඤ්ඤා විමුත්තනම්. මහා මොග්ගල්ලාන තෙරහු චෙතොවිමුත්ත නම් වෙති. ඉන්ද්‍රිය වෙමත්තතාව එහි හේතුවයයි දත යුතුයි. සෙස්ස සියලු තැන නොගැඹුරු අර්ථ ඇත්තේ මය.

## සිව්වැනි මහාමාලුඩක්‍ය සූත්‍රයයි

## 2.2.5

**එවමෙමසුතං** යනු භද්දාලිසූත්‍රයයි. **එකාසන භෝජනං** එක් පෙරවරුවක ආසන භෝජනය වැළඳිය යුතුය යන අර්ථයි **අප්පාබාධං** ආදිය කකචොපම සූත්‍රයෙහි විස්තර කරන ලදී. **න උස්සහාමි** නොහැකි වෙමි. **සියා කුක්කුච්චං සියා විප්පටිසාරො** මෙසේ වළඳන්නේ දිවි ඇතිතාක් බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්ට හැකිවෙම්ද නොහැකි වෙම්දැයි මෙසේ මට විපිළිසර කුකුසක් වන්නේ ය යන අර්ථයි. **එකදෙසං භුඤ්ජිත්වා** **පුරාණ** තෙරවරු වනාහි පාත්‍රයෙහි බත් දමා ගිතෙල් දුන් කල්හි ගිතෙලින් උණුඋණුවේම මඳක් වළඳා අත් දොවා ඉතිරිය පිටතට ගෙනවුත් සෙවන හා ජලය පහසු තැනක හිඳ වළඳත්. ශාස්තෲන් වහන්සේ ඒ සඳහා වදාළ සේක භද්දලි මෙසේ සිතිය. යම් හෙයකින් තම පාත්‍රය පුරවා දුන් බත වළඳ නැවත පාත්‍රය සෝදා බතින්පුරවා ලද දෙයක් පිටතට ගෙනවුත් සෙවන ජල පහසුකම් ඇති තැනෙක වළඳත් නම් එසේ වටනේය. වෙනත් අයුරකින් කවරෙක් සමත්වේද. එහෙයින් **එවම්පි බො අහංභනෙත න උස්සහාමි** කීය. මොහු වනාහි අතීතයෙහි අනන්තර ජාතියෙහි කාකයෝනියෙහි උපන්නේ ය. කපුටෝ නම් මහා කුසගිනි ඇත්තෝ වෙති. ඒනිසා මහාජාතක තෙරුන් වහන්සේයයි නමක් ඇතිවිය. ඔහු හඬනගද්දීම භාග්‍යවතුන් වහන්සේ එය මැඩ පවත්වා යටපත්කොට යම් භික්ෂුවක් විකල්හි කැයුතුදෙයක් හෝ පියයුතු දෙයක් කන්නේ හෝ බොන්නේ නම් පචිති ඇවතක් වෙයි යයි ශික්ෂාපදයක් පැනවූසේක. එහෙයින් කියනලදි **අථබො ආයස්මා භද්දාලි - පෙ - අනුස්සාහං පවෙදෙසි..........** යනුවෙන්. යම්සේ ශික්ෂා නොපුරන්නෙක් එක් වෙහෙරක වසන්නේ ශාස්තෲන් වහන්සේ හමුවීමට නොදේද එසේ නොදුන්නේ ය. යන අර්ථයි. භාග්‍යවතුන් වහන්සේට උවටැන් කිරීමටද නොගියේය. දම්දෙසන තැනට නො ගියේය. සීමා මාළකයටද නො ගියේය. එකඳු පිණ්ඩපාත මාර්ගයකට පිවිසියේද නැත. යම් ගෘහයක භාග්‍ය වතුන්

වහන්සේ වැඩහිඳිනාසේක්ද, එහි දොරටුවෙහි පවා නොසිටියේය. ඉදින් භාග්‍යවතුන් වහන්සේ ඔහු වසන තැනට වඩනාසේක්ද හෙතෙම පෙරාතුවම දුන අන්තැනකට යයි. මේකුලපුත්‍රයා ශ්‍රද්ධාවෙන් පැවිදිවුවෙකි. පිරිසිදු සිල්ඇත්තේය. එහෙයින් ඔහුට වෙනත් විතර්කයක් නොවීය. මා විසින් උදර හේතුවෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශික්ෂා පද පැනවීම ප්‍රතික්ෂේප කරනලදී. මා විසින් නුසුදුසු දෙයක් කරන ලද්දේය යන මේ විතර්කයම විය. එහෙයින් එක් වෙහෙරක වසන්නේ වුවද ලජ්ජාවෙන් ශාස්තෲන් වහන්සේගේ හමුවීමක් නුදුන්නේය. **චීවර කම්මං කරොන්ති** මිනිස්සු භාග්‍යවතුන් වහන්සේට සිවුරු සළුවක් දුන්හ. එය ගෙන සිවුරු මසත්. **එතංදෙසකං** මේ අවසරය මේ අපරාධය, ශාස්තෲන් වහන්සේ ශික්ෂාපද පනවන විට ප්‍රතික්ෂේප කිරීම මනාසේ සිත්හි තබාගනී යන අර්ථයි. **දුක්කරතරං** වස්වැස දිසාවන්ට ගිය භික්ෂූන්ගෙන් කොහි විසුහුදැයි අසත්. ඔවුන් දෙව්රමෙහි වුසුම්හයි කිකල්හි ආයුෂ්මත්නි භාග්‍යවතුන් වහන්සේ මේ වස්කාලයතුළ කිනම් ජාතකයක් වදාළසේක්ද, කිනම් සූත්‍රයක් වදාළසේක්ද කිනම් ශික්ෂාපදයක් පැනවූ සේක්දැයි ඇසුවෝවෙති. ඉන්පසු විකාලභෝජන ශික්ෂා පදය පැනවූසේක. භද්දලිනම් එක් තෙරනමක් ප්‍රතික්ෂේප කළැයි කියති. ඒ අසා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ශික්ෂා පද පනවනවිට ප්‍රතික්ෂේප කළහ. එය අයුතු යයිද අහේතුක යයිද කියති. මෙසේ ඔබගේ මේ දෝෂය මහාජනයා අතර ප්‍රකටවී ප්‍රතිකර්ම කළනොහැකි තත්ත්වයට පැමිණෙන්නේයයි හැඟින්නාහු මෙසේ ඇසූහ. අනිකුත් භික්ෂූහුද පවරා ශාස්තෲන් වහන්සේ සමීපයට එන්නාහුය ඉක්බිති එසේනම් ඇවැත්නි මා ශාස්තෲන් වහන්සේ කමාකරවන විට සහාය වනුමැනවැයි සංඝයා රැස්කරවන්නාහුය. එහිදී ආගන්තුකයෝ මෙසේ අසන්නාහු ඇවැත්නි මේ භික්ෂුව විසින් කුමක් කරන ලද්දේද? ඉන්පසු ඒ බව අසා බැරෑරුම් දෙයක් කරන ලද්දේය. භික්ෂුව විසින් දසබල ධාරීන් වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලබනසේක. මෙය අයුක්තියක් යයි කියති. ඔවුහු මේ අපරාධය මහජනයා අතර ප්‍රකටව ප්‍රතිකර්ම කළ නොහැකි තත්වයට පැමිණෙන්නේයයි හඟින්නාහු මෙසේ කිහ. **අථභගවා පවාරෙත්වා චාරිකං පක්කමිස්සති** ඔබ ගියගිය තැන භාග්‍යවතුන් වහන්සේ කමා කරවනු පිණිස සංඝයා රැස්කරවන්නෙහිය. එහිදී දිසාවාසී භික්ෂූහු මෙසේ අසන්නාහුය. ඇවැත්නි මේ භික්ෂුව විසින් කුමක් කරන ලද්දේද - පෙ - ප්‍රතිකර්ම කළ නොහැකි

බවට පත්වන්නේයයි හඟින්නාහු මෙසේ කීහ. එතදවොච මා විසින් නුසුදුස්සක් කරනලදී. භාග්‍යවතුන් වහන්සේ මහත්වූද අගුණයෙහි නොලැබී මාගේ වරද පිළිගන්නා සේකැයි හඟින්නේ එතං අච්චයො මං හනෙත ආදී වදන් කීය. එහි අච්චයො අපරාධය. මං අච්චගමා මා ඉක්මවා අබිබවා පැවතියේය. පතිගණ්හාතු කමා කළමැනව. ආයතිං සංවරාය අනාගතයෙහි සංවරය පිණිස. නැවත මෙබඳු අපරාධයක්, දෝෂයක් වැරැද්දක් නොකරනු පිණිස තගසා නිශ්චිතව. යථා ධම්මං කරොසි යෝග්‍ය ස්වභාවයෙහි සිට එසේම කරහි. කමාකරවවයි කියන ලදි. තං තෙ මයං පතිගණ්හාමා ඔබගේ ඒ අපරාධයට අපි කමාකරමු. වුඩ්ඪිහෙසා භද්දාලි අරියසස විනයෙ භද්දාලි මෙය ආර්ය විනයෙහි බුදුන්ගේ සසුනෙහි වෘද්ධියක්මය. කුමක්ද වරද වරදයි දැක යෝග්‍ය පරිදි පිළියම් කොට නැවත සංවරයට පැමිණීම දේශනාව පුද්ගලාධිෂ්ඨාන කරන්නේ යො අච්චයං අච්චයතො දිසවා යථා ධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජතියයි කීය. සමයොපි බොතෙ භද්දාලි භද්දාලි ඔබ දැන ගතයුතු එක් කරුණක් ඇත. එයත් ඔබ දැන ගෙනනැත. නොසලකා හැර ඇතැයි දක්වයි. උභතොභාග විමුත්තො ආදී තන්හි ධම්මානුසාරී සද්ධානුසාරී යන චිත්තක්ෂණ දෙකින් යුතු මාර්ගයෙන් යුත් පුද්ගලයෝ මේ සත් ආර්ය පුද්ගලයන් භාග්‍යවතුන් වහන්සේ විසිනුදු මෙසේ අණ කරවන්ට යුතු නැත. භාග්‍යවතුන්වහන්සේ විසින් අණකරන ලද කල්හි ඔවුන්ද එසේ කිරීම යුතු නැත. අස්ථාන පරිකල්ප වශයෙන් ආර්ය පුද්ගලයන්ගේ සුවචබව පෙන්වනු පිණිසද භද්දාලි තෙරුන්ගේ දුර්වච බව පෙන්වනු පිණිසද මෙය කියන ලදී. අපිනු ත්‍වං තස්මිං සමයෙ උභතොභාග විමුත්තො දේශනාව කුමක්නිසා ආරම්භකළ සේක්ද. භද්දාලිට නිග්‍රහකිරීම පිණිසය. මේ මෙහි අභිප්‍රාසයි. භද්දාලි මේ සප්ත ආර්ය පුද්ගලයෝ ලෝකයෙහි දකඛිණෙය්‍ය පුද්ගලයෝය. මාගේ ශාසනයෙහි හිමිකරුවෝය. මා ශික්ෂාපද පනවන විට ඔබ එය ප්‍රතික්ෂේප කිරීම යුතුනැත. රිත්තො තුච්ඡො ඇතුළත ආර්යගුණ නැති බැවින් හිස්ය පහත්ය. ඉසුරු වචන කිසිවක් නොවීය. සඤ්ඤාපි උපවදති අසුවල් විහාරවාසී අසුවල් තෙරුන්ගේ සද්ධි විහාරිකයා අසුවලාගේ අතවැසියා මෙනම් ඇති භික්ෂුව ලෝකෝත්තර ධර්ම නිපදවාගන්ට අරණ්‍යයට පිවිසියේයැයි ආ ඔහුට අරණ්‍යයවාසයෙන් කවර ප්‍රයෝජයක්ද හේ මාගේ ශාසනයෙහි ශික්ෂා නොපුරන්නෙකියි මෙසේ උපවාදකරයි. සෙසුපදවලද මෙම ක්‍රමය මැයි

එසේවුවත් මෙහිදී හුදෙක් දෙවියෝ උපවාද පමණක් නොකරත්. භායානක නිමිති පෙන්වා පලායන ආකාරයක්ද කරත්. **අත්තාපි අත්තානං** ශීල ආවර්ජනය කරන්නහුට කිලිටිතැන් ප්‍රකට වෙයි. සිත අයාලේයයි. කර්මස්ථානයෙහි නො ඇලේ. හේ මාවැන්නකුට අරණ්‍යවාසයෙන් කම් කිමැයි විපිළිසරව නැගිට යයි. **අත්තාපි අත්තානං උපවාදිතො** තමා විසින්ම තමා උපවාද කරනලදදේ. මෙයම හෝ පාඨය වියහැකිය. ශුක්ලපක්ෂය කියන ලද විරුද්ධ න්‍යායයෙන් දත යුතුය. **යො විවිචෙචව කාමෙහි** ආදිය මෙසේ සාක්ෂාත්කරයි යන්න දක්වනු පිණිස කියන ලදී. **පචයහ පචයහ කාරණං කරොනති** අල්පමාත්‍රවූද දෝෂයන්ට නිග්‍රහ කොට නැවත නැවත කරවත් **නොතථා** මහත්වූ අපරාධ අනික මෙන්ම මෙසේ නැවත නොකරවත්. හේ ඇවැත්භද්දාලිය නොසිතන්න. ඔබ මෙබන්දක් වෙහි එන්න ශාස්තෲන් වහන්සේ තමා කරන්නැයි භික්ෂූන් අතුරින් කිසිවකු යවා තමා සමීපයට කැඳවා භද්දාලි මෙබඳු දෙයක් ඇතැයි නොසිතන්න. මෙසේ ශාස්තෲන් වහන්සේ හමුවෙහිද අනුග්‍රහයක් අපේක්ෂා කෙරේ. ඉන්පසු භික්ෂුසංඝයා විසින්ද ශාස්තෲන් වහන්සේ විසින්ද අස්වසාලන ලද්දෙම් වෙමියි සිතා මෙසේ කීය.

ඉක්බිති භික්ෂුසංඝයා මෙන්ම ශාස්තෲන් වහන්සේත් අවවාද දියයුත්තකුටම අවවාද දෙති. අන් කිසිවකුට නොවේයයි දක්වන්ට **ඉධ භද්දාලි එකචෙචා** යනාදිය කීහ. එහි **අඤ්ඤෙනඤ්ඤං** ආදිය වදළසේක අනුමාන සූත්‍රයෙහි විස්තර කරන ලදී. **න සමමාවතතතති** සම්මා වතෙහි නොපිහිටියේය. **න ලොමං පාතෙති** අනුලෝම වතෙහි නොපිහිටයි. විරුද්ධ දෙයම ගනියි. **න නිත්ථාරං වතතති** නිස්ථරණක වතෙහි නොපිහිටයි. ආපත්තියෙන් නැගී සිටීම පිණිස වහවහා කැමැත්ත උපදවා ගත්තෙක් නොවේ. **තත්‍ර** ඔහුගේ ඒ දූර්වච හේතුවෙහි. **අභිණ්හාපත්තිකො** නිතර ඇවතට පැමිණෙන්නෙක් **ආපත්ති බහුලො** ඔහුට ඇවැත් සහිත කාලය වැඩිය. ශුද්ධවූ ඇවැත් රහිත කාලය අල්පය යන අර්ථයි. **නඛිප්පමෙව වූපසමමති** වහා නොසන්සිදේ. දීර්ඝ සූත්‍රයකි. විනය ධරයෝ පාදෝනාකල්හි ආවහුට ඇවැත්නි යන්න වත් වේලාව යයි කියති. නැවත කාලයයි සිතා ආවහුට තොපගේ විහාර වේලාවය ඇවැත්නි යන්න සාමණේර ආදීන්ට අවවාද දෙන වේලාවය, තෙරුන්ට උපස්ථාන කරනවේලාවය, මුව දෝනා

වේලාවය, ආදිය කියා දිවාකාලයෙහිද රාත්‍රිකාලයෙහිද පැමිණියහු පිටත්කර හරිත්මය. ස්වාමීනි කිනම් වේලාවක අවකාශයක් වන්නේදැයි කියුකල්හිද ඇවැත්නි යන්න ඔබම තැන දැනගන්න. අසුවල්නම් විනයධර තෙරුන් වහන්සේ බෙහෙත්තෙල් පානය කරති, අසුවලා විරේක කරවයි. කුමක් හෙයින් ඉක්මන් වන්නෙහිදැයි කියා දිග්ගැස්සීමක්ම කරත් ඛිප්පමෙව වූපසමමනි කෙටියෙන් දිග්ගැස්සීමක් නොවේ. උත්සාහවත් භික්ෂුවක් ඇවැත්නි මේ සුවච භික්ෂුවක්ය. ජනපදවාසීන්ට ගම්සෙනසුනෙහි වසනතැන් සාදා ගැනිම පහසුනැත. පිඬුපිණිස හැසිරීමද දුකකි. මොහුගේ අධිකරණය සත්සිඳවමුයි රැස්ව ආපත්තියෙන් නැගිටුවා පිරිසිදු බවෙහි පිහිටුවත්. අධිච්චාපත්තිකො ඉදහිට ඇවතට පැමිණේ. හේ කෙසේවුවත් ලජ්ජීභික්ෂුවකි. ප්‍රකෘති ස්වභාවය ඇත්තෙකි. ඔහුගේ දුර්වච බව නිසාම භික්ෂුහු ඒ අයුරින් පිළිපදිති. සද්ධා මත්තකෙන වහති පෙම මත්තකෙන ආචාර්ය උපාධ්‍යායන් කෙරෙහි ස්වල්ප වූ ගේහසිත ශ්‍රද්ධාවෙන් ගේහසිත ප්‍රේමයෙන් කල්යවයි. මේ පැවිද්ද ප්‍රතිසන්ධිගැනීමක් හා සමානය. අලුතින් පැවිදිවූ තැනැත්තා පැවිද්දෙහි ගුණ නොදන්න ආචාර්ය උපාධ්‍යායයන් කෙරෙහි ප්‍රේම මාත්‍රයෙන්ම කල්යවයි. ඒනිසා මෙබඳුවුවන්ට සංග්‍රහ කළයුතුය. අනුග්‍රහ දැක්විය යුතුය. අල්පමාත්‍රවූද සංග්‍රහයක් ලැබ පැවිද්දෙහි සිට අභිඥාවන්ට පත්ව මහා ශ්‍රමණයෝ වන්නාහුය. මෙපමණ කථා මාර්ගයකින් අවවාද ලැබිය යුත්තකුට අවවාද දෙත්. අන් අයකුට නොවේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අයුරින් දක්වා ඇත. අඤ්ඤදාය සණ්ඨහිංසු රහත් බවෙහි පිහිටියාහුය. සත්තෙසු හායමානෙසු ප්‍රතිපත්තිය පිරිහෙන කල්හි සත්වයෝද පිරිහෙත්මය. සද්ධම්මෙ අන්තරධායමානෙ ප්‍රතිපත්ති යනු ධර්මය අතුරුදහන් වන කල්හි ප්‍රතිපත්ති යන ධර්මයද, ප්‍රතිපත්ති පූරන සත්වයන් නැතිවිට අතුරු දහන් වේමය. ආසවට්ඨානියා ආශ්‍රවයෝ මේවායෙහි සිටින්නුයි ආසවට්ඨානියා නම් යම්දෙයක දිට්ඨ ධම්ම සම්පරායික පරොපවාද විප්පටිසාර වධබන්ධන ආදියද අපාය දුකට විශේෂයෙන් හේතුවූ ද ආශ්‍රවයෝ සිටිත්මය. ඔවුන්ට එබඳු හේතුවක් ඇත යන අර්ථයි. ඒ ආසවට්ඨානිය වූ ඉක්මයන ධර්මයෝ සංඝයා තුළයම්තාක් පහළ නොවෙත්ද ඒතාක් ශාස්තෘන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද නොපනවන සේක යනු මෙහි යෙදුමයි. මෙසේ අකාලය දක්වා නැවත කාලය දැක්වීමට යතොච බො භද්දාලි ආදිය කීහ. එහි යතෝ යම් දිනෙක

යම් කලෙකැයි කියන ලද්දේ වෙයි. සෙස්ස කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. මෙය මෙහි සංක්ෂේප අර්ථය හෝ වෙයි. යම්කලෙක අසවට්ඨානිය ධර්මයයි හැඳින්වුණු ඉක්මවිය හැකි දොස් සංඝයා තුළ පහළ වේද, එකල්හි ශාස්තෘන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවනසේක කුමක් හෙයින් ආසවට්ඨානිය ධර්ම සංඛ්‍යාතවූ වීතිකම දෝෂ නැතිකිරීම පිණිස පනවත්ද, මෙසේ ආසවට්ඨානිය ධර්මයන් නූපදවන ශික්ෂාපද පැනවීමට අකාලයයිද උත්පත්තියට කාලයයිද කියා දැන් ඒ ධර්මයන්ගේ නූපදනාකාලයද උපදනාකාලයද දක්වන්ට නතාව භද්දාලි ඉධෙවෙකචෙච ආදිය කීහ. එහි මහත්තං යනු මහත්බවයි. සංඝයා යම්තාක් ස්ථාවර නවක මධ්‍යම වශයෙන්, මහත්බවට පත් නොවේද ඒතාක් සේනාසන ප්‍රමාණවත් වේ. සෙනසුන් නිසා ආසවට්ඨානිය ධර්මයෝ නූපදිත්. මහත්බවට පත්වූ කල්හි ඒවා උපදිත්. ඉන්පසු ශාස්තෘන් වහන්සේ ශික්ෂාපද පනවන සේක. අර්ථ මහත්වයට පත්වූ කල්හි සංඝයා කෙරෙහි පනවන ලද ශික්ෂාපද, යම් භික්ෂුණියක් වසක් පාසා ආපසු එයිද පාචිත්තිය ඇවැත් වේ. යම් භික්ෂුණියක් එක් වසක් දෙකක් ආපසු එයිද පාචිත්තිය ඇවැත්වේ මේ ක්‍රමයෙන් දතයුතුයි. ලාභග්ගං ලාභයෙන් අගතැන්පත් සංඝයා යම්තාක් ලාභයෙන් අගතැන්පත් නොවේද ඒතාක් ලාභය නිසා අසවට්ඨානිය ධර්මයෝ නූපදිති. පැමිණිකල්හි උපදිත්. ඉන්පසු ශාස්තෘන් වහන්සේ ශික්ෂාපද පනවන සේක. අර්ථ මහත්ඵලයට පත්වූ කල්හි සංඝයා කෙරෙහි පනවන ලද ශික්ෂාපද යම් භික්ෂුවක් අනුපසම්පන්නයකු සමග රැදෙකතුනකට වඩා එක්තැනෙක සයනය කරයිනම් පාචිත්තිය ඇවැත්වේ. යම් භික්ෂුණියක් වසක් පාසා ආපසු එයිද පාචිත්තිය ඇවැත් වේ. යම් භික්ෂුණියක් එක් වසක් දෙකක් ආපසු එයිද පාචිත්තිය අවැත්වේ. මේ ක්‍රමයෙන් දතයුතුයි. ලාභග්ගං ලාභයෙන් අගතැන්පත්. සංඝයා යම්තාක් ලාභයෙන් අගතැන්පත් නොවේද ඒතාක් ලාභය නිසා අසවට්ඨානිය ධර්මයෝ නූපදිති. පැමිණිකල්හි උපදිත්. ඉන්පසු ශාස්තෘන් වහන්සේ ශික්ෂාපද පනවන සේක. යම් කිසි භික්ෂුවක් අචේලයකුට හෝ පරිබ්‍රාජකයකුට හෝ පරිබ්‍රාජිකාවකට තමාගේ අතින් කෑයුතු දෑ හෝ පියයුතු දේනම් පචිතිවේ යනු මේලාභයෙන් අගපත් වූකල්හි ශික්ෂාපද පැනවීමයි. යසසින් අගපත් නුයි යසග්ගං සංඝයා යම්තාක් යසසින් අගපත් වූයේ නොවේද ඒතාක් යසස නිසා ආසවට්ඨානිය ධර්මයෝ නූපදිත්. පැමිණිකල්හි

උපදිත්. ඉක්බිතිව ශාස්තෲන් වහන්සේ ශික්ෂාපද පනවන සේක. සුරාමේරය පානයෙහි පචිතියැයි. මේ සංඝයා යසසින් අගපත්කල්හි ශික්ෂාපද පැනවීමයි. බාහු සච්චං බහුශ්‍රැත බව. යම්තාක් සංඝයා බහුශ්‍රැත භාවයට නොපැමිණේද ඒතාක් ආසවට්ඨානිය ධර්මයෝ නූපදිත්. බහුශ්‍රැත භාවයට පත්කල්හි, යම්හෙයකින් එක්නිකායක් දෙ පස් නිකායයන් උගෙන නුනුවණින් ඉපිලෙන පුද්ගලයෝ රසයෙන් රසය සසදා අධර්මය අවිනය ශාස්තෲ ශාසනයයයි දක්වත්ද ඉක්බිතිව ශාස්තෲන් වහන්සේ යම් කිසි භික්ෂුවක් මම භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කළේමෙසේයයි කියන්නේ නම් - පෙ - ශ්‍රමණඋද්දේශකයකු වුවද කියන්නේනම් ආදි වශයෙන් ශික්ෂාපද පනවන සේක. රත්තඤ්ඤුතං පත්තො මෙහි රාත්‍රීන් දනින්නුයි රත්තඤ්ඤූ තමාගේ පැවිදිවූ දිනයෙහි පටන් බොහෝ රාත්‍රීන් දනිත්. පැවිදිවී බොහෝකල් ඇත්තෝ යයි කියන ලද්දේවෙයි. රතතඤ්ඤූන්ගේ බව රතතඤ්ඤූතං නම්. එහි රතතඤ්ඤූභාවයට පත්කල්හි උපසේන වඞ්ගත්තපුත්ත අරහයා ශික්ෂාපද පනවන ලද්දේ යයි දතයුතුයි. ඒ ආයුෂ්මතුන් වහන්සේ දසවසට අඩු භික්ෂූන් උපසම්පදාකරනු දක එක්වස් සද්ධිවිහාරිකයා උපසම්පදා කළහ. ඉක්බිතිව භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපද පැනවූසේක මහණෙනි අඩුදසවසින් උපසම්පදා නොකළයුතුය. යමෙකු උපසම්පදා කෙරේනම් දුකුළා ඇවැත්වේ.

මෙසේ ශික්ෂාපද පැනවූ කල්හි නැවත බාලවූ අව්‍යක්තවූ භික්ෂුහු දසවස් වෙමුයි දසවස් වෙමුයි උපසම්පදා කරත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තවත් ශික්ෂාපදයක් පැනවූසේක. මහණෙනි බාලවූ අව්‍යක්ත වුවකු විසින් උපසම්පදා නොකළ යුතුය. යමෙක් උපසම්පදා කෙරේද දුකුළා ඇවැත්වේ. මහණෙනි, ව්‍යක්ත ප්‍රතිබල දසවස් ඇති හෝ අතිරේක දසවස් ඇති භික්ෂුව විසින් උපසම්පදා කිරීමට අනුමතිය දෙමි. රත්තඤ්ඤූබවට පත් කල්හි ශික්ෂාපද පැනවිමයි. ආජානීයසුසූපමං ධම්මපරියායං දෙසෙසිං තරුණ ආජානීය්‍යයකු උපමා කොට ධර්මය දේශනා කෙළෙමි. තත්‍ර ඒ සරණ වූවෙහි. නබො භද්දාලි එසෙව හෙතු මේ ශික්ෂා නොපුරන බවම එකම හේතුව නොවේ. මුඛාධාන කාරණං කාරෙති - (කටකලියාව බැඳීමේදී )

ගෙල මනාසේ අල්ලාගන්වන්ට කරුණු ඇති කරවයි විසූකායිකානි ආදී වැරදි සේවන ආචාරය කියූසේක. මේ සියල්ල අන්‍යොන්‍ය සමන

වචනයි. **තසමිං ඨානෙ** මේ විසේවනාචාර යෙහි **පිරිනිබ්බායති** තමා ප්‍රතික්ෂේප කරන්නේ වෙයි. එම විසේවනය අත්හරී යන අර්ථයි. **යුගාධානෙ** යුග තැබීමෙහිදී යුගය මැනවින් ග්‍රහණය පිණිස **අනුක්කමෙති** සතර පාද එක්වරම එසවීමෙහි හා තැබීමෙහිද විරුද්ධ සේනාව යම් වළෙකසිට කඩුව ගෙන එන්නාවූ අශ්වයාගේ පා සිඳීද එසමයෙහි මොහු එක්පහරින්ම පාසතර ඔසවන්නේයයි රහැන් බැඳීම් විධානයෙන් මේ කරුණ කරත්. **මණ්ඩලෙ** යම්සේ අශ්වයා පිට හිඳම මණ්ඩලයෙහි බිම වැටුණු ආයුධය ගන්ට හැක්කේද එසේ කරවනු පිණිස කළයුතුදේ කරයි. **ඛුරකාසෙ** කුරඅගින් බිමසැරීමෙහි රාත්‍රියෙහි බැසගෙන ඒමේදී යම්සේ පාහඬ නො ඇසේද, ඒ අර්ථය එක් තැනෙක සංඥාවක්දී කුරතුඩු අගින්ම යාම උගන්වත්. ඒ සඳහා මෙය කියන ලදී ධාවෙ වේගයෙන් දිවීමෙහි ධාවනෙ යනුවෙන්ද පාඨයෙකි. තමාට පරාජය ලැබුණු කල්හි පළා යාමටද පළායන සතුරා ලුහුබැඳ අල්ලා ගැනීම පිණිසද. මෙසේ කාර්ය කරවයි. **රවත්ථං** හේෂාරව කිරීම පිණිස, යුද්ධකාලයෙහි ඇතුන් කුංචනාද කරනවිට අසුන් හේෂාරව කරනවිට රිය ගැටෙන විට. යෝධයන් ඔල්වරසන් දෙනවිට ඒ ශබ්දයට බියනොවී සතුරුසේනා අතරට ප්‍රවේශවනු පිණිස මේ කාර්ය කෙරේ. **රාජ ගුණෙ** රජු විසින් දත යුතු ගුණ, **කුටකණ්ණරඤ්ඤො** කුටකණ්ණ රජුට ගළවණණ නම් අශ්වයෙක් විය. රජ පෙරදිග දොරටුවෙන් නික්මී චෙතිය පබ්බතයට යන්නෙමියි කදම්බ නදීතීරයට පැමිණියේය. අශ්වයා ඉවුරෙහි සිට ජලයට බැසීමට නොකැමති වෙයි. රජ අශ්වාචාර්යයා අමතා, ඔබ විසින් අශ්වයා හික්මවන ලද අයුරු අපූරුය. ජලයට බැසීමට නොකැමතියයි කීය. ආචාර්යයා දේවයන් වහන්ස අශ්වයා මැනවින් හික්මවන ලදී. මුගේ සිත වන්නේ යම් හෙයකින් මම ජලයට බසින්නෙමි නම් වලිගය තෙමෙන්නේය. වලිගය තෙමුණුවිට රජුගේ ඇඟෙහි ජලය ඉසෙන්නේය. මෙසේ ඔබ වහන්සේගේ සිරුරෙහි දිය වැටෙන බියෙන් නොබසී වලිගය අල්ලා ගන්වනු මැනවැයි කීය. රජ එසේ කළේය. අශ්වයා වේගයෙන් බැස පරතෙරට ගියේය. මේ අර්ථය සඳහා මේ කාර්යය කෙරේ. **රාජවංසෙ** අශ්වරාජ වංශයෙහි මේ වංශය නම් අශ්ව රාජයින්ට එවන් පහරකින් සිඳී බිඳීගිය සිරුරු ඇතත් අසරුවා සතුරු සෙනග මැද නොහෙළා පිටතට ගෙනයත්මය. මේ අර්ථය සඳහා මේ කාර්යය කෙරේ යන අර්ථයි. **උත්තමෙජවෙ** ජව සම්පත්තියෙහි, යම්සේ උතුම් ජවයක් වේද මෙසේ මේ කාර්යය කෙරේ යන අර්ථයි. **උත්තමහයෙ** උත්තමවූ අශ්වභාවයෙහි. යම්

උත්තම අශ්වයෙක් වේද. එසේ කාර්ය කෙරේ යන අර්ථයි එහි ප්‍රකෘතියෙන්ම උතුම් අශ්වයාම උත්තම අශ්ව කාරණයකට සුදුසුය. අනෙකෙක් නොවේ. උතුම් අශ්වයා උතුම් ජවයක් ඇතිකරගනී. අනෙකෙක් නොවේ. මේ මෙහි කථාවයි එක් රජෙක් එක් සෛන්ධව පැටවකු ලැබ සෛන්ධව බව නොදැනම මු හික්මවත්නැයි ආචාර්යයාට දුන්නේය. ආචාර්යයාද ඌ සෛන්ධව බව නොදැන පියලි ධාන්‍ය කන තරක අසුන් කරන කර්යයන්ට ගෙන එයි ඌ තමාට නුසුදුසු බැවින් කාර්යය ඉටුනොකරයි. හේ ඌ දමනය කරන්ට නොහැක්කේ මහරජ යම් කුළු අසෙකැයි අත්හැර දැම්මවීය. ඉක්බිති එක් දවසක් එක් පෙරඅස් ඇදුරෙක් වු තරුණයෙක් උපාධ්‍යායන්ට බඩු ගෙන යන්නේ ඒ දිය අගල පිට හැසිරෙන අශ්වයා දැක ස්වාමීනි සෛන්ධව පැටවා අනර්ඝයයි උපාධ්‍යායයන්ට කීය. මේ හෙයකින් රජ දැනගතහොත් ඌ මංගල අශ්වයා කරන්නේය. තෙරුන් වහන්සේ මෙසේ කීහ. දරුව රජ මිසදිටුවෙකි. බුදුසසුනෙහි පහදීනම් මැනවියි රජුට කියව. හේ ගොස් මහරජ අනර්ඝවූ සෛන්ධව පැටවෙක් සිටීයි කීය. දරුව ඔබ ඌ දැක්කෙහිද? එසේය මහරජතුමනි, කුමක් ලබන්ට වටීද, ඔබවහන්සේ අහර ගන්නා රන්තලියෙහි ඔබ වහන්සේ අනුභවකරන බත්, ඔබවහන්සේ පැන් බොන බඳුන ඔබ වහන්සේගේ සුවඳවිලවුන්, ඔබ වහන්සේගේ මල්දම්, ආදිය අවශ්‍ය බව කීය. රජතෙමේ සියල්ල දෙවීය. තරුණයා ඒවා ගෙන්වා ගෙන ගියේය. අශ්වයා සුවඳ ආඝ්‍රාණය කොට මාගේ ගුණ දන්නා ආචාර්යයකු ඇතැයි සිතමියි හිස ඔසවා බලමින් සිටියේය. තරුණයා ගොස් බත්කවයි අසුරගැසීය. අශ්වයා පැමිණ රන්තලියෙහි බත් කැවේය. ජලය බිවේය. ඉක්බිති ඌ සුවඳගල්වා රජ පැළඳුම් පළඳවා පෙරටුව යවයි අසුර ගැසීය. ඌ තරුණයාගේ ඉදිරිපසින් ගොස් මඟුල් අසු සිටිනාතැන සිටියේය. තරුණයා මහරජතුමනි මේ ඔබ වහන්සේගේ අනර්ඝවූ සෛන්ධව පෝතකයාය. මු මේ ක්‍රමයෙන් කිහිප දවසක් පිළිදැගුම් කරවනු මැනැවැයි කියා නික්ම ගියේය. ඉක්බිති කිහිප දිනක් ඇවෑමෙන් පැමිණ මහරජ තුමනි අශ්වයාගේ ආනුභාවය බලනු මැනව. එසේය ආචාර්යය කොහි සිට බලමුද, මහරජතුමනි උයනට යනුමැනව. රජ අසු ගෙන්වාගෙන ගියේය. තරුණයා අසුරගසා මේ ගසවටා යවයි අසුට සන් කළේයි. අශ්වයා පැන ගසවටාගොස් ආවේය. රජ ඌ යන බවවත් එන බවවත් නුදුටුවේය. මහරජතුමනි එබතුමා විසින් දක්නා ලද්දේද,

දරුව දුටුවේ නැත. සෝදන අඬුව මේ ගස ළඟින් තබනු මැනවැයි කියා අසුර ගැසීය. සෝදන අඬුව ගෙන එව. අශ්වයා පැන කටින් ගෙන ආවේය. දක්නා ලද්දේද මහරජතුමනි, දක්නාලදී දරුව නැවත අසුර ගැසීය. උයනෙහි පවුර මතින් හැසිර එව. අශ්වයා එසේ කළේය. දක්නා ලද්දේද මහරජතුමනි, නොදක්නාලදී දරුව රන් කම්බිලියක් ගෙන්වා අශ්වයාගේ පාදවල බඳවා එසේම සංඥවක් දුන්නේය. අශ්වයා උඩපැන පවුර මත වටේ දිවීය. ශක්තිමත් පුරුසයකු විසින් විදින ලද ගිනි පෙනෙල්ලක ගිනිසිළුවක් මෙන් උයන්පවුර මත පෙනිණ. අශ්වයා ගොස් සමීපයෙහි සිටියේය. දක්නා ලද්දේද මහරජතුමනි. දක්නාලදී දරුව මගුල් පොකුණු පවුර මතින් වටේ යවයි සංඥාවක් දුන්නේය. නැවත පොකුණට බැස නෙළුම් කොළ මත හැසිරෙවයි සංඥාවක් දුන්නේය. පොකුණට බැස සියලු නෙළුම් කොළ මත හැසිරෙමින් ගියේය. එක් පත්‍රයක්වත් ඇක්මීමක් හෝ පැල්මක් හෝ සිඳීමක් හෝ කැඩීමක් හෝ නොවීය. දක්නාලද්දේද මහරජතුමනි. දක්නාලදී දරුව, අසුර ගසා අල්ල දික්කළේය. වාතයෙන් උදවු ලැබ උඩපැන අල්ලෙහි සිටියේය. දක්නා ලද්දේද මහරජතුමනි දක්නාලදී දරුව. මෙසේ උත්තම අශ්වයා මෙසේ උත්තම කාරණයක් සඳහා උතුම්ජවයක් ඇතිකරගනී. **උත්තමෙ සාබලෙල** මුදුවදනින්, දරුව මුදුවදනින් ඔබ නහමක් සිතව. රජුගේ මංගල අශ්වයා වන්නෙහිය. රාජභෝජන ලබන්නෙහිය. උතුම් අසුකෙරෙහි කාර්ය කරවිය යුතුය. එහෙයින් කියන ලදී. උත්තමෙ සාබලෙල යනුවෙන් **රාජභොගෙගා** රජුගේ උපභෝග වස්තුවක් වෙයි. **රඤෙඤා අඞගනෙතවව සඞඛං ගචඡති** යම් තැනෙක යන කල්හි අතක් මෙන් පයක් මෙන් අත් නොහැරම යායුතු වෙයි. ඒනිසා අඞග යයි ප්‍රසිද්ධියටයයි. චතුරංගිනී සේවාවන්හි එක් අංගයක් වෙයි. අසෙඛාය **සමමාදිට්ඨියා** අර්හත්ඵල සම්‍යක් දෘෂ්ටියෙන් සමමාසංකපප ආදියද එයට ඇතුළත්වෙයි. සම්‍යක්ඥනය පෙර කියූ සම්මා දිට්ඨියෙහි ම තබා අෂ්ටඵල අංග වෙයි. සෙසු ධර්ම සම්මාවිමුත්තියයි දත යුතුය. සෙස්ස සියලුතැන නොගැඹුරු මය. මේ දේශනාව උග්ඝටිතඤඤු පුද්ගලයාගේ වශයෙන් රහත් බවින් කුළුගන්වා නිමවා වදාළසේක.

**පස්වැනි භද්දාලි සූත්‍රයයි**

## 2.2.6

එවමෙමසුතං යනු ලටුකිකොපම සූත්‍රයයි. එහි යෙන සො වන සණ්ඩො මේ මහ තෙරුන් වහන්සේද භාග්‍යවතුන් වහන්සේ සමගම පිඬු පිණිස පිවිස සමගම පැමිණියහ. ඒනිසා යෙන සො භගවතා උපසඞ්කමනෙතා වනසණ්ඩො තෙනුපසඞ්කමි යයි දත යුතුය. අපහනනා ඉවතගෙනයන්නා. උපහනනා ළඟට ගෙන එන්නා. යංභගවා යම් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ පටිසල්ලාණා වුට්ඨිතො ඵලසමාපත්තියෙන් නැගී සිටිසේක්. ඉඞ්ඝ අණ කිරීමේ නිපාතයයි. අඤ්ඤථත්තං සිතෙහි වෙනස් බව. එයද භාග්‍යවතුන් වහන්සේ නිසා මෙබඳු ප්‍රණීත භෝජනයක් නොලබන්නහු කෙසේ යැපෙන්නමු දැයි මෙසේ ප්‍රණීත භෝජන ලැබීම නිසා වීයයි දතයුතුයි. භූත පුබ්බං මෙයින් රාත්‍රිභෝජනයෙහි ප්‍රණීතබව පෙන්වයි. සූපෙය්‍යං සූපයට සුදුසු මත්ස්‍ය මාංශ පලා ආදිය සමග්ගාභුඤ්ජිස්සාම එකතුව වළඳන්නෙමු. සඞ්ඛනියො පිළියෙල කරනලද කැයුතුදෑ සබ්බා තා රත්තිං ඒ සියලු පිළියෙලකිරීම් රාත්‍රියෙහිම වෙයි. දිවාකාලයෙහි අල්පය. කුඩාය මඳ වෙයි. මිනිස්සු දිවා කාලයෙහි කැඳ ආදියෙන් යැපුණද රාත්‍රියෙහි ශක්තිපරිදි ප්‍රණීතවූ දෙයක්ම අනුභවකරති. නැවත භූතපුබ්බං මෙයින් රාත්‍රි විකාල භෝජනයෙහි ආදීනව දක්වයි. එහි අන්ධකාරතිමිසාය ඝන අන්ධකාරයෙහි මාණවෙහි සොරුන් විසින් කතකම්මෙහි කරන ලද සොරකම්වලින්, ඒ කරන ලද සොරකම් ඇත්තේ තම දෙවියන් යැද කිසියම් කාර්යයක් ඉටුකරගනු ලැබීද එයට බාරය පිණිස මිනිසුන් මරා ගලලෝහිත ආදිය ගනිත්. ඔවුන් තවත් මිනිසුන් මරන විට කෝලාහල ඇතිවන්නේය. පැවිද්දෙකු සොයන්නෙක් නැතැයි හඟිමින් භික්ෂූන් ගෙන මරති. ඒ සඳහා මෙය කියන ලදී. අකතකම්මෙහි කැලයෙන් ගමට පැමිණෙන කල්හි කාර්ය නිෂ්පාත්තියට පෙරාතුව බිලියම් කරනු කැමැත්තවුන් විසින්, අසද්ධම්මෙන නිමනෙතති මහණ එව. අදරැ මෙහි වළඳා මෙහිම වැස සම්පත් අනුභව කොට ගෙට යන්නෙහියයි මෛථුන ධර්මයෙන් පවරා. නැවත භූතපුබ්බං මෙයින් තමා දුටු කරුණ කියයි. විජ්ජන්තරිකාය විදුලිය දිලිසෙන ඇසිල්ලෙහි. විස්සරමකාසි මහා ශබ්දයක් කළේය. අබ්භුමෙම භූති- දියුණුව අභූති - පිරිහීම - මාගේ විනාශයයි අර්ථයි පසාචො වතමං පිශාචයෙක් මා කැමට ආයේ වන ආතුමාරි මාතුමාරි එහි ආතු යනු පියාය. මාතු යනු මවය.

මෙය කියන ලදී. යමකුට පියා හෝ මව ඇත්ද ඒ මව්පියෝ ඔහු අපගේ පුත්‍රයායයි හැකි පරිද්දෙන් යම් කැමක් බීමක් දී එක් තැනෙක නිදිකරවත්. හේ ඒ අයුරින් රාත්‍රි පිඬු පිණිස නොහැසිරේ. ඔබගේ මව්පියන් මළහයි සිතිමි. ඒනිසා මෙසේ හැසිරෙති. **එවමෙව** මෙසේ කිසිදු ආනිසංසයක් නොදක්නාහු නිස්කාරණයෙන්, **එවමාහංසු** අවමන් කරමින් කීහ. එහි ආහංසු යනු කියති. **කිංපනිමසස** මොහුගේ අප්‍රමාදීභාවයට හේතුව කුමකැයි කිවයුතුද? නොදකී මෙන් නොඇසීමෙන් මෙන් විය යුතු නේද? **ඔරමතතකසස** - සුළුදෙයක **අධිසලලිඛතෙවායං** මේ ශ්‍රමණයා වෙඩරු පිසින්නාක් මෙන් නෙළුම් දඬු නූල් කතුරෙන් කපන්නාක් සේ අතිශයින් දුක් විඳියි අතිශයින් වෑයම් කරයි. **සිකඛාකාමා** සැරියුත් මුගලන් ආදීන් මෙන් ශික්ෂාකාමීහුය. ඔවුන් කෙරෙහිද නොකැමැත්තක් මතුකරත්. ඔවුන්ට මෙසේ සිතක් විය. යම්හෙයකින් මොවුන් භාග්‍යවතුන් වහන්සේ මොහු ගෙනයතියි කියත්ද ශාස්තෘන් වහන්සේ කිම ගෙනයන සේක්ද? මෙසේ නොකියා භාග්‍යවතුන් වහන්සේ පිරිවරා හුන්නාහු එසේය භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ පනවනු මැනවැයි වැඩිපුර උත්සාහයක් දරතියි ඔවුන් කෙරෙහි අකැමැත්තක් මතුකරත්. **නෙසං** ඒ එක්තරා හිස් පුරුෂයන්ගේ තං ඒ අප්‍රමාදී බව අත්හැර දැමිය යුතුය. **ථූලොකලිඞගරො** ගෙල බැඳි මහලීකඳක් මෙන් වෙයි. **ලටුකිකා සකුණිකා** වාකිරිල්ල. අද රැව්සියයක් කරා නැටුම් සියයක් නටා, වරක් ගොදුරු ගනී. අහසින් බිම පිහිටි දෙයක් දැක වසුපැටවුන් පාලනය කරන්නවුන් ක්‍රීඩා පිණිස පූතිලතාවෙන් බඳිත්. ඒ සඳහා මෙය කියන ලදී. ආගමෙහි එළඹෙයි **තංහි තසස** ඒ පූතිලතා බැම්ම උෟගේ කුඩා සිරුරක් ඇතිබැවින්ද ශක්තිය අඩුබැවින්ද බැම්ම මහා පොල්කෙඳි රැහැනක් මෙන් කැඩීමට අපහසු වෙයි. **තෙසංතං** ඒ හිස් මිනිසුන්ගේ ශ්‍රද්ධාව අඩුබැවින්ද ප්‍රඥාව අඩු බැවින්ද තද බැම්මක් නම් වෙයි. දුකුළා කරුණු මාත්‍රයක් ද මහා පාරාජිකා කරුණක් මෙන් අත්හැරීම දුෂ්කරය. ශුක්ල පක්ෂයෙහි **පහාතබබසස** මේ අල්පමාත්‍රවූ අත්හැරදැමිය යුත්තකට හේතුව භාග්‍යවතුන් වහන්සේ විසින් කියයුතුව තිබේ. එහි ප්‍රහාණය භාග්‍යවතුන් වහන්සේ වදළසේක. භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය දැනත් මෙය ප්‍රහාණය කළ යුතු නොවේද යන අර්ථයි. **අපොසසුකකා** අල්ප උත්සාහ **පනනලොමා** හැළුණු ලොම් ඇති ඔහුට අත්හළ යුතුයයන බියෙන් නැඟුණු ලොම් නැති, **පරදවුතතානි** අනුන් විසින්

දෙන ලද දෙයින් යැපෙන අනුන්ගෙන් ලද දෙයින් යැපෙන යන අර්ථයි. **මිගභූතෙන චෙතසා විහරන්ති** නැවත අපේක්ෂා නොකරන පක්ෂයෙහි සිට වාසයකරත්. මුවා පහර කා මනුෂ්‍ය වාසයට ගොස් බෙහෙතක් හෝ තුවාලතෙලක් හෝ ලබන්නෙමියි. අදහසක් ඇතිකර නොගෙන පහර කාගෙනම මහකැලයට පිවිස පහර වැදුණු තැන යටකොට වැදහෙව පහසුවක් ඇතිවූ කල්හි නැගිට යයි, මෙසේ මුවෝ නැවත අපේක්ෂා නොකරන පක්ෂයෙහි සිටියාහුය. මෘග චේතනාවෙන් වාසය කරත්නුයි මේ සඳහා කියන ලදී. **තංහි තස්ස** ඒ වරපට බැම්ම ඒ මහාහස්තියාගේ සිරුර මහත් බැවින්ද මහාශක්තියක් ඇති බැවින්ද, දුබල බැම්මක් නම් පූතිලතාවක්මෙන් පහසුවෙන් කැඩිස හැකි වෙයි. **තෙසංතං** ඒ කුල පුත්‍රයන්ගේ ශ්‍රද්ධා මහත්වය නිසාද ප්‍රඥමහත්වය නිසාද මහත්වූ පාරාජිකා කාරණයද දුකුළා කරුණු මාත්‍රයක් මෙන් පහසුවෙන් අත්හළහැකි වෙයි. **දලිද්දො** දිළිඳු බවින් යුත්, **අස්සකො** තමාසතු දෙයක් නැති, **අනාළ්හියො** ආඪ්‍ය නොවූ **අගාරකං** කුඩා ගෙය, **ඔලුගගවිලුගගං** යමකුගේ ගෙහි යටලී වහලයෙන් මිදී කැණි මඬලෙහි රැදී කැණිමඬලින් මිදී බිම වැටුණු, **කාකාතිදායිං** යම්තැනක කිසිවක් කන්නෙමුයි ඇතුළත හුන්කල්හි වෙනම දොර ඇරීමක් නම් නැත. කපුටෝ තැනින් තැනින් පිවිස පිරිවරා ගනිති. ඉගිලී යන කල්හිද හමුවුණු තැනින් මෙන්ම පළායති. **න පරමරූපං** පින් ඇත්තවුන්ගේ ගෙයක් මෙන් උතුම් පෙනුමක් නැත. **බටොපිකා** කුඩා පතුරු ඇඳක් **ඔලුගගවිලුගගා** නැමුණු නැගුණු බව, **ධඤ්ඤසමවාපකං** ධාන්‍යද ඇටද, එහි ධඤ්ඤනම් කුරහන්ය සමාවාපක යනු ලබුඇට කොමඩු ඇට ආදී ඇට වර්ග **න පරම රූපං** යම්සේ පුණ්‍යවන්තයින්ගේ සුවඳහැල් ආදී පිරිසිදු බිජුවට වේද එසේ නොවේ. **ජායිකා** දිළිඳු බිරිය. **රනපරමරූපා** පැසක්වැනි හිස් ඇති එල්ලෙන කන් ඇති මහ උදරයක් ඇති පිශාච ස්ත්‍රියක වැනි පිළිකුල්වූ **සාමඤ්ඤං** ශ්‍රමණ භාවය **සොවතස්සයොහං** ඒ මම පුරුෂයෙක් වන්නෙම් නම් කෙස් රවුළු ඉවත්කොට පැවිදි වන්නෙමි. **සො නසක්කුණෙය්‍ය** හෙතෙමේ එබඳු සිත් ඇත්තේද ගෙට ගොස් පැවිද්දනම් බරපතලය, දුෂ්කරය, ළංවිය නොහැක්කකි ගම් හත අටක පිඬු පිණිස හැසිර සේදූ පාත්‍රයෙන්ම ආයුතුද වෙයි. එසේ යැපෙන්නට නොහැකිවන මට නැවත පැමිණ වසනා තැනක් කැමත් වියයුතුය. තණ වැල් ගොඩක් එකතුකරගැනීම අපහසුය. කුමක් කරම්දැයි විමසයි ඉක්බිති ඔහුට ගෙයක්

වෛජයන්ත ප්‍රාසාදය මෙන් ඉපදෙයි. ඉක්බිති ඇඳක් බලා මා ගිය කල්හි මෙය අවුල්කොට උදුනෙහි ගිනි අඟුරු මෙන් කරති. නැවත ඇඳකකුල් උණපතුරු ආදිය ලැබිය යුතු වෙයි. කුමක් කරම්දැයි සිතයි. ඉක්බිති ඔහුට එය සිරි යහනක් මෙන් ලැබෙයි. ඉන්පසු ධාන්‍ය සැළක් බලා මාගිය කල්හි මේ ගෘහිණිය මේ ධාන්‍ය එකළුකා සමග කන්නීය. නැවත ආකල්හි ජීවිකා වෘත්තියක් ලැබිය යුතු වෙයි. කුමක් කරම්දැයි සිතයි. ඉක්බිති ඔහුට ඈ කොටුගෙවල් හයසිපනහකට මෙන් එළඹෙයි. ඉන්පසු ගැහැණිය බලා මාගිය කල්හි මැය ඇත්ගොව්වෙක් හෝ අස්ගොව්වෙක් හෝ කවරෙක්හෝ පොළඹවාගන්නේය. නැවත එන මා විසින් බත් පිසන්නියක් ලැබිය යුතුවන්නීය. කුමක් කරම්දැයි සිතයි. ඉක්බිති ඔහුට ඒ රූමතිය දේවියක මෙන් උපස්ථාන කරයි. මේ සඳහා නොහැකිවන්නේය ආදිය කියනලදී. **නික්ඛගණාතං** රන්කාසි සියගණනක්, **චත්තාරො** මෙ **උදායි පුග්ගලා** මෙහි කුමක් දක්වාද, යව ඔවුහු එයද අත්හරිත්. එයම අත්නොහරිත්යැයි අත්හරින්නෝද අත්නොහරින්නෝද රාශි වශයෙන් දක්වන ලදහ. එකක් එකක් නොබෙදන ලදහ. දූන් ලීගොඩක් සඳහා ගිය පුරුෂයෙක් පිළිවෙළින් ගස් කපා යලිනැවතී වක්වුතැන් සිඳ කටයුතු අත්හැර ළඟට ගෙන ආයුත්තක්ම ගනී. මේ අයුරින් අත්නොහැරිය යුතුදේ විසිකොට ව්‍යවහාරයට නොගත යුත්තන් කොට අත්හැර දමන පුද්ගලයෝම සතරදෙනෙක් වෙතියි දක්වන්ට මේ දේශනාව ආරම්භ කළ සේක.

**උපධිපහානාය** ඛන්ධඋපධි, කිලේස උපධි, අභිසංඛාර උපධි කාමගුණ උපධි යන මේ උපධීන් නැති කරනු පිණිස. **උපධිපටිසංයුත්තා** උපධිඅනුව දුවන්නෝ, **සරසඞ්කප්පා** මෙහි සරති දුවතියි සරා කල්පනා කරතියි සංකප්පා. පදදෙකින්ම විතර්කයන්ම කියන ලදී. **සමුදාචරන්ති** අභිභවනය කරත්. වසාගෙන පවතිත්. **සංයුත්තො** කෙලෙසින් යුත්, **ඉන්ද්‍රිය වෙමත්තතා** ඉන්ද්‍රියනානාත්වය, **කදාචිකරහචි** බොහෝකලක් අබිබවා පැවත නැවතී. **සතිසම්මොසා** අවධානය නැතිවීමෙන්, **නිපාතො,** යකඩ කටාහයක හෙළීම. මෙපමණකින් අතිනොහරී (අත්හරී) වහා අත්හරීනුයි රාශිතුනක් දක්වන ලදී. ඔවුන් අතුරින් සිව් ජනයෝ අත්නොහරිත්මය. සතරදෙනෙක් වහා අත්හරිත්නම්. එහි පෘථක්ජනයා, සෝතාපන්නයා, සකෘදාගාමියා අනාගමියා යන මේ සතර දෙන අත්නොහරිත් පෘථක්ජන ආදීහු නම් අත්

නොහරිත්වා අනාගාමියා කෙසේ අත් නොහරිද, හෙතෙමේද ඔහුට යම්තාක් භාවලෝභය ඇත්තේද ඒතාක් අහෝ සැපයි අහෝ සැපයි යනුවෙන් සතුටුවෙයි. ඒනිසා අත්නොහරිමය. මේ සිව්ජනයෝ අත්හරිත්මය. සෝතාපන්න ආදීහු අත්හරිත්වා, කෙසේ අත්හරිද විදර්ශනා ආරම්භ කළ තැනැත්තේ. අවධානය නැතිකමින් වහා කෙලෙස් හටගත් කල්හි මාවැනි භික්ෂුවකට කෙලෙස් උපන්නේ වේදැයි සංවේගයට පත්ව වීර්යය ග්‍රහණය කොට විදර්ශනාවඩා මාර්ගයෙන් කෙලෙස් වනසයි. මෙසේ ඔහු අත්හරියි. ඒ සතරදෙන වහා අත්හරිත් නම් මේ සූත්‍රයෙහිද මහාහත්ථිපදොපම සූත්‍රයෙහිද ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහිද යන මේ සූත්‍රවල කෙසේවත් තෙවැනි වාරය ගන්නා ලද්දේය. ප්‍රශ්නය දෙවැනි වාරයෙහි නොකියන ලද්දේ යයි දතයුතුය. **උපධි දුක්ඛස්සමූලං** එහි පංචස්කන්ධය උපධි නම්වේ. එය දුකට මුල යයි දැන ක්ලේශ උපධියෙන් උපධි නැත්තේ වෙයි. නිග්‍රහණය ඇත්තේ, තෘෂ්ණාව නැත්තේය යන අර්ථයි. **උපධිසඞ්ඛයෙ විමුත්තො** තෘෂ්ණාක්ෂය නම් වූ නිර්වාණයෙහි අරමුණින් විමුක්තවිය.

මෙසේ පුද්ගලයන් සතර දෙන විස්තර කොට දැන් අත්හරින්නෝ කවුරුද ඔවුහු නම් මොහුය. මෙපමණක් කෙලෙස් අත්හරිත් අත්නොහරින්නෝ කවුරුද ඔවුහුද මොහුය මෙපමණක් කෙලෙස් අත් නොහරිතියි දක්වන්ට **පඤ්ච ඛො උදායි කාමගුණා** යනාදිය කීය එහි **මීළ්හසුඛං** අපිරිසිදු සැපය **අනරිය සුඛං** අනාර්යයන් විසින් සේවනය කරනු ලැබූ සුවය. **භායිතබ්බං** මේ සැපය ලැබීමෙන්ද එහි විපාකයෙන්ද බිය විය යුතුයි. **නෙක්ඛම්මසුඛං** කාමයෙන් නික්මුණු සුවය. **පවිවෙකසුඛං** ගණසංගණිකාවෙන්ද ක්ලේශයන්ගෙන්ද වෙන්වුණු සුවය. **උපසමසුඛං** රාග ආදිය සන් සිඳුවනු පිණිස වූ සුවය. **සම්බොධසුඛං** මාර්ග සංඛ්‍යාතවූ සම්බෝධිය උපදවා ගැනීමේ සුවය. **නභායිතබ්බං** ඒ සැපය ලැබීමෙන් ද එහි විපාකයෙන්ද බියනොවිය යුතුය. එය වැඩිය යුත්තක් මය. **ඉඤ්ජිතස්මිං** වදාම් සැලීම, සෙලවීම පැනීම යයි කියමි. **කිඤ්චතත්ථඉඤ්ජිතස්මිං** එහි කිසියම් සැලීමක් වේද මෙය එහි සැලීමෙහිමයැයි මේ නිරුද්ධනොවූ විතර්ක විචාරයෝය. මේ එහි සැලීමයි. ද්විතිය තෘතීය ධ්‍යාන වලදී ද මෙම ක්‍රමය මැයි.

ආනෙඤ්ජසම්ං වදාමි මේ චතුර්ථධ්‍යානය සැලීමක් නැත. සෙලවීමක් නැත පැනීමක් නැතැයි කියමි. අනලනතිවදාමි නොකළයුතු ඇලීම යැයි කියමි. තෘෂ්ණාවෙහි ඇලීම මෙහිදී නූපදවියයුතුයැයි දක්වයි. නැතහොත් අනාලය කෙළවරක් නැත්තකි මෙපමණකින් මේ ප්‍රමාණවත් යැයි සිතිටුහනක් නොකළයුතු යැයි කියමි. නෙවසඤ්ඤානාසඤ්ඤා යතනසසපි මෙබඳු සමාපත්තියක් තිබියදීත් ප්‍රහාණයම කියමි. අණුංවාථූලංවා කුඩාවූ හෝ මහත්වූ හෝ අල්ප සාවද්‍යවූ හෝ මහා සාවද්‍ය වූ හෝ, සෙස්ස සියලුතැන නොගැඹුරුමය. දේශනාව නෙය්‍ය පුද්ගල වශයෙන් අර්හත්වය කුළුගැන්වීමෙන්ම නිමවා වදාළසේක

## සවැනි ලටුකිකොපම සූත්‍රයයි.

## 2.2.7

එවමෙමසුතං යනු චාතුම සූත්‍රයයි. එහි චාතුමායනු එනම් ඇති කුඩාගමෙහි පඤ්චසතතානි භික්ඛුසතානි අලුත පැවිදිවූ භික්ෂූන් පන්සියයක්. තෙරවරු මෙසේ සිතූහ. මේ කුලපුත්‍රයෝ දසබලයන් වහන්සේ නොදකම පැවිදිවූවෝය. මොවුන්ට භාග්‍යවතුන් වහන්සේ පෙන්වන්නෙමු. භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ධර්මය අසා තමාට සුදුසු උපනිශ්‍රයකින් පිහිටා සිටින්නාහුයයි ඒනිසා ඒ භික්ෂූන් රැගෙන ආවාහුය. සමෙමාදමානා කිමෙක්ද ඇවැත්නි සැපයෙන්ද ආදී පිළිසඳර කථා කරමින්, සෙනාසනානි පඤ්ඤපයමානා තමාගේ ආචාර්ය උපාධ්‍යාය යන්ට වසනතැන් විමසා දොර කවුළු විවරකොට ඇඳපුට පැදුරු ආදිය ඉවත්කොට ගසාදමා නියම තැන තබමින්. පත්තචීවරානි පටිසාමය මානා ස්වාමීනි මේ පාත්‍රය මට තබනු මැනවි. මේ සිවුර මේ තලිය මේ පැන් කෙණ්ඩිය මේ සැරයටිය මට තබනු මැනවැයි මෙසේ ශ්‍රමණ පරිෂ්කාර ආරක්ෂාකරමින් උච්චාසද්දා මහාසද්දා උඩට නැගුණු බැවින් උච්චං පැතිරීගිය බැවින් මහන්තං, නොපැහැදිලි හඬ කරන්නාහු, කෙවට්ටා මඤ්ඤෙ මච්ජ විලොපෙ කෙවුලන් මාළුපැස් තිබුතැන්හි මහජනයා රැස්ව මේ මට වෙනත් මාළුවකු දෙව. මාළුපැසක් දෙව. මෙයාට ගොඩක් දුන්නේය. මට ටිකක් දුන්නේය මෙසේ උස්හඬ මහ හඬ කරත් ඒ සඳහා මෙය කියනලදී. මසුන් ගැනීම පිණිස දැල

දැමුවිටද එම ස්ථානයෙහි කෙවුලෝද අන්‍යයෝද පිවිසියෝද නොපිවිසියෝද ගත් තැනැත්තේද නොගත් තැනැත්තේද මහා ශබ්දයක් කරති එය සඳහාද මෙය කියන ලදී. පණාමෙමි එළියට ඇදදමමි. නවො මම සන්තිකෙ වත්‍ථබ්බං තෙපි මාවැනි බුදුවරයකු වසන තැනට පැමිණ මහා ශබ්දයක් කරහු. තමාගේ ස්වභාවයෙන් වසන්නාහු කුමක්නම් සරුප් දෙයක් කරවුද, තොපවැන්නවුන්ට මාගේ සමීපයෙහි වැසීමක් නැතැයි පෙන්වයි. ඔවුන් අතරින් එක් භික්ෂුවක්වත් භාග්‍යවතුන් වහන්ස ඔබවහන්සේ මහාශබ්ද මාත්‍රයකින් අප නෙරපතියි හෝ අන් කිසිවක් කීමට නොහැකිවිය. සියල්ලෝ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගන්නාහු එවංභන්තෙ එසේය ස්වාමීනියි කියා නික්මගියහ. ඔවුන්ට මෙසේ සිතිණ අපි ශාස්තෲන් වහන්සේ දකින්නෙමු දහම් කතා අසන්නෙමු. ශාස්තෲන් වහන්සේ සමීපයෙහි වසන්නෙමුයි පැමිණියෝ වෙමු. මෙබඳු ගරුකටයුතු ශාස්තෘ කෙනකුන් වෙත පැමිණ මහා ශබ්දයක් කළම්හ. නෙරපා හරිනු ලැබුයේ අපගේ දෝෂය නිසයි. භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි කිසිදු වස්තුවක් නොලැබිණ. රන්වන් සිරුර බලන්නට මිහිරිහඬින් දහම් ඇසීමට නොලැබිණ ඔවුහු මහත් දොම්නසින්යුතුව ගියාහුය. තෙනුපසඞකමිංසු ඒ ශාක්‍යයෝ පැමිණෙනවිට හෝ එහිම හිඳනාවිට ඒ භික්ෂූන් තුදුටුවාහ. ඉක්බිති ඔවුන්ට මෙසේ සිතිණ. මේ භික්ෂූන් පිවිසි සැණින්ම අපාසුහැරී ගියේ කුමක් නිසාද ඒ කරුණ දැනගන්නෙමුයි සිතා ඒ භික්ෂූන් සිටිතැනට එළඹුණාහුය. හන්ද නිගමනාර්ථයෙහි නිපාතයකි. කහංපනතුමෙහ ඔබ දැන් පැමිණ කොහි යහුද, ඔබට කිසියම් අනතුරක්ද නැතහොත් දසබලධාරීන් වහන්සේට අනතුරක්ද ඒ භික්ෂූන්ට අනතුරක්ද එසේය ඇවැත්නි අපි භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස පැමිණියෝ වෙමු. ඔබ භාග්‍යවතුන් වහන්සේ දුටුවාහුද, දැන් තමාගේ වසන තැනට යමුයි කිසියම් බහින්බස්වීමක් ඇත. මෙබඳු ව්‍යාජයක් නොකොට සිදුවූ දෙයම දන්වන්නාහු ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂුසංඝයා එළවා දමන ලද්දේයයි කීහ. ඒ රජවරුවනාහි සසුනෙහි බර උසුලන්නෝය, ඒනිසා මෙසේ සිතුහ. දැග සව්වන් සමග පන්සියයක් භික්ෂූන් ගමන් ගන්නා විට භාග්‍යවතුන් වහන්සේ ගේ පතුල් බිඳෙන්නේය. මොවුන් නවතන අයුරක් කරන්නෙමුයි මෙසේ සිතා, තෙනායසමා එසේනම් ඇවැත්නි යනාදිය කීහ. ඒ භික්ෂූන් අතරද අපි මහා ශබ්ද මාත්‍රයෙන් නෙරපා හරිනු ලැබීමු. අපි ජීවත්වන්ට නොහැකිව පැවිදි වූවෝ නොවෙමු. ඒ විරුද්ධව සිටි එක් භික්ෂුවක් වත්

නොවීය. සියලු දෙනම සමසමව එසේය ඇවැත්නියි පිළිගත්හ. **අභිනන්‍දතු** භික්ෂු සංඝයාගේ පැමිණීම කැමතිව සතුටු වන්න. ආනුගගහිතො ආමිෂ අනුග්‍රහයෙන්ද ධර්ම අනුග්‍රහයෙන්ද අනුග්‍රහ කරන ලද්දේ. **අඤ්ඤථත්තං** දශබලධාරීන් වහන්සේගේ දැක්මක් නොලබමුයි ප්‍රසාදයෙහි වෙනසක් වන්නේය. **විපරිණාමො** ප්‍රසාදයෙහි වෙනස් බවකින් සිවුරුහැර යන්න. වුන්ගේ විපරිනාමයෙහි වෙනස් බවක් වන්නේය. **බීජානං තරුණානං** තරුණ සස්‍යයන්ට **සියා අඤ්ඤථත්තං** ජලය අවශ්‍ය කලට ජලය නොලැබ මලානික බැවින් වෙනසක් ඇතිවන්නේය. වියලීගොස් පිදුරුබවට පත්වීමේදී විපරිණාමයක් වන්නේය. වසු පැටියාට කිරි පිපාසයෙන් හුල්ලැම අන්‍යථාත්වය නම් හුල්ලා කලුරිය කිරීම විපරිණාමය නම් **පසාදිතො** භගවා තෙරුන් වහන්සේ එහි හිඳගෙන දිවැසින් බ්‍රහ්මයා පැමිණෙනු දුටහ. දිව කණින් අයැදින හඬ ඇසුහ. චෙතොපරිය ඥානයෙන් භාග්‍යවතුන් වහන්සේ පහන්වූ බව දත්හ. ඒ නිසා කිසියම් භික්ෂුවක යවා කැඳවනු ලබන්නවුන්ගේ ගමන පහසුය. යම්තාක් භාග්‍යවතුන් වහන්සේ නොයවන සේක්ද, එකෙණෙහි යන්නෙමියි හඟිමින් මෙසේ කීහ. **අප්පොස්සුක්කො** අන් වැඩවල උත්සාහවත් නොවී, **දිට්ඨධම්ම සුඛ විහාරං** සමාපත්ති විහාරයෙහි යෙදී භාගයවතුන් වහන්සේ වසන සේ කැයි සිතමි. මෙසේ උන්වහන්සේට සිතිණැයි කියයි. **මයම්පිදානි** අපි අනුන්ට අවවාද දුන් බැවින් විහාරයෙන් නෙරපා හරිනු ලැබුවෙමු. අනුන්ට අවවාද දීමෙන් අපට ඇති ප්‍රයෝජනය කුමක්ද දූන් අපි දිට්ඨ ධම්ම සුඛවිහාරයෙන් වාසය කරන්නෙමුයි දක්වයි. තෙරුන් වහන්සේ මෙම ස්ථානයෙහි නොසලකා හරින ලදුව තමාගේ භාරත්වය නොදත්හ. මේ භික්ෂු සංඝයා මහතෙරුන් දෙනමට භාරය එයින් ඔහු පිළිකෙව් කරන්නේ භගවා ආගමෙහි ආදිය කීය. මහමුගලන් තෙරුන් වහන්සේ තමන්ගේ භාරත්වය දත්හ. එයින් උන්වහන්සේට භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දුන් සේක. **චත්තාරිමානිභික්ඛවෙ** යනු වෙන් ඇරඹුවේ කවරහෙයින්ද මේ සසුනෙහි බිය සතරක් ඇත. යමෙක් ඒවා ජයගනීද හේ මේ සසුනෙහි පිහිටා සිටීමට හැකිවෙයි. අන් තැනැත්තේ නොහැකි වෙතියි දක්වන්ට මේ දේශනාව ඇරඹූ සේක. එහි **උදකොරොහනෙත** ජලයට බසින පුද්ගලයන් **කුම්භීලභයං** කිඹුලුන්ගෙන්වන බිය. **සුසුකාභයං** සැඬ මසුන්ගෙන් වන බිය. **කොධූපායසෙසතං අධිවචනං** ක්‍රෝධ උපායාසයන්ට මේ සමාන වචනයකි.

යම්සේ බාහිර ජලයට බට පුද්ගලයා දියවැල්වල ගිලී මැරේද මෙසේ මේ සසුනෙහි ක්‍රෝධ උපායාසයන්හි ගිලී උපැවිදි වෙයි. ඒ නිසා ක්‍රෝධ උපායාස ඌමී භයයයි කියන ලදී. **ඔදරිකත්තසෙසතං අධිවචනං** යම් සේ බාහිර ජලයට බට පුද්ගලයා දියවැල්වල ගිලී මැරේද මෙසේ මේ සසුනෙහි ක්‍රෝධ උපායාසයන්හි ගිලී උපැවිදිවෙයි. ඒනිසා ක්‍රෝධ උපායාස හැමී යයි කියන ලදී. ඔදරිකත්තං අධිවචනයි. යම්සේ බාහිර ජලයට බට තැනැත්තේ කිඹුලාවිසින් කනුලැබුයේ මැරේද. එසේ මේ සෙසුනෙහි කෑදර භාවයෙන් කනුලැබ උපැවිදි වෙයි. ඒ නිසා ඖදාරිකත්වය කුම්භීලභය යයි කියන ලදී. **අරක්ඛිතෙන කා යෙන** හිස සෙලවීම් ආදි කරුණින් ආරක්ෂානොකරන ලද කය ඇත්තේව, **අරක්ඛිතාය වාචාය** දුෂ්ට කතා ආදි වශයෙන් ආරක්ෂා නොකරන ලද වචන ඇත්තේව. **අනුපට්ඨිතාය සතියා** කායගතාසතිය ළංකොට නොගෙන, **අසංවුතෙහි** නොවැසු, **පඤ්චනෙතං කාමගුණානං අධිවචනං** පංචකාම ගුණයන්ට සමාන වචනයකි. යම්සේ බාහිර ජලයට බට පුද්ගලයා දිය සුළියෙහි ගිලී මැරේද, එසේ මේ සසුනෙහි පැවිදි වූ තැනැත්තා පංචකාමගුණ නමැති දිය සුළියෙහි ගිලී උපැවිදි වෙයි. මේ නිසා පංච කාමගුණ ආවට්ටභය යයි කියන ලදී. **අනුද්ධංසෙති** ක්ලාන්ත වෙයි මිලානවෙයි. **රාගානුද්ධසෙනෙන** රාගයෙන් උඩට නැංවු **මාතුගාමසෙසතං අධිවචනං** ස්ත්‍රිය යන්නට සමාන වචනයකි. යම්සේ බාහිර ජලයට බට තැනැත්තේ සැඩ මසකු වෙත පැමිණ ලබන ලද ප්‍රහාර ඇත්තේ මැරේද, මෙසේ මේ සසුනෙහි ස්ත්‍රියක වෙත පැමිණ උපන්කාමරාග ඇත්තේ උපැවිදි වෙයි. මේනිසා ස්ත්‍රිය සුසුකාභය යයි කියන ලදී. මේ සතරබියෙන් බියපත්ව ජලයට නොබසින්නහුට ජලය නිසා ලැබෙන ප්‍රතිඵලයක් නැත. ජල පිපාසයෙන් පිපාසිත හෝ වෙයි. රජස් දූලියෙන් කිලිටි සිරුරක් හෝ වෙයි. මෙසේ මේ සතර බියෙන් බියපත්ව සසුනෙහි පැවිදි නොවන්නහුටද මේ සසුන නිසා ප්‍රතිඵලයක් නැත. තෘෂ්ණා පිපාසයෙන් පිපාසිත හෝ වෙයි. කෙලෙස් රජසිත් කිලිටුවූ සිත් ඇත්තේ හෝ වෙයි. යම් සේ මේ සතර බියෙන් බියපත්නොවී සසුනෙහි පැවිදිවූවහුටද කියන ලද ප්‍රකාර ප්‍රතිඵල වෙයි. තෙරුන් වහන්සේ මෙසේ කීහ. සතර බියෙන් බියපත්ව ජලයට නොබසින්නේ දිය දහර සිඳගෙන පරතෙරට පැමිණීමට නොහැක්කේවෙයි. බියපත් නොවී බසින්නා හැකිවෙයි. මෙසේ බියපත්ව සසුනෙහි පැවිදි නොවන්න ද තෘෂ්ණා නමැති දියපහර බිඳගෙන නිවන

නමැති පරතෙර දකීමට නොහැක්කේ වෙයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය. මේ දේශනාව නෙය්‍ය පුද්ගල වශයෙන් නිමවා වදාළ සේක.

## සත්වැනි චාතුම සූත්‍රයයි.

## 2.2.8

එවමෙම සුතං යනු කළකපාන සූත්‍රයයි. එහි නළකපානෙ එනම් ඇති ගමෙහි. පෙර අපගේ බෝසතුන් වහන්සේ වඳුරු යොනියෙහි ඉපිද මහා සිරුරක් ඇති වඳුරු රාජයෙක් වැ නොයෙක් දහස් ගණන් වඳුරන් විසින් පිරිවරන ලදුව කඳු පාමුල හැසිරේ. ප්‍රඥා ඇත්තේද වෙයි. මහාප්‍රාඥවූ හෙතෙමේ පිරිසට මෙසේ අවවාද දෙයි. දරුවනි! මේ කඳුපාමුල විස ගඩාගෙඩි ඇත. අමනුෂ්‍යයන් විසින් අරක් ගන්නාලද පොකුණු ඇත. උඹලා පෙර කා පුරුදු ගෙඩිම කවු. බී පුරුදු ජලයම බොවු මෙතැන ඔබලාට මා විමැසිය යුතු බවක් නැත. නොකෑවිරූ ගඩාගෙඩි නොබීවිරූ ජලය මා නොවිමසා නොකවු නොබොවු ඔවුහු එක් දවසක් හැසිරෙන්නාහු වෙනත් කඳුපාමුලකට ගොස් ගොඳුරු ගෙන පැන් සොයන්නාහු එක් අමනුෂ්‍යයන් විසින් අරක්ගත් පොකුණක් දක වහා එහි නොපිවිස ඒ වටා පිරිවරා බෝසතුන් එනමග බලමින් හුන්හ. බෝසත්හු පැමිණ, කිමෙක්ද දරුවනි, පැන් නොබොන්නේදැයි ඇසූහ. ඔබතුමා පැමිණෙන තෙක් බලාසිටිමු. මැනවි දරුවෙනි හාත්පස පියසලකුණු සොයමින් දියට බට පදසලකුණු පමණක් දුටහ. නැඟුණු සලකුණු නොදක අනතුරු සහිතයයි දැනගත්හ. එකෙණෙහිම එහි සිටි රකුසා ජලය දෙබෑ කොට සිටගනී. ඒ ජල රකුසා සුදුපාට කටක්ද, නිල් බඩක්ද, රතු අත්පාද. මහ දත්ද, නැමුණු දළද ඇත්තෙකි. විරූපීය. පිළිකුල්ය හේ මෙසේ කීය. ජලය නොබොන්නේ ඇයි මිහිරි ජලය බොන්න. මොහුගේ වචන ඔබ අසන්නේ නැද්ද බෝසත්හු මෙසේ කීහ. තෝ මෙහි අමනුෂ්‍යයෙක් වෙහිද ඔව් මම වෙමි. තෝ මෙහි බට තැනැත්තකු අල්ලාගන්නෙහිද ඔව් අල්ලාගනිමි. නොහැකිය. පැන් බොන්න පැනුත් බොන්නෙමු. මෙසේ ඇති කල්හි ඔබ එකෙක්වත් මිදී නො යන්නේ ය. පැන් බොන්නෙමු ඒත් තාගේ වසඟයට නොයන්නෙමු. එක් බට දඬුවක් ගෙන්වා ගෙන කෙළවරින්ගෙන පිම්බහ. සියල්ල එක් සිදුරක් වීය. ඉවුරෙහි

හිඳ පැන් පානය කළහ. සෙසු වඳුරන්ටද එක් එක් බටදඬුව බැගින් ගෙන්වාගෙන පිඹ දුන්හ. සියල්ලෝ යක්ෂයා බලා සිටියදීම පැන් බීහ. එයමෙසේ කියන ලදී.

**දිස්වා පදමනු ත්තිණ්ණං දිස්වා නොත්තරිතං පදං**
**නළෙන වාරිං පිවිස්සාම් නෙව මං ත්වං වධිස්සසී**

බැස ගිය පා ලකුණු දැක
ගොඩවූ ලකුණු නොම දැක
බට දඬුවෙන් දිය බොන්නෙමු
තට මා නසනු නොහැකිය.

එතැන්පටන් අද දවස දක්වා ඒ ස්ථානයෙහි බටගස් එකම සිදුරක් ඇත්තේය. මේ සමග මේ කල්පයෙහි කල්පයක් පවත්නා පෙළහර සතරක් නම් ඇත. චන්ද්‍රයාගේ ශශරූපය. වට්ටකජාතකයෙහි සත්‍යක්‍රියාකළ තැන ගින්න වැළකීම, ඝටීකාර කුඹල් කරුගේ මව් පියන් වසන තැනට වැසි නොවැසීම, ඒපොකුණු තෙර බටගස්වල එක්ම සිදුරක් තිබීම. මෙසේ ඒ පොකුණ බටදඬුවෙන් පැන් බිව් බැවින් නළකපාන යයි නමක් ලැබීය. පසුකලෙක ඒපොකුණ නිසා ගමක් ඇතිවිය. එයට නළකපාන යයි නමක් ඇතිවිය. **නළකපානෙ** යනුවෙන් ඒ සඳහා කියන ලදී. **පලාසවනෙ** කිනිහිරි වනයෙහි, **තඝ මයං භනෙත** ස්වාමීනි අපි ඒකාන්තයෙන් ඇලුණෝ වෙමු. යම් අන්කිසිවෙක් ඔබ වහන්සේගේ සසුනෙහි ඇලෙත්ද ඔවුහුද අපමෙන් වී ඇලෙත්යයි පෙන්වයි. නෙව **රාජාභිනීතා** ආදිතත්හි එකෙක් රජුට අපරාධයක් කොට පළායයි. පින්වත්ති අසුවලා කොහිද දේවයන් වහන්ස පළාගොස්ය. පළාගිය තැනිනුත් මගෙන් නොමිදෙන්නේය. යම් හෙයකින් පැවිදි වුවොත් මිදෙන්නේයැයි කියයි. දේවයන් වහන්ස ඔහුගේ කිසියම් මිතුරෙක් ගොස් ඒ පවත දන්වා පැවිදිවීමට කැමතිනම් පැවිදිවෙවයි කියයි. හේ පැවිදිව ජීවිත රැකගනිමින් හැසිරේ. මේ රාජාභිනීත නම්. එකෙක් සොරුන්ගේ මුල් සිඳිමින් හැසිරෙයි. සොරුමෙය අසා පුරුෂයන්ගේ ප්‍රයෝජනවත් බව මොහු නොදනී. ඒ බව දන්වත්නෙමියි කියත්. හේ එපුවත් අසා පළායයි. සොරා පළාගියේ යැයි අසා පළාගියතැනේදීත්

නොමිදෙන්නේය. පැවිදිවුවොත් මිදෙන්නේයයි කියති. හේ පුවත් අසා පැවිදිවේ. මේ චොරාභිනීත නම්. එකෙක් බොහෝ ණය ගෙන ඒ ණයින් අසරණව පෙළී ඒ ගමෙන් පළායයි. ණයහිමියෝ ඒ බව අසා පළාගිය තැනේදීත් අපගෙන් නොමිදෙන්නේය. ඉදින් පැවිදි වුවොත් මිදෙන්නේයයි කියත්. හේ එපුවත් අසා පැවිදිවෙයි. මේ ඉණට්ඨනම් රාජභය ආදී එක්තරාභයකින් බියපත් වුයේ අසරණ වුයේ ආතුරවූයේ නික්ම පැවිදිවුයේ භයට්ඨ නම් දුර්භික්ෂ ආදියෙහිදී ජීවත්වන්නට නොහැකිව පැවිදිවුයේ ආජීවිකාපකත නම් ජීවත්වීමෙන් මැඩුණේ ය යන අර්ථයි. මොවුන් අතුරින් එකෙක් හෝ මේ කරුණු නිසා පැවිදි වූවෙක් නම් නැත ඒ නිසා රාජාභිනීත නොවේ යැයි ආදිය කීය. **විවෙකං** වෙන්ව හුදෙකලාවී. මෙය මෙසේ කියන ලද්දේවෙයි. කාමයන්ගෙන්ද අකුසල ධර්මයන් ගෙන්ද වෙන්වූවහු විසින් ද්විතීයධ්‍යාන සංඛ්‍යාත ප්‍රීතිසුඛය අවබෝධ කළයුතුය. ඉදින් කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රීතිසුඛය අවබෝධකරනොගනීද, ඉහළ ධ්‍යාන දෙකින් හා මාර්ග සතරින් වඩා ශාන්ත වු සැපයක් අවබෝධ කර නොගනී. ඔහුගේ සිත අභිජ්ඣාආදීයෙන් වසා සිටී. එහි අරති අධිකුසල ධර්මයන්හි කලකිරීම් ස්වභාවය. **තන්දි** අලසබව යමෙක් පැවිදිව පැවිදිකිස කරන්ට නොහැක්කේද ඔහුට මේ සත් වැදෑරුම් පාපධර්ම ඉපදී සිත වසාගෙන සිටිතියි දක්වා දූන් යමකුගේ සිත ඒ ධර්මයෝ වසාගෙන සිටිත්ද, ඔහුට මහණකමද කරන්ට නොහැක්කේයැයි නැවත **විවෙකං අනුරුද්ධා අඤ්ඤංවා තතො සනතතරං** යයි කීය. මෙසේ කෘෂ්ණපක්ෂය දක්වා දූන් ඒ ක්‍රමයෙන්ම ශුක්ලපක්ෂය දක්වන්ට **විවෙකං** ආදිය කීය. එහි අර්ථය කියන ලද පරිද්දෙන් දත යුතුය.

**සංඛාය** දැන, **එකං** එක්තරා අයකු **පටිසෙවති** සේවනය කළයුත්තක් සේවනය කරයි. සෙසු පදවලද ක්‍රමය මෙයයි. **උපපත්තිං සුවයා කරොති** ප්‍රතිසන්ධි ඇත්තවුන් ප්‍රකාශ කෙරේවා. ප්‍රතිසන්ධි නැත්තවුන් කෙසේ ප්‍රකාශකරන්නේද ප්‍රතිසන්ධියක් නැත්තකුට නැවත භවයෙහි ප්‍රතිසන්ධියක් නැතැයි කියන්නේ උපපතති සවයාකරොති නම් **ජන කුහනත්‍ථං** ජනයා රැවටීම පිණිස **ජනලපනත්‍ථං** ජනයා නම්මා ගැනීම පිණිස **ඉතිමංජනොජානාතු** මෙසේ මහජනයා මා ගැන දන්නේයි මෙසේ මහජනයා අතර මාගේ කීර්තිරාවය උඩට නගින්නේයයි මේ කරුණින්

ප්‍රකාශ නොකෙරේ යන අර්ථයි. උළාරවෙදා මහත් තුෂ්ටි ඇත්තහුම **සොබොපනසස ආයසමා** ඒ ආයුෂ්මත්හු පිරිනිව්යෝය. මේ දූනට සිටින ආයුෂ්මත් හුගේ. **එවං සීලො** ආදී තන්හි සීලාදිය ලෞකික ලොකොත්තර මිශ්‍රයැයි දත යුතුය. **එවං විහාරොහොති** ඒ භික්ෂුව විසින් පුරන ලද ප්‍රතිපත්තිය පුරන්නහුට අර්හත් ඵලය සාක්ෂාත් කොට ඵලසමාපත්ති විහාරයෙන් පහසු විහාරයක් වෙයි. අර්හත් බවට පැමිණීමට නොහැක්කහුට ප්‍රතිපත්ති පිරුවද හැසිරුණේද වාසු විරණයක් නම් නැත. මේ ක්‍රමයෙන් සියලු වාරයන්හි අර්ථය දත යුතුය.

## අටවැනි නළකපාන සූත්‍රයයි

## 2.2.9

**එවමෙමසුතං** යනු ගුලිස්සානි සූත්‍රයයි. එහි **පදරසමාචාරො** දුර්වල සමාචාරයයි. පහත් ආචාරයයි. ප්‍රත්‍යයන්හි අපේක්ෂා ඇති මහාරක්ඛිත තෙරුන් මෙන් උන්වහන්සේ උපස්ථායක නිවසක හුන්කල උපස්ථායකයා මෙසේ ඇසීය. ස්වාමීනි මා විසින් අසුවල් තෙරුන්ට සිවුරක් දෙනලදී. ඔබ කළේ යහපත් දෙයකි. එයම සිත සිතා වාසය කරන උන්වහන්සේට සිවුරක් දීමෙන් ඔබ කළේ යහපත් දෙයකි. ස්වාමීනි ඔබ වහන්සේටද දෙන්නෙමි. මැනවි එසේ කරන්නෙහි එයම සිතමින් සිටිනහුට යැයි කීහ. මෙයද එබඳු පහත්ආචාරයක් විය. **සපපතිසෙසන** ජ්‍යෂ්ඨයන් ඇත්තහු විසින්, තමා ජ්‍යෂ්ඨ කොට නොවිසිය යුතුය. **සෙරිවිහාරෙන** ස්වච්ඡන්දවිහරණයෙන්. අවිනය විහරණයෙන්. **නානුපබජ්ජ** බලයෙන් ඇතුළුනොවී, අනුව නොපිවිස එහි යමෙක් දෙපස මහතෙරුන් දෙනම වැඩහුන් කල්හි ඔවුන් නොවිචාරාම සිවුරින් හෝ දණින් හෝ දණින් හිඳගනී. මෙය අනුපබජ්ජ. බලයෙන් ඇතුළුවී හිඳගනී නම්වේ. මෙසේ නොකොට තමාට පැමිණි අසුන සමීපයෙහි සිට ඇවැත්හි හිඳවයි කීකල්හි හිඳගත යුතුය. ඉදින් නොපවසන්නේනම් ස්වාමීනි හිඳිමියි විමසා හිඳගතයුතුය. විමසන ලද කල්හි සිට හිඳගනුවයි කීකල්හිද. නොකියුකල්හිද හිඳගන්ට වටී. **නපටිබාහිසසාමි** මෙහිදී යමෙක් තමාට පැමිණි අසුන ඉක්මවා නවකයන් පැමිණෙන තැන හිඳගනී. මෙය නවක භික්ෂූන් අසුනින් වළැක්වයි නම්වේ.

එහිදී එසේ හුන් නවක භික්ෂුව අපට හිඳගන්නට නොදෙතියි දොස්නගමින් සිටිත් නැතහොත් ආසනයක් සොයමින් ඇවිදිත්. එනිසා තමාට පැමිණි අයුනෙහිම හිඳගතයුතුය. මෙසේ එය නොවළක්වයි නම්වේ. **ආභිසමාචාරිකමපි ධම්මං** නියම හැසිරීම වත්පිළිවෙත් මාත්‍රයක් **නාතිකාලෙන** ඉතා උදෑසන නොපිවිසිය යුතුය. ඉතාදවල් කල ඉවත්වී නොයා යුතුය. භික්ෂුසංඝයා සමගම පිවිසිය යුතුය නික්මිය යුතුය. ඉතා උදෑසන පිවිස නොදවල් කල්හි නික්මෙන්නා ගේ චෛත්‍යමළු බෝමළු වත් පිරිහෙයි. උදෑසනින් මුව දොවා මකුළුදැල් කඩාගෙන, පිනිබිඳු පාගාගෙන ගමට පිවිස කැඳ සොයා දන්වළඳන කල් එනතුරු ඇතුළුගමෙහිම නානාප්‍රකාර තිරිසන්කතා කියමින් හිඳ බත්කිස නිමවා දවල්හි නික්ම භික්ෂුන් පාදොවන කල්හි විහාරයට ආපසු පැමිණිය යුතු වෙයි. **නපුරෙ භත්තං පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිතබ්බං** යම් භික්ෂුවක් ආරාධනා කරනුලැබ අහර වළඳා ශාන්තවූ භික්ෂුවක නොවිමසා පෙරබත් කල්හි පසුබත් කල්හි නියමිත කාලයේදීහැර කුලචාරිත්‍රයන්ට එළඹේද පචිති ඇවැත්වේය යන ශික්ෂා පදය රක්නහු විසින් විභඞ්ගයෙහි කියන ලද පෙරබත් කල්හි පසුබත්කල්හි චාරිත්‍රයන්ට නොඑළඹිය යුතුය. **උද්ධතො හොති චපලො** උඩඟු ස්වභාව ඇත්තේ හෝවෙයි. සිවුරු සැරසීම්, පාත්‍ර සැරසීම් සෙනසුන් සැරසීම් මේ කුණුසිරුර කෙළිපිණිස කරන සැරසීම්යයි මෙසේ කියන ලද තරුණ දරුවන්ගේ චපල භාවයෙන් යුත්. **පඤ්ඤවතා භවිතබ්බං** කළයුතු. චීවරකර්ම ආදීන්හි උපාය ප්‍රඥවෙන් යුක්ත විය යුතුය. **අභිධම්මෙ අභිවිනයෙ** අභිධර්ම පිටකයෙහි මෙන්ම විනය පිටකයෙහිද පෙළ වශයෙන් අටුවා වශයෙන්ද යෙදීම කළයුතුය. අඩුතරමින් අභිධර්මයෙහි දුකතිකමාතික සමග ධම්මහදය විභඞ්ගය හැර නොවටී. විනයෙහි කම්මාකම්ම විනිච්ඡය සමග සුවිනිශ්චිත ප්‍රාතිමෝක්ෂ දෙක හැර නොවටී **ආරුප්පා** එපමණකින් අටසමවත්ද කියන ලද්දේවෙයි. ඒවා සියල්ලෙහි යෙදීමට නොහැක්කකු විසින් සතකවත් යෙදීම කළයුතුය. සයක, පහක අඩුවශයෙන් එක් කසිණයෙක පරිකර්ම කර්මස්ථානය ප්‍රගුණකොට ගෙන හැසිරිය යුතුය. මෙහිදී එයහැර නොවටී. **උත්තරිමනුස්සධම්මෙ** මෙයින් සියලු ලෝකෝත්තර ධර්මයන් දක්වයි. ඒනිසා රහත්වී වාසයකළ යුතුය. රහත්බව ලැබීමට නො හැකිවන්නකු විසින් අනාගාමි ඵලයෙහි සකදාගාමි ඵලයෙහි සෝතාපත්ති ඵලයෙහි පිහිටියයුතුය. අඩුතරමින් එක් විදර්හනා

මාතෘකාවක් රහත්බව තෙක් ප්‍රගුණ කොටගෙන හැසිරිය යුතුය. සෙස්ස සියලු තැන නොගැඹුරුමය. මේ ධර්ම දේශනාව ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරහු නෙය්‍ය පුද්ගල වශයෙන් අභිසමාචාරික වතෙහි සිට පිළිවෙළින් රහත්බවට පමුණුවා නිමවා වදාළහ.

## නව වැනි ගුලිස්සානි සූත්‍රයයි.

## 2.2.10

**එවමෙමසුතං** යනු කීටාගිරි සූත්‍රයයි. එහි **කාසිසු** එනම්ඇති ජනපදයෙහි **එථතුමෙහපි භික්ඛවෙ** මහණෙනි එවු, ඔබද මේ ආනිසංස පස බලමින් රාත්‍රිභෝජනය අත්හැර වළදවු මෙසේ භාග්‍යවතුන් වහන්සේ රාත්‍රි විකාලභෝජනය දිවාවිකාල භෝජනයැයි මේ භෝජන දෙක එක් පහරින් අත් නොහරවා එක්කලෙක දිවා විකාල භෝජනයම අත්හරවාපු සේක. නැවත බොහෝ කලකට පසු රාත්‍රි විකාලභෝජනය අත්හරවනසේක් මෙසේ කීසේක. කුමක් නිසාදයත්, මේ භෝජන දෙක සංසාරයෙහි පුරුදු වූවකි ගඟට බට ජලය මෙන් ඉදිරියටම යන්නකි. එළිමහනෙහිද ගෙහිද අහර අනුභවකොට වැඩුණු සුකුමාර කුලපුත්‍රයෝ භෝජන දෙක එක් පහරින් අත්හරින්නාහු ක්ලාන්ත වෙති. ඒනිසි එක්පහරින් අත්නොහරවා භද්දාලි සූත්‍රයෙහි දිවාවිකාල භෝජනය අත්හැරවූ සේක. මෙහි රාත්‍රි විකාල භෝජනය අත්හරවන්නේ තර්ජනය කොට හෝ අවමන් කොට නොවේ. ඒවා අත්හැරීමනිසා අල්පාබාධතාව හඳුනා ගනිවුයයි මෙසේ ආනිසංස දක්වා අත්හැරවූ සේක. **කීටාගිරි** ඒ නියම්ගමෙහි නම. **අස්සජි පුනබ්බසුකා** අස්සජි සහ පුනබ්බසුක. ඡබ්බග්ගියයන් සය දෙනා අතර ගණාචාර්ය දෙදෙන පණ්ඩුක ලෝහිතක මෙත්තිය, භූමමජක අස්සජි පුනබ්බසුක යනු මේ ඡබ්බග්ගියෝය. මොවුන් අතරින් පණ්ඩුක ලෝහිතක දෙදෙන තම පිරිස ගෙන සැවතෙහි වෙසෙත්. මෙත්තිය භූමමජක දෙදෙන රජගහනුවර වෙසෙත්. මේ දෙදෙන කීටාගිරියෙහි නේවාසිකයෝ වෙති. **ආවාසිකා** නිබඳව වසමින් ඒ හා බැඳුණු නොසැදූ සෙනසුන් සදත්. දිරාගිය තැන් පිළිසකර කරති. කළ කල්හි බලවත්තු වෙති. **කාලිකං** අනාගත කාලයෙහි පැමිණිය යුතු ආනිසංස, **මයා චෙතං භිකඛවෙ** මෙහි කුමක් දක්වන සේක්ද

මහණෙනි දවසට තෙවරක් අනුභවකොට සුඛ වේදනාවම උපදවන්නා මේ සසුනෙහි කාර්ය කරන්නෙක් නම් නොවේ. මෙපමණක් වේදනාව ඉවසිය යුතුයි මෙපමණක් නොඉවසිය යුතුයි යන මේ අර්ථය දක්වනු පිණිස මේ දේශනාව ඇරඹූසේක. **එවරූපං සුඛං වෙදනං පරිහරථ** මෙය ගෙහසිත සොමනසස සයක් වශයෙන් කියන ලදී. **උපසමපජ්ජ විහරථ** මෙය නෛෂ්ක්‍රම්‍ය ආශ්‍රිත සෝමනසස සයක් වශයෙන් කියන ලදී. මෙසේ මෙයින් අන්‍යවූ වාර දෙකෙහි ගෙහසිත, නෙක්ඛමමසිත දෝමනසසයන්ද උපේක්ෂාවන්ද වශයෙන් අර්ථය දතයුතුය. මෙසේ සේවනය කළ යුතු නොකළයුතු සියලු දේශනාව දක්වා දූන් අප්‍රමාදයෙන් ක්‍රියාකළයුතු නොකළයුතු කවරකගේද යන්න දක්වන්ට. **නාහං භික්ඛවෙ සබෙබසංයෙව** ආදිය කීහ. එහි **කතං තෙසං අපපමාදෙන** යැයි අප්‍රමාදයෙන් යමක් කළයුතුද එය කරන ලද්දේය. අනුලොම්කාහි ප්‍රතිපත්තියට අනුලෝමවූ කර්මස්ථාන සත්ප්‍රාය යම්තැනක වසන්නහු විසින් මාර්ගඵලවලට පැමිණෙන්ට හැකි වෙයි. **ඉන්‍ද්‍රියානි සමනනානයමානා** ශ්‍රද්ධා දී ඉන්ද්‍රියයන් සමසේ කරමින්, **සතතිමෙ පුගගලා** මෙහි කුමක් දක්වයිද, යමකුට අප්‍රමාදයෙන් කළයුත්තක් නැද්ද. ඒ දෙකක් වෙයි. යමකුට ඇත්ද ඒ පසකි. මෙසේ මේ පුද්ගලයෝ සත් දෙනෙක් වෙතියිමේ අර්ථය දක්වයි. එහි **උභතොභාග විමුතෙතා** භාග දෙකින් මිදුණේ අරූප සමාපත්තියෙන් රූපකායෙන් මිදුණේ වෙයි. මාර්ගයෙන් නාමකායෙන් මිදුණේ වෙයි. හේ අරූප සමාපත්තී සතරෙහි එකඑකකින් නැගිට සංස්කාරයන් මැනවින් දූන රහත් බවට පත් වූවන් සිව්දෙනාගේද නිරෝධයෙන් නැගිට රහත්බවට පත් අනාගාමියාගේද වශයෙන් පස්වැදෑරුම් වෙයි. මෙහි පෙළනම් උභතො භාග විමුත්ත පුද්ගලයා කවරෙක්ද මෙහි එක්තරා පුද්ගලයෙක් අෂ්ට විමෝක්ෂයන් කයින් ස්පර්ශකොට ආශ්‍රවයෝ ක්ෂීණ වූහයි ප්‍රඥවෙන් දූකද වසානුයි අභිධර්මයෙහි අෂ්ට වීමෝක්ෂ ලාභියා ගේ වශයෙන් පැමිණියේය. ප්‍රඥවෙන් මිදුණේනුයි **පඤ්ඤා විමුතෙතා**, හේ ශුෂ්ක විදර්ශකයෙක්ද වී චතුර්ධ්‍යානයන්ගෙන් නැගිට රහත්බවට පත් සිව්දෙනද වශයෙන් පස්වැදෑරුම් වෙයි. මෙහි පෙළනම් උභතො භාග විමුත්ත පුද්ගලයා කවරෙක්ද මෙහි එක්තරා පුද්ගලයෙක් අෂ්ට විමෝක්සයන් කයින් ස්පර්ශකොට ආශ්‍රවයෝ ක්ෂීණවූහයි ප්‍රඥවෙන් දූකද වසානුයි අභිධර්මයෙහි අෂ්ට වීමෝක්ෂ ලාභියා ගේ වශයෙන් පැමිණියේය.

ප්‍රඥාවෙන් මිදුණේනුයි පඤ්ඤා විමුත්තො හේ ශුෂ්ක විදර්ශකයෙක්ද වී චතුර්ධ්‍යානයන්ගෙන් නැගිට රහත්බවට පත් සිව්දෙනද වශයෙන් පස්වැදෑරුම්මවෙයි. මෙහි පෙළ අෂ්ටවිමෝක්ෂ ප්‍රතික්ෂේප වශයෙන්ම ආයේය. කියනලද්දේමැයි. අෂ්ටවිමෝක්ෂයන් කයින් ස්පර්ශකොට, ආශ්‍රවයෝ ක්ෂිණවුවෝයයි ප්‍රඥවෙන් දැක විසීමක් නැත. මේ පුද්ගලයා ප්‍රඥා විමුක්ත යයි කියනු ලැබේ. ස්පර්ශකරන ලද එය සාක්ෂාත් කරන ලද්දේයයි කායසාක්ෂියයි. යමෙක් ධ්‍යාන ස්පර්ශය පළමුව ස්පර්ශ කෙරේද පසුව නිරෝධ සංඛ්‍යාත නිර්වාණය සාක්ෂාත් කෙරේද හේ සෝවාන් පලයෙහි පිහිටියහු ආදිකොට අර්හත් මාර්ගස්‍යා දක්වා සවැදෑරුම් වේයයි දත යුතුය. එහෙයින් කීය. මෙහි එක්තරා පුද්ගලයෙක් අෂ්ට විමෝක්ෂයන් කයින් ස්පර්ශ කොට ඇතැම් ආශ්‍රව ක්ෂීණවුයේයයි ප්‍රඥාවෙන් දැක වාසය කරයි. මේ පුද්ගලයා කාය සාක්ෂියයි කියනු ලැබේ. දුටු දෙයෙහි අන්තයට පත්වුයේනුයි දිට්ඨප්පත්තො. සංක්ෂේප ලක්ෂණයයි. සංස්කාර දුකය. නිරෝධය සැපයැයි ප්‍රඥාවෙන් දත්තේ, දැක්කේ. මැනවින් දත්තේ සාක්ෂාත් කරන ලද්දේ බලන ලද්දේනුයි දිට්ඨිප්පත්තනම් විස්තර වශයෙන් හෙතෙමේද කාය සාක්ෂි මෙන් සැවැදෑරුම් වේ. එහෙයින් කීය. මෙහි එක්තරා පුද්ගලයෙක් මේ දුකයයි ඇතිසේ දනී - පෙ - මෙය දුක්ඛනිරෝධ ගාමිනි පටිපදායයි ඇතිසේ දනී. ඔහුම තථාගත ප්‍රවේදිත ධර්මය ප්‍රඥාවෙන් අබබෝධ කරගත්තේවෙයි. ප්‍රඥාවෙන් අබාධිත වෙයි. මේ පුද්ගලයා සද්ධා විමුත්තයයි කියනු ලැබේ. **නොච බො දිට්ඨප්පත්තස්ස** මෙහි ශ්‍රද්ධාවිමුක්තවූ පූර්වභාග මාර්ගක්ෂණයන් අදහන්නහුට මෙන් සිත පිහිටුවා ගන්නහුට මෙන්, එහි යෙදෙන්නහුටමෙන් ක්ලේශක්ෂය වෙයි. දිට්ඨිපත්තයාට පූර්වභාගයෙහි මාර්ගක්ෂණයෙහි ක්ලේසච්ඡේදක ඥානය අමුඪ තීක්ෂ්ණ ශුර වී දරයි. ඒනිසා යම්සේ අතිශයින් තීක්ෂණ නොවූ කඩුවකින් කෙසෙල් ගසක් කපන්නහුට සිඳින ලද ස්ථානය නොමට වේද කඩුව වහා නොදරයිද ශබ්දය ඇසේද වඩා බලවත් ලෙස ව්‍යායාම කළයුතුවේද එබඳු ශ්‍රද්ධා විමුක්තයාගේ පූර්වභාග මාර්ග භාවනාව මුවහත් කඩුවකින් කෙසෙල් ගස සිඳින්නහුට සිඳින ලද ස්ථානය මට වේද අසිපත වහා දරයිද ශබ්ද නොඇසේද බලවත් ව්‍යායාමයක් නොවේද, ප්‍රඥවිමුක්තයාගේ පූර්වභාග මාර්ග භාවනාව එබඳුයයි දතයුතුය.

ධම්මං අනුස්සරති යනු ධර්මයෙහි හැසිරෙන ධම්මොයනු ප්‍රඥාවයි. ප්‍රඥා පූර්වංගම මාර්ග වඩයි යන අර්ථයි. ශ්‍රද්ධානු සාරියා කෙරෙහිද මෙම ක්‍රමයයි මේ දෙදෙනාම සෝතාපත්ති මාර්ගස්ථයෝ වෙති. මෙය කියන ලදී. සෝතාපත්ති ඵලය සාක්ෂාත් කර ගැනීමට පිළිපන් කිසියම් පුද්ගලයකුගේ ප්‍රඥා ඉන්ද්‍රිය අධිමාත්‍ර වෙයි. ප්‍රඥාවන්තයා ප්‍රඥා පූර්වංගම මාර්ගය වඩයි. මේ පුද්ගලයා ධම්මානුසාරී නම් එසේම සෝතාපත්ති ඵලය සාක්ෂාත් කරගැනීමට පිළිපන් කිසියම් පුද්ගලයකුගේ ශ්‍රද්ධා ඉන්ද්‍රිය අධිමාත්‍ර වෙයි. ශ්‍රද්ධාවන්තයා ශ්‍රද්ධා පූර්වංගම ආර්ය මාර්ගය වඩයි. මේ පුද්ගලයා ශ්‍රද්ධානුසාරී යයි කියනු ලැබේ. මේ මෙහි සංක්ෂේපයයි. මේ උභතොභාග විමුක්ත ආදී කථා විස්තර වශයෙන් විශුද්ධිමාර්ගයෙහි ප්‍රඥාභාවනා අධිකාරයෙහි කියන ලදී. ඒනිසා එහි කියනලද ක්‍රමයෙන් දතයුතුය. මොවුන්ගේ විභාග දක්වනු පිණිස මෙහි පෙළ ආයේය. එහි යම්හෙයකින් රූපසමාපත්තීන්ගෙන් තොර අරූප සමාපත්ති නැත්ද ඒනිසා අරූපා යයි කියූ කල්හිද අෂ්ට විමෝක්ෂ කියන ලද්දේම වෙතියි දතයුතුය. **කායෙන ඵුසිත්වා** සහජාත නාම කායෙන් ස්පර්ශ කොට **පඤ්ඤාය චස්ස දිස්වා** මොහුගේ ප්‍රඥාවෙන් ආර්යසත්‍ය ධර්මයන් දැක, **එකච්චෙ ආසවා** ප්‍රථම මාර්ග ආදියෙන් ප්‍රහාණය කළයුතු ආශ්‍රව කොටසක්. **තථාගතප්පවෙදිතා** තථාගයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද චතුරාර්ය සත්‍ය ධර්මයෝ **පඤ්ඤාය වොදිට්ඨා හොන්ති** මේස්ථානයෙහි ශීලය කියන ලදී. මෙහි සමාධිය, මෙහි විදර්ශනාව, මෙහි මාර්ගය මෙහි ඵලයැයි මෙසේ අර්ථයෙහි අනර්ථයෙහි කරුණින් කරුණ පුරුදුකරගත් සිරිත් ඇතිබැවින් මාර්ග ප්‍රඥාවෙන් මනාසේ දක්නා ලද්දේ වෙයි. වොචරිතා බැබලුණු, **සද්ධා නිවිට්ඨා හොති** ඕකප්පන ශ්‍රද්ධාව පිහිටියේවෙයි. **මත්තසො නිජ්ඣානං ඛමන්ති** ප්‍රමාණයෙන් බැලීම ඉවසත් **සද්ධාමත්තං** ශ්‍රද්ධාවමය, අනික එයටම තවත් වචනයකි. මෙසේ අප්‍රමාදයෙන් කළයුතු දෑ ඇති වේ පුද්ගලයන් අතර තිදෙනෙක් මාර්ග අවබෝධකරගත් සෙඛයෝය. ඔවුහු සුදුසු සෙනසුනක් ඇසුරු කෙරෙමින් කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කරමින් ඉන්ද්‍රියයන් හසුරුවාගනිමින් රහත්බවට පැමිණෙත්. ඒ නිසා එහි පාළි අර්ථය සිටි ඇයුරුමය. අවසානයෙහි සෝතාපත්ති මාර්ගයෙන් යුත් දෙදෙන විසින් ඒ මාර්ගයෙහි සුදුසු සෙනසුනක් සේවනය කරන ලද්දේය. කල්‍යාණමිත්‍රයෝ සේවනය කරන ලද්දෝය. ඉන්ද්‍රිය පාලනය කරන ලදී. ඉහළින් මාර්ගත්‍රය

සඳහා සේවනය කරමින්, ඇසුරු කරමින් පාලනය කරමින් පිළිවෙළින් රහත් බවට පැමිණෙන්නාහුය යනු මෙහි පෙළ අරුතයි. විතණ්ඩ වාදීයා මේ පෙළ අරුත ගෙන ලෝකෝත්තර මාර්ගය ඒක චිත්ත ක්ෂණික නොවේ බහු චිත්ත ක්ෂණිකයයි කියයි. ඔහුට මෙසේ කිය යුතුය. ඉදින් අන් සිතකින් කල්‍යාණමිත්‍රයන් ඇසුරු කෙරේද අන්සිතකින් ඉන්ද්‍රිය පාලනය කෙරේද මාර්ග සිත අනිකකි මේ සඳහා ඔබ මාර්ගය ඒකචිත්ත ක්ෂණික නොවේ බහු චිත්ත ක්ෂණිකයයි කියති. මෙසේ ඇතිකල්හි සෙනසුන පරිහරණය කරමින් නිල්වන් එලියක් ඇති පර්වතයක් දකී. වනය දකී. මෘගපක්ෂීන්ගේ හඬ අසයි. මල් පලතුරු සුවඳ ආඝ්‍රාණය කරයි. පැන්බොමින් රසය විඳගනී. හිඳිමින් වැද හොවමින් ස්පර්ශය ලබයි. මෙසේ ඔවුහු පංච විඤ්ඤාණයෙන් යුතුවුවද ලෝකෝත්තර ධර්මයන්ගෙන් යුක්ත වන්නාහුය. මෙය පිළිගන්නේ නම් ශාස්තෲන් වහන්සේ සමග විරුද්ධ වන්නෙහිය. ශාස්තෲන් වහන්සේ විසින් පංචවිඤ්ඤාණ කාය ඒකාන්තයෙන් අව්‍යාකෘත බව කියන ලදී. එයින් යුක්ත වුවහුගේ කුසල අකුසල ප්‍රතික්ෂේප කරන ලද්දේය. ලෝකෝත්තර මාර්ගයෙහිද ඒකාන්තයෙන් දක්ෂය. ඒනිසා එය ඉවත ලවු යයි කියතියි දන්වා සිටිය යුතුය. යම්හෙයකින් දැන්වීමක් නොලැබේනම් උදෑසනම යව වෙහෙරට පිවිස කැඳ බොවයි උනන්දු කළයුතුය. **නාහංභික්ඛවෙ ආදිකෙනෙව මහණෙනි** මම පළමු කොටම මැඩියා ගේ පැන පැන යාම මෙන් **අඤ්ඤාරාධනං** රහත් බවෙහි පිහිටීම යයි නොකියමි. **අනුපුබ්බසික්ඛා** කරණාර්ථයෙහි වර්තමාන වචනයි. පසු පද දෙකෙහිම මෙම ක්‍රමයයි. **සද්ධාජාතො** ඔකප්පන ශ්‍රද්ධාවෙන් හටගත් ශ්‍රද්ධාව ඇත්තේ. **උපසඞ්කමති** ගුරුවරුන්ගේ සමීපයට යයි. **පයිරුපාසති** සමීපයෙහි හිඳී. **ධාරෙති** ප්‍රගුණකොට දරයි. **ඡන්දොජායති** කිරීමේ කැමැත්ත නමැති කුසලච්ඡන්දය උපාදවාගනී. **උස්සහති** වීර්යකරයි. **තුලෙති** අනිත්‍යය. දුඃඛය, අනාත්මයැයි තුලනය කරයි. තුලයිත්වා පදහති මෙසේ තීරණ විදර්ශනාවෙන් තුලනය කරයි. **තුලයිත්වා පදහති** මෙසේ තීරණ විදර්ශනාවෙන් තුලනයකරමින් මහා ප්‍රධන් වීර්ය කරයි. **පහිතත්තො** යවන ලද ආත්මභාව ඇති **කායෙන චෙව පරම සච්චං** නාමකායෙන් නිර්වාණ සත්‍යය සාක්ෂාත් කරයි. පඤ්ඤායචා නාමකාය සම්ප්‍රයුක්ත මහා ප්‍රඥවෙන් විනිවිද දකී. දැන් ඒනිසා ශාස්තෲන් වහන්සේගේ පැමිණීම අසා පසුගමන් මාත්‍රයක් පවා නොකළහ. ඒනිසා ඔවුන්ගේ චර්යාවට නිග්‍රහ කරනසේක් **සාපිනාම භික්ඛවෙ සද්ධා නාහොසි**

ආදිය කීසේක එහි කිවදුරෙව්මෙ කෙතරම් දුර තැනක යොදුන් සියයක් යොදුන් දහසක්ද අපක්‍රාන්ත වීයයි කියන්ට වටී. එහෙත් කිසිවක් නොකීය. **චතුප්පදං වෙය්‍යාකරණං** චතුරාර්ය සත්‍ය ව්‍යාකරණය සඳහා කියන ලදී. **යස්සුද්දිට්ඨස්ස** උදෙසූ යමකුගේ **යොපි සො භික්ඛවෙ සත්ථා** බාහිර ශාස්තෘවරයකු දක්වයි. **එවරූපී** මෙබඳු ජාති ඇති **පණොපණවිය** මිල වැඩි හා අඩු කරන්නෝ නෙඑළඹෙතිය දෙයක් නොවේ. ගනුදෙනුකාලය මෙන් අගය වැඩි අඩු කිරිමක් නොවේ යන අර්ථයි. මේ ගොනා කීයක් අගීද විස්සක් අගීයයි කියන්නේ **පණති** නම් වේ. විස්සක් නොඅගී දහයක් අගි යැයි කියන්නේ **ඔපණති** නම් වේ. මෙය ප්‍රතික්ෂේප කරමින් **පණොපණවියා න උපෙතියි** කීය. දැන් මිල වැඩි අඩුකිරීම දක්වන්ට **එවඤ්ච නො අස්ස අථ නං කරෙය්‍යාම නච එවමස්ස නනං කරෙය්‍යාමාති කිංපන භික්ඛවෙ** මහණෙනි තථාගතයන් වහන්සේ සර්වාකාරයෙන් ආමිෂයන් ගෙන් වෙන්ම වාසය කරති. මෙසේ නොඇලුණු ශාස්තෘන් වහන්සේට වැඩි අඩු කිරිමක් කුමක්නිසා යෙදෙන්නේද **පරියොගාය වත්තතො** විනිවිද ගොස් ඔසවා ගෙන පවත්නහුගේ **අයමනුධම්මො** මේ ස්වභාවයයි. **ජානාතිභගවා නාහං ජානාමි** භාග්‍යවතුන් වහන්සේ ඒකාසන භෝජනයෙහි ආනිසංස දන්නා සේක. මම නොදනිමියි මා කෙරෙහි ශ්‍රද්ධාවෙන් දවසට තෙවරක් අහර අත්හැර ඒකාසන භෝජනය වළඳයි. **රූළ්හනියං** වැඩෙනසුලු **ඔජවන්තං** සෙනෙහෙවත්. **කාමං තචොචා** මෙයින් අංගසතරකින් යුත් වීර්යය දක්වයි. මෙහි තචො එක් අංගයකි. නහාරු එක් අංගයකි. මෙසේ අංග සතරකින් යුත් වීර්යය අධිෂ්ඨාන කොට රහත්බවට නොපැමිණ **න උට්ඨහිස්සාමි** මෙසේ පිළිපදීයයි දක්වයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව නෙය්‍ය පුද්ගල වශයෙන් රහත්බව කුළුගන්වා නිමවා වදාළ සේක.

**දසවැනි කීටාගිරි සූත්‍රයයි**

**දෙවැනි වර්ගය.**

## 2.3.1

එවමෙමසුතං යනු තෙවිජ්ජවච්ඡ සූත්‍රයයි. එහි එකපුණ්ඩරීකෙ ප්‍රණ්ඩරීක යනු සුදු අඹරුක. ඒ අඹරුක ඒ ආරාමයෙහි එකො පුණ්ඩරීකො අත්‍ථීති එකපුණ්ඩරීක නම් එතදහොසි එහි පිවිසෙනු කැමැත්තෙන් විය. චිරසසං බො භනෙත ප්‍රකෘතියෙන් ගෙන ආ බව උදෙසා ධම්මසසච අනුධම්මං මෙහි සර්වඥතාඥානය ධම්ම නම් මහජනයාට ප්‍රකාශකිරීම අනුධම්ම නම් සෙස්ස ජීවක සූත්‍රයෙහි කියන ලද ක්‍රමයමය. නමෙ අනවසරයෙන් සිට අවසරයද ප්‍රතික්ෂේප කරයි සබ්බඤ්ඤූ සබ්බදස්සාවි අපරිසෙසං ඤාණදස්සනං පටිජානාති මෙය අනුදනිය යුතුව තිබුණි. හැසිරෙන්නාවූ මාහට - පෙ - එළඹ සිටියේය. මෙය නොඅනුදනිය යුතුය සර්වඥතාඥානයෙන් ආවර්ජනය කොටම දනී. ඒනිසා අනවසරයෙන් සිට අවසරයද පිළිකෙව් කරන්නේ මෙසේ කීය. ආසවානංඛයා මෙහි වරක් ක්ෂීණවූ ආශ්‍රවයන් නැවත ගෙවා දැමිය යුතු නොවන බැවින් නොකියන ලදී. භාග්‍යවතුන් වහන්සේ පූර්වේනිවාස ඥනයෙන් මෙහිදී අතීතය දන්නා නුවණ දක්වති. දිබ්බචක්ඛු ඥනයෙන් වර්තමානය දන්නා නුවණද ආශ්‍රවක්ෂය ඥානයෙන් ලෝකෝත්තර ගුණයද දක්වති. මේ මේ ත්‍රිවිද්‍යාවන් සමස්ත බුද්ධ ගුණයෙහි හකුළුවා වදාළසේක. ගිහි සංයෝජනං ගිහිබන්ධනය භාණ්ඩවල ආශාවයි. නත්‍ථිබො වච්ඡ ගිහි සංයෝජන අත්නොහැර දුක් කෙළවර කිරීමක් නම් නැත. සන්තතිමහා මාත්‍රයා උග්ගසේන සිටු පුත්‍රයා මීතසොත දාරකයා ගිහිබවෙහි සිටම රහත්බවට පත්වූහ. ඔවුහු මාර්ගයෙන් සියලු සංස්කාරයන්හි ආශාව වියලවාම රහත්බවට පත්වූහ. එසේ පැමිණ ගිහිබවෙන් නොසිටියහ. මේ ගිහිබව වනාහි හීනය උතුම් ගුණ දැරීමට නොහැකිය. ඒනිසා එහි සිටියේ රහත්බවට පැමිණ එදවසම එක්කෝ පැවිදිවෙයි නැතහොත් පිරිනිවන් පායි. භූමාටු දෙවියෝ නම් සිටිති. කුමක්නිසාදයත් සැඟවී සිටීමට ආකාශය ඇතිබැවිනි. සෙසු කාමභාවයන්හි මනුෂ්‍යයන් අතර සෝවාන් ආදී ඵලයන්ට පැමිණියාහු සිටිති. කාමාවචර දෙවියන් අතර සෝවාන් වූවෝද සකෘදාගාමීහුද සිටිති. අනාගාමී වූවෝද ක්ෂීණාශ්‍රවයෝද නොසිටිති. කුමක්නිසාදයත් ඒ ස්ථානය ප්‍රමාදී ජනයාට නිවාසස්ථානයකි. එහි ඔවුන්ට විවේකයට සුදුසු සැඟවුණු තැනක් නැත. මෙසේ එහිදී ක්ෂීණාශ්‍රව තෙමේ පිරිහිවන්පායි අනාගාමියා

චුතව් සුද්ධාවාසයෙහි උපදී. කාමාවචර දෙවියන්ට ඉහළ ආර්යයෝ සතරදෙන සිටිත්. සොපාස කම්මවාදී ඔහුද කර්ම වාදියෙක් විය. ක්‍රියාව පිළිකෙව් නොකළේය. අනූඑක් කල්පයක් මත්තෙහි තමාම ගෙන කියයි. එකල්හි බෝසත්හු මිථ්‍යා දෘෂ්ටිය වැළඳගැනීම පිණිස පැවිදිව ඒ මිථ්‍යාදෘෂ්ටියෙහි නිෂ්ඵලබව දැන වීර්ය අත්නොහළහ. ක්‍රියාවාදීව ස්වර්ගයෙහි උපන්හ. ඒ නිසා මෙසේ කීහ. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

## පළමුවැනි තෙවිජ්ජ වච්ඡ සූත්‍රයයි

### 2.3.2

එවමෙමෙසුතං යනු අග්ගිවච්ඡ සූත්‍රයයි. එහි නඛොඅහං පළමුවර මම ශාස්වත දෘෂ්ටිකයෙක් නොවෙමියි කියයි. දෙවැනි වර මම උච්ඡේද දෘෂ්ටිකයෙක් නොවෙමියි කියයි. මෙසේ අන්තානන්තික ආදී වශයෙන් සියලු වාරයන්හි ප්‍රතික්ෂේපය දත යුතුය. හොතිච නචහොති ච මේ එකච්ච සස්සත වාදයයි. නෙව හොති න න හොති මෙය අමරාවික්කෙබප. වාදයයිද දතයුතුය. සදුක්ඛං කෙලෙස් දුකින් හෝ විපාකදුකින්ද දුක්සහිත සවිඝාතං ඒ දෙක වශයෙන් උපඝාත සහිත සඋපායාසං ඔවුන්ගේම වශයෙන් පරිළාහ සහිත කිඤ්චි දිට්ඨිගතං කිසියම් එක් දෘෂ්ටියක් වත් කැමතිවී කමවා ගන්නා ලද්දේ වේදැයි අසයි. අපනීතං ඉවතට ගෙනයනලද විසිකරන ලද දිට්ඨං ප්‍රඥාවෙන් දක්නා ලද යම්හෙයින් පංචස්කන්ධයන්ගේ ඇතිවීම හා නැතිවීම දුටුවේද ඒනිසා, සබ්බමඤ්ඤිතානං සියලු තෘෂ්ණා දෘෂ්ටි මාන තුන පිළිබඳව හැඟීම ඇති මථිතානං ඒවාටම වෙනත් වචනයකි. දැන් ඒවා බෙදා දක්වන්නේ. සබ්බඅභිඞකාර මමිංකාර මානානුසයානං යයි කීය. මෙහි අභිඞකාර නම් දෘෂ්ටියය ..මිංකාරය තෘෂ්ණාවය. මානානුසය මානයයි. අනුපාදා විමුත්තො සිව් උපාදානයන් අතුරින් කිසියම් දහමක් නොගෙන මිදුණු, නැපෙති නොයෙදේ. මෙහිද නඋපපජ්ජති යන්න අනුදැනියයුතුව තිබුණි. කුමක්නිසාද මෙසේ කීකල්හි ඒ පිරිවැජියා උච්ඡේදය ගනුඇත. උපපජ්ජති කියුවිට ශාස්වතයයි. උපපජ්ජතිච නො උපපජ්ජති ඒකච්ච

සස්සත වාදයයි. නෙව උපපජ්ජති නන උපපජ්ජතිච අමරා වික්ෂේපයයි. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ මෙය ප්‍රතිෂ්ඨා රහිතවේවා අනාලම්බවේවා සැපයට පිවිසෙන තැනක් නො ලබාවායි අවසරනොදී සිට අවසර දුන් දෙයද ප්‍රතික්ෂේප කළසේක. අලං සමත්. ප්‍රමාණවත්, ධම්මො ප්‍රත්‍යාකාර ධර්මය අඤ්ඤත්‍ර යොගෙන අන්තැනක යෙදීමෙන්. අඤ්ඤත්‍ර ආචරිය කෙන ප්‍රත්‍යාකාරය නොදන්නා අන් ගුරුවරුන් සමීපයෙහි වසන්නහු විසින් නෙනභිවච්ඡ යම් හෙයකින් ඔබ සම්මෝහයට පැමිණියෙමියි කියහිද ඒනිසා එයම මෙහිදී නැවත විචාරන්නෙමි. අනාහාරො නිබ්බුතො ප්‍රත්‍ය නැතිව පිරිනිවියේය. යෙන රූපෙන යම් රූපයකින් සත්ව සංඛ්‍යාත තථාගතයා යයි පනවන්නේනම් ගම්භීරො ගුණයෙන් ගැඹුරු. අප්පමෙය්‍ය ප්‍රමාණයක් ගැනිමට නොහැකිවන දුප්පරියෝගාහෝ ගැනීමට අපහසු දැනීමට අපහසු සෙය්‍යථාපි මහා සමුද්දො යම් සේ මහ සමුදුර ගැඹුරුද ප්‍රමාණකළ නොහැකිද දැනගැනීම අපහසුද එසේම ආශ්‍රවක්ෂය කළ පුද්ගලයාද ඒ අරබයා උපදීය ආදී සියල්ල නොයෙදේ. කෙසේද නිවීගිය ගින්න අරබයා පෙරදිගට ගියේය ආදි සියල්ල නොයෙදේද ඒවාගේ, අනිච්චතා අනිත්‍යතා වෙන් සාරෙපතිට්ඨිතං ලෝකෝත්තර ධර්ම සාරයෙන් පිහිටි, සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

## දෙවැනි අග්ගිවච්ඡ සූත්‍රයයි

### 2.3.3

එවමෙමසුතං යනු මහාවච්ඡසූත්‍රයයි. එහි සහකථී සමගවාදය බහුං මයා තුමෙහි සද්ධිං කථිතපුබ්බං සිහිකරවීම ආදරය හා කෙසේ ගැටේද, පෙරකියූ සූත්‍රදෙක මෙයටම කියන ලදී. සංයුත්තයෙහි අව්‍යාවට සංයුත්තය මෙයටම කියනලදි. භවත්ගෞතමයෙනි. ලෝකය ශාස්වත වේද. මෙම සත්‍යයම හිස් යයි සිතමියි මෙය අව්‍යාකෘතයයි අංගුත්තර නිකායෙහිද මෙය සමගම කියන ලද්දේවෙයි. ඒනිසා මෙසේ කීය. සම්මාසම්බුදුන් වහන්සේද ආආවුන්ට සංග්‍රහ කොට ඉඩ දුන්සේක්මය. ඒනිසා මේ ශාස්වත දෘෂ්ටිකයා. ශාස්වත දෘෂ්ටිකයෝ වහා දෘෂ්ටිය අත්නොහරින්නෝය. වුරුණු තෙල්

ගැවුණු රෙදිකැබැල්ලක් මෙන් බොහෝ කලකින් පිරිසිදු වෙයි. මේ පිරිවැජියා යන්නේ ලබ්ධිය අත්හැර මා සමීපයෙහි පැවිදිව අභිඥ අවබෝධ කොට අවබෝධකරගත් ශ්‍රාවකයෙක් වන්නේයයි භාග්‍යවත් තෙමේ දකියි. ඒනිසා ආආවුන්ට සංග්‍රහකොට ඉඩ ලබා දුන්නේය. මේ මොහුගේ අවසාන ගමනය. හෙතෙමේ මේ සූත්‍රයෙහි තරණය හෝ මරණයයි සැරයටිය සඟවා ජලයෙහි වැටෙන්නාක්මෙන් ශ්‍රමණ ගෞතමයන් සමීපයට ගොස් පැවිදිවන්නෙමියි සනිටුහන් කොට පැමිණියේය. ඒනිසා දම්දෙසන්නැයි **යාචනෙනා සාධු මේ භවං ගොතමො** ආදිය කීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට මූලික වශයෙන් සංක්ෂිප්ත දේශනාවක්ද, කර්මපථ වශයෙන් විස්තර දේශනාවක්ද දෙසූ සේක. මූලික වශයෙන් මෙහිදේශනාව අතිසංක්ෂිප්ත කර්මපථවශයෙන් සජක්ෂිප්තවුවද විස්තරයක් හා සමානය. බුදුවරුන්ගේ පිළිවෙළක් නැතිව කෙරෙන දේශනාවක් නම් නැත. සුවිසි සමන්ත පට්ඨානයද සප්ත ප්‍රකරණද අභිධර්ම පිටකයද යන සියල්ල සංක්ෂිප්තමය. ඒනිසා මූලික වශයෙන්ද කර්මපථ වශයෙන්ද සංක්ෂිප්තවම දේශනාකරන ලදැයි දත යුතුය. එහි **පාණාතිපාතා වෙරමණී කුසලං** ආදියෙහි පිළිවෙළින් සප්තධර්මයෝ කාමාවචරයහ.. අනභිධ්‍යා ආදී චාතුර්භූමකයෝද වැටෙත්. **යතො බො වච්ඡ භික්ඛුනො** කිසිවක් නියම නොකොට කියන ලදද, ජීවකසූත්‍රයෙහිද වඩකීසූත්‍රයෙහිද මේ සූත්‍රයෙහිද කියන ලද පරිදි තමාම සඳහා මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලදැයි දතයුතුය. **අත්‍ථිපනාති කිං පුච්ඡාමියි** අසයි. මේ මොහුගේ ලබ්ධියයි. ඒ ඒ සසුනෙහි ශාස්තෘන් වහන්සේම අර්හත්වෙති. ශ්‍රාවකයා රහත්බවට පැමිණීමට සමර්ථයෙක් නැත. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ **යතොබො වච්ඡ භික්ඛුනො** යි එක් භික්ෂුවක කියන්නාක් මෙන් කියති. **අත්‍ථිනුබො සමණසස ගොතමසස සාවකො අරහත්තං පත්තො** යි මේ අර්ථය විමසන්නෙමියි ඇසූහ. එහි **තිට්ඨතු** යී ගෞතමයන් වහන්සේ සිටිත්වා. භාග්‍යවතුන් වහන්සේම ලෝකයෙහි ප්‍රකටවූ රහතන් වහන්සේය යන අර්ථයි. මෙය කියූ කල්හි මතුයෙහි භික්ෂුණී ආදීන්ගේ වශයෙන් ප්‍රශ්න ඇසීය. භාග්‍යවතුන් වහන්සේද ප්‍රකාශ කළ සේක **ආරාධකො** සම්පාදකයා පරිපූරකයා. **සෙඛාය විජ්ජාය පත්තබබං** අවම ඵලත්‍රයට පැමිණිය යුතුය. ඒ සියල්ලටම මම පැමිණියෙමි කියන සේක. විතණ්ඩ වාදියා මෙසේ කීය. ධර්මකීයක් සේබද, නොපැමිණි සිව් මගද අවම සාමඤ්ඤඵල තුනද යන වචනයෙන් අර්හත් මාර්ගයටද

අවසානයෙහි පැමිණියේමය. ඵලයට නොපැමිණියේය. එයට පැමිණීමට මතුයෙහි යෙදීම කියවයි. එය මෙසේ හැඳින්විය යුතුය.

යොචෙ කිලෙසානි පහාය පඤ්ච
පරිපුණ්ණසෙඛො අපහාන ධම්මො
චෙතො වසිප්පත්තො සමාහිතින්‍ද්‍රිය
සචෙ ඨිත තෙතානි නරො පවුච්චති

යමෙක් කෙලෙස් පස හැර
පිරිපුන් සේඛව නොහරන දහම් ඇත්තේ
සිත්හි වසඟව සන්හුන් ඉඳුරන් ඇත්තේ
හේ නැවතුණු ආත්ම ඇති මිනිසායය කියනු ලැබේ.

අනාගාමි පුද්ගලයා ඒකාන්ත පරිපූර්ණ සේඛයාය. ඒ සඳහා මේ **සෙඛාය විජ්ජා පත්තබ්බං** යයි කීහ. මාර්ගය ඒක චිත්තක්ෂණික හෙයින් එහි සිටියහුගේ විමසීමක් නැත. මේ සූත්‍රයෙන්ද මාර්ගයද **බහුචිත්තක්ඛණිකො** - බහු චිත්ත - ක්ෂණික වෙති යන්න බුද්ධවචන නොවේනම් කියන ලද ගාථාවෙහි අර්ථයද විරුද්ධය. ඒනිසා අනාගාමි ඵලයෙහි සිට අර්හත් මාර්ගයෙහි විදර්ශනාව කියවන ලද්දේයයි දත යුතුය. යම් හෙයකින් ඒ පිරිසිදු රහත්හුටම උපනිශ්‍රය නොවේ. ෂට් අභිඥවනටද උපනිශ්‍රය වේ. ඒනිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ සමථයෙහි කර්ම කොට පංච අභිඥ්ඥා උපදවන සේක. විදර්ශනාවෙහි කර්ම කොට රහත්බවට පැමිණෙන සේක. මෙසේ ෂට්අභිඥසහිත මහා ශ්‍රාවකයෙක් වන්නේයයි විදර්ශනාමාත්‍රයම නොකියා සමථ විදර්ශනා කියාදුන් සේක. **සති සති ආයතනෙ** කරුණු ඇති ඇති කල්හි, මෙහි කාරණ යනු කිම. අභිඥ්ඥාව හෝ අභිඥ්ඥාපාදක ධ්‍යානය හෝ අවසන්හි රහත්බව හෝ රහත්හුගේ විදර්ශනාව හෝ යන කාරණයයි දතයුතුය. **පරිචිණ්ණාමෙ** භගවා සේඛයෝ සත්දෙන භාග්‍යවතුන් වහන්සේ වටා හැසිරෙත්. ක්ෂීණාශ්‍රවයා විසින් භාග්‍යවතුන් වහන්සේ වටා පිරිවරනලද සේකැයි මෙසේ සංක්ෂේපයෙන් රහත්බව ප්‍රකාශ කරමින් තෙරුන් වහන්සේ මෙසේකීහ. ඔවුහු භික්ෂූන්ගේ අර්ථය නොදත්හ. නොදනම ඔහුගේ වචනය පිළිගෙන

භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. දෙවතා ඔවුන්ගේ ගුණලැබූ දේවතාවා සෙස්ස සියලු තැන නොගැඹුරුය.

## තෙවැනි මහාවච්ජ සූත්‍රයයි

## 3.3.4

**එවමෙමසුතං** යනු දීඝනඛ සූත්‍රයයි. එහි සූකරඛතායං සූකරඛත නම් ඇති ලෙනෙහි. කාශ්‍යප බුදුන් කල ඒ ලෙන එක් බුද්ධාන්තරයක් පොළොව වැඩෙන කල පොළොව තුළට ගියේ වෙයි. ඉක්බිති එක්දවසක් ඌරෙක් එහි වහල කෙළවර සමීපයෙහි පස් හැරිය. වැසිවටකල්හි පස් සේදී වහල කෙළවර ප්‍රකට විය. වනචාරියෙක් දැක පෙර සිල්වතුන් විසින් පරිභෝගකරන ලද ලෙනක් වියයුතුය එය පිළිදගුම් කරන්නෙමියි හාත්පස පස් ඉවත් කොට ලෙන සෝදා බිත්තියකින් ආවරණයක් කොට දොර කවුළු යොදා මැනවින් නිමකරන ලද සුණු පිරියම් චිත්‍රකර්ම ඇති රිදීපටක් වැනි වැලි අතුරනලද මිදුල ඇති ලෙනක් කොට ඇඳපුටු පනවා භාග්‍යවතුන් වහන්සේගේ වාසය පිණිස දුන්නේය. ලෙන ගැඹුරවිය. පහළට බැස නැගිය යුතුය. ඒ සඳහා මෙය කියනලදී. **දීඝනඛො** ඒ පිරිවැජියාගේ නමයි. **උපසඞකමි** කුමක්නිසා පැමිණියේද හේ තෙරුන් වෙත පැවිදිව අඩමසක් වූකල්හි මෙසේ සිතීය. මාගේ මාමා වෙනත් පාෂාණ්ඩයකු වෙතගොස් වැඩිකල් නොසිටී දැන් මේ ශ්‍රමණ ගෞතමයන් වෙත ගොස් අඩමසක් විය. ඔහුගැන ප්‍රවෘත්තියක් වත් නො අසමි. ශාසනය ඕදවත් විය යුතුය. එය දැනගන්නෙමිය එහි යනු කැමැත්තේ විය. ඒනිසා එළඹියේය. **එකමනතං ඨිතො** එසමයෙහි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් හුන්නාහු වෙති. පිරිවැජියා මාමා කෙරෙහි භය ලජ්ජාවෙන් සිටියේම ප්‍රශ්නයක් ඇසීය. එකමනතං ඨිතො යි ඒනිසා කියන ලදී. **සබබං මෙ නකඛමති** මාගේ සියලු උත්පත්තීහු නොකමත්. ප්‍රතිසන්ධිහු නොකමත්ය යන අදහසින් කියයි. මෙපමණකින් මොහු විසින් මම උච්ඡේදවාදී වෙමියි පහදන ලද්දේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ ඔහු ගේ අදහස සඟවා අක්ෂර දෝසය පමණක් දක්වන සේක් **යාපිඛොතෙ** ආදිය කීසේක. **එහි එසා පි තෙ දිට්ඨි නකඛමති** ඔබ විසින් පළමුව කැමතිවී කමාකරවා ගන්නාලද

දෘෂ්ටියනොකමයි. **එසා බො මෙ හො ගොතම දිට්ඨි** **ඛමෙය්‍ය** මාගේ වනාහි සියල්ල නොතමයි යන දෘෂ්ටියකි. ඒ මාගේ සියල්ල නොකමයි යන දෘෂ්ටිය එය කමන්න. යම දෘෂ්ටියක් සියල්ල මට කමතියි කියන ලදි. එයද ඔහුට එසේමය, යම්සේ සර්වග්‍රහණයෙන් ගත්තාවූ මේ දෘෂ්ටිය කමයිද එසේ මෙයද කමන්න. මෙසේ තමාගේ වාදයෙහි නගන ලද දෝෂය දැන එය පරිහරණය කරම්යි හැඟීමෙන් කියයි. අර්ථවශයෙන් ඔහුගේ මේ දෘෂ්ටිය නොකමතියි පෙන්නුම් කරයි. යමකුට එම දෘෂ්ටිය නොකමයිද රිසිනොවේද ඔහුට ඒ දෘෂ්ටියෙන් සියල්ල මට නොකමතියි දෘෂ්ටිය රිසිවිය. ඒ අක්ෂමායෙන් අරුචියෙන් වියයුතුය. **සබ්බං ඛමති රුච්චති** පෙන්නුම්කරයි. එය පිළිගන්නේ නොවේ හුදෙක් ඒ උච්ඡේද දෘෂ්ටියෙන් උච්ඡේදයම ගනී. භාග්‍යවතුන් වහන්සේ ඒනිසා වදාළ සේක. **අතො බො තෙ අග්ගිවෙස්සන - පෙ - අඤ්ඤඤ්ච දිට්ඨිං උපාදියන්ති** එහි අථො යනු අත්හරින්නන් කෙරෙහි. පඤ්චමී විභක්ති යමෙක් අතේ හරින්ද ඔවුන් විසින් යමෙක් අත්නොහරිතියි කියනු ලබත්ද ඔවුහුම බහුතරය යන අර්ථයි. බහුහි බහුතරා යන මෙහි හි කාරය නිපාත මාත්‍රයකි. බහු බහුතරය යන අර්ථයි. **පරතො තනුහි තනුතතරා** යන පදයෙහිද මෙම ක්‍රමයමැයි. **යෙ එවමාහංසු** යමෙක් මෙසේ කියත්ද ඒ දෘෂ්ටියම අත් නොහරිති. අන්දෘෂ්ටියක්ම අල්ලාගනිත් යන මුලදර්ශනය අත් නොහරිත්. වෙනත් දර්ශනයක් අල්ලාගනිත්. මෙහිද ශාස්වතය ගෙන එය අත්නොහැර උච්ඡේදය හෝ එකච්ච සස්සතය ගන්නට නොහැකිය. උච්ඡේදයද ගෙන එය අත්නොහැර සස්සතය හෝ එකච්ච සස්සතය ගන්ට නොහැකිය. එකච්ච සස්සතයද ගෙන එය අත්නොහැර සස්සතය හෝ උච්ඡේදය හෝ ගන්ට නොහැකිය. මුලසස්සතය අත්නොහැර අන්‍යවූ සස්සතයම ගන්ට හැකිය. එක් කලෙක රූප සස්සතයයි ගෙන තවත් කලෙක ශුද්ධරූපයම සස්සත නොවේ. වේදනාවද සස්සතය - පෙ - විඤ්ඤාණතයද සස්සතයයි ගනියි. උච්ඡේදයෙහිද එකච්ච සස්සතයෙහිද මේ ක්‍රමය මැයි. ඛන්ධන්හි මෙන්ම ආයතනයන්හිද මෙසේම යොදාගතයුතුය. මේ සඳහා **තඤ්චෙව දිට්ඨිං නප්පජහන්ති අඤ්ඤඤ්ච දිට්ඨිං උපාදියන්ති** යි කියන ලදී. දෙවැනිවර අතො අත්නොහරින්නවුන් අතර, පඤ්චමී විභක්තිය යමෙක් අත්නොහරිත්ද ඔවුන් විසින්ම අත්හරිතියි කියනු ලබත්. ඒවාට සුළුතරය අල්පතරය යන අර්ථයි. **තඤ්චෙව දිට්ඨිං පජහන්ති අඤ්ඤඤ්ච දිට්ඨිං න උපාදියන්ති** මුල දර්ශනය අත්හරිති. අන් දෘෂ්ටියක්

නොගනිති. එක්කලෙක රූපය සස්සත යයි ගෙන තවත් කලෙක එහි ආදීනව දැක මාගේ දර්ශනය පහත් යයි අත්හරින්නේ කෙසේද. හුදෙක් රූපය පමණක් සස්සත නොවේ පහත් දර්ශනයම සස්සතය වේදනාවද සස්සතය. විඤ්ඤාණය සස්සතය යන දර්ශනයම පහත් යයි ඉවත්කරයි. උච්ඡේදයෙහිද එකච්චසස්සතයෙහිද මෙම ක්‍රමයයි. මේ අයුරින් ඛන්ධක වල ද ආයතන වලද යෙදිය යුතුය. මෙසේ මුලදර්ශනය අත්හරිත් වෙනත් දර්ශනයක් නොගනිති. **සතනගගිවෙසසනා** යැයි කුමක්නිසා ආරම්භ කළ සේක්ද, මේ උච්ඡේද ලබ්ධිකයා තමාගේ ලබ්ධිය සඟවයි. ඒ ලබ්ධියෙහි ගුණ කියනවිට තමාගේ ලබ්ධිය එළිකරන්නේය. ලබ්ධිතුනම එකට දක්වා බෙදන්ට මේ දේශනාව ආරම්භකළසේක. **සරාගාය සනතිකෙ** ආදී තන්හි රාගවශයෙන් සංසාරයෙහි ඇලෙන්නාහුට තෘෂ්ණා දෘෂ්ටි සංයෝජනයෙන් සංසාරයෙහි සංයෝජන සමීපයෙහි තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් සතුටුවීම යනු තෘෂ්ණා දෘෂ්ටිවශයෙන්ම ගිල අබ්බවාගත් ග්‍රහණයට ආසන්නය යන අර්ථයි. **අසාරාගාය** අබ්බවාගත් **සනතිකෙ** ආදී තන්හිද සංසාරයෙහි නො ඇලන්නහුට සමීපවූ ආදී ක්‍රමයෙන් අර්ථය දතයුතුය. මෙහිද ශාස්වත දර්ශනය අල්ප සාවද්‍යය දන්ධ විරාගයි. උච්ඡේද දර්ශනය මහා සාවද්‍යයි. ඛිප්ප විරාගයි. කෙසේ ද? ශාස්වතවාදියා මෙලොවක් ඇතැයිද පරලොවක් ඇතැයිද දනී. සුකෘත දුෂ්කෘතයන්ට ඵලයක් ඇතැයි දනි. කුසල් කරයි. අකුසල් කරන්නේ බියවෙයි. සංසාරය අස්වාදකරයි. සතුටු වෙයි. බුදුවරුන් හෝ බුදුසච්වන් හමුවුයේ වහා ලබ්ධිය අත් හැරීමට නොහැක්කේය. ඒ නිසා ශාස්වත වාදය අල්ප සාවද්‍යයැයිද දන්ධ විරාග යැයිද කියනු ලැබේ. උච්ඡේදවාදියා මොලොවක් ඇතැයිද පරලොවක් ඇතැයිද නොදනී. සුකෘත දුෂ්කෘත යන්ගේ ඵලයක් ඇතැයි නොදනී. කුසල් නොකරයි. අකුසල් කරන්නේ බිය නොවේ. සංසාරය ආස්වාද නොකරයි. සතුටු නොවේ බුදුවරුන් හෝ බුදුසච්වන් හමුවෙහිදී වහා දර්ශනය අත්හරී පාරමී පුරන්ට හැක්කේ බුදුවී නොහැක්කේනම් උත්සාහ කොට ශ්‍රවකයෙක් වී පිරිනිවන් පායි. ඒනිසා උච්ඡේද දර්ශනය මහා සාවද්‍යයැයිද ඛිපපවිරාග යැයිද කියනු ලැබේ. ඒ පිරිවැජියා මේ අර්ථය නොසලකා මාගේ දර්ශනය වර්ණනාකරයි. ප්‍රශංසාකරයි. ඒකාන්තයෙන් මාගේ දර්ශනය සුන්දරයයි සලකා **උකකංසති මෙ භවං** ආදිය කීය. යම් හෙයකින් මේ පිරිවැජියා කැඳවතුරින්ම තිත්තලබු පුරවන්නාක්මෙන් උච්ඡේද දර්ශනයෙන්ම පුරවන ලද්දේ. කැඳවතුර ඉවත්

නොකොට ලබුගෙඩියෙහි තෙල් පැණි ආදිය බැහීමටද බැහුවද නො අල්ලන්නේ යම්සේද එසේම ඒ ලබ්ධිය අත්නොහැර අග්‍රඵල අල්ලාගැනීමට නොහැකිය. ඒනිසා ලබ්ධිය අත්හැර දැමීම පිණිස තත්‍රග්ගි වෙස්සන ආදිය අරඹන ලදී. විගගහො යනු කලහයයි. **එව මෙවාතාසං දිට්ඨීනං පහානං හොති** මෙසේ විග්‍රහ ආදියෙහි ආදීනව දැක ඒ දෘෂ්ටීන්ගේ ප්‍රහාණය යේ. ඒ පිරිවැජියාද මට මේ විග්‍රහ ආදියෙන් ඇති ඵලය කිමැයි ඒ උච්ඡේද දර්ශනය අත්හරී. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට කැඳඉවත්කළ ලබ්බෙහි ගිතෙල් මීපැණි ආදිය බහන්නාක්මෙන් හෘදයෙහි අමෘතය නමැති ඖෂධය පුරවන්නෙමියි විදර්ශනාව කියාදෙන සේක් **අයං බො අගගිවෙසසන කායො** ආදිය කී සේක. එහි අර්ථය වම්මික සූත්‍රයෙහි කියන ලදී. **අනිච්චතො** ආදියද යට විස්තර කරන ලද්දේමය. **යො කායසම්ං ඡන්‍දෙ** කායෙහි යම තෘෂ්ණාවක් වේද, **සෙනහො** තෘෂ්ණා ස්නේහය. **කායන්වයතා** කය අනුගමනය කරන බව. කය අනුව යන ක්ලේශය යන අර්ථයි. මෙසේ රූප කර්මස්ථානය දක්වා දැන් අරූප කර්මස්කානය දක්වන සේක් **තිසෙසා බො** ආදිය කීසේක. නැවත ඒ වේදනාවන්ගේම අසම්මිශ්‍රබව දක්වන සේක් **යසම්ං අගගිවෙසසන සමයෙ** ආදිය කී සේක. මේ එහි සංක්ෂේප අර්ථයයි. යම් කලෙක සුඛආදීන් අතරින් එක් වේදනාවක් විඳගනීද එකල්හි අන්වේදනාවක් තමාගේ වාරය හෝ අවස්ථාව බලමින් හුන්නේ නම් නැත. එහෙත් නූපන්නේම වෙයි. බිඳුණු දියබුබුළක් මෙන් අතුරුදහන් වූයේ හෝ වෙයි. සුඛාපිබො ආදි ඒ වේදනාවන් සුනු විසුනු වූ බව දක්වන්ට කියන ලදී. **න කෙනචි සංවදති** එය ගෙන මම ශාස්වත වාදීයෙක් වෙමියි ශාස්වත වාදියකු සමගද සංවාද නොකරයි. එයම ගෙන මම ශාස්වතවාදියෙක් වෙමියි ඒකච්ච සස්සත වාදියකු සමග විවාද නොකරයි. මෙසේ වාදත්‍රයට පරිවර්තනය කොට යොදා ගත යුතුය. **යඤච ලොකෙ වුතතං** යමක් ලෝකයෙහි කියන ලදද ව්‍යවහාර කරන ලදද කිසි ධර්මයක් ස්පර්ශ නොකරමින් පරාමාස ග්‍රාහයෙන් නොගෙන එය ව්‍යවහාර කරයි. මෙය මෙසේ කියන ලදී.

යොහොති භික්ඛු අරහං කතාවී
ඛීණාසවො අන්තිම දෙහධාරි
අහං වදාමීතිපි සො වදෙය්‍ය
මමං වදන්තීතිපි සො වදෙය්‍ය
ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා
වොහාර මත්තෙන සො වොහරෙය්‍ය

රහත්වූ කළයුතුදේකර ඇති
නැසූකෙළෙසුන් ඇති
අන්තිම දේහධාරී භික්‍ෂුව
මම කියමියිද
මාගැන කියතියිද කියනු ඇත
දක්ෂයා ලෝවහර දැන
ව්‍යවහාර මාත්‍රයෙන
වහණු ඇත.

අනිකක්ද කියන ලදී. චිත්‍රය මේ ලෝකය හැඳින්වීමයි. ලෝක නිරුක්තියි ලෝක ව්‍යවහාරයි. ලෝක ප්‍රඥප්තියි. තථාගතයන් වහන්සේ ස්පර්ශ නොකොට ඒවායින් ව්‍යවහාර කරන සේක. **අභිඤ්ඤපහාන මාහා** ශාස්වත ආදීන්හි ඒ ඒ ධර්මයන්ගේ ශාස්වත බව මනාසේ දැන ඒකච්ච සස්සතයාගේ ප්‍රහාණය කීය උච්ඡේදය ඒකච්ච සස්සතය මැනවින් දැන ඒකච්ච සස්සත ප්‍රහාණය ගැන කියයි. රූපය මැනවින් දැන රූපප්‍රහාණය ගැන කියතියි ආදී ක්‍රමයෙන් මෙහි අර්ථය දතයුතුය. **පටිසඞ්ඛික්ඛතො** නැවත බලන්නහුට **අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි** අනුත්පාද නිරෝධයෙන් නිරුද්ධවූ ආශ්‍රවයන් ගෙන් අල්ලා නොගෙන සිත මිදුණේය. මෙපමණකින් අනුන්ට එළවන ලද බත් කා කුසගින්න නිවාගන්නාක් මෙන් අනුන් සඳහා අරඹන ලද ධර්ම දේශනා වෙහි සිතයවා විදර්ශනා වඩා රහත්බවට පැමිණ ශ්‍රාවකපාරමීඥනයෙහිද මුදුනට නැගුණේය. සොළොස් ප්‍රඥාවන් දැන සිටියේය. **දීඝනඛො** දීඝනඛ සෝවාන් ඵලයට පැමිණ සරණයන්හි පිහිටියේය. භාග්‍යවතුන් වහනසේ මේ ධර්ම දේශනාව සූර්යයා නොබැසසිටියදීම නිමවා ගිජුකුළු පව්වටබැස වේළුවනයට වැඩ ශ්‍රාවකයන්

රැස් කිරීමක් කළසේක. රැස්වීම චතුරංග සමන්නාගත විය. එහි මේ අංග මා නැකතින් යුත් පුන් පොහෝ දිනයයි. කිසිවකු විසින් ආරාධනය නොකරන ලද්දේ වී තමාගේම ස්වභාවයෙන් රැස්වූ භික්ෂූන්ගේ ගණන හයසිය පනසකි. පෘථක් ජනයෙක් හෝ සෝවාන් සකෘදාගාමි අනාගාමි සුක්ක විපස්සක රහතුන් අතර අන්කිසිවෙක් නැත. සියල්ලෝ ෂට්අභිඥලාභීහුය. මෙහි කිසිවෙක් ආයුධයකින් කෙස් කපා පැවිදිවුවෙක් නම් නැත. සියලු දෙන එහිභික්ෂුභාවයෙන් පැවිදි වූවෝය.

## සිව්වැනි දීඝනඛ සූත්‍රයයි.

## 2.3.5

**එවමෙමසුතං** යනු මාගන්දික සූත්‍රයයි. එහි අග්‍යාගාරෙ ගිනිපුදන ශාලාවෙහි **තිණ සන්ථරකෙ** මාගන්දියෝ දෙදෙනෙකි. මාමාද බෑණාද ඒ අතුරින් මාමා පැවිදිව රහත්බවට පැමිණියේය. බෑණාද උපනිශ්‍රය සහිත වූයේ නොබෝ කලෙකින් පැවිදිව රහත් බවට පැමිණෙන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ උපනිශ්‍රය දැක රමණීයවූ දෙව්කුටියක් වන් ගඳකිලිය අත්හැර අළුතණ කසල ආදියෙන් අපිරිසිදුවූ ගිනිහල්ගෙයි තණ ඇතිරියක් පනවා අනුන්ට සංග්‍රහ කරනු පිණිස කිහිප දවසක් වැඩසිටිසේක. ඒ සඳහා මෙය කියන ලදී. **තෙනුපසඞ්කමි** හුදෙක් එදවස පමණක්නොවේ. යම් හෙයකින් ඒ ගිනිහල්ගෙය ගම අසල දරුදූරියන්ගෙන් ගැවසී හුදෙකලා නොවී ද ඒනිසා භාග්‍යවතුන් වහන්සේ නිතිකල්හි දිවාකාලයේ අඩදිනය ඒ වන ළැහැබෙහි කල්යවා සවස්භාගයෙහි වාසය පිණිස එහි යන සේක. **අද්දසා ඛො තිණ සන්ථරකං පඤ්ඤත්තං** භාග්‍ය වතුන් වහන්සේ අත් දිනවල තණ ඇතිරිය හකුළා සලකුණක් කොට තබා වඩනාසේක. එදවස පනවාම වැඩිසේක. මක්නිසාද යත් එදවස උදෑසන ලොව බලන සේක් අද මාගන්දිය මෙහි පැමිණ මේ තණ ඇතිරිය දැක භාරද්වාජ සමග තණ ඇතිරිය අරබයා තථා සල්ලාපයක් කරන්නේය. ඉන්පසු මම පැමිණ ධර්මය දේශනා කරන්නෙමි. හේ ධර්මය අසා මා සමීපයෙහි පැවිදිව රහත් බවට පැමිණෙන්නේය. අනුන්ට සංග්‍රහ කරනු පිණිසම මා විසින් පාරමී පුරන ලද්දේයයි තණ ඇතිරිය පනවාම වැඩිසේක. **සමණසෙය්‍යාරූපං මඤ්ඤෙ**

මේතණ ඇතිරිය ශ්‍රමණයාට සුදුසුවන්නේයයි හඟිමි මෙහි අසංවර තැනක් වත් පයින් පෑගු තැනක්වත් හිසින් පහරනු ලැබූ තැනක් වත් නො පැනේ. අනාකුල නොගැටුණු නොකැඩුණු, දක්ෂ චිත්‍රකාරයකු විසින් තෙලිතුඩින් පිරිසිඳ පැනවූවක් මෙන් දමුණු ශ්‍රමණයකු වුසු තැනක්ය. පින්වත, කාගේ වුසු තැනක්දැයි අසයි. භූනභූනො වැඩීම් සීමා කළ අයකුගේ ඒ නිසා මෙසේකීය. සදොරෙහි වර්ධනය පනවන ලබ්ධි ඇතිබැවින් මේ ඔහුගේ ලබ්ධියයි. ඇස වර්ධනය කළයුතුය. නොදුටු දෙය දැකගත යුතුයි. දුටුදෙය ඉක්මවා යායුතුය. කන වර්ධනය කළයුතුය. නොඇසුදෙය ඇසිය යුතුය. ඇසුදෙය ඉක්මවා යායුතුය. නාසය වර්ධනය කළ යුතුය. ආඝ්‍රාණය නොකළ දේ ආඝ්‍රාණය කළයුතුය. ආඝ්‍රාණය කළදේ ඉක්මවා යායුතුය. ශරීරය වර්ධනය කළයුතුය. ස්පර්ශ නොකළදේ ස්පර්ශකළයුතුය. ස්පර්ශ කළදේ ඉක්මවා යායුතුය. සිත වර්ධනය කළයුතුය. නොදත්දේ දතයුතුය. දත්දේ ඉක්මවා යායුතුය. මෙසේ හෙතෙමේ ෂට්ද්වාරයන්හි වර්ධනය පනවයි. භාග්‍යවතුන් වහන්සේ

**චක්ඛුනා සංවරො සාධු සාධු සොතෙන සංවරො**
**ඝානෙන සංවරො සාධු සාධු ජිව්හාය සංවරො**
**කායෙන සංවරො සාධු සාධුවාචාය සංවරො**
**මනසා සංවරො සාධු සාධු සබ්බත්ථසංවරො**
**සබ්බත්ථසංවුතො සබ්බදුක්ඛා පමුච්චති**

ඇසින් සංවර වීම යහපති - කනින් සංවර වීම යහපති
නාසයෙන් සංවරය යහපති - දිවෙන් සංවරවීම යහපති
සිතින් සංවරීම යහපති - සියලුතැන සංවරය යහපති
සියලුතැන සංවරවූ භික්ෂුව - මිදේ මැයි හැම දුක්වලින්.

සදොරෙහි සංවරය පනවයි. ඒ නිසා ඒ වර්ධනය නැසූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සීමා කරන්නකුයයි හඟිමින් භූනහුනො යයි කීය. අරියෙ ඤායෙ ධම්මෙ කුසලෙ පිරිසිදුකරුණෙහි. නිවැරදි දහමෙහි මෙයින් කුමක් දක්වේද මෙබඳු උද්ගතවූ ප්‍රසිද්ධවූ යසස් ඇත්තහුට ඉහළින්

කියන්නහු විසින් විමසා උපධාරණය කොට කට රැකගෙන කිවයුතුවෙයි. **එවංච නො සුතෙත ඔවරති** අපගේ සූත්‍රයෙහි මෙසේ එන්නේ යමක් නිසාද අපි කටට ආ දෙයක් නොකියමු සූත්‍රයෙහි ආදෙයක් කියන්නට කාට බිය වෙමුද ඒනිසා භාග්‍යවතුන් වහන්සේ හමුවෙහිද එය කියන්නෙමුයි අර්ථයි. **අපොසසුකෙකා** මාගේ ආරක්ෂාව පිණිස උත්සාහවත් නොවී ව්‍යාවෘත නොවී යන අර්ථයි.

**වුතෙතාව නං වදෙය්‍ය** මා විසින් කියන ලද්දේ වී නොවිමසාම කථාවක් ඇතිකොට අඹදඹ ආදිය ගෙන නොපුරවමින් මා කියූ අයුරින් භවත් භාරද්වාජ කියන්නේ නම් කියාවායි අර්ථයි. **අසොසාසිබො** ශාස්තෘන් වහන්සේ ආලෝකය වඩා මාගන්දිය එහි පැමිණි බව දිවැසින් දුටුසේක. දෙදෙන කථාකරමින් සිටින විට දිවකණින් කටහඬ පවා ඇසූසේක. **පටිසලලාණාවුට්ඨිතො** ඵලසමාපත්තියෙන් නැගිනා ලද්දේ **සංවිගෙගා** ප්‍රීති සංවේගයෙන් සංවේගප්‍රාප්තවූයේ සසලවූයේ කම්පා වූයේ ඔහුට මෙසේ සිතිණ මාගන්දික විසින් ශ්‍රමණ ගෞතමයන්ට දක්වනු ලැබුවේ නැත. අප හැර මෙහි අන්ත තෙවැන්නෙක්ද නැත. තියුණු කන් ඇති පුරුෂයා විසින් අපගේ ශබ්දය ඇසුවා වන්නේ යැයි ඔහුගේ අභ්‍යන්තරයෙහි ප්‍රීතිය හටගෙන අනූනවදහසක් රෝම කූප නැගී සිටිනසේ කළේය. **සංවිගෙගා ලොමහටඨජාතො** යි එහෙයින් කියන ලදී. **අථ මාගණ්ඩියො පරිබබාජකො** පිරිවැජියාගේ බිඳීගිය මුඛය වැනි බිජුවට මෙන් ඥනය මුහුකුරා ගියේය ඒනිසා හිඳගැනීමට නොහැකිව ඇවිදිමින් නැවත ශාස්තෘන් වහන්සේ සමීපයට පැමිණ එකත් පසෙක හුන්නේය. එය දක්වන්ට **අථමාගණ්ඩියො** යි ආදිය කියන ලදී. ශාස්තෘන් වහන්සේ මාගන්දිය, මාහට කියුවේවෙහිදැයි නොකියාම **චකඛුං බො මාගණ්ඩිය** යැයි පිරිවැජියාට දම් දෙසන්ට ඇරඹූසේක. එහි වසනස්ථාන අර්ථයෙන් රූපය ඇසට ඇලුණේ යැයි ඇස **රූපාරාමං** රූපයෙහි ඇලුණේනුයි **රූප රතං** රූපයෙන් ඇස සතුටුවූයේනුයි මැනවින් සතුටුවූයේහුයි **රූප සමමුදිතං දනතං** තමා ප්‍රතික්ෂේප කිරීම. **ගුතතං** - පාලනය කරන ලද **රකඛිතං** තැබූ ආරක්ෂාව ඇති, **සංවුතං** වසන ලද, **සංවරාය** වසනු පිණිස. **පරිචාරිත පුබෙබා** අභිරමණය කරන ලද විරූ **රූප පරිළාහං** රූපය අරබයා උපදින දාහය. **ඉමසස පන තෙ මාගණ්ඩිය කිමසස වචනීයං** රූප පරිග්‍රහණය කොට රහත් බවට පත්වූ ක්ෂීණාශ්‍රවයාට ඔබ

විසින් කුමන වචනයක් කියයුතුද වැඩීම නැසූ සීමා කාරකයෙක්යැයි කියයුතුද. නොකියයුතුදැයි ඇසුසේක. නකිඤචි හො ගොතම ගෞතමයන් වහන්ස කිවයුතු කිසිවක්නැත. සෙසු ද්වාරයන්හිද මේ ක්‍රමය මැයි දැන් යම් හෙයකින් ඔබ විසින් පංචස්කන්ධයන් පරිග්‍රහණය කොට රහත් බවටපත් ක්ෂීණාශ්‍රවයාට කිවයුතු කිසිවක් නැද්ද. මමද පංචස්කන්ධයන් පරිග්‍රහණය කොට සර්වඥතා ඥානයට පැමිණියේ වෙමි. ඒනිසා මමද ඔවුන්ට කිසිවක් නොකිය යුතුයයි දක්වන්ට අහං බොපන ආදිය කීය. තසස මය්හං මාගන්දියයි ගිහිකල තමාගේ සම්පත් දක්වන්නේ මෙසේ කීය. තයො වසසිකං ආදිතන්හි යම්තැනෙක සැප ඇත්ද වැසිකල වසන්ට මෙයයැයි වසසිකො අන්තන්හිද මෙම ක්‍රමයමැයි මේ මෙහි වචනාර්ථයයි. වැඩිකල වාසය, වැස්ස සුදුසුය වසයිකො අන්තන්හිද මේ ක්‍රමය මැයි එහි වැසිපහය වැඩි උසත් නැත. වැඩි පහත්ද නැත. එහි දොර වා කවුළුද බොහෝ නොවේ. බුමුතුරුණු අහර බෙහෙත් ආදිය මිශ්‍රව තිබේ. හිමත් පහයෙහි කණුද බිත්තිද පහත්ය. දොර වා කවුළු අඩුය. කුඩා සිදුරු ඇත්තේය. උණුසුම ඇතුළුවනු පිණිස බිත්ති මුදුන් කේතුරූපා කාරයට තබා ඇත. බුමුතුරුණු පසතුරුණු ඇඳුම් පොරෝනා උෂ්ණය දරාගන්නා කම්බිලි ආදිය පවතී. ආහාරපාන සිනිඳුද කටුකද වෙයි. ගිමත් පහයෙහි කණුද බිත්තිද උසය. දොර වාකවුළු බොහෝය. මහදැල් සහිතය. බුමුතුරුණු ආදිය දුහුලින් කළඒවාය මිහිරි රස සීතල දරාගන්නා ආහාරපානය වාකවුළු අසල අලුත් සැළිතබා ජලයෙන්පුරවා නිලුපුල් ආදියෙන් වසත්. ඒ ඒ පැතිවල ජලයන්ත්‍ර තනත් වැසි වසින්නාක් මෙන් දියදහරා නික්මෙයි. බෝසතුන්ට රන්කළ අටසියයක්ද රිදීකළ අටසියයක්ද සුවඳ දියෙන් පුරවා නිලුපුලින් ගවසා සයනය වටා තැබූහ. විශාලවූ ලෝහ කටාරම්වල සුවඳකලල් පුරවා නිලුපුල් නෙළුම් සුදුනෙළුම් රෝපණය කොට සෘතු ගන්වනු පිණිස ඒ ඒ තැන තැබූහ. සූර්ය රශ්මියෙන් මල් පිපේ. නානාප්‍රකාර බමර සමූහයා පහයට පිවිස මල්වල රොන් උරමින් හැසිරෙත්. ප්‍රාසාදය අතිශයින් සුවඳවත්ය. දෙබිඩි බිත්ති අතර ලෝහ නළ තබා නවමහල් පහය මතුපිට මිදුලෙහි රත්න මණ්ඩප මතුයෙහි සියුම් ඇස් ඇති දැලක් එළා තිබිණ. එක් තැනෙක වියළි මීහරක් සමක් එළා තිබිණ. බෝසතුන් උදෑසන ක්‍රීඩා කරන වේලාවෙහි මීහරක් සම මතුපිටට පාෂාණමය පන්දු විසිකරත්. වැසිවලාකුළු ගුගුරන හඩ මෙන් වෙයි. යට යන්ත්‍ර භ්‍රමණය කරවත්. ජලය නැගී දැලමතට වැටේ. වැස්ස පැමිණි කලක් මෙන් වේ. එවිට බෝසත්හු නිල් රෙද්දක් හඳිති. නිල් රෙද්දක්

පොරවති. නිල් අබරණ පළඳීත්. උන්වහන්සේ පිරිවරා සිටි සතළිස් දහසක් නළුතිළියෝ නිල් වස්ත්‍රාභරණ හැදපැළඳ නිල් විලවුන් ගා මහාපුරුෂයා පිරිවරා රත්න මණ්ඩපයට යති. දිවාභාගයෙහි ජලක්‍රීඩා කරමින් සීතල ඍතු සුඛය විඳගනී. පහයට සිව්දෙසින් විශාල විල් සතරක් ඇත. දිවා කාලයෙහි නානාවර්ණ පක්ෂි සමූහයා පෙරදිගු විලෙන් නැග රැව්නගමින් පහයමතින් අපරදිග විලට යෙත්. අපරදිගු විලෙන් නැග පෙරදිගුවිලටද, උතුරුදිගු විලෙන් දකුණු දිගුවිලටද, දකුණුදිගුවිලෙන් උතුරුදිග විලටද යෙත්. අතුරු වැසිසමය මෙන් වෙයි. හේමන්ත ප්‍රාසාදය පස් මහල්ය. වස්සාන ප්‍රාසාදය සත් මහල්ය. නිප්පුරිසෙමෙහි පුරුෂයන් නැත්තේ. තූර්යභාණ්ඩ සඳහාද පමණක් නොවේ. සියලු තන්හිම පුරුෂයෝ නැත්මය. දොරටුපල්ලෝ ස්ත්‍රීහුමය. නැවීම් ආදී පිරියම් කරන්නෝද ස්ත්‍රීහුමය. රජතෙමේ එබඳු ඓශ්වර්ය සම්පත්විඳින කුමරුට පුරුෂයකු දැක සැක උපදී. එබන්දක් මාගේ පුත්‍රයාට නොවේවායි ස්ත්‍රීන්ම තැබීය. තාය රතියා රමමානො මෙය චතුර්ථ ධ්‍යාන වල සමාපත්තියෙහි ඇලීම සඳහා කියන ලදී. ගහපතිවා ගහපති පුත්තොවා මෙහි ක්ෂත්‍රියන්ට සේසත කෙරෙහිම ප්‍රාර්ථනාවක් ඇතිවා සේම ඔවුන්ට එයින් මහා ප්‍රපංචයක්ද වේ. බමුණෝ මන්ත්‍රයන්ගෙන් අතෘප්තිමත්ව මන්ත්‍රම සොයා ඇවිදිති ගෘහපතීහු මුද්‍ර ගණින මාත්‍රයක් උගත් කල්හි පටන් සම්පත්තියම අනුභව කරත්. ඒනිසා ක්ෂත්‍රිය බ්‍රාහ්මණයන් නොගෙන ගහපතිවා ගහපති පුත්තොවා යි කීය.

ආවටෙටයා මිනිස් කම්සැප සඳහා ආපසු පැමිණීමක් වන්නේය. අභික්කන්තතරා විශිෂ්ටතර, පණීතතරා වඩා සන්තර්පතරය. මෙය මෙසේ කියන ලදී.

කුසගෙග උදක මාදාය සමුදෙද උදකං මිනෙ
එවං මානුසකා කාමා - දිබ්බකාමාන සන්තිකෙ

කුසතණග දියගෙන - සමුදුරු දිය මනින්නේය
එලෙසය මිනිස් කම්සැප - දිවකම් සැපත් හමුවෙහි.

සමධිගගයහ තිට්ඨති දිවසැප ගෙන ඉන් විශිෂ්ටතරව සිටිය. මෙහි උපමා සන්සන්දනය මෙසේ දතයුතුය. ගෘහපතියාගේ පස්කම් ගුණෙන් යුතු වූ කලමෙන් බෝ සතුන්ට තුන් පහයෙහි ස්ත්‍රීන් සතළිස් දහසක් මැද තුටුවන කාලයවෙයි. ගෘහපතියා සුසිරිත් පුරා ස්වර්ගයෙහි උපන් කලමෙන් බෝසතුන්ට මහබිනික්මන් කොට බෝධිපර්යංකයෙහි සර්වඥතාඥනය අවබෝධ කළ කාලය වේ. ගෘහපතියා නඳුන් වනයෙහි සම්පත් අනුභව කරන කල් මෙන් තථාගතයන් වහන්සේට චතුර්ථධ්‍යානික ඵල සමාපත්ති රතියෙන් කල් ගෙවන කාලයවෙයි. ගෘහපතියා මිනිස් පස්කම් ගුණ ප්‍රාර්ථනා නොකරන කල්මෙන් චතුර්ථධ්‍යානික ඵල සමාපත්ති රතියෙන් කල්ගෙවන කාලයවෙයි. ගෘහපතියා මිනිස් පස්කම් ගුණ ප්‍රාර්ථනා නොකරන කල්මෙන් චතුර්ථධ්‍යානික වල සමාපත්ති රතියෙන් කල්ගෙවන තථාගතයන් වහන්සේට හීන ජන සුඛය ප්‍රාර්ථනා නොකරන කාලය වේ. සුඛී පළමුව දුක්පත්ව පසුව සුවපත්වුවහුට සෙරී පළමුව වෛද්‍යයාට දෙවැනියාව සිට පසුව වෙදෙක් වන්නේය. සයංවසී පළමුව වෙදාගේ යටතෙහි සිටිමින් වෙදා විසින් හිදවයි කියන ලද කල්හි හුන්නේය. වැදහෙවයි කියුකල්හි වැදහොත්තේ ය. කවයි කීකල්හි කෑවේය. බොවයි කීකල්හි බීවේය. පසුව ස්වයං වහී විය. යෙන කාමඞගමො පළමුව කැමති කැමති තැනට යාමට නොලැබීය. පසුව රෝගය සන්සුන් කල්හි ගංදසුන් ගිරිදසුන් පව්දසුන් ආදි තැන්වලට කැමති පරිදි යන්නෙක් විය. යම් යම් තැනකට යාමට කැමතිවේද ඒ ඒ තැනට යන්නේය. මෙහිද මේ උපමා සන්සන්දනය පුරුෂයකුගේ කුෂ්ටකාලය මෙන් බෝසතුන්ට ගිහිගෙයි වසන කාලය වෙයි. මේ කාම වස්තුව එක් අඟුරු කබලක්මෙනි. වස්තු දෙක කබල් දෙකක් මෙනි. සක්දෙව් රජුට අඟුරු කබල් කෝටි දෙකහමාරක් මෙන් නිළියෝ කෝටි දෙකහමාරකි. නියෙන් වණ මුඛය කඩා ගිනි කබලෙහි තවන්නාක් මෙනි, වස්තු පරිභෝජනය. බෙහෙත් ලැබ ලෙඩසුව වන කල් මෙනි. කාමයන්හි ආදීනව දැක නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංස දැක නික්ම බුදුවුකල් මෙනි. චතුර්ථධ්‍යානික ඵලසමාපත්ති රතියෙන් කල්ගෙවන කාලය මෙනි, වෙනත් කුෂ්ටරෝගී පුරුෂයකු දැක එය නොපනත කාලයමෙනි. ඒ රතියෙන් කල්ගෙවන්නහු හීනජන රතියෙන් නොපතන කල්මෙහි උපහතින්ද්‍රියො බොහෝකලක් කුෂ්ටයෙන් විනාශවූ කායප්‍රසාදය ඇත්තේ. උපහතින්ද්‍රිය විනාශවූ ප්‍රඥ ඉන්ද්‍රිය ඇති, යම්සේ ඒ විනාශවූ කාය ඉන්ද්‍රිය ඇති කුෂ්ට රෝගියා

දුක්ස්පර්ශ යෙහිද ගින්නෙහිද සැපයයි විපරීත හැඟීමක් ඔවුහු ඇතිකරගත්තේ එසේ ප්‍රඥා ඉන්ද්‍රිය විනාශවූ බැවින් දුක් ස්පර්ශයෙහි මෙන්ම කාමයන්හිද සැපයැයි විපරීත හැඟීමක් ඔවුහු ඇතිකරගත්හ. අසුචිතරානිචෙව ආදි තන්හි ප්‍රකෘතියෙන්ම ඒ අසුචි දුර්ගන්ධද කුණුවූද වෙයි. දූන් වඩා අපරිසිදුද වඩා දුර්ගන්ධද වෙයි කාචි ඒ තැවෙන්නාවූ හොරි ඇත්තහුගේ අභ්‍යන්තරයට පණුවෝ පිවිසෙත්. දූෂිත ලේ ද දූෂිත සැරවද ගලයි. ඔහුට කිසියම් ආස්වාද මාත්‍රයක් වෙයි. ආරොග්‍යා පරමා යන ගාථාවෙන් යම්කිසි ධන ලාභයක් හෝ යස ලාභයක් හෝ පුත්‍රලාභයක් වේද ආරෝග්‍යයට වඩා ඒවාට ප්‍රධාන වූවක් උතුම් වූවක් නැත. ඉන් උත්තරීතර ලාභයනුයි ලාභ ආරෝග්‍ය පරම නම්වේ. යම්කිසි ධ්‍යාන සුඛයක්හෝ මාර්ග සුඛයක් හෝ ඵලසුඛයක් හෝ ඇත්ද එහි නිර්වාණයට වඩා ප්‍රධාන දෙයක් නැත. ඊටවඩා උත්තරීතර සුඛයනුයි නිබ්බානං පරමං සුඛං වේ. අට්ඨඞ්ගිකොච මගගානං පූර්වභාග මාර්ගයන්ගේ පූර්වභාග ගමනින්ම අමෘතයකරා යන්නාවූ අෂ්ටාඞගයට වඩා ක්ෂේම ස්ථානයක් නැත. ඊටවඩා ක්ෂේමතර වූ වෙනත් මාර්ගයක් නැත. නැතහොත් ඛෙමං අමත ගාමිනං මෙහි ඛෙම යනුද, අමතයනුද නිර්වාණයටම නමකි. යම්තාක් ව්‍යාජ ගුරුවරුන්ගේ මාර්ගයෙහි ගිය බොහෝ මහණ බමුණෝ ක්ෂේම ගාමීහුයයිද අමෘතගාමීහුයයිද ලබ්ධි වශයෙන් ගත්තාහු ඒ සියලු ක්ෂේම අමෘත ගාමී මාර්ගයන්ට වඩා අෂ්ටාංගික මාර්ගය ප්‍රධානය උත්තමය යන්න මෙහි අර්ථයයි. ආචරිය පාචරියානං ආචාර්යයන්ගේද ආචාර්යන්ගේ ආචාර්ය වරන්ගේද සමෙති එක් නැළියකින් මැන්නාක්මෙන් එක් තරාදියකින් තිරුවාක් මෙන් සදාශ වෙයි. නොයෙක් කරුණින් ඇති ඵලය කිම. අනොමජ්ජති පහළට දමමින් උද්දාමයව පත්වෙයි. භවත් ගෞතමය මේ ආරෝග්‍යය, මේ නිර්වාණයයි කාලයකට හිස පිරිමදිමින්ද කලකට උදරය පිරිමදිමින්ද මෙසේකීය. ජෙකං ප්‍රසන්න සාහුළචීවරෙන කළු බැටළු ලොමින් කරන ලද ඝන සිවුරින් කසල ගොඩින් ගත් රෙදිකඩකැයිද කියත්. වාචං නිච්ඡාරෙය්‍ය කලකට දාවල්ලෙන්ද කලකට වාටියෙන්ද කලකට මැදින්ද පිරිමදිමින් කියන්නේය යන අර්ථයි. පුබ්බකෙහෙසා පූර්වකයන් විසින් මෙය. විපසසි භාග්‍යවතුන් වහන්සේද - පෙ - කස්සප භාග්‍යවතුන් වහන්සේ ද සිව්පිරිස් මැද වැඩහුන්සේක් මේ ගාථාව වදාළසේක. අත්ථනිස්සිත ගාථායයි මහජනයා උගත්තේය. ශාස්තෘන් වහන්සේ

පිරිනිවන් පෑකල්හි පසුකලෙක පරිබ්‍රාජකයන්ගේ අතරට පිවිසියාහු ඒ පොත්වල ලියා පදදෙකම රැකගන්ට හැකිවුහ. එයින් කීය. එය දූත් අනුපිළිවෙළින් පෘථක්ජනයා අතරට ගියේවෙයි. රොගොව භූතො රෝගීවූයේ. සෙසුපදයන්හිද මෙම ක්‍රමයයි. අරියංචක්ඛුං පරිශුද්ධ විදර්ශනා ඥානය හා මාර්ගඥානයද, පහොති සමර්ථ. හෙසජ්ජං කරෙය්‍ය උද්ධවිරේකය යටි විරේකය අඳුන් ආලේප පසු අඳුන් ආලේප ආදී බෙහෙත් කරන්නේය. නවක්ඛුනි උප්පාදෙය්‍ය යමකුගේ අතරතුර පිත් සෙම් ආදි පලිබෝධයෙන් චක්ෂුප්‍රසාදය විනාශවූයේ වේද හේ දක්ෂ වෙදකු වෙත පැමිණ සත්ප්‍රාය වූ බෙහෙත් වළඳන්නේ ඇස් උපදවා ගනී නම්. ජාත්‍යන්ධයාගේ ඇස් මවිකුසදීම නැසීගොස්ය. ඒනිසා හේ නොලබයි. ඇස් නූපදවන්නේයයි ඒනිසා කියන ලදී. දෙවැනිවර ජච්චන්ධො උපන් කල්හි පටන් පිත් ආදී පලිබෝධයෙන් අන්ධවූයේ, අමුසම්ං පෙරකියූ දෙයෙහි. අමිත්තතො දහෙය්‍ය මේ මාගේ සතුරායයි මෙසේ සතුරා සේ තබන්නේය. දෙවැනි පදයෙහිද මේ ක්‍රමය මැයි. ඉමිනා චිතෙතන සංසාරයෙහි අනුවගිය සිතින්, තස්ස මෙ උපාදානපච්චයා එක් සන්ධියක් ඇති සංක්ෂේප දෙකක් ඇති ප්‍රත්‍යයාකාරය කියන ලද්දේ සංසාරය විස්තර කරන ලද්දේය. ධම්මානුධම්මං ධර්මයට අනුවගිය ධර්මය, සුදුසු ප්‍රතිපදාව ඉමෙ රොගා ගණ්ඩා සලලා පංචස්කන්ධ දක්වයි. උපාදාන විරෝධයැයි නිර්වාණය දක්වන්නේ කීය. සෙස්ස සියලු තැන නොගැඹුරු මය.

## පස්වැනි මාගන්දිය සූත්‍රයයි.

## 2.3.6

එවමෙමසුතං යනු සඳක සූත්‍රයයි. එහි පිලක්ඛගුහායං එහි ගුහා ද්වාරයෙහි ඇසතුගසක් වූ බැවින් පිලක්ඛගුහා යයි ප්‍රසිද්ධියට පත්. පටිසලලාණා වුට්ඨිතො විවේකයෙන් නැගී. දෙවකට සොබ්භා වර්ෂා ජලයෙන් බිඳුණු තැන මහා ජල තටාගය ගුහාදස්සනාය එහි ගුහා යනු පසින් සැඳුණු ගුහාව. එය සානුවෙහි ජලය නැගුණු තැන විය. එක්පසෙක උමගක් කොට කණු ද පස්ද ඉවත්කොට ඇතුළත කණු නංවා මතුයෙහි ලෑලිවලින්

වසා ගෘහයක් වශයෙන් කරන ලද එහි ඒ පරිබ්‍රාජකයෝ වාසයකරත්. එය වැසිකල්හි ජලය පිරී පවතී. නියං කල්හි එහි වාසය කරත්. ඒ සඳහා ගුහා දසසනාය යයි කීය.. විහාර දර්ශනය සඳහා අක්මුල්නැති බව සලකා මුහුද පර්වත දකිනු පිණිසද යන්ට වටනේය. උනනාදිනියා මහ හඬනගන, මෙසේ හඬ නගමින් උඩට යාම් වශයෙන් උස්ව දිසාවන්හි පැතිරීයාම් වශයෙන් මහා ශබ්දයයිද උච්චාසද්දමහා සද්දා ඒ උස්හඬ මහහඬ ඇති, ඒ පිරිවැජියන්ට උදෑසනින් නැගී කළ චෛත්‍යවත් බෝධිවත් හෝ ආචාර්ය උපාධ්‍යාය වත් හෝ යෝනිසෝ මනසිකාරයක් හෝ නැත. ඔවුහු උදෑසනින් නැගී මඳ අව්වෙහි හිඳ සවස්කල කථාවට පහසුව පිණිස රැස්වූවාහු මොහුගේ අත ලස්සනය. මොහුගේ පාදය ලස්සනයැයි මෙසේ ඔවුනොවුන්ගේ අත්පා හෝ අරබයා ස්ත්‍රීපුරුෂ දරුදැරි ආදීන්ගේ ගුණ හෝ කාමාස්වාද භවාස්වාද කරුණක් අරබයා කතාවක් ඇතිකොට පිළිවෙළින් රාජකථා ආදී අනේකවිධ තිරිසන් කතා කරන්නාහුය. එයද අනෛර්යානික බැවින් සගමොක් මගට හරස්වූ කථා තිරච්ඡාන කථානම් එහි රජුන් අරබයා මහාසම්මත මන්ධාතු ධර්මාශෝක මේ අයුරින් මහානුභාව ඇත්තෙකැයි ආදී ක්‍රමයෙන් පැවති කථාව රාජකථාව නම් චෝර කථා ආදියෙහිද මෙම ක්‍රමයයි. ඔවුන්ගේ අසුවල් රජ රූපවත්ය. දර්ශනීයය. ආදී ක්‍රමයෙන් ගේහසිත කතාව ද තිරච්ඡාන කථානම් ඔහු ද මෙසේ මහානුභාව ඇතිව සිට ක්ෂයවී ගියා නේදැයි මෙසේ පැවති කථා කර්මස්ථාන භාවයෙහි පවතී. සොරුන් අතර මූලදේව මහානුභාව සම්පන්නය. මේඝමාල ද ඒ අයුරින්ම මහානුභාව සම්පන්නයැයි ඔවුන් කර්මය නිසා අනේ සූරයෝය යන ගේහසිත කථාව තිරච්ඡාන කථානම් යුද්ධයෙහි භාරත යුද්ධ ආදීන්හි අසුවලා විසින් අසුවලා මරනු ලැබුවේ මෙසේය. විදිනු ලැබුයේ මෙසේයැයි කාමාස්වාද වශයෙන් තිරච්ඡාන කතාවේ. ඔවුහුත් ක්ෂයවී ගියා නේදැයි මෙසේ පැවති සියලුතැන කථා කර්මස්ථානයම වෙයි. ආහාර ආදියෙහි මෙසේ වර්ණවත් සුවඳවත් රසවත් ස්පර්ශ සම්පන්න ආහාර කෑවෙමු බිව්වෙමු. පරිභෝග කෙළෙමුයි කාමාස්වාද වශයෙන් කියන්ට නොවටී. අර්ථසහිත කොට පෙර මෙසේ වර්ණ ආදියෙන්යුත් ආහාර පාන වස්ත්‍ර සයන. මල් සුවඳ සිල්වතුන්ට න්නෙමු. චෛත්‍යයන්හි පිදුවෙමුයි කියන්ට වටී. ඥාති කතා ආදියෙහිද අපගේ නෑයෝ සූරයෝය සමර්ථයෝය, නැතහොත් මෙබඳු රියවලින් හැසිරුණෙමුයි ආස්වාද වශයෙන් කියන්ට නොවටී. අර්ථ සහිත කොට ඒ

අපේ නෑයෝත් නැතිවී ගියා නේදැයි හෝ පෙර අපි මෙවන් පාවහන් සංඝයාට දුන්නෙමුයි හෝ කිවයුතුයි. මනාව පිහිටියේය. නොපිහිටියේය. සුභික්ෂ දුර්භික්ෂ ආදී වශයෙන් හෝ අසුවල් ගම වැසියෝ සූරයෝය සමර්ථයෝයැයි මෙසේ ආස්වාද වශයෙන් නොවටී. අර්ථසහිත කොට ශ්‍රද්ධා ඇත්තෝය ප්‍රසන්නයැයි හෝ ක්ෂයවී ව්‍යයවී ගිය නේදැයි කියන්නට වටී. නියම්ගම් නගර ජනපද කථාවන්හිද මෙම ක්‍රමය මැයි ස්ත්‍රිකථාද වර්ණ සංස්ථාන ආදීය අරබයා ආස්වාද වශයෙන් නොවටී. ශ්‍රද්ධාවත්ය. ප්‍රසන්නය ව්‍යයව ගියානේදයන මේ අයුරින්වටී. සූරකථාද නන්දිමිත්‍ර යෝධයා නම් සූරයෙක්යැයි ආස්වාද වශයෙන් නොවටී, ශ්‍රද්ධාවත්ය ප්‍රසන්නය ක්ෂයවී ගියානේදයන මේ අයුරින් වටී. වීදි කථාද අපිරිසිදු වීදිය හොඳට සැදූ විදිය, හොඳට නොසැදූ වීදිය, සූරය සමර්ථයැයි ආස්වාද වශයෙන්ම නොවටී. භ්‍රද්ධාවත්ය ප්‍රසන්නය ක්ෂයවී ගියානේද යනුවෙන් වටී. **කුමහට්ඨානකථා** ළිදළඟ කථා යයි කියනු ලැබේ. කුම්භදාසී කථා හෝ ඈ පැහැපත්ය නටන්ට ගයන්ට දක්ෂයැයි ආස්වාද වශයෙන් නොවටී. ශ්‍රද්ධා වත්ය ප්‍රසන්නය ආදී ක්‍රමයෙන්ම වටී. **පුබ්බපෙතකථා** අතීත ඥාතීන්ගේ කතා එහි වර්තමාන ඥාතිකතා විනිශ්චයද සමානය **නානත්තකතා** පූර්ව පශ්චිම කථාවන්ගෙන් තොර වූ අවශේෂ නෙයෙක් ආකාරයේ නිරර්ථක කථා **ලොකක්ඛායිකා** මේ ලෝකය කුමකින් නිර්මිත වුයේද, අසුවල්දෙයින් නිර්මිත වුයේය. කපුටෝ සුදුය. ඇට සුදු බැවිනි. කොක්කු රතුය. ලේ රතු බැවිනියි මේ ආදි ලෝකායත විතණ්ඩ සල්ලාප කථාය. **සමුද්දක්ඛායිකා** සමුද්‍රය යනු කුමක්නිසාද, සගරදෙවියාවිසින් හාරන ලද බැවිනි. මා විසින් සාගරය හාරන ලද්දේයයි හස්ත මුද්‍රාවෙන් දන්වන ලද බැවින් සමුද්‍රය නම්වීයැයි මේ ආදී නිරර්ථක සමුද්දකබායී කථා **ඉතිභවො ඉති අභවො** කුමක් හෝ නිරර්ථක කතාවක් කොට පැවති කථා මෙසේ භව අභවකථා මෙහි භව යනු ශාස්වතයයි. අභව උච්ඡේදයයි. භවයනු වෘද්ධියයි. අභව හානියයි. භවයනු කාමසුඛයයි. අභව අත්තකිලමථයයි. මෙසේ මේ සවැදෑරුම් භවාභව කථාව සමග තිරිසන් කතා දෙතිසකි. තිරිසන් කථාව මෙබඳුය. මෙබඳු තිරිසන් කථා කියන්නියක සමග හුන්නේ වෙයි. ඉන්පසු සන්දක පරිබ්‍රාජකයා ඒ පරිබ්‍රාජකයන් දෙස බලා මේ පරිබ්‍රාජකයෝ නම් අතිශයින් එකිනෙකාට ගෞරවයක් නැත්තෝය. නොදමුණෝය. අපි ශ්‍රමණ ගෞතමයන් පහළ වූ තැන්පටන් සූර්යෝදයෙහි කදෝපැණියන් හා සමාන වුම්හ. අපගේ ලාභසත්කාරද

පිරිහිණ. යම් හෙයකින් මෙතැනට ශ්‍රමණ ගෞතමයන් හෝ ගෞතම ශ්‍රාවකයකු හෝ ඔහුගේ ගිහි උපස්ථායකයකු හෝ පැමිණියේනම් අතිශයින් ලජ්ජා සහගතවන්නේය. පිරිස් නිසා ඇතිවන දෝෂය පිරිස් දෙටුවාගේ මත පැටවෙන්නේයයි ඔබ්නොබ බලන්නේ තෙරුන් දුටුවේය. එහෙයින් කියන ලදී. **අද්දසාඛො සන්දකො පරිබ්බාජකො - පෙ - තුණ්හී අහෙසුන්ති** **තස්ස** **සණ්ඨපෙසි** හික්මවීය. ඔහුගේ වරදසැගවිය. යම්සේ මැනවින් තබන ලද්දේවේද එසේ ඔහු තැබීය. යම්සේ පිරිස් මැදට පිවිසෙන පුරුෂයා වරද වසාගැනීම පිණිස පහත් අසුනක් තබාගනීද, පොරෝනය සදා ගනීද දූලි වැකුණු තැන් පිසදමයිද එසේ ඔහුගේ වරද වසාගැනීම පිණිස පින්වත්නි අල්ප ශබ්ද වන්නැයි හික්මවන්නේද, යම්සේ හොඳින් පිහිටුවාද එසේ ඔහු තැබීය යන අර්ථය **අප්පසද්දකාමා** අල්පශබ්ද කැමති වෙති. තනිතනිව හිඳිති තනිතනිව සිටිති පිරිස් අතර නො යැපෙති. **අප්පසද්දවිනිතා** අල්පශබ්ද ඇති නිහඬ බුදුන් විසින් හික්මවන ලද අප්ප සද්දස්ස වණ්ණ වාදිනො යම් තැනක් අල්ප ශබ්ද ඇත්තේද නිශ්ශබ්දද එහි ගුණකියන. **උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යාය** මෙහි ආයුතුයයි සිතන්නේය. මොහු තෙරුන්ගේ පැමිණීම ප්‍රශංසා කරන්නේ කුමක් නිසාද? තමාගේ දියුණුව පතමිනි. පරිබ්‍රාජකයෝ බුදුවරුන්හෝ බුද්ධ ශ්‍රාවකයන් හෝ තමා සමීපයට පැමිණි කල්හි අපේ ළගට ශ්‍රමණ ගෞතමයෝ පැමිණියෝය. සාරිපුත්‍ර ආවේය. ඒ ඇත්තෝ එක් එක් අය ළගට නොයති අපගේ උතුම්බව බලවුයැයි තම උපස්ථායකයන් සමීපයෙහි තමා ඔසවා තබා ගනිති. උස් තැනක තබති. භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයන්ද අල්ලාගන්ට වෑයම් කරති. භාග්‍යවතුන්ගේ උපස්ථායකයන් දැක මෙසේ කියති. ඔබලාගේ ශාස්තෘ භවත් ගෞතමයෝද ගෞතම ශ්‍රාවකයෝද අපගේ සමීපයට එත්. අපි ඔවුනොවුන් සමගිව සිටිමු. උඹලා අප ඇසින් දකින්ට නොකැමැතිය. ප්‍රියමනාප කථා නොකරති. අපෙන් ඔබලාට අපරාධයක් සිදුවුණාද ඉක්බිති සමහර මිනිස්සු බුදුවරුද මොවුන් සමීපයට යති. ඇයි අපේ ළඟට යැයි එතැන් පටන් ඔවුන් දැක ප්‍රමාද නොවෙති. **තුණ්හි** අහෙසුං සන්දක පිරිවරා නිහඬව හුන්හ. **සවාගතං භොතො ආනන්දස්ස** ආනන්ද වෙත භවතුන්ගේ සුභ ආගමනයක් වේවා. ඔබ ආකල්හි පින්වතුන් කෙරෙහි සතුටක්වෙයි. ගියවිට ශෝකයක් වෙතියි දක්වයි. **චිරස්සං** බො මෙය ප්‍රිය ආචාරවචනයකි. තෙරුන් වහන්සේ කලින්කල පරිබ්‍රාජකාරාමයට චාරිකාව සඳහා යතියි පෙරගමන ගෙන

මෙසේ කීය. මෙසේකියා මානයෙන් දරදඬුවී හිඳගත්තේය. තමාගේ අසුනින් නැගිට ඒ අසුන ගසාදමා තෙරුන්ට ආසනයට පැමිණෙන ලෙස ආරාධනා කරන්නේ **නිසීදතු භවං ආනන්දො ඉදමාසනං පඤ්ඤත්තං** යි කිය. **අන්තරා කථාවිප්පකතා** හුන්නාවූ ඔබ ආරම්භයෙහි පටන් මා එනතෙක් මේ අතරෙහි කවරනම් කථාවක් අඩාලවීද. මාගේ පැමිණීම නිසා කවරකථාවක් අවසන් නොවිණිදැයි අසයි. ඉක්බිති පරිබ්‍රාජකයෝ මෙය නිරර්ථක කථාවකි. සංසාරය ආශ්‍රිතය. ඔබ වහන්සේ ඉදිරියෙහි කීම නුසුදුසුයයි දක්වන්නාහු **තිට්ඨතෙසා හොති** ආදිය කීය. **නෙසා හොතො** ඉදින් භවත්හු අසනු කැමැත්තහුනම් පසුව වුවත් මෙය දුලබ නොවේ. අපට මෙයින් ප්‍රයෝජනයක් නැත. පින්වතුන්ගේ පැමිණීමක් ලැබ වෙනත් යහපත් කරුණක් අසනුකැමැත්තෙමුයි දක්වයි. ඉන්පසු ධර්ම දේශනාවක් ඉල්ලා සිටිමින් **සාධුවත භවන්තං යෙව** ආදිය කීය. එහි **ආචරියකෙ** ආචාර්ය වාදයෙහි **අනස්සාසිකානි** ආශ්වාස විරහිත. **සක්කං** ඒකාන්ත අර්ථයෙහි නිපාතයකි. නුවණැති පුරුෂයා ඒකාන්තයෙන් නොවසන්නේය යන අර්ථයි නුවණැත්තා වාසය කළත් සතුටු නොකරයි, සම්පාදනය නො කරයි නොපිළිපදීයයි කියන ලදී. **ඤායං ධම්මං කුසලං** ආරෝග්‍ය නිවැරදිය යන අර්ථයෙන් කුසල් දහමක් වේ. **ඉධ** මේ ලෝකයෙහි **නත්ථිදින්නං** ආදිය සාලෙය්‍යක සූත්‍රයෙහි කියන ලදී. **චාතුම්මහාභූතිකො** සතර මහාභූතමය **පඨවි පඨවිකාය** ආධ්‍යාත්මික පෘථුවිය බාහිර පෘථුවි ධාතුව **අනුපෙති** අනුවයයි. **අනුපගච්ඡති** එයටම වෙනත් වචනයකි. අනුවයයි යන අර්ථය දෙකින්ම එළඹෙයි ළඟට යතියි දක්වයි. **ආප** ආදී තැන්වලද මෙම ක්‍රමයයි. **ඉන්ද්‍රියානි** මනස සයවැනි කොට ඇති ඉන්ද්‍රිය **සඞ්කමන්ති** අහසට පනිත්. **ආසන්දි පඤ්චමානි** වැදහොත් ඇඳෙන් පස්වැන්න ඇඳ ද ඇඳ කකුල් සතර ගෙන සිටි මිනිසුන් සතර දෙනාද යන අර්ථයි. **යාව ආළාහනා** සොහොන තෙක්, **පදානි** මේතෙමේ මෙසේ සිල්වතෙක් විය. මෙසේ දුස්සීලයෙක් විය ආදී ක්‍රමයෙන් පැමිණි ගුණපද ශරීරයම හෝ පාද මෙණි අභිප්‍රේතයි. **කාපොතකානි** පරෙවියන්ගේ වර්ණ ඇති පරෙවියන්ගේ පියාපත්වල වර්ණය ඇතියි යන අර්ථයි. **භස්සන්තා** අළුකරන්නාහු මෙයම පෙළයි. **ආහුතියො** රසකැවිලි හකුරු ආදී ප්‍රභේද ඇති දුන්දානය සියල්ල ගේ අන්තය අළුවලින් අවසන්වෙයි ඉන්පසු ප්‍රතිඵලදායක වී නොයයි යන අර්ථයි. **දත්තුපඤ්ඤත්තං** මෝඩ මිනිසුන් විසින් පනවන ලද මෙය මෙසේ

කියන ලදී. මෝඩ දුර්බුද්ධීන් විසින් මේදානය පනවනලදී පණ්ඩිතයන් විසින් නොවේ. මෝඩයෝ දෙති පණ්ඩිතයෝ පිළිගනිති යන අර්ථයි. **අත්ථිකවාදං** දුත් නුදුන් දෙයෙහි ඵල ඇත. මෙය අත්ථික වාදයයි කියත්. ඔවුන්ගේ වචනයකි ව්‍යාජ විලාපයකි. **බාලෙච පණ්ඩිතෙච** බාලයෝද පණ්ඩිතයෝද. **අකතෙන මෙ එත්ථ කථං** මාගේ නොකරන ලද මහණදමින් මෙහි මොහුගේ සමයෙහි කර්මයක් කරන ලද්දේ නම්වෙයි. **අවුසිතෙනෙව බ්‍රහමචරියෙන වුසිතං නාම** වෙයි. එත්ථ මේ මහණදහමෙහි. **සමසමා** අතිශයින් සම සමගුණයෙන් සම **සමඤ්ඤං පත්තා** සමාන බවට පත් කරොති ආදිය අපණ්ණක සූත්‍රයෙහි කියන ලදී. එසේ නත්ථි හෙතු යැ ආදිය **චතුත්ථ බ්‍රහමචරියවාසෙ අකටා** යනු නොකළ **අකටවිධා** යනු නොකළ විධාන එවං කරොහි කිසිවකු විසින් කරවන ලද නොවේ යන අර්ථයි. **අනිම්මිතා** ඍද්ධියෙන්ද නිර්මාණය නොකරන ලද **අනිම්මාතා** නිර්මාණය නොකරවන ලද, ඇතැමෙක් අනිම්මිතබ්බා යන පදයක් කියති. එය පාළියෙහි නොව අටය්කථාවෙහි දක්නට ලැබේ. **වඤ්ඣා** වඳ වඳ ඵලදෙන, තල් ආදීන් මෙන් ඵලනැති කිසිවකුටත් ජනනය නොකරන්නෝ යන අර්ථයි. මෙයින් පෘථුවි කාය ආදීන්ගේ රූප උපදවන බව ප්‍රතික්ෂේප කරයි. **පබ්බත කූටාවිය ඨිතා** මුදුනෙහි සිටි කණු **බීජට්ඨිතා**. උණ දඬුවක් මෙන් සිටි එහි අදහසනම් යමක් උපදීයයි කියනු ලැබේද එය උණ ලීයෙන් සෑදූ කණුවක් මෙන් පෙනෙමින් නික්මෙයි එසිකට්ඨා යිට්ඨිතා යනුවෙන්ද පාඨයක් වෙයි. මැනවින් සිටවූ උණ කණුවක් නිශ්චලව සිටීද එසේ සිටි යන අර්ථයි. දෙකින්ම ඔවුන්ගේ විනාශභාවය දක්වයි. **නඉඤ්ජන්ති** උණකණුවක් මෙන් සිටි බැවින් නොසැලෙත්. **නවිපරිනාමන්ති** ප්‍රකෘතිය අත් නොහරී. **න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති** ඔවුනොවුන් අවහිර නොකරත් **නාලං** නොසමත් පෘථුවිකාය ආදී තන්හි පෘථුවියට පෘථුවිකාය හෝ පෘථුවි සමූහය **තත්‍ථ** ඒ සප්තකායයන්හි, **නත්ථි හන්තාවා** මරන්ට හෝ ඝාතනය කිරීමට අසන්ට හෝ අසවන්ට දනගන්ට හෝ දනගන්වන්ට සමර්ථයෙක් නම් නැතියි දක්වයි. **සත්තන්නං යෙව කායානං** යම්සේ මුගුරු අසිපත් ආදීන්හි පහරදුන් ආයුධය මුගුරු අතරින් පිවිසේද එසේ සප්ත කායයන් අතරින් සිදුරින් විවරයෙන් යම්තැනක පිවිසේද, එහි මම මේ ජීවිතය නැති කරගන්මියි හුදෙක් ප්‍රකාශන මාත්‍රයක් පමණක් වෙතියි පෙන්වයි. **යොනි පමුඛ සත සහස්සානි** ප්‍රමුඛයෝනීන්ගේ උත්තම යෝනීන්ගේ දහහතර

ලක්‍ෂයක් තවත් හයසියයක්ද. තවත් හයසිය හැටක් හා කරන්නවුන් පන්සියයක්ද කර්ම පන්සියයක් දැයි හුදු තර්ක මාත්‍රයෙන් නිරර්ථක දෘෂ්ටිය දක්වයි. **පඤ්චච කම්මානි තීනිච කම්මානි** ආදීතන්හිද මෙම ක්‍රමය මැයි. කර්ම පසක්, ඉන්ද්‍රියපසක් වශයෙන්ම කාය කර්ම තුනක් වශයෙන්ද ගණන් ගනිතැයි ඇතැම්හු කීහ. **කම්මෙ ච අඩ්ඪකම්මෙච** මෙහිදී ඔහුට කායකර්මයද වචීකර්මයද කර්මය යන ලබ්ධියවේ. මනෝකර්මය අර්ධකර්මයකි. **දිවයී පටිපදා** දෙසැටක් පිළිවෙත් යයි කියයි. **ද්වට්ඨන්තරකප්පා** එක් කල්පයක අන්තර්කල්ප හැට හතරක් වෙයි. අනික් දෙක නොදන්නේ මෙසේ කීය. අභිජාතිහය අපණ්ණක සූත්‍රයෙහි විස්තර කරන ලදී. **අට්ඨ පුරිසභූමියො** මන්‍දභූමි - ඛිඩ්ඩභූමි - වීමංසභූමි - උජුගතභූමි - සෙඛභූමි- සමණභූමි - ජිනභූමි - පන්‍න භූමියැයි මේ අටපුරුෂභූමියයි කියයි. එහි උපන්දිනයෙහි පටන් දිනසතක් බාධක ඇති තැනින් නික්මුණු සත්වයෝ මැද වෙති. මෝඩයෝ මෙය මන්‍දභූමි යයි කියති. යමෙක් දුගතියෙන් ආවාහුද ඔවුහු නිතර හඬති. එසේම මහහඬින් හඬති. සුගතියෙන් ආවාහු එය සිහිකොට සිනාසෙති. මෙය ඛිඩ්ඩභූමි නම් මව්පියන්ගේ අත හෝ පය හෝ ඇඳ හෝ පුටුවහෝ අල්ලාගෙන බිම පා තැබීම වීමංසන භූමි නම්, පයින් යාමට සමර්ථකාලය උජුගතභූමිනම් ශිල්ප හදාරන කාලය සෙඛභූමිනම්, ගිහිගෙන් නික්ම පැවිදිවන කාලය සමණභූමි නම්. ගුරුන් ඇසුරු කොට දැනගන්නා කාලය ජිනභූමි නම්, භික්ෂුව නිශ්ශබ්ද වූයේ පීනතෙමේ නිසිවක් නොකීහයි මෙසේ නොබන ශ්‍රමණයා පන්‍නභූමියයි කියයි. **එකූන පඤ්ඤාස ආජීව සතෙහි** එකක් අඩු පන්සියයක් වූ ජීවිකා වෘත්ති **පරිබ්බාජක සතෙ** සියයක්වූ පරිබ්‍රාජක පැවිද්ද. **නාගාවාස සතෙ** නාමඬුලු සියයක් **වීසෙ ඉන්‍ද්‍රිය සතෙ** දෙදහසක්වූ ඉන්ද්‍රිය **තිංසෙ නිරය සතෙ** තුන්දහසක්වූ නිරය. **රජොධාතුයො** දූලි වැකුණු තැන්. අන්පුටුපාපුටු ආදිය සඳහා කියයි. **සත්‍ත සඤ්ඤිගබ්භා** ඔටුවන් ගෝණුන් කොටළුවන් එළුවන් ගවයන් මුවන් මීහරකුන් සඳහා කියයි. **අසඤ්ඤිගබ්භා** සහල් යව තිරිඟු මුං බජිරි බෝංචි කුරහන් සඳහා කියයි. **නිගණ්ඨිත** ගබ්භා ගැටනැතිතන්හි උපන් ගැබ් ඇති උක් උණ බට ආදිය සඳහා කියයි. **සත්‍තදෙවා** බොහෝ දෙවියෝ. හේ සත්වයයි කියයි. අනන්තවූ සත්වයෝ. හේ සත්ව යැයි කියයි. **සරා** මහවිල්, කණ්ණමුණ්ඩක, රථකාර, අනොතත්ත, සීහපපාතක, තියගගල මුචලින්ද කුණාල විල් ගැන කියයි. පවුටා ගැට ඇත්තෝ, **පපාතා** මහාප්‍රපාත, **පපාතසතානි** කුඩා ප්‍රපාත

සියගණන්, **සුපිනා** මහාස්වප්න **සුපින සතානි** කුඩා ස්වප්න සිය ගණනක්, **මහාකප්පුනො** මහා කල්පයන්ගේ. එහි එක් විලකින් වර්ෂ සියයෙන් සියය කුසතණගින් එක් දියබිඳුවක් බැගින් ඉවත් කරකර සත්වරක් ඒ විල නිරුදක කළ කල්හි එක් මහා කල්පයෙකැයි කියයි. එබඳු මහාකල්ප අසුහතර ලක්ෂයක් ගෙවා බාලයාද පණ්ඩිතයාද දුක් අවසන් කරති යන්න මොහුගේ ලබ්ධියයි. පණ්ඩිතයා වුවද අතර පිරිසිදු කිරීමට නොහැකිවේ. බාලයා ද ඊට ඉහළට නොයයි. **සීලෙන** වස්ත්‍රනැති ශීලයෙන් හෝ අන් කිසිවකින්, **වතෙන** එබඳුම ව්‍රතයකින්, **තපෙන** තපස් කර්මයෙන් **අපරිපක්කං පරිපාචෙති** යමෙක් මම පණ්ඩිතයෙමියි කාය ඇතුළතින් පිරිසුදු වෙයි. පැසුණු බව අතගගා ඉවත් කරයි. යමෙක් මම බාලයෙකැයි කියුපමණ කාලයක් ඉක්මවා යයි. **හෙවං නත්ථි** මෙසේ නාස්තිත්වය දෙදෙනාටම කළ නොහැකියැයි දක්වයි. **දෝණමිතෙ** ලාහෙන් මැන්නාක් වැනි **සුඛ දුක්ඛෙ** සැප දුක, **පරියන්ත කටෙ** කියු පමණ කලකින් අවසන්කළ, **නත්ථිහාපන වඩ්ඪනෙ** පරිහානියක් වර්ධනයක් නැත. සංසාරය පණ්ඩිතයාට ගෙවෙන්නේ නැත. බාලයාට වැඩෙන්නේද නැත යන අර්ථයි. **ඔක්කංසාවකංසං** ගෙවීයාමක් හෝ වැඩීමක් හාපන වඩ්ඪන යන්නට වෙනත් වචනයකි. දැන් ඒ අර්ථය උපමාවකින් සාධනය කරන්නේ **සෙය්‍යථාපි** නාම ආදිය කීය. එහි **සුත්තගුලෙ** වෙළා කළ නූල් ගුලිය **නිබ්බෙඨිය මානමෙව එලෙති** පර්වතයක හෝ ගස් මුදුනක සිට විසිකළාකල්හි නූලෙහි ප්‍රමාණයට ලිහෙමින්ම යයි නූල අවසන්වූ විට එහිම සිටී. නොයයි. මෙසේ කියුකාලයෙන් උඩට නොයතියි දක්වයි. **කිමිදං** කුමක්ද මේ ඔබගේ අනුවණකම, ඔබ සර්වඥයෙක්දැයි මෙසේ ඇසුකල්හි නියතිවාදයෙහි බහමින් මාගේ ගෙය ශූන්‍යයැයි ආදිය කීය. **අනුස්සවිකො** හොති ඕපදූප කියන්නේ වෙයි. **අනුස්සව සච්චො** ඇසීම සත්‍යවශයෙන් ගෙන සිටියේ. **පිටක සම්පදාය** වර්ග පනසකින් යුත් පිටක බන්ධ සම්පත්තියෙන් **මන්දො** මඳනුවණ ඇත්තේ මොමුහො අතිශයින් මුළාවූයේ, **වාචා වික්ඛෙපං ආපජ්ජති** වචනයෙන් වික්ෂේපයට පැමිණේ. අමරා වික්ෂේපය කෙබඳුද, අපරියන්ත වික්ෂේපය කෙබඳුද යන අර්ථයි. නැතහොත් අමරා යනු මාළු වර්ගයකි ඒ මත්ස්‍යයා ගිලෙමින් මතුවෙමින් ආදි වශයෙන් ජලයෙහි දුවන බැවින් අල්ලාගත්ට නොහැකිය. මෙසේම මේ වාදය එහේ මෙහේ දුවයි. ග්‍රහණයට නොපැමිණේහුයි අමරාවික්ඛෙප යයි කියනු ලැබේ. ඒ අමරාවික්ෂේපය.

එවම්පි මෙ ආදීතන්හි මේ කුසලක් දැයි ඇසුවහොත් මෙහෙමත් මට නැතැයි කියයි. එසේනම් අකුසලය කුමක්දැයි ඇසුවොත් ඒ අයුරින්ම මට නැතැයි කියයි. මේ දෙකින් වෙනස් දෙයක්දැයි කීකල්හි වෙනත් විදියකින් ද මට නැතැයි කියයි. ඉන්පසු එබන්දකින්ද නොවේ නම් එය ලබ්ධියක් යයි කිකල්හි නැත. මට නැතැයි කියයි. ඉන්පසු ඔබට නැත්නම් එය ලබ්ධියක් නොවේදැ, යි කීකල්හි නැත නැත මට නැත. මෙසේ වික්ෂේපයට පැමිණේ. එක් පක්ෂයකවත් නොසිටී. **නිබ්බිජ්ජපකකමති** මේ ශාස්තෘවරයා අවශ්‍යවූවකු වන්නට නොහැකිය. මට හැකිවන්නේ කෙසේදැයි කලකිරී පහවයයි. පෙර අනස්සාසික යන්හි මෙම ක්‍රමය මැයි. **සනනිධිකාරකංකාමෙ පරිභුඤ්ජිතුං** පෙර මෙන් ගිහිව එක්රැස්කොට පරිභෝජනය කරයි. මෙසේ තල සහල් ගිතෙල් වෙඬරු ආදිය එක් රැස්කොට දැන් පරිභෝජනය කරන්ට අභව්‍යවෙයි යන අර්ථයි. ක්ෂීණාශ්‍රවයකු වසන තැන තල සහල් ආදිය පෙනෙන්නේ නොවේද ඒ ක්ෂීණාශ්‍රවයා ඒවා තමාගේ ප්‍රයෝජනය පිණිස නොතබයි. **අනාගමිසස කථං** ඔහුගේද පඤ්චකාම ගුණයෝ සර්වාකාරයෙන් ප්‍රහීණය. දැහැමෙන් සෙමෙන් ලද දෙය විචාරා පරිභෝජනය කරයි. **පුතතමතාය පුතතා** හේ මේ ධර්මය අසා ආජීවකයෝ මළාහුය යන හැඟීමෙන් යුතුව මෙසේකීය. මේ මෙහි අර්ථයයි. ආජීවකයෝ මළාහු නම් වෙති ඔවුන්ගේ මව මළපුත්‍රයන් ඇත්තී වෙයි. මෙසේ ආජීවකයෝ පුත්‍රයන් මළ තැනැත්තියගේ පුත්‍රයෝ නම් වෙති. **සමණෙ ගොතමෙ** ශ්‍රමණ ගෞතමයන් වෙත බ්‍රහ්මචරිය වාසය ඇත. වෙනත් තැනක නැතැයි දක්වයි. සෙස්ස සියලුතැන නොගැඹුරුමය.

## සවැනි සන්‍දක සූත්‍රයයි

## 2.3.7

**එවමෙමසුතං** යනු මහා සකුලුදායී සූත්‍රයයි. **මොරනිවාපෙ** එතැන මොනරුන්ට අභයස්ථානයයි ප්‍රසිද්ධකොට බොජුන් තැබවූහ. ඒනිසා ඒ ස්ථානය මොරනිවාපයැයි ප්‍රසිද්ධියට ගියේය. **අනනභාරො** ඒ මේ පිරිවැජියාගේ නමයි. **තථාවරධරො අඤ්ඤද** යනු හුදෙක් මේ තිදෙන පමණක් නොවෙති. අන්‍යවූ ප්‍රසිද්ධියටපත් බොහෝ පිරිවැජියෝ

අප්පසද්දස්ස වණ්ණවාදී මෙහි අල්ප ශබ්ද විනීතයැයි නොකියාම මෙය කියන ලදී. කුමක් හෙයින්ද? භාග්‍යවතුන් වහන්සේ අනිකකු විසින් විනීත නොකරන ලද සේක පුරිමානි ඊයේ දවස සඳහා පුරිමානි නම් වේ. ඉන් පසු පුරිමතර නම් වේ. කුතුහලසාලායං කුතුහලසාලා යනුවෙන් එක්ශාලාවක් නැත. යම් තැනක අන්‍ය තීර්ථකයෝ මහණ බමුණෝ නානාවිධ කථා පවත්වත්ද එය බොහෝ දෙනකුට මොහු කුමක් කියයිද මොහු කුමක් කියයිදැයි කුතුහලයට පැමිණෙන තැන හෙයින් කුතුහල සාලායයි කියනු ලැබේ. කොතුහලසාලා යයිද පායක් ඇත ලාභා යමෙක් මෙබඳු මහණ බමුණන් දකීමට ප්‍රශ්න ඇසීමට ධර්මකථා හෝ ඇසීමට ඔවුන්ට ලැබේද ඒ අංග මගධ වැසියන්ට මේ ලාභයෝ වෙතියි අර්ථයි. සඞ්ඝිනො ආදීන්හි පබ්බජිත සංඛ්‍යාතවූ සංඝයා. ඔවුන්ට ඇතැයි ගණිනො නම්, ආචාර හික්මීම් වශයෙන් ඒ ගණයාගේ ආචාර්යයෝය යන අරුතින් ගණාචරියා ඤාතා ප්‍රසිද්ධප්‍රකට, අයථා ගුණයන්ගෙන් ද යථා ගුණයන්ගෙන්ද පැනනැඟුණු කීර්තිය මොවුන්ට ඇත්තේයයි යසස්සිනො පූරණ ආදීන්ගේ අල්පේච්ඡතාව සන්තුෂ්ටිය. අල්පේච්ඡ බැවින් වස්ත්‍රයක් වත් නොහඳිතියි ආදී ක්‍රමයෙන් කීර්තිය පැනනැඟුණේය. තථාගතයන් වහන්සේගේ ඉතිපිසොභගවා ආදි යථාභූත ගුණයෙන් පැනනැගුණේය. තිත්ථකරා ලබ්ධි ඇත්තෝ. සාධුසම්මතා මොවුහු යහපත් සොඳුරු සත්පුරුෂයෝ යැයි සම්මතය. බහුජනස්ස අශ්‍රැතවත්. අන්ධබාල පෘථක්ජනයාගේද බුද්ධිමතුන්ගේද පණ්ඩිත ජනයාගේද, එහි තීර්ථකයෝ බාල ජනයා අතර මෙසේ සම්මතය. තථාගතයන් වහන්සේ පණ්ඩිත ජනයා අතර, මේ ක්‍රමයෙන් පූර්ණ කාශ්‍යප සංඝයා ඇත්තේය ආදී තැන්වල අර්ථය දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ යම් හෙයකින් අරමුණු තිස්අට විභජන කරන සේක් බොහෝ අරමුණු නිවනට බස්නා තොටුපොළවල් කළසේක්ද, ඒ නිසා තීර්ථංකර යයි කියන්ට වටී. මේ සියලු දෙනද එහි බැසගත්තේ කුමක් නිසාද, උපස්ථායකයන් රැකගනු පිණිස සහ ලාභසත්කාර ලබාගැනීම පිණිසත්ය. ඔවුන්ට මෙබඳු අදහසක් ඇත. අපගේ උපස්ථායකයෝ ශ්‍රමණ ගෞතමයන් සරණ ගියාහු වෙත්වා, ඔවුන්ද ආරක්ෂා කරන්නෙමු. ශ්‍රමණ ගෞතමයන්ට උපස්ථායකයන් සත්කාර කරනු දැක අපගේ උපස්ථායකයෝද අපට සත්කාර කරත්. ඒනිසා භාග්‍යවතුන් වහන්සේ යම්තැනක සැරිසරත්ද එතැන බැසගෙන සිටිති. වාදං ආරොපෙත්වා අපක්කන්තා ඉවත්ව ගියාහුය. ඇතම්හු

දිශාවන්ට ගියහ. ඇතැම්හු ගිහිබවට ගියාහුය. ඇතමෙක් මේ සසුනට පැමිණියාහුය. **සහිතං** මෙ මාගේ වචනය හිතවත්ය. මටසිලිටිය. අර්ථසහිතය, කරුණු සහිතය යන අර්ථයි. **අසහිතං** තෙ ඔබගේ වචනය අහිතවත්ය. මැනවින් පුරුදු නොකරන ලද්දේය. ඒවා ආපසු පෙරළේ. ඔබට යමක් දිගුකලක් පුරුදු වශයෙන් මනාසේ ප්‍රගුණවී තිබේද එය මාගේ එක් වචනයකින් ම අන් අතට පෙරලී සිටියද කිසිවක් නොවීය යන අර්ථයි. **ආරෝපිතො** තෙවාදො මා විසින් ඔබගේ වාදයෙහි දෝෂ ආරෝපණය කරන ලදී. **චර වාදපපමොකඛාය** දොස් මුදනු පිණිස චර හැසිරෙන්න ඒ ඒ තැනට ගොස් හික්මෙන්න යන අර්ථයි. **නිබෙඨයෙහිවා සචෙ පහොසි** තමාට පුළුවන්නම් දැන්ම ලිහාගන්න. **ධමමකෙකාසෙන** ස්වභාවයට අක්‍රෝශ කිරීමෙන්, **තං නො සොසසාම** අපට දෙසූ ධර්මය අසන්නෙමු. **බුදදං මධු** කුඩා මැස්සන් විසින් තනන ලද දඬු වැල්බෑ මී, **අනෙලකං** නිදොස්ය. පහවගිය මැස්සන් ඇත්තේය. **පපීළෙයා** දෙන්නේය. **පචචාසිංසමානරූපො** අපට අහර දෙන්නේ පුරවා තේදැයි භාජන අතින්ගෙන බලාපොරොත්තු වෙමින් එළඹ සිටියේය. **සමපයොජෙතවා** අල්පමාත්‍රවූ විවාදයක් කොට, **ඉතරීතරෙන** ලාමක අලාමක දෙයින් වෙන් වී යැයි මේ පිරිවැජියා කායවිවෙක මාත්‍රයක් සඳහා කියයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි තුන් විවේකයෙන්ම වෙන්වූසේක. **කොසකාහාරාපි** දානපතියන්ගේ ගෙහි අග්‍රවූ භික්ෂාවතබනු පිණිස කුඩා බඳුන් ඇත. දානපතීහු අගබත් එහි තබා අනුභව කරත්. පැවිද්දා පැමිණිවිට ඔහුට දෙති. ඒ බඳුන **කොසක** යයි කියනු ලැබේ. ඒනිසා යමෙක් එක් බත් පතකින් යැපෙත්ද. ඔවුහු කොසකාහාර නම්වෙති. **බෙලුවාහාරා** බෙලිගෙඩියක් තරම් බත්. **සමතිකකනතං** එලලුතැනක යටම නුලමෙන් **ඉමිනා ධමෙමන** මේ අල්පාහාරතා ස්වරූපයෙන්, මෙහිදී භාග්‍යවතුන් වහන්සේ සර්වාකාරයෙන් අල්පාහාර ඇත්තෙකැයි නොකිය යුතුය. ප්‍රධන් වීර්යය කරන අවස්ථාවෙහි සයවසක් අල්පාහාර ඇත්තෙක් වූහ. වේරංජාවේදී තුන් මසක් පිටි දියකළ ජලයෙන්ම යැපුණු සේක. පාරිලෙය්‍යක වන ළැහැබෙහි තුන් මසක් නෙළුම් දඬුවෙන්ම යැපුණු සේක. මෙහි මේ අර්ථය දක්වයි. මම එක් කලෙක අල්පාහාර ඇත්තෙක් වීමි. මාගේ ශ්‍රාවකයෝ ධූතාංග සමාදානයෙහි පටන් දිවි ඇතිතාක් ධූතාංගය නොබිඳිති. ඒ නිසා ඉදින් ඔවුන්ට මේ ස්වරූපයෙන් සත්කාර කරත්නම් එය මට සත්කාර කිරීමක් නොවේ. ඔවුහු මට වඩා විශේෂයක් ඇත්තෝ වෙති. ඔවුන්

මට සත්කාර කරන වෙනත් ස්වභාව ඇත්තේයයි දක්වයි. මේ ක්‍රමයෙන් සියලු වාරයන්හි යෙදීම දතයුතුය. **පංසුකූලකා** සමාදන්වූ පංසුකූලික අංග ඇත්තෝ, **ලූඛචීවරධරා** ආයුධයකින් කැපූ රළු සිවුරු දරන්නාහු **නන්ත කානි** කෙළවරනැති, කෙළවරවල් නැති රෙදිකැබලි, කෙළවරක් තිබේනම් පිළෝතික ගණනට නොයයි. **උච්චිනිත්වා** පලා, දුර්වල තැන් හැර තිරතිර තැන් ගෙන, **අලාපුලොමසානි** පුහුල් කෙඳි හා සමාන සියම් නූල් යයි දක්වයි. මෙපමණකින් ශාස්තෘන් වහන්සේ චීවර සන්තෝෂයෙන් අසතුටට පත්වූහයි නොකියයුතුයි. උන්වහන්සේ අතිමුත්තක සොහොනින් පූර්ණදාසිය පොරවා අත්හැර දැමූ වැහැරි පංසුකූලය ගන්නා දිනයෙහි මහාපෘථිවිය ජල පර්යන්තය තෙක් කම්පාවිය. මෙහි මේ අර්ථය දක්වයි. මම එක් කලෙක පංසුකූලය ගත්තෙමි. මාගේ ශ්‍රාවකයෝ ධූතාංග සමාදානයෙහි පටන් දිවි ඇතිතාක් ධූතාංගය නොබිඳිති. **පිණ්ඩපාතිකා** අතිරේක ලාභ අත්හැර සමාදන් වූ පිණ්ඩපාතිකංග ඇත්තාහු. **සපදාන චාරිනො** කෑදරකමින් හැසිරීම ප්‍රතික්ෂේප කොට සමාදන්වූ පිළිවෙළින් ඇවිදීම ඇත්තාහු **උඤ්ඡාපකෙ වතෙ රතා** උඤ්ඡාචරිය සංඛ්‍යාතවූ භික්ෂූන්ගේ ප්‍රකෘති ව්‍රතයෙහි ඇලුණාහු උස්මිටි දොර සිටින්නාහු වී කසල මිශ්‍රවූ ආහාර එකතුකොට වළඳති යන අර්ථයි. **අන්තරඝරං** බ්‍රහමායු සූත්‍රයෙහි උළුවස්සෙහි සිට ඇතුළු ගෙට, මෙහි ඉඳුකීලයෙහි පටන් අදහස් කරන ලදී. මෙපමණකින් ශාස්තෘන් වහන්සේ පිණ්ඩපාත සන්තෝෂයෙන් අසතුටු වූහයි නොකිය යුතුය. අල්ප ආහාර ඇති බැවින් කියන ලද පරිද්දෙන්ම සියල්ල විස්තරකළ යුතුවෙයි. **ඉති ඉධාපි** මේ අර්ථය දක්වන සේක. මම එක්තරා කලකදී ආරාධනය නොඉවසීමි. මාගේ ශ්‍රාවකයෝ ධූතාංග සමාදානයෙහි පටන් දිවි ඇතිතෙක් ධූතාංගය නොබිඳිති. රුක්ඛමූලිකා සෙවන ප්‍රතික්ෂේප කොට සමාදන් වූ රුක්ඛමූලිකාංග ඇත්තාහු, **අබ්භොකාසිකා** සෙවනද රුක්මුලද ප්‍රතික්ෂේප කොට සමාදන්වූ අබ්භොකාසික අංග ඇත්තාහු අට්ඨමාසෙ හේමන්ත ගිම්හාන කල්හි ඇතුළුවස චීවරානුග්‍රහය පිණිස සෙවනට පිවිසෙති. මෙපමණකින් ශාස්තෘන් වහන්සේ සේනාසන සන්තෝෂයෙන් අසන්තෝෂ වූහයි නොකිය යුතුය. උන්වහන්සේගේ සේනාසන සන්තෝෂයෙන් ෂට්වාර්ෂික මහා ප්‍රධානයෙන් ද, පාරිලෙය්‍යක වන ළැහැබින්ද දැක්විය යුතුවෙයි. මෙහි මේ අර්ථය දක්වන සේක. මම එක්තරා කාලයක සෙවනට හෝ නොපිවිසියෙමි. මාගේ ශ්‍රාවකයෝ ධූතාංග සමාදානයෙහි පටන් දිවි ඇතිතෙක් ධූතාංගය නොබිඳිති

ආරඤ්ඤකතා ග්‍රාමාන්ත සේනාසනය ප්‍රතික්ෂේප කොට සමාදන්වූ ආරණ්‍ය කාංග ඇත්තාහු **සඞ්ඝ මජ්ඣෙ ඔතරනති** අබද්ධ සීමාවෙහි කියන ලද බද්ධසීමාවෙහි වසන්නාහු තමාගේ වසනතැනම පොහොය කරති. මෙපමණකින් ශාස්තෘන් වහන්සේ විවේක රහිතයයි නොකිව යුතුය. මහණෙනි මම අඩමසක් හුදෙකලාව සිටීමට කැමැත්තෙමි මෙසේ උන්වහන්සේගේ ප්‍රවිවේකය පැනේ. මෙහිදී මේ අර්ථය දක්වත්. මම එක් එක් සුදුසුකල්හි හුදෙකලා වීමි. මාගේ ශ්‍රාවකයෝ ධූතාංග සමාදනයෙහි පටන් දිවිඇතිතාක් ධූතාංගය නොබිඳිති. **මමං සාවකා** මා ශ්‍රාවකයෝ, **සනිදානං** ප්‍රත්‍යසහිත, අප්‍රත්‍යය යනු කිමඃ නිර්වාණය නොදෙසානුයි නොදෙසනුයේද නොවේ. ඒදේශනාව හේතු සහිත කොට දෙසයි අහේතුක වශයෙන් නොවේ. **සප්පාටිහාරියං** පෙරකියුදෙයට මෙය වෙනත් වචනයකි. කාරණ සහිතය යන ආර්ථයි. **තංවත** මෙහි වත යනු නිපාත මාත්‍රයෙකි. **අනාගතං වා වාදපථං** අදසිට හෙටහෝ ඉන්පසුදින හෝ අඩමසෙකින් හෝ මසකින් හෝ වසරකින් හෝ ඒ ඒ ප්‍රශ්නයට මතුවට වන වාදමාර්ගය **නදක්ඛති** සච්චක නිගණ්ඨයා තමාට නිග්‍රහ කරනු පිණිස ආ කරුණ විශේෂ කොට කියන්නේ. නොදක්කේය. එසේ නොදකීයැයි මේ කරුණ නොපෙනේ. **සහධම්මෙන** කරුණු සහිතව, **අනතරනතරා කථං ඔපාතෙය්‍යුං** මාගේ කථා වාරය නවත්වා අතරතුර තමාගේ කථාව ප්‍රවේශ කරන්නේ යන අර්ථය. **නඛො පනායං උදායි** උදායි මම **අම්බට්ඨ** සොණදණ්ඩ කූටදන්ත සච්චක හො නිගණ්ඨයන් සමග මහා වාද පවත්නා කල්හිද මාගේ එක් සච්වෙක් යන උපමාවක් හෝ කාරණයක් ගෙන හැර දෙන්නේනම් මැනැවැයි. මෙසේ ශ්‍රාවකයන් කෙරෙහි අනුශාසනාවක් අපේක්‍ෂා නොකරමි. **ධම්මං යෙව** එබඳු තැන්වලදී ශ්‍රාවකයෝ මාගේම අනුශාසනාව සහ අවවාදය අපේක්ෂා කරති. **තෙසාහං චිත්තං ආරාධෙමි** මම ඔවුන්ගේ ප්‍රශ්නයට විසඳුමක් දීමෙන් සිත් සදමි. පුරවාලමි. එකක් ඇසුවිට අනිකක් නොකියමි. අඹ ගැන ඇසුවිට ලබු ගැනද ලබු ගැන ඇසුවිට අඹ ගැනද කියන්නාක් මෙන් **එත්ථච අධිසීලෙ සම්භාවෙන්ති** යැයි කියුතැන බුද්ධශීලය කියන ලදී. **අභික්කන්තෙන ඤාණදස්සනෙන සම්භාවෙන්ති** යැයි කියු තැන සර්වඥතා ඥනයයි. **අධිපඤ්ඤාය සම්භාවෙන්ති** යැයි කියු තැන ස්ථානොත්පත්තික ප්‍රඥාවයි. **යෙන දුක්ඛන** යැයි කියු තන්හි සත්‍යප්‍රකාශ කරන ප්‍රඥාවයි එහි සර්වඥතාඥානයද සත්‍ය ප්‍රකාශකරන ප්‍රඥාවද හැර

අවශේෂ ප්‍රඥාවෝ අධිප්‍රඥාව භජනය කරති. දූන් ඒ ඒ විශේෂ අධිගමයන්ගේ ප්‍රතිපදාව විමසන්නේ **පුනචපරං උදායි** ආදිය කීහ. එහි **අභිඤ්ඤා වොසානං පාරමිප්පත්තා** අභිඥාවසාන සංඛ්‍යාත ද අභිඥාපාරමී සංඛ්‍යාතවූ රහත්බවට පැමිණි **සම්මප්පධානෙ** උපාය ප්‍රධාන, **ඡන්දං ජනෙති** කත්තුකම්‍යතා කුසලච්ඡන්දය උපදවාගනී. **වායමති** උත්සාහකරයි. **විරියං ආරභති** වීර්යය පවත්වාගනී. **චිත්තං පග්ගණ්හාති** සිත ඔසවා තබයි. **පදහති** උපාය ප්‍රධානය කරයි. **භාවනාය පාරිපූරියා** වර්ධනය සම්පූර්ණ කිරීම පිණිස තව ද මෙහි යම් බුද්ධියක් වේද, යම් සන්සුන් බවක් වේද, යම් විපුලත්වයක් වේද ඒ භාවනාවයි. පරිපූරියනු මෙසේ මුලින් මුලින් ඇතිදෙය පසුපසු අර්ථය වේයයිද දතයුතුය. මේ සම්‍යක් ප්‍රධානයන් ගෙන් කුමක් කියන ලද්දේද එහි මෙසේ කියන ලදී. ඇවැත්නි, සම්‍යක් ප්‍රධාන සතරකි ඇවැත්නි මෙහි භික්ෂුව මට පාපක අකුසල ධර්ම නූපන්නේය. උපදින්නේ අනර්ථය පිණිස වන්නේයයි තැවෙයි. මාහට උපන් පාපක අකුසලධර්ම ප්‍රහාණය නොකරනු ලබන්නේ අනර්ථය පිණිස වන්නේයයි තැවෙයි. මාහට නූපන් කුසල ධර්ම නූපදින්නේ අනර්ථය පිණිස වන්නේයයි තැවෙයි. මාහට උපන් කුසල ධර්ම නිරුද්ධ වන්නේ අනර්ථය පිණිස වන්නේයයි තැවෙයි. මෙහි **පාපකා අකුසලා** ලෝභ ආදිය යැයි දතයුතුය. **අනුප්පන්නා කුසලාධම්මා** සමථ විදර්ශනා ද මාර්ගයද. **උප්පන්නා කුසලාධම්මා** සමථ විදර්ශනාව පමණි. මාර්ගය වනාහි වරක් ඉපදී නිරුද්ධවන්නේ අනර්ථය පිණිස වන්නක් නම් නොවේ. එය ඵලයට හේතුවක් දීම නිරුද්ධ වෙයි. පළමුකී දෙයෙහිද සමථ විදර්ශනා පමණක්ම ගත යුතුයයි කියන ලදී. එය සුදුසු නොවේ. එහිද උපන් සමථ විදර්ශනා නිරුද්ධ වන්නේ අනර්ථය පිණිස පවතින්නේය යන අර්ථය පහළවීම පිණිස මේ කරුණ වෙයි. එක් ක්ෂීණාශ්‍රව තෙර නමක් මහා චෛතියද මහාබෝධියද වඳින්නෙමියි සමාපත්ති ලාභී භාණ්ඩ ගෙනෙන සාමණේර නමක් සමග ජනපදයේ සිට මහා විහාරයට පැමිණ විහාර මළුවට පිවිසියේය. සවස් කාලයෙහි බොහෝ භික්ෂු සංඝයා චෛත්‍ය වඳින කල්හි චෛත්‍යය වඳිනු පිණිස නික්මී නොගියේය. කුමක් හෙයින් ද යත්, ක්ෂීණාශ්‍රවයන්ට ත්‍රිවිධ රත්නය කෙරෙහි මහත්වූ ගෞරවයක් ඇති එහෙයින් භික්ෂු සංඝයා වැඳ ආපසු එනකල්හි මනුෂ්‍යයන් සවස ආහාරය අනුභව කල කල්හි සාමණේරයන්ටද නොදන්වා චෛත්‍යය වඳින්නෙමියි තනිවම නික්මගියේය. සාමණේරයෝ තෙරුන් වහන්සේ අවේලාවෙහි තනියම වඩිති කුමක් නිසාදැයි දූනගන්නෙමිය උපාධ්‍යායන්ගේ පා අනුව නික්මී

ගියහ. තෙරුන් වහන්සේ ආවර්ජනය නොකිරීම නිසා ඔහුගේ පැමිණීම නොදැන දකුණු සෑ මළුවට නැංගාහ. සාමණේරයෝද පා අනුවම නැංගාහ. මහතෙරුන් වහන්සේ මහසෑය දෙස බලා බුද්ධාරම්මණ ප්‍රීතියලබා ගෙන මුළුහිතින් සලකා බලා තුටුපහටු වූවාහු සෑය වඳිති. සාමණේරයෝද තෙරුන් වන්දනා කරන ආකාරය දැක මාගේ උපාධ්‍යායයන් වහන්සේ අතිශයින් පහන් සිත් ඇතිව වන්දනා කරති. කිමෙක්ද මල් ලැබ පූජා කරනු ඇතැයි සිතූහ. තෙරුන් වහන්සේ වන්දනා කොට නැගී හිස ඇඳිලි බැඳ මහසෑය දෙස බලා සිටියහ. සාමණේරයෝද කාරා තමා ආබව දැන්වූහ. තෙරුන්වහන්සේ හැරී බලන්නාහු කවදා ආවෙහිදැයි ඇසූහ. ඔබ වහන්සේ සෑය වන්දනා කරන වේලාවේ ස්වාමීනි අතිශයින් පහන්ව සෑය වැන්දාහුය. මල් ලදහොත් පූජා කරන්නේද, එසේය සාමණේරය, මේ සෑයේ තරම් වෙනත් තැනක මෙපමණ ධාතු නිදන්කොට නැත. මෙබඳු අසදෘශ. මහසෑයක් මල්ලැබ පූජා නොකරන්නේ කවරෙක්ද එසේනම් ස්වාමීනි මඳක් ඉවසනු මැනවි මල් ගෙන එන්නෙමියි. එකෙණෙහිම ධ්‍යානයට සමවැදී ඍද්ධියෙන් හිමවතට ගොස් වර්ණගන්ධයෙන් යුත් මල් පෙරහනක පුරවා මහතෙරුන් දකුණු දොරටුවෙන් බටහිර දොරටුවට නොපැමිණ සිටියදීම පැමිණ මල් පෙරහන අතෙහි තබා පුදනු මැන ස්වාමීනියි කීහ. සාමණේරය අපගේ මල් ඉතාම ටිකයි තෙරණුවෝ කිහ. යන්න ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේගේ ගුණ ආවර්ජනය කොට පුදනුමැනවි. තෙරණුවෝ බටහිර දොරටුවට නගින පියගැටපෙළින් නැග ඇතුළත වේදිකා භූමියෙහි මල්පූජා කිරීමට පටන්ගත්හ. වේදිකා භූමිය පිරීගිය මල් වැටී දෙවැනි වේදිකාව දණක් පමණ පිරිණ. එයින් බැස පාදස්ථල මළුවට පිදූහ. එයද පිරීගියේය. පිරීගිය බව දැන පහතම මළුවෙහි විසුරුවමින් ගියහ. මුළු සෑමළුව පිරීගියේය. එය පිරීගිය කල්හි සාමණේරය, මල් ඉවර වන්නේ නැතැයි කීහ. ස්වාමීනි පෙරහන යටට හරවනු මැනවැයි කීහ. යටට හරවා සෙලවූහ. එවිට මල් අවසන් විය. පෙරහන සාමණේරයන්ට දී ඔහු සමග ඇත්පවුර වටා සෑය තෙවරක් පැදකුණු කොට දොරටු සතරෙහිදී වැඳ මළුවට යමින් මෙසේ සිතූහ. මේ සාමණේරතෙමේ මහාඍද්ධි ඇත්තෙකි. මේ ඍද්ධි ආනුභාවය රැකගන්ට මොහුට හැකි වන්නේද ඉන් නොහැකිවන්නේ යයි දැක සාමණේරයන්ට මෙසේ කීහ. සාමණේරය ඔබ දැන් මහා ඍද්ධි ඇත්තෙකි. මෙබඳු ඍද්ධියක් නැතිකරගෙන අනාගතයෙහි කණවූ පේෂකාරියකගේ

අතින් මැඩු කැඳ බොන්නෙහිය. මේ තරුණ බවෙහි දෝෂයකි. හෙතෙමේ උපාධ්‍යායයන් වහන්සේගේ කථාවෙන් කලකිරී ස්වාමීනි. මට කර්මස්ථාන කියාදෙනු මැනවැයි ඉල්ලා නොසිටියේය. අපගේ උපාධ්‍යයන් වහන්සේ කුමක් කියත්දැයි නෑසුණාක් මෙන් ගියේය. තෙරණුවෝ මහසෑයද මහාබෝධියද වැඳ සාමණේරයන් ලවා පා සිවුරු ගෙන්වා ගෙන පිළිවෙළින් ගං ඉවුරෙහි තිස්ස මහා විහාරයට ගියහ. සාමණේර තෙමේ උපාධ්‍යායයන්ගේ පා අනුව පිඬුසිඟා නොයයි. ස්වාමීනි කිනම් ගමකට පිවිසෙන්නහු දැයි විචාරා දැන් මාගේ උපාධ්‍යායයන්ගේද පා සිවුරු ගෙන අහසින් ගොස් තෙරුන්ට පා සිවුරුදී පිඬු පිණිස හැසිරෙයි. තෙරණුවෝ සෑම කල්හිම අවවාද දෙති. සාමණේරය එසේ නොකරව. පෘථක්ජන සෘද්ධිය සෙලවෙන සුලුය. නිබඳ නොවේ. අසත්ප්‍රාය රූපාදී අරමුණු ලැබ නොපමාවම බිඳීයයි. සමාපත්ති ඇතිකල්හි පිරිහීගොස් බ්‍රහ්මචරිය වාසයෙහි රැඳීසිටින්ට නොහැකිවන්නේය. සාමණේර තෙමේ මාගේ උපාධ්‍යායන් වහන්සේ කුමක් කියත්දැයි අසන්ට නොයයි. එසේම කරයි. තෙරණුවෝ පිළිවෙළින් චෛත්‍යවන්දනා කරමින් කපුවෙණ නම් විහාරයකට ගියහ. එහි තෙරුන් වසන කල්හිද සාමණේරතෙමේ එසේම කරයි. ඉක්බිති එක්දවසක් එක් අතිශයින් රූමත් තරුණ වයසෙහි සිටි පේෂකාර දියණියක් කුපුවෙණ ගමින් නික්ම නෙළුම් විලට බැස ගයමින් මල් කඩයි. එකල්හි නෙළුම් විල මතින් යන සාමණේර තෙමේ ලහටුවෙහි කණ මැස්සක මෙන් ඇයගේ ගීත ශබ්දයෙහි බැඳුණේය එකෙණෙහි සෘද්ධිය අතුරුදහන් වී පියාපත් සිඳුණු කපුටකු මෙන් විය. සප්ත සමාපත්ති බලයෙන් එහි ජලය මතුපිට නොවැටී පුළුන් පොදක මෙන් වැටෙමින් පිළිවෙළින් නෙළුම් විල ඉවුරෙහි සිටියේය. හේ වේගයෙන් ගොස් උපාධ්‍යායයන්ට පා සිවුරුදී නැවතුණේය. මහතෙරණුවෝ කලින්ම මෙය මා විසින් දක්නා ලද්දේයයි වළක්වනු ලබන්නේමද නොනවතින්නේමයයි කිසිවක් නොකියා පිඬු පිණිස පිවිසියහ. සාමණේර තෙමේ ගොස් නෙළුම් විල ඉවුරෙහි ඇය නැවත ගොඩවන තුරු සිටියේය. ඇය ද සාමණේරයන් අහසින් යනුද නැවත අවුත් සිටිනුද දැක මොහු ඒකාන්තයෙන් මා නිසා කලකිරුණේ වනැයි දැන ඉවත්වන්න සාමණේරයැයි කීවාය. හේ ඉවත්විය. ඇය ගොඩවී සළුව හැඳ ඔහු වෙත එළඹ ඇයි ස්වාමීනියි ඇසුවාය. හේ ඒ කරුණ දැන්වීය. ඈ බොහෝ කරුණුවලින් ගෘහවාසයෙහි ආදීනවද බ්‍රහ්මචරිය වාසයෙහි

ආනිසංසද දක්වා අවවාද කළත් ඔහුගේ උකටලීබව නැතිකරන්ට නොහැකිවන්නී මේතෙමේ මා කරණ කොට ගෙන මෙබඳු ඍද්ධිය කින් පිරිහී ගියේය. දූන් අත්හරින්ට සුදුසු නොවේයයි මෙහිම සිටුවයි කියා ගෙට ගොස් මව්පියන්ට ඒ බව දූන්වූවාය. ඔවුහුද අවුත් නානාප්‍රකාරයෙන් අවවාද දෙන්නාහු වචන පිළිනොගන්නා ඔහුට මෙසේ කීහ. ඔබ අපි උසස් කුල ඇත්තෝ යයි සලකන්නෙහිය. අපි රෙදිවියන්නෝ වෙමු. පේෂකාර කර්මය කරන්ට හැකි ද සාමණේර තෙමේ මෙසේ කීය. උපාසකය ගිහිවූවෙක් රෙදිවිවීම හෝ බටපතුරුවැඩ හෝ කරන්නේය. ඉත් ඇති වැඩය කිම. සළු මාත්‍රයෙහි ලෝභ නොකරන්න. පේෂකාරයා කරබැඳි සළුව දී දුව දුන්නේය. හේ පේෂකාර කර්මය ඉගෙන පේෂකාරයන් සමග ශාලාවෙහි වැඩ කරයි. අන් අයගේ ස්ත්‍රීහු උදෑසනම බත් සදාගෙන ආහ. ඔහුගේ බිරිය තවමත් නොඑයි. හේ අන්‍යයන් වැඩ නවත්වා ආහාර අනුභව කරන කල්හි නඩාව ගසමින්ම හුන්නේය. ඈ පසුවී ගියාය. ඉක්බිති හේ ඈයට පමාවී පැමිණියානේදැයි තර්ජනය කළේය. ගැහැණුනම් සක්විති රජකු වුවත් තමාකෙරෙහි පිළිබඳ සිතක් ඇත්තකු යයි දත්විට ඔහු දාසයකු මෙන් සලකත්. ඒනිසා ඈ මෙසේ කීවාය. අන්අයගේ ගෙහි දර කොළ ලුණු ආදිය තැන්පත් කර ගෙන ඇත. බැහැරින් ගෙනවුත් දෙන පණිවිඩකරුවෝද ඇත. මම ඉත් එකියකි. ඔබද මාගේ ගෙහි මෙය ඇත මෙය නැතැයි නො දන්නෙහිය. කැමති නම් කන්න නැත්නම් නොකන්න හේ මැය ඉරබැසගිය පසු බත් ගෙන එන්නී පමණක් නොව වචනයෙනුත් මට ගටතිය කිපී පහරදීමට අන් යමක් නොදක්නේ තසර දඬුව යන්ත්‍රයෙන් කඩාගෙන දමා ගැසීය. ඇය ද එය එනු දූක කණුවකට මුවා වූවාය. නඩාවෙහි කොන තියුණුය. ඈ එය එනවිට ඇස් කොනක ඇනී සිටියේය. ඈ දෑතින්ම වේගයෙන් ඇස අල්ලා ගත්තීය. බිඳුණු තැනින් ලේ ගලයි. හේ එවිට උපාධ්‍යායයන් වහන්සේගේ වචන සිහි කළේය. මේ සඳහා මාගේ උපාධ්‍යයයන් වහන්සේ අනාගතයෙහි පේෂකාරියකගේ අතින් මිරිකනලද කැඳ බොන්නෙහියයි කීහ. මෙය තෙරුන් විසින් දක්නා ලද්දේ වන්නේය. අනේ දුර දක්නා ආර්යයන් වහන්සේ යැයි මහහඬින් හඬන්ට පටන්ගති. අන්‍යයෝ නොහඬන්න දරුව, බිඳුණු ඇස හැඩීමෙන් ප්‍රකෘතිමත් කිරීමට නොහැකිය. හේ මම ඒනිසා නොහඬමි. එසේ වුවත් මේ කරුණ නිසා හඬමියි සියල්ල පිළිවෙළින් කීය. මෙසේ උපන් සමථවිදර්ශනා

නිරුද්ධවන්නේ අනර්ථය පිණිස වන්නේය. තවත් කථාවක් ඇත. භික්ෂූහු තිස්නමක් පමණ කැළණි මහ සෑය වැඳ කැලෑමාර්ගයකින් මහමඟට බසින්නාහු අතරමග දූවිගිය කෙතක වැඩ කොට එන එක් මිනිසකු දුටහ. ඔහුගේ සිරුර දූලි ගැවී තිබුණේය. දූලි තැවරුණු එක් කහකඩක් කිහිල්ලට තද කොට හැඳ සිටිනු බලනවිට දූවිගිය කණුවක් මෙන් වැටහෙයි. හේ දවල්කාලයෙහි වැඩකොට අඩක් දූවිගිය දර කඳන් ඔසවා පිටදිගේ විසිරුණු කෙසින් යුතුව කුඩා මගකින් අවුත් භික්ෂූන් හමුවෙහි සිටියේය. සාමණේරයෝ ඔහු දැක ඔවුනොවුන් දෙසබලා සිනා සෙමින් ඇවැත්නි, මේ ඔබේ තාත්තා. ඔබගේ මහතාත්තාය, ඔබගේ මාමායැයි සිනා සෙමින් ගොස් උපාසකය, ඔබගේ නම කුමක්දැයි ඇසුහ. නම අසනු ලැබූ ඔහු විපිළිසරව දර දඬුව ඉවතලා රෙදිකඩ සදාගෙන හැඳ වැඳ ස්වාමීනි මදක් හිඳින්නැයි කීය. මහ තෙරවරු සිටියහ. තරුණ සාමණේරයෝ පැමිණ මහතෙරුන් හමුවෙහිද අවඥකරති. උපාසකයා මෙසේ කීය. ඔබ වහන්සේලා මා දෙස බලා අවඥකරන්නාහුය. මෙපමණකින් මුදුනට පැමිණියෙමුයි සලකන්නහුය. මම ද පෙර ඔබ වැනිම ශ්‍රමණයෙක් වීමි. ඔබගේ සිතේ එකඟතා මාත්‍රයක් වත් නැත. මම මේ සසුනෙහි මහා සෘද්ධි ඇත්තෙක්ද මහා අනුභාව ඇත්තෙක්ද වීමි. අහස ගෙන පොළොව කරමි. පොළොව ගෙන අහසකරමි. දුර ගෙන ළඟ කරමි. ළඟ දුර සක්වල සිය දහසක් සැණින් විනිවිදිමි. මාගේ මෙ අත්දිහා බලන්න. දැන් ඒවා වඳුරු අත් වැනිය. මම මේ අත්වලින්ම මෙහි හිඳගෙනම සඳහිරු ස්පර්ශ කෙළෙමි. මේ පාදවලින් සඳහිරු පාතබනා කොටයක් කොට වාඩිවී සිටියෙමි. මාගේ එබඳුවූ සෘද්ධිය ප්‍රමාදය නිසා අතුරු දහන්විය. ඔබ පමා නොවන්න. ප්‍රමාදය නිසා මෙබඳු ව්‍යසනයට පැමිණෙත්. අප්‍රමාදීව වාසය කරන්නෝ ජාති ජරා මරණ කෙළවර කරති. ඒ නිසා ඔබ වහන්සේලා මා මැ අරමුණු කොට අප්‍රමාදීවන්න ස්වාමීනියි තර්ජනය කොට අවවාද කළේය. ඔහු එසේ කියද්දීම ඔවුහු සංවේගයට පැමිණ මැනවින් බලන්නාහු තිස්දෙනම එහිදීම රහත්බවට පැමිණියහ. මෙසේද උපන් සමථ විදර්ශනාවෝ නිරුද්ධවෙමින් අනර්ථය පිණිස වන්නේ යයි දතයුතුය. **අනුප්පන්නානං පාපකානං** මෙහි උත්පන්න වර්තමාන උත්පපන්නවී. විගත උත්පන්න ඕකාසකත උප්පන්න භූමිලද්ධ උත්පන්නයයි චතුර්විධ උත්පන්නයෝ වෙති. එහි යම් ක්ලේශයෝ පෙනෙමින් උත්පාද ආදියෙනි යුක්ත වුවාහුද මේ වත්තමානුප්පන්න නම්

කර්ම ජීවිතයෙහි අරමුණු රසය විඳ නිරුද්ධවී ගිය විපාක ඇතිවී විගත නම්වෙ. කර්මය ඉපදී නිරුද්ධවී විගතනම් වේ. ඒ දෙකම වි විගතුප්පන්න යයි ප්‍රසිද්ධියට යයි. කුසල අකුසල කර්මය අන්‍යයකුගේ විපාකය බැහැර කොට තමාගේ විපාකයට ඉඩ සලසාගනී මෙසේ අවකාශ ඇතිකරගත් කල්හි විපාකය උපදිමින් අවකාශකරණයේ පටන් උපන්නේයයි කියනු ලැබේ. මෙය ඔකාස කත උප්පන්න නම් පංචස්කන්ධය වනාහි විදර්ශනාවගේ භූමියයි. ඒවා අතීත ආදී භේද ඇත්තෝය. ඔවුන් අතර නිදාගත් කෙලෙස් අතීත හෝ අනාගත හෝ වර්තමාන යැයි නොකිය යුතුය. අතීත ස්කන්ධයන්හි නිදාගත් ක්ලේශයෝද ප්‍රහීණ නොවූවාහුම වෙති. මේ භූවිලද්ධ උත්පන්න නම් පෝරාණයෝ එයින් කීහ. ඒ ඒ භූමිවල ඝාතනය නොවූ කෙලෙස් භූමිලද්ධුප්පනන යයි ගණනට යෙයි. තවත් චතුර්විධ උත්පන්න යෝ වෙති. සමුදාචාරුප්පනන, ආරම්මණාධිගිහිතුප්පනන, අවික්ඛමහිතුප්පනන අසමුග්ඝාතිතුප්පනන යනුවෙන් එහි දූන් පවත්නා උත්පන්නයම සමුදාචාරුප්පනන නම් වරක් ඇස් ඇර අරමුණු නිමිති ගත් කල්හි සිහිකළ සිහිකළ කෙණෙහි කෙලෙස් නූපදින්නේ යයි නොකිය යුතුය. කුමක් හෙයින්දයත් අරමුණ අධිගෘහිතබැවිනි. කෙසේද යම්සේ කිරි ගහක පොරොවෙන් ගැසූ ගැසූ තැන කිරි නොනික් මෙන්නේයයි නොකිය යුතුය. මෙසේ මෙය ආරම්මණාධිගහිතුප්පනන නම් සමාපත්තියෙන් විෂ්කම්භනය නොකළ කෙලෙස් මෙතැන නූපදින්නේ යයි නොකියයුතුය. කුමක්නිසාදයත්, අවිෂ්කම්භිතවූ බැවිනි. කුමක්සේද? යම්සේ සාරවූ කිරිගසකට පොරොවෙන් කොටත්ද මෙතැන කිරි නොනික් මෙන්නේයයි නොකිය යුතුය. මෙසේ මෙය අවික්ඛමහිතුප්පන්න නම් මාර්ගයෙන් නොනසනු ලැබූ කෙලෙස් භවාග්‍රයෙහි උපන්නහුටද උපදීතියි පෙර පරිද්දෙන්ම විස්තර කළයුතුය. මෙය අසමුග්ඝාතිතුප්පනන නම් මේවා උපන් කල්හි වත්තමානුප්පනනයවී විගතුප්පනන ඔකාසකතුප්පනන සමුදාචාරු-ප්පනන යැයි චතුර්විධ උප්පනනය මාර්ගය නොමරන්නේ වේ. භූමිලද්ධුප්පනන, ආරම්මණාධ්ගහිතුප්පන්න, අවික්ඛමහි තුප්පන්න, අසමුග්ඝාතිතුප්පන්න යන චතුර්විධ උත්පන්න මාර්ග මරන්නේ වේ. මාර්ගය උපදිමින් මේ කෙලෙස් අත්හැරදමයි. ඒවා අතීතහෝ අනාගත හෝ වර්තමාන යැයි නොකිය යුතුයි. මෙය කියන ලද්දේද වෙයි. යම්හෙයකින් අතීතවූ කෙලෙස් අත්හරිද, එසේ නම් කෂීණාවූ දෙය ගෙවාදමයි. නිරුද්ධ වූ

දෙය නිරුද්ධ කරයි. අර්ථගත වූ දෙය අස්තංගත කරයි. අතීතවූ යමක් නැද්ද එය අත්හැර දමයි යනුවෙන් යම්හෙයකින් අනාගත කෙලෙස් අත්හැරදමයිද එසේනම නූපන් කෙලෙස්ද අත්හැර දමයි. නූපන් පහළනොවූ කෙලෙස් අත්හැරදමයි. අනාගතවූ යමක් නැද්ද එය අත්හැර දමයි යනුවෙන් දුෂ්ටවූයේ දෝෂයද, මෝඩ වූයේ මෝහයද විනිවිදින ලද්දේ මානයද පරාමර්ශනය කරන ලද්දේ දෘෂ්ටිය ද තිෂ්ඨාවට නොගියේ විචිකිච්ඡාවද, ශක්තිමත්බවට ගියේ අනුසයද අත්හැරදමයි. කලුසුදු ධර්මයෝ එකටබැදී පවතිත්. කිළිටිවූ මාර්ගභාවනා වෙයි. එසේනම් මාර්ගභාවනාවක් නැත. ඵලසාක්ෂාත් කිරීමක්නැත. ක්ලේශ ප්‍රහාණයක් නැත. ධර්මාභිසමයක් නැත. මාර්ගභාවනාවක් ඇත. - පෙ - ධර්මාභිසමයක් ඇත. කෙසේද යම්සේ තරුණ ගසක් - පෙ - පහළනොවූ දෙයක්ම පහළ වේද? මෙසේ පාළියෙහි පලහට නොගත් ගස ආයේය. ඵලහටගත් ගසින් දැක්විය යුතුය. යම්සේ පලඇති අඹගසක් මිනිස්සු එහි ගෙඩි අනුභව කරත්නම් ඉතිරිය හලා පස් පුරවත්නම්, තවත් පුරුෂයෙක් එය පොරොවෙන් සිදින්නේනම් එයින් එහි අතිත ඵල නොනැසුයේ වෙයි. අනාගත වර්තමාන ඵලද නොනසන ලද්දේ වෙයි. අතීතඵල නොනසනලද්දේ යනු ඒවා මිනිසුන් විසින් පරිභෝගකරන ලද බැවිනි. අනාගත වල ඉපදී නැති බැවින් නසන්ට නොහැකිය. යම් කලෙක එය සිදින ලද්දේද එකල්හි ඵලද නැත. වර්තමාන ඵලද නොනසන ලදඒවාය. ඉදින් ගස නොකපන ලද්දේනම් ඉක්බිති පෘථුවි රසයද ආපොරසයද පැමිණ යම් ඵලයක් තිපදවයිද ඒවා නසනලද්දේම වෙයි. ඒවා නූපන් ඵලය. නූපදිත්. නොනිපන් ඵලනූපදිත් පහළනොවූවෝමය. මෙසේ මාර්ගය අතීත ආදී භේද ඇති කෙලෙස් අත්නොහරී. ඉවත් නොකරයි. යම් කෙලෙසුන්ගේ මාර්ගයෙන් ස්කන්ධයන් නොදන්නා කල්හි උත්පත්තියක් වේනම් මාර්ගයෙන් ඉපදී ස්කන්ධයන් දන්නා බැවින් ඒ කෙලෙස් නූපදීම නූපදීත් නොනිපන්නේම නොනිපදෙත්. පහළනොවූවෝම පහළ නොවෙත්. තරුණ පුත්‍රයකු ඇති ස්ත්‍රියගේ යළි නොවැදීම සඳහා ලෙඩවූවන්ගේ රෝග සුවකිරීම සඳහා බීවූ බෙහෙත් වලින්ද මේ අර්ථය පැහැදිලි කළයුතුය. මෙසේ මාර්ගය යම් ක්ලේශයක් අත්හරිද ඒ අතීත හෝ අනාගත හෝ වර්තමාන කියා හෝ නොකිය යුතුය. මාර්ගය කෙලෙස් අත්නොහරින්නේ නොවේ. මාර්ගය යම් ක්ලේශයක් අත්හරීද ඒ සඳහා **උප්පන්නානං පාපකානං** ආදිය කියන ලදී. මාර්ගය හුදෙක් ක්ලේශයන් පමණක් අත්හරින්නේ නොවේ.

කෙලෙස් ප්‍රහීණ නොවූ බැවින් යමෙක් උපදීත් ද උපාදින්නස්කන්ධ ඒවාද අත්හැර දමන්නේමය. මෙයද කියනලදී. සෝතාපන්න මාර්ග ඥානයෙන් අභිසංඛාර විඤ්ඤාණය නිරෝධ වීමෙන් සප්ත භවයන් හැර අනවරාග්‍ර සංසාරයෙහි යමෙක් උපදිත්ද මෙහි ඒ නාමයද රූපයද නිරුද්ධ වෙති යන්න විස්තරයයි **ඉතිමගෙගා උපාදිනන අනුපාදිනනතො වුට්ඨා** භවංගයෙන් සෝතාපත්ති මාර්ගය අපායභාවයෙන් නැගිටී සකෘදාගාමි මාර්ගය සුගතිභවයෙන් කොටසකි. අනාගාමි මාර්ගය සුගතිකාම භවයෙන් කොටසකි. අර්හත් මාර්ගය රූපාරූප භවයෙන් නැගිටියි. සියලු භවයන්ගෙන් නැගීටී යයිද කියති. මාර්ගක්ෂණයෙහි නුපන්නවුන්ගේ ඉපදවීම පිණිස භාවනාව කෙසේවේද, උපන්නවුන්ගේ පැවැත්ම පිණිස කෙසේවේද? මාර්ග පැවැත්මෙන්මය. මාර්ගය පවත්වමින් පෙර නුපන් විරූ බැවින් අනුප්පනනයයි කියනු ලැබේ. නොගිය විරූ තැනට ගොස් අත්දැකීම් නොලදවිරූ අරමුණ අත්දැක නොපැමිණි තැනට පැමිණියෙමුයි කියන්නෝද අත්දැකීම් නොලද අරමුණ අත්දකිමුයි කියන්නෝද වෙති. යම්තාක් එය පැවැත්මක්වේද එයම ඨිතියයිද ඨිතියෙන් වර්ධනය වන්නේයයිද කියන්ට වටී. ඍද්ධිපාදයන්හි සංක්ෂේප කථාව වෙතොඛිල සූත්‍රයෙහි කියන ලදි. සංසිඳුවමින් යනුයි හෝ කෙලෙස් උපසමය සඳහා යනුයි උපසමගාමී, අවබෝධ කරවමින් යනුයි හෝ මාර්ග අවබෝධය පිණිස යනුයි සමෙබාධගාමී. විවේක නිශ්‍රිත ආදිය සියලු ආශ්‍රව සංවරයෙහි කියන ලදී. මේ එහි සංක්ෂේපයයි. මෙය විස්තර වශයෙන් මේ බෝධිපාක්ෂික කථාව විශුද්ධිමාර්ගයෙහි කියන ලදී. විමෝක්ෂ කථාවෙහි **විමොකෙඛා** විමෝක්ෂ යනු කවරාර්ථයකින්ද? සිත පිහිටුවා ගැනීම් අර්ථයෙන් කුමක්ද මේ අධිමුච්චන අර්ථය? විරුද්ධ ධර්මයන්ගෙන් මනාසේ මිදෙන අර්ථය. අරමුණෙහි ඇලීම්වශයෙන් මනාසේ මිදෙන අර්ථය පියාගේ උකුලෙහි අඟපසඟ දිගහැරසිටින දරුවාට නින්ද මෙන් නිග්‍රහ නොකරන ලද බැවින් සැකනැති බැවින් අරමුණෙහි පවතීයැයි කියන ලදී. මේ අර්ථය පශ්චිම විමෝක්ෂයෙහි නැත. පූර්ව සියල්ලෙහි ඇත. **රූපී රූපානි පසසති** මෙහි ඇතුළත කෙස් ආදීන්හි නීලකසිණ ආදීවශයෙන් උපදවනලද රූපය ඔහුට ඇත්තේහුයි රූපී බාහිර රූප දකිනුයි, බාහිර වූ නිලකසිණ ආදී රූප ධ්‍යාන ඇසින් බලයි. මෙයින් ඇතුළත පිටත වස්තු කොට ගත් කසිණයන්හි උපදවාගත් ධ්‍යාන ඇති පුද්ගලයාගේ රූපාවචර ධ්‍යාන සතරක් පෙන්වන

ලදී. **අජ්ඣත්තං අරූප සඤ්ඤී** ඇතුළත අරූපය යන හැඟීම ඇත්තේ, තමාගේ කෙස් ආදියෙහි නූපදවනලද රූපාවචර ධ්‍යාන ය යන අර්ථය, මෙයින් බාහිරව පිළියම් කොට බාහිරවම උපදවාගත් ධ්‍යාන ඇති පුද්ගලයාගේ රූපවචර ධ්‍යාන දක්වන ලදී. **සුභන්තෙව අධිමුත්තො හොති** මෙයින් විශුද්ධවූ නීලංදී වර්ණ කසිණයන්හි ධ්‍යාන දක්වන ලදී. එහි කිසිදු ඇතුළත අර්පණයට සුභයයි අදහසක් නැත. යමෙක් අතිපරිශුද්ධ සුභ වූ කසිණාරම්මණයක් කොට වාසය කෙරේද, හේ කුමක් හෙයින් සුභයයි විශ්වාසයක් ඇත්තේ වේයැයි කියයුතු බවට පැමිණෙයිද. ඒනිසා මෙසේ දේශනා කරන ලදී. පටිසම්භිදා මගගයෙන් සුභාන්තයෙහි විශ්වාසය විමෝක්ෂය වන්නේ කෙසේද? මෙහිදී භික්ෂුවක් මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් - පෙ - වාසය කරයි. මෛත්‍රිය භාවිත කළබැවින් සත්වයෝ පිළිකුල් සහගත නොවෙත්, කරුණා මුදිතා උපේක්ෂා සහගත චේතනාවෙන් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. උපේක්ෂාව භාවිත කළ බැවින් සත්වයෝ පිළිකුල් සහගත නොවෙති. මෙසේ සුභාන්නයෙහි විශ්වාසය විමෝක්ෂය වේයයි කියන ලදී. සබ්බසො රූප සඤ්ඤානං ආදීතන්හි යමක් කිවයුතුද එය විශුද්ධි මාර්ගයෙහි කියන ලදමය. මේ අටවැනි විමෝක්ෂයයි සිව් ස්කන්ධයන් සර්වාකාරයෙන් දිගහැර ඇතිබැවින් විමුක්තවූ බැවින්ද අටවැනි උත්තම විමෝක්ෂය නම්.

අභිඥාආයතන කථාවෙහි : **අභිභායතනානි** අභිභවනය කරන කරුණු කුමක් අභිබවත්ද. විරුද්ධ ධර්මයන් අරමුණු වේනම් ඒවා විරුද්ධ භාවය නිසා විරුද්ධ ධර්ම පුද්ගලයාගේ අරමුණ ඥනයෙන් උසස්වූ බැවින් අබිබවත් **අජ්ඣත්තං රූප සඤ්ඤී** ආදී තන්හි ඇතුළත රූප පරිකර්ම වශයෙන් අජ්ඣත්තරූප  සඤ්ඤී නම් වේ. ඇතුළත නීල පරිකර්ම කරන්නේ කෙස්හි හෝ හිතෙහි හෝ ඇස්තරුවෙහි හෝ කරයි. පීත පරිකර්මය කරන්නේ මේදයෙහි හෝ සමෙහි හෝ ඇතුල්පතුල්හි හෝ ඇස්වල කහවන් තැන්හි හෝ කරයි. ලෝහිත පරිකර්මය කරන්නේ මසෙහි හෝ ලෙයෙහි හෝ දිවෙහි හෝ ඇස්වල රතු තැන්වලහෝ කරයි. ඕත පරිකර්මය කරන්නේ ඇටවල හෝ දත්වල හෝ නියවලහෝ ඇස්වල සුදුස්ථානවල හෝ කරයි. ඒවනාහි අතිශයින් නිල්හෝ අතිශයින් කහ හෝ අතිශයින් ලේපාට හෝ අතිශයින් සුදු හෝ නොවේ. විසුදු නොවේ. එකො

බහිද්ධා රූපානි පස්සති යමකුට මෙසේ පරිකර්මය ඇතුළත උපන්නේ වේද නිමිත්ත පිටතිනි. හේ මෙසේ ඇතුළත උපන්නේ වේද? නිමිත්ත පිටතිනි. හේ මෙසේ ඇතුළත පරිකර්ම කරන්නේ පිටතද අර්පණා වශයෙන් ඇතුළත රූපසඤ්ඤීවෙයි. එකෙක් පිටත රූප බලතියි කියනු ලැබේ. **පරිත්තානි** නොවඩනලද, **සුවණ්ණ දුබ්බණ්ණානි** සුවර්ණහෝ වේවා දුර්වර්ණ හෝ වේවා පරිත්ත වශයෙන්ම මේ අභිභායතනය කියන ලද්දේයයි දතයුතුය. **තානි අභිභුය්‍ය** ග්‍රහණියෙන්යුත් තැනැත්තෙක් හැන්දක් පමණ බත් ලැබ මෙහි කුමක් කැයුතුදැයි ඇදගෙන එක් පිඩුවක්ම කරයිද එසේම ඥානයෙන් උසස් වූ විශදඥානයක් ඇති පුද්ගලයා මේ මැද අරමුණෙහි සමවැදිය යුතු දෙයක් ඇත්ද මෙය මට බාරනොවේයයි ඒ රූප අබිබවා සමවදීද නිමිත්ත උප්පාදනය සමගම මෙහි අර්පණාවට පමුණුවයි යන අර්ථයි. **ජනාමිපස්සාමි** මෙයින් මොහුගේ සිතිවිල්ල කියන ලදී. හෙතෙමේද සමාපත්තියෙන් නැගුණහුට සමාපත්තිය ඇතුළත මෙබඳු සඤ්ඤා ඇත්තෙක්වේ. අභෝග සඤ්ඤාවෙහිද, ඣාන සඤ්ඤාවෙහිද මෙබඳු සඤ්ඤා ඇත්තෙක් වේ. ඔහුට අභිභව සඤ්ඤාව සමාපත්තිය ඇතුළතම වේ. අභෝග සඤ්ඤාව සමාපත්තියෙන් නැගුණහුට පමණකි. **අප්පමාණානි** වඩනලද ප්‍රමාණ මහත්‍ය යන අර්ථයි. **අභිභුය්‍ය** මෙහි යම්සේ උත්සවය අවසානයෙහි ඒ පුරුෂයා එක් බත් බෙදන්නකු ගෙන තවද වේවා තවදවේවා මෙය මට කුමක් කරන්නද, එය මහත්සේ නොදකී. මෙසේම ඥානයෙන් උසස්වූ විශදඥානයක් ඇති පුද්ගලයා මෙහි සමවැදිය යුත්තක් තිබේද මෙය අප්‍රමාණ නොවේයයි මාහට සිත එකඟ කිරීමෙන් භාරයක් ඇතැයි ඒවා අබිබවා සමවදී නිමිත්ත උත්පාදනයෙන් මෙහි අර්පණාවට පමුණුවයි යන අර්ථයි. **අජ්ඣත්තං අරූප සඤ්ඤී** නොලැබීම නිසා හෝ අර්ථයක් නැති නිසා හෝ ඇතුළත රූපයෙහි පරිකර්මසංඥානැති එකෙක් පිටතරූප දකී. යමකුගේ පරිකර්මයත් නිමිත්තත් පිටතින් උපන්නේ වේද හේ මෙසේ පිටත පරිකර්මයද අර්පණාවද වශයෙන් ඇතුළත අරූප සංඥා ඇත්තේද එකෙක් පිටතරූප දකීයයි කියනු ලැබේ. මෙහි සෙස්ස සිව්වැනි අභිභායතනයෙහි කියන ලද ක්‍රමය මැයි. මේ සිව්තැන පරිකර්මය විතර්කචරිත වශයෙන් පැමිණියේය. අප්පමාණය මෝහචරිත වශයෙනි. සුවර්ණය දෝෂචරිත වශයෙනි. දුර්වර්ණය රාගචරිත වශයෙනි. මේවායෙහි මෙම සත්ප්‍රාය වෙයි. මොවුන්ගේ සත්ප්‍රාය බව විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි චරියා

නිද්දේසයෙහි කියනලදී. පස්වැනි අභිභායතනාදියෙහි නීලානි යනු සර්වසංග්‍රාහක වශයෙන් කියන ලදී. නීලවණ්ණානි යනු වර්ණ වශයෙනි, නීලානිදස්සනානි යනු නිදර්ශන වශයෙනි. නොපෙනෙන සිදුරු නොබිඳුණු වර්ණ එක් නිලක්වම පෙනේයයි කියන ලද්දේවෙයි. නීලනීභාසානි යනු ඔභාස වශයෙන් කියනලදී. නීලොභාසානි **නීලපභායුත්තානි** - නිල්පැහැයෙන් යුතු යන අර්ථයි. මෙහි ඔවුන්ගේ සුවිශුද්ධතාව පෙන්වයි. මේ සිව් අභිභායතන විශුද්ධ වශයෙන්ම කියන ලදී. **උමමාපුප්ඵං** මේ සිනිදු මෘදු මල පෙනුමට නිල්ම වෙයි. ගිරිතිල්ල මල් ආදිය පෙනුමට නිල්ම වෙයි. ගිරිතිල්ල මල් ආදිය පෙනුමට ස්වේත ස්වරූප වෙයි. ඒනිසා මෙයම ගන්නා ලදී. ඒවා නොවේ **බාරාණසෙය්‍යකං** බාරාණසියෙහි වූයේ බාරාණසෙය්‍යක නම් එහි කපුද මෘදුය. නුල් කටින්නෝද රෙදිවියන්නෝද දක්ෂයෝය. ජලයද සුමුදුය. එහි වස්ත්‍ර දෙපැත්තම මෘදුය. දෙපසම මටව මෘදුව සිනිඳුව වියය පීතානි ආදියෙහිද මේ ක්‍රමයෙන්ම අර්ථවේයයි දතයුතුය. නීල කසිණය ඉගෙන ගන්නේ නිලෙහි නිමිත්ත ගනී මලෙහි හෝ වස්ත්‍රයෙහි හෝ වර්ණධාතුවෙහි හෝ ආදිය මෙහි කසිණ කරණයද පරිකර්මයද, අර්පණා විධානයද යන සියල්ල විශුද්ධි මාර්ගයෙහි විස්තර වශයෙන් කියන ලදී.

**අභිඤ්ඤාවොසාන පාරමිප්පත්තා** මින්පෙර සතිපට්ඨාන ආදියෙහි ඒ ඒ ධර්මයන් වඩා රහත්බවට පත්වූවෝම අභිඥ අවසානයෙහි පාරමී ප්‍රාප්ත වූවෝ නම් වෙති. කසිණ කථාවෙහි සකලාර්ථයෙන් **කසිණානි.** තදාරම්මණ ධර්මයන්ගේ ක්ෂේත්‍රාර්ථයෙන් හෝ **ආයතනානි. උද්ධං** උඩ ගුවන්තලයට අභිමුඛවූ. **අධො** යට භූමිතලයට අභිමුඛවූ **තිරියං** වෙල්යාය මෙන් හාත්පස පිරිසිඳ සමහරු උද්ධ කසිණය වඩති. සමහරු අධෝ කසිණය වඩති. සමහරු හාත්පසින් වඩති. ඒ ඒ කරුණින් මෙසේ රූපය දකිනු කැමැත්තේ අලෝකය මෙන් ප්‍රසාරණය කරයි. එහෙයින් කියන ලදී. පඨවිකසිණ **මෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියන්ති** යනුවෙන් **අද්වයං** මෙය එකක් වෙනස් බවට පැමිණීම පිණිස. යම්සේ ජලයට පිවිසියහුට සෑම දිසාවකම ජලයම වේද අනිකක් නොවේද මෙසේ පඨවි කසිණය පඨවිකසිණයම වේ. එයට වෙනත් කසිණ භේදයක් නැත. සියලු තැන මේ ක්‍රමයයි. **අප්පමාණං** මෙය ඒ ඒ පැතිරීම් අප්‍රමාණ වශයෙන් කියන ලදී. එයද චේතනාවෙන් පතුරුවන්නේ සියල්ලට පතුරුවයි. මෙයට ආදිමධ්‍යයයි ප්‍රමාණයක්

නොගනී. **විඤ්ඤාණකසිණං** මෙහි කසිණය සෙලවෙන ආකාසයෙහි පැවති විඤ්ඤාණයයි. එහි කසිණ වශයෙන් කසිණය සෙලවෙන ආකාසයෙහි කසිණු ගසාට මාකාස වශයෙන් එහි පැවති විඤ්ඤාණ යෙහි උඩයට හාත්පස බව දතයුතුය. මේ මෙහි සංක්ෂේපයයි. කර්මස්ථාන භාවනා වශයෙන් මෙම පඨවිකසිණ ආදිය විස්තර වශයෙන් විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දේමය. මෙහිද වර්ණවශී භවයෙන්ම අභිඤ්ඤාවෝසාන පාරමී ප්‍රාප්ත වෙතියි දතයුතුයි. එසේ මෙයින් අනන්තර සිව් ධ්‍යානයන්හි යමක් මෙහි කිවයුතු නම් එය මහා අස්සපුර සුත්‍රයෙහි කියන ලද්දේමය. විදර්ශනා ඥානයෙහි රූපී ආදීන්ගේ අර්ථය කියන ලද්දේමය. **එත්ථ සිතං එත්ථ පටිබද්ධං** මෙහි සතර මහා භූතයන්ගෙන් සැදුණු ශරීරයෙහි ආශ්‍රිතවූ හා බැඳුණු. **සුභො** සුන්දර, **ජාතිමා** පිරිසිදු අයුරින් පැනනැගුණු **සුපරිකම්මකතො** මැනවින් පිරියම්කරන ලද ඉවත් කරනලද පාෂාණ හා ගල්කැට ඇති. **අච්ඡො** සිරුරෙහි සම.... **විප්පසන්නො** මැනවින් පහන්වූ, **සබ්බාකාර සම්පන්නො** යමෙක් වේදනාදී සියලු ආකාරයෙන් යුත් නීලං ආදියෙන් වර්ණ සම්පත්තිය දක්වයි. එබඳු වසන ලද්දක් ප්‍රකට වෙයි. **එවමෙව බො** මෙහි මෙසේ උපමා සන්සන්දනය දතයුතුය. කරජකාය මැණිකක් බඳුය. වෙළාගත් නූල මෙනි විදර්ශනා ඥනය. ඇස්ඇති පුරුෂයකු මෙනි විදර්ශනා ඥන ලාභී භික්ෂුව අතෙහි තබා ප්‍රත්‍යවේක්ෂණය කරන්නහුට මෙය. මැණිකකැයි මැණික පහළවූ කාලය මෙනි විදර්ශනාඥනය ඉවතට ගෙන ගොස් හුන් භික්ෂුවගේ සතර මහාභූතයන්ගෙන් සැදුණු කයෙහි පහළ වූ කාලය මෙහි මේනූල පැටලී ඇතැයි නූල පහළවූ කාලය මෙනි විදර්ශනා ඥනය ඉවතට ගෙන ගොස් හුන් භික්ෂුවගේ තදාරම්මණවූ ස්පර්ශපංචමක සියලු චිත්ත චෛතසිකයන්ගේ හෝ විදර්ශනා ඥනයේ පහළවූ කාලය කුමක්ද මේ ඥනය පහළවීම. ඥානය පහළවුබැවින් පුද්ගලයා පහළවුයේම වේ. මේ විදර්ශනාඥානය මාර්ගයට අනතුරුවම වේ. මෙසේ ඇතිකල්හිද යම් හෙයකින් අභිඥාවාරය ඇරඹුණු කල්හි මෙය අනන්තර වාරයක් නැත. ඒනිසා මෙහි පෙන්වන ලදී. අනිත්‍ය ආදී වශයෙන් සම්මර්ශනය නොකළ දිව්‍ය ශ්‍රෝත ධාතුවෙන් භයානක ශබ්ද අසන්නකුට පූර්වෙනි වාසානුස්මෘතියෙන් භයහානක ස්කන්ධයන් සිහිකරන්නහුට දිව්‍යචක්ෂුසින් භයානක රූප දකින්නකුට භයද සන්ත්‍රාසයද උපදී. අනිත්‍යාදි වශයෙන්

සම්මර්ශනය කරන්නහුට නොවේ. ඒනිසා අභිඥාවට පැමිණියහුගේ භයනැති කරන හේතු ඇතිකිරීමටද මෙය මෙහිදීම දක්වනලදී. මෙහිදීද අර්හත් වශයෙන්ම අභිඤ්ඤාවොසාන පාරමීප්පත්තතාව දතයුතුය. මනෝමය ඍද්ධියෙහි පුරුදු වසිතාවන්හි වසිතාසු එහි **මනොමයං** මනසින් නිපැදුණු, **සබ්බඞ්ගපච්චඞ්ගං** සියලු අංගයන්ගෙන් යුත්. අභිනිඤ්ද්‍රියං සණ්ඨාන වශයෙන් විකල්නොවූ ඉන්ද්‍රිය ඍද්ධිමත්හු විසින් නිර්මිත රූපය. ඉදින් ඍද්ධිමතා ඕදාත නම් එයද ඕදාතය ඉදින් නොවිදිකන් ඇත්තේනම් එය ද නොවිදිකන්වේ. මෙසේ සර්වාකාර යෙන් එය හා සමානම වන්නේය. **මුඤ්ජම්හා ඉසිකං** ආදී උපමාවෙහි එයද සමානබව දක්වනු පිණිසම කියන ලදී. උණගස හා සමානවම එහි ඇතුළත අරටුවද වෙයි. අසිපත කොපුව හා සමානය. වටවූ කොපුවක වටවූ අසිපතක්ම බහන් පැතලි කොපුවක පැතලි අසිපතක් බහන් **කරණ්ඩා** මෙයද සර්පහැවට නමකි. උණ පතුරින් කළ කොපුවට සර්පහැව සර්පයා සමාන නොවේ. එහි පුරුෂයෙක් සර්පහැව ගලවන්නේ වුවද අතින් ගලවන්නාක්මෙන් දක්වන ලදී. එය සිතින්ම ගැළවීම දත යුතුයි. මේ සර්පයා උපන් ජාතියෙහි සිට දර අතර හෝ ගස් අතර ඇසුරු කොට සමින් ශරීරය අදින ප්‍රයෝග සංඛ්‍යාත ශක්තියෙන් සිරුර කාදමන්නාක් මෙන් පැරණි හම පිළිකුල්කරන ලද්දෙකැයි යන මේ සිව්කරුණින් තමාම හැව හරී. වෙනත් ක්‍රමයකින් ගැලවීමට නොහැකිය. ඒනිසා සිතින් ගැලවීම සඳහා මෙය කියන ලදැයි දත යුතුය. මෙසේ මේ භික්ෂුවගේ ශරීරය උණගසක් බඳුය. නිමිත්ත රූපය අරටුව මෙනි. මේ මෙහි උපමා සන්සන්දන යයි. නිර්මාණ විධානයද මෙහිවෙයි. තවදුරටත් ඍද්ධිවිධ ආදී පංච අභිඥා කථා සර්වාකාරයෙන් විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. එහි කියන ලද ආකාරයෙන් දත යුතුය. මෙහි වැඩිපුරම ඇත්තේ උපමාමාත්‍රය පමණකි. එහි දක්ෂ කුම්භ කාර ආදීන් මෙන් ඍද්ධිවිධ ඥානය දතයුතුයි. කැමති කැමති භාණ්ඩ විකෘති ආදිය කිරීම මෙන් ඒ භික්ෂුවගේ විකුර්වණය දත යුතුයි. මෙහිදීද පුරුදුකරන ලද වශීතා වශයෙන්ම අභිඤ්ඤා වොසනා පාරමිප්පත්තතාව දතයුතුයි. එසේම ඉන් අන්‍යවූ සතර අභිඥාවන්හිද දත යුතුයි. **සඞ්ඛංධමෙමා** සක් පිඹින්නා. **අප්පකසිරෙන** දුකින් තොරව **විඤ්ඤාපෙය්‍ය** දන්වන්නේය. එහි සක්සිඹින්නා සිව් දිසාවන්ට දන්වන කල්හි මේ සක්හඬයැයි තීරණයකට එළඹෙන සත්වයෝ සක්හඬ පහළවූ කාලය මෙනි. යෝගියාට දුර ළඟ භේද ඇති දිව්‍යමය වූද මානුෂික වූද ශබ්ද

ඇතිවූ කල් චේතෝපරිය උපමාවෙන් දත යුත්තේය. දහරො තරුණයා යුවා යෞවනයෙන් යුත්. මණ්ඩනක ජාතිකො යෞවනයා අලසකම්නැත්තෙකි. කිළිටි වස්ත්‍ර ඇති සිරුරු නැත්තෙකි : එපමණක්නොව සැරසෙන ස්වභාව ඇත්තේ දවසට දෙතුන්වර නා පිරිසිදු වස්ත්‍ර හැඳීම හා අලංකාර කරන සුල්ලෙකි යන අර්ථයි **සකණිකං** කලුකැලැල් ඇදවූ මුව කුරුලෑ ආදීන්ගෙන් කිසිවකින් දොස් සහිත එහි යම්සේ ඔහුගේ මුඛ නිමිත්ත ප්‍රත්‍යවේක්ෂණය කරන්නහුට මුඛ දෝෂය ප්‍රකට වේද එසේ චේතෝපරිය ඥාණය සිතින් ඉවතට ගෙන දුන් භික්ෂුවකට අනුන්ගේ සොළොස් ආකාර සිත ප්‍රකටවේයයි දතයුතුය. පෙර නිවාස උපමා ආදියෙහි යමක් කිවයුතුව තිබුණේද ඒ සියල්ල මහා අසසපුර සූත්‍රයෙහි කියන ලද්දේමය. **අයං බො උදායි පඤ්චමො ධම්මො** කොටස් දහනවයක් ප්‍රතිපදා වශයෙන් එක් ධර්මයක් කොට පඤ්චම ධර්මයැයි කියන ලදී. යම්සේ අටඨකනාගර සූත්‍රයෙහි කොටස් එකොළොසක් ප්‍රශ්න වශයෙන් එක් ධර්මයක් කරන ලද්දේය. ඉන්පසු ඒ අයුරින් මෙහි කොටස් දහනවයක් පටිපදා වශයෙන් එක් ධර්මයක් කරන ලද්දේයැයි දත යුතුය. මේ කොටස් දහනවයෙහි පිළිවෙළින් අටකොටසක විදර්ශනා ඥනයාගේ ආශ්‍රවක්ෂය ඥනයෙහිද අරහත්ත වශයෙන් අභිඤ්ඤා වොසාන පාරම්ප්පත්තතාව (අභිඥා අවසානයෙහි පරතෙරට පැමිණිබව) දතයුතුය. සෙස්සෙහි පුරුදුකළ පංච වශීතා වශයෙනි. සෙස්ස නොගැඹුරුමය.

**සත්වැනි මහාසකුලුදායී සූත්‍රයයි.**

## 2.3.8

**එවමෙමසුතං** යනු සමණ මණ්ඩික සූත්‍රයයි. එහි **උගගාහමානො** ඒ පිරුවැජියාගේ නමයි. නියම නම සුමනය. යමක් යමක් ඉගෙන ගන්ට සමර්ථ බැවින් උග්ගාහමාන යයි හඳුන්වති. **සමයං** මෙහි කියත්නුයි සමයප්පවාදක වේ. එම ස්ථානයෙහි වඞකිතාරුකබ. පොකබර සාතී ආදී බ්‍රාහ්මණයෝද. නිගණ්ඨ අචේලක පරිබ්‍රාජක ආදී පැවිද්දෝ ද රැස්ව තමතමන්ගේ සමය ගැන කථාකරත්. කියත්, පැහැදිලිකරත් ඒනිසා ඒ

ආරාමය සමයප්පවේදකයැයි කියනුලැබේ තින්දුකාචීර සංඛ්‍යාතවූ තිඹිරි ගස් පෙළකින් තෙමෙම වටවූ බැවින් තින්දුකාචීර නම්. යම් හෙයකින් මෙහි පළමුකොට එක් ශාලාවක් වීද පසුව මහා පින්ඇති පොට්ඨපාද පරිබ්‍රාජකයා නිසා බොහෝ ශාලා කරන ලද්දේද ඒනිසා ඒ එකම ශාලාව උදෙසා ලැබූ නම් වශයෙන් ඒකසාලක යයි කියනු ලැබේ. පසේනදී කොසොල් රජුගේ මල්ලිකා දේවියගේ උයන වූ ඒ ආරාමය මල්පලයෙන් ගැවසුණු ආරාමයක් කොට මල්ලිකාරාමය යයි ප්‍රසිද්ධියට ගියේය. ඒ සමයප්පවාදක තින්දුකාචීරයෙහි මල්ලිකා ගේ ආරාමයෙහි පටිවසති විසීම් පහසුව නිසා වාසය කරයි. දිවාදිවසස්ස දවස දිවා නම්. මධ්‍යාහ්න අති ක්‍රමය. ඒ දවසටද දිවාව අතික්‍රාන්ත වන මධ්‍යාහ්නයෙහි නික්මීගියේය අර්ථයි. පතිසල්ලීනො ඒ ඒ රූපාදි ගෝචරයෙන් සිත හකුළා ගෙන සැඟවී ධ්‍යානාශා සේවන වශයෙන් හුදෙකලා අංග වශයෙන් මනොභාවනීයානං මනවඩවන ආවර්ජනය කරන්නහුගේ. සිහිකරන්නහුගේ සිත නීවරණ යන්ගෙන් මිදේද නැමේද වැඩේද. යාවතා යම්පමණ අයං තෙසං අඤ්ඤතරො මේ ඔවුන්ගේ අභ්‍යන්තරවශයෙන් එක් ශ්‍රාවකයෙකි. අපෙවනාම ඔහුගේ පැමිණීම පතමින් කීය. ප්‍රාර්ථනාකරණය සන්දකසූත්‍රයෙහි කියන ලද්දේමය. එතදවොච මේ ගෘහපතියා මඳ ප්‍රඥා ඇත්තේය. දහම් කථාවෙන් ඔහුට සංග්‍රහ කොට තමාගේ ශ්‍රාවකයකු කරන්නෙමියි හඟිමින් මෙසේ චතුහිබො ආදී වචන කීය. එහි පඤ්ඤපෙවි දෙමි, තබමි. සම්පන්නකුසලං පිරුණු කුසල් ඇති. පරමකුසලං උතුම් කුසල් ඇති. අයොජ්ඣං වාද යුද්ධයෙන් යුද්ධකොට සොලවන්ට නොහැකි. අචල කම්පා නොවන, ස්ථිර. නකරොති නොකිරීම් මාත්‍රයම කියයි. මෙහි සංවර ප්‍රහාණය හෝ සිහිය ගැන නොකියයි. සෙසු පදයන්හිද මේ ක්‍රමයයි නෙව අභිනන්දි තිර්ථකයෝ නම් දැන ද නොදැනද ඒ ඒ දේ කියතියි හඟිමින් සතුටු නොවීය. නපටික්කොසි ශාසනයට අනුකූලවූවක් මෙන් ප්‍රසන්නවූ ආකාරයක් මෙන් කියතියි හඟිමින් ප්‍රතික්ෂේප නොකළේය. යථා උග්ගාහමානස්ස ඔහුගේ වචනය මෙසේ වන කල්හි උඩුබැල්ලෙන් නිදන දරුවා පැරදවිය නොහැකි ශ්‍රමණයෙක් ස්ථිර ශ්‍රමණයෙක් වන්නේය. අපි මෙසේ නොකියමුයි පැහැදිලිකරයි. කායොතිපි නහොති තමාගේ කය කියා හෝ අනුන්ගේ කය කියා හෝ විශේෂ ඥානයක් නොවේ. අඤ්ඤත්‍ර ඵන්දිතාමත්තා ඇතිරිල්ලෙහි රැලි ගැවීමෙන් හෝ මකුණන් ආදීන් දෂ්ටකිරීමෙන් හෝ සිරුර ගැහීමක්

වෙයි. එය හැරුණුවිට වෙනත් කයින් කෙරෙන කර්මයක් නම් නැත. එයද කෙලෙස් සහිත සිතින්ම වෙයි. වාචාතිපි නාහොසි මිථ්‍යාවාචා සම්වාචා යැයි නානාත්වයක් නොවේ. රොදිතමත්තා කුසගින්නෙන් පිපාසයෙන් පෙළුණුහුට හැඬීම් මාත්‍රයක් වෙයි. එයද කෙලෙස් සහිත සිතින්ම වෙයි. සඞ්කප්පො මිථ්‍යා සංකල්ප සම්‍යක් සංකල්පයැයි කියාද නානාත්වයක් නොවේ. විකූජිතමත්ත යනු සිනාසීම් මාත්‍රයක් වේ. කුඩාදරුවන්ට චිත්තාරම්මණයක් පවතී. නිරයෙන් පැමිණියාහු නිරාදුක සිහිකොට හඬත් දෙව්ලොවින් පැමිණියාහු සිනාසෙත්. එයද කෙලෙස් සහිත සිතින්ම වෙයි. ආජීවො මිථ්‍යාජීවය සම්මාජීවය කියා නානාත්වයක් නැත. අඤ්ඤත්‍ර මාතුථඤ්ඤා කිරි වැරූ දරුවෝ වෙති. මව කිරිපොවත්දී නොබී අන්දෙයක් කරනකල්හි පිටිපසින් අවුත් කිරිබොත්. මෙයහැර අන්‍ය මිථ්‍යාජීවයක් නැත. මෙයද කෙලෙස් සහිත සිතින්ම වෙතියි දක්වයි. මෙසේ පරිබ්‍රාජකවාදය ප්‍රතික්ෂේප කොට දූන් මෙතෙමේ සෙඛභූමියෙහි මාතිකාවක් තබන්නේ චතූහි ඛො අහං ආදිය කීය. එහි සමධිගය්හ තිට්ඨති විශේෂ කොටස වී. න කායෙන පාපං ආදිතන්හි හුදෙක් නොකිරීම් මාත්‍රය පමණක් නොවේ. භාග්‍යවතුන් වහන්සේ මෙහි සංවර පහාණ පටිසංඛා පනාවන සේක. ඒ සඳහාම කීසේක. නචෙව සම්පන්න කුසලං ආදිය ක්ෂිණාශ්‍රවයා සඳහා කියන ලදී. දූන් අසේඛභූමියෙහි මාතිකාවක් තබන්නේ දසහි ඛො අහං යනාදිය කීය එහි පදතුන නිසා ප්‍රථම චතුෂ්ක දෙක තබනලදී. එක්පදයක් නිසා පශ්චිම චතුෂ්ක දෙකක් තබන ලදී. මේ අසෙඛ භූමියෙහි මාතිකාවයි. දූන් එය බෙදන්නේ කතමෙච ගහපති අකුසල සීලා ආදිය කීය. එහි සරාගං යනු අෂ්ටවිධ ලොභසහගත සිතයි. සදොසං යනු පටිඝ සම්ප්‍රයුක්ත සිත් දෙකයි. සමොහං යනු විචිකිච්ඡා උද්ධච්ච සහගත සිත්දෙකද වටී. සියලු අකුසල සිත්ද වටී. මෝහය සියලු අකුසල් උපදවතියි කියන ලදී. ඉතො සමුට්ඨානා මෙයින් රාගාදි සිතින් නැගී සිටීමයි. මොවුන්ගේ උත්පත්තියනුයි ඉතො සමුට්ඨානා. කුහිං කිනම් තැනකට පැමිණ ඉතිරි නොකොට නිරුද්ධ වෙත්ද, එත්ථෙ සෝතාපත්ති ඵලයෙහි පදනම වූ ප්‍රතිමෝක්ෂ සංවර ශීලය සෝතාපත්ති ඵලයෙහිදී පිරිපුන්වෙයි. ස්ථානයට පැමිණ අකුසල ශීලය ශේෂනොකොට නිරුද්ධ වෙයි. අකුසල ශීලය යනු දුස්සීලයට සමාන වචනයකියි දතයුතුය. අකුසලානං සීලානං අකුශල ශීලයන්ගේ නිරෝධය පිණිස පිළිපන්නේ. මෙහි සෝවාන් පලයතෙක් නිරෝධය පිණිස පිළිපන්නේ නම් වෙයි. ඵලයට පැමිණියහු

විසින් ඒවා නිරෝධ කරනලද්දේ නම්වෙයි. වීතරාගං ආදීන්ගෙන් අෂ්ටවිධ කාමාවචර කුසල චිත්තයම කියනලදී. මෙයින් කුසලසීලය පැනනගී. සීලවාහොති සීලසම්පන්න ගුණ සම්පන්න වෙයි. සීලසමය නොවේ. මෙය මෙපමණකින් මින් මත්තෙහි කළයුත්තක් නැත. මෙසේ සීලසමය නොවේ. යත්ථස්ස තෙ රහත්ඵලයෙහි පදනම. අර්හත්ඵලයට පැමිණ කුසලසීලය ඉතිරි නොකොට නිරුද්ධ වේ. නිරෝධාය පටිපනෙන මෙහි අර්හත් මාර්ගය තෙක් නිරෝධය පිණිස පිළිපන්නේනම් වේ. ඵලයට පැමිණියාහු විසින් ඒවා නිරුද්ධ කරන ලද්දේ වෙයි. කාම සඤ්ඤ ආදීයෙහි කාමසඤ්ඤා යනු අෂ්ට ලෝභ සහගත සිත්සහිත විය. ඉතිරි දෙක දොමනස්ස සහගත චිත්තද්වය සමග උපන්නේය. පඨමජ්ඣානං අනාගාමි ඵලයෙහි ප්‍රථමධ්‍යානයයි. එත්ථෙතෙ අනාගාමි ඵලයෙහි පදනමයි. අනාගාමි ඵලයට අකුශල සංකල්ප ඉතිරිනොකොට නිරුද්ධ වෙයි. නිරෝධාය පටිපනෙනා මෙහි අනාගාමි මාර්ගය තෙක් නිරොධය පිණිස පිළිපන්නේ නම්වෙයි. ඵලයට පැමිණියහු විසින් ඒවා නිරුද්ධ කරන ලද්දේ වෙයි. නෙක්ඛම්ම සඤ්ඤදයො අෂ්ට කාමාවචර කුසල සහිත සඤ්ඤා තුන එත්ථතෙ අර්හත් ඵලයෙහි පදනමය. ද්විතීය ධ්‍යානික අර්හත් ඵලයට පැමිණ කුශල සංකල්ප ඉතිරිනොකොට නිරුද්ධ වේ. නිරොධාය පටිපනෙනා මෙහි අර්හත් මාර්ගය තෙක් නිරෝධය පිණිස පිළිපන්නේ නම් වේ. ඵලයට පැමිණියහු විසින් නිරුද්ධ කරන ලද්දේ වෙයි. සෙස්ස සැමතැන නොගැඹුරුමය.

## අටවැනි සමණ මණ්ඩක සූත්‍රයයි.

## 2.3.9

එවමෙමසුතං යනු චූලසකුලුදායි සූත්‍රයයි එහි යදාපන භනෙත භගවා මෙය පරිබ්‍රාජකයා ධර්මකතාවක් අසනු කැමැත්තේ භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනාකිරීමට කැමති බව දක්වන්නේ කීය. තං යෙවෙත්ථ පටිභාතු ඉදින් ධර්මය අසන්ට කැමැත්තේ වෙහිනම් ඔබම මෙහිදී එක් ප්‍රශ්නයක් එක්කරුණක් ඉදිරිපත් කෙරේවා යථා මං පටිභාසෙය්‍ය යම් කරුණකින් ධර්ම දේශනාව ඉදිරිපත් කෙරේනම් එම කරුණින්ම කතාව හටගත් කල්හි සුවසේ ධර්මය දේශනා කෙරේවායි දක්වයි. තසස මය්හං භනෙත හේ ඔහු

කුපිතවූ බවදැක ඉදින් භාග්‍යවතුන් වහන්සේ මෙහි වූසේක්නම්, මේ මේ කියුදෙයෙහි අර්ථයයි පහන් දහසක් දල්වා මෙන් අද මට ප්‍රකට කරන සේකැයි දසබලධාරීන් වහන්සේම සිහි කෙළෙමි. ඒනිසා **තසස මයහං භනෙත** ආදිය කීය. එහි **අහොනුන** යනු සිහිකිරීම් අර්ථයෙහි නිපාත දෙකකි. භාග්‍යවතුන් වහන්සේ සිහි කරන ඔහුට මෙසේ සිතුණේය. අනේ භාග්‍යවතුන් වහන්සේ අනේ සුගතයන් වහන්සේ **යො ඉමෙසං** යමෙක් මේ ධර්මයන් පිළිබඳව දක්ෂයෙක්ය, මනා දක්ෂයෙක්ය, නිපුණයෙක්ය, ඡේකයෙක්ය, ඒ භාගවතුන් වහන්සේ අනේ කියන්නේනම් මැනවි, ඒ සුගතයන් වහන්සේ අනේ කියන්නේ නම් මැනවි, භාග්‍යවතුන් වහන්සේගේ පෙරවිසූ කඳ පිළිවෙළ දන්නා නුවණට නොයෙක් කල්ප කෝටි සිය දහස් ගණනක් එකයායට පැහැදිළි විය යනු මෙහි අදහසයි. **තසසවාහං පුබබනතං ආරබභ** යමෙක් ලාභියෙක් වේද. හේ පෙර ඔබ ක්ෂත්‍රියෙක් වූයෙහිය, බ්‍රාහ්මණයෙක් වූයෙහි යයි කී කල්හි ඒ ගැන දන්නේ සකසා අසන්ට කැමතිවෙයි. ලාභී නොවන්නෙක් මෙසේ වන්නේය. මෙසේ වන්නේයයි කීකල්හි හේ සසලවූ බවක් පමණක් පෙන්වයි. ඒනිසා මෙසේ කීය. මම ඔහුගේ පූර්වාන්තය අරබයා ප්‍රශ්නය විසඳීමෙන් සිත ගන්නෙමි නම් මැනවි. **සොවා මං අපරනතං** දිවැස් ලාභියාට අනාගතය පිළිබඳවූ දැනුමක් පහළවෙයි. ඒනිසා මෙසේ කීය. අනික පෙර කියූ ක්‍රමයමැයි **ධමමං දෙසිසසාමි** මෙතෙමේ අතීතයෙහි දේශනා කරනු ලැබුයේ වුවද අවබෝධකර නොගන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෘදු සියුම් ප්‍රත්‍යයාකාරය දේශනා කරනු කැමති සේක් මෙසේ කීහ. **කිංපනතං භුඤ්ජිසසති** මෙය පමණක් අවබෝධ නො කරන්නේ ය. අනාගතයෙහි ඔහුගේ වාසනාවට හේතුවක්ද වන්නේ ය. මේ එහි කතාවයි : එක් යකින්නක් තම දෙදරුවන් ථූපාරම දොරටුවෙහි හිඳුවා අහර සොයනු පිණිස නගරයට ගියාය. දරුවෝ එක් පිඬුසිඟායන තෙරනමක් දැක මෙසේ කීහ, ස්වාමීනි අපගේ මව ඇතුළුනුවරට පිවිසියාය. ඇයට මෙසේ කියනු මැනවි. ලැබුණු ලැබුණු දෙයක් අරගෙන ඉක්මනට යන්න. තිගේ දරුවෝ කුසගින්න දරාගන්නට නොහැක්කෝය. මම ඇය කෙසේ දැක ගන්නෙම්ද. ස්වාමීනි මෙය ගන්නැයි එක් මුල්කැබැල්ලක් දුන්හ. තෙරුන්ට යකුන් දහස් ගණනක් දක්නට හැකිවිය. උන්වහන්සේ දරුවන් විසින් දෙන ලද සලකුණින් විරූපී පිළිකුල් කටයුතු කෙවුල් වීදියෙහි ගැබ්මල ගැන බලාසිටින ඒ යකින්න දුටහ.

දැක ඒ බව දැන්වූහ. ඔබ වහන්සේ කෙසේ මා දකින්දැයි කීකල්හි මුල්කැබැල්ල පෙන්වූහ. ඇ එය පැහැර ගත්තාය. මෙසේ පාංශු පිශාචයෝ එක් මුලක්ගෙන නොපෙනෙන සිරුර ඇත්තාහු වෙති. ඒ සඳහා එකම පාංශු පිශාචයකු වත් නොදකිමියි කීහ. **පක්ඛායති** නොපෙනේ. නොවැටහේ. **දීඝාපි බො තෙ උදායි** මේ ඔබගේ වචනය දිග වියහැකිය. මෙසේ කියන්නහුට වර්ෂ සියයක් හෝ වර්ෂ දහසක් වුවත් පැවතිය හැකියැයි අර්ථය පැහැදිලි කළ යුතුය. යන අදහසයි. **අප්පාටිහීරකතං** අනෛර්යාණික, අමූලක. නිරර්ථක තත්වයට පැමිණේය යන අර්ථය. දැන් ඒ වර්ණය දක්වන්නේ **සෙය්‍යථාපි භනෙත** ආදිය කීය. එහි **පණ්ඩුකම්බලෙනික්ඛනෙතා** අසමාන වර්ණ ඇති පඬු ඇඹුලෙහි තබන ලද්දේ **එවං වණ්ණො අත්තා හොති හේ සුභකිණ්ණ** දිව්‍ය ලෝකයෙහි උපන් ස්කන්ධ සඳහා අප මළකල්හි සුභ කිණ්ණ දිව්‍යලෝකයෙහි අන්තය ඇති ස්කන්ධ මෙන් බැබලේ යැයි කියයි. **අයං ඉමෙසං උභින්නං** යම් හෙයකින් මැණිකෙහි දීප්තිය පිටතට නොනික්මේද, කණාමැදිරියාගේ අඟලක් දෙකක් හතරක් පමණට නික්මේද, මහා කණාමැදිරියාගේ කමත දක්වා නික්මේ මය. ඒනිසා මෙසේ කීය. **විදෙධ** බිඳීගිය වලාකුළු පහවීමෙන් දුරීභූතවූ කල්හි යන අර්ථයි. **විගතවලාහකෙ** වැඩිවලාකුළු ඉවත්වූ කල්හි දෙවෙ අහසෙහි, **ඔසධී තාරකා** සුදුතරුව එය උදාවූකල්හි පටන් ඒ සලකුණින් යම්හෙයකින් ඖෂධ ගනී ද පානය කරයිද ඒනිසා ඕසධී තාරකා යයි කියනු ලැබේ. **අභිදො අඩ්ඪරත්තසමයං** නොබිඳුණු මැදියම් කල්හි, අහස් ගැබෙහි සිටි චන්ද්‍රයා දක්වයි. **අභිදො මජ්ඣන්තිකෙපි** එම ක්‍රමය මැයි, **අතොබො** යමෙක් අනුභව කරත්ද ඔවුන්ගෙන් බහුතරය බොහෝ ද බහුතරද යන අර්ථයි. **ආභායනානුභොන්ති** ආලෝකය වැළඳනොගනී. තමාගේ ශරීරාලෝකයෙන්ම ආලෝකය පතුරුවා වාසය කරත්. දැන් ඔහු කුමක්නිසා ඒකාන්ත සුඛ ඇති ලෝකය ගැන අසන්නෙමියි හුන්නේ ඇසීම් මුළාබවට පත්වූයේද, ඒනිසා භාග්‍යවතුන් වහන්සේ ඔහුට ඒ ප්‍රශ්නය සිහිකරන සේක් **කිංපන උදායි අත්ථි එකනත සුඛො ලොකො** ආදිය කීසේක. මෙහි **ආකාරවතී** යනු කාරණා ඇති. **අඤ්ඤතරංවාපන තපොගුණං** අචේලක පෙළ සඳහා කීහ. කුමක්නිසා අසයිද? ඔහුට මෙසේ සිතිණ. අපිද තමන්ට ඒකාන්ත සුඛයයි කියමු. ප්‍රතිපදාව කලකට සැපය කලකට දුකයැයි කියමු. ඒකාන්ත සුඛ ඇති තමාගේ ප්‍රතිපදාවද ඒකාන්ත සුඛ වියයුතුයි. අපගේ කථාව

අනෛර්යාණිකය ශාස්තෘන් වහන්සේගේ කථා නෛර්යාණිකය. දූන් ශාස්තෘන් වහන්සේම විචාරා දූන ගන්නෙමියි ඒනිසා විචාරයි. **එත්ථමයං අනස්සාම** මේ කරුණෙහිදී අපි නසින්නෙමු: මෙසේ කුමක් නිසා කීවාහුද? ඔවුහු පූර්වයෙහි ධර්මපසක පිහිටා කිසුණු පිරියම් කොට තෘතිය ධ්‍යානය උපදවා ගෙන නොපිරිහුන් ධ්‍යානයෙන් කලුරිය කොට සුභකිණ්ණයෙහි උපදිතියි දනිති. කල්යත්යත්ම කසිණ පරිකර්මය වත් නොදත්හ. තෘතීයධ්‍යානයවත් උපදවාගන්ට නොහැකිවූහ. පූර්වභාග ධර්ම පස ආකාරවතී ප්‍රතිපදා යැයි උගෙන තෘතීය ධ්‍යානය ඒකාන්ත සුඛ ලෝකය යැයි උගත්හ. ඒ නිසා මෙසේ කීහ. **උත්තරීතරං** මෙයින් පංචධර්මයට වඩා උත්තරීතරවූ ඒකාන්තසුඛ ලෝකයක් හෝ නොදනිමුයි කියන ලද්දේවෙයි. **අප්ප සද්දෙ කත්වා** එකපහරින්ම මහා ශබ්දයක් කිරීමට ඇරඹුවන් නිශ්ශබ්ද කොට, **සච්ඡිකිරියා හෙතු** මෙහි පටිලාභ සච්ඡිකිරියා. පච්චක්ඛ සච්ඡිකිරියා යනුවෙන් සච්ඡිකිරියා දෙකකි. සතරවැනි තෘතීය ධ්‍යානය උපදවා නොපිරිහුන් ධවානයෙන් කලුරිය කොට සුභකිණ්ණ ලෝකයෙහි ඒ දෙව්වරුන්ගේ සම ආයුවර්ණ ඇතිව උපදී. මෙය පටිලාභ සච්ඡිකිරියානම් චතුර්ධ්‍යානය උපදවා ඍද්ධි විකුර්වණයෙන් සුභකිණණ ලෝකයට ගොස් ඒ දෙවියන් සමග සිටී කථාකරයි සාකච්ඡාවට එළඹෙයි. මෙය පච්චක්ඛ සච්ඡිකිරියා නම් ඔවුන් දෙදෙනගේම තෘතීයධ්‍යානය ආකාරවතී ප්‍රතිපදවනම් එය නූපදවා සුභ කිණණ ලෝකයෙහි උපදින්ට නොහැකිය. චතුර්ථ ධ්‍යානය උපදවන්ටද නොහැකිය. මෙසේ මේ දෙවැදෑරුම් සච්ඡකිරියා සඳහා ස්වාමීනි මේ ඒකාන්ත සුඛ ලෝකයෙහි සච්ජිකිරියාව වේවායි කීය. **උදෙක නිකතො** ජලය අදින්නෙක් **අන්තරායමකාසි** යම්සේ පැවිදිබව නොලබාද එසේ බාධා ඇත්තෙකු කළේය. උපනිශ්‍රය නැත්තකු යම්සේද එසේ කළේය. මොහු වනාහි කාශ්‍යප බුදුරදුන්ගේ කාලයෙහි පැවිදිව මහණදම් පිරුවේය. ඉක්බිති ඔහුගේ යහළු භික්ෂුවක් සසුනෙහි නොඇලුණෝ ඇවැත්නි සිවුරු හරින්නෙමියි දූන්විය. හේ ඔහුගේ පාසිවුරු කෙරෙහි ලෝභය උපදවාගෙන ගිහි බවෙහි ගුණ කීය. අනිකා ඔහුට පාසිවරුදී සිවුරු හළේය. ඔහුට මේ කර්මය නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් කලින් සූත්‍රය අතිරේක බණවරපමණක්ද මෙම බණවර පමණක් දූයි මෙපමණකින් ත්‍රිපිටකයෙහි ධර්මය දේශනා කරන ලද්දේය. එක් දේශනාවකින් වත් මාර්ගඵල ප්‍රතිවේධයක් නොවීය. අනාගතයෙහි ඔහුට

හේතුවක් වන්නේ යයි භාග්‍යවතුන් වහන්සේ ධර්මය දෙසූසේක. අනාගතයෙහි ඔහු ගේ හේතුසම්පන්න භාවය දැක භාග්‍යවතුන් වහන්සේ ජීවත්ව සිටිමින්ම එක්භික්ෂුවක්වත් මෙතතා විහාරීයැයි අග්‍රස්ථානයෙහි නොතැබූසේක. භාග්‍යවතුන් වහන්සේ අනාගතයෙහි මොහු මාගේ ශාසනයෙහි පැවිදිව මෙත්තා විහාරීන්ට අග්‍රවන්නේ යයි දකින සේක. හෙතෙමේද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි ධර්මාශෝක රජුගේ කාලයේදී පාටලීපුත්‍රයෙහි ඉපිද පැවිදිව රහත්බවට පත්ව අස්සගුත්ත තෙර නම් වී මෙත්තා විහාරීන්ට අග්‍රවිය. තෙරුන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් තිරිසන් සත්තුද මෛත්‍රී සිත්ලැබූහ. තෙරුන්වහන්සේ සියලු දඹදිව භික්ෂු සංඝයාගේ අවවාද දෙන ගුරුවරයා වී වත්තනිය සේනාසනයෙහි විසූහ. තිස් යොදුන් පමණ වනයෙහි එක් ප්‍රධාන ගෙයක් විය. තෙරුන් වහන්සේ අහසෙහි සම්කඩක් එලා එහි උන්නාහු කමටහන් කියති. කල්යත්යත්ම පිඩුසිඟා වත් නොගොස් විහාරයෙහි හිඳ කමටහන් කියූහ. මිනිස්සු විහාරයටම ගොස් දන්දුන්හ. ධර්මාශෝක රජ තෙරුන්ගේ ගුණ අසා දකිනු කැමැත්තේ තෙවරක් පණිවුඩ යැවීය. තෙරුන්වහන්සේ භික්ෂු සංඝයාට අවවාද දෙමියි එක්වරක්වත් නොගියහ.

## නවවැනි චූළසකුලුදායී සූත්‍රයයි.

## 2.3.10

එවමෙමසුතං යනු වෙඛනසස සූත්‍රයයි. එහි වෙඛනසස මොහු සකුලුදායීගේ ගුරුවරයාය. හේ සකුලුදායී පරිබ්‍රාජකයා පරම වර්ණ ප්‍රශ්නයේදී පරාජිතවූයේ යයි අසා මා විසින් ඔහු මනාසේ උගන්වන ලද්දේය. ඔහු විසින්ද මැනවින් ඉගෙන ගත්තා ලදී. පැරදුණේ කෙසේද? මම තෙමේම ගොස් ශ්‍රමණ ගෞතමයන්ගෙන් පරම වර්ණ ප්‍රශ්නය විචාරා හොඳින් දැනගන්නෙමියි රජගහනුවරසිට යොදුන් හතළිස් පහක් සැවතට ගොස් භාගයවතුන් වහන්සේ යම්තැනකද එතැනට එළැඹියේය. එළඹ සිටියේම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි උදානයක් ඇනීය. එහි පෙර සේයැයි කියන ලද පරිදි දතයුතුය. පඤ්චවබො ඉමෙ යයි කුමක් නිසා

ඇරඹුසේක්ද, ගිහියන්ගෙන් සමහරු කාමයටගරු කරන්නෝය. කාමයෙහි ගැලුණෝ වෙති. සමහරු නෛෂ්ක්‍රම්‍යයට ගරු කරන්නෝය නෛෂ්ක්‍රම්‍යයෙහි ගිලුණෝය. මේ කාම ගරුකයා, කාමාධිමුක්තයා මේ කතාව කියනු ලබන කල්හි තමා කාමාධි මුත්ත බැවින් එය සලකන්නේය. මෙසේ ඔහුට මේ දේශනාව සත්ප්‍රාය වෙතියි මේ දේශනාව ඇරඹුසේක. කාමගගසුඛං නිර්වාණය අදහස් කරන ලදී. පාපිතො භවිසසති නොදන්නා බවට පමුණුවන ලද්දේ වෙයි. ලාමකබවටම පැමිණේනුයි තිරිසන් වචනයටම පැමිණෙයි. තිටඨතු පුබබනෙතා තිටඨතු අපරනෙතා යම්හෙයකින් තාගේ අතීත කතාවට සුදුසු දිබ්බචක්ඛුඥානයක් නැත. ඒනිසා මේ දෙකම සිටීවායි කීය. සුත්තබන්‍ධනෙහි නූල් බැඳීම් වලින් ඔහුගේ ආරක්ෂාව පිණිස අත්පාවල ද ගෙලෙහිද නූල් බඳිති. ඒවා සඳහා මෙසේ කියනලදී. මහලුකල ඔහුගේ ඒ නූල් තෙමේම කුණුවී මිදෙයි. කඩා හෝ ඉවත් කරති. එවමෙව බො මෙයින් මෙය දක්වයි. ළදරුවාගේ නූල් බැඳීම නොදන්නා කාලය අවිද්‍යාවෙහි මුල්කොන නොදැනීම මෙනි. අවිද්‍යා වෙහි මුල්කොන දතනොහැකිය. මුදනකල දැනීම අර්හත් මාර්ගයෙන් අවිද්‍යා බන්ධනයෙහි මිදීම වීයයි දැනීම මෙනි. සෙස්ස සියලුතැන නොගැඹුරුමය.

**දසවැනි වෙඛනසස සූත්‍රයයි**
**තෙවැනි වර්ගය නිමියේය.**

## 2.4.1

එවමෙමංසුතං යනු ඝටීකාර සූත්‍රයයි. එහි සිතං පාත්වාකාසි මහමගින් යන්නේ එක්තරා බිම් පෙදෙසක් බලා සැරිසරන මා මෙහි විසූවිරූ බවක් ඇත්දැයි ආවර්ජනය කරන්නේ කාශ්‍යප බුදුන්කල මේ ස්ථානයෙහි වේහලිංගනම් ගම්නියම්ගමක් වීයයි දුටුවේය. මම එකල ජෝතිපාල නම් මානවකයෙක් වීමි. මාගේ සහායකයා ඝටීකාර නම් කුම්භකාරයෙක් විය. මා විසින් ඔහු සමග එක් යහපත් කරුණක් සිදුකරන ලදී. එය භික්ෂු සංඝයාට ප්‍රකට වුයේ නැත. වැසීතිබුණේය. එය භික්ෂු සංඝයාට ප්‍රකට කරමියි මගින් ඉවත්ව එක්තරා පෙදෙසක සිටිමින් සිනාපහළ කළේය. දත් අග පෙන්වා මඳ සිනාවක් පෑවේය. යම්සේ ලෞකික මනුෂ්‍යයෝ උදරයට ගසන්නා කොහිද කොහිදැයි සිනාසෙත් බුදුවරු එසේ නොවෙති. බුදුවරුන්ගේ සිනාව තුටු පහටු මාත්‍රයක්ම වෙයි. මෙය හසිත නම් වේ මෙය සොමනස්ස සහගත සිත් කෙළෙසකින් වෙයි. එහි ලෞකික මහජනයා අකුසල වශයෙන් සතරකින්ද, කාමාවචර කුසල වශයෙන් සතරකින්දැයි සිත් අටකින් සිනාසෙයි. සේඛයෝ අකුශල වශයෙන් දිට්ඨි සම්පයුත්ත දෙකක් ඉවත් කොට සිත් සයකින් සිනාසෙත්. ක්ෂීණශ්‍රවයෝ සහේතුක කිරිය සිත් සතරින් එක් අහේතුක කිරිය සිතකින්ද යනුවෙන් සිත් පසකින් සිනාසෙත්. ඒ අතරද බලවත් අරමුණක් පහළවු කල්හි ඤාණ සමපයුත්ත සිත් දෙකකින් සිනාසෙත්. දුර්වල අරමුණෙහි ද්විහේතුක සිත් දෙකින්ද, අහේතුක සිතින්ද යන සිත් තුනෙන් සිනාසෙත්. මෙතැන කිරියා හේතුක මනෝවිඤ්ඤාණ ධාතු සොමනස්ස සහගත සිත භාග්‍යවතුන් වහන්සේට උපස්ථ ආකාර මාත්‍රවූ සිනාව ඉපදවීය. ඒ මේ හසිතයයි මෙසේ අල්ප මාත්‍රයක් තෙරුන්ට ප්‍රකටවිය. එබඳු කලෙක තථාගතයන් වහන්සේගේ සිව් දළදාවන් ගෙන් චාතුර්ද්වීපික මහා මේඝ මුඛයෙන් අකුණු සහිත විදුලියක් මෙන් බබලමින් මහතල් කඳක් පමණ වු රශ්මිමාලා නැගී තෙවරක් උතුම්වු සිරස පැදකුණු කොට දළදාවන්හි අතුරුදහන් වන්නේ කෙසේද. ඒ සලකුණින් ආයුෂ්මත් ආනන්ද තෙරුණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ පසුපසින් යමිනුත් සිනාපහළ වු බව දනිති. භගවනතං එතද වොච මෙහිදී කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට අවවාද කළසේක. චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. භාග්‍යවතුන් වහන්සේටද මෙහි වැඩසිටීමට ආශාවක්

උපදවන්නෙමියි මේ භූමිභාගය බුදුවරුන් දෙනමක විසින් පරිභෝජනය කරනලද්දේ වන්නේය. මහජනයා ගඳමල් ආදියෙන් පුද චෛත්‍යස්ථානයක් කොට පිරිවරන්නාහු ස්වර්ග පරායණ වන්නාහුයයි සිතා **එතං තෙනහි භනෙත** ආදි වචන කීය. **මුණ්ඩකෙන සමණකෙන** මුණ්ඩං මුණ්ඩා කියාද සමණං සමණො කියාද කියන්ට වටී. මේ නම් මුහුකුරා නොගිය ඥානයක් ඇතිබැවින්ද, බ්‍රාහ්මණකුලයෙහි උගත් ව්‍යවහාර වශයෙන්ද අවමන් කරමින් මෙසේ කීය. **සොත්තිං සිනාතිං** එකල්හී ඡබ්බග්ගිය භික්ෂූහු කුරුවින්දක නම් පාෂාණ කුඩුවර්ගයක් ඇඟ ගාමින් ද, කුරුවින්දක පාෂාණ කුඩු ගැල්වූ ලණුවක දෙකොණින් අල්ලා ඇඟ උලමින්ද ස්නානය කරති. ඒ නිසා **එවංසමමා** යම්සේ දූන් මිනිස්සු චෛත්‍ය වන්දනාව පිණිස යමු, ධර්මශ්‍රවණය සඳහා යමුයි කියනු ලැබුවත් උත්සාහ නොකරති. නැටුම් සැණකෙළි ආදිය බලන්නට යමුයි කීවිට එක්වචනයෙන්ම පිළිගනිත්. සිනායිතුංති කීකල එක් වචනයෙන්ම පිළිගන්නේ මෙසේ කීය. **ජොතිපාල මාණවං ආමනෙතසි** ඝටීකාර එක් පැත්තක සිය පිරිවර සමග දිය නා අවසන් කොට හිසකෙස් පිසදමමින්ම ජෝතිපාල මාණවකයන් ඇමතීය. තමන් සමීපයේම ආසන්නයේම සිටින බව දක්වමින් **ඔවට්ටිකං විනිවෙඨෙත්වා** ඇත්බල සහිත වූ බෝධිසත්වයෝ මෙතැනින් ඉවත්වන්න යහළුව යැයි කියමින්ම ලී දඬුව පෙරලා අතහැරීය. යන තේරුමයි. **කෙසෙසු පරාමසිත්වා එතදවොච** ඔහු මෙසේ සිතීය. මේජෝතිපාල තෙමේ පැණවත්ය. වරක් දක්මක් ලදහොත් තථාගතයන් වහන්සේගේ දර්ශනයෙහිද පැහැදෙන්නේය. ධර්ම කථාවෙහිද පැහැදෙන්නේය. පැහැදුණේම පහන්වූ ආකාරයක් කරන්නට හැක්කේය. මිත්‍රයෝනම් මේ සඳහා වෙති. යම්කිසිවක් කොට මාගේ යහළුවා ගෙන දසබලධාරීන් වහන්සේ සමීපයට යන්නෙමි නම් ඒ සඳහා කෙස් පිරිමැද මෙසේ කීය. **ඉතතරජචෙචා** වෙනත් ජාති ඇත්තෙක් මා සමග අසමාන ජාති ඇත්තෙක් පහත්ජාති ඇත්තෙක් යන අර්ථයි. **නවතිදං** මේ අපගේ ගමන ඒකාන්තයෙන් පහත් දෙයක් නොවේ. කුඩා නොවේ. මහත් වන්නේය. මොහු තමාගේ ශක්තියෙන් නොගත්තේය. ශාස්තෘන් වහන්සේගේ ශක්තියෙන් ගත්තේයයි ග්‍රහණයෙහිම නිෂ්ඨාවට ගියේය. **යාවෙතදොහිපි** මෙහි දොකාර හිකාර පිකාර නිපාතයෝය. ය ඇත්තද යන අර්ථයි. මෙය කියන ලද්දේවෙයි. වචනයෙන් කථා කිරීමද ඉඟියෙන් ගැනීමත් ඉක්මවා හිසකෙස් දක්වා ග්‍රහණයද එහි ගමනාර්ථය යොදා

ගතයුතුය. ධම්මියා කථාය මෙහි සිහිය ලබනු පිණිස පූර්වෙ නිවාසයෙන් යුක්තවූ ධර්මකථාව දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ ජෝතිපාලය. ඔබ පහත් තැනකට බැසගත් සත්වයෙකි. මහාබෝමැඩදී සර්වතාඥනය ප්‍රාර්ථනා කොට බැසගත්තේය. එබන්දකුට ප්‍රමාද විහාරය යුතුනොවේයයි ආදික්‍රමයෙන් සිහි ලබනු පිණිස ධර්ම කථාවක් කීසේක. මුහුදින් එතෙර වැසි තෙරවරු මෙසේ කියති. ජොතිපාලය මම යම්සේ දස පෙරුම්පුරා සර්වඥතාඥානය අවබෝධකොට භික්ෂු පිරිවර ඇතිව ලෝකයෙහි හැසිරෙම්ද, එසේම ඔබත් දසපෙරුම්දම්පුරා සර්වඥතාඥනය අවබෝධ කොට මහණගණ පිරිවරා ලොව හැසිරෙන්නෙහිය. මෙබඳුවූ ඔබ විසින් ප්‍රමාදයට එළඹීමට යුතුනොවේයැයි ඔහුගේ සිත පැවිද්දට නැවෙන අයුරින් කාමයන්හි අදීනවද නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංසද කියන සේක. **අලත්‍ථ බො ආනන්‍ද පබ්බජ්ජං අලත්‍ථ උපසම්පදං** පැවිදිව කුමක් කළේද? බෝසත්වරු බුදුවරුන් හමුවෙහි පැවිදිවෙති. පැවිදිවී ද තිරිසන් සතුන් මෙන් හැළුණු අං ඇත්තෝ නොවෙත්. චතුපාරිශුද්ධි ශීලයෙහි පිහිටා ත්‍රිපිටක බුද්ධවචනය උගෙන කෙලෙස් ධුතාංග සමාදන්ව අරණ්‍යයට පිවිස ගතපච්චාගත වත පුරමින් මහණදම් කරන්නාහු විදර්ශනා වඩා අනුලෝම ඥාණයට පැමිණ සිටිත්. මාර්ග ඵල පිණිස වෑයම් නොකරත්. ජෝතිපාල ද එසේම කළේය. **අඩමාසූප සම්පන්නෙන** කුලදරුවකු පැවිදි කරවා අඩමසක්වත් නොවැස ගියකල්හි මා පියන්ගේ ශෝකය නොසන් සිඳේ, හෙතෙමේද පාසිවුරු හඳනා අයුරු නොදනී. තරුණ භික්ෂු සාමණේරයන් සමග විශ්වාසය නුපදී. තෙරවරුන් සමග ස්නේහය නොපිහිටයි. ගිය ගිය තැන නොඇල්ම ඇතිවේ. මෙපමණ කලක් ගෙහි සිටිකල මව්පියන් දක්නට ලැබෙයි. එයින් ඔවුන්ගේ ශෝකය තුනී බවට යයි. පාසිවුරු පරිහරණය දන්නාහු නම් සාමණේර තරුණ භික්ෂූන් සමග විශ්වාසය ඇතිවේ. තෙරවරුන්සමග ස්නේහය පිහිටයි. ගියගියතැන සතුටුවෙයි. නොකලකිරෙයි. එහෙයින් මෙපමණ කලක් වසන්ට වටී යැයි අඩමසක් වැස ගියේය. **පණ්ඩු මුට්කසස සාලිනො** මිටිබැඳ වියලූ රත්හැල් ඒ හැල් වැපුරූ තැන් පටන් මේ පෙරහරවෙයි. කුඹුරු මැනවින් සකස් කරන ලද්දේවෙයි. එහි බිජුවටතබා සුවඳ ජල ඉස්සාහ. වපුරන කලට වියනක් මෙන් මත්තෙහි පැලැල්ලක් බැඳ පැසුණු කල්හි වීකරල් කපා මිටක් තරම් මිටි බැඳ ලනු බැඳි දූලක අහසෙහිම වියලවා සුවඳසුණු අතුරා කොටුවල පුරවා වසර තුනකටවරක් විවෘතකළහ. මෙසේ

තෙවසරක් වසා තැබූ රත්හැල්, කලුඇට ඉවත්කළ සහල් ගෙන කැවිලි වර්ගද බත්ද පිළියෙල කළහ. ඒ සඳහා කියනලදී. **පණීතං ඛාදනීයං භොජනීයං - පෙ - කාලං ආරොචා පෙසි** යනුවෙන් අධිවුත්‍ථොවෙ කුමක් සඳහා කියයිද වේහලිංගයෙන් නික්මෙන කල සටීකාර තමා සමීපයෙහි වස්වැසීම පිණිස ප්‍රතිඥාවක් ලබාගත්තේය. ඒ සඳහා කියයි. **අහුදෙව අඤ්ඤථත්තං අහුදෙව දොමනස්සං** තෙමසක් දන්දෙන්නට දහම් අසන්ට මේ ක්‍රමයෙන් විසිදහසක් භික්ෂූන්ට පිළිදගුම් කරන්ට නොලදිමියි නොලැබීම අරබයා සිතෙහි වෙනස් බවක් සිත් දොම්නස් බවක් විය. තථාගතයන් වහන්සේ අරබයා නොවේ. මක්නිසාදයත්. සෝවාන් වූ බැවිනි. හෙතෙමේ පෙර බ්‍රාහ්මණ භක්තිකයෙක් විය. ඉක්බිති එක්තරා කලෙක ප්‍රත්‍යන්තය කුපිත වූ කල්හි සන්සිඳුවීම සඳහා යන්නේ උරචජද නම් දියණියට මෙසේ කීය. දරුව. අපගේ දෙවියන් කෙරෙහි පමානොවන්න. බමුණෝ ඒ රජ දියණියන් දක විසඥ වූහ. මේ කවුදයි කීවිට අපගේ දෙවියෝය දෙවියෝනම් මෙ වැන්නෝ දැයි කෙළගසා ප්‍රාසාදයට ගියාය. ඈ එක් දිනක් වීථිය දෙස බලමින් සිටියා කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයන් වහන්සේ දක කැඳවා පිඬු දී අනුමෝදනාව අසමින් සිටියදීම සෝවාන්වී තවත් භික්ෂූහු වෙත් දයි ඇසුවාය. ශාස්තෲන් වහන්සේ විසිදහසක් භික්ෂූන් සමග ඉසිපතනයෙහි වසන බව අසා ශාස්තෲන් වහන්සේට ආරාධනා කොට දානය දුන්නාය. රජ ප්‍රත්‍යන්තය සමනය කොට පැමිණියේය. ඉක්බිති ඔහුවෙත පළමුවෙන්ම බමුණෝ පැමිණ දුවගේ අගුණ කියා බිඳවූහ. රජවනාහි දුව උපන්කල්හිම වරයක් දුන්නාය. ඇයට සත් දිනකට රාජ්‍යය දියයුතුයයි වරය ගත්තාය. රජ සත්දිනකට ඇයට රාජ්‍යය පවරා දුන්නේය. ඈද ශාස්තෲන් වහන්සේ වළඳවමින් රජු කැඳවා තිරය පිටුපස හිඳවූවාය. රජතෙමේ ශාස්තෲන් වහන්සේගේ අනුමෝදනාව අසාම සෝවාන්විය. සෝවාන් වූවකුට තථාගතයන් වහන්සේ අරබයා වෛරයක් නැත. එහෙයින් කියන ලදී. **නතථාගතං ආරබ්භ යං ඉච්ඡසි තං හරතු** හෙතෙමේ බඳුන් පුළුස්සා ගනුදෙනු නොකරයි. මෙසේ කියා දරපිණිස හෝ මැටිපිණිස හෝ පිදුරු පිණිස හෝ වනයට යයි. මහජනයා සටීකාර විසින් වළං පුළුස්සන ලද්දේ යැයි අසා පිරිසිදු සහල් ලුණු. ගිතෙල් තෙල් පැණි ආදිය ගෙන එති. ඉදින් වළඳ මාහැඟි නම් මුදල් අල්පය කියක්හෝ දී ගනිමුයි නොගනිති. දහැමි වෙළෙන්දා මව්පියන් පෝෂණය කරයි. සම්මා

සම්බුදුන්ට උවටැන් කරයි. ඔහුට බොහෝ කුසල් වන්නේයයි නැවත ගොස් මිලගෙනෙති. ඉදින් වළඳ මඳක් අගනේ ගෙන ආ මුදල වැඩිය දෑහැමි වෙළෙන්දාය. අපට පින් ලැබෙන්නේ යයි ගෙන ආ පරිදිම ගෘහ පතිනිය මෙන් මනාසේ තබා යති. මෙසේ ගුණ ඇත්තා කුමකට පැවිදි වෙයිද යන රජුගේ වචන පථය පිරිසිඳින්නේ අනෙඩ මාතාපිතරො පොසෙතියි කීය. කොනුබො කොහින්ද? බත් සැළියෙන් **පරියොගා** එළවළු ඇතිලියෙන් **පරිභුඤ්ජ** අනුභව කරන්න. මොවුන් මෙසේ කියන්නේ ඇයි. සට්කාර බත් පිස ව්‍යංජන සාදා මවු පියන් කවා තමාද කා භාග්‍යවතුන් වහන්සේට වඩනා බත් හොඳින් තබා අසුනක් පනවා ආධාරකයක් පිරිනමා ජලය එළවා මව්පියන්ට සංඥාවක් කොට වනයට යයි. ඒනිසා මෙසේ කියති. **අභිවිසසත්ථො** බොහෝ විශ්වාස යන අර්ථයි. **පීතිසුඛං නවිජහති** නිරන්තරයෙන් අත් නොහරී. ඉක්බිති රෑකල්හි හෝ දිවාකල්හිහෝ ගමෙහි හෝ අරණ්‍යයෙහි හෝ යම් යම් ක්ෂණයෙක දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර පුද්ගලයා මාගේ ගෙට පිවිස තමඅතින් ආමිෂය ගෙන වැළඳූසේක. **ලාභාවතමෙ** මට ඒකාන්තයෙන් ලාභයෙකැයි සිහිකරයි. ඒ ඒ මෙහොතෙහි පස්වණක් ප්‍රීතිය උපදී. ඒ සඳහා මෙය කියන ලදී. **කලොපියා** පැසින්: කුමක්නිසා භාග්‍යවතුන් වහන්සේ මෙසේ කළ සේක්ද, භික්ෂූන්ගේ පාත්‍රයෙහි බත් හා සමාන ධාර්මික ප්‍රත්‍යයෙකි. ඒනිසා එසේ කළසේක. ශික්ෂාපද පැනවීමද ශ්‍රාවකයන්ටමය. බුදුවරුන්ට ශික්ෂාපද වේලාවක් නැත. රජුගේ උයනෙහි මල්පල ඇත. ඒවා ගන්නා අන්‍යයන්ට නිග්‍රහ කරත්. රජ රිසිපරිදි පරිභෝජනය කරයි. මේ මෙබඳු සම්පතකි. මුහුදින් එතර වැසි තෙරවරු දෙවියෝ පිළිගෙන දුන්හයි කියති. **හරථ භනෙත හරථභද්‍රමුඛ** අපගේ පුත්‍රයා කොහි ගියේ දෑයි කීකල්හි දශබල ධාරීන් වහන්සේ සමීපයට යයි. කියයි කොහිද යන්නේ. ශාස්තෘන් වහන්සේ වසන තැනට වඩින බවවත් නොදනියයි පුත්‍රයා අපරාධයක් කළේය යන සංඥාව ඇත්තාහු යයි ගැනීමෙහි සතුටු සිතැත්තාහු මෙසේ කීහ. **තෙමාසං ආකාසච්ඡදනං අට්ඨාසි** භාග්‍යවතුන් වහන්සේ වස්සතර මාසයෙහි එක්මසක් ඉක්මවා තණකොළ ගෙන්වා ගත්සේක. ඒනිසා මෙසේ කීහ. මේ මෙහි පදාර්ථයයි ආකාසච්ඡදනය මොහුට නුයි ආකාසච්ජදනං නවාතිවසසි හුදෙක් වැඩියෙන් නොවැස්සේය. එළිපතට ජලය හෙළන ස්ථානය ඇතුළත එක් ජලබිඳුවක් වත් වැඩිපුර වැස්සේනැත. මෙසේ ඝන සෙවන ඇතිගෙය

ඇතුළත මෙන් වාතයවත් අව්වවත් කිසිදු බාධකයක් කළේ නැත. ප්‍රකෘති ඍතු පැතුරුම පමණක් විය. පසුකලෙක ඒ නියම්ගමෙහි අත්හැර දැමුවද ඒ ස්ථානය අනො වස්සක - වැසිනොවැටෙන තැනක්ම විය. මිනිස්සු කර්මාන්ත කරන්නාහු වැසිවසින විට එහි රෙදි තබා කර්මාන්ත කරති. කල්පය පවත්නා තෙක් ඒ ස්ථානය එපරිද්දම වන්නේය. එයද තථාගතයන් වහන්සේගේ ඍද්ධි ආනුභාවයෙන් නොව ඔවුන්ගේම ගුණ සම්පත්තියෙන් වූවකි. ඔවුන්ට සම්මා සම්බුදුන් වහන්සේ කිසියම් තැනක නොලබෙත්නම් අන්ධවූ අප දෙදෙනාගේ නිවස වහල ඉවත්කරවී යැයි ඒ කරුණ හේතු කොට දොම්නසක් ඉපදුණේ නැත. දෙවියන් සහිත ලෝකයෙහි අග්‍රපුද්ගලයා අපගේ නිවසින් තණකොළ ගෙන්වා ගඳකිළිය වැස්වූහයි ඔවුන්ට අනල්පවූ බලවත් සොම්නසක් උපන්නේය. මෙසේ ඔවුන්ගේම ගුණ සම්පත්තියෙන් මෙම ප්‍රාතිහාර්යය ඇතිවිණැයි දතයුතුය. **තණ්ඩුලවාහ සතානි** මෙහි ගැල්දෙකක් එක් වාහයක්යැයි දතයුතුය. **තදාපිකංච සූපෙයාං** ව්‍යඤ්ජන පිණිස එයට සුදුසු තෙල්පැණි ආදියෙන් භික්ෂූන් දහසකට තෙමසක් සඳහා දන්වැට වන්නේ යයි යන හැඟීමෙන් රජතෙමේ මෙපමණක් එවීය. **අලමෙම රඤ‍්ඤොදාවහොතු** කුමක්නිසා ප්‍රතික්ෂේප කළේද. අධිගම අල්පේච්ඡතාව නිසාය. ඔහුට මෙසේ සිතක් ඇතිවිය. මම රජු විසින් නොදන්නා ලද්දෙමි. එවුවේ කෙසේද. ඉන්පසු මෙසේ සිතීය. ශාස්තෘන් වහන්සේ බරණැසට වැඩිසේක. ඒකාන්තයෙන් උන්වහන්සේ රජුවිසින් වස්වසනු පිණිස ඉල්ලාසිටිනු ලබන්නේ මා හට ප්‍රතිඥා දුන්බව දන්වා මාගේ ගුණ කථාව කියුසේක. ගුණකථාවෙන් ලද ලාභය නළුවා නටා ලැබූ ලාභය මෙන්ද ගායකයා ගයා ලැබූ ලාභය මෙන්ද වෙයි. මාගේ මේ උපන් කර්මයෙන් මව්පියන්ටද සම්මාසම්බුදුන්ටද උවටැන් කිරීමට හැකිය. සෙස්ස නොගැඹුරු මය.

## පළමුවැනි ඝටීකාර සූත්‍රයයි

## 2.4.2

එවමෙමසුතං යනු රට්ඨපාල සූත්‍රයයි. එහි ථුල්ලකොට්ඨිකං යනු මහා කොටුවයි. පිරිපුන් කෝෂ්ඨාගාරයයි. ඒ ජනපදය නිරන්තර ශස්‍ය ඇත්තේය. සැමදා බිජුවට නික්මෙයි. ධාන්‍ය පිවිසෙයි. ඒනිසා ඒ නියම්ගමෙහි කෝෂ්ඨාගාර නිරතුරුව පිරී පවතී. ඒනිසා ථුල්ලකොට්ඨික යනුවෙන්ම ප්‍රසිද්ධියට පත්විය. රට්ඨපාලො රට්ඨපාලයනු කුමක් හෙයින්ද? බිඳුණු රට දරාගන්ට පාලනය කරන්ට සමර්ථනුයි රට්ඨපාලනම් වේ. ඔහුට මේ නම ලැබුණේ කවදාද? පදුමුත්තර සම්මාසම්බුදුන් වහන්සේගේ කාලයෙහි මින් පෙර කප් සියදහසක් මතුයෙහි මිනිසුන්ගේ ආයුකාලය වර්ෂ සියදහසක්වූ කල්හි පදුමුත්තරනම් ශාස්තෘන් වහන්සේ ඉපිද භික්ෂූන් සියදහසක් පිරිවර ඇතිව ලෝකයාගේ හිත පිණිස චාරිකාවේ හැසිරුණුසේක. යමක් සඳහා කියන ලද්දේද.

**නගරෙ හංසවතියා ආනන්දෙනාම ඛත්තියො**
**සුජාතා නාම ජනිකා පදුමුත්ත රස්ස සත්ථුනො**

හංසවතී නුවර ආනන්ද නම් ක්ෂත්‍රියයා හා
සුජාතා, පියුමතුරා බුදුන්ගේ පියා හා මව වූහ.

පදුමුත්තර බුදුරජාණන් වහන්සේ නූපන් කල්හිම හංසවතී නගරයෙහි කෙළෙඹියෝ දෙදෙනෙක් ශ්‍රද්ධා සම්පන්නව දුප්පතුන්ට මාර්ගිකයන්ට යාචකයන්ට දන් එළවූහ. එකල්හි පර්වත වාසී පන්සියයක් තවුසෝ සුළුකලක් වැස පර්වතපාදයටම ගියාහුය. සඟතෙරවරු දෙනමක් පැමිණියහ. උන්වහන්සේලාට ඔවුහු දිවි ඇතිතාක් උපස්ථාන කළහ. තවුසන් වළඳා අනුමෝදනාව කරන කල්හි එක්අයෙක් ශක්‍රභවනයෙහි ගුණ කියයි. එක් අයෙක් භූමින්ධර නාගරාජ භවනයෙහි ගුණකියයි කෙළෙඹියන් දෙදෙනාගෙන් එකෙක් ශක්‍රභවනය කෙරෙහි ප්‍රාර්ථනාවක් කොට සක්‍රයෙක් වැ උපන්නේය. එකෙක් නාගභවනයෙහි පාලිත නාගරාජනම් වී ශක්‍රයා ඔහු තමාගේ උපස්ථානයට පැමිණි බව දැක නාගයෝනියෙහි සතුටුවෙහිදැයි ඇසීය. හේ සතුටු නොවෙමියි කීය. එසේනම් පුදුමුත්තර භාග්‍යවතුන්

වහන්සේට දානයක්දී මෙතැන ප්‍රාර්ථනාවක් කරව දෙදෙනාම මෙහි සැපසේ වසන්නෙමු. නාරජ භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට භික්ෂූන් සිය දහසක් පිරිවර ඇති භාග්‍යවතුන් වහන්සේට සත් දවසක් මහදන් දෙමින් පදුමුත්තර දශබලධාරීන් වහන්සේ ගේ පුත්‍ර උපරේවත නම් සාමණේරයන් දැක සත්වැනි දවසෙහි බුද්ධ ප්‍රමුඛ සංඝයාට දිවසළුදී සාමණේරයන්ගේ තනතුර පැතුවේය. භාග්‍යවතුන් වහන්සේ අනාගතය බලා අනාගතයෙහි ගෞතම නම් බුදුන්ගේ පුත්‍ර රාහුල කුමාරයා වන්නේ යයි දැක ඔබගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන්නේයයි ප්‍රකාශ කළසේක. නාරජ ඒ බව ශක්‍රයාට කීය. ශක්‍රයා ඔහුගේ වචනය අසා එසේම සත්දවසක් මහදන්දී බිඳුණු රට සමගි කොට ශ්‍රද්ධාවෙන් පැවිදිවූ රට්ඨපාලනම් කුලපුත්‍රයා දැක මමද අනාගතයෙහි ලෝකයෙහි ඔබවැනි බුදුවරයකු උපන්කල්හි බිඳුණුරට සමගි කරන්ට පාලනය කරන්ට සමර්ථවූ කුලයක ඉපිද මේ කුලපුත්‍රයා මෙන් ශ්‍රද්ධාවෙන් පැවිදිවූ රට්ඨපාල නම් වුවමැනවැයි ප්‍රාර්ථනාවක් කළේය. ශාස්තෘන් වහන්සේ සමෘද්ධවන බව දැන මේ ගාථාව කීසේක.

**සරාජිකං චාතුවණ්ණං පොසෙතුං යං පහොස්සති**
**රට්ඨපාල කුලංනාම තත්ථ ජායිස්සතෙ අයං**

සරාජිකවූ චතුර්වර්ණයන් ඇති යම් කුලයක් වේද.
ඒ රට්ඨපාලකුලය පෝෂණය කරනට මොහු එහි උපදනේය.

මෙසේ පුදුමුත්තර සම්මා සම්බුදුන් වහන්සේගේ කාලයෙහිම ඔහුට මේ නම ලැබිණැයි දතයුතුයි. එතදහොසි කුමන සිතක් ඇතිවීද? යථා යථා ඛො යනාදිය මේ මෙහි සංක්ෂේප කථාවයි. මම යම් යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනාකරන ලද ධර්මය දනිම්ද ඒ ඒ කරුණින් සලකාබලන මට මෙසේ සිතෙයි. යම්කලෙක මේ ත්‍රිවිධ ශික්ෂා බ්‍රහ්මචර්යය එක්දවසක්වත් නොකඩ කොට හැසිරීමේ සිත පත්කළයුතු බැවින් ඒකාන්තයෙන් පරිපූර්ණව හැසිරිය යුතුය. එක්දවසක්වත් කෙලෙස් මලින් කිලිටි නොකොට හැසිරීමේ සිත පත්කළ යුතු බැවින් ඒකාන්ත පරිශුද්ධය. සඞ්ඛලිඛිතං ලියවන ලද සක්ගෙඩියක් හා සමානව දෝවනය කරන ලද සක්ගෙඩියක් හා සමානව හැසිරිය යුතුය. ඉදං න සුකරං අගාරං

අජ්ඣාවසතා ගිහිගෙයි වසන්නකු විසින් ඒකාන්ත පරිපූර්ණ කොට -පෙ - චරිතුං හැසිරෙන්ට යනනූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසාය රසපීතාය කාසායානි බ්‍රහමචරියං චරනතානං අනුච්ඡවිකානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරසමා නික්ඛමිත්වා අනගාරිය පබ්බජෙය්‍යං කෙස් රවුලු ඉවත් කොට කසට රස පෙවූ කහවත් හැඳ බඹසර හැසිරෙන්නා වූනට සුදුසු රෙදි හැඳ ගිහිගෙන් නික්ම අනාගාරියනම් සසුනෙහි පැවිදිවන්නෙමි නම් මැනවි. අචිරපක්කනෙතසු චුල්ල කොටයීතකෙසු බ්‍රාහමණ ගෘහපතිකෙසු යෙන භගවා තෙනුපසඞ්කමි චුල්ල කොටයීතක බමුණු ගෘහපතියන් නික්ම ගොස් නොබෝ දිනකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියේය. රට්ඨපාල ඔවුන් නො නැගිටින තෙක් භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිද්ද නොඉල්ලීය. කුමක් නිසාද? එහි ඔහුගේ නෑයෝ ලේනෑයෝ මිත්‍රයෝ ඇමතියෝ ඇත. ඔවුහු ඔබ මව්පියන්ගේ එකම පුත්‍රයාය. ඔබට පැවිදි වන්නට නොලැබේයැයි අතින් හෝ ගෙන අදින්නෝය. එයින් පැවිද්දට අනතුරක් වන්නේයැයි පිරිස සමඟ නැගිට මඳ දුරක් ගොස් නැවත කිසියම් සිරුරු කිසක ව්‍යාජයෙන් නැවතී භාග්‍යවතුන් කරා එළඹ පැවිද්ද ඉල්ලීය. එහෙයින් කියන ලදී. අථඛො රට්ඨපාලො කුලපුතෙතා අචිරවුටයීතාය පරිසාය - පෙ - පබ්බාජෙතු මං භගවාති - ඉක්බිති රට්ඨපාල කුලපුත්‍රයා පිරිස නැගිට නොබෝ වේලාවකින් - පෙ - භාග්‍යවතුන් වහන්සේ මා පැවිදිකරන· සේක්වා. භාග්‍යවතුන් වහන්සේ රාහුල කුමරුන් පැවිද්දෙහි පටන් මව්පියන් විසින් නොඅනුදන්නා ලද පුත්‍රයකු පැවිදි නොකරන සේක. එහෙයින් ඔහු විමසූ සේක. අනුඤ්ඤාතොසි පනත්වං මතාපිතූහි - පෙ - පබ්බජ්ජාය යනුවෙන් අමමතාතා එහි අම්මා යනු මවට කියයි. තාතා යනු පියා එකපුතතකො එකම පුත්‍රයා අන් දෙවු හෝ කනිටුවුවෙක් නැත. මෙහි එකපුතෙතෙ යනුවෙන් කියයුතු කල්හි අනුකම්පා වශයෙන් එකපුතතකොයි කියනලදී. පියො ප්‍රිය උපදවන මනාපො මනවඩනා, සුඛෙධිතො සැපසේ වැඩුණු සැපයෙන් සංවර්ධනය වූණු යන අර්ථයි. සුඛපරිනතො සැපයෙන් පරිණතවූ. උපන්කල්පටන් කිරිමව්වරුන් විසින් උකුලෙන් උකුලට ගෙන ගොස් වඩාගනු ලබන්නේ. කුඩා අස්රිය ආදී ක්‍රීඩාභාණ්ඩ සමග සෙල්ලම් කරමින් රස පිරි බොජුන් කවනු ලබමින් සැපයෙන් පරිහරණය කරන ලද. නත්වං රට්ඨපාල කසසචි දුකඛසස ජානාසි දරුව රට්ඨපාල දුකපිළිබඳ අල්පමාත්‍රයක්වත් නොදන්නෙහි. සිහි නොකරහි,

යන අර්ථයි. මරණෙන පිතෙ මයං අකාමකා විනා භවිස්සාම යම් හෙයකින් අපජීවත්වන කල්හි ඔබගේ මරණය සිදුවුවහොත් එයින් ඔබගේ මරණින්වත් අපි කැමැත්තක් නැත්තෝව තමන්ගේ කැමැත්තෙන් වෙන් නොවන්නෙමු. වියෝගයට වත් නොපැමිණෙන්නෙමු යන අර්ථයි. කිම්පන මයංතං මෙසේ ඇතිකල්හි අප ජීවත්වන ඔහුට අනුමතිය දෙන්නේ කවර කරුණක් නිසාද? නැතහොත් කිම්පන මයං තං කුමක්නිසා අපි ඔහු ජීවත්ව සිටියදී අනුමතිය දෙන්නෙමුද යනු ද මෙහි අර්ථය දත යුතුය. තෝව එහිසිටි ඔහුට මව්පියෝ එතැනදීම අනුමතිය නොදුන්හ. අනන්තරහිතාය කිසිවක් හෝ ඇතුරු බිමෙහි පරිවාරෙහි ගන්ධර්වයන් නළුවන් ආදීන් ගෙන්වාගෙන එහි යහළුවන් සමග සැපසේ ඉන්ද්‍රියයන් පිනවන්න හොඳින් පිනවන්න. එහෙත් මෙහෙන් ගෙන එන්න යැයි කියන ලද්දේවෙයි. නැතහොත් පරිවාරෙහි යනු ගාන්ධර්වයන් නළුවන් ආදීන් ගෙන්වාගෙන යහළුවන් සමග තුටුවන්න නැලවෙන්න රමණය කරන්න කෙළින්න යනු ද කියන ලද්දේවෙයි. කාමෙ පරිභුඤ්ජනෙතා තමාගේ අඹුදරුවන් සමග සම්පත් විඳින්නේ. පුඤ්ඤානිකරොනෙතා බුදුන්ද ධර්මය ද සංඝයාද අරබයා දන්දීම් සුගති මාර්ගය පිරිසිදුකරන කුසල් කරන්නේ තුණ්හී අහොසි කථා හා ඒ අනුව ඇතිවන ප්‍රබන්ධ කථා සිඳ දැමීම පිණිස ආලාප සල්ලාප නැත්තේ විය. ඉක්බිති ඔහුගේ මව්පියෝ තෙවරක් ම කියා පිළිතුරක්වත් නොලබන්නාහු යහළුවන් සතුටුකරවා මේ යහළුවා පැවිදිවනු කැමැත්තේය. වළක්වන්න ඔහු යැයි කීහ. ඔවුහු ද ඔහුවෙත එළඹ තෙවරක් කීහ. ඒවාටද නිහඬව සිටියේය. එහෙයින් කියන ලදී. අථඛො රට්ඨපාලස්ස කුලපුත්තස්ස සහායකා - පෙ - තුණ්හී අහොසී යැයි තෙවරක් කියුපසු ඔහුගේ යහළුවන්ට මෙසේ සිතිණ. ඉදින් මොහු පැවිද්ද නොලැබ මළහොත් කිසි ගුණයක් නොලබයි. ඔහු පැවිදිවූ විට මව්පියෝද කලින් කල බලන්නාහුය. අපිද බලන්නෙමු. මේ පැවිද්ද ද බැරෑරුම් ය. දවසක් පාසා මැටි පාත්‍රය ගෙන පිඬු පිණිස හැසිරිය යුතුය. එක් සෙය්‍යාවක්, එක් බතක් ඇති බ්‍රහමචර්යය අති දුෂ්කරය, මොහුද සියුමැලිය. නගරයේ පවුලකට අයත් හෙතෙමේ එය කරන්නට නොහැකිව නැවත මෙහාටම පැමිණෙන්නේය. ඔහු මා පියන් ලවා අනුමතිය ලබවා ගනිමු. ඔවුහු එසේ කළහ. මාපියෝද පැවිද්දකු විසින් ඔහුට පෙන්වා දියයුතුයයි කතිකා කොට අනුදත්හ. එහෙයින් කියන ලදී. අථඛො රට්ඨපාලස්ස කුල අත්තස්ස සහායකා යො රට්ඨපාලස්ස කුලපුත්තස්ස

මාතාපිතරො - පෙ - අනුඤ්ඤාතොසි මාතා පිතුහි - පෙ - උද්දසෙස තබ්බා යනුවෙන් එහි උද්දසෙසතබ්බා - ඔහු කලින්කල දකින්ද එසේ අවුත් තමා පෙන්විය යුතුය. බලංගහෙත්වා පර්‍ය්‍යාවු බොජුන් බුදින්නේ ඉලීම් නෑම් ආදියෙන් සිරුර පරිහරණය කරන්නේ කයින් ශක්තිය උපදවා මව්පියන් වැඳ කඳුලින් තෙමුණු මුහුණු ඇති ඥාති සමුහයා අත්හැර භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි තැනට - පෙ - භාග්‍යවතුන් වහන්සේ මා පැවිදිකරන සේක්වායි කීය. භාග්‍යවතුන් වහන්සේ අසල සිටි එක්තරා භික්ෂුවක ඇමතූ සේක. එසේනම් භික්ෂුව රට්ඨපාල පැවිදිකරන්න. උපසම්පදා ද කරන්න මැනවි ස්වාමීනියි ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී රට්ඨපාල කුලපුත්‍රයා බුදුන් විසින් දෙන ලද සද්ධි විහාරිකයකු ලැබ පැවිදි කළේය. උපසම්පදාද කළේය. එහෙයින් කියන ලදී. අලත්‍ථබො රට්ඨපාලො කුලපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්‍ථ උපසම්පදං යනුවෙන් පහිතත්තො විහරන්තො දෙළොස් වසරක් මෙසේ වාසය කරන්නේ මෙ ආයුෂ්මත්හු නෙය්‍ය පුද්ගලයෙකි. ඒනිසා පුණ්‍යවන්තද, අභිනීහාර සම්පන්නද වූවාහු දොළොස් වැනි වර්ෂයෙහි රහත් බවට පත්වූහ. යෙන භගවා තෙනුපසඞ්කමි මාගේ මා පියන් පැවිද්ද අනුදනිමින් ඔබ විසින් කලින්කල පැමිණ අප වෙත පෙනී සිටිය යුතුයයි කියා අනුදත්හ. මාපියෝ වනාහි දුෂ්කර දේ කරන්නෝය. මමද යම් අදහසකින් පැවිදි වූයෙම්ද ඒ දේ මස්තක ප්‍රාප්තවිය. දැන් භාග්‍යවතුන් වහන්සේගෙන් විමසා දෙමාපියන්ට තමා පෙන්වන්නෙමියි සිතා විමසනු කැමැත්තේ එහි එළඹියේය. මනසාකාසි රට්ඨපාල ගියකල්හි කිසියම් උපද්‍රවයක් වන්නේ දෝහෝයි සිතිවිල්ලක් ඇතිකරගත්තේය. එයින් උපද්‍රවයක් වන්නේයයි දැන රට්ඨපාල එය මර්දනයකරන්ට හැක්කේ දැයි බලන සේක් ඔහු රහත්බවට පත්වූ බව දැක හැකිවන්නේයයි දැන අනුදැන වදාළසේක. එහෙයින් කියන ලදී. යද භගවා අඤ්ඤාසි - පෙ - කාලං මඤ්ඤසි යනුවෙන් මිගාචීරෙ එනම් උයනෙහි, එයවනාහි රජුවිසින් නොකල්හි පැමිණෙන පැවිද්දන්ට සැපසේ පරිභෝජනය කෙරෙත්වායි දෙන ලද්දේය. මෙසේ අනුදන්නා ලද්දේ විය. ඒනිසා තෙරුන් වහන්සේ මා පැමිණි බව මා පියන්ට දන්වන්නෙමි. ඔවුහු මාගේ පා දෝනා උණුදිය පාදයෙහි ආලේප කරන තෙල් ආදිය එවන්නෝයයි සිතක්වත් නූපදවා උයනටම පිවිසියහ. පිණ්ඩාය පාවිසි දෙවැනිදින පිඬු පිණිස පිවිසියහ. මජ්ඣිමාය දෙරකොටු සතක් ඇති

ගෘහයෙහි මැද දෙරකොටුවෙහි උලෙලබාපෙති කපුවකුලවා කෙස් නැවත තබවයි. එතදවොච මේ ශ්‍රමණයෝ අපගේ ප්‍රියපුත්‍රයා පැවිදි කරවා සොරුන්ගේ අතට පත් කොට මෙන් එක් දවසක්වත් නො දක්වත්. මෙසේ ඔවුහු රළුවැඩ කරන්නෝය. ඔවුන් මේ ස්ථානයට ආයුතුයයි සිතත්. මෙතැන්ම මොවුන් ඇදදැමිය යුතුයයි සිතා මෙසේ ඉමෙහි මුණ්ඩකෙහි ආදි වචන කීය. ඤාතිදසි ඥාතීන්ගේ දසියක්, ආභිදෙසිකං කාලයක් තිබුණු එක්රැයක් ඉක්මී පිළුණුවූ මේ එහි පදර්ථයයි. පිළුණුවූ දෝෂයෙන් මැඩුණෙනුයි අභිදෙසනම් අභිදෙසයට ආභිදෙසික වේ. එක් රැයක් ඉක්මගිය දෙයකටම නාම සඤඤා වකි. ආභිදෙසික වූ දෙය ආභි දෙසිකයි. කුමමාසං යව පිට්ටු, ඡඩ්ඩතු කාමා හොති යම්හෙයකින් යටක් පිරිසෙයින් දස්කම්කරුවන්ට ගොපල්ලන්ටවත් පරිභෝගයට නුසුදුසු ද ඒනිසා එය කසල මෙන් පිටතට විසිකරනු කැමැත්තීවෙයි. සචෙතං යම්හෙයකින් මෙය. භගිනී ආර්ය ව්‍යවහාරයෙන් තමාගේ ඥාතීන්ගේ දාසියට කථාකරයි. ඡඩ්ඩනියධම්මං ඉවතදැමිය යුතු ස්වභාවය මෙය කියන ලද්දේ වෙයි. නැගණිය. ඉදින් මෙය ඉවත දැමිය යුතු ස්වභාවය නම් ඉවතලූ දෙය පිළිගැනීමකි. මේ මාගේ පාත්‍රයට දමන්න. කුමක් නිසා මෙසේ කීමට ලැබේද? අණකිරීමක් හෝ වැරදිලෙස යෙදූ වචනයක් වත් නොවේද නොවේ කුමක් හෙයින්ද එය ඉවතලූ දෙය ගැනීමක් වන බැවිනි. යමක් ඉවතලන ස්වභාවයේවේද ඉවතලූදෙය ගැනීමකි. යම්තැනෙක හිමිකරුවෝ අපේක්ෂාවක් නැත්තෝද ඒ සියල්ල දෙව, ගෙනඑව මෙහි බහාලවයි කියන්ට වටී. ඒනිසාම මේ ආයුෂ්මතුන් වහන්සේ අග්‍ර ආර්ය වංශයෙහි වුවද මෙසේ කීහ. හත්ථානං භික්ෂාව ගැනීම පිණිස පාත්‍රය පිරිනමන්නහුගේ මැණික් කටුවේ සිට දැතම. පාදනං හැඩි රෙද්දෙහි සිට පාදෙකම. සසෙස ඉදින් නැගණියැයි වචන පිට කරන්නහුගේ ස්වරයෙහි, නිමිත්තං අගහෙසි පිටි අත්ල ආදිය බලමින් මාගේ රටඨපාල පුත්‍රයාගේ මෙන් රන් කැසුබු පිටක් බඳු මේ අත්පාවල පිටි අලු හිරියල් වැටි මෙන් වටකුරුවූ ඇඟිලි, මිහිරිස්වරයැයි ගිහිකල සලකනලදවිරූ ආකාරය සැලකුවාය අල්ලාගත්තාය. හඳුනාගත්තාය. දොළොස්වසක් අරණ්‍යවාසයද පිඩුසිඟාලද අහර වළඳන මේ ආයුෂ්මතුන්ට අන්‍යයන්ට හා සමාන ශරීර වරණයවිය. ඒනිසා ඒ ඥාතින්ගේ දසිය ඔහු දැක ද හඳුනා නොගත්තාය. නිමිත්තක් නම් ගත්තාය. රටඨ පාලසස මාතරං එතදවොච තෙරුන්ගේ අඟපසඟ සනිටුහන්

කොට කිරිපොවා හදාවඩාගත් කිරිමව වූවා පැවිදිව මහා රහත්බවට පත්වූ ස්වාමිපුත්‍රයා සමග ස්වාමිනි මාගේ පුත්‍ර රට්ඨපාල ඔබගේදැයි ආදී වචනයක් කියන්ට උත්සාහ නොකරන්නී වේගයෙන් ගෙට පිවිස රට්ඨපාලගේ මවට මෙසේ කීවාය. **යග්ඝෙ** ආරෝචනාර්තයෙහි නිපාතයි. **සචෙජ සච්චං** මෙහි ජෙ යනු ආලපන අර්ථයෙහි නිපාතයි. ඒ දේශයෙහි දසි ජනයාට ආමන්ත්‍රණය කරන්නෝ මෙසේය. ඒනිසා එම්බල දසිය කී සත්‍ය කියහිද? මෙහි අර්ථය මෙසේයැයි දතයුත්තේය. **උපසඩකම්** කුමක්නිසා එළඹියාද මහකුලයෙහි ස්ත්‍රීහු පිටතට යන්නාහු ගර්භාවට පත්වෙති. මේ හදිසි කටයුත්ත සිටුවරයාට දන්වන්නෙමියි සිතුවාය. ඒනිසා එළඹියාය. **අඤ්ඤතරං කුඩ්ඩං** ඒ දේශයෙහි දනපතීන්ගේ ගෙහි ශාලා ඇත. එහි ආසනද පනවා ඇත. එළවූ කැඳවතුර එහි පැවිද්දෝ පිඬු පිණිස හැසිර හිඳ අනුභවකරත් කැමති වන්නාහු නම් දනපතීන්ට අයත් දේද ගනිති. ඒනිසා එයද වෙනත් කුලයක මෙබඳු ශාලාවක තවත් බිත්ති මුල්ලක් යයි දතයුතුය. පැවිද්දන් ලෙස නොව දුප්පත් මිනිසුන් මෙන් නොසරුප් තැන හිඳ අනුභව කරත්. **අත්ථිනාම තාතා** මෙහි ඇත. විද්‍යාමාන අර්ථයෙහි. **නාම** විමසීම් අර්ථයෙහි හඟින අර්ථයෙහි නිපාතයකි. මෙය කියන ලද්දේවෙයි. දරුව රට්ඨපාලයෙනි අපට ධනය ඇත්තේ නොවේද. අපි නිර්ධන යෝ යැයි කියයුතු නොවේද. දරුව රට්ඨපාල ඔබ කිසිවකුගේ මෙබඳුතැනක හිඳ පිළුණු වූ පිට්ටු අනුභව කරන්නෙහිය. අපට ජීවිතයක් තිබෙනවානේද අප මළායයි කිවයුත්තේද යමෙකුගේ මෙබඳු තැනක හිඳ දරුව රට්ඨපාල ඔබ පිළුණුවූ බත් අනුභව කරන්නෙහිය දරුව රට්ඨපාල ඔබගේ අභ්‍යන්තරයෙහි සසුන නිසා ලද ශ්‍රමණ ගුණය ඇතැයි සිතෙයි. ඔබ මනාවූ බොජුන් රසයෙන් වැඩුණාද මේ පිළිකුල් පිට්ටු අනුභව කරන්නේ යනුවෙන් එපමණක්ම කීය. අක්ෂර ගැන සිතන්නෝ මෙහිදී මේ ලක්ෂණය ගැන කියති. විශ්වාසයෙන් තොරව අදහන අයුරින්

අත්ථි ශබ්දයෙහි උප පදයෙහි පරිභුඤ්ජිස්සතියැයි අනාගත වචනය කරන ලදී. මේ එහි අර්ථයයි. ඉකුත්වූ දේ - පෙ - අනුභව කරන්නෙහිය. මෙම ප්‍රත්‍යක්ෂ වූවද මම නොඅදහමි.

ගෘහපතියා තෙරුන්වහන්සේගේ පාත්‍රයෙහි මුව විට අල්ලාගෙන සිටිමින්ම මෙපමණක්ම කීය. තෙරුන් වහන්සේද පියා පාත්‍රයෙහි මුවවිට අල්ලාගෙන සිටියදීම බලුවමනයක් බඳු කුණු බිත්තරයක් මෙන් බිඳුණු තැනින් කුණු ගඳ හමන ඒ කුණුවූ බත වැළඳූහ. පෘථක්ජනයකුට එබඳු බතක් අනුභව කරන්ට නොහැකිය. තෙරුන් වහන්සේ අර්හත්වයෙහි සිට දිව්‍යඕජාවක් අමෘත රසයක් වළඳන්නාක් මෙන් වළඳ කෙණ්ඩියෙන් ජලය ගෙන පාත්‍රයද මුවද අත්පාද දෙවා **කුතො නො ගහපති** ආදිය කීහ. එහි **කුතොනො** යනු කොහි සිටද. නෙවදනං දෙය්‍යධර්ම වශයෙන් දනයක් නොලැබුවෙමු. **නපච්චක්ඛානං** දරුව රටඨ්පාල, ඔබ සුවයෙන්ද, වැඩි වෙහෙසක් නැතිව පැමිණියේද දරුව තවමත් ගෙයි බත් නොසෑදේය ආදිවශයෙන් පිළිසඳර වශයෙන් බැහැරකිරීමක් ද නොලැබුවෙමු. තෙරුන් මෙසේ කීවේ කුමක්නිසාද? පියාකෙරෙහි අනුග්‍රහයෙනි. උන්වහන්සේට මෙසේ සිතිණ, යම්සේ මොහු මට කියාද අන් පැවිද්දන්ටද මෙසේ කිය තියි සිතම්. බුදුසසුනෙහි පත් අතර නෙළුමක් මෙන්, අළුයෙන් වැසුණු ගිනිමෙන්, එලයෙන් වැසුණු සඳුන් හරයක්මෙන් නුලෙන් වැසුණු මුතු ඇටයක් මෙන් වලාකුළින් වැසුණු සඳමෙන් මාවැනි වැසුණු ගුණඇති භික්ෂූන්ගේ කෙළවරක්නැත. ඔවුන් අතර මෙබඳු වචනයක් පැවැත්වෙන්නේ නැත. සංවරයෙහි සිටියි යන අනුග්‍රහයෙන් මෙසේ කීහ. **එහිතාතා** දරුව ඔබගේ ගෙයක් නොවේවා එන්න ගෙදර යන්නෙමුයි කියයි. **අලං** තෙරුන් වහන්සේ තෙරහු උපරිම වශයෙන් එකාසනික අංගයෙහි සිටිබැවින් ප්‍රතික්ෂේප කරන්නේ මෙසේකීහ. **අධිවාසෙයි** තෙරුන්වහන්සේ ප්‍රකෘතියෙන්ම උසස් සපදන චාරිකා ඇත්තහු හෙට පිණිස භික්ෂාව නොපිළිගනිත්. මවට අනුග්‍රහයෙන් ඉවසූහ. මවට තෙරුන් සිහිකොට මහත් ශෝකයක් උපදී. හැඩීමෙන්ම රතුවූ ඇස් ඇත්තී මෙන් වූවාය. ඒනිසා තෙරුන් වහන්සේ යම්හෙයකින් මම ඇය නොදක යන්නෙම්ද ඇයගේ හදවත පැලෙන්නටද පුළුවනැයි අනුග්‍රහයෙන් ඉවසූහ. **කාරාපෙත්වා** හිරණ්‍යයෙන් එකක්ද, සුවර්ණයෙන් එකක්දැයි ගොඩවල් දෙකක් කරවා පූජාවෝ කෙතරම් මහත්වූදයත්. මෙතෙර සිටි පුරුෂයෙක් එතර සිටි මධ්‍යම ප්‍රමාණයේ පුරුෂයකු නොදකීද එසේ මහත්වූ, **ඉදං තෙතාත** කහවණු ගොඩද රත්රන් හැඩද පෙන්වන්නේ මෙසේ කීය. **මත්තිකං** මවගෙන් පැමිණි. මේ ඔබගේ මිත්තණියගේ මව මේගෙට එද්දී ඇය විසින් මව විසින්

මල්දම් සුවඳ ආදිය පිණිස දෙන ලද ධනය යන අර්ථයි. අඤ්ඤං පෙත්තිකං අඤ්ඤං පිතාමහං යමක් ඔබගේ පියාටද මුත්තණුවන්ටද අයිතිවීද එය වෙනමම තැන්පත් කර ඇත. යොදන ලද දෙය අතිබහුල නොවිය. මෙහි සිතාමහං යනුවෙන් තද්ධිත ලෝපය දතයුතුය. පෙතාමහං කියාද පාඨයක් වෙයි. සක්කා තාත රට්ඨපාල දරුව රට්ඨපාල, හුදෙක් පැවිද්දකු විසින් පමණක් පින් නොකළ හැකිය. ගිහිගෙය වසන්නහු විසින්ද සම්පත් අනුභව කිරීමටද තුනුරුවන්හි පිහිටා පන්සිල්පද සමාදන්ව උදාරවූ දනාදි පින් කිරීමට හැකිය. එහිත්වංතාත - පෙ - පුඤ්ඤානිච කරොහි - එන්න දරුව - පෙ - පින්ද කරන්න. තතො නිදානං ධනය සඳහා, ධන ඉපයීමේ හේතුව සඳහා ඒ ඒ ධනය රක්නා පුද්ගලයකුගේ රජුන් ආදීන් වශයෙන් ධන පරිහානියට පැමිණෙන්න හුටද උපදනා ශෝක ආදිය සඳහා මෙසේ කීය. මෙසේ කීකල්හි, සිටුගෘහපතියා මම මොහු උපැවිදි කරවන්නෙමියි ගෙන ආවෙමි. ඔහු දූන් මට ධර්මකථා කියන්ට පටන්ගත්තේය. මොහු මාගේ වචනය නොකරතියි නැගිට ගොස් ඔහුගේ අන්තඃපුරයෙහි දොර විවෘත කරවා. මේ තොපගේ ස්වාමියාය. යවු ඔහු යම්කිසිවක් කොට අල්ලාගන්ට වෑයම් කරවුයයි පිටත් කරයැවීය. තරුණ වයසෙහි සිටි නාටක ස්ත්‍රීහු නික්ම ගොස් තෙරුන් පිරිවරාගත්හ. ඔවුන් අතරින් දෙටු නාටක ස්ත්‍රීන් දෙදෙනෙකු සඳහා පුරාණදුතියිකා යනාදිය කියන ලදී. පච්චෙක පාදෙසු ගහෙත්වා එක් එක් පාදයෙන් ඔහු අල්ලාගෙන කීදිසා නාම තා අය්‍යපුත්ත අච්ඡරායො යැයි කුමක්නිසා මෙසේ කීහුද. එකල්හි බොහෝ ක්ෂත්‍රිය කුමාරයන්ද බ්‍රාහ්මණ කුමාරයන්ද සිටුපුත්‍රයන්ද මහසම්පත් හැරදමා පැවිදිවනු දූක පැවිද්දෙහි ගුණ නොදන්නෝ කථාවක් ඇතිකරත්. ඇයි මොවුන් පැවිදිවන්නේ? සමහරු මෙසේ කියති. දෙවසරන් දෙව් තිළියන් සඳහාය. ඒ කථාව පැතිරී ගියේය. එය අල්ලාගෙන ඔවුහු මෙසේ කීහ. තෙරුන් වහන්සේ එය පිළිකෙව් කරමින් නබො මයං භගිනී - නැගණියනි අපි එසේ නොවෙමු යි කීහ. සමුදචරති ව්‍යවහාර කෙරයි. එහිදීම මුසපත්ව වැටුණාහුය. උන්වහන්සේ නංගී භාෂාවෙන් - භගිනී වාදයෙන් ව්‍යවහාර කරනු දූක, අපි අද එති අදඑතිය දෙළොස් අවුරුද්දක් පිටතට නොගියෙමු. ඒනිසා අපි දරුවන්ද නොලැබීමු යමකුගේ ආනුභාවයෙන් ජීවත්වෙමුද එයින් ද පිරිහුණෝ වෙමු. මේ ලෝකය අන් අයුරකින්වෙයි. තමා ගැනම සිතීය. ඒනිසා ඔවුහුද දූන්අපි අනාථවූයෙමුයි තමාගැනම සිතමින්, අපගෙන් දූන්

වැඩක් නැත. මොහු බිරින්දන් වූ අප තමාසමග එක්කුස විසූ දූරියන් මෙන් සිතයි හටගත් බලවත් ශෝක ඇතිව ඒ ප්‍රදේශයේදීම මුසපත්ව වැටුණාහුය. යන අර්ථයි. මා **නොවිහෙඨෙථ** අපට ධනය පෙන්වා ගැහැණුන් යොදවා වෙහෙස නොකරනු මැනවි. **විහෙසා එසා පබ්බජිතානං** - පැවිද්දන්ට මෙය වෙහෙසකැයි කුමක් නිසා මෙසේ කීද? මා පියන්ට අනුග්‍රහ පිණිස ඒ සිටුවරයා පැවිදිකම කිළිටිය. පැවිදිවෙස හරවා නහවා තිදෙන එකට කෑම කන්නෙමුයි සිතමින් තෙරුන්ට භික්ෂාව නොදෙයි. තෙරුන් වහන්සේ මා වැනි කෙලෙස් නැසුවකුගේ ආහාරයට අනතුරක් කොට මොවුහු බොහෝ අකුසල් රැස්කරගනිතියි ඔවුන්ට අනුග්‍රහ පිණිස මෙසේ කිහ. **ගාථාඅභාසි** ගාථා කිහ. එහි **පස්ස** යනු ළඟ සිටිජනයා සඳහා කියයි. **චිත්තං** විසිතුරු කළ **බිම්බං** ආත්ම භාවය, අරුකායං නව වණමුඛයන්ගේ වශයෙන් වණ සමූහයක් ඇති. **සමුස්සිතං** ඇටතුන් සියයකින් නගර නවසියයකින් බැඳ මාංශපේශි නවදසයයකින් ආලේප කොට තැනින් තැනින් උස්කරන ලද. **ආතුරං** ජරාවෙන් ආතුරවූ බැවින්, රෝගයෙන් ආතුර වූ බැවින් කෙලෙසින් ආතුරවූබැවින් නිරන්තර යෙන් ආතුරවූ බහු **සංකප්පං** අනුන්ට උපන් ප්‍රාර්ථනා සංකප්පයන්ගෙන් බහුසංකප්පවූ, ස්ත්‍රීන්ගේ සොහොනෙහි අත්හැරදමන ලද සිරුරක්වූ මෙය කපුටන් ගිජුලිහිණියන් ආදීහුද ප්‍රාර්ථනා කරන්නාහුයැයි බහුසංකප්ප නම් **යස්ස නත්ථි ධුවං ඨිති** යම්කිසි කයකට මායාව මිරිගුව පෙණපිඬුව දිය බුබුළ ආදින්ට මෙන් ඒකාන්තයෙන් පැවැත්මක් නම් නැත. බිඳෙනසුලු බවම නියතය. **තචෙන ඔනද්ධං** තෙත් මිනිස් සමින් වැසිණ. **සහ වත්ථෙහි සොභති** සුවඳින් මිණිකොඬොලින් ද විසිතුරු කළ රූපය වස්ත්‍රයන්ගෙන් ස්වභාවයෙන් බැබලේ. වස්ත්‍ර නැතිවිට නොබැලියහැකි තරමට පිළිකුල්ය. **අලත්තකකතා** ලාරසින් රංජනය කළ **චුණ්ණ මක්ඛිතං** අබකල්කයෙන් කුරුලෑ ආදිය ඉවත් කොට ලුණු මැට්ටෙන් නරක්වූ ලෙස වියලවා, ඇඹරූ තල ඇටවලින් ලෙය පිරිසිදුකරවා කහ වර්ණය සඳා සුණු පොඩියකින් මුහුණ තලත්. මෙයින් එය බෙහෙවින් බබලයි. ඒ සඳහා මෙය කියන ලදී. **අට්ඨපාදකතා** රසදිය ගා තලල්පට කෙළවර පටලවා අට පෙළකට සකස් කරනලද, **අඤ්ජනී** නෙලිතුඩ, ඔදහී - තැබීය. **පාසං** පුඩුදූල **නාසද** නොගැටුණේයි. **නිවාපං** නිවාප සූත්‍රයෙහි කියන ලද නිවාපතණ සමාන බොජුන **කන්දනෙත** හඬද්දී වලපිද්දී තෙරුන්වහන්සේ මේ ගාථාවෙන් මව්පියන් මුවවැද්දන් මෙන් කොට

පෙන්වූහ. අවශේෂ ඥතීන් වැදි පිරිසමෙන්, රතින් කළ පුඩුදලක්මෙන්. තමා අනුභව කළ බොජුන නිවාප තණ මෙන්, තමා මහමුවා මෙන් කොට දක්වූහ. යම්සේ මහමුවා ඇතිතාක් නිවාප තණ කා පැන්බී ගෙල ඔසවා පිරිස දෙස බලා මෙතැනට ගිය අයකුට යහපතක් වන්නේයයි මුවවැද්දන්ගේ දැලට නොගැවීම උඩින් පැන අරණ්‍යයට පිවිස ගන සෙවන ඇති කුඩයක් බදු වනගුම්බයක යට මඳ සුළඟින් පවන් සලනු ලබන්නේ ආමග බලන්නේ සිටීද. මෙසේම තෙරුන් වහන්සේ මේ ගාථා කියා අහසින් ගොස් මිගාචීරයෙහි පෙනීසිටියහ. තෙරුන් අහසින් ගියේ ඇයි? උන්වහන්සේගේ සිටු පියා දෙර කොටු සතෙහිම අගුලු දම්මා මල්ලයන්ට මෙසේ අණ කළේය. ඉදින් නික්ම යයිනම් අතින් පයින් ඔහු අල්ලාගෙන කහසිවුරු ඉවත්කර ගිහිවෙස් ගන්වවු. ඒනිසා තෙරුන් වහන්සේ මොවුහු මා වැනි කෙලෙස් නැසුවකු අතින් හෝ පයින් අල්ලා අකුසල් රැස්කරත් ඔවුන්ට එය නොවේවායි සිතා අහසින් ගියහ. පරසමුද්දවාසී තෙරවරුන්ට, සිටියේම මේ ගාථා කියා අහසට පැනනැඟී කෝරව්‍ය රජුගේ මහාචීරයෙහි නැවත පෙනී සිටියහ. යන්න වාචනා මාර්ගයයි. මිගචො ඒ උයන් පල්ලාගේ නම සොධෙනතා උයන්මග සම කරවා හැමදියයුතු තැන් හමදවන්නේ වැලිවිසිරවීම් මල්ගවගැවසීම් පුන්කලස් තැබීම් කෙසෙල් කඳන් තැබීම් ආදියද කරන්නේ යන අර්ථයි. යෙන රාජා කොරව්‍යො තෙනුපසඞකමි අපගේ රජතුමා සැම කල්හි මේ කුලපුත්‍රයාගේ ගුණකියයි. ඔහු දකිනු කැමැත්තේ ඔහු පැමිණි බව නොදනී. මේ පඬුරු විශාලය. ගොස් රජුට දන්වන්නෙමියි සිතා කෝරව්‍ය රජු සිටින තැනට එළඹියේය. කිතනය මානොහොසි ඒ රජ තෙරුන් සිහිකොට බලගණ මැදද නාටක ස්ත්‍රීන් මැදද මහාසම්පත් අත්හැරදමා පැවිදිව නැවත නොනැවති අවසර නො ඉල්ලන කුලපුත්‍රයා විසින් දුෂ්කර දෙයක් කෙරන ලද්දේයැයි ගුණ කීවේය. එය අල්ලාගෙන හේ මෙසේ කීය. විසසජෙථාතිවතථා අන්තඃපුර මහාමාත්‍ර බලකාය ආදීන්හි යමකුට යමක් සුදුසුද ඔහුට එය දෙවා යන අර්ථයි. උසසටාය උසසටාය උසස් උසස් මහාමාත්‍ර මහරැටි ආදීන්ගේ වශයෙන් නැගී නැගී ආ පිරිස රැගෙන එළැඹියේය යන අර්ථයි. ඉධභවං රටඨපාලො හතථතරෙ නිසීදතු ඇතුන්පිට එළාලු ඇතිරිල්ල කුඩාය. බොහෝ මල් ඇත. දෙගුණ කොට අර්ථවශයෙන් කරන ලද්දේ වෙයි. එබඳු තැනක නොවිමසා හිඳගන්ට යුතු නැතැයි සිතමින් මෙසේකීය. පාරිජුඤ්ඤානි දිරායන බැවින්

ක්ෂය වීමෙන්, **ජිණෙණා** ජරාජිර්ණ **වුදෙධා** වයෝවෘද්ධ, **මහලලකො** උපතින් මහලු, **අද්ධගතො** වයස් මාර්ගය ඉක්මවන, **වයො අනුප්පතෙතා** පශ්චිම වයසට පැමිණි, **පබබජති** අසල අරමට ගොස් භික්ෂූන් වැඳ ස්වාමීනි, මා විසින් තරුණ කල්හි බොහෝ කුසල් කරන ලද්දේය. දැන් මහලුවෙමි. මහල්ලාටද මෙය පැවිද්ද නම්වේ. සැමළුව හැමද පිරිසිදු කොට ජීවත් වන්නෙමි. ස්වාමීනි මා පැවිදි කරන්නැයි කරුණාව උපදවමින් ඉල්ලාසිටී තෙරවරු අනුකම්පාවෙන් පැවිදිකරති. ඒ සඳහා මෙය කියන ලදී. දෙවැනි වරද මෙම ක්‍රමයයි. **අප්පාබාධො** රෝග නැති. **අප්පාතඩෙකා** දුක්නැති, **සමවෙපාකිනිසා** සමව පැසවන **ගහණියා** කර්මජ තේජෝධාතුවෙන්, එහි යමකුට කෑසැණින්ම ආහාර ජීර්ණවෙයි. යමෙකුට බත් පිඩක් මෙන් එසේම සිටියි. මේ දෙදෙනාම සම විපාකයෙන් යුතු කර්මජ තේජෝධාතුවෙන් යුක්ත නොවෙත්. යමකුට නැවත කෑ කල්හි බත් පිළිබඳ කැමැත්ත ඇතිවන්නේමය. මේ සමව පැසවීමෙන් යුක්ත වූයේවෙයි. **නාතිසීතාය නාච්චුණ්හාය** ඒ කරුණින්ම අතිශීතලද අතිඋෂ්ණද නොවේ. **අනුපුබෙබන** රජවරු හෝ ගෙන යති ආදී ක්‍රමයෙන්, **සමුදෙදසා උද්දිට්ඨා** ධර්මනිර්දේශයෙන් නිර්දේශිත, **උපනීයාති** ජරාමරණ වෙතට යයි. ආයුක්ෂය යෙන් හෝ එතැනට ගෙනයනු ලැබේ. **අද්ධුවො** ස්ථිරතැන් නැති. **අතතාණො** රැකීමට සමත් අයකු නැති. **අනභිසසරො** අසරණ, සිහිකොට ළඟට ගොස් අස්වසන්ට සමර්ථයකු නැති. **අසසකො** තමාගේ නොවන. ස්වකීය වූ භාණ්ඩනැති. **සබබං පහාය ගමනීයං** තමාගේ බඩුයයි සලකනු ලැබූ සියල්ල අත්හැර ලෝකයෙන් යායුතු, **තණ්හාදසො** තෘෂ්ණාවට දසවූ **හත්‍ථිසමං** හස්ති ශිල්පයෙහි **කතාවි** කළයුතු දේ කළ හික්මවූ ශිල්ප ඇති ප්‍රගුණ කළ ශිල්ප ඇති යන අර්ථයි. සියලු තැන මේ ක්‍රමයයි. ඌරුබලී කලවා ශක්තියෙන් යුත්. පලිහද ආයුධයද ගෙන පරසෙනග අතරට පිවිස නිරන්තරයෙන් බිඳින, බිඳුණවුන් සමගිකරන අනුන් අතට ගිය රාජ්‍යය ගෙන එන්ට උරදෙත්ද එය ඌරුබලිතම් බාහුබලී බාහු බලයෙන් යුත්, සෙස්ස පෙර පරිදිමය. **අලමතෙතා** සමර්ථ ආත්මභාවය **පරියොධාය වතතිසසනති** උපන් උපද්‍රවය නවත්වාතබා නොපතුරුවා පවතින්නේයයි සලකා ගන්නා ලද **සංවිජ්ජති භොරට්ඨපාල ඉමස්මිං රාජකුලෙ පහූතං හිරඤ්ඤං සුවණ්ණං** යනුවෙන් මෙය ඒ රජ මත්තෙහි ධර්ම උපදේශයට කරුණක් ගෙන එන්නේ කීය. **අථාපරං එතදවොච** මෙය ලෝකයෙහි දකිමියි ආදී ක්‍රමයෙන්

සමුද්දේස සතරෙහි පසු ගීයක් කීය. එහි හියෝාව කාමෙ අභිපත්ථයන්ති එකක් ලැබ දෙකක් පතයි දෙකක් ලැබ සතරක්ද ඊටත් වැඩියෙන් ද වස්තු කාම ක්ලේශකාමයන් ප්‍රාර්ථනාකරති. පසය්හ සතුරු ගණයා අබිබවා සසාගරන්තං සයුරු අන්තය සමග ඔරං සමුද්දස්ස සමුද්‍රයට මෙපිට තම රට, එයින් අතෘප්ත වූයේ යන අර්ථයි. නහඣි නැත. අහො වතානො අහෝ අපගේ අයමෙව යනුවෙන්ද පාඨයක් ඇත. අමරාතිවාහු අමරයෝ යැයි කියන ලද්දේ වෙයි. මෙය කියන ලද්දේවෙයි. මළ යමකු පිරිවරා ඥාතීහු හඩත්ද. අහෝ අපගේ සොහොයුරා මළේය. පුත්‍රයා මළේය ආදියද කියත්. ඵුසන්ති ඵස්සං මරණ ස්පර්ශය ස්පර්ශ කරති. තථෙව පුට්ඨො යම්සේ බලවත් නුවණැත්තේ වුවද මරණ ස්පර්ශයෙන් ස්පර්ශ කරන ලද්දේය. ස්පර්ශ නොකරන ලද්දෙක්නම් නැත. විශේෂය මෙයයි. බාලයා වතාහි බාල බැවින් පහර දෙනු ලැබුයේ නිදයි බාලයා බාලබැවින් මරණය ස්පර්ශ කිරීමට පැමිණ වධයට පමුණුවන ලද්දේම නිදයි. මරාදමන ලද්දේ නිදයි. මාවිසින් යහපත් දෙයක් නොකරන ලද්දේයයි ආදී විපිළිසර වශයෙන් සැලෙයි, වෙවුලයි, ගැහෙයි, ධීරොච නවෙධති නුවණැත්තේ සුගති නිමිත්තක් දකිමින් සසල නොවෙයි. නො වෙවුලයි. යාය වොසානං ඉධාධිගච්ඡති යම් ප්‍රඥාවකින් මෙලොව සියලු කිස අවසන් කොට ලබන රහත් බවට පැමිණේ. සාවධානයෙන් උත්තමතරය. අසොසිතත්තා නොවියලුණු බැවින් රහත්බවට පැමිණීමෙන් අභාවයට යන බැවින් යන අර්ථයි. භවාභාවෙසු හීන ප්‍රණීත භවයන්හි. උපෙති ගබ්භඤ්ච පරඤ්ච ලොකං පව් කරන්නවුන් අතර යම් කිසි සත්වයෙක් පරම්පරාවෙන් සංසාරයට පැමිණ ගැබටද පරලොවටද එළඹෙයි. තස්සප්පපඤ්ඤො එබඳු අල්පවූ ප්‍රඥාව ඇති, අල්පප්‍රඥාව ඇතිව අදහන සකම්මනා හඤ්ඤති කමා විසින් කරන ලද කර්ම වශයෙන් කසවළින්ද තලවන්නාහුය ආදී කර්ම කිරීම්වලින් මැරේ. පෙච්ච පරම්හි ලොකෙ මෙයින් ගොස් අපාය ලෝකයෙහි. විරූප රූපෙන විරූපවූ රූපයෙන්, නොයෙක් ස්වභාවයෙන් යන අර්ථයි. කාමගුණෙසු දිට්ඨ ධම්මික සම්පරායික සියලු කාම ගුණයන්හි ආදීනව දැක. දහරා යටත් පිරිසෙයින් කලලමාත්‍ර භාවය උදෙසා තරුණයෝ, වුඩ්ඪා වර්ෂ සියය ඉක්මවූවෝ අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යො අවිරුද්ධවූ, නොසැලී යන්නාවූ ඒකාන්තයෙන් නෛර්යාණික ශ්‍රමණභාවයම මැනවි. උත්තරීතරයයිද ප්‍රණීත තරයයිද උපධාරණය කොට

මහරජ මම පැවිදිවූයේ වෙමි. ඒ නිසා ඔබ කුමක් කියහිද කුමක් දැකද කුමක් අසා ද මෙය දැකම පැවිදිවූයේ වෙමිය. සිතාගන්නැයි දේශනාව නිමවාවදළ සේක.

## දෙවැනි රට්ඨපාල සූත්‍රයයි

## 2.4.3

**එවමෙමසුතං** යනු මඛාදේව සූත්‍රයයි. එහි **මඛාදෙවමබවනෙ** පෙර මඛාදේව නම් රජෙක් ඒ අඹවනය රෝපණය කළේය. ඒ ගස් විනාශවී යන විට පසුකලෙක අන් රජවරුද රෝපණය කළාහුය, පුරාණ ව්‍යවහාර වශයෙන් මඛාදේව අඹවනය ම යැයි ප්‍රසිද්ධියට ගියේය. **සිතමාාතවාකාසි** සවස් කල්හි විහාරචාරිකාවෙහි හැසිරෙමින් රමණීයවූ බිම්කඩක් දැක මාවිසින් මේ අවකාශයෙහි වසන ලද විරූයැයි ආවර්ජනාකරන්නේ පෙර මම මඛාදේව නම් රජෙක්ව මේ අඹවනය රෝපණය කෙළෙමි. මෙහිම පැවිදිවී සිට බඹවිහරණ වඩා බඹලොව උපන්නෙමි. මේ කරුණ භික්ෂු සංඝයාට ප්‍රකට නැත. එය ප්‍රකට කරන්නෙමියි දත් අග පෙන්වා සිනා පහළ කළේය. ධර්මය ඔහුට ඇතැයි **ධම්මිකො** ධර්මයෙන් රජවූයේ නුයි. **ධමමරාජා, ධමෙම ඨිතො** දසකුසල ධර්ම පථ ධර්මයෙහි සිටියේ **ධමමංචරති** සමසේ හැසිරේ. එහි බ්‍රාහ්මණ ගෘහපතීන් අතර හෙතෙමේ පෙර යමෙක් රජුන් විසින් දෙනලද පෙරහර ඇත්තේද එය නොකඩවා මුල් ක්‍රමයෙන්ම දුන්නේය. ගෘහපතියන්ටද එසේය. ඒ සඳහා මෙය කියන ලදි. **පකඛසස** මෙයින් ප්‍රාතිහාර්ය පක්ෂයද ගන්නා ලදී. අටවක, පොහොයට ප්‍රත්‍යුද්ගමන අනුද්ගමන වශයෙන් සතවකද නවවකද. සෙළෙස්වකද පසළොස් වකගේද ප්‍රත්‍යුද්ගමන අනුද්ගමන වශයෙන් තෙළෙස්වකද යන පිළිවෙළ මේ දවස් ප්‍රාතිහාර්ය පක්ෂයැයි දතයුතුය. ඒ අතර පොහොය සමාදන්ව විසීය. **දෙවදූතා** දෙවායනු මරුය. ඔහුගේ දූතයෝ නුයි දේවදූතා හිසෙහි නරකෙස් පහළ වූ කල්හි මරුගේ සමීපයෙහි සිටියාක් මෙන් වෙයි. ඒනිසා නරකෙස් මරුගේ දූතයෝයැයි කියනු ලැබේ. දෙවියන් වැනි දූතයෝද දෙවදූතයෝය යම්සේ අබරණින් සැරසුණු දේවතාවක අහසෙහි සිට අසුවල් දවසෙහි මැරෙන්නේයයි කිකල්හි එය එසේම වෙයි. මෙසේ හිසෙහි නරකෙස්

පහළවූ කල්හි දේව භාෂිතයක් හා සමාන වෙයි. ඒ නිසා නරකෙස් දේවදූතයන් හා සමානයයි කියනු ලැබේ. විශුද්ධි දෙවියන්ගේ දූතයෝනුයිද දේවදූත නම් සියලුම බෝධිසත්වයෝ දිරාගිය පුද්ගලයකු, ලෙඩවූ පුද්ගලයකු, මියගිය පුද්ගලයකු පැවිද්දකු දැකම සංවේගයට පත්ව ගිහිගෙන් නික්ම පැවිදිවෙත්. කියන ලදී.

**ජිණ්ණඤ්ච දිස්වා දුඛිතඤ්ච ව්‍යාධිතං - මතඤ්චා දිස්වා ගතවායු සංඛයං කාසාය වත්ථං පබ්බජිතඤ්ච දිස්වා - තස්මා අහං පබ්බජිතොම්හි රාජ**

ජරාජීර්ණ වූවකු
දුකට පත්වූවකු රෝගියකු
ආයු කෙළවර මිය ගිය එකකු
කසාවත් හැඳි පැවිද්දකු දැක
රජතුමනි මම පැවිදි වූයෙමි.

මේ ආකාරයෙන් නරකෙස් විශුද්ධි දෙවියන්ගේ දූතයන් බැවින් දේවදූතයෝ යැයි කියනු ලැබේ. කපපකසස ගාමවරංදත්වා සිය දහසක් උපදනා දෙවුගමක් දී, කුමක් නිසා දුන්නේද? සංවේගප්‍රාප්ත සිත් ඇති බැවින් ඔහුගේ අල්ලෙහි තබන ලද නරකෙස් දැකම සංවේගය උපන්නේය. තවත් අසූහාරදහසක් වස් ආයුෂ ඇත. එසේ ඇති කල්හිත් මාරයාගේ සමීපයෙහි තමා සිටියාක් මෙන් හඟිමින් සංවේගයටපත්ව පැවිද්ද කැමතිවිය. එහෙයින් කියන ලදී,

**සිරො දිස්වාන පලිතං මඛාදෙවො දිසම්පති
සංවෙගං අලභීධීරො පබ්බජ්ජං සමරොචයී**

මඛාදේව රජ
නරකෙස් ඇති හිස දැක
සංවේගයට පත්ව
පැවිද්ද කැමතිවිය.

තවත් කියන ලදී

උත්තමඞ්ගරුහා මය්හං ඉමෙ ජාතා වයොහරා
පාතුභූතා දෙවදූතා පබ්බජ්ජා සමයො මම

වයස පැහැර ගන්නා
මාගේ හිසකෙස් ඇතිවිය.
දේවදූතයෝ පහළවූහ
පැවිදිවීමට කාලයයි.

**පුරිසයුගෙ** වංශය ආරම්භයෙහි සිටි පුරුෂයා, **කෙසමස්සුංඔහාරෙත්වා** තවුස් පැවිද්දෙන් පැවිදිවන්නෝද පළමු කොට කෙස් රවුල් ඉවත් කොට පැවිදිවෙති. එතැන්පටන් වැඩුණු කෙස් බැඳ ජටා කලාප ධරව හැසිරෙත් බෝධිසත්වයන් වහන්සේ ද තවුස් පැවිද්දෙන් පැවිදිවූහ. පැවිදිවීද ආහාර සොයායාමෙහි නොයෙදී රජගහනුවරින් ගෙන්වනලද භික්ෂාවෙන් යැපෙන්නාහු බ්‍රහ්විහාර විසූහ. ඒනිසා **සො මෙත්තා සහගතෙන** ආදිය කියන ලදී. **කුමාර කිළකං කීළි** උකුලින් උකුලට වඩනු ලබමින්ම ක්‍රීඩා කළහ. ඔවුහු මල්කලඹක් මෙන් ඔහු ඔසවාගෙනම හැසිරුණාහ. **රඤ්ඤොපදා මඛාදෙවස්ස පුත්තො - පෙ - පබ්බජි** මොහු පැවිදිවූ දිනයෙහි මඟුල් පහක් සිදුවිය. මඛාදේව රජුගේ මතක බත, ඒ රජුගේ පැවිදි මඟුල, ඔහුගේ පුතුට නම් තබන මඟුල යුවරජකමට පත්වීමේ මඟුල සේසත් නැංවීමේ මගුල යැයි එකම කලෙක මගුල්පහක් කළහ. මුළු දඹදිව් තලයට විවේක දිනයක් විය. **පුත්තපපුත්තකා** පුත්‍රයෝ ද මුණුබුරෝදැයි යනුවෙන් පැවති ඔහුගේ පරපුර, **පච්ජිමකො අහොසි** පැවිද්දෙන් පශ්චිමයා විය. බෝධිසත්වයෝ බ්‍රහ්මලෝකයෙහි ඉපිද, මා විසින් මිනිස් ලොව පිහිටවූ යහපත් වැඩපිළිවෙළ පවතීදැයි ආවර්ජණය කරත් මෙතෙක් පැවැති බවද දැන් නොපවත්නා බවද දුටුවෝය. දැන් නොපවතින්නේයයිද දුටුවේය. මාගේ ප්‍රවේණිය සිඳ දමන්ට නොදෙමියි තමාගේ වංශයෙහි උපන් රජුගේම අගමෙහෙසියගේ කුසයෙහි පිළිසඳගෙන තමාගේ වංශයට නිම්වළල්ලක් ගසන්නාක් මෙන් උපන්නෝය. ඒනිසාම ඔහුට නිමි යයි නමක් විය. මෙසේ හෙතෙමේ පැවිදිවූ රජුන් සියලු දෙනට පශ්චිම වී පැවිදිවූයේනුයි පැවිද්දෙන් පශ්චිමයා විය. ගුණයෙන් අතිරේකතර විය. සියලු රජුන්ට වඩා ඔහුගේ අතිරේක තරවූ ගුණ දෙකක්

විය. සිව්දෙර සියදහසක් සියදහසක් බැගින් දිනපතා දන් දුන්නේය. අඩමසකට වරක් දර්ශනය වැළැක්වීය. අඩමසකට වරක් රජුන් දකින්නෙමියි ගිය විට දෙරටුපාලයා මෙසේ විමසයි ඔබ මසකට වරක් එන්නේද නොවේද අඩමසකට වරක් එන්නෝනම් ඔවුන් වළක්වයි අඩමසකට වරක් එන්නවුන්ට රජතුමා දර්ශනයක් නොදෙයි. අපි ජනපද වැසියෝ වෙමු. උදෑසන ආහාර කොහින් ලබන්නෙමුද්, එහි කතාකිරීමට අවසරයක් නැත. සිව් දෙරටුවෙහිද රජ මිදුලෙහිද නොයෙක් දහස් ගණන් බත් සැළි පිළියෙල කොට ඇත. ඒනිසා මහජනයා කැමති කැමති තැන රැවුල කපා නා වස්ත්‍ර අමුතුවෙන් හැඳ කැමතිපරිදි බොජුන් අනුභව කොට උපොසථ අංග ඉටාගෙන රජුගේ මාලිගය ඉදිරියට යයි. දෙරටුපල්ලා විසින් ඔබලා මසකට වරක් එන්නාහුදැයි අසනු ලැබුවෝ එසේය එසේයැයි කියති. එසේනම් එවුයැයි ප්‍රවේශකරවා රජුට දක්වයි මෙසේ මේ ගුණ දෙකින් අතිරේක තර විය. දෙවතානං තාවතිංසානං තවුතිසා දෙව්ලොව උපන් දෙවියන්ට, ඒදෙවියෝ විදේහ රට මිථිලා නගර වැසි රජුගේ අවවාදයෙහි පිහිටා පන්සිල් රැක පෙහෙවස්කම් කොට එහි ඉපදුණාහු රජුගේ ගුණ කථා කියති. ඔවුන් සඳහා කියන ලදී දෙවානං තාවතිංසානං යනුවෙන් නිසිනෙනාහොති උතුම්පහයෙහි මතුමහලට ගියේ දනය ශීලයද පරීක්ෂාකරබලමින් හුන්නේ වෙයි. ඔහුට මෙසේ සිතිණ දනය මහත්ය, සීලයද මහත්ය, ඉදින් දනය මහත්නම් සියල්ල අබ්බවා දනයම දෙන්නෙමි. එසේනම් සීලය මහත්නම් සීලයම පුරන්නෙමියි ඔහුට කුමක් මහත් දැයි නිශ්චයකරන්ට නොහැකිව සිටිනවිට ශක්‍රයා ගොස් ඉදිරියෙහි පහළ විය. අථඛො ආනාද - පෙ - පමුඛෙ පාතුරහොසි යි කියන ලදී. ඔහුට මෙසේ සිතිණ රජුට සැකයක්උපන ඔහුගේ සැකදුරු කිරීම පිණිස ප්‍රශ්නයක්ද කියන්නෙමි. මෙහි පැමිණෙන බවට ප්‍රතිඥාවක්ද ගන්නෙමි. ඒනිසා ගොස් ඉදිරිපිට පහළවිය. රජ පෙර නුදුටු විරූ රූපය දැක බියපත්විය. ලොමු දැහැගත්තේය. ඉක්බිති ශක්‍රයා බියනොවන්න මහරජ, විශ්වාසඇතිව ප්‍රශ්නයක් විචාරන්න. ඔබගේ සැකය දුරුකරලන්නෙමි. රජ මෙසේ ඇසීය.

පුච්ඡාමි තං මහා බාහු සබ්බභූතානම්සසර
දනංවා බ්‍රහමචරියංවා කතමං සුමහප්ඵලං

සියලු භූතයන්ට අධිපති
මහා බාහු ඇත්තව.
මම අසමි ඔබගෙන්
දනයද බඹසරද
මහත්ඵල දෙන්නේ?

ප්‍රශ්නයක් ඇසීය. ශක්‍රයා දනය කුමක්ද, සීලයම ගුණවිශිෂ්ට බැවින් මහත්‍ය. මහරජ මම පූර්වයෙහි වර්ෂ දසදහසක් ජටිලයන් දස දහසකට දන්දී ප්‍රේතවිෂයයෙන් නොමිදුණෙමි. සිල්වත්තු මාගේ දනය වළදා බඹලොව උන්නාහුයැයි කියා මේ ගාථා කීය.

හීනෙන බ්‍රහමචරියො බත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙනච දෙවත්තං උත්තමෙන විසුජ්ඣති

හීනවූ බඹසරින්
කැත්කුලයෙහි උපදී
මැදි බඹසරින් දෙවත්බව ලබයි
උතුම් බඹසරින් විසුදුවේ.

නහෙතෙ සුලහාකායා යාච යොගෙන කෙනචි
යෙකායෙ උපපජ්ජන්ති අනගාරා තපස්සිනො

කිසියම් යෝගයක යෙදුණු පමණින්
මේ අත්බැව් ලැබීම අපහසුය.
එබඳු අත්බැව්හි උපදින්නෝ
අනගාරික තපස් වීහුය.

මෙසේ රජුගේ සැක දුරුකොට දෙව්ලොව ගමන පිණිස ප්‍රතිඥාවක් ගනු සඳහා **ලාභාතෙ මහාරාජ** ආදිය කීය. එහි **අවිකම්පමානො** යනු නොපිරිහෙන්නේ අධිවාසෙසි මම මහජනයා කුසල්හි සමාදන් කරවමි. පින්වතුන් වසන තැන දක පැමිණ මිනිස් පියසෙහි ඒ සැප කියන්ට වේහුයි

ඉවසිය. එවං හදදනනවා මෙසේ ඔබගේ වචනය සොඳුරු වේවායි කියා යොජේත්වා එකම වියගසක දහසක් ආජානීය අශ්වයන් යොදා ඔවුන් තනිව යෙදුමක් නැත. සිත් අනුව යෙදුවාහුම වෙති : ඒ දිව්‍ය රථය යොදුන් එකසිය පනසක් වෙයි. රැහැනෙහි පටන් රථමුදුනට පනස් යොදුනකි. අක්ෂ දණ්ඩ පනස් යොදුනකි. අක්ෂ දණ්ඩෙහි සිට පසු භාගය පනස් යොදුනකි. සියල්ල රක්ත වර්ණ උතුම් මැණික්මුවා වෙයි. දෙව්ලොව උඩය. මිනිස් ලොවනම් යටය ඒනිසා යටිකුරු ලෙස රථය යැවීයයි නො සැලකිය යුතුයි. යම්සේ පියවි මගෙහි යැවේනම් එසේවෙයි. මෙසේ මිනිසුන්ගේ රාත්‍රි ආහාරය නිමවුකල්හි නවසඳ සමග දෙදෙනා බැගින් එකට වියගසෙහි බැඳ යැවීය. සඳයුගලයක් නැගුණාක් මෙන් විය. මහජනයා දැක සඳ දෙකක් නැගලායයි කීය. එක් එක්ම සඳ යුගලක් නොව එක් විමානයක් නොවේ. එක් රථයකි. රථයද එත්එත්ම ප්‍රකෘති රථයක ප්‍රමාණය මය. අශ්වයෝ ප්‍රකෘති අශ්වයන් පමණම වූහ. මෙසේ රථය ගෙනවුත් රජුගේ ප්‍රාසාදය පැදකුණු කොට පෙරදිග සීමැදුරු කවුළුව සිට නැගීම සඳහා සැදීම් කළේය. මහරජතුමනි නගින්න. දිව්‍යයානයක් මට ලැබුණේය එකෙණෙහි නැංගේය. නුවරුන්ට අවවාදයක් දුන්නේය. දරුවෙනි බලවු, සක්දෙව් රජු විසින් මට දිව්‍ය රථයක් එවන ලදී. එයද ජාතිය හෝ ගෝත්‍රය හෝ කුලප්‍රදේහය හෝ නිසා නොඑවන ලද්දකි. මාගේ ශීලාචාර ගුණයන්හි පැහැදී එවන ලද්දකි. ඉදින් තොපිත් සිල් රකිවුනම් තොපටත් එවන්නේය. මෙසේ සීලය රැකිය යුත්තක්මය. මම දෙව්ලොවට ගොස් පමානොවන්නෙමි. අප්‍රමාදී වවුයයි මහංජනයාට ඔවදන් දී පන්සිල්හි පිහිටුවා රථයට නැංගේය. ඉන්පසු මාතලී පියැදුරා මම ද මහරජුට මටසුදුසු දෙයක් කරන්නෙමියි අහසෙහි මං දෙකක් පෙන්වා අපිච මහාරාජ ආදිය කීය. එහි කතමෙන මහාරාජ මේ මං දෙකින් එක්මගක් නිරය වෙතට දිවෙයි. එකක් දෙව්ලොව වෙත දිවෙයි. ඒ දෙකින් කුමකින් ගෙන යම්ද. යෙන යම් මගකින් ගොස්, යම්තැනක පව්කම්කරන්නෝ පාප කර්මයන්ගේ විපාකය විඳිත්ද එතැන ලබන්ට හැකිය යන අර්ථයි. දෙවැනි පදයෙහිද මෙම ක්‍රමය මැයි. ජාතකයෙහි:

කෙනතං නෙමි මගෙන රාජසෙට්ඨදිගම්පතී
යෙනවා පාප කම්මනෙතා - ප්‍රඤ්ඤකම්මාච යෙනවා

රාජාධි රාජවූ දිසාපතිවූ
නිමි මහරජ තුමනි
පව් කමින් හෝ පින් කමින් යන
කුමන මගකින් මෙහි පැමිණියෙහිද?

ගාථාවෙහි මෙම අර්ථය එහෙයින් කියන ලදී.

> **නිරයං තාව පස්සාමි ආවාසං පාපකම්මිනං**
> **ඨානානි ලද්ධ කම්මානං දුස්සීලානඤ්ච යාගතී**

පව්කම් කරන වුන්
වසන තැන නිරයැයි දකිමි
සැහැසිකම් කරනවුන්, දුසිලුන්
උපදනා තැන මෙයයි.

මාතලී මන්ත්‍රිය. මාර්ගදෙකින්ම මා ගෙනයන්න. මම නිරයද දෙව්ලොවද දකිනු කැමැත්තෙමි. පළමුවෙන් කුමකින් ගෙනයම්ද? පළමුවෙන් නිරය මාර්ගයෙන් ගෙන යන්න. ඉන්පසු මාතලී තමාගේ ආනුභාවයෙන් රජුට පසළොස් නිරය පෙන්වීය. මෙහි විස්තර කථාව වනාහි.

> **දස්සෙසි මාතලී රඤ්ඤො - දුග්ගං වෙතරණිං නදිං**
> **කුපිතං ඛාරසංයුත්තං තත්තං අග්ගි සිඛූපමං**

බුබුළුදමන ලවණ ජලයෙන් පිරුණු
ගිනි සිළුවක් මෙන් රත්වූ
දුගම වේතරණී නදිය
මාතලී, රජුට පෙන්විය.

ජාතකයෙහි කියුක්‍රමයෙන් දත යුතුයි. නිරය පෙන්වා රථය නතර කර දෙව්ලොවට අභිමුඛ කොට බීරණීනම් දෙව්දුවගේ සොණදින්න දිව්‍ය පුත්‍රයාගේද ගණ දේවපුත්‍රයන්ගේ ද විමාන පෙන්වමින් දෙව්ලොවට පැමිණ වීය. මෙහිද විස්තරකථාව:

යදිතෙසු තා බීරණී ජීවලොකෙ
ආමා යදසි අහු බ්‍රාහමණසස
සා පත්තකාලං අතිථිං විදිත්වා
මාතාව පුත්තං සකිමාභිනන්දි
සංයමා සංවිභාගාච සා විමානසමිං මොදති

බමුණාගේ ප්‍රවේණි දසියවූ බීරණී,
සුදුසුකල්හි එන ආගන්තුකයා දැන
පුතු සමග තුටු වන මව මෙන්
සංයමයෙන් සංවිධානයෙන් යුතුව
අද විමානයෙහි තුටුවෙයි.

ජාතකයෙහි කියන ලද පරිද්දෙන් දත යුතුයි. මෙසේ යන ඔහුගේ රථයෙහි නිමි වළල්ල චිත්‍රකූටයෙහි දෙරකොටුවෙහි උළුවස්සෙහි වැදුණු සැණින් දෙව්නුවර කෝලාහලවිය. සක්දෙව් රජු තනිව අත්හැර දේව ගණයා බෝධිසත්වයන්ට පෙරගමන් කළහ. දෙවියන්ගේ ඒ ආදරය දැක ශක්‍රයාද සිත දරාගන්ට අසමත් වන්නේ මහරජතුමනි, දෙව්ලොව දිව්‍යානුභාවයෙන් සතුටු වන්නැයි කීය. ඔහුට මෙසේ සිතිණ. මේ රජ අද පැමිණ එක්දවසකින්ම දේවගණයා තමා අබිමුවට ගෙන්විය. ඉදින් දවසක් දෙකක් විසුවොත් දෙවියෝ මා දෙස නොබලන්නෝ යැයි ඊර්ෂ්‍යාවෙන් පෙළෙමින් මහරජ ඔබට මේ දෙව්ලොව විසීමට පින්නැත. අනුන්ගේ පිනින් වසන්නැයි මේ අදහසින් මෙසේ කීය. බෝධිසත්වයන් වහන්සේ මේ මහලු ශක්‍රයාට සිත වාවාගන්ට නොහැකිය. අනුන්ට යාච්ඤා කොට අනුන්නිසා ලබාගත් බඩුවක් මෙන් වෙතියි ප්‍රතික්ෂේප කරන්නේ පින්වත වැඩක් නැතැයි ආදිය කීය. ජාතකයෙහිද මෙසේ කියන ලදී.

යථා යාචිතකං යානං යථා යාචිතකං ධනං
එවං සමපදමෙවෙතං යමපරතො දන පච්චයා
නචාහමෙතං ඉච්ඡාමි යමපරතොදන පච්චයා

ඉල්ලාගත් යානයක්
ඉල්ලාගත් ධනයත් සමානය.
අනුන්ගේ දන හේතුවෙන්
ලබාගත් සම්පතකි.
අනුන්ගේ දන හේතුවෙන්.
ලදමෙය නොකැමැත්තෙමි

සියල්ල කිවයුතුය. බෝධිසත්වයෝ මනුෂ්‍යාත්මභාවයෙන් කීවරක් දෙව්ලොවට ගියාහුද? සතරවරකි මන්ධාතු රජුන් කාලයෙහි සාධීනරජකාලයෙහි. ගුත්තිල විණාවාදනය කරන කාලයෙහි, නිමිමහාරාජ කාලයෙහි යනුවෙන්. හෙතෙමේ මන්ධාතුකාලයෙහි දෙව්ලොව අසංඛ්‍යකාලයක් විසීය. එහි වසද්දීම ශක්‍රයෝ තිස්හය දෙනෙක් චුතවගියහ. සාධීන රජකල්හි සත්දිනක් විසීය. මිනිස් ගණනින් වර්ෂ එකසිය හතකි. ගුත්තිල වීණා වාදනය කරන කල්හි ද නිමිමහාරාජ කල්හිද මොහොතක් පමණක් විසීය. මිනිස් ගණනින් සත්දවසක් වෙයි. එහිදීම මිථිලාවට ආපසු පැමිණවීය නැවතගෙන්වා ප්‍රකෘති සිරියහන් ගබඩාවෙහිම පිහිටුවීය. **කළාරජනකො** ඔහුගේ නමයි. පිටට නෙරාගිය දත් ඇති බැවින් කළාර ජනක යයි කියන ලදී. ගිහිගෙන් නික්ම අනගාරික සංඛ්‍යාත සසුනෙහි පැවිදිනොවී මෙපමණක්ම නොකළේය සෙසු සියල්ල ප්‍රකෘති තත්වයේම විය. **සමුචෙඡදෙ** හොති මෙහි යහපත් වැඩ පිළිවෙළ කවරෙක් කඩා දමයිද, කාවිසින් කඩාදමන ලද්දේද, කවරෙක් පවත්වයිද. කවරකු විසින් පවත්වන ලද්දේද යන මේ විභාගය දතයුතුය. එහි සිල්වත් භික්ෂුවක් මාවිසින් රහත්බව ලැබීමට නොහැකියයි වීර්යය නොකරන්නේ කඩාදමයි. දුස්සීලයා විසින් කඩාදමන ලද්දේනම් වෙයි. සප්තසේඛයෝ පවත් වති. ක්ෂීණාශ්‍රවයා විසින් පවත්වන ලද්දේ නම් වෙයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

තෙවැනි මඛාදේව ජාතකයයි

## 2.4.4

එවමෙමෙසුතං යනු මධුර සූත්‍රයයි. එහි මහාකච්චානෝ ගිහිකල උදේනී රජුගේ පුරෝහිතයාගේ පුත්‍රයාය. රූපවත්ය. දක්ෂමකළය. ප්‍රසන්නය රන්වන්ය. මධුරායං එනම් ඇති නගරයෙහි ගුඳුවනෙ කණ්හ ගුන්ද වනයෙහි, අවන්තිපුත්තො අවන්ති රටෙහි රජුගේ දූවගේ පුත්‍රයාය වුද්ධො චෙව අරහාච තරුණයා රහත්වුවද මහලු තෙරුන්ට මෙන් සම්භාවනා නොකෙරෙති. උන්වහන්සේ වෘද්ධද රහත් ද වූහ. බ්‍රාහමණා හො කච්චාන ඒ රජතෙමේ බ්‍රාහ්මණ ලබ්ධිකයෙකි. ඒනිසා මෙසේ කීය. බ්‍රාහමණොව සෙට්ඨො වණ්ණො ආදිතන්හි ජාති ගෝත්‍ර ආදිය පනවන තැන බමුණෝම ශ්‍රේෂ්ඨයයි දක්වයි. හීනො අඤ්ඤො වණ්ණො ඉතිරි වර්ණත්‍රය හීන යයිද ලාමක යැයිද කියයි. සුක්කො සුදු කණ්හො කලු, සුජ්ඣන්ති ජාතිගෝත්‍ර ආදිය පනවන අර්ථයෙන් පිරිසිදු වෙත්. බ්‍රහමුනො පුත්තා මහා බ්‍රහ්මයාගේ පුත්‍රයෝ, ඔරසා මුඛතොජාතා උරයෙහි වැස මුඛයෙන් නික්මුණු. උරයෙහි තබා වර්ධනය කරන ලද්දේ නුයිද ඔරසනම් බ්‍රහමජා බ්‍රහ්මයාගෙන් උපන්, බ්‍රහමනිම්මිතා බ්‍රහ්මයා විසින් නිර්මාණය කරන ලද, බ්‍රහමදයාද බ්‍රහ්මයාගේ දයාදය ඝොසොයෙව ඛො එසො එය ව්‍යාවහාර මාත්‍රයක්මය. ඉජ්ජෙය්‍යා සමෘද්ධ වන්නේය. යම්තරම් ධනය ප්‍රාර්ථනා කරයිද එපමණින් ඔහුගේ මනෝරථය පිරෙන්නේය යන අර්ථයි. ඛත්තියො පිසස ක්ෂත්‍රියයෙක් වෙයි. මේ ඓශ්චර්ය සම්පන්න පුද්ගලයා සැමට කලින් නැගිටින්නේ වෙයි. නෙසං එත්ථ කඞ්ඛාවි යනු මොවුන්ට මෙහි කිසිවක් නැත. ආසනෙනවා නිමන්තෙය්‍යා හුන් අසුන ගසාදමා මෙහි හිඳින්නැයි කියන්නෙමු. අභි නිමන්තෙය්‍යාම පිතං මෙහි ගෙනවුත් ඔහුට ආරාධනා කරන්නෙමු. එහි කැඳවීම දෙයාකාරයි. වචනයෙන් ද කයින්ද, ඔබ කැමති කැමති ක්ෂණයෙහි මට චීවරාදියෙන් කියන්නාහුය. යම් අර්ථයකින්දූයි කියන්නේ වචනයෙන් කැඳවා ආරාධනය කරයි නම් චීවර ආදියෙහි වෙනස සලකා මෙය ගන්න. ඒවා දෙන්නේ කයින් කැඳවා ආරාධනය කරයි නම්. ඒ දෙකම සඳහා අභිනිමන්තෙය්‍යාමපිනං යනුවෙන් කීය. රක්ඛාවරණ ගුත්ති ආරක්ෂා සංඛ්‍යාතවූද ආවරණ සංඛ්‍යාතවූද රැකවරණය. එයවනාහි ආයුධ අතින්ගත් පුරුෂයන් තබන්නහු විසින් ධාර්මික ආරක්ෂාව තබන ලද්දේවෙයි. යම්සේ අවේලාවෙහි දර ගෙන එන්නාවූ ස්ත්‍රීහුද කොළ ගෙන එන්නාවූ ස්ත්‍රීහු

විහාරයට නොපිවිසෙත්ද මුව වැද්දෝ ආදීහු විහාර සීමාව තුළ මුවන්හෝ මත්ස්‍යයන්හෝ නොඅල්ලත්ද එසේ සංවිධාන කරන්නා විසින් ධාර්මික ආරක්ෂාව තබන ලද්දේනම් වේ. ඒ සඳහා කීය. ධම්මිකං යනුවෙන් එවං සනෙත මෙසේ චතුර්වර්ණ ඇති පැවිද්දන්ට පැවිදි සත්කාර සමකල්හි සමාන කල්හි, සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

## සිව්වැනි මධුරසුත්‍රයයි

## 2.4.5

**එවමෙමසුතං** යනු බොධිරාජ කුමාර සුත්‍රයයි. එහි කොකනදෙ කොකනදයයි කියනු ලැබේ. ඒ මංගල ප්‍රාසාදය එල්ලෙන නෙළුමක හැඩයෙන් පෙනුමෙන් කරන ලද්දකි. ඒනිසා කෝකනදයයි නමක් ලැබීය. **යාව පච්ඡිමා සොපාන කළෙපරා** - එහි පශ්චිමසෝපාන කළෙපර යනු පියගැට පෙළෙහි පළමුවැනි එලකයයි කියන ලදී. අද්දසාබො බලන අර්ථයෙන්ම දෙර කොටුවෙහි සිට දුටුවේය. **භගවා තුණ්හී අහොසි** කවර අර්ථයකින් රජකුමරා විසින් මේ මහා සත්කාරය කරන ලද්දේදැයි ආවර්ජනය කරනු යේ පුත්‍රයකු පතා කරන ලද බව දන්නේය. ඒ රාජපුත්‍රයා පුත්‍රයන් නැති බහුශ්‍රැතයෙක් විය. බුදුවරුන් හමුවෙහි උත්සාහ කර මනසින් කැමතිවන දේ ලබත්. හෙතෙමේ ඉදින් මම පුත්‍රයකු ලබන්නෙම් නම් සම්මාසම්බුදුන් වහන්සේ මේ රෙදිකඩ පාගන්නෝය නොලබන්නෙම්නම් නොපාගන්නෝ යැයි ප්‍රාර්ථනාවක් කොට ඇතිරවීය ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මොහුට පුතෙක් උපදින්නේ දැයි ආවර්ජනා කොට නූපදින්නේයයි දුටුසේක. පෙර ඔහු එක්තරා දූපතක වසමින් වටු කුරුලු පැටවුන් කෑවේය. ඉදින් ඔහුගේ ගැහැණිය පින් ඇත්තී වන්නී නම්, දෙදෙනා විසින් සමාන කැමැත්තෙන් යුතුව පාපකර්මය කළබැවින් පුත්‍රයෙක් නූපදින්නේයයි දත්සේක. රෙදිකඩ පාගන කල්හි බුදුන් හමුවෙහි උත්සාහයක් කොට පැතුදෙය ලබත් යයි ආරංචියක් ලෝකයෙහි ඇත. මා විසින්ද මහා උත්සාහයක් කරන ලදී. පුත්‍රයකු නොලබම්නම් මේ කීම තුච්ඡයයි මිථ්‍යාදෘෂ්ටිය ගනිම්. මිසදිටුවෝද ශ්‍රමණයන්ට නොකළහැකි දෙයක් නැත. රෙදිකඩවල් පාගමින් ඇවිදිතිය කෑගසනු ඇත. දූත්ද

පාගන්නවුන් අතර බොහෝ භික්ෂූහු පරසිත් දන්නෝය. ඔවුහු සිදුවිය හැකි දෙය පමණක් දැන පාගත්. සිදුවිය නොහැක්ක දැන නොපාගත්. අනාගතයෙහි උපනිශ්‍රය මඳවන්නේය. අනාගතය නොදන්නෝය. ඔවුන් පාගන විට ඉදින් ප්‍රාර්ථනාව ඉටු වන්නේනම් එය කුසලයකි. ඉටුනොවන්නේ නම් ඉස්සරනම් භික්ෂුසංඝයා හමුවෙහි උත්සාහ කොට කැමති කැමති වූ දෙය ලබති. දැන් නොලබති. ප්‍රතිපත්ති පුරන භික්ෂූන් ඔවුන් වූහයි හැඟේ. මොවුහු පිළිවෙත් පුරන්ට නොහැක්කෝයැයි මිනිස්සු විපිළිසර වන්නාහුය. මේ කරුණු නිසා භාග්‍යවතුන් වහන්සේ පා තබන්ට නොකැමති සේක් නිහඬ වූහ. ශික්ෂා පදයක්ද පැනවූ සේක. මහණෙනි රෙදිකඩ නොපෑගිය යුතුය. මගුල් පිණිස පැනවූ රෙදිකඩ නොපාගන්නවුන් කෙරෙහි පෑගීම පිණිස අනුප්‍රඥප්තියක් තැබූසේක. මහණෙනි ගිහියෝ මගුල් ඇත්තෝය. මගුල්පිණිස වූ රෙදිකඩ පෑගීම අනුදනිමි. **පච්ඡිමං ජනතං තථාගතො අපලොකෙති** කියන ලද කාරණයන්හි තුන්වැනි කරුණ සඳහා තෙරුන් වහන්සේ මෙය කීහ. **නබොසුඛෙන සුඛං** යනුවෙන් කුමක්නිසා කීයේද? සම්මාසම්බුදුන් වහන්සේ කාමසුඛල්ලිකානු යෝගී සංඥාවෙන් නොපෑගුසේක. ඒනිසා මමද ශාස්තෲන් වහන්සේ සමග සමානච්ඡන්ද වන්නෙමියි. හඟිමින් **සොබොඅහං** යනුවෙන් කීහ. **යාව රත්තියා පච්ඡිමයාමෙ** මහාසච්චක සූත්‍රයෙහි කියූ ක්‍රමයෙන් දතයුතුය. ඉන් මතුවට පස්වග මහනුන්ගේ ආශ්‍රවක්ෂය දක්වා පාසරාසි සූත්‍රයෙහි කියූ ක්‍රමයෙන් දත යුතුය. **අඞ්කුසගය්හ සිප්පෙ** අංකුස ගන්නා ශිල්පයෙහි. **කුසලො අහං** මම දක්ෂවෙමි. කවරකුගේ සමීපයෙහි ශිල්ප උගත්තේද පියා සමීපයෙහිම උගත්තේය. කොසඹෑ නුවර පරන්තප නම් රජෙක් රජ කළේය රජමෙහෙසිය ගැබ්බරව උඩුමහලෙහි රජුසමග ළාහිරු රැස් තපිමින් රතු කම්බිලියක් පොරවා හුන්නීය. එක් ඇත්කඳ ලිහිණියෙක් මස් පිඩුවක්යයි හඟිමින් ගෙන අහසට පැන්නේය. අද මා අත්හැර දමතියි බියෙන් නිහඬව සිටියාය. ඌ ඇය පර්වත පාමුල රුක් දෙබලක තැබීය. ඇ අතින් සංඥා කරමින් මහා හඬක් නැගුවාය. පක්ෂියා පළාගියේය. ඇයට එහිදීම ප්‍රසූතිය සිදුවිය. තුන්යම රැය වැසි වසිද්දී කම්බිලිය පොරවාගෙන හුන්නාය. ඉන් නුදුරෙහි තවුසෙක් වෙසේ හෙතෙමේ ඇයගේ හඬින් අරුණු නැගුණු කල්හි රුක්මුලට පැමිණියේ ජාතිය විමසා හිනිමඟක් බැඳ බස්සවා තමා වසන තැනට ගෙනගොස් කැඳ පෙව්වේය. දරුවාට වර්ෂා ඍතුවත් පර්වත

සතුවත් ගෙන උපන් බැවින් උදේනයයි නමක් තැබීය. තවුසා ගඩාගෙඩි ගෙනවුත් දෙදෙනාම පෝෂණය කරයි. ඈ එක් දවසක් තවුසා එනවේලාවෙහි පෙරගමන් කොට ස්ත්‍රී අඟර දඟර පෙන්වා තාපසයා ශීලභේදයට පත්කළාය. ඔවුන් එක්ව වසමින් කල් ගතවද්දී පරන්තප රජ කලුරිය කළේය. තාපසයා රාත්‍රි කාලයෙහි නැකැත්තරු බලා රජු මියගියබව දැන, ඔබගේ පුත්‍රයා මෙහි වසන්ට කැමැත්තේද, නැතහොත් පියාසතු රාජ්‍යයෙහි සේසත් නංවන්ට කැමැත්තේදැයි විමසීය. ඈ පුත්‍රයාට මුලපටන් සියලු පුවත් කියා සේසත් නැංවීමට කැමැත්ත ඇතිබව දැන තවුසාට කීවාය. තවුසා ඇතුන් බඳනා ශිල්පය දනී. එය කොයින් ලැබුණාක්ද? ශක්‍රයාගේ සමීපයෙනි. පෙර ශක්‍රයා ඔහුගේ උපස්ථානයට පැමිණ කුමකින් කරදර වේදැයි ඇසීය. හෙතෙමේ ඇතුන්ගෙන් කරදර ඇතැයි දැන්වීය. ශක්‍රයා ඔහුට ඇතුන් බඳනා ශිල්පයද වීණාවක්ද දී පළායෑමට කැමැත්ත ඇතිකල මේ තත වයා මේ ගීය කියන්න. කැඳවීමට කැමැත්ත ඇතිකල මෙ ගීතය කියන්නැයි කීය. තවුසා ඒ ශිල්ප කුමාරයාට දුන්නේය. හෙතෙමේ විශාල ගසකට නැඟ ඇතුන් ආකල්හි තත වයා ගීතය ගයයි. ඇත්තු බියවී පළාගියහ. හෙතෙමේ ශිල්පයෙහි ආනුභාවය දැන දෙවැනි දවසෙහි කැඳවන ශිල්පය යෙදීය. දෙවු ඇතා පැමිණ ඇත්කඳ පිරිනැමීය හේ උගේ පිටඋඩ නැග යුදයෙහි සමත් තරුණ ඇතුන් තෝරා ගෙන කම්බිලියද මුද්දද ගෙන මව්පියන් වැඳ නික්මෙන්නේ පිළිවෙළින් ඒ ඒ ගමට පිවිස මම රජුගේ පුත්‍රයාය. සම්පත් කැමැත්තෝ එන්වායි ජනයාට සංග්‍රහ කොට නුවර වට කොට මම රජුගේ පුත්‍රයාය. සේසත දෙවූ. නොඅදහන්නවුන්ට කම්බිලියත් මුද්දත් පෙන්වා සේසත් නැංවීය. හේ හස්තිධනය ඇත්තේව අසුවල් තැන සොඳුරු ඇතෙක් ඇතැයි කීකල්හි ගොස් අල්ලාගනී. චණ්ඩපජ්ජෝත ද ඔහුගේ සමීපයෙහි ශිල්ප උගන්නෙමියි ලීයෙන් තැනූ ඇතකු යොදවා එහි ඇතුළත යෝධයන් හිඳුවා ඒ ඇතා අල්ලාගැනීමට පැමිණයවුන් අල්ලා ඔහුගේ සමීපයෙහි ශිල්ප ඉගෙනීම පිණිස දුව පිටත්කර හැරියේය. හේ ඇය සමග සංවාස කොට ඔහු රැගෙන තමාගේ නගරයටම ගියාය. ඇගේ කුසෙහි උපන් මේ බෝධිරාජ කුමාරයා තමාගේ පියා සමීපයෙහි ශිල්ප උගත්තේය.

පධානියඞ්ගානි පධානං යනු උත්සාහවත්බව මොහුට ඇත්තේනුයි පධානියෝ උත්සාහවත් භික්ෂුවගේ අංගනුයි පධානියඞ්ගනි සද්ධො ශ්‍රද්ධාවෙන්යුත් මේ ශ්‍රද්ධාව වනාහි ආගමන සද්ධා, අධිගමන සද්ධා

ඔකප්පන සද්ධා පසාද සද්ධායැයි සිව්වැදෑරුම් වෙයි. එහි සර්වඥ බෝධිසත්වයන්ගේ ශ්‍රද්ධාව අභිනීහාරයෙහි පටන් පැමිණිබැවින් ආගමන සද්ධානම්. ආර්ය ශ්‍රාවකයන් ප්‍රතිවේධයෙන් අවබෝධකරගත් බැවින් අධිගමන සද්ධානම් බුද්ධ ධර්ම සංඝයැයි කීකල්හි නොසැලෙන බැවින් සිත පිහිටුවා ගැනීම ඔකප්පන සද්ධා නම් ප්‍රසාදය ඉපදීම පසාද සද්ධානම් මෙහි ඔකප්පන ශ්‍රද්ධාව අදහස් කරන ලදී. **බෝධිං** චතුර්මාර්ග ඥානයයි. එය මනාසේ තථාගතයන් විසින් අවබෝධ කරන ලද්දේයයි අදහයි. මෙය දේශනා ශීර්ෂයද වෙයි. මේ අංගයෙන් ත්‍රිවිධ රත්නයෙහි ශ්‍රද්ධාව අභිප්‍රේතයි. යමකුගේ බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාදය බලවත් වේද ඔහුගේ ප්‍රධන් වීර්යය ඉටුවෙයි. **අප්පාබාධො** රෝගනැති. **අප්පාතංකො** දුක්නැති **සමවෙපාකිනියා** ආහාර පැසවීමේ සම්බන්ධතාව ඇති කර්මජ තේජෝ ධාතුවෙන්, **නාතිසීතාය නාච්චුණ්හාය** අතිශීත තේජෝධාතුවක් ඇත්තෝ ශීතලට බිය ඇත්තෝය අතිඋෂ්ණ තේජොධාතුවක් ඇත්තෝ උෂ්ණයට බිය ඇත්තෝය. ඔවුන්ගේ ප්‍රධන් වීර්යය ඉටු නොවේනම් මධ්‍යම තේජෝ ධාතුවක් ඇත්තකුට ඉටුවෙයි. එහෙයින් කීය. **මජ්ඣිමාය පධානක්ඛමාය** යනුවෙන් **යථාභූතං අත්තානං ආවිකත්තා** තමාගේ ඇති අගුණ ඇති පරිදි ප්‍රකාශ කරන්නා. **උදයත්ථගාමිනියා** උදයටත් අස්තයටත් යාමට පිරිසිදීමට සමත් මෙයින් සමපඤ්ඤාස සමලක්ඛණ පරිග්‍රාහක උදව්‍යය ඥානය කියනලදී. **අරියාය** පිරිසිදු **නිබ්බේධිකාය** විනිවිද නොගිය විරූ ලෝභස්කන්ධ ආදිය විනිවිදින්ට සමත්. **සම්මාදුක්ඛක්ඛය ගාමිනියා** තදඞ්ගවශයෙන් කෙලෙස් ප්‍රහීණකළබැවින් යම් දුකක් ගෙවීයයිද ඒ දුකෙහි ක්ෂයටයන, මෙසේ මේ සියලු පදවලින් විදර්ශනා ප්‍රඥාවම කියන ලදී. නුවණනැත්තනුගේ ප්‍රධන්වීර්යය ඉෂ්ටනොවේ. මේ ප්‍රධාන අංග පස ලෞකික බව දතයුතුය. **සායමනුසිට්ඨො පාතො විසෙසමධිගච්ඡති** සූර්යයා අස්තයට ගියකල්හි උපදෙස් දෙන ලද්දේ අරුණු නැගෙන වේලෙහි විශේෂත්වයට පැමිණේ. **පාසමනුසිට්ඨොසායං** අරුණුනැගෙන වේලෙහි උපදෙස් දෙනලද්දේ සූර්යයා අස්තයට යන වේලාවෙහි මේ දේශනාවද නෙය්‍ය පුද්ගලවශයෙන් කියන ලදී. මුග්ධප්‍රඥා ඇති නෙය්‍ය පුද්ගලයා වර්ෂ සතකින් පැමිණේ. සෙස්ස මධ්‍යම ප්‍රඥා ඇත්තන් වශයෙන් දතයුතුය. අහෝ බුද්ධ, අහෝධර්ම. අහෝ සංඝ සම්පත්තියැයි යම්හෙයකින් බුදුන්ගේ හා ධර්මයෙහි උදාරබව හේතුවෙන් ධර්මයෙහි ස්වාක්ඛාතතාව හේතුවෙන්ද උදෑසන කර්මස්ථානය

කියවාගෙන සවස අරහත් බවට පැමිණෙයි. ඒනිසා ප්‍රශංසා කරන්නේ මෙසේ කීය. යත්‍රහිනාම විස්මයාර්ථයෙහි නිපාතයි. කුච්ඡිමති පැමිණි සත්වයෝ, ස්වාමීනි යමෙක් මාගේ කුසතුළට ගියේද, මෙසේ සරණ ගන්නා ලදැයි කෙසේ වේද එය නොවේ. අචිත්තක සරණාගමනයක් නම් නැත. ආරක්ෂකයෙක් පමණක් එළඹියේ වෙයි. ඉක්බිති ඔහු යම්කලෙක මහලු කල්හි මව්පියෝ දරුව කුසටගිය පමණින් ඔබ සරණ ගැන්වූයෙමුයි සිහිකරවත්. හෙතෙමේද ඒ සලකා මම සරණ ගිය උපාසකයෙකියි සිහිය උපදවයි. එදාට සරණ ගන්නා ලද්දේනම් වෙයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

## පස්වැනි බෝධිරාජකුමාර සූත්‍රයයි.

## 2.4.6

එවමෙමසුතං යනු අංගුලිමාල සූත්‍රයයි. එහි අඞගුලිනං මාලංධාරෙති කුමක් නිසා දරයිද? ගුරුවරයාගේ වචනයනිසා, මේ එහි අනුපිළිවෙළකථාවයි. මොහුවනාහි කොසොල් රජුගේ පුරෝහිතයාගේ මන්තාණිනම් බැමිණියගේ කුසෙහි පිළිසිඳගත්තේය. බැමිණියට රාත්‍රිකාලයෙහි ප්‍රසූතිය සිදුවිය. ඔහු මව්කුසින් නික්මෙන කල්හි මුළු නුවර ආයුධ දිලිසිණ. රජුගේ මගුල් කොන්තය ද තමාළඟ තබා තිබුණු කඩු මිටද දිලිසුණේය. බමුණා නික්ම ගොස් නැකැත් බලන්නේ සොර නැකතින් උපන්නේ යයි රජුගේ සමීපයට ගොස් සැපසේ සැතපේදැයි ඇසීය. රජතෙමේ ආචාර්යය. මට සැප නින්දක් කොයින්ද, මාගේ මඟුල්කඩුව දිලිසුණේය. රාජ්‍යයට හෝ ජීවිතයට අන්තරායක් වන්නේ යැයි හැගේ. මහරජතුමනි බියනොවන්න, මාගේ ගෙයි කුමරෙක් උපන. ඔහුගේ ආනුභාවයෙන් ඔබතුමාගේ ගෙහි පමණක් නොව මුළු නුවර ආයුධ දිලිසුණේය. ආචාර්යය කුමක් වන්නේද? මහරජතුමනි සොරෙක් වන්නේය. දේවයන්වහන්ස, එක්සොරෙක්, එක් සොරෙක් පමණක්ද රාජ්‍ය දූෂකයෙක්ද වේ. මෙසේ කියාම රජුගේ සිත ගනු කැමැත්තේ මෙසේ කීය. දේවයන් වහන්ස, ඔහු ඉවත් කරනු මැනවි. එක් සොරෙක් වී කුමක් කරන්නද? කිරිය දහසක් පමණවූ කුඹුරෙහි හැල්කරලක් මෙන් වෙයි. ඔහු හදාවඩාගනු

මැනව, ඔහුට නම් තබන්නාහු ඇඳෙහි තැබූ මගුල්කඩුවෙහි මිට, පියස්සෙහි තැබූ සරාව, කපුපුළුනෙහි තැබූ තල්වැට තනන ආයුධය යන මේවා දිලිසුණත් කිසිවකුට හිංසාවක් නොවීයැයි අහිංසක යැයි නමක් තැබූහ. ඔහු ශිල්ප උගන්නා සමයෙහි තක්සලාවට පිටත් කොට හැරියාහුය. හේ ධර්මාන්තේ වාසිකයකු වී ශිල්ප ඇරඹීය. වතින් සරු. කිකරු, මනාපචාරී ප්‍රියාවාදී සිසුවෙක් විය. සෙසු අතවැසියෝ බැහැරීයෝය. ඔවුහුද අහිංසක තරුණයා පැමිණි කල් පටන් අපි කැපීනොපෙනෙමු. කෙසේ බිඳුවන්නෙමුදැයි හිඳ කුමන්ත්‍රණ කරන්නාහු සියල්ලන්ට වඩා පැණවත් හෙයින් මෝඩයෙක් යැයි කිව නොහැකිය. වතින් සරුහෙයින් නරක හැසිරීම් ඇත්තෙක්යැයි කිව නොහැකිය. ජාති සම්පන්න හෙයින් කුලහීනයෙකැයි කිව නොහැකියි. කුමක් කරන්නෙමුදැයි ඉන්පසු එක් දරුණු කුමන්ත්‍රණයක් කළහ. ගුරුපත්නිය ඈතුළත් කොට ඔහු බිඳුවන්නෙමුයි කණ්ඩායම් තුනකට බෙදී පළමුව එක්පිරිසක් ගුරුවරයා වෙත එළඹ වැඳ සිටියාහුය. ඇයි දරුවෙනි? මේ ගෙය එක් කථාවක් ඇසේ. කුමක්ද දරුවෙනි, අහිංසක මානවකයා ඔබ වහන්සේ මැරීම සඳහා (පතිනිය හා) කුමන්ත්‍රණ කරතියි සිතමු. ගුරුවරයා ඔවුන්ට තර්ජනය කොට පලයවු වසලයෙනි. මාගේ පුත්‍රයා මා අතරෙහි නොබිඳුවවුයයි එලවා දැමීය. ඉන්පසු ඉතිරි කණ්ඩායමද අනිත් කණ්ඩායමද යන තුන්කොටසම අවුත් එසේම කියා අප නො අදහන්නේනම් පරික්ෂා කොට දනුමැනැවැයි කීහ. ගුරුවරයා සෙනෙහසින් කියන්න්වුන් දැක, පතිනිය හා මිතුරුකමක් ඇතැයි සිතමියි බිඳී මෙසේ සිතීය. ඔහු මරමි. නැවත සිතීය. ඉදින් මරන්නෙම් නම් දිසාපාමොක් ඇදුරු තෙමේ තමාගේ සමීපයට ශිල්ප ඉගෙනීමට ආ මානවකයන් වරදක් උපදවා දිවි තොර කරයි. නැවත කිසිවෙක් ශිල්ප ඉගෙනීමට නොඑන්නේය. මෙසේ මාගේ ලාභය පිරිහෙන්නේය. ඉක්බිති ඔහුට ශිල්පයට අවසාන උපහාරයයැයි කියා පාදහසක් මරවයි කියමි. අවශ්‍යයෙන්ම එහිදී එකෙක් නැගී මොහු මරන්නේයයි ඔහුට කීය. එව දරුව පා දහසක් මරව. මෙසේ ඔබ ශිල්පයට උපහාර කළා වන්නේය. ගුරුතුමනි අපි අහිංසක කුලයෙහි උපන්නෝ වෙමු එය කළ නොහැකිය. දරුව උපහාර නොලබන ශිල්පය පලනොදෙයි. ඔහු පංචායුධය ගෙන ගුරුවරයා වැඳ වනයට පිවිසියේය. වනයට පිවිසෙන තැනද, වනමැදද වනයෙන් පිටවන තැනද සිට මිනිසුන් මැරුවේය. වස්ත්‍රයක්වත් හිස් වෙළුමක්වත් නොගනී. එකයි දෙකයි

යනුවෙන් ගිණුම් පමණක් කරමින් යයි. ගණනයද නුගනී. ප්‍රකෘතියෙන්ම මොහු පැණවත්ය ප්‍රාණඝාතකරන්නහුගේ සිත නොපිහිටයි. ඒනිසා පිළිවෙළින් ගණනද නොසැලකීය. එක් එක් ඇඟිල්ලකපා තබයි. තිබුතැන ඇඟිලි විනාශවෙයි. ඉන්පසු විද ඇඟිලි වලින් වැලක් කොට දැරිය. ඒනිසාම ඔහුට අංගුලි මාලයයි නමක් උපන හෙතෙමේ මුළුවනයම නොහැසිරෙන තැනක් කළේය. දර ආදිය සඳහා වනයට යාමට සමතෙක් නොවීය. රාත්‍රි කාලයෙහි ඇතුළුගමටද අවුත් පයින් පහරදී දොර ඇරගනී. ඉන්පසු නිදන්නවුන් මරා එකයි එකයි ගැණයයි. ගම අත්හැර නියම්ගමෙහි සිටියේය. නියම්ගම අත්හැර නගරයෙහි සිටියේය. මිනිස්සු තුන්යොදුනක් තැන් පටන් ගෙවල් අත්හැර අඹුදරුවන් අතින්ගෙන පැමිණ සැවැත්නුවර වටකොට කඳවුරක් බැඳ රජමිදුලෙහි රැස්ව දේවයන්වහන්ස ඔබ වහන්සේගේ විජිතයෙහි අංගුලිමාල නම් සොරෙක් සිටී යැයි කියා විලාප නගයි. පුරෝහිත තෙමේ මේ මාගේ පුත්‍රයා වියයුතුයැයි දැන බැමිණියට කීය. අංගුලිමාල නම් සොරෙක් උපන්නේය. හේ අනිකෙක් නොව තිගේ පුත්‍රයායි අහිංසක කුමාරයාය. දැන් රජතුමා ඔහු ඇල්ලීමට නික්මෙන්නේය. කුමක් කරන්නද? යන්න හිමියනි මාගේ පුත්‍රයා අල්ලාගෙන එන්න. සොඳුර මම උත්සාහ නොකරමි. ජනයන් සිව් දෙනකු කෙරෙහි විශ්වාසයක් නම් නැත. සොරා මාගේ පුරාණ මිතුරෙක්යයි විශ්වාස නොකළයුතුයි. සාධා මෙ **පුරාණ සන්ථාති** - කොල ඇතිරිය පෙර මගේ ඇතිරියයැයි විශ්වාස නොකළ යුතුය. රජු මට පුදතියි විශ්වාස කළ නොහැකිය. ස්ත්‍රීය මාගේ වසඟයට පැමිණියායැයි විශ්වාසකළ නොහැකිය. මවකගේ හදවත මෘදුය. ඒනිසා ඈ මෙසේ කීවාය. මම ගොස් මාගේ පුත්‍රයා කැඳවාගෙන එන්නෙමියි නික්ම ගියාය. එදවස භාග්‍යවතුන් වහන්සේ අළුයම් වේලෙහි ලොව බලනසේක් අඞ්ගුලිමාල දැක මා එහි ගියකල්හි ඔහුට යහපතක් වන්නේය. යානොහැකි වනයෙහි සිට සිව්පද ගාථාවක් අසා මා සමීපයෙහි පැවිදිව ෂට් අභිඥා සාක්ෂාත් කරන්නේය. ඉදින් නොයන්නෙමිනම්, මව් කෙරෙහි අපරාධයක් කොට එය නුගුළුවාලිය හැකිවන්නේය. එහුට සංග්‍රහ කරන්නෙමියි පූර්වාහ්නයෙහි හැඳපෙරව පිඩුපිණිස පිවිස කරන ලද බත් කිස ඇතිසේක් ඔහුට සංග්‍රහ කරනු කැමැත්තෙන් විහාරයෙන් නික්මුණු සේක. ඒ අර්ථය දක්වනු පිණිස අථඛො භගවා ආදිය කියන ලදී. **සංහරිත්වා සංහරිත්වා** එකට එක්ව කාණ්ඩගැසී, **හත්ථපාං ගච්ජන්ති** අතට පත්ව

විනාසයටයති. ඔවුහු භාග්‍යවතුන් වහන්සේ හැඳින මෙසේ කියත්ද? නොහැඳින කියත්ද? නොහැඳිනය, භාග්‍යවතුන් වහන්සේ වෙස් වළාගෙන තනිවම වැඩිසේක. සොරා එකල්හි දිගුකලක් අපථ්‍ය ආහාරයෙන්ද. නිදිවැරීමෙන්ද කළකිරුණේ වෙයි. මොහු විසින් කොපමණක් මිනිස්සු මරනු ලැබුවාහුද? එකකින් අඩු දහසක් හෙතෙමේ දැන් එකක් ලැබ දහස පුරවන්නේයයි හැඟීමෙන් යුතුව තමා පළමුව බලමි. එයම ගෙන ගණන පුරවා ශිල්පයට උපහාරකොට රැවුල කප්පවා නා වස්ත්‍ර පෙරළා හැඳ මව්පියන් දකිමියි වනමැදින් වනය කෙළවරට අවුත් එකත් පසෙක සිටියේ භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. මේ අර්ථය දක්වනු පිණිස අද්දසාඛො ආදිය කියන ලදී. ඉද්ධාභිසංඛාරං අභිසඞ්ඛාසි යනුවෙන්. මහපොළොව උල්පත් නංවන්නාක් මෙන් එක් රැස්ව ඇත භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට වැඩම කරයි. මැතභාගයෙහි රැලි නැගෙයි. සරකෙබ්ප මත්තං මුඤ්චිත්වා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මහත්වූ එළිමහනක් පෙන්වා තමන් වහන්සේ මැද සිටිති. සොරා අන්තයෙහි සිටී. හේ දැන් මොහු වෙත පැමිණ අල්ලා ගන්නෙමියි හැකි වැර යොදා දුවයි. භාග්‍යවතුන් වහන්සේ එළිමහනෙහි එහා කොණෙහි සිටිති. සොරා මැදසිටී. හේ මෙහි පැමිණ ගන්නෙමියි වේගයෙන් දුවයි. භාග්‍යවතුන් වහන්සේ ඔහු ඉදිරියෙහි ඇළක් හෝ ගොඩබිමක් දක්වති. මේ ක්‍රමයෙන් තුන්යොදුනක් ගියහ - සොරා ක්ලාන්ත විය. කටෙහි කෙල වැටිණ සිරුරින් දහදිය මිදිණ. ඉක්බිති ඔහුට මෙය ආශ්චර්යයකැයි සිතුණේය. මිගංමපි මුවා කුමක්නිසා අල්ලාගනීද, කුසගිනි ඇතිවූවිට ආහාර පිණිසය. හේ එක් පඳුරකට ගසා මුවන් නැගිටුවයි. ඉන්පසු සිතේ හැටියට මුවා ලුහු බඳිමින් අල්ලාගෙන පිස කයි. පුච්ඡෙය්‍යාං යම් කරුණකින් මොහු යන්නේම සිටියේද, මමද සිටියේම අටඨිත නම් වෙමි. මේ ශ්‍රමණයාගෙන් ඒ කරුණ අසන්නෙම්නම් මැනැවැයි යන අර්ථයි. නිධාය යමෙක් හිංසාකාරී මේ අදහසින් සතුන් කෙරෙහි දණ්ඩනය පැවැත්විය යුතුයැයි එය තබා ඉවත් කොට මෛත්‍රියෙන් ක්ෂාන්තියෙන් සිතා අවිහිංසා වෙන් සමගි ධර්මයන්හිම මම සිටියෙමි යන අර්ථයි. තුවමටඨිතොසි ප්‍රාණීන් කෙරෙහි අසංවේදීබැවින් මෙපමණ ප්‍රාණ දහස් ගණනක් මරන්නාවූ පුද්ගලයාට ඔබගේ මෛත්‍රිය හෝ ක්ෂාන්තියහෝ මැනවින් සිතීම හෝ සමගි දහමහෝ නැත. ඒ නිසා ඔබ අටඨිත නම් දැන් ඉරියව්වෙන් සිටියේ වුවද නිරයේ දුවන්නේය. තිරිසන් යෝනියෙහි

දුවන්නේය. ප්‍රේත ලෝකයෙහි දුවන්නේය. අසුරලෝකයෙහි දුවන්නේය යයි කියන ලද්දේ වෙයි. ඉන්පසු සොරා මේ සිංහනාදය මහත්ය. ගර්ජිතය මහත්ය. මෙය අනිකකුගේ නොවන්නේය. මහාමායාවගේ පුත්‍රයාවූ සිද්ධාර්ථශ්‍රමණ රජ්ජුරුවන්ගේ මේ ගර්ජිතයයි. තීක්ෂ්ණවූ ඇසින් බුදුරදුන් විසින් දක්නා ලද්දේයයි සිතමි. මාහට සංග්‍රහ පිණිස භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේකැයි සිතා **චිරසසං** වතමෙ ආදිය කීය. එහි මහිතො දෙවිමිනිසුන් ආදීන්විසින් සිව්පස පූජාවෙන් පූජාකරනු ලැබූ **පචවුපාදී?** බොහෝ කලකින්හමුවී. බොහෝ කල් ඇවෑමෙන් මාහට සංග්‍රහපිණිස මේ මහාවනයට පැමිණිසේක. **පහසසං පාපං** පාපය අත් හරින්නෙමි. **ඉචෙචව** මෙසේ කියාම **ආවුධං** පංචායුධය. **සොබෙහ** හාත්පසින් කැඩිගිය. **පපාතෙ** එක්පැත්තකින් කැඩුණු නරකෙ පැළුණු තැන. මෙහි මේ තුනින් අරණ්‍යයට කියන ලදී. **අනුකාරී** ඉවත දැමීය. විසිකළේය. **තමෙහි හිකඛුති තද අවොච** භාග්‍යවතුන් වහන්සේ මොහු පැවිදිකරවන සේක්. කොයින් ආයුධය ලබන්නෙමිද, කොයින් පා සිවුරු ලබන්නෙමිදැයි සෙවීමක් නැත. කර්මය පමණක් බැලූසේක. පෙර ඔහු සියලු සිල්වතුන්ට අටපිරිකර භාණ්ඩ දුන් බව දැන දකුණු අත දිගුකොට එන්න භික්ෂුව, ධර්මය ස්වාක්ඛාතය බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්න මැනවි දුක අවසන් කිරීම පිණිසැයි කීසේක. හෙතෙමේ ඒ වචන සමගම **ඍද්ධිමය** පා සිවුරු ලැබීය. එකෙණෙහිම ඔහුගේ ගිහි බව අතුරු දහන් විය. ශ්‍රමණභාවය පහළවිය.

**තිචීවරඤච පතෙනාච වාසි සූචිච බනධනං**
**පරිසසාවනෙන අටෙඨතෙ - යුතත යොගසස භිකඛුනො.**

තුන්සිවුර පාත්‍රය
කරකැත්ත ඉදිකටුව
කාබහන පෙරහන
යන අට පිරිකර -
නියම භික්ෂුවට සුදුසුය.

මෙසේ කියන ලද අට පිරිකර සිරුරෙහි බැඳීමැ උපන්නේය. **එසෙව තසස අහු භිකඛුභාවො** එහි භික්ෂුභාවය ඔහුගේ උපසම්පන්න භික්ෂුභාවයම විය. එහි භික්ෂුන්ට වෙනම උපසම්පදාවක් නම් නැත. **පබඩාසමණෙන**

භාණ්ඩගෙනයන පසුව යන ශ්‍රමණයකු ලවා තමාගේ පාසිවුරු ගෙන්වාගෙන ඔහු පසුව යන ශ්‍රමණයකු ලවා තමාගේ පාසිවුරු ගෙන්වාගෙන ඔහු පසුවයන ශ්‍රමණයා කොට ගියේය යන අර්ථයි. ඔහුගේ මව ද අටඉස්බක් පමණ තැන අන්තර්ගත වුවා දරුව අහිංසක, සිටියේ කොහිද, හුන්නේ කොහිද, ගියේ කොහිද මා සමග කථා නොකළේ ඇයි මෙසේ කියන්නී ඇවිද නොදක්නී එතැනින්ම ගියාය. පඤ්ච මතෙනහි අසස සතෙහි ඉදින් සොරාට පරාජය වන්නේනම් ලුහුබැඳ ඔහු අල්ලා ගන්නෙමි. ඉදින් මට පරාජය වන්නේ නම් වේගයෙන් පලායන්නෙමියි සැහැල්ලු බලයෙකින් නික්මුණාය. යෙන ආරාමො කුමක්නිසා අරමට ගියාද ඔහු සොරාට බියවෙයි. සිතින් යන්ට නොකැමැත්තේ නො යතියි අවමන් බියෙන් නික්මුණෝය. එයින් ඔහුට මෙසේ සිතිණ. සම්මා සම්බුදුන් වැඳ හිඳගන්නෙමි. ඔහු මෙසේ අසන්නේය :- බලය ගෙන කුමක් හෙයින් නික්ම ගියෙහිද මම මෙසේ දන්වන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ මාහට හුදෙක් සම්පරායික අර්ථයෙන් පමණක් සංග්‍රහ නොකරන සේක. දිට්ඨධම්මයෙනුත් සංග්‍රහකරන සේක. හෙතෙමේ ඉදින් මාහට ජයවන්නේනම් ඉවසන්නේය. ඉදින් පරාජය වන්නේ නම් මහරජ ඔබ එක් සොරකු අරබයා කුමක් නිසා යන්නේ දැයි කියයි. ඉන්පසු ජනයා මා මෙසේ හඳුන්වන්නේය. රජතෙමේ සොරා අල්ලන්ට නික්මෙන්නේ සම්මා සම්බුදුන් වහන්සේ විසින් මම නවත්වනු ලැබීම් මෙසේ ගර්භාවෙන් මිදීම අපේක්ෂාවෙන් ගියේය. කුතො පනසස කුමක් නිසා කීයේද? භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ උපනිශ්‍රය සම්පත් බලා ඔහු ගෙනවුත් පැවිදි කරන සේක්ද භාග්‍යවතුන් වහන්සේට අපහාස කරනු පිණිස රඤෙඤා යයි කීය. භය ඇතිවූයේ රජුට පමණක් නොවේ. අවශේෂ මහජනයාද බියටපත්වී පලිස් ආයුධ ඉවත දමා හමුවූ හමුවූ තැනම පළාගොස් නගරයට පිවිස දෙරවසා අට්ටාලයට නැග බලමින් සිටියේය. මෙසේද කීය. රජතුමා මා සමීපයට පැමිණෙතියි දැන පළමුව පැමිණ ජේතවනයෙහි හුන්නේය. රජතෙමේ ඔහු විසින් ගන්නා ලද්දේය. අපි පළාගොස් මිදුණෙමු. නත්‍ථිතෙ අතොභයං. මොහු දූන් කුරු කුහුඹියකුවත් නොමරයි. ඔබට මොහුගේ සමීපයෙන් භයක් නැත යන අර්ථයි. කථං ගොතෙතා කුමක් නිසා විමසයිද? පැවිද්දකු දරුණු කර්මයක් නිසා උපන් නම ගෙන ව්‍යවහාර කිරීම යුතුනැත. මව් පියන්ගේ ගෝත්‍ර වශයෙන් ඔහුට කථාකරන්නෙමියි සිතමින් ඇසීය. පරික්ඛාරානං

මොවුන්ගේ ප්‍රයෝජනය සඳහා මම උත්සාහ කරන්නෙමි යන අර්ථයි. කථා කරද්දීම බඩබැඳි සළුව මුද තෙරුන්ගේ පාමුල තැබීය. අරඤ්ඤකො ආදි ධුතාංග සතර පාළියෙහි ආවේය. තෙරුන් විසින් ධුතාංග දහතුනක් සමාදන් වනලදී. ඒනිසා අලං යයි කීය. **යමහි මයං භනෙත** කුමක් සඳහා කියයිද? දුවන අශ්වයා වුවත් ඒ අනුව දුවගොස් ගනිමියි පැමිණි විට රජුවිසින් යවන ලදී. ඔහු ඇත්ආදින්ම අල්ලා ගන්නේය. රජතෙමේ ඇතුන්ගෙන්ම වට කොට ගනිවු. අශ්වයන්ගෙන්, රියවලින් වටකොට ගනිවූ යයි නොයෙක්වර බොහෝ ඇත් ආදීන් යැවීය. මොවුන් එසේ ගියකල්හි. බොලව් මම අංගුලිමාලයයි එහි නැගිට හඬ නගද්දී එකෙක් වත් ආයුධයක් ලෙලවන්ට නොහැකිවිය. සියලු දෙනම කොටා මැරීය. ඇත්තු වල් ඇත්තු වෙති. අශ්වයෝ වල් අශ්වයෝය. රිය ද එතැනදීම බිඳේයයි මේ සඳහා රජතෙමේ මෙසේ කියයි. **පිණ්ඩාය පාවිසි** පළමුව පිවිසියේ නැත. ස්ත්‍රිය දකින දිනය සඳහා මෙය කියන ලදී. දිනපතාම පිවිසෙයි. මිනිස්සු ඔහු දැක බියවෙති. පළායති දෙරවසති. සමහරු අංගුලිමාලයැයි ඇසූපමණින් පළාගොස් වනයට හෝ පිවිසෙති ගෙට වැදී දොරවසති. පළායාමට නොහැකිව පිටිපසහරවා සිටිති. තෙරුන් වහන්සේ කැඳ අලුවක්වත් බත්හැන්දක් වත් නොලබති. ආහාරයෙන් ක්ලාන්ත වෙති. පිටතින් නොලබන්නාහු නගරය සර්ව සාධාරණයැයි නගරයට පිවිසෙත්. යම් දෙරකින් පිවිසෙත්ද එතැන අංගුලිමාල පැමිණියේයයි ගල්කුළු දහසක් බිඳින තරම් කරුණක් වෙයි. **මතදහොසි** කාරුණ්‍යයට පැමිණීම සඳහාය. එකක් අඩු මිනිසුන් දහසක් මරන්නහුට එක් දවසක්වත් කරුණාවක් නොවීය. විලිරුදවෙන් මුසපත්වූ ස්ත්‍රියක දුටුපමණින් කථාව හට ගැනිණි. **පබ්බජ්ජා** බලෙන මේනම් පැවිද්දෙහි බලයයි. **තෙනහි** යම්හෙයකින් ඔහුට කරුණාවක් ඉපදුණේද ඒනිසා යන අර්ථයි. **අරියාය ජාතියා** අංගුලිමාල මෙය ඔබ නොගන්න. මේ ඔබගේ ජාතිය නොවේ. මෙය ගිහිකලයි. ගිහියෝ නම් පණද නසති. නොදුන් දෙය ගනිති. දැන් ඔබගේ ආර්ය ජාතියයි. ඒනිසා ඔබ **යතො අහංභගිනි ජාතො** යැයි මෙසේ කියන්ට කුකුස් ඇත්තෙහි. එසේ නම් අරියා ජාතියා යැයි මෙසේ විශේෂකොට කියහිය පිටත්කර හැරියේය. **තං ඉත්‍ථිං එවං** අවව ස්ත්‍රීන්ගේ දරු ප්‍රසූතියට පුරුෂයකුට එළඹිය නොහැකිය. තෙරුන් වහන්සේ කුමක් කරන්නද? අංගුලිමාල තෙරුන් වහන්සේ සත්‍යක්‍රියා කොට යහපතක් කිරීම පිණිස පැමිණියහයි දැන්වීය. ඉන්පසු ඔවුහු තිරයකින් වටකොට

තෙරුන් වහන්සේ එහි හිඳ සොහොයුරිය මම සර්වඥවූ බුදුන් වහන්සේගේ ආර්ය ජාතියෙහි උපන්නෙමියි සත්‍ය ක්‍රියා කළහ. සත්‍යක්‍රියාව සමගම කෙණ්ඩිය කින් වැහෙන ජලය මෙන් දරුවා නික්මුණේය. මවටත් දරුවාටත් යහපතක්ම විය. මේ පිරිත කිසිදු අනතුරක් නොමඩින්නේනොවේ. මෙය මහාපරිතත නම්වේයයි කියන ලදී. තෙරුන් හිඳ සත්‍යක්‍රියා කළ ස්ථානයෙහි පීඨිකාවක් තැනූහ. විලිරුදවෙන් මුසපත්වූ තිරිසන් ගත ස්ත්‍රීන්ද මෙහි ගෙනවුත් එහි වැදහොවති. එකෙණෙහිම සැපසේ ප්‍රසුතිය සිදුවේ. යම් ස්ත්‍රියක් දූර්වලනම් මෙහි ගෙන ඒමට නොහැකිනම් පිඨිකාව සේදූ ජලය ගෙනගොස් හිසපිට වත්කරති. එකෙණෙහිම ප්‍රසුතිය සිදුවෙයි. වෙනත් රෝගද සන්සිඳේ. මෙය කල්පය පවත්නාතෙක් තිබෙන ප්‍රාතිහාර්යයකි. භාග්‍යවතුන් වහන්සේ තෙරුන් ලවා වෙදකම් කරවන සේක්ද? නොකරවූසේක. තෙරුන් දුක මිනිස්සු බිය වී පැනයති. තෙරුන් වහන්සේ ආහාර නැතිව ක්ලාන්ත වෙති. මහණදම් පිරීමට නොහැකිය. ඔහුට අනුග්‍රහ කොට සත්‍යක්‍රියා කරවූසේක. උන්වහන්සේට මෙබඳු සිතක් පහළ විය. දැන් අංගුලිමාල තෙරුන් වහන්සේ මෛත්‍රී චිත්තය ලැබ සත්‍යක්‍රියා කිරීමෙන් මිනිසුන්ට යහපතක් කරතියි මිනිස්සු තෙරුන් කරා එළඹිය යුතුයයි සිතන්නෝය. එයින් ආහාරයෙන් ක්ලාන්ත නොවී මහණදම් පිරීමට හැකි වන්නේයයි සත්‍යක්‍රියා කරවූ සේක. සත්‍යක්‍රියාව වෙදකමක් නොවේ. තෙරුන්ගේද මහණ දම් පුරන්නෙමියි මුල කර්මස්ථානය ගෙන රාත්‍රිස්ථාන දිවාස්ථාන යන්හි හිඳ සිත කර්මස්ථානාභිමුඛ නොවේ. වනයෙහි සිට මිනිසුන් මැරූ තැනම සිතට ප්‍රකට වෙයි. දුගියෙක්මි. කුඩා දරුවන් ඇත්තෙක්මි. මට ජීවිත දානය දෙනුමැනවි. හිමියනියි මරණබියෙන් බියපත් වූවන් කියන ආකාරයද. අත්පා විකාරද සිතෙහි පහළවෙයි. හේ විළිපිසරව එයින් නැගිට යයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට ඒ ජාතිය අධ්‍යාහාර කොට විදර්ශනාවඩා හේ රහත්බව ළංකර ගත්තේයයි ආර්ය ජාතියේ සත්‍යක්‍රියා කරවූ සේක. **එකොවූපකටෙ‍ය්‍යා** ආදි වත්‍ථ සූත්‍රයෙහි විස්තර කරන ලදී. **අඤ්ඤෙනපි ලෙඩ්ඩු බිතෙනා** කපුටන් බල්ලන් ඌරන් ආදීන් හරවා යැවීම පිණිස හාත්පස කටහඩ ඇසෙන මානයෙහි තැන කිසියම් දිශාවකින් විස්කරන ලද ගලක් අවුත් තෙරුන්ගේ සිරුරෙහි වැටේද, කොපමණක් තැන මෙසේ වේද ඊතලයක් ගිලිහී, ගිය තැනට පැමිණේද එතාක් වෙයි. **භිනෙනන සීසෙන** මහා චර්මය සිදුරුවී අස්ථිකෙළවර තෙක් සිදුරුවුණු,

බ්‍රාහමණො රහත්බව සඳහා කියූසේක. යසසබො ත්වං බ්‍රාහ්මණ කමමසස විපාකෙන භාග්‍යවතුන් වහන්සේ විසින් ඔහුට දිට්ඨධම්ම වෙදනිය කර්මය සඳහා කියන ලදී. කර්මයක් කරද්දීම කොටස් තුනක් පිරෙයි. සිත් සතෙහි කුසල් හෝ අකුසල් හෝ ප්‍රථම ජවන චේතනාව දිට්ඨධම්ම වෙදනීය කර්මය නම්. එය මේ ආත්ම භාවයෙහිම විපාකදෙයි. එසේ නොහැකි වුවිට එය අහොසි කර්ම නොවිය. කර්ම විපාකයක් නැත. කර්මවිපාකය, තත්‍රිකමම විපාකයැයි මෙය තිකවශයෙන් අහොසි කමම නම්වේ. අර්ථ සාධක සත්වැනි ජවන චේතනාව උපපජ්ජ වේදනීය කර්ම නම් වේ. එය අනතුරු ආත්ම භාවයෙහි විපාක දෙයි. එසේ නොහැකිවුවිට කියූ ක්‍රමයෙන්ම අහොසි කම්ම නම්වේ. දෙක අතර ජවන චේතනා පහක් අපරාපරිය වේදනීය කම්ම නම්වේ. එය අනාගතයෙහි අවකාශයක් ලද විට එකල විපාක දෙයි. සසර පැවැත්ම ඇති විට අහෝසි කම්ම නොවේ. තෙරුන් වහන්සේට උපපජ්ජවේදනීය ද අපරාපරිය වේදනීයද යන මේ කර්ම දෙක කම්මක්ඛය කර්මයෙන් අර්හත් මාර්ගයෙන් ඝාත නය කරන ලදී. දිට්ඨධම්ම වේදනීය තිබේ. එය රහත්බවට පත්වුවහුටද විපාක දෙන්නේමය. ඒ සඳහා භාග්‍යවතුන් වහන්සේ යසස බොත්වං ආදිය කීසේක. ඒනිසා යසසබොත්වං බමුණ එබඳු විපාකයෙන් යයි මේ අර්ථය දතයුතුය. අබ්භාමුත්තොා මෙය දේශනා ශීර්ෂ මාත්‍රයකි. අබ්භ, මහිකා, ධූම රජො රාහු යන මේ උපක්ලේශයන් ගෙන් මිදුණු සඳ මෙහි අදහස් කෙරිණ. යම්සේ මෙසේ උපක්ලේශ යන්ගෙන් මිදුණු චන්ද්‍රයා ලෝකය බබලවයි. පහවූ කෙළෙස් අඳුර ඇත්තක් කරයි. කුසලෙන පිථියති මාර්ග කුසලයෙන් ප්‍රතිසන්ධි නැත්තක් කෙරේ. යුඤ්ජති බුද්ධසාසනෙ බුද්ධශාසන යෙහි කයින් වචනයෙන් මනසින් යුතුව වාසයකරයි. මේ තෙරුන්ගේ උදන වාක්‍ය තුන නම් දිසාහි මෙ මෙය තෙරුන් වහන්සේ තමාගේ ආරක්ෂා ආකාරයක් කරන්නාහු මෙසේ කීහ. එහි දිසාහිමෙ මාගේ සතුරෝ මට මෙසේ චෝදනා කරති. අංගුලිමාල වූ මා විසින් මරන ලද ඥාතීන්ගේ වශයෙන් දුකක් විඳිමි. මෙසේ අංගුලිමාලද දුනගනීවායි මාගේ දිසා චතුසසත්‍ය ධර්ම කථාව අසත්වා යන අර්ථයි. යුඤ්ජනතු යමෙක් ධර්මයම පිළිගනිත්ද ඔවුහුකයින් වචනයෙන් මනසින් සෑදීපැහැදී වෙසෙත්වා සනෙතා යම්ශාන්ත වූ සත්පුරුෂයෝ ධර්මයම පිළිගනිත්ද, සමාදන් වෙත්ද ගන්වත්ද ඔවුන් මිනිසුන් අතර මාගේ සතුරෝ ආශ්‍රයකෙරෙත්වා සේවනය කෙරෙත්වා.

පයිරුපාසනය කෙරෙත්වා යන අර්ථයි. **අවිරොධපසංසිනං** අවිරෝධ යනු මෛත්‍රියයි. මෛත්‍රිය ප්‍රශංසා කරන්නවුන්ට යන අර්ථයි. **සුණන්තු ධම්මං කාලෙන** ක්ෂණයෙහි ක්ෂණයෙහි ක්ෂාන්ති මෛත්‍රී නුවණින් සලකා කෙරෙන සාරාණීය ධර්මය අසත්වා. එය ද අනුව කටයුතු කෙරෙත්වා ඒ ධර්මය අනුකරණය කරත්වා පුරත්වා. **නහිජාතු සො මමං හිංසෙ** හෙතෙමේ මා හා සමානය. හේ ඒකාන්තයෙන් මට හිංසා නොකරන්නේය. **අඤ්ඤංවාපන කඤ්චිනං** මට පමණක් නොව අන් කිසිදු පුද්ගලයකුට හිංසා නොකරාවා. වෙහෙස නොකරවා **පරමං සන්තිං** පරම ශාන්තිය වූ නිර්වාණයට පැමිණ **රක්ඛෙය්‍ය තසථාවරෙ** තසා යනු තෘෂ්ණා සහිත. ථාවරා තෘෂ්ණාව නැති මෙසේ කියන ලදී, යමෙක් නිර්වාණයට පැමිණේද, හෙතෙමේ සියලු තෘෂ්ණා සහිත දේත් රහිත දේත් රකින්ට සමත්වේ. ඒනිසා මා සමාන වූවෝද නිර්වාණයට පැමිණෙත්වා. මෙසේ මාහට ඒකාන්තයෙන් හිංසා නොකරති. මේ ගාථාතුන තමාට ආරක්ෂාව සලසාගන්ට කීය. දූත් තමාගේම සම්පත්තිය දක්වන්නේ **උදකංහි නයන්ති නෙත්තිකා** ආදිය කීය. එහි **නෙත්තිකා** යනු යමෙක් ඇළ සුද්ධකර බැඳියයුතු තැන් බැඳ ජලය ගෙනයත්ද ඔවුහු **උසුකාරා** ඊවඩුවෝ **නමයන්ති** තෙල් කැඳ ආදිය තවරා උණු අළුයෙහි තව තවා නැමුණු නැමුණු තැන් නමමින් කෙළින් කරත්. **තෙජනං** ඊමුව එය ඊයෙහි තියුණුබව කරයි. අනුන්ට තර්ජනද කරයි. ඒනිසා තේජනයයි කියනු ලැබේ. **අත්තානං දමයන්ති** යම්සේ දියාලුළුවෝ ඍජුමාර්ගයෙන් ජලය ගෙන යත්ද ඊවඩුවෝ ඊතලයද වඩුවෝ ලීද කෙළින් කරත්ද එසේම පණ්ඩිතයෝ තමා දමනයවෙත්. ඍජු කරත්. වෙනස නැතිකරත්. **තාදිනා** ඉෂ්ට අනිෂ්ට ආදියෙහිදී වෙනසක් නැති. භාග්‍යවතුන් වහන්සේ විසින් පස් ආකාරයකින් තාදි ඉෂ්ටානිෂ්ට දෙයෙහිතාදි ඇත්තේනුයි තාදීයයද තාදි ඇත්තේනුයි තාදියැයිද එතෙරවූයේනුයි තාදි තාදිභාවය නිර්දේශ කරන ලදී. තාදී යනු මෙසේ තාදි ලක්ෂණයන්ට පත් ශාස්තෲන් වහන්සේ විසින් **භවනෙත්ති** භවරජ්ජුවයි. තෘෂ්ණාවට නමකි. යන්ත්‍රයෙහි ගොනුන් මෙන් සත්වයෝ ගෙලෙත්ද හෘදයෙහි රැහැනින් බැඳුණාහු ඒ ඒ භාවයට ගෙනයනු ලබත්ද, ඒනිසා භවනෙත්ති යයි කියනු ලැබේ. **ඵුට්ඨො කම්මවිපාකෙන** මාර්ග චේතනාවෙන් ස්පර්ශ කරන ලද්දේ යම්හෙයකින් මාර්ග චේතනාවෙන් කර්මය පැසවයිද, විශේෂයෙන් පැසවයිද දැවේද ක්ෂයවේද ඒනිසා එය කර්ම විපාකයැයි කියනු ලැබේ.

එයින් ස්පර්ශ කරන ලද හෙයින් එය අණණ නික්කිලෙස විය. දුක්ඛ වේදනාවෙන් අණණ නොවේ. භුඤ්ජාමි මෙහි ථෙය්‍ය පරිභෝග. ඉණ පරිභෝග, දයජ්ජ පරිභෝග සාමි පරිභෝග පරිභෝග සතරක් දතයුතුයි. හි දුශ්ශීලයාගේ පරිභෝගය ථෙය්‍ය පරිභෝග නම් හේ සිව්පසය සොරාගෙන වළදයි. මෙසේද කියන ලදී. මහණෙනි තෙපි සොරෙන් රට්වුන්දෙන පිඬු වැළඳුවෝයැයි සීලවන්තයා ප්‍රත්‍යවේක්ෂානොකොට කරන පරිභෝගය ඉණපරිභෝග නම් රහත්හුගේ පරිභෝගය සාමිපරිභෝග නම් මෙහි කෙලෙස්ණය නැතිබව සඳහා අණණයැයි කියන ලදී. අණිණෙ යනුවෙන්ද පාඨයක් වෙයි සාමිපරිභෝගය සඳහා බොජුන් බුදිමියි කියන ලදී. **කාමරතිසන්ථවං** ද්විවිධාකාර කාමයන්හි තෘෂ්ණාරති සන්ථවය (නොයොදන්න, නොකරන්න) **නයිදං දුමමන්තිතං** මම මා විසින් සම්බුදුන් දක පැවිදිවන්නෙමියි මන්ත්‍රණය කරන ලද්දේද ඒ මාගේ මන්ත්‍රණය කුමන්ත්‍රණයක් නොවේ. **සවිභත්තෙසු ධම්මෙසු** මම ශාස්තෘවෙමියි මෙසේ ලෝකයෙහි උපන්නවුන් විසින් යම් ධර්ම කෙනෙක් මනාසේ බෙදන ලද්දේද ඒ ධර්මයන් අතර යමක් ශ්‍රේෂ්ඨද ඒ නිර්වාණයට මම එළඹියෙමි එයට එළඹියේ වෙමි. එයින් යුක්තවෙමි ඒනිසා මාගේ මේ ආගමනය ස්වාගමනයකි. අපගමනයක් නොවේ. **තිස්සො විජ්ජා,** ප්‍රබ්බ නිවාස දිබ්බචක්ඛු ආසවක්ඛය ප්‍රඥ **කතං බුද්ධස්සසාසනං** බුද්ධ ශාසනයෙහි කළයුතු යම් කාර්යයක් ඇත්ද, මා විසින් එය කරන ලදී. ත්‍රිවිද්‍යාවෙන් නව ලෝකෝත්තර ධර්මයන් ගෙන් දේශනාව මුදුන් පත් කළසේක.

**සවැනි අංගුලිමාල සූත්‍රයයි.**

## 2.4.7

**එවමෙමසුතං** යනු පියජාතික සූත්‍රයයි. එහි **නෙව කම්මන්තා පටිභන්ති** සියලු ආකාරයෙන් සියල්ල අවබෝධ නොකෙරෙත් ප්‍රකෘති නියාමයෙන් අවබෝධ නොවෙත් නො එළඹෙත්. දෙවැනි පදයෙහිද මේ ක්‍රමය මැයි මෙහි **නපටිභාති** යනු රුචිනොවේ **ආලාහනං** සුසානය **අඤ්ඤථත්තං** විවර්ණ හෙයින් වෙනස්බව. **ඉන්ද්‍රියයෝ** නම් මනෝ විඤ්ඤෙය්‍ය ධර්මයෝය. එහි පිහිටියවුන් සඳහා මෙය කියන ලදී. **පිය ජාතිකා** ප්‍රියභාවයෙන් හටගනිත්.

**පියප්පභවිකෙ** ප්‍රියභාවයෙන් සම්භවය ලබත්. ඉදින් මහරජයැයි එහි අර්ථය නොසලකන්නෝද වුවද ශාස්තෲන් වහන්සේ සඳහා කියයි. **චරපිරෙ** ඉවත්වව අප අනුන් ආභ්‍යන්තරික නොවූ කල්හි යන අර්ථයි. නැතහොත් චරපිරේ යනු ඉවතට යව. මෙහි නොසිටුව යන අර්ථයද වෙයි. **ද්විධා ඡෙත්වා** අසිපතින් දෙකොටසක් කරමින් සිඳ. **අත්තානං ඔපාදෙසි** ඒ අසිපතින්ම තමාගේ උදරය පැළීය. ඉදින් ඔහුට එය අප්‍රිය වේනම් දූන් වෙනත් ගැහැණියක ගන්නෙමියි තමා මරා නොගන්නේය. යම්හෙයකින් ඔහුට ඇය ප්‍රියවුවාද ඒනිසා පරලොවද ඇය සමගින් එක්වන බව පතමින් මෙසේ කළේය. **පිසා තෙ වජිරී** (වජිරිනම් රජුගේ එක් දූවක සඳහා කීය) ඇයට මෙසේ සිතිණ. මහරජතුමනි ඉදින් මම මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියක් වීනම් ආදි කථාවක් කියන්නිය. ඔබට මේ ඉවත්වෙව යන කථාව කීයේ කවරෙක්ද එසේ නොවේයයි ප්‍රතිෂේධනය කරන්නෙමි. වර්තමානයෙන්ම දන්වන්නෙමියි සිතා මෙසේ කීය. **විපරිණාමඤ්ඤථාභාවා** එහි මරණ වශයෙන් විපරිණාමයයි. කිසිවකු සමග පළාගොස් ගමන වශයෙන් වෙනස් බව දතයුතුය. **වාසභාය** වාසභා යනු රජුගේ එක් බිසවකි. ඇය සඳහා කීය. **පියාතෙ අහංයැයි** කුමක්නිසා සියල්ලට පසුව කීවාද ඇයට මෙසේ සිතිණ. මේ රජ මට කිපුණේය. ඉදින් මම සියල්ලට පළමුව මම ඔබට ප්‍රිය දූයි අසම්නම් මට තී ප්‍රිය නොවේ ඉවත්වෙවයි කියන්නේය. එසේ ඇතිකල්හි කථාවට ප්‍රතිෂ්ඨාවක් නොලබන්නේය. කථාව පිහිටුවීම සඳහා සියල්ලට පසුව ඇසුවාය. කාසි කෝසල ජනපදයන් අත්හරින ලද බැවින් විපරිණාමයයි. විරුද්ධ රජුන්ගේ අතට යාම් වශයෙන් වෙනස්බව දතයුතුය. **ආචාමෙහි** සෝදන ජලය දෙව. **සෝද** අත්පා දෙවා මුව සෝදා ශාස්තෲන් වහන්සේ වඳිනු කැමැත්තේ මෙසේ කීය. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

**සත්වැනි පියජාතික සූත්‍රයයි.**

2.4.8

**එවමෙමසුතං** යනු බාහිතිය සූත්‍රයයි එහි **එකපුණ්ඩරීකනාගං** යනු එනම් ඇති හස්තියා. උගේ ඉලඇට මත තල්ගෙඩියක් තරම්වූ සුදු තැනක්

ඇත. ඒනිසා උෟට එකපුණ්ඩරීකයැයි නමක් කළහ. **සිරිවඩ්ඪං මහාමත්තං** තනි ඇතකු පිට නැගී. කීමෙ පහසුව පිණිස සමග යන්නාවූ මේ නම ඇති මහාමාත්‍රයා. **ආයසමානො** මෙහි නො යනු ප්‍රශ්න කිරීම සඳහා වූ නිපාතයකි. මහා මාත්‍රයා තෙරුන්ගේ දෙපට සිවුර හා පාත්‍රය දරන ආකාරය සලකා එසේය. මහරජයි කීය. **ඔපාරමෙහා** දෝෂාරෝපණය දොස් පැවරීමට සුදුසු **කිං පුච්ජාමි** රජ අසයි සුන්දරී වස්තුවෙහි උපන් මෙම සූත්‍රය ඔහු විමසමියි අසයි. **යංහි මයං භනෙත** ස්වාමීනි අපි. **විඤ්ඤූහි** මේපදය ගෙන ප්‍රශ්නයෙන් පුරවන්ට නොහැකිවීමු ඒ කරුණ මෙසේ කියන ආයුෂ්මතුන් විසින් පුරවන ලදී. **අකුසලො** අදක්ෂතා වෙන් හටගත්, **සාවජ්ජො** දෙස් සහිත **සව්‍යාපජ්ඣො** දුක්සහිත. **දුක්ඛවිපාකො** මෙහි කර්ම විපාකය කියන ලදී. **තසස** ආත්ම ව්‍යාධි ආදීන් පිණිස පැවති කාය සමාචාරයාගේ, මහරජ සියලු අකුසල්දම් ප්‍රහීණ කළ තථාගතයන් වහන්සේ කුසල ධර්මයන්ගෙන් යුක්තය. මෙහි **සබ්බසරඤ්ඤුච අකුසලානං ධම්මානං පහානං වණ්ණෙති** එසේය වර්ණනා කරතියි කීකල්හි විමයීම යම්සේද අර්ථයද එසේයයි කීවා වන්නේය. මෙසේ ප්‍රකාශ කිරීම බැරැරුම්නැත. අල්පහීන අකුසල ඇත්තාද ප්‍රහාණය වර්ණනා කරන්නේය. භාග්‍යවතුන් වහන්සේ ප්‍රහීණ අකුශල ඇතිබැවින් යථාවාදී තථාකාරීයැයි දක්වන්ට මෙසේ ප්‍රකාශ කළේය. ශුක්ල පක්ෂයෙහිද මේ ක්‍රමයයි. බාහිතියා බාහිත රටෙහි විසූ වස්ත්‍රයව මේ නමයි. **සොලසමා ආයාමෙන** දිගින් සමසොළොස් රියන්ය. **අට්ඨසමා විත්ථාරෙන** පුළුලින් සම අටරියන්ය. **භගවතො පාදසි** භාග්‍යවතුන් වහන්සේට පැවරීය. දී ගඳකිලියෙහි වියනක් කොට බැන්දේය. එතැන්පටන් ගඳකිළිය බොහෝ සෙයින් සෝභමානවිය. සෙස්ස සියලු තැන නොගැඹුරුමය. නෙය්‍ය පුද්ගල වශයෙන් මේ දේශනාව නිමවිය.

අටවැනි බාහිතිය සූත්‍රයයි.

## 2.4.9

**එවමෙමසුතං** යනු ධම්මචෙතිය සූත්‍රයයි. එහි **මෙදතළුම්පං** මේ නම ඒ නියම්ගම මේද වර්ණ පාෂාණ බෙහෙවින් තිබුණේය. ඒනිසා මෙදතළුම්පයයි ප්‍රසිද්ධියට ගියේය. මෙහි සේනාසනය තාවකාලිකය ඒනිසා නොකියන ලදී.

නගරකං මෙනම් ඇති ශාක්‍යයන්ගේ නියම්ගම කෙනචිදෙව කරණීයෙන අත්කරුණක් සඳහා නොවේ. හෙතෙමේ බන්ධුල සේනාපතියා පුතුන් තිස් දෙදෙන සමග එක්දවසකින්ම අල්ලාගනිවූයයි අණකළේය. එදවසම ඔහුගේ භාර්යාව වූ මල්ලිකා විසින් පන්සියයක් භික්ෂූන් සමඟ භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කරන ලදී. බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා ගෙට පැමිණ වැඩහුන් කෙණෙහිම සේනාපතියා කලුරිය කළේයයි හසුනක් ගෙනවුත් මල්ලිකාට දුන්හ. ඈ හසුන ගෙන පණිවිඩය ඇසුවාය. ආර්යාවනි, රජුවිසින් සේනාපති තුමා පුතුන් තිස් දෙදෙන සමග එක පහරින්ම අල්ලාගනු ලැබීයයි දැන්වූහ. මෙය මහජනයා අතරට නොයවන්න. හසුන ඉනෙහි ගසාගෙන භික්ෂුසංඝයා වැළඳවූවාය. ඒ වේලාවෙහි එක් ගිතෙල් සැළියක් පිටතට ගෙන ගියහ. එය එළිපත්තෙහි ගැටී බිඳිණ. එය ඉවත් කොට අනිකක් ගෙන්වාගෙන භික්ෂු සංඝයා වැළඳවූවාය. ශාස්තෘන් වහන්සේ බත්කිස නිමවා කතාවක් පටන්ගැනීම පිණිස ගිතෙල් සැළිය බිඳුණු හේතු නොසිතිය යුතුයැයි කීසේක. ඒවේලෙහි මල්ලිකා හසුන ඉවතට ගෙන භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි තබා භාග්‍යවතුන් වහන්ස, මේහසුන පුතුන් තිස් දෙදෙනා සමග සේනාපතිතුමා මළ හසුනයි. මම එය නොසිතමි. ගිතෙල් සැළිය හේතුවෙන් කුමක් සිතන්නෙම් දැයි ඇසුවාය. භාග්‍යවතුන් වහන්සේ මල්ලිකාවනි, ඒ ගැන නොසිතන්න. අනවරාග්‍ර සංසාරයෙහි පවතින්නවුන්ට මෙය වෙයි යැයි අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්මකථාවක් කොට වැඩිසේක. මල්ලිකා ලේලියන් තිස් දෙදෙන කැඳවා අවවාද දුන්නාය. රජතෙමේ මල්ලිකාව කැඳවා සේනාපතිතුමා සහ අප අතර සිත් දූෂ්‍ය වීමක් ඇත්ද නැද්දැයි විමසීය. නැත ස්වාමීනි රජතෙමේ ඇයගේ වචනයෙන් ඔහුගේ නිර්දෝෂී බව දැන විපිළිසරව බලවත් දොම්නසක් උපදවාගත්තේය. හෙතෙමේ මෙබඳු දෝෂයක් නැති මට සම්භවනා කොට පැමිණි සහායකයකු විනාශ කෙළෙමියි එතැන් පටන් ප්‍රසාදයෙහි හෝ නාටිකාවන් අතර හෝ රාජ්‍ය සුඛයෙහි හෝ චිත්තාස්වාදයක් නොලබමින් ඒ ඒ තැන හැසිරෙන්ට පටන් ගත්තේය. ඔහුගේ කාර්යය එයම විය. මේ සඳහා කියන ලදී. **කෙනචිදෙවකරණීයෙනා දීඝංකාරායනං දීඝකාරායන** නම් බන්ධුලමල්ල සේනාපතිගේ බෑණාය. එබඳුවූ මාගේ නරකක් නොකරන මාගේ මාමා නිකරුණේ ඝාතනය කරන ලද්දේයයි රජු විසින් සේනාපති ස්ථානයෙහි තබන ලද්දේය. ඒ සඳහා මෙය කියන ලදී. **මහච්ච රාජානුභාවෙන** මහත්වූ

රාජානුභාවයෙන් ධරණිතලය බිඳින්නාක් මෙන්ද සාගරය පෙරළෙන්නාක් මෙන්ද විචිත්‍රවේශ ශෝභාවෙන් මහත් බලකායෙන් යන අර්ථයි. පාසදිකානි දර්ශනයෙන්ම ප්‍රාසාදජනක පසාදනීයානි එයටම වෙනත් වචනයකි. නැතහොත් පාසාදිකානි දර්ශනීය පාසාදනීයානි ප්‍රසාදජනක අප්පසද්දානි නිශ්ශබ්ද අප්පනිග්ඝොසානි භාවිත නොකරන ලද අර්ථයෙන් ඝෝෂා රහිත. විජනවාතානි පහවගිය ජනයා ඇඟවැදී එන සුළං නැති. මනුස්ස රාහසෙය්‍යකානි මිනිසුන් ගේ රහසිගත කටයුතු වලට යෝග්‍ය රහස් මන්ත්‍රණ කරන්නවුන්ට සුදුසු යන අර්ථයි. පටි සල්ලාණ සාරුප්පානි සැඟැවී සිටීමට හුදෙකලාව සිටීමට සුදුසු යත්ථසුදංමයං ඔහුවිසින් එහිදී භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රය නොකරන ලද විරුය. එබන්දවුන් අතර ආශ්‍රයකරන ලද විරූය..ඒනිසා යම්බදුවුවන් අතර අපි වීමු යනු මෙහි අර්ථයි. අත්ථිමහාරාජ නුවණැති සෙන්පතියා රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට ළෙන්ගතුයයි දනී. ඉදින් ඒ රජතෙමේ භාග්‍යවතුන් වහන්සේ කොහිදැයි කියන්නේ නම් නොපමාව අසන්ට යුතුයයි චරපුරුෂයන් යොදවා භාග්‍යවතුන් වහන්සේ වසන තැන දැනගෙනම වාසයකරති. ඒනිසා මෙසේ කීය. ආරාමං පාවිසි නියම් ගමින් පිට කඳවුරු බැඳ කාරායන සමග පිවිසියේය. විහාරො ගඳකිළිය සඳහා කීහ. ආළින්දං ඉදිරිපස උක්කාසිත්වා කාරන හඬක් කොට අග්ගළං කවුළුව ආකොටෙති නිය අගින් දෙරකඳ යතුරුසිදුර ළඟට කොටවයි කියන ලද්දේවෙයි. දොර ඉතා ඉහළින් තිබේ. අමනුෂ්‍යයෝ අතිශයින් පහළය, උසමිනිසුන් කොටන්නාක් මෙන් නොකොටා මැද සිදුර ළඟ කෙටිය යුතුය. මෙය දෙර කොටු වතයයි දක්වා කියත්. තත්ථෙව භික්ෂූන් විසින් කියන ලද තන්හිම අසිපතද නළල්පටදැයි මෙය දේශනා මාත්‍රයකි.

වාලවීජනී මුණ්හීසං - ඛග්ගං ඡත්තඤ්චුපාහනං
ඔරුය්හ රාජා යානම්හා ඨපයිත්වා පටිච්ඡදං

වල්විදුනාව නළල්පට
අසිපතද සේසතද
මිරිවැඩි සඟලද ඇතිව -
රජයානයෙන් බැස
ආරක්සාව පිණිස තබා

පැමිණි පංචරාජ කකුධභාණ්ඩ දුන්නේය. කුමක්නිසා දුන්නේද? අතිගෞරවනීය සම්මාසම්බුදුන් සමීපයට උඩඟුවෙසින් යාම යුතු නැතැයි තනිවම එළඹ තමාගේ කැමැත්ත වශයෙන් සතුටුවන්නෙමි. පංච කකුධභාණ්ඩ නැවැත්වූ කල්හි ඔබත් නවතුවයි කිවයුතු නොවේ. සියල්ලෝ ඉබේම නවතිති. මෙසේ මේ කරුණු දෙකින් දුන්නේය. රහායති රහස්‍ය කරයි. සඟවයි. මේ ඔහුගේ අදහසයි. පෙරද මේ රජ ශ්‍රමණ ගෞතමයන් සමග පුතුන් තිස් දෙදෙන අල්ලාගත්තේය. දැනුත් සිව්කන් මන්ත්‍රණයක් කරන්ට කැමැත්තේය. මා අල්ලාගන්ටදැයි මෙසේ කෝපවශයෙන් ඔහුට මෙසේ සිතිණ. විවරිභගවා ද්වාරං භාග්‍යවතුන් වහන්සේ නැගිට දොර ඇරියා නොවේ. විවෘතවන්නැයි අත දිගුකළ සේක ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ තොපවිසින් නොයෙක් කල්ප කෙළගණන් දන් දෙන කල්හිත් තම අතින් දොර ඇරීම් කාර්යයක් නොකරන ලද්දේයැයි ඉබේම දොර විවරවිය. භාග්‍යවතුන් වහන්සේගේ සිතින් විවරවූ බැවින් විවරිභගවා ද්වාරං යැයි කීම වටී. විහාරං පවිසිත්වා ගඳකිළියට පිවිස, ඔහු පිවිසි කෙණෙහිම කාරායන පංච රාජකකුධභාණ්ඩ ගෙන කඳවුරට ගොස් විඩූඩභ ඇමතීය. යහළුව සේසත ඔසවන්න. මගේ පියා කුමක් කරයිද? පියාගැන නොඅසන්න. ඉදින් ඔබ ඔසවන්නේ නැතිනම් එය ගෙන මම ඔසවන්නෙමි. ඔසවමි යහළුවැයි පිළිගත්තේය. කාරායන රජුට එක් අශ්වයකුද අසිපතද එක් පරිවාර ස්ත්‍රියක ද තබා ඉදින් රජ ජීවිතයට ආසාකරන්නේනම් නොඑ්වායි කියා විඩූඩභට සේසත ඔසවා ඔහුගෙන සැවැත් නුවරටම ගියේය. ධම්මන්වයො ප්‍රත්‍යවේක්ෂා ඥාන සංඛ්‍යාත ධර්මයෙහි අන්වය අනුමානය, අනුබුද්ධිය යන අර්ථයි. දැන් උන්වහන්සේ ධර්මඅන්වයෙන් සම්මා සම්බුදුන් වහන්සේ. භාග්‍යවතුන් වහන්සේ ආදිය වෙයි. එය දක්වන්නට ඉදනිභනෙතා ආදිය කීය. එහි ආපාණ කොටිකං පණ කෙළවරතෙක්, ජීවිතාවසානය ඇතුළත් කොට මරණ සමයෙහිද හැසිරෙත්මය. ඉක්මවා නොයන්නේයැයි කියන ලදී. ආනාපාන කොටිකං - ආශ්වාස ප්‍රශ්වාස කෙළවර කොට ඇති - යනුවෙන්ද පාඨයක් ඇත. ජීවිත අවසානය දක්වා යන අර්ථයි. යම්සේ ඇතැම්හු ජීවිතය සඳහා ඉක්මවා යන්නාහු පණ කෙළවර කොට නොහැසිරෙත්. එසේ නොවේ යන අර්ථයි. අයමපි බො මෙ භනෙත බුදුන් සුබුද්ධ හෙයින්, ධර්මය ස්වාක්ඛාත හෙයින් සංඝයා සුපටිපන්න හෙයින්ද මෙය මෙසේ වෙයි. මෙසේ ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි

ධර්ම අන්වය වෙතියි දක්වයි. සියලු තැන මේ ක්‍රමය මැයි. න විය මයෙඤ්ඤ **චක්ඛුං බන්ධනෙන** ඇස් නොබඳින්නාක් මෙන් ප්‍රසන්න නොවූවන් දෙස බලා නැවත බැලීමක් නොවේ. ඒනිසා ඇස නොබඳී නම්වේ. ප්‍රසන්න වූවකු දෙසබලා නැවත නැවත බැලීමක් සිදුවෙයි. ඒනිසා ඇස්බඳී නම් මෙයම අප්‍රසන්න බවය ඒ නිසා මෙසේ කීය. **බන්ධුක රොගො නො** කුලරෝගය අපගේ කුලයෙහි උපන්නෝ මෙසේ වෙතියි කියත්. **උළාරං** මහෙශාඛ්‍ය, **පුබ්බේනාපරං** පෙරින් පසුවට එහි කිසුණු පිරියම්කොට සමවත් නිපදවන්නේ උදරවූ පූර්ව විශේෂය හඳුනාගනීනම් **ඝාතෙ තායං වාඝාතෙතුං** ඝාතනය කළයුතු පුද්ගලයා ඝාතනය කරන්ට **ජාපෙතායං ජාපෙතුං** ධනයෙන් හෝ පිරිහෙළන්ට යුතු පුද්ගලයා පිරිහෙළන්ට දූනගන්ට නිර්ධනකරන්ට **පබ්බාජෙතුං** රටින් පිටුවහල්කළයුතු පුද්ගලයන් පිටුවහල්කරන්ට **ඉසිදත්තපුරාණා** ඉසිදත්තද පුරාණද, මොවුන් ගෙන් එකෙක් බ්‍රහ්මචාරීය එකෙක් අඹුවගෙන් සතුටු වන්නෙකි. **මමභත්තා** මට අයිති සැමියා ඔවුන්ගේනුයි මමහතතා **මමයානා** මට අයිති යානය ඔවුන්ගේ නුයි මමයානං නම් **ජීවිකංදතා** ජීවිතවෘත්තිය දෙන්නා **වීමංසමානො** පරීක්ෂාකරමින් එකල්හි රජ නින්දට නොයන්නේම නින්දට ගියාක්මෙන් වී වැදහොත්තේය. ඉක්බිති ඒ නිලධාරීහු භාග්‍යවතුන් වහන්සේ කුමන දිශාභාගයකදැයි විචාරා අසුවල් දිසාභාගයෙහියයි අසා මන්ත්‍රණය කළහ. යම්තැනක භාග්‍යවතුන් වහන්සේ වෙසෙත්ද එදෙසට හිස හැරවූ කල්හි රජ පා පැත්තේ වෙයි. රජ යම් දෙසකද එදෙසට හිස හැරවූ කල්හි ශාස්තෘන් වහන්සේ පා පැත්තේ වෙති. කුමක් කරන්නෙමුද, ඉක්බිති ඔවුන්ට මෙසේ සිතිණ. රජ කුපිත වී යමක් අපට දේද එය සිදිනු ඇත. එවිට දූන දූන ශාස්තෘන් වහන්සේ පාපැත්තට කිරීමට නොහැක්කෙමුයි රජු පා පැත්තට කර වැද නොත්තාහුය. ඒ සඳහා මේ රජ මෙසේ කීය. **පක්කාමි** ගඳකිළියෙන් නික්ම කාරායන සිටිතැනට ගියේය. ඔහු එහි නොදූක කඳවුර තිබුණු තැනට ගියේය. එහිද අන්කිසිවකු නොදූක ඒ ස්ත්‍රිය ගෙන් ඇසීය. ඈ ඒ සියලු පුවත් කීවාය. රජ දූන් මා විසින් ඒකාන්තයෙන් එහි නොයා යුතුය. රජගහ නුවරට ගොස් බෑණා සමග අවුත් මාගේ රාජ්‍යය ගන්නෙමියි රජගහනුවරට යන්නේ අතරමගදී කඩහාල් බත්ම අනුභව කළේය. බොහෝ ජලයද බීවේය. සියුමැලි ප්‍රකෘති ඇති බැවින් ආහාර මනාසේ දිරවූයේ නැත. හේ රජගහ නුවර පැමිණෙන්නේ නොකල්හි දෙරවල් වැසූවිට පැමිණියේය. අද ශාලාවෙහි

තිද හෙට මාගේ බෑණා දකින්නෙමියි පිට නුවර ශාලාවෙහි වැද හොත්තේය. ඔහුට රාත්‍රිකාලයෙහි නැගිමට සිදුවිය. කිහිපවරක් පිටතට නික්මගියේය. එතැන් පටන් පාගමනින් යන්ට නොහැක්කේ ඒ ස්ත්‍රියගේ උකුලෙහි වැදහෙව ඉතා උදැසන කලුරිය කළේය. අද ඔහු මළ බව දැන රටවල් දෙකක රජකම් කරවා දැන් පිටනුවර අනුන්ගේ ශාලාවක අනාථයකු ලෙස කලුරිය කොට වැදහොත්තේය. මාගේ ස්වාමීවූ කොසොල් රජ්ජුරුවෝ යැයි ආදිය කියමින් මහ හඬින් වැළපෙන්නට ආරම්භ කළාය. මිනිස්සු අසා රජුට දැන්වූහ. රජ පැමිණ දැක හැඳින ආකරුණ අසා මහත් පෙරහරින් සිරුර ආදහනය කරවා විඩූඩභ අල්ලා ගන්නෙමියි බෙරහසුරුවා බලකාය රැස්කරවීය. ඇමතියෝ පාමුල වැටී දේවයන් වහන්ස ඉදින් ඔබතුමාගේ මාමා නිරොගී නම්, ඔබ වහන්සේ ඔහුවෙත යාම සුදුසුය. දැන් විඩූඩභද ඔබ වහන්සේ නිසා සේසත් නැංවීමට සුදුසු යැයි හඟවා වැළැක්වූහ. ධම්ම චෙතියානි ධර්මයට විසිතුරු වචන ඇත. තෙරුවන් අතර යම් තැනක විසිතුරක් කළවිට සියලු තැන කළානම් වන්නේය. ඒනිසා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විසිතුරක් කළවිට ධර්මයෙහිද කළානම් වන්නේයැයි භාග්‍යවතුන් වහන්සේ ධම්ම චෙතියයැයි කීසේක. ආදිබ්‍රහ්ම චරිකානි මාර්ග බ්‍රහ්ම චර්යයට මුල්වූ පූර්වභාග ප්‍රතිපත්ති වූ යන අර්ථයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

## නවවැනි ධම්මචෙතිය සූත්‍රයයි

## 2.4.10

එවමෙමසුතං යනු කණ්ණකත්ථල සූත්‍රයයි එහි උජුඤ්ඤායං උජුඤ්ඤා යනු ඒරටටද නගරයටද එම නමමය. භාග්‍යවතුන් වහන්සේ උජුඤ්ඤා නගරය නිසා වාසයකරන සේක. කණ්ණකත්ථලෙ මිගදයෙ ඒ නගරය නුදුරෙහි කණ්ණකත්ථල නම් එක් රමණීය භූමිභාගයක් ඇත. මුවන්ගේ අභය භූමියක් ලෙසින් දුන් බැවින් මිගදය යැයි කියනු ලැබේ. ඒ කණ්ණකත්ථල මුවවනයෙහි කෙනචිදෙව කරණීයෙන අනන්තර සූත්‍රයෙහි කියූ කටයුත්තක් සඳහා මිස අන් කරුණකින් නොවේ. සොමාච භගිනී සකුලාච භගිනී මේ දෙසෝවිරියෝ රජුගේ බිසෝ වරුය. භත්තාභිහාරෙති බත් බෙදන තැන.

රජුට උපස්ථාන කිරීමටයති. ඔවුහුද එසේම ගියහ. **කිංපන මහාරාජ** කුමක්නිසා මෙසේ කීවේද? රජුට සිදුවන ගර්හාවෙන් මුදවනු පිණිස. පිරිස මෙසේ සිතන්නේය. මේ රජතුමා එන ගමන්ම ගැහැණුන්ට හසුන දූත්වීය. අපි තමාගේ ස්වභාවයෙන් භාග්‍යවතුන් වහන්සේ දැකීමට ආවේ වනැයි සිතමු. මොහු ගැහැණුන්ගේ පණිවිඩ ගෙන ආවේය. ගෑණු දාසයෙකැයි සිතෙයි. මොහු පෙරද මේකරුණින්ම එන්නේ දැයි විචාරන ලද්දේ හේ තමා ආකරුණ කියන්නේය. මෙසේ ඔහුට මේ ගර්හාව නුපදින්නේයැයි ගර්හාවෙන් මුදනු පිණිස මෙසේ කීය. **අබ්භූ දහාස** කීය. **සකිදෙව සබ්බං ඤස්සති සබ්බං දක්ඛිති** යමෙක් එක් ආවර්ජනයකින්ම එක් සිතකින්ම එක් ජවනයකින්ම අතීත අනාගත වර්තමාන සියලුදේ දනීද හෝ දකීද එබන්දෙක් නැත යන අර්ථයි. එක්සිතකින්ම අතීතවූ සියල්ල දන්නෙමියි ආවර්ජනාකොටද අතීතවූ සියල්ල දැනගන්ට නොහැකිය. ඒකදේශයක් පමණක් දනී. අනාගත වර්තමාන වූදේ ඒ සිතෙන්ම සියල්ල නොදනී. **ඉතිරි** තන්හිද මේ ක්‍රමයයි. මෙසේ ඒකචිත්ත වශයෙන් මේ ප්‍රශ්නය කියන ලද්දේය. **හෙතුරූපං** හේතුවේ ස්වභාවය, කරුණට මුල්වූ දෙය **සහෙතුරූපං කරුණු** සහිතවූ දෙය, **සම්පරායිකාහං භනෙත** ස්වාමීනි, මම පරලොව ගුණ අසමි. **පඤ්චවිමානි** මේ සූත්‍රයෙහි ලෞකික හා ලෝකෝත්තර මිශ්‍ර ප්‍රධාන අංග පසක් කියන ලදී. ගවිලඬගණ වාසී චූලසමුද්ද තෙරුන් වහන්සේ, ස්වාමීනි ඔබවහන්සේට කුමක් රුචිදැයි විමසූ කල්හි මට ලෝකෝත්තර ගුණම රුචියයි කීහ. **පධාන වෙමත්තං** ප්‍රධාන නානාත්වය පෘථක්ජනයාගේ ප්‍රධානය අන්‍යයට අසමානය. සෝවාන් වූවහුගේ අසමානය. සකෘදාගාමීහුගේ අසමානය. අනාගාමීහුගේ අසමානය. රහතන් වහන්සේගේ අසමානය. අසූමහ සව්වන්ගේ අසමානය. අගසව්වන් දෙදෙනාත් අසමානය. පසේ බුදුවරුන්ගේ අසමානය සර්වඥ බුදුවරුන්ගේ අසමානය. පෘථක් ජනයාගේ ප්‍රධානය සෝවාන් වූ ඔහුගේ ප්‍රධානයට නොපැමිණේ - පෙ - පසේ බුදුවරුන්ගේ ප්‍රධානය සර්වඥ බුදුකෙනෙකුගේ ප්‍රධානයට නොපැමිණේ. මේ අර්ථය සඳහා ප්‍රධාන නානාත්වය කියමියි කියූසේක. **දනතකාරණං ගවෙෂයසුං** කුට නොවූ කරුණ නොකැඩෙන කරුණයි. ධූරය ඉවතනොලන දමුණුවුන් අතර කරුණක් දක්නට ලැබේද ඒ කරුණට යායුතුය යන අර්ථයි. **දනතභූමිං** දමුණුවුන් විසින් යා යුතු භූමිය. **අස්සදෙධා** ආදීතන්හි පෘථක්ජන සෝතාපන්න සකෘදාගාමී අනාගාමී යන

සිව්දෙන අස්සද්ධ නම්වෙති. පෘථක් ජනයා සෝවාන් වූවහුගේ ශ්‍රද්ධාවට නොපැමිණියේනුයි. අස්සද්ධ නම්වේ. සෝතාපන්නයා සකෘදාගාමීහුගේ ශ්‍රද්ධාවට නොපැමිණියේනුයි අස්සද්ධ නම් සකෘදාගාමියා අනාගාමියාගේ ශ්‍රද්ධාවට නොපැමිණියේ නුයි අස්සද්ධනම් අනාගාමියා රහත්වූවහුගේ ශ්‍රද්ධාවට නොපැමිණියේනුයි අස්සද්ධනම්. ආබාධො අරහතො වි **උපපජ්ජති** රෝගාබාධ පහක්වෙයි. ආර්ය ශ්‍රාවකයාට සඨ මායාවී යන නම් නැත. ඒනිසාම තෙරුන් වහන්සේ කියන ලද ලෝකෝත්තර ප්‍රධානාංග පස මට රුචි වෙතියි කීහ. අස්සබලුඞ්ක සූත්‍රාන්තයෙහි මහණෙනි අස්සබලුඞ්කයෙහි තුනක්ද පුරිසබලුඞ්කයෙහි තුනක්ද දේශනා කරන්නෙමි, මෙහි ආර්ය ශ්‍රාවකයාටද සඨයැයි නමක් ආයේය. ඒ වශයෙන් ලෝකෝත්තර මිශ්‍රක කියන ලදැයි කියන ලදී. පෘථක් ජනයා වනාහි සෝතාපත්ති මාර්ග වීර්යට නොපැමිණියේ - පෙ - අනාගාමි මාර්ග වීර්යයට, අර්හත් මාර්ග වීර්යයට නොපැමිණියේ වෙයි. කුසීතයාද අස්සද්ධයා මෙන් යැයි කියන්නෝ වෙති. නුවණ පුද්ගලයාද එසේය. මෙහි උපමා සන්සන්දනය මෙසේ දතයුතුයි. මාර්ග ප්‍රධාන රහිත පුද්ගලයා නොදැමුණු ආදීන් මෙනි. මාර්ග ප්‍රධාන ඇත්තා දැමුණු ඇත් ආදීන් මෙනි. යම්සේ නොදැමුණු ඇත් ආදීහු කුළු බවක් නොදක්වා නොකඩවා ධූරය නොහළා දැමුණු ගමනක් යන්ටහෝ දැමුණු බිමකට පැමිණීමට හෝ නොහැකිවෙත්ද, මෙසේම මාර්ග ප්‍රධාන රහිත පුද්ගලයා මාර්ග ප්‍රධාන ඇත්තකු විසින් පැමිණිය යුත්තක් පමුණුවන්ට ඉපදවියයුතු ගුණයක් උපදවන්ට නොහැක්කේද, යම්සේ දැමුණු ඇත් ආදීහු කුළුබවක් නොදක්වා නොකඩවා ධූර නෙහෙළා දැමුණු ගමනක් යන්ට හෝ දැමුණු බිමකට පැමිණීමට හෝ හැකිවෙත්ද මෙසේම මාර්ගප්‍රධාන ඇත්තා පැමිණිය යුත්තක් පමුණුවන්ට ඉපදවියයුතු ගුණයක් උපදවන්ට හැක්කේද, මෙය කියන ලද්දේය. සෝතාපත්ති මාර්ග ප්‍රධාන ඇත්තා සෝතාපත්ති මාර්ග ප්‍රධාන ඇත්තකු විසින් පැමිණි අවකාශයට පැමිණීමට, ඉපදවූ ගුණයක් ඉපදවීමට, හැකිවේද - පෙ - අර්හත් මාර්ග ප්‍රධාන ඇත්තා අර්හත් මාර්ග ප්‍රධාන ඇත්තකු විසින් පැමිණි අවකාශයට පැමිණීමට ඉපදවූගුණයක් ඉපදීවීමට හැක්කේය. **සම්මප්පධානානි** මාර්ග ප්‍රධානයෙන් සම්‍යක් ප්‍රධානයට විවිධත්වයක් කුමටදැයි (කියම්) **යදිදං විමුත්තියා විමුත්තිං** එකකුගේ ඵලවිමුක්තියෙන් අනිකාගේ ඵලවිමුක්තිය අරබයා විවිධත්වය

කියයුතු වන්නේනම් කිසිවක් නොකියමි යන අර්ථයි. අවචියාවා අවචිං ගිනිදලුවෙන් ගිනිදැල්ලෙහි සෙසුපද දෙකෙහිද මේ ක්‍රමය මැයි. අවධි අර්ථයෙහි ද්‍විතියා වචනයි. **කිංපනත්වං මහාරාජ** මහරජ, ඔබ මෙසේ චාතුර්මහාරාජික දෙවියන් ඇතිබව, තාවතිංස දෙවියන් ඇතිබව - පෙ - පරනිර්මිත වශවර්තී දෙවියන් ඇතිබව ඊටත් ඉහළින් දෙවියන් ඇතිබව නොදන්නෙහිද? ඉන්පසු ඇතිබව දනිමි. මනුෂ්‍ය ලෝකයට එන්නෝද නොඑන්නෝදැයි අසන්නේ යදිවා තෙ **භනෙත** ආදිය කීය. **සව්‍යාපජ්ඣා** දුක්සහිත වූවාහු සමුච්ඡේදප්‍රහාණයෙන් (හීනනොවූ) චෛතසික දුක්ඛය **ආගන්තාරො** උපපත්ති වශයෙන් පැමිණෙන්නෝ. (**අබ්‍යාපජ්ඣා** යනු සිඳදැමූ දුක් ඇත්තෝ, **ආගන්තාරො** උපපත්ති වශයෙන් නො එන්නෝ, **පහොති** හැකිවෙයි. රජතෙමේ පුණ්‍යවන්තවූ ලාභසත්කාර සම්පන්නවූ අයකු කරා නොඑළඹේද, එසේ කරන්නේ ඒ ස්ථානයෙන් ඉවත්වන්ට හැකිවෙයි. පින්නැත්තකු වුවද මුළුගමෙහි පිඩු පිණිස හැසිර යැපෙන පමණක්වත් නොලබන්නකු ලාභසත්කාර සම්පන්නයෙක් වන්නේ කෙසේද එසේ) මෙසේ කරන්නා ඒ තැනින් ඉවත් කරන්ට හැකිවෙයි. බ්‍රහ්මචර්ය වසන්තයකුවුවද ස්ත්‍රීන් සමග යොදවා ශීලවිනාශයට පැමිණෙන්නේ බලාත්කාරයෙන් හෝ උපැවිදි වන්නේ ඒ තැනින් ඉවත් කරන්නට හැකිවෙයි. අබ්‍රහ්මචර්ය ඇත්තකුවූවද කාමගුණ සහිත ඇමතියකු බන්ධනාගාරයට පිවිසවා ස්ත්‍රීන්ගේ මුහුණක් වත් දකින්ට නොදෙන්නේ ඒ තැනින් ඉවත් කරන්ට හැකිවෙයි. රටින් යමක් කැමතිවේද එය පිටුවහල්කිරීම නම් **දස්සනායපි නප්පහොනති** දෙවියන් කාමාවචර අව්‍යාපාද ව්‍යාපාද සහිත දෙවියෝ චක්ඛු විඤ්ඤාණයෙහි දර්ශනයටවත් නොපොහොසත්වෙති. කුමක් හෙයින්ද රහත් කෙනෙකු එහි නැතිබැවිනි. රූපාවචරයෙහි එක් විමානයක යමෙක් සිටිත්ද හිඳිත්ද චක්ඛුවිඤ්ඤාණයෙහි දර්ශනයට පොහොසත් වෙති. ඔවුන් විසින් දුටුදෙය සලකා බලන්නට අවබෝධකරන්ට ලක්ෂණ දැකීමට සලකාබලන්ට අවබෝධ කරන්ට නොහැකිවෙත් ඥාන චක්ෂුසින් දකින්ට නොපොහොසත් වෙති. උඩ උඩ දෙවියන් චක්ඛු විඤ්ඤාණ දර්ශනයට වත් නොපොහොසත්වෙති. **කොනාමොඅයං භනෙත** රජ තෙරුන් දන්නේම නොදන්නාක් මෙන් විමසයි. කුමක්නිසාද: ප්‍රශංසාකරනු කැමතිවය. **ආනන්දරූපො** සතුටු ස්වභාවය. බ්‍රහ්මපුච්ඡාවද කියූ ආකාරයෙන්ම දතයුතුය. අථඛො

අඤ්ඤතරො පුරිසො ඒකථාව විඩූඪභ විසින්ම කියන ලද්දකි. ඔවුහු ඔහු විසින් කියන ලදී. ඔහු විසින් කියන ලදී යයි කුපිතවූවාහු ඔවුනොවුන් මෙතැනදීම තමතමන්ගේ බලකායන් නැගිටුවා කලහ වුවද කරන්නෝය. එය නැවැත්වීම පිණිසය. ඒරාජපුරුෂයා මෙසේකීය. සෙස්ස සියලුතැන නොගැඹුරුමය මේ දේශනාව නෙය්‍ය පුද්ගල වශයෙන් නිම කරන ලදී.

දසවැනි කණ්ණකත්ථල සූත්‍රයයි.

සිව්වැනි වර්ගය නිමියේය.

## 2.5.1

**එවමෙමසුතං** යනු බ්‍රහ්මායු සූත්‍රයයි. එහි **මහතා භික්ඛුසඞෙඝන සද්ධිං** මහතා යනු ගුණමහත්වයෙන්ද මහත්වූ සංඛ්‍යා මහත්වයෙන්ද මහත්වූ ඒ භික්ෂු සංඝයා ගුණයෙන්ද මහාවිය. අල්පේච්ඡතාදි ගුණයෙන් යුක්තවූ බැවින් සංඛ්‍යාවෙන්ද මහාවිය. පන්සියයක් වූ බැවින් භික්ෂූන්ගේ සංඝයෙන් **භික්ඛු සංඝෙන** දිට්ඨිසීල සාමඤ්ඤසංඝාත සංඛ්‍යාත ශ්‍රමණ ගුණයෙන් යන අර්ථයි. **සද්ධිං** එකතුව, **පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි** පංචමාත්‍රය ඔවුන්ගේනුයි පංචමත්තානි. මත්තායනු ප්‍රමාණයයි කියනු ලැබේ. ඒනිසා භොජනෙ මත්තඤ්ඤූයයි කියුකල්හි භෝජනයෙහි මාත්‍රය දනියි. ප්‍රමාණය දනියි යන අර්ථයි. මෙසේ මෙහිද ඒ සියයක් භික්ෂූන්ගේ පංචමාත්‍රය පංච ප්‍රමාණයැයි එම අර්ථය දතයුතුය. භික්ෂූන්ගේ සියගණන භික්ඛුසතානි ඒ පන්සියයක් පමණ භික්ෂූන් සමග **වීසං වසස සතිකො** විස්සක් අධික වස් සියයක්. **තිණණං වෙදනං** ඍග්වේද යජුර්වේද සාමවේද යන්ගේ තොල්හි ගැවෙන කරුණුවශයෙන් පරතෙරට ගියේනුයි **පාරගූ** නිඝණ්ඩු කෙටුභ සහිත **සනිඝණ්ඩු කෙටුභානං**. නිඝණ්ඩුයනු නාම නිඝණ්ඩුය. රුක් ආදීන්ගේ විවිධ වචන ප්‍රකාශ කරන ශාස්ත්‍රය අක්ෂර ප්‍රභේද සමගවූ **සාක්ඛරප්පභෙදනං** අක්ඛරප්පභේද යනු ශික්ෂාව සහ නිරුක්තිය. **ඉතිහාස පඤ්චමානං** යනු අථර්ව වේදය සිව්වැනි කොට මෙසේ මෙහි වීය, මෙසේ මෙහි වී යැයි එබඳු වචන ප්‍රතිසංයුක්ත පුරාණ කථා සංඛ්‍යාතවූ ඉතිහාසය පස්වැනි වූයේ මොවුන්ටනුයි ඉතිහාසපඤ්චමා එයද පදයද එයින් අවශේෂවූවද ව්‍යාකරණ අධ්‍යයනය කෙරේ දන්වානුයි **පදකො වෙය්‍යාකරණෙ, ලොකායතං** විතණ්ඩවාදශාස්ත්‍රය **මහාපුරිසලක්ඛණං** මහාපුරුෂ බුද්ධාදීන්ගේ ලක්ෂණ පෙන්වන දොළොස් දහසක් පමණ ග්‍රන්ථ ඇති ශාස්ත්‍රය. යම් තැනක සොළොස් දහසක් පමණ ගාථාපද බුද්ධමන්ත්‍ර නම්විය. ඒ වශයෙන් මේ ලක්ෂණයෙන් යුත් බුදුවරු නම් වෙති. මෙයින් පසේ බුදු. අගසව්වෝ, අසූමහා ශ්‍රාවකයෝ. බුද්ධමාතා, බුද්ධපිතා. අග්‍රඋපස්ථායක, අග්‍රඋපස්ථායිකා. චක්‍රවර්ති යන මේ විශේෂය දනී. අනවයො මේ ලෝකායත මහාපුරුෂ ලක්ෂණයන්හි නොඅඩුව පිරිපුන් කරන. අව්‍ය නොවේනුයි කියන ලද්දේ වෙයි. අව්‍යනම් යමෙක් ඒවා අර්ථවශයෙන්ද ග්‍රන්ථ වශයෙන්ද ආරක්ෂා කරන්ට නොහැකි වෙත්

**අසෙසාසිබො** ආදිතන්හි යමක් කිවයුතු වන්නේ නම් එය සාලෙය්‍යක සූත්‍රයෙහි කියන ලද්දේමය. **අයංතාතා** තමා මහලුබැවින් යාමට නොහැකි වන්නේ තරුණයා අමතා මෙසේකීය. එසේවුවත් මේ බ්‍රාහ්මණයා මෙසේ සිතීය. මේ ලෝකයෙහි මම බුදුවෙමියි නැගුණහුගේ නම ගෙන බොහෝ දෙන හැසිරෙති. ඒනිසා ඇසීම් මාත්‍රයෙන්ම එළඹෙන්නට යුතු නැත. එක්පැත්තකින් එළඹෙන්නහුගේ ඉවත්වීමද ගෞරවනීය වෙයි. අනර්ථයක්ද ඇතිවේ. අතවැසියකු යවා බුදුන්ද නැද්දැයි දැනගෙන එළඹෙන්නෙමි නම් යෙහෙකි. ඒනිසා තරුණයා අමතා අයං තාතා ආදිය කීය. **තං භගවතනං** ඒභාග්‍යවතුන් වහන්සේගේ, සන්තං යන්නම සතො යනුවෙන් වෙයි. මෙය **ඉත්ථම්භූත ආඛ්‍යාත** අර්ථයෙහි දුතියා විභකති වචනයි. **යථාකථමප නාහං භොති** මෙහි හොතං, භාග්‍යවත් ගෞතමයන් මම දැන ගන්නේ කෙසේද, දැනගන්ට ඔහුට හැකිනම් මට කියන්න යන අර්ථයි. **යථාතිවා** නිපාත මාත්‍රයක්මය. **කථං** යනු ආකාර විමසීමයි. කුමන ආකාරයකින් මම භවත් ගෞතමයන් දැනගන්නෙම්ද යන අර්ථයි. මෙසේ කිකල්හි උපාධ්‍යායන් වහන්සේ ඔහුට දරුව ඔබ පෘථුවියෙහි සිටිමින් පෘථුවිය නොදකිමියි කියන්නාක් මෙන්, චන්ද්‍රසූරියන් බබලමින් සිටින විට චන්ද්‍රසූරියන් නොදකිමියි කියන්නාක්මෙන් කතා කරතියි ආදිය කියා දන්නා ආකාරයක් පෙන්වන්නේ **ආගතානි** බො **තාතා** ආදිය කීය. එහි **මනෙතසු** වේදයන්හි, තථාගතයන් වහන්සේ උපදින සේකයි පළමුකොටම සුද්ධාවාස දෙවියෝ වේදයන්හි ලක්ෂණ බහා මේවා බුද්ධ මන්ත්‍රයයි බමුණු වෙසින් වේදයන් කියවත් ඒ අනුසාරයෙන් මහේශාඛ්‍ය සත්වයෝ තථාගතයන් වහන්සේ දැන ගන්නාහුයැයි පෙර වේදයන්හි මහා පුරුෂලක්ෂණ තිබුණේය. තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි අනුක්‍රමයෙන් අතුරුදහන්වෙයි. ඒනිසා දත් ඇත. **මහාපුරිසසස** ප්‍රණිධිසමාදනඥාන, කරුණාදීගුණමහත්වයක් ඇති පුරුෂයාට, ගති දෙකකි. නිෂ්ඨා දෙකකි. ගති ශබ්දය කාමයද වේ. සාරිපුතතා ගති පසකි ආදීතන්හි භවභේදයෙහි පවතී. මුවන්ගේ ගතිය මහවනයයි ආදිතැන්වල නිවාසස්ථානයයි. මෙසේ අධිමතතා ගතිමනෙතා ආදී තැන්වල ප්‍රඥාවෙහි පවතී. ගතිගතං ආදීතන්හි පැතිරුණු බවෙහි මෙහි නිෂ්ඨාවෙහි පවතීනුයි දතයුතුය. එහි යම් දෙයකින් යුත් තැනැත්තේ රජ වේද එයින්ම බුද්ධ වේ ජාති ආදීතන්හි පැතිරුණු බවෙහි. මෙහි නිෂ්ඨාවෙහි පවතීනුයි දතයුතුය. එහි යම් දෙයකින් යුත් තැනැත්තේ රජ වේද එයින්ම බුද්ධ වේ. ජාති

සමානතාවෙන් ඒවාම ඒවාම වෙතියි කියනු ලැබේ. එහෙයින් කියන ලදී යෙහි **සමන්නාගතස්ස** යනුවෙන් **සචෙ අගාරං අජ්ඣාවසති** ඉදින් ගිහිගෙහි වසයිනම් සක්විති රජවෙයි. සතර ආශ්චර්ය ධර්මයන්ගෙන් හා සිව්සඟරා වතින්ද ලෝකය රංජනය කරන බැවින් රාජ නම්වේ. චක්‍රරත්නය පවත්වයි. සතර සම්පත් චක්‍රයෙන් පවත්වයි මේවායින්ද අනුන් කෙරෙහි පවත්වයි යනුයි චක්‍රවර්ති වේ. අනුන්ගේ හිත පිණිස ඉරියව් චක්‍රවත් ඔහුකෙරෙහි ඇත්හුයි චක්‍රවර්ති නම් මෙහි රාජා යනු සාමාන්‍ය යෙදුමයි. චක්‍රවර්තී යනු විශේෂණයයි. දැහැමින් හැසිරේනුයි ධම්මිකො න්‍යායයෙන් සෙමෙන් පවතීයන අර්ථයි. ධර්මයෙන් රාජ්‍යය ලබා රජවීහුයි ධම්මරාජා අනුන්ට හිතවත් දහම් කිරීමෙන් හෝ ධම්මිකො නම් තමාට හිතවත් කරුණු සිදුකිරීමෙන් හෝ ධම්මරාජා නම් දිශා හතරට ප්‍රධානීනුයි චාතුරන්ත නම් සිව්දින සිව් සමුදුරු අන්ත කොට ඇති චතුර්විධවූ දිවයින් අලංකාර කරන ලද හෙයින්ද පෘථුවියට ප්‍රධානී යන අර්ථයි. ඇතුළත කෝප ආදී සතුරන්ද පිටත සියලු රජුන්ද ජයගත්තේනුයි **විජිතාවි ජනපදත්ථාවරිප්පත්තො** ජනපදයන්හි ස්ථාවරභාවයට පත් කා විසින් හෝ දිනිය නොහැකිය. ජනපදයෙහි ස්ථාවර භාවයට පැමිණි, උත්සුක නොවූ. ස්වකීය කාර්යයන්හි නිරත, නොසැලෙන, කම්පාවට පත් නොවන බැවින් ජනපදත්ථා වරියප්ප ත්තො නම්. **සෙය්‍යථීදං** නිපාතයකි. ඒවා මොනවාද යන අර්ථයි. **චක්කරතනං** ආදී තන්හි චක්‍රයද රතිජනන අර්ථයෙන් රතන ද චක්ක රතනං සියලු තන්හි මේ ක්‍රමයයි. මේ රත්නයන් අතර මේ සක්විතිරජ චක්‍රරත්නයෙන් නොදිනුතැන් දිනයි. හත්ථි අස්ස රත්නයන් සහිතව විජිතයෙහි සැපසේ හැසිරෙයි. පරිනායක රත්නය සමග විජිතය ආරක්ෂා කරයි. සෙස්සන් සමග උපභෝග සම්පත් අනුභව කරයි. පළමුවෙන්ම ඔහුගේ උත්සාහ ශක්ති යෝගයයි. පසුව කියූ දෙයින් මන්ත්‍ර ශක්තියෝගය සුපරිපූර්ණවෙයි. **ඉත්ථිමණි** රතනයන්ගෙන් ත්‍රිවිධ ශක්තීන් යෙදීමෙහි ඵලයයි. හෙතෙමේ ඉත්ථිමණී රතනයන් ගෙන් යෝග සුඛය අනුභව කරයි. සෙස්සෙන් ඓශ්වර්ය සුඛය අනුභවකරයි. විශේෂ වශයෙන් ඔහුට පෙරකී ත්‍රිවිධ ශක්තීහු අදෙස කුසල මූලයන්ගෙන් හටගත් කර්මානුභාවයෙන් සැපයේ. මැද ශක්ති අලෝභකුසල මූලයන්ගෙන් ජනිත කර්ම ආනුභාවයෙන් සැපයේ. පසුව කී ශක්තිය අමෝහ කුසල මූලයන්ගෙන් ජනිත කර්ම ආනුභාවයෙන් සැපයේයැයි දත යුතුය. මේ මෙහි

සංක්ෂේපයයි. විස්තර බොජ්ඣංග සංයුක්තයෙහි රතන සූත්‍රයට උපදේශ වශයෙන් ගතයුතුය. එසේ වුවත් බාලපණ්ඩිත සූත්‍රයෙහි මේ රත්නයන්ගේ උත්පත්ති ක්‍රමය සමග වර්ණනාව පැමිණෙන්නේය. **පරොසහස්සං** අතිරේක දහස සූරා බියනැති වර්ගයා **වීරඞ්ගරූපා** දේවපුත්‍රයකුට හා සමාන සිරුරු ඇති මෙසේ එක් කොටසක් වර්ණනා කරත්. මේ මෙහි ස්වභාවයයි. වීරා උත්තම සූරයෝ යැයි කියනු ලැබෙත්. වීරයන්ගේ අංගය වීරඞ්ගං නම් වීර කාරණයයි. වීර්යයැයි කියන ලද්දේවෙයි. **පරසෙනප්පමද්දනා** ඉදින් ඉදිරියෙහි සිටින්නේනම් පරසේනාවන් හෝ එය මර්දනය කරන්ට සමර්ථයැයි අදහස් කරන ලදී. ධම්මෙන ප්‍රාණය නැති නොකළ යුතුය ආදී පංචශීලධර්මයෙන් **අරහං හොති සම්මා සම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දො** මෙහි රාග දෝස මෝහ මාන දිට්ඨි අවිජ්ජා දුශ්චරිත සත් සෙවනින් වැසුණු ක්ලේශාන්ධකාර ලෝකයෙහි ඒ වහලය විවෘතකොට හාත්පසින් හටගත් ලෝකයක්ව සිටියේ විවත්තච්ඡද්දොනම්. එහි පළමුපදයෙන් පූජාවට සුදුසු බව දෙවැන්නෙන් එයට හේතුව, යම් හෙයකින් සම්මාසම්බුද්ධ වීද එය තෙවැන්නෙන් බුද්ධත්වයට හේතුභූතවූ විවත්තච්ඡදදතාව කියන ලදූයි දත යුතුයි. නැතහොත් විවෘත කරන ලද වහලය ඇත්තේනුයිද, විවෘතකරන ලද වහලය ඇත්තේ වටකිරීම් නැති වහලය නැති යයි කියන ලද්දේ වෙයි. එයින් අරහං වෙයි. වටකිරීම් නැති බැවින්ද වහලය ඇත්තේ වටකිරීම් නැති වහලය නැති යයි කියන ලද්දේ වෙයි. එයින් අරහං වෙයි. වටකිරීම් නැති බැවින්ද වහලය රහිත බැවින්ද සම්මාසම්බුද්ධය. මෙසේ පූර්ව පද දෙකටම හේතු භූතවූ දෙක කියන ලද්දේවෙයි. දෙවැනි වෛශාරද්‍යයෙන්ද මෙහි පූර්ව සිද්ධිය ඇතිවේ. පළමු වැන්නෙන් දෙවැනි සිද්ධිය ඇතිවේ. තෙවැන්නෙන් සිව්වැන්නෙන් තෙවැනි සිද්ධිය ඇතිවේ. පළමුවැන්න ධර්මචක්ෂුසද, දෙවැන්න ධර්ම චක්ෂුසද, තෙවැන්න සමන්ත චක්ෂුසද සදතියි දතයුතුය. **තුවං මනතං පටිග්ගහෙතා** මෙයින් ඔහුට ගුරුභාවය උපදී හෙතෙමේද ඒ ආචාර්ය කථාවෙහි ලක්ෂණයන්හි පහවූ මෝහ ඇති ඒකාලෝක වූවාක්මෙන් බුද්ධමන්ත්‍රයන් බලමින් එවංහොති මෙසේ වේයයි කීය. එහි අර්ථය නම් පින්වත ඔබ මට යම්සේ කියහිද එසේ කරන්නෙමි. **සම්මන්නෙසි** - ගවේෂණය කළේය. එක දෙක යයි ගණන් කරන්නේ සමාන කළේය. **අද්දසාබො** කෙසේ දුටුවේද? වැඩහුන් බුදුවරුන්ගේ හෝ වැදහොත්

බුදුවරුන්ගේ කිසියම් ලක්ෂණයක් පර්යේෂණය කරන්ට නොහැකිය. සිටි බුදුවරුන්ගේ හෝ සක්මන් කරන බුදුවරුන්ගේ හැකිය එහෙයින් ලක්ෂණ පර්යේෂණය කිරීම සඳහා කීය. ඒ දැක බුදුවරු අසුනින් නැගිට සිටිති කියාහෝ සක්මන හෝ අධිෂ්ඨාන කරතියි කියා හෝ ලක්‍ෂණ දැකීමට සුදුසු ඉරියව් පවත්වන විට දුටුවේය. **යෙභුය්‍යෙන** බෙහෙවින් බොහොමයක් දුටුවේය. මඳක් නොදුටුවේය යන අර්ථයි. ඉන්පසු යම් කිසිවක් නොදුටුද ඒ දෙකක් හැර පෙන්වීම පිණිස කියන ලදී. **කංඛති** අනේ බලන්ට ඇත්නම් යයි ප්‍රාර්ථනාවක් උපදවයි. **විචිකිච්ඡති** එයින් ඒවා විමසා බලන්නේ වෙහෙසෙයි දකින්ට නොහැකිවෙයි. **නාධිමුච්චති** ඒ විචිකිච්ඡාවෙන් නිෂ්ඨාවකට නොයයි. **නසම්පසීදති** එයින් මුන් වහන්සේ පරිපූර්ණ ලක්ෂණ ඇතිසේකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයට නොපැමිණේ. සැකයෙන් දුබලවූ විමතිය කියන ලදී. විචිකිච්ඡාවෙන් මැද අවබෝධ නොවන බැවින් බලවත්යයි අප්‍රසාදයෙන් ඒ තුන් කරුණු වලින් සිත කිළිටිවන බව **කොසොහිත** වත්ථි කෝෂයෙන් වැසුණු, **වත්ථගුය්හෙ** අංගජාතයෙහි භාග්‍යවතුන් වහන්සේගේ වනාහි ඇතකුගේ මෙන් කෝෂයෙන් වසුණු අංගජාතය. රන්වන්ය. පියුම් ගැබක් වැනිය. එය වස්ත්‍රයෙන් වැසුණු බැවින් නොදකින්නේ මුවතුළටවත් දිවෙහි පුළුල් බව නොසලකන්නේ ඒ ලක්ෂණ දෙකෙහි සැක ඇත්තේ විය. වෙහෙසුණේය. **අථඛොභගවා** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූ සේක. යම්හෙයකින් මා මොහුට මේ ලක්ෂණ දෙක නොපෙන්වූවහොත් නිශ්ශංක නොවන්නේය. මෙහි සැක ඇතිකල්හි ඔහුගේ ගුරුවරයාද නිශ්ශංක නොවන්නේය. නැවත මා බලන්නට නොඑන්නේය. නොපැමිණෙන්නේ ධර්මය නො අසන්නේය. ධර්ම නොඅසන්නේ සාමඤ්ඤඵලතුන සාක්ෂාත් නොකරන්නේය. මා පාරමිතා පිරූයේ මේසඳහාය. මොහුට ඒ ලක්ෂණ දක්වන්නෙමියි එබඳුවූ ඍද්ධි අභිසංඛාරයක් කළසේක. රූපය කෙසේද මෙහිදී අනිකකු විසින් කුමක් කිවයුතුද. එය නාගසේන තෙරුන් විසින්ම ඒ ගැන විමසූ මිලින්ද රජුට කියන ලදී. මෙසේ කීහ. නාගසේනයන් වහන්ස භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද්දේ දුෂ්කර දෙයකි. කිමෙක්ද මහරජ, මහජනයා විසින් ලජ්ජාවීමට අවකාශයෙක, බ්‍රහ්මායු බ්‍රාහ්මණයටත් අතවැසි උත්තරටද, පාවාරියගේ අතවැසිවූ සොළොස් බමුණන්ටත්, සේල බ්‍රාහ්මණයාටද අතවැසි මාණවයන් තිස් දෙනාටද දැක්වූයේ ස්වාමීනි. මහරජ භාග්‍යවතුන්

වහන්සේ අංගජාතය නොපෙන්වූ සේක. ඡායාව පමණක් පෙන්වූසේක. ඍද්ධියෙන් මවා සිවුර අඳනය කාබහන බැඳුණු සිවුර පොරෝනයෙහි ඡායාරූපයක් රූපමාත්‍රයක් පෙන්වීය මහරජ ස්වාමීනි ඡායාව දුටුවිට දුක්කේම වෙයි නේද? එය වෙයි මහරජ හෘදය රූපය දැක අවබෝධ කරගන්නා සත්වයෙක් වන්නේය හෘදය මාංශය ඉවතට ගෙන දක්වන්නේය. නාගසේනයන් වහන්ස සම්මා සම්බුද්ධ යනු දක්ෂයෙක් නේද? **නිනනාමෙත්වා** ඉවතටගෙන, **අනුමසි** විදින ඉදිකටුවක් මෙන් කොට අතගෑය. එසේ කිරීමෙන් මෙහි මෘදුබව, කර්ණ ශ්‍රෝතය ස්පර්ශ කිරීමෙන් දිගුබව, නාසිකා ශ්‍රෝතය පිරිමැදීමෙන් මහත්බව නළල වැසීමෙන් පුළුල් බවද ප්‍රකාශ විණැයි දතයුතුය. **උභොපිකණ්ණසොතානි** ආදිතන්හිද, බුදු වරුන්ගේ කර්ණ ශ්‍රෝතයන්හි මලහෝ දූලි හෝ නැත. සෝද තැබූ රිදී බටයක් මෙන් වෙයි. නාසිකාවද එසේය. කන්වල ඒවාද මැනවින් කැටයම් කළ රන් බටයක් මෙන්ද, මැණික් බටයක් මෙන්ද වෙයි. ඒනිසා දිව පිටතට ගෙන විදින ඉදිකටුවක් මෙන් කොට මුව කෙළවරින් එක්තැන්කොට දකුණුකන් සිදුරට ප්‍රවේශ කොට, යින් පිටට ගෙන වම්කන් සිදුරට ප්‍රවේශ කළ සේක. එයින් පිටතටගෙන වම් නාස් පුඩුවට ප්‍රවේශකළසේක එයින් පිටතට ගෙන පුළුල්බව දක්වන සේක් රන්වලාවකින් අඩසඳසේද රන්පටක් සේද රන් කම්බිලි පටකින් විදුලිය එළියක් බඳු දිවෙන් මුළු නළල් තලය වැසූසේක. **යනනූනාහං** කුමක්නිසා සිතීද? මම මහාපුරුෂලක්ෂණ හොඳින් පරීක්ෂාකර බලා ගියවිට, දරුව ඔබ මහාපුරුෂලක්ෂණ දුටුවෙහිදැයි ගුරුවරයා විසින් විමසන ලද්දේ එසේය ආචාරීනි කියන්ට හැකිවන්නේනම්. යම්හෙයකින් ඔහුගේ කාර්යකරණය කෙසේදැයි මා විමසන්නේය. එය කියන්ට නොහැකිය. නොදනිමියි කීකල්හි ගුරුවරයා කිපෙන්නේය. ඔබ පිටත්කරහැරියේ මේ සියල්ල දැනගන්ට නොවේද කුමක්නිසා නොදැන ආවෙහිද? ඒනිසා මැනැවැයි සිතා ලුහුබැන්දේය. භාග්‍යවතුන් වහන්සේ නානතැන. මුවදෝනා තැන. සිරුර පිළිදැගුම් කරන තැන අන්තඃපුර ස්ත්‍රීන් සමග රාජරාජ මහාමාත්‍රාදීන් පිරිවරා හිඳින තැන යන මේ සිව්තැන් හැර සෙසුතැන්වල යටත් පිරිසෙයින් එකම ගඳකිළියෙහි පවා අවකාශය ලබාගත්තේය. කලයත්යත්ම මේ බ්‍රහ්මායු බමුණාගේ උත්තර නමැති ශිෂ්‍යයා බුදුවරයෙක්ද නැද්දැයි භාග්‍යවතුන් වහන්සේගේ බුදුබව ගැන විමසන්නේ හැසිරේ. හේ බුද්ධ වීමංසන මාණව නමින් ප්‍රකටවිය. යම්යම්

තැනෙක බුදුවරු වසත්ද එතැන කෘත්‍ය පහක් කරනලද්දේ වෙයි. ඒවා යට පෙන්වා දෙනලදී පසු බත් කල්හි අලංකාරකරනලද ධර්මාසනයෙහි හිඳ ඇත්දතින් කැටයම් කළ වටාපතගෙන මහජනයාට භාග්‍යවතුන් වහන්සේ දම්දෙසන කල්හි උත්තර මාණවකයාද නුදුරෙහි හිඳී. දහම් අසා කෙළවර ශ්‍රද්ධාවත් මනුෂ්‍යයෝ හෙට පිණිස භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට මාණවයා වෙතටද එළඹ දරුව අප විසින් භාග්‍යවතුන් වහන්සේට ඇරයුම් කරනලදී. ඔබද උන්වහන්සේ සමග පැමිණ අපගේ ගෙහි ආහාර ගන්නේ මැනවැ දෙවැනි දවසෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා ගමට පිවිසෙන සේක. උත්තර ද පියවරක් පියවරක් පාසා පා අනුවම ලුහුබඳී කුලගෙයට පිවිසුණු කල්හි දක්ෂිණෝදකය පිළිගැනීම ආදීකොට සියල්ල බලමින් සිඳී. බත්කිස කෙළවර භාග්‍යවතුන් වහන්සේ පාත්‍රය බිමතබා දූන්කල්හි මාණවයාට උදෑසන ආහාරය පිළියෙල කරති. හේ එකත් පාසෙක හිඳ අනුභව කොට නැවත අවුත් ශාස්තෘන් වහන්සේ සමීපයෙහි සිට භුක්තානුමෝදනාව අසා භාග්‍යවතුන් වහන්සේ සමගම වෙහෙරට යයි. එහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් බත්කිස නිමවා එන තෙක් ගඳකිළියෙහි ආලින්දයෙහි වැඩහිඳින සේක. භික්ෂූන් බත්කිස නිමවා පා සිවුරු නමාතබා පැමිණ වැඳ කල්දූන්වූ කල උන්වහන්සේ ගඳකිළියට පිවිසෙන සේක. මාණවයාද ඒ සමගම යයි. භාග්‍යවතුන් වහන්සේ පිරිවරා පැමිණි භික්ෂුසංඝයාට ගඳකිළිය ඉදිරිපිට සිට ඔවදන් දී පිටත්කොට යළි ගඳකිළියට පිවිසෙන සේක. මාණවයාද පිවිසෙයි. භාග්‍යවතුන් වහන්සේ කුඩා ඇඳක සුළුවේලාවක් හිඳින සේක. මානවයාද නුදුරෙහි බලමින් හිඳී භාග්‍යවතුන් වහන්සේ මොහොතක් හිඳ හිස සෙලවීමක් පෙන්වන සේක. භවත් ගෞතමයන්ගේ විවේක වේලාව වන්නේයැයි මාණවයා ගඳකිළිදෙර වසාගෙන නික්මගොස් එකත් පසක හිඳී. මිනිස්සු පෙරබත දන් දී උදෑසන අහර ගෙන පෙහෙවස් අංග සමාදන්ව පිරිසිදු උතුරු සළුඇතිව මල්දම් සුවඳගත් අත් ඇත්තාහු දහම් කථා අසන්නෙමුයි වෙහෙරට පැමිණෙති. සක්විති රජකුගේ කඳවුරු බැඳිතැනක් මෙන් වෙයි. භාග්‍යවතුන් වහන්සේ මොහොතක් සිංහසෙය්‍යාව කොට නැගිට පූර්වාධ්‍යාශයෙන් පිරිසිඳ සමවතට සමවදින සේක. සමවතින් නැගිට මහජනයා පැමිණි බව දැන ගඳකිළියෙන් නික්ම මහජනයා පිරිවරා ආලින්දයට ගොස් පනවනලද උතුම් බුදු අසුනට පැමිණි සේක් පිරිසට දහම් දෙසන සේක. මාණවයාද නුදුරෙහි

හිඳ ශ්‍රමණ ගෞතම තෙමේ පිරිස ගෘහාශ්‍රිත වශයෙන් උනන්දු කරමින් ධර්මය දෙසයිද නැතහොත් උනන්දුව නැති කරමින් ධර්මය දෙසයිදැයි අකුරක් අකුරක් පාසා පදයක් පදයක් පාසා අල්ලාගනී. භාග්‍යවතුන් වහන්සේ එබඳු කථාවක් නොකියා කල්දූන දේශනාව නවත්වනසේක. මාණවයා මේ ආකාරයෙන් අල්ලාගන්නේ සත්මසක් එක්ව හැසිර භාග්‍යවතුන් වහන්සේගේ කායද්වාර ආදීන්හි අණු මාත්‍රවූද වරදක් නොදක්කේය. බුදුවූ කෙනකුගේ වරදක් මනුෂ්‍ය වූ මාණවයකු නොදක්නේ නම් එය නොවේ. බෝධිසත්වූ උන්වහන්සේගේ සවසක් පධන් බිමෙහි අමනුෂ්‍ය වූ මාරදිව්‍ය පුත්‍රයා ගෘහාශ්‍රිත විතර්ක මාත්‍රයක්වත් නොදක බුදුවූ පසුත් වසරක් ලුහුබැඳ කිසිවක් නොදක්නේ,

**සත්ත වස්සානි භගවන්තං - අනුබන්ධිං පදාපදං**
**ඔකාරං නා ධිගච්ඡිස්සං - සම්බුද්ධස්ස සතිමතො.**

සත්වසක් බුදුන් පසුපස
පියෙන් පිය ලුහුබැඳ ගියෙමි
වරදක් සොයාගත නුහුනුයැ
සිතීමත් සම්බුදුන්ගේ

ආදී ගාථා කියා නික්ම ගියේය. ඉක්බිතිව මාණවයා මෙසේ සිතීය. මම සත්මසක් භවත් ගෞතමයන් ලුහුබඳිමින් කිසිදු වරදක් නොදකිමි. ඉදින් මම තවත් සත්මසක් හෝ සත්වසක් වස්සියයක් වස්දහසක් හෝ ලුහුබැන්දත් ඔහුගේ වරදක් නොදක්නෙමි. මාගේ ගුරුවරයා මහලුය. යෝගක්ෂේමය දැනගන්ට නොහැකිය. ශ්‍රමණ ගෞතමයන්ගේ බුදුබව ඔහුගේ ස්වභාව ගුණයෙන් ලද බව ගුරුවරයාට දන්වන්නෙමියි භාග්‍යවතුන් වහන්සේ විමසා භික්ෂු සංඝයා වැඳ නික්මගියේය. ගුරුවරයාගේ සමීපයටද ගොස්, දරුව උත්තර, ශ්‍රමණ ගෞතමයන් පිළිබඳ ශබ්දය පවත්නා තත්වය නිසාම පැනනැගුණක් දැයි අසන ලද්දේ ගුරුතුමනි කුමක් කියන්නෙහිද. සක්වල අතිශයින් සම්බාධ සහිතය. භවාග්‍රය අතිශයින් නීචය. ඒ භවත් ගෞතමයන්ගේ ගුණ සමූහය අහසමෙන් කෙළවරක් නැත. ඒ ගුණකඳ තිබෙන දෙයක්මයැයි කියා දුටුපරිදි දෙතිස්මහා පුරින් ලකුණු පිළිවෙළින් කියා කාර්ය සමාචාරය ඉල්ලාසිටියේය. එහෙයින් කියනලදී.

අථඛො උත්තරො මාණවො - පෙ - එදිසොච සො භවං ගොතමො තතොච හීයෙසා එහි සුප්පතිට්ඨිතපාදෙ අන්‍යයන් බිම පා තබන විට ඇඟිලි අගහෝ විළුඹ පැත්ත පළමුව බිම ස්පර්ශ කරයි, පතුලෙහි මැද සිදුරක් වෙයි. පා ඔසවන විට ද ඇඟිලි අග එක්කොටසක් පළමුව එසවෙයි. උන්වහන්සේගේ එසේනැත. උන්වහන්සේගේ රන් මිරිවැඩි පතුලක්මෙන් එක්පහරින්ම මුළු පාතලයම බිම ස්පර්ශකරයි. බිමින් එසවෙයි ඒනිසා ඒ භවත් ගෞතමයන් සුප්පතිට්ඨිතපාද බැවින් යම්සෙයකින් භාග්‍යවතුන් වහන්සේ සියගණන් පුරුෂයන් සිටින නිරය ඇක්මවම්යි පාදය ඉවතට ගන්නා සේක්නම් එකෙණෙහි නැමුණුතැන් වාතයෙන් පිරුණු කුඹුරුහම මෙන් උඩටනැමී පොළොවට සමවෙයි. උස්තැන්ද ඇතුළට පිවිසෙයි. දුර ඇක්මන්නෙම්යි ඔසවනවිට මහමෙර තරම් පර්වතය තැම්බූ වේවැල් අංකුරයක් මෙන් නැමී පා ළඟට පැමිණේ. ඒ අයුරින්ම යමක ප්‍රාතිහාර්යය කොට යුගන්ධර පර්වතය ඇක්මම්යි පා ඔසවන කල්හි පර්වතය නැමී පා ළඟට පැමිණියේය. උන්වහන්සේ එය පාගා දෙවැනි පාදයෙන් තව්තිසා භවනය ආක්‍රමණය කළසේක. චක්‍ර ලක්ෂණයෙන් පිහිටිය යුතු තැන විෂම වන්නට නොහැකිය. කණුවක් හෝ කටුවක් හෝ ගල්කැටයක් හෝ මලමූත්‍ර හෝ කෙළ සොටු ආදිය හෝ ඊට වැඩිදෙයක්හෝ පැමිණේද ඒ සියල්ල එහි එහිදීම පොළොවට පිවිසෙයි - තථාගතයන් වහන්සේගේ සිල් තෙදින්, පැණ තෙදින් දම්තෙදින් දසපෙරුම් දම් අනුහසින් සම වී මෘදුවී මල්විසුරුවාක් මෙන් වෙයි. එහිදී භාග්‍යවතුන් වහන්සේ සමපාදයම තබන සේක. සමපාදයම ඔසවන සේක. නොනැමුණු පාදතලයන් ගෙන් බිම ස්පර්ශ කරන සේක. චක්කානි පාදෙකෙහි චක්‍ර දෙකක් ඇත. එහි අර ද නිම්වළල්ලද නැබද පෙළෙහි කියන ලද්දේමය. සබ්බාකාරපරිපූරානි මෙයින් මෙය විශේෂයෙකැයි දතයුතුය. ඒ චක්‍ර පාතලය මැද දක්නට නොලැබේ. නාභිය පිරිසිඳින ලද වටරේඛාවක් තිබේ. නාභිමුඛය වට කොට ඇති වටයක් පෙනේ. බවයෙහි මුව පෙනේ. අර පෙනේ. අරයන්හි වටරේඛා පෙනේ. නිම්වළල්ලක් පෙනේ. නිම්වළල්ලෙ මණියක් පෙනේ. මෙය පාළියෙහි පැමිණියේ වෙයි. සම්බහුලවාරය නොපැමිණියේය. ඔහු මෙසේ දතයුතුය. ස්වස්ති, සිරිවසය, නන්දිය, ස්වස්තිකය, වටංසකය, වද්ධමානකය මත්ස්‍ය යුගලය, භද්දපීඨය, පාසාද, තොරණ, සේතඡත්ත, ඛඩ්ගය, තල්වැටය මොණර පිල් වල්විදුනාව, උණ්හීසපට්ටය සුමනමල්දම, නීලුප්පලය

රත්තුප්පලං, රත්නෙළුමය, සුදුනෙළුමය, පූර්ණඝටය පිරුණු පාතිය, සමුද්‍රය, චක්‍රවාටය, හිමාලය, මහමේරුව චන්ද්‍ර සූර්යයෝ නැකැත්තරු, සිව්මහදිව්, දෙදහසක් කොදෙව් අවසන් වශයෙන් චක්‍රවර්ති රජුගේ පිරිස සඳහා සියලු චක්‍රලක්ෂණ පිරිවරවෙයි. ආයතපණ්හී දික්විළුඹ, පිරිපුන්විළුඹ යන අර්ථයි. යම්සේ අන්අයගේ පාද අග දික්වේද, විළුඹ මත ගොප්මස පිහිටාද, විළුඹ තලා තැබුවාක් මෙන්වෙයි. තථාගතයන් වයහන්සේගේ එසේ නොවේ. තථාගතයන් වහන්සේගේ විළුඹ කොටස් සතරින් දෙකක් පා අගවෙයි. තුන්වැනි කොටසෙහි ඇටය පිහිටාද සිව්වැනි කොටසෙහි අර අගින්වටවී තැබුවාක් මෙන් රත්කම්බිලියෙන් සැදූ පන්දුවක් මෙන් වූ විළුඹ ඇත්තේය. දීඝඞගුලී අන් අයගේ ඇතැම් ඇඟිල්ලක් දික්වෙයි. ඇතැම් එකක් කෙටිවෙයි. තථාගතයන් වහන්සේගේ එසේ නොවේ. තථාගතයන් වහන්සේ වනාහි වඳුරකුගේ මෙන් දික්වූ අත්පා ඇඟිලි ඇත්තේය. මුලින් මහත්ය. අනු පිළිවෙළින් ගොස් අග සිහින්ය. දුම්මලතෙලින් මැද වටකොට සැදූ සුදු තල් වැටක් බඳු වෙයි. ඒනිසා දීඝඞගුලීයයි කියන ලදී. මුදු තලුන හත්‍ථ පාදො ගිතෙල් මණ්ඩියෙහි බහා තැබූ සියවරක් පෙලූ පුළුන් රොද්දක් මෙන් මෘදුවූ උපන් හැටියේ දරුවකුගේ මෙන් සැමකල්හි උන්වහන්සේට තරුණ අත්පා ඇත්තේනුයි මුදුතලුන හත්‍ථපාද නම් වෙති. ජාලහත්‍ථපාදෙ සමින් වැසුණු ඇඟිලි අතර නැත. එබඳු පුද්ගලයා නයිපෙණ බඳු අත්ඇති වන පුරුෂ දෝෂයට පැමිණියේ පැවිද්දද නොලබයි. තථාගතයන් වහන්සේගේ අත් ඇඟිලි සතර පා ඇඟිලි පස එක් පමණ වෙයි ඒවා එක්පමණ වූ හෙයින්ම ලක්ෂණ එකිනෙකට විනිවිද සිටී. උන්වහන්සේගේ අත්පා දක්ෂ වඩුවකු විසින් යොදන ලද දැල් වාකවුළුවක් මෙන් වෙයි. ඒනිසා ජාලහත්‍ථපාදයයි කියන ලදී. උඩින් පිහිටි ගොප් ඇටය ඇතිබැවින් උන්වහන්සේට උස්සඞ්ක පාද ඇතිබැවින් උස්සඞ්ඛපාදනම්වෙති. (ගොප් ඇටය උඩින් පිහිටි) අන් අයගේ පාදයෙහි පිටිපස ගොප් ඇට ඇත ඒනිසා ඔවුන්ගේ පාදයෝ ඇණහිසක් මෙන් තදය. සුදුසුපරිදි පෙරළීමට නොයත් ගමන් කරන්න වුන්ගේ පතුල් නොපෙනේ. තථාගතයන් වහන්සේගේ නැගී උඩින් ගොප් ඇට පිහිටයි. ඒනිසා උන්වහන්සේගේ නාභියෙහි පටන් උඩුකය නැවක තැබූ රන් ප්‍රතිමාවක් මෙන් නිශ්චලය. යටිකය කැමතිනම් පහසුවෙන් පා පෙරළයි. ඉදිරියෙන්ද පසුපසින්ද යන දෙපස සිට බලන්නවුන්ට පතුල් පෙනෙයි. ඇතුන්ගේ මෙන් පසුපසින් පමසණක් නොවේ. එණිජඞඝා ඒ ණිමුවකුගේ මෙන්වූ දගයුග මස් උස්වී පිරිපුන් දඟ, එකට බැඳුණු මස්පිඬු

සහිතවූවක් නොවේ. හාත්පසින් සමව පිහිටි මාංශයෙන් වටවූ මනාවූ සමකින් වැසුණු ගොයම්බොඩ හා සමාන දඟයුගකින් යුතුය යන අර්ථයි. **අනොණමනො** නොනැමෙන මෙයින් උන්වහන්සේගේ කුදුනොවූ මිටිනොවූ බව දක්වන ලද්දේය. අවශේෂජනයා කුදුහෝ වෙති. මිටිහෝ වෙති. කුදුවූවන්ගේ උඩුකය අසම්පූර්ණය. වාමනයන්ගේ යටිකය අසම්පූර්ණය ඔවුහු අසම්පූර්ණ ශරීර ඇතිබැවින් නොනැමී දණපිරිමැදීමට නොහැක් වෙත්. තථාගතයන් වහන්සේ පිරිපුන් උඩුකය හා යටිකය ඇතිබැවින් හැකිවෙති. ගොනුන්ගේ ඇතුන්ගේ මෙන් රන් පියුම් කෙමියක්හා සමාන කෝෂයෙහි බැහී වැසුණු අංගජාතයක් ඔහුට ඇත්තේනුයි **කොසොහිතවත්‍ථ ගුය්‍හනම්.** වත්‍ථගුය්‍හං යනු වස්ත්‍රයෙන් වැසියයුතු අංගජාතය කියනු ලැබේ. **සුවණ්ණ වණ්ණො** දූහිගුලෙන් මැද දිව්දළයෙන් ගටා ගෛරුක පරිකර්ම කොට තැබූ දඹරන් රුවක් හා සමානය යන අර්ථයි. මෙයින් උන්වහන්සේගේ ඝන සිනිඳු මෘදු ශරීර ඇතිබව දක්වා සමේ වර්ණය දැක්වීම පිණිස **කඤ්චන සන්නිභත්තචො** යැයි කියන ලදී. පළමුවැන්නටම වෙනත් වචනයකි. **රජොජල්ලං** රජස්හෝ මලහෝ **නැඋපලිම්පති** නොලගී. නෙළුම් කොළයෙහි දියබිඳු මෙන් පෙරළේ. අත් දෙවීම් පාදෙවීම් ආදිය ඍතුගැන්වීම පිණිසද දායකයන්ගේ පින්පල පිණිසද බුදුවරු මෙසේ කරත්. වත් පැවැත්වීම සඳහාද කෙරෙත් මය. සෙනසුනට පිවිසෙන භික්ෂුව විසින් පාදෙවා පිවිසිය යුතුය යන්න වතකි. **උද්ධග්ග ලොමො** රැලි ගැසීම කෙළවර අග්උස්වී මුව සොබාව බලන්නාක් මෙන් සිටි ලොම් මුන්වහන්සේටනුයි උද්ධග්ග ලොම නම් **බ්‍රහ්මුජ්ජුගත්තො** බ්‍රහ්මයා මෙන් ඍජු සිරුරක් ඇති ඍජුව නැගී සිටිනා දිගු සිරුරු ඇත්තේ. බොහෝ සෙයින් සත්වයෝ කඳින් උකුලින් දණහිසින් යන තුන් තැනින් නැමෙත් උකුලින් නැමෙන්නෝ පසුපසින් නැමෙති. අතින් දෙතන්හි ඉදිරියෙන් දිගු සිරුරු ඇත්තෝ සමහරු පසෙකින් ඇදවුවෝ වෙති. සමහරු මුහුණ උඩට ඔසවා නැකැත්තරු ගණන්කරන්නාක් මෙන් හැසිරෙත්. ඇතැම් අඩුමස්ලේ ඇත්තෝ හුලක් මෙන් වෙති. වෙව්ලමින් යති. තථාගතයන් වහන්සේ ඍජුවම උඩටනැගී දිග පමණට දෙව්නුවර නැගූ රන් තොරණක් මෙන් වෙති. **සත්තුස්සදො** අත්වල පිටිඅලු දෙක, පාවල උඩු පලුදෙක ඇස්වට දෙක කඳ යන මේ සත්තැන පිරිපුන් මස් උස්වී ඇත්තේ මොහුටනුයි සත්තුස්සද නම්. අන්‍යයන්ගේ අත්පා පිටි අලුවල තහරදැල දක්නට හැකිය. ඇස්වට කඳ

යන තන්හි ඇට කෙළගණන් ඇත. ඔවුහු මිනිස් ප්‍රේතයන් මෙන් වැටහෙත්. තථාගතයන් වහන්සේ එසේ නොවෙත් තථාගතයන් වහන්සේ සත්තැනක පිරිපුන් මාංශ උස්සද ඇතිබැවින් සැඟවුණු නහරදැලින් අත්වල පිටිඅලු ආදියෙන් වටකොට තැබූ රන්රුවක් හා සමානව කදින් යුතු සෙල්රුවක් මෙන්ද සිතුවම්කළ රුවක් මෙන්ද වැටහේ සිංහයකුගේ පූර්වාර්ධය බඳු කය මොහුට නුයි සීහපුබ්බද්ධ කායො නම් සිංහයාගේ පෙරකයම පිරිපුන්වෙයි. පසුකය අසම්පූර්ණය තථාගතයන් වහන්සේගේ සිංහයකුගේ පූර්වකාය මෙන් මුළුසිරුර පරිපූන්ය. එයද සිංහයකුගේ මෙන්ය. ඒ ඒ තැන ගිලීගිය උඩටනැගුණු ආදිවශයෙන් මනාව නො පිහිටියේ ඇදට පිහිටියේ දික්වියයුතු තැන දිගද, කෙටි මහත් අනුවට වියයුතු තන්හි එපරිදිම වේ. මෙසේ මෙය කියන ලදී. මහණෙනි. කර්ම විපාක එළඹ සිටිකල්හි ඒවා මනාපය. යම් අංගයන් ගෙන් දිගට හොබීද ඒ අංග දිගට පිහිටයි. යම් අංගයන්ගෙන් කොටට හොබිද ඒ අංග කොටට පිහිටයි. යම් අංගයන්ගෙන් මහතට හොබිද ඒ අංග මහතට පිහිටයි. යම් අංගයන්ගෙන් කෘෂවුවිට හොබීද ඒ අංග කෘෂව පිහිටයි. යම් අංගයන්ගෙන් වටව හොබීද ඒ අංග වටව පිහිටයි. මෙසේ නොයෙක් චිත්‍රයෙන් පුණ්‍ය විචිත්‍රත්වයෙන් විසිතුරු කරන ලද දස පාරමීන්ගෙන් තථාගතයන් වහන්සේ ගේ ආත්ම භාවය සැදුණේය. උන්වහන්සේගේ ප්‍රකෘති රූපය කරන්ට ලෝකයෙහි සියලු ශිල්පීහුද සෘද්ධි ඇත්තෝද නොසමත් වෙති. **චිතනතරංසො** අතරංස යනු උදරය හා යටිබඩ අතර පිරිපුන් වූයේ යමකුගේ ද හේ චිතන්තරංසනම් අන්‍යයන්ගේ ඒ ස්ථානය වළගැසී ඇත. පිට කොටස් දෙක වෙන වෙනම පෙනේ. තථාගතයන් වහන්සේගේ උකුලෙහි පටන් මංශපටලය බඳතෙක් උස්වී ඔසවාලු රන් එලකයන් මෙන් පිටවසා පිහිටියේය. **නිග්‍රොධපරිමණ්ඩලො** නුගගසක් මෙන් විහිදිගියේය. යම්සේ අතුපනසක් ඇති බැවින් හෝ අතු සියයක් ඇති බැවින් හෝ සම කඳ සාකා ඇති නුගරුක දිගින්ද පළලින්ද එක් පමණවෙයි. මෙසේ කයින්ද බඹයෙන්ද මෙසේ විෂමප්‍රමාණ නොවේ යන අර්ථයි. **යාවතකවසස කායො** ආදිය කියන ලදී. යාවතබො අසස යාවතසව සසකායො නම්වෙයි. **සම වතතකඛනෙධා** සමව වටවූ බඳ, යම්සේ සමහරු කොස්වාලිහිණියන් මෙන්ද කොකුන් මෙන්ද දිගුගෙල ඇත්තෝ, වක්ගෙල ඇත්තෝ, පුළුල් ගෙල ඇත්තෝ මෙන්ද, කථාකරන කල ශිරාජාලය පෙනේ. ස්වරය හෙමින් නික්මෙයි. තථාගතයන් වහන්සේගේ එසේ නොවේ.

තථාගතයන් වහන්සේගේ සුවට රන් රුවක් හා සමාන බඳ වෙයි. කථාකරන කල ශිරාජාලය නොපෙනේ. මේඝගර්ජනාවක් මෙන් ස්වරය විශාලවෙයි. **රසග්ගසග්ගී** මෙහි රසංගසනති යනු රස අනුභවකරන රසනහරයන්ට මේ සමවචනයකි. ඒ අග් මොහුගේනුයි රසග්ගසග්ගී නම් තථාගතයන් වහන්සේගේ සියගණන් රස නහර උඩට නැමුණු අග් ඇතිව ගෙලෙහිම බැඳී තල ඇටයක් තරම් අහරක් දිවග තබන ලද්දේ කයපුරා දිවෙයි. ඒ නිසාම මහාප්‍රධාන වීර්යය කරන උන්වහන්සේගේ එක්සහල් ඇටයකින් වුවද කාලාය යූෂ බිඳුවකින් වුවද කයෙහි යැපුම විය. අන්‍යයන්ගේ එසේ නොවන බැවින් මුළුකය පුරා ඕජාව නොපැතිරේ. එයින් ඔවුනට බොහෝ ආබාධ ඇතිවෙයි. බුදුහුගේ මේ ලක්ෂණය අල්ප ආබාධතා සංඛ්‍යාත නිසසන්දඵලයෙහි වශයෙන් ප්‍රකට වෙයි. සිංහයකුගේ වැනි හනු ඔහුගේ නුයි **සීහහනු** එහි සිංහයාගේ යටහනුවම පිරිපුන්වෙයි. උඩහනුව නොවේ. තථාගතයන් වහන්සේගේ සිංහයාගේ යටහනුව මෙන් හනු දෙකම පිරිපුන්ය පක්ෂයෙහි දෙළොස්වක දිනයෙහි චන්ද්‍රයා මෙන් වෙයි. **චත්තාරීසදනෙතා** ආදීතන්හි උඩහනුවෙහි පිහිටි විස්සද යටහනුවෙහි විස්සදැයි දත් සතළිසක් ඔහුගේ නුයි චතතාරීසදන්ත නම්. පිරිපුන් දත්ඇති අන්‍යයන්ට දත් තිස් දෙකක් වෙයි. තථාගතයන් වහන්සේගේ සතළිසකි. අන්‍යන්ගේ සමහර දත් උසය සමහරදත් මිටියැයි විසම වෙයි. තථාගතයන් වහන්සේගේ යකඩ පත්‍රයකින් කැපූ හක් ගෙඩියක් මෙන් සමය අන්‍යන්ගේ කිඹුලන්ගේ මෙන් දත් විරලය. මස් මාංශ කන්නවුන්ගේ දත් අතර පිරෙයි. තථාගතයන් වහන්සේගේ රන්ලියකින් ඔසවනලද වජ්‍රපෙළක් මෙන් විවර රහිතව තෙලිතුඩින් දක්වන ලද පිරිසිදීම් මෙන් දත් ඇත. අන්‍යයන්ගේ කුණුවීගිය දත් ඇතිවෙයි. එයින් ඇතැම් දළදත්ද විවර්ණ වෙයි. තථාගතයන් වහන්සේ මනා සුදුදත් ඇත්තාහු ඕසධී තාරකාවද ඉක්මවා බබළන ප්‍රභාවෙන් යුත් දථා ඇත්තේ, එහෙයින් කියන ලදී. **සුසුක්කදාඨොයි.** **පහුත ජිවෙහා** අන්‍යයන්ගේ දිව මහතද වෙයි. කෘෂද කෙටිද වෙයි. තදදවෙයි විසමවෙයි. තථාගතයන් වහන්සේගේ දිව මෘදුය දිගය පුළුල්ය වර්ණවත්ය උන්වහන්සේ ඒලක්ෂණ පරීක්ෂාකිරීමට පැමිණියවුන්ගේ සැකදුරුකිරීම සඳහා මෘදුබැවින් ඒ දිව තද ඉදිකටුවක් මෙන් වටකොට දෙනාසාපුට පිරිමදිති. දිග බැවින් දෙකන් සිදුරු පිරිමදිති. පුළුල් බැවින් කේශාන්ත කෙළවරකොට ඇති නළල වසති. මෙසේ එහි මෘදුදික් පුළුල් බව

ප්‍රකාශකරන්නේ සැක දුරුවෙයි. මෙසේ ලක්ෂණ තුනකින් යුතු දිව සඳහා පහූතජිව්හා යි කියන ලදි. බ්‍රහමස්සරො අන් අය කැඩුණු ස්වර ඇත්තෝය. බිඳුණු ස්වර ඇත්තෝය. කාකස්වර ඇත්තෝය. තථාගතයන් වහන්සේ මහා බ්‍රහ්මයාගේ ස්වරය පිත් සෙම්වලින් පලිබෝධ නොවූ බැවින් විශුද්ධය. තථාගතයන් වහන්සේ විසින් කරන ලද කර්ම ඇති උන්වහන්සේගේ හෘදයවස්තුව පිරිසිදු කරනු ලැබේ. හෘදය වස්තුවෙහි නාභියෙහි පටන් හටගන්නා ස්වරය විශුද්ධය. අෂ්ටාංග සහිතවම පැනනගී. කෝකිලයකු මෙන් කථාකරතියි කුරවිකභාණී. මත් කෝකිලයකු විසින් නගන ලද මිහිරි හඬ යන අර්ථයි. මෙහි කුරවීක හඬෙහි. මිහිරිබව කියයි. කුරුවි කුරුල්ලන් මිහිරිරස අඹ පලය මුවතුඩින් පහරා වැහෙන රසය රසබලා පියාපතින් තාල අල්ලා හඬනගන කල්හි සිව්පා ආදීහු මත්වූවන් මෙන් සතුටු වන්ට පටන්ගනිති. ගොදුරු සෙවීමෙහි නිරත වූවෝද සිව්පාවෝ මුවට ගත් තණ ඉවතලා ඒ ශබ්දය අසති. ව්‍යාලමෘගයෝ කුඩා සතුන් ලුහුබැඳ දුවන්නාහු එසවූ පය නැවත නොඔසවා ම සිටිත්. ලුහුබඳිනු ලැබූ සත්තුද මරණභය අත්හැර සිටිත්. අහසේ පියාඹන පක්ෂීහු අත්තටු විදහාගෙන සිටිත්. දියෙහි මස්සු වරල් නො සොල්වා ඒ ශබ්දය අසමින් සිටිත්. කුරවි කොවුල්ලෝ මෙසේ මිහිරි හඬ නගන්නෝය. ධර්මාශෝකගේ දේවි අසාන්ධිමිත්තා, ස්වාමීනි බුද්ධශබ්දය හා සමාන කිසියම් ශබ්දයක් ඇත්තේදැයි සංඝයාගෙන් ඇසුවාය. කුරවි පක්ෂියාට ඇත. ස්වාමීනි ඒ පක්ෂීහු කොහි සිටිත්ද? හිමාලයෙහි සිටිත් ඈ රජුට කීවාය. දේවයන් වහන්ස කුරවි පක්ෂියා දකිනු කැමැත්තෙමි. රජතෙමේ මේ කූඩුවෙහි හිඳ කුරවීකයා පැමිණේවායි රන්කූඩුව යැවීය. කූඩුව ගොස් එක් කුරුවීකයකු ඉදිරිපිට සිටියේය. ඌ රජඅණින් ආ කූඩුවයි නොගොස් නොහැකියයි එහි හුන්නේය. කූඩුව පැමිණ රජු ඉදිරියෙහිම සිටියේය. කුරවීකයා ලවා ශබ්ද කරවීමට නොහැක්කෝය. දරුවෙනි මොවුන් ශබ්දකරන්නේ කෙසේ දැයි ඇසීය. දේවයන් වහන්ස නෑයින් දැක යැයි කීහ. ඉක්බිති රජ ආදස තලයන්ගෙන් වට කරවීය. කුරුල්ලා තමාගේම ඡායාව දැක මාගේ නෑයෝ ආවෝයැයි හඟිමින් පියාපතින් තාල අල්ලා මිහිරිසරින් මැණික් වස් දඬුවක් පිඹින්නාක් මෙන් නාද කළේය. මුළු නුවර මනුෂ්‍යයෝ මත්වූවාහු මෙන් නැළවුණාහ. අසන්ධි මිත්‍රා මෙසේ සිතුවාය. මේ තිරිසනාගේ ශබ්දය මෙතරම් මධුරය. සර්වඥතාඥානශ්‍රීයට පැමිණි භාග්‍යවතුන් වහන්සේගේ ශබ්දය කෙබඳු

වන්නට ඇත්දැයි ප්‍රීතිය උපදවා ඒ ප්‍රීතිය අත් නොහැර සත්සියයක් සමග සෝවාන් පෙළෙහි පිහිටියාය. කුරවීක නාදය මෙතරම් මධුරයි. ඉන් සියගුණයක් දහස් ගුණයක් තථාගතයන් වහන්සේගේ හඬ මිහිරිය. ලෝකයෙහි කුරවීකයාට හැර අනිකකුට මධුරතර ශබ්දයක් නැති බැවින් තථාගතයන් වහන්සේට කුරවීක භාණීයයි කියන ලදී. අභිනීලනෙත්තො මුළු අහසම නිල් නොවේ. නිල තිබිය යුතු තැන දියබෙරලිය මලක් බඳු අතිපවිත්‍ර නීලවර්ණයෙන් යුත් ඇස් ඇත. කහ විය යුතු තැන කිණිහිරි මල බඳු කහ පැහැයෙන්, රත්පැහැ තිබිය. යුතු තැන බඳුවද මලක්බඳු රත්පැහැයෙන්, සුදුපැහැ තිබිය යුතු තැන ඕසධීතාරකාව බඳු සුදු පැහැයෙන්, කලුපැහැ තිබිය යුතුතැන කලු තිඹිරිගෙඩියක් බඳු කලු පැහැයෙන්ද යුත් රන්විමනෙහි තැබූ මැණික් කුඩුවක් සේ වැටහේ. ගොපඛුමො මෙහි පඛුම යනුවෙන් මුළු ඇස් ගඩුවම අදහස් කරන ලදි. එය කලු වස්සකුගේ මෙන් ස්වභාව ඇත. රතුවස්සාගේ මෙය අතිප්‍රසන්නය. ඒ මොහොතෙහි උපන් රතුවස්සකුගේ ඇස්ගඩුවය යන අර්ථයි. අන්‍යයන්ගේ ඇස්ගඩු අසම්පූර්ණය. ඇතුන්ගේ මීයන් ආදීන්ගේ ඇස්වලට සමාන වීමට නෙරාගියාවූද ගිලී ගියාවූද ඇස්වලින් යුතුවෙයි. තථාගතයන් වහන්සේ ගේ ඇස් සෝද මැද තැබූ මැණික් බෝලමෙන් මෘදු සිනිඳු නිල් සියුම් ඇස්පිහාටුවෙන් සටහන් කළ ඇස්ය. උණ්ණා ඌර්ණ රෝමයයි. හමුකන්තරෙ ඇස්බැම දෙක මැද නාසය මුහුනෙහි ජාතා උඩටනැගි නළලමැද උපන් ඔදතා පිරිසිදු ඕසධී තාරකාවෙහි වර්ණයෙන් මුදු වෙඩරුසෙහි බහා තැබූ සියවර පොලාලූ කපු පුළුන් පටලයක් බඳු තූලසනනිභා ඉඹුල්පුළුන් තූලක් ලියතුලක් හා සමාන මෙය සුදුබවට උපමායැ එය කෙළවරින් අල්ලා අදින විට අතින් අඩක් පමණවෙයි. විසිකළ විට දක්ෂිණාවර්ත වශයෙන් පෙරලී අක් උඩ බලා සිටියි. රන්ඵලකයක්මැද තැබූ රිදී බුබුළක්මෙන් රන් කළයෙකින් නික්මෙන කිරිදහරාමෙන් අරුණ ප්‍රභා රශ්මි සහිත ගුවන් තලයෙහි ඕසධී තාරකාව මෙන් ද අතිමනෝහර ශ්‍රීයකින් බබලයි. උණ්හීස සීසො මෙය පිරිපුන් නළල්තලයක් හා පිරිහුන් හිසක් ඇති බැවින් මේ දෙ අරුත නිසා කියන ලදී. තථාගතයන් වහන්සේගේ දකුණු කන් සිළුවෙහි පටන් මාංශ පටලයක් නැගී මුළු නළලම වසමින් පුරවාගෙන ගොස් වම්කන් සිළුවට වැටී තිබේ. රජකුට බැඳි නළල්පටක් මෙන් බබලයි. පශ්චිම භවික බෝධිසත්වයන්ගේ මේ ලක්ෂණය දැක රජුන්ට නළල්පට තැනූහ. ඒ එක් අර්ථයක් පමණි.

අන්‍යජනයෝ නොපිරිපුන් හිස් ඇත්තෝ වෙති. ඇතැම්හු සැරසු හිස් ඇත්තෝය තථාගතයන් වහන්සේගේ වනාහි අර අගින් වට කොට තැබුවාක් වැනි සර්වසම්පූර්ණ වූ දිය බුබුළක් වැනි හිසක් වෙයි. එහි පෙර ක්‍රමයෙන් නළල් පටින් වෙළූ හිසක් මෙනැයි උණ්හීස සීසනම් දෙවැනි ක්‍රමයට, නළල්පටක් මෙන් සියලුතැන වටවූ හිස් ඇත්තේ උණ්හීස සීසො නම්, මේ මහා පුරුෂ ලක්ෂණ කර්මය, කර්ම සරිකව ලක්ෂණ, ලක්ඛණානි සංස යන සිව් කොටසෙහි එක් එක් කොටසෙහි ලක්ෂණ දක්වා කියන ලදි. මැනවින් කියන ලද්දේ වෙයි. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ විසින් ලක්ඛණසුත්‍රයෙහි කියන ලද මේ කම්ම ආදිය දක්වා කිවයුතුය. සුත්‍රවශයෙන් විනිශ්චය කිරීමට නොහැකි වන්නකු විසින් සුමංගල විලාසිනි නම්වූ දිඝනිකාය අටඨකථා වෙහි එම සුත්‍රයට කරන ලද වර්ණනාවෙහි කියු ක්‍රමයෙන්ම ගතයුතුය. **ඉමෙහි බොසො භවං ගොතමො** පින්වත් ආචාරිනි, මේ දෙතිස් මහ පුරිස් ලකුණින් ඒ භවත් ගෞතමයෝ යුක්තවූවෝය. දෙව්නුවර නැංවු රුවනින් විසිතුරු රන් තොරණක් මෙන් යොදුන් සියයක් උස එක්පෙළට මල් පිපුණු පරසතු රුකක්මෙන් පර්වත අතරෙහි සුපුෂ්පිත සල්රුකක් මෙන් තරු ගණයෙන් සැදුම්ලත් ගුවන් තලය මෙන් තමාගේ ශ්‍රී සම්පත්තියෙන් ලෝකය ආලෝක කෙරෙමින් මෙන් හැසිරෙති යන මේ අර්ථය දක්වා කාර්ය ආචාරය අසන්ට **ගවෙජනෙතා** බොපන ආදිය කීය. **දක්ඛිණෙන** බුදුවරුන් සිට හෝ හිඳහෝ වැදහෙව හෝ ගමනට පිටත් වනවිට දකුණු පයම පෙරටුව වෙයි. මෙම සප්ත ප්‍රාතිහාර්යන්ගෙන් එකකි. **නාතිදුරෙ පාදං උද්ධරති** ඒ දකුණු පය බොහෝ ඈතින් නො තබන්නෙමියි ඔසවති. **අතිදුරයනු** ගමන් කරනවිට දකුණු පයින් වම්පස අදිමින් යන්නේනම් දකුණු පයද දරාගන්ට නොහැකි වන්නේය. ආසන්නයේම තබන්නේය. මෙසේ ඇතිකල පද කැඩීමක් සිදුවෙයි. දකුණුපය ප්‍රමාණයටම එසවූවිට වම්පයද ප්‍රමාණයටම එසවෙයි. ප්‍රමාණයට එසවු පය තබන්නේත් ප්‍රමාණයටයි. මෙසේ මෙයින් තථාගතයන් වහන්සේගේ දකුණු පයින් කෙරෙන කාර්යය වම්පසින් නියමිත වම්පා කිස දකුණුපයින් නියමිත වන්නේයයි දතයුතුය. **නාතිසීඝං** දිවා විවේකයෙන් පසු දන්පිණිස යන්නේ භික්ෂුන් මෙන් ඉතාවේගයෙන් නොයති. **නාතිසණිකං** පස්සෙන් එන තැනැත්තා අවකාශයක් නොලබයිද එසේ ඉතා සෙමින් නොයති. **අඩ්ඩුවෙන අඩ්ඩුවං** දණින් දණ, **නසඝට්ටං** ගැඹුරුදියෙහි යන්නාක් මෙන්

කලවා නොනමයි. **නඕණාමෙති** ගසක අතුකපන අංකුස දඬුවක පාදය මෙන් පස්සට නො අදියි. **නසනනාමෙති** එබුතැනට පා කොටන්නාක් මෙන් තද නොකරයි. **නවිනාමෙති** යන්ත්‍රරූපයක් කෙළවන්නාක්මෙන් ඔබ්මොබ නොලෙලවයි **අධරකායොවා** යටිකයම සෙලවෙයි. උඩුකය නැවෙහිතැබූ රන්පිළිමයක් මෙන් නිශ්චලවෙයි. දුරසිට බලනවිට බුදුවරුන් සිටිනා බව හෝ ඇවිදිනබව නොදනිත්. **කායබලෙන** බාහු සොලව සොලවා යද්දී සිරුරින් දහදිය මිදෙන විට කාය බලයෙන් නොයයි. **සබ්බකායෙනෙව** ගෙල නොහරවා රාහුලොවාද සූත්‍රයෙහි කියන ලද නාගාවලෝකිත වශයෙන්ම අවලෝකනය කරයි. **උද්ධං** ආදීතන්හි නැකැත්තරු ගණිමින් මෙන් උඩ නොබලයි. නැතිවූ කාකණිකයක් හෝ මස්සක් හෝ සොයන්නාක්මෙන් යට නොබලයි. ඇතුන් අසුන් බලන්නාක්මෙන් එහා මෙහා වික්ෂේපයෙන් නොයයි. **යුගමත්තංයනු** වියත් නවයක් පමණ තැන ඇස් රඳවා යන්නේ යුගමාත්‍රයක් බලයි නම් භාග්‍යවතුන් වහන්සේ යුගමාත්‍රයක සිටින සේක් මනාසේ දමුණු ආජානිය අශ්වයකු මෙන් එපමණක්ම බලමින් යන සේක. ඉන් එපිට යනු යුගමාත්‍රයෙන් එපිට නොබලතියි නොකිව යුතුය. බිත්තියක් හෝ කවුළුවක් හෝ පඳුරක් හෝ වැලක් තිබේනම් එය ආවරණය කරන්ට නොහැකිද? එවිට උන්වහන්සේගේ අනාවරණ ඥාණයට නොයෙක් සක්වල දහස්ගණනක් එකයායක්ම වෙයි. **අනනරඝරං** යට මහා සකුලුදායි සූත්‍රයෙහි ඉන්ද්‍රඛීලයෙහි පටන් අන්තර්ගෘහය මෙහි ගෙහි එළිපත්තෙහි පටන් දතයුතුය. **නකායං** පියෙව් ඉරියව්වෙන්ම පිවිසෙතියි දක්වීම පිණිස කියන ලදී. දිළිඳු මිනිසුන්ගේ නුස් කුඩා ගෙවලට පිවිසෙන විට වහලය හෝ ඉස්සෙයි පොළොව හෝ පහත් වෙයි භාග්‍යවතුන් වහන්සේ ප්‍රකෘතිගමනින් වඩිති. **නාතිදූරෙ** බොහෝ ඈත ගමන් කරන්නකු විසින් පියවර එකක් දෙකක් පිටුපසින් ගොස් හිඳගතයුතු වෙයි. ඉතා ආසන්නයෙහි එන්නකු විසින් පියවර එකදෙකක් පෙරටුව ගොස් හිඳගත යුතුවෙයි. ඒනිසා යම්කිසි පියවරක සිටියකු විසින් පෙරටුව හෝ පසුව නොගොස් හිඳගත යුතුවෙයි. එහිදී හැරෙයි. **පාණිනා** කටිවායුවෙන් පොළෙන්නකුමෙන් අසුන අතින් අල්ලාගෙන නොහිඳියි. **පක්ඛපති** කිසියම් කාර්යයක් කොට ක්ලාන්ත වන අයෙක් හිටගෙනම වැටෙයි. යමෙක් පහත් අංගයක් ඇසුරුකොට හුන් තැනැත්තේ ගසාදමමින් උස් අංගයක් දක්වා යයිද උස් අංගයක් ඇසුරුකොට හුන් තැනැත්තේ එසේම පහත් අංගයක් දක්වා එයිද

හෙතෙමේ මුළු සිරුර අසුනෙහි දමයි නම් භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොකොට අසුන මැද එල්ලෙන දෙයක් සොලවන්නාක් මෙන්, පුළුන් රොදක් තබන්නාක් මෙන් සෙමින් හිඳගන්නා සේක. **හත්ථකුක්කුච්චං** පාත්‍රයෙහි මුවවිට දියබිඳු පිසදැමීම, මැස්සන් එලවන කොලකපන පලන කල්හි මෙන් අතින් අසංයත ක්‍රියා කිරීම, **පාදකුක්කුච්චං** පාදයෙන් බිමසැරීම ආදී අසංයත ක්‍රියා කිරීම. **නඡම්භති** බියනොවෙති. **න කම්පති** බිඳ නොවැටෙති. **නවේධති** නොසැලෙති. **නපරිතස්සති** භය සන්ත්‍රාසයෙන්ද සන්ත්‍රාසයට පත්නොවෙති. ඇතැම්හු ධර්මකථා ආදිය සඳහා පැමිණි මිනිසුන් වැඳහුන් කල ඔවුන් සිත් ගනිමින් ධර්මය කියන්ට හෝ ප්‍රශ්නයක් ඇසූවිට පිළිතුරුදීමට හෝ භුක්තානු මෝදනාව හෝ කරන්ට හැකිවේදෝයි. භයසන්ත්‍රාසයෙන් සන්ත්‍රාසයට පත්වෙති. ඇතමෙක් මා කැමති කැඳ එද. මා කැමති අතුරුපසක් ඒදැයි තෘෂ්ණා සන්ත්‍රාසයෙන් සන්ත්‍රාසයට පත්වෙති. ඒ දෙකම උන්වහන්සේට නැති බැවින් සන්ත්‍රාසයට පත්නොවෙති. **විවෙකාවත්තො** විවෙකයෙහි නිර්වාණයෙහි දැවටුණු මනසක් ඇතිවූ විවේක චිත්තො යනුවෙන්ද පාඨයක් ඇත. විවේකවතින් යුතුව යන අර්ථයි. විවෙක වත්ත නම් කරන ලද බත්කිස ඇති භික්ෂුවගේ දිවා විහරණයෙහි සමථ විදර්ශනා වශයෙන් මුල කර්මස්ථානයක් ගෙන පළක්බැඳ හිඳීමයි මෙසේ හුන්නහුගේ ඉරියව් ශාන්ත වේ. **න පත්තං උන්නාමෙති** ආදිතන්හි ඇතැම්හු පාත්‍රයෙහි මුවවිටින් උදරයට අනින්නාක් මෙන් පාත්‍රය උඩට හරවත්. එකෙක් පාපුටුවෙහි තබන්නාක් මෙන් මුණින්නමයි. එකෙක් තද කොට ගනී. එකෙක් එහාට මෙහාට පද්දයි. මෙසේ නොකොට දැතින් ගෙන මඳක් නැමී ජලය පිළිගනිති. යන අර්ථයි. **න සම්පරිවත්තකං** හැරී පළමුකොටම පාත්‍රයෙහි පිට නොසෝදති. **නාතිදූරෙ** හුන් අසුනින් දුරට වැටෙන්ට විසිනොකරති. **න අච්චාසනෙන** පාමුලම නොහළති. **විච්ඡඩ්ඩයමානො** විසුරුවන්නේ ප්‍රතිග්‍රාහකයා තෙමේ ද එසේ විසිනොකරති. **නාතිථොකං** ඇතැම් පාවිෂ්ටයෝ අල්පේච්ඡතාව පෙන්වන්ට මිටක් පමණම ගනිති. භාග්‍යවතුන් වහන්සේ එසේ නොවෙති. **අතිබහුං** යැපෙන පමණට අතිරේකව **බ්‍යඤ්ජන මත්තායා** ව්‍යඤ්ජනමත්ත යනු බතින් සතරෙන් එකක් ඇතැම්හු බතෙහි ආශාවට බොහෝ බත් ගනිත්. ව්‍යඤ්ජනයෙහි ආශාවට ව්‍යඤ්ජන බොහෝ ගනිත්. ශාස්තෲන් වහන්සේ එසේ නොගන්නා සේක. **නචබ්‍යඤ්ජ නෙන** නොකැමති ව්‍යඤ්ජනය හැර බත්ම අනුභව කරන්නේ.

බත්ද හැර ව්‍යඤ්ජනම කන්නේ ව්‍යඤ්ජනයෙන් බත්පිඬ වැසී සිටී නම්වේ. ශාස්තෘන් වහන්සේ එක සමානව ව්‍යඤ්ජන ගන්නාසේක. බත්ද ව්‍යඤ්ජනද එක්ව සිටී. **අවත්ථිකබ්භත්තුං** තථාගතයන් වහන්සේගේ දිවෙන් දත්වලට ගෙන එනු ලබන භෝජනය දෙතුන් වරක් දත්වලින් ස්පර්ශවූ කෙණෙහි සියුම් වී පිටි ආලේපනයක් මෙන් වෙයි. ඒනිසා මෙසේ කිහ. **මුඛෙ අවසිට්ඨා** පොකුරු පතෙහි වැටුණු දියබිඳුමෙන් පෙරළී උගුරෙන් එපිටට යයි. ඒනිසා ඉතිරිවීමක් සිදුනොවේ. **රසපටිසංවේදී** මධුර තිත්ත කටුක ආදී රස දන්නාසේක. යටත් පිරිසෙයින් බුදුවරුන්ගේ පානීය ජලයෙහි දිව්‍ය ඕජස් බහාලන ලද්දේවෙයි. ඒනිසා උන්වහන්සේලාට සියලුතන්හි රසය ප්‍රකටය. රස තෘෂ්ණාවක් නම් නැත. **අට්ඨංඝ සමන්නාගතං** නෙවදවායයැයි අංගයන්ගෙන් යුක්තය. විසුද්ධි මග්ගයෙහි මෙහි විනිශ්චය ආයේය. මෙය සබ්බාසව සූත්‍රයෙහි කියන ලද්දකි. **හත්ථෙසු ධොතෙසු** ශාස්තෘන් වහන්සේ කුමක් කරන සේක්ද? පළමුව පාත්‍රය අල්ලාගන්නා තැන සෝදන සේක. එහිදී පාත්‍රය ගෙන සියුම් දූල් අත යවා දෙවරක් අත කරකවන සේක. එපමණකින් පොකුරු පත වැටුණු ජලය මෙන් කරකැවී යයි. **නච අනත්ථිකො** ඇතැම්හු පාත්‍රය ආධාරකයෙහි තබා පාත්‍රයෙහි ජලය පිස නොදමති. දුවිලි වැටෙනවිට සැලකිලිමත් වෙති. භාග්‍යවතුන් වහන්සේ එසේ නොකරන සේක. **නච අතිවෙලානුපෙක්ඛති** ඇතැම්හු ප්‍රමාණාතික්‍රාන්ත ලෙස ආරක්ෂාව එළවා ගනිති. වළඳ පාත්‍රයෙහි ජලය පිසදමා සිවුරුපොට ඇතුළට පිවිසවා පාත්‍රය උදරයෙන් තදකර ගනිති. තථාගතයන් වහන්සේ එසේ නොකරන සේක. **නච අනුමොදනස්ස** යමෙක් ආහාරගත් කෙණෙහි දරුවන් බත්ඉල්ලා හඬනකල්හි මිනිසුන් කුසගිනිවූ කල්හි නොපැමිණි හෙට දවසෙහි අනුමෝදනාව ආරම්භ කරයිද? ඉන්පසු සියලු කටයුතු අත්හැර ඇතැම්හු එති. ඇතැම්හු නොපැමිණියෝ වෙති. මෙය කල්ගෙවීමකි. යමෙක් මිනිසුන් පැමිණ අනුමෝදනාව පිණිස වැඳ දුන්කල්හි අනුමෝදනාව නොකොට, කොහොමද තිස්ස, කොහොමද ඵුස්ස. කොහොමද සුමන, කොහොමද තිස්සා. කොහොමද ඵුස්සා, කොහොමද සුමනා කොහොමද කරදයක් නැතිව අස්වැන්න ලැබුණද ආදී වෙන වෙන කථා උපදවත් මෙයද අනුමෝදනාවේ කාලය ඉක්මවීමකි. මිනිසුන්ගේ අවස්ථාව දැන අයැද සිටිකල්හි කරන්නේ කාලය ඉක්මවා යයි. ශාස්තෘන් වහන්සේ එසේ නොකරනසේක. **නතංභත්තං** මොනවාද මේ

බත්. ඇටකුණාවෙලාය, බෙරිවෙලාය ආදිය කියා නොගරහන සේක. **න අඤ්ඤං හනනං** හෙට පිණිස හෝ නැවත දිනක බත් උපදවාගන්නෙමියි අනුමෝදනා කරන්නේ අන්බතක් අපේක්ෂාකරයි - යමෙක් යම්තාක් ගැහැණුන්ට බත් පිසයිද ඒතාක් අනුමෝදනාව කරන්නෙමි. මාගේ අනුමෝදනාව අවසානයෙහි තමාට පිසූ බතින් ටිකක් දෙන්නාහුයයි අනුමෝදනාව වැඩිකරයි. මෙයත් **පටිකඞ්ඛති** නම්වේ. ශාස්තෘන් වහන්සේ මෙසේ නොකරන සේක. **න නිමුච්චිතුකාමො** ඇතැම්හු පිරිස පසු කොට පසුකොට යති. වේගයෙන් ලුහුබැඳ යායුතු වෙයි. ශාස්තෘන් වහන්සේ එසේ නොකරන සේක. පිරිසමැද සිට යන සේක. **අච්චුක්කට්ඨං** කෙනෙක් හකුඇටයෙන් උඩට සිටිනසේ සිවුර පොරවයි. ඔහු **අච්චුක්කට්ඨ** නම්වෙයි. කෙනෙක් ගොප් ඇටය වසා සිවුර පොරවයි. ඔහු **අවෙචාක්කට්ඨ** නම් වෙයි. කෙනෙක් දෙපසින් ඔසවා උදරය විවෘතව තබාගෙනයයි. ඔහු ද අච්චුක්කට්ඨ වෙයි. කෙනෙක් ඒකාංස කොට තනය විවෘතව තබාගෙනයයි. ඔහු ද අවෙචාක්කට්ඨ නම ලබයි. ශාස්තෘන් වහන්සේ මේ සියල්ලම නොකරන සේක. **අල්ලීනං** අන්‍යයන්ගේ දහදියෙන් තෙත ඇලෙයි. ශාස්තෘන් වහන්සේගේ එය නැත. **අපක්කට්ඨං** වේරම්බ වාතයද නැගී සොලවන්ට නොහැකිවෙයි. **පාදමණ්ඩ නානුයොගං** ගඩොලින් ඇතිල්ලීම් ආදියෙන් පාදයන් අලංකාර කිරීමෙහි යෙදීම. **පක්ඛාලෙත්වා** පයින්ම පා සෝද **සොනෙව අත්තබ්‍යාධාය** ආදිය පුබ්බෙනිවාස චෙතොපරියඤාණයන් ඇතිබැවින් නොකියන සේක. ඉරියව් ඇතිබව දැන අනුමානයෙන් කියන සේක. ධම්මං පරියත්ති ධර්මය. **උස්සාදෙති** කිමෙක්ද මහා රටඨික, මහා කුටිම්බික ආදිය කියා ගෘහාශ්‍රිත වශයෙන් අවුල් කරයි. **අපසාදෙති** කිමෙක්ද උපාසකය, ඔබ වෙහෙරට එන මග දැන ගත්තේ කෙසේද? බයනිසා එන්නේ නැද්ද, භික්ෂූහු කිසි දෙයක් උදුරා නොගනිති. බිය නොවන්න. කියා හෝ කුමක්ද ඔබගේ මේ මසුරු ජීවිතය ආදිය කියා ගෘහාශ්‍රිත වශයෙන් අප්‍රසාදයට පත් නොකරති. **විස්සට්ඨො** හමුනොවුයේ, බාධා නොකරන ලද්දේ **විඤ්ඤෙය්‍යො** දන්වන ප්‍රකට විස්‍රුත බැවින්ම මෙය විඤ්ඤෙය්‍ය නම්වේ. **මඤ්ජු** මිහිරි, **සවනියො** කර්ණ රසායන, මිහිරිබව නිසාම සවනීය නම්වේ. **බින්දු** සම්පිණ්ඩිත, **අවිසාරී** නොවිසුරුණු, සම්පිණ්ඩිත බව නිසා මෙය අවිසාරී නම් වේ. **ගම්භීරො** ගැඹුරින් නැගුණු, **නින්නාදි** නින්නාද වන, ගැඹුරුබව නිසාම මෙය නින්නාදී වෙයි. **යථා පරිසං** සක්වළ කෙළවරටම

ඒකාබද්ධවූ පිරිසට දන්වන සේක. බහිද්ධා අඟලක්වත් අඩ අඟලක්වත් පිරිසෙන් පිටට නොයයි. කුමක් නිසාද මෙවන් මිහිරි හඬක් නිකරුණේ නොනැසේවායි මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ හඬ පිරිස් මත්තෙන් මත්තෙන්ම හැසිරේ. අවලොකයමානා හිසෙහි ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේ දෙස බලමින්ම ආපසු හැරී දර්ශනය අවසන්වන තැන දී වැඳ යති. අවිජහන්තා යමෙක් කථාව අසා නැගිට වෙනත් දුටු ඇසූකථා කියන්නේයයි. මේ ස්වභාවයෙන් නවිජහන්ති නම් වෙයි. මෙසේ අත් නොහරනා බැවින් ආපසු යති. ගච්ඡන්තං රැහැනින් ක්‍රියා කරන යන්ත්‍රයක වශයෙන් සියක් රියනක් උස රන් ඇහැයක් මෙන් වඩිනු දුටුවෙමු. ඨිතං ඔසවාතැබූ රන් පව්වක් මෙන් සිටිනු දුටුවෙමු. තතොවහීයෝ විස්තර කොට ගුණ කියන්ට නොහැකිව අවශේෂවූ ගුණ කෙටි කොට කලබක් මෙන් මිටට බැන්දක් මෙන් කොට විසුරුවන්නේ මෙසේ කීය. මෙය මෙහි අදහසයි. මා විසින් කියන ලද ගුණයන්ගෙන් නොකියූ ගුණම බහුතරය. මහා පෘථුවිය මහා සමුද්‍රය ආදීන්මෙන් ඒ පින්වතාගේ අනන්තවූ අප්‍රමාණ වූ ගුණ ආකාශය මෙන් විස්තෘතය අප්පටිසංවිදිතො නොදත් ආගමනය. පැවිද්දකු එළඹෙන කල්හි සිවුරු පිරියම් කරන කාලයෙහි හෝ එක් සිවුරක් හැඳ සිරුර තෙල් ගල්වන වේලෙහි හෝ එළඹ ඉන්පසුව හෝ නැවතිය යුතු වෙයි. පිළිසඳර මාත්‍රයක්වත් නොලැබේ. පෙරාතුව අවකාශ ලබාදුන් කල දිවස්ථානය ඇමද සිවුර පොරවා භික්ෂුව හුදෙකලා තැන හිඳී. ඔහු කරා පැමිණ බලන්නෝ දර්ශනයෙන්ම පහදිත්. පිළිසඳර හටගනී. ප්‍රශ්නයක් ව්‍යාකරණයක් ධර්මකථාවක් හෝ ලැබේ. ඒනිසා නුවණැත්තෝ අවසරය ලබාගනිති. හෙතෙමේද ඔවුන්ගෙන් අන්‍යයෙකි. ඒනිසා ඔහුට මෙසේ සිත්විය. ජිනෙනා වුදෙධා තමාගේ උසස්බව නොකියා කුමක්නිසා මෙසේකීද? බුදුවරුනම් අනුකම්පාව ඇත්තෝ වෙති. මාගේ මහලුබව දැන වහා අවසරය ලබාදෙන්නේ යැයි මෙසේකීය. අථනං ඔකාස මකාසි වේගයෙන් නැගිට දෙකට බෙදී අවසරය ලැබීය. යෙමෙ යමෙක් මා විසින් නාරී සහනාම සවහයා නාරීසහනාමං යනු ස්ත්‍රී ලිංගයි. එයින් ආමන්ත්‍රණය කළයුතුය. නාරීස සහනාම සවහයා යනුවෙන් ස්ත්‍රී ලිංග පදයෙන් කියයුතුය. ව්‍යවහාර දක්ෂතාව නිසා මෙසේ කියයි. පනූතජ්වෙහා පුළුල් දිව. නිනනාමයෙතං එය ගෙනයව, කෙවලී යනු සියලු ගුණයුත් පචවහාසි එකපහරින් ඇසූකල්හි ප්‍රශ්න

ප්‍රශ්න අටක් විසඳන්නේ නැවත කීය. **යොවෙදී** යමෙක් යමකුගේ පෙරවිසූ කඳපිළිවෙළ විදති - දනීද ප්‍රකටය. **සග්ගාපායඤ්ච පස්සති** දිබ්බචක්ඛු ඤාණය කියන ලදී. **ජාතික්ඛයං පත්තො** අර්හත්වයට පත්වූයේ. **අභිඤ්ඤා වොසිතො** ඒ අර්හත්වය හොඳින් දැන වොසතො - අවසානයට පැමිණියේ. **මුනී** අර්හත් ඥාන නිශ්ශබ්දතාවෙන් යුතු, **විසුද්ධං** යනු සුදු **මුත්තං රාගෙහි** ක්ලේශරාගයෙන් මිදුණු. **පහීන ජාතිමරණො** ජාතික්ෂයට පැමිණි බැවින් ප්‍රහීණජාතිකයෙක්ව, ජාතිප්‍රහාණයෙන්ම මරණය ප්‍රහීණ කළ, **බ්‍රහ්මචරියස්ස කෙවලී** බ්‍රහ්මචර්යයෙහි සකල භාවයක් වෙද එයින් යුත්, සියලු චාතුර්මාර්ගික බ්‍රහ්මචර්ය වාසය යන අර්ථයි. **පාරගූ සබ්බ ධම්මානං** සියලු ලෞකික ලෝකෝත්තර ධර්මයන් දැන පරතෙරටගිය, සියලු ධර්මයන් දැන සිටියේ යන අර්ථයි. පාරගූ යනු පංචස්කන්ධයන්ගේ මෙපමණකින් පරිඤ්ඤා පාරගූ හෝ සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණ පාරගූ, චතුර්මාර්ගයන්හි භාවනා පාරගූ, නිරෝධයාගේ සච්ඡිකිරියාපාරගූ සියලු සමාපත්තීන්ගේ සමාපත්ති පාරගූයැයි මෙහි අර්ථය කියන ලද්දේය. නැවත සබ්බධම්මානං යනු මෙයින් අභිඤ්ඤා පාරගූ කියන ලදී. **බුද්ධොතාදි පවුච්චති** සය ආකාරයකින් පරතෙරට ගිය එවැන්නෙක් සර්වාකාරයෙන් චතුස්සත්‍යය අවබෝධ කළ හෙයින් බුද්ධ යැයි කියනු ලැබේ. මෙපමණකින් සියලු ප්‍රශ්න විසඳුණේද? එසේය විසඳුණේය. රාගයන්ගෙන් මිදුණු බව විශුද්ධ චිත්තය දනී. මෙයින් පව් ඉවත් කරන ලදහෙයින් බ්‍රහ්මණයැයි පළමුවැනි ප්‍රශ්නය විසඳුණේය. පාරගූ යැයි මෙයින් වේදයන් සමග ගිය බැවින් වෙදගූ යැයි දෙවැනි ප්‍රශ්නය විසඳුණේය. **පුබ්බෙනිවාසං** ආදියෙන් මේ විද්‍යාවන් තුන ඇතිබැවින් **තෙවිජ්ජො** යැයි තුන්වැනි ප්‍රශ්නය විසඳුණේය. සැම අතින්ම රාගයන්ගෙන් මිදුණු මෙයින්ද, පාපධර්මයන් මුදාහළහෙයින් යහපත්ය සිව්වැනි ප්‍රශ්නය විසඳුණේවෙයි. ජාතික්ෂයට පැමිණියේ. මෙයින් අර්හත්වයම කී බැවින් පස්වැනි ප්‍රශ්නය විසඳුණේය. සකලබ්‍රහ්මචර්යය අවසන් වියැයි සවැනි ප්‍රශ්නය විසඳුණේවෙයි. මුනිතෙමේ අභිඥ්ඤාව අවසන් කළේය. මෙයින් සත්වැනි ප්‍රශ්නය විසඳුණේ වෙයි. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය බැවින් බුදුන් වහන්සේ තාදී යැයි කියනු ලැබෙත්. මෙයින් අටවැනි ප්‍රශ්නය විසඳුණේවෙයි. **දනකථං** ආදිය යට සූත්‍රයෙහි විස්තරකරන ලද්දේමය. **පච්චපාදි** පිළිපැද්දේය. **ධම්මස්සානු ධම්මං** මේ සූත්‍රයෙහි ධම්මො නම් අර්හත් මාර්ගය අනුධම්ම නම් මින් පහත මාර්ග

තුන ද සාමඤ්ඤඵලද පිළිවෙළින් ලබන්නේය යන අර්ථයි. **නච මං ධම්මාධිකරණං ච විහොසෙසි** ධර්මාධිකරණයෙන් මා වෙහෙසට පත් නොකළේය, නැවත නැවත කථානොකරවීයැයි කියන ලද්දේවෙයි. සෙස්ස සැමතැන නොගැඹුරුමය. **තත්‍ථපරිනිබ්බායි** යන පදයෙන් අර්හත් භාවයෙන් දේශනාව කුළු ගැන්විණ.

## පළමුවැනි බ්‍රහ්මායු සූත්‍රයයි.

## 2.5.2

**එවමෙමසුත්තං** යනු සේලසුත්‍රයයි. එහි **අඞ්ගුත්තරාපෙ** ආදිය පොතලික සූත්‍රයෙහි විස්තරකරන ලදි. **අඩ්ඪතෙළසෙහි** භික්ෂූන් එක්දහස් දෙසිය පනසක් සමග යැයි කියන ලද්දේවෙයි. මේ ශ්‍රාවක සන්නිපාතයෙහි එක්රැස්වූ සියලු භික්ෂූහු එහි භික්ෂු භාවයෙන් පැවිදිවූ රහතන් වහන්සේලාය. **කෙණියො** ඔහුගේ නම. **ජටිලො** තවුසා ඔහු බ්‍රාහ්මණ මහාසාලයෙකි. ධනය ආරක්ෂා කර ගැනීම සඳහා තවුස් පැවිද්ද ගෙන රජුට පඬුරුදී බිම්කඩක්ගෙන එහි ආශ්‍රමයක් කරවා වාසය කරයි. ගැල්පන්සියයක් වෙළඳමෙහි යොදවා පවුල් දහසක් ඇසුරුකොට, ඔහුගේ ආශ්‍රමයෙහි එක් තල් රුකක් දවසට එක් රන්තල්ගෙඩියක් බැගින් දෙතියි කියති. හෙතෙමේ දිවාකාලයෙහි කාෂාය වස්ත්‍රදරයි. ජටාවද බඳියි. රෑට කාම සම්පත් අනුභව කරයි. **ධම්මියා කථාය**. පානයන්හි අනුසස් කියැවෙන දැහැමි කථාවෙන් මේ කෙණිය හිස් අතින් භාග්‍යවතුන් වහන්සේ දකින්ට යාමට ලජ්ජාවන්නේ. විකාලභෝජනයෙන් වෙන්වූවන්ට ද පානයක් කැපයයි සිතා මනාසේ සැකසූ ඩෙබර පානය කත් පන්සියයකින් ගෙන්වාගෙන ගියේය. මෙසේ ඔහු ගිය බව "ඉක්බිති කෙණිය ජටිලයාට මෙසේ සිත්විය. මම ශ්‍රමණ ගෞතමයන්ට කුමක් යවන්නෙම්දැයි භෙසජ්ජක්ඛන්ධකයෙහි පෙළට ඇතුළත්වේ. **දුතියම්පිඛො භගවා** කුමක් නිසා යලියලිත් ප්‍රතික්ෂේප කළ සේක්ද? තීර්ථකයන් ප්‍රතික්ෂේප කිරීම. ප්‍රසාද පිණිස මෙය කරුණක් නොවේ. බුදුවරුන්ගේ ප්‍රත්‍ය හේතුවෙන් මෙබඳු කුහක බවක් නැත. මොහු අඩ තෙළෙසක් භික්ෂූන් දැක මෙපමණ දෙනකුට ආහාර පිළියෙල කරන්නාහුය. හෙට සේල පුරුෂයන් තුන්සියයක් සමග පැවිදිවන්නේය.

නවකයන් අනුත් අත යවා මොවුන් සමග යාම යුතුනොවේ. එහෙත් සියල්ලන් ගෙන යන්නෙමි. භික්ෂා ආහාරය ප්‍රමාණවත් නොවන්නේය. ඉන්පසු භික්ෂූන් පිඬුසිගා වඩිනු දුටු මිනිස්සු දොස් කියන්නෝය. කලකින් කෙණිය ශ්‍රමණ ගෞතමයන්ට ආරාධනා කොට යැපෙන පමණක්වත් දීමට නොහැකි විය. තෙමේම විපිළිසර වෙයි. ප්‍රතික්ෂේපය කළකල්හි ශ්‍රමණ ගෞතමයෝ නැවත නැවත ඔබත් බ්‍රාහ්මණයන් කෙරෙහි අතිප්‍රසන්නය. බමුණන්ගේ නම ගත්තේයැයි සිතා බමුණන්ටද ආරාධනා කිරීමට කැමැත්තේ වන්නේය. ඉන් පසු බමුණන්ට වෙන වෙනම ආරාධනා කරන්නේය. ඉන්පසු ආරාධනය කරනු ලැබුවෝ භික්ෂූන් වී වළඳන්නාහුය. මෙසේ ඔහුගේ ශ්‍රද්ධාව ආරක්ෂිතවූවානම් වන්නේයැයි නැවත නැවත ප්‍රතික්ෂේප කළහ. **කිඤ්චාපි හොති** මෙයින් මෙය දක්වයි. භවත් ගෞතමයෙහි කුමක් වීද? ඉදින් මම බමුණන් කෙරෙහි අතිශයින් පැහැදී ගෞතමයන් වහන්සේ ඉවසා වදරනු මැනවි මම බමුණන්ටද දෙන්ට හැක්කෙමි. ඔබටත් දීමට හැක්කෙමි. **කාය වෙය්‍යාවටිකං** කයට කෙරෙන වතාවත්, **මණ්ඩල මාලං** රෙදි මණ්ඩපය **ආවහො** කන්‍යාග්‍රහණය **විවාහො** කන්‍යාදනය **සොමෙ නිමන්තිතො** හෙතෙමේ මා විසින් නිමන්ත්‍රණය කරන ලද්දේය. ඉක්බිති බමුණා මුහුකුරාගිය උපනිශ්‍රය ඇතිබැවින් බුදුන්ගේ හඬ අසාම අමෘතයෙන් අභිෂේක කරන ලද්දේ ප්‍රසාදය හෙළිදරවු කරන්නේ **බුද්ධොති හො කෙණිය වදෙසි** ය කීය. කෙණිය පවත්නා තත්වය අසන්නේ: **බුද්ධොති හො සෙළ වදමි** යි කීය. ඉන්පසු ඔහු නැවතත් දෘඪිකිරීම පිණිස මෙසේ ඇසීය. අනෙකාද එසේම දැන්වීය. ඉක්බිති ඔහුට කල්ප සියදහසකින් බුද්ධ ශබ්දය දුර්ලභ බව මැනවින් බලනවිට මෙසේ මේ ඝෝෂාවක්ද? යනාදිය සිතිණ. **නීලවන රාජී** නිල්වන් රුක්පෙල **පාදෙපාදං** පියවර පමණ, පියවර පියවරට ඉතා ආසන්නයෙහි ඉතා ඇතින් පා තබන විට ශබ්දය පැනනගී එය බැහැර කරන්නේ මෙසේ කීය. **සීහාව එකචරා** සමූහයෙහි වැසි සිංහයා සිංහ පැටවුන් සමග ප්‍රමාදයට පැමිණේ. තනිව හැසිරෙන්නා අප්‍රමාදීවෙයි. මෙසේ අප්‍රමාද විහාරය දක්වන්නේ එකචර සිංහයකුගේ උපමාව ඉදිරිපත් කරයි. **මාමෙ හොනෙතා** ආචාරයෙහි හික්මෙන්නේ මෙසේ කීය. මේ මෙහි අදහසයි. ඉදින් ඔබ කථා කිරීමට අවස්ථාවක් නොලැබ මාගේ කථාව අතරතුර කථාවට පිවිසෙන්නේ නම් අතවැසියන් හික්මවන්ට නොහැකිවනු ඇතැයි මට ගර්හාවක් ඇතිවන්නේය. ඒනිසා

ඔකාසං පසසිත්වා මනෙනයා නොච බො තං නජානාමි විපස්සී බෝධිසත්වයෝ සතළිස් සතර දහසක් පැවිද්දන් පිරිවරා සත්වසක් බෝධිසත්ව චර්යාවෙහි හසිරුණාහ. බුද්ධෝත්පාද කාලයක් මෙන්විය. අපගේ බෝධි සත්වයෝද සවසක් බෝධිසත්ව චර්යා වෙහි හැසිරුණාහ. මෙසේ පිරිපුන් ලකුණින් යුතුවුවද බුදුවරු නොවෙති. ඒනිසා බමුණා මම එය නොදන්නේ නොවෙමියයි කීය. **පරිපුණණකායො** ලක්ෂණයන්ගෙන් පිරිපුන් බැවින් නොඅඩු අංග ඇති බැවින්ද පිරිපුන් සිරුරු ඇත්තේ, **සුරුචී** සොඳුරු සිරුරු පැහැ. **සුජාතො** ආරෝහ පරිණාහ සම්පත්තියෙන් සණ්ඨාන සම්පත්තියෙන්ද මනාසේ උපන්නේ. **චාරුදසසනො** බොහෝ කලකින් පහන් වූවන්ට අතෘප්තිජනක මනෝහර දර්ශන ඇති **සුවණණ වණෙණා** රන්වන් හා සමාන **සුසුකකදයො** අතිශයින් සුදුදත් **මහා පුරිසලකඛණා** පළමුව කියූ ව්‍යඤ්ජන වචන අතරින් නිගමනය කරමින් කීය. දැන් ඒ ලක්ෂණ අතුරින් තමාගේ සිට රුචිවූ ලක්ෂණ ගෙන ස්තුති කරන්නේ **පසනන නෙතෙතා** ආදිය කීය. භාග්‍යවතුන් වහන්සේ පස්වණක් ප්‍රසාද සම්පත්තියෙන් ප්‍රසන්න නෙත් ඇත්තෝය. පූර්ණ චන්ද්‍රයා හා සමාන මුව ඇති බැවින් **සුමුඛො** නම්. ආරෝහ පරිණාහ සම්පත්තියෙන් බ්‍රහා නම් බ්‍රහ්මයා හා සමාන ඍජු සිරුරක් ඇති බැවින් **උජු** නම්. ශෝභා වත් බැවින් **පතාපවා** නම්. මෙහි යමක් කිව යුතුනම් එය පෙර කියන ලදී. එය **මජෙඣ සමණසඞසසස** මේ ක්‍රමයෙන් ස්තුති කරන්නහුට නැවත කියන ලදී. එබන්දක් මෙසේ බබලයි. ඊළග ගාථාවද මෙම ක්‍රමය මැයි. **උත්තම වණණිනො** උත්තම වර්ණ සම්පන්න වූවහුගේ **රථෙසභො** උතුම් රථ ඇත්තේ **ජමබුසණඩසස** දඹදිවට ප්‍රකටවූ ඓශ්වර්යයට ස්තුති කරන්නේ කීය. චක්‍රවර්ති රජ දිවයින් සතරට ප්‍රධානියා වෙයි. **ඛත්තියා** උපතින් ක්ෂත්‍රියයෝ **භොගී** භෝග ඇත්තෝ. **රාජානො** රාජ්‍යය කරවන්නෝ. **රාජාභිරාජා** රජවරුන්ට පූජනීය වූ අධිරාජයාවූ චක්‍රවර්ති යන අදහසයි. **මනුජිනෙද** මනුෂ්‍යයින්ට අධිපති පරමේශ්වරවූ මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ යමෙක් රහත්වෙත්ද සම්මා සම්බුදුවරුන් තම වර්ණයන් කියද්දී තමා පහළ කරත්නුයි සේලගේ මනෝරථය පුරවමින් **රාජාභමසමි** ආදිය කීය. එහි අදහස සේල ඔබ සුදුසු නම් රජවන්නැයි මගෙන් ඉල්ලයි. මෙහි අල්ප උත්සාහ ඇත්තෙක් වෙච රජවෙමියි රාජත්වය ඇතිකල්හි අන් රජවරු යොදුන් සියයක් හෝ යොදුන් දහසක්ද පාලනය කරත්ද, සක්විතිවී සිව්

දිවයින් කෙළවර පමණක් නොව, මම මෙසේ සීමා කරන ලද විෂය ඇත්තෙක් නොවෙමි. අනුත්තරවූ ධර්මරාජත්ව භවාග්‍රයෙන් සීමා නොකොට සරසට අප්‍රමාණවූ ලෝකධාතූන් පාලනය කරමි. යම්තාක් අපාද ද්විපාද ආදී භේද ඇති සත්වයෝ වෙත්ද මම ඔවුන්ට අග්‍රවෙමි. සීලයෙන් හෝ - පෙ - විමුත්තිඤාණ දස්සනයෙන්හෝ මා හා සමානයෙක් නැත. ඒ මම මෙසේ අනුත්තර ධර්මරාජන් වෙමි. අනුත්තරවූ සතරසතිපට්ඨාන ආදී භේද ඇති ධර්මයෙන් චක්‍රය පවත්වමි. මෙය අත්හරිවූ. මෙයට පැමිණ වාසය කරවූ යයි ආඥාචක්‍රයයි. මහණෙනි මේ දුක්ඛ ආර්ය සත්‍යයැයි ආදි වශයෙන් පර්යාප්ති ධර්මයෙන් ධර්මචක්‍රයම චක්‍රනම්වේ. **අප්පතිවත්තියං** යම් චක්‍රයක් ශ්‍රමණයකු විසින් හෝ - පෙ - ලෝකයෙහි කිසිවකු විසින් ආපසු හැරවිය නො හැකිවේද මෙසේ තමා එළිදරවූ කරන භාග්‍යවතුන් වහන්සේ දැක ප්‍රීති සොම්නස් හටගත් සේල නැවත දෘඩිකිරීම පිණිස **සම්බුද්ධො පටිජානාසි** යන ගාථා දෙක කීය. එහි **කොනු සෙනාපති** භවත් ධර්මරාජයන්ගේ ධර්මයෙන් පවත්වන චක්‍රයට අනුව පවත්නා සේනාපතියා කවරෙක්දැයි ඇසීය. ඒ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේගේ දකුණු පසින් ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවෝ රන් පිඬුවක් මෙන් ශ්‍රීයෙන් බබලමින් හුන්හ. එය දක්වන්ට භාග්‍යවතුන් වහන්සේ **මයා පවත්තිතං** යන ගාථාව වදළහ. එහි **අනුජාතො තථාගතං** තථාගතයන් වහන්සේ සඳහා අනුව උපන්, තථාගතයන් වහන්සේ හේතුකොටගෙන උපන් යන අර්ථයි. තවද අනුජාත අවජාත අතිජාතයැයි පුත්‍රයෝ තිදෙනෙක්වෙති. ඔවුන් අතරින් අවජාතයා දුශ්ශීලයෙකි. හේ තථාගතයන් වහන්සේගේ පුත්‍රයෙක් නොවේ. අතිජාත පුත්‍රයා නම් පියාට වඩා උසස්ය. එබන්දෙක් ද තථාගත පුත්‍රයෙක් වන්නේද නොවේ. තථාගතයන් වහන්සේට එක් අනුජාත පුත්‍රයෙක් පමණක් ඇත. එය දක්වමින් මෙසේ කීහ. මෙසේ **කොනු සෙනාපති** යන ප්‍රශ්නය විසඳ සේල මෙසේ කීය. **සම්බුද්ධො පටිජානාසි** එහි ඔහු නිසැක කරනු කැමැත්තේ මම ප්‍රතිඥා මාත්‍රයෙන්ම නොදනිමි. එහෙත් මම මේ කාරණයෙන් බුද්ධවෙමියැයි හඳුන්වන්ට **අභිඤ්ඤෙය්‍යං** යන ගාථාව වදාළහ. එහි අභිඤ්ඤෙය්‍යං විද්‍යාවද විමුක්තියද වැඩිය යුතුය. මාර්ග සත්‍යය අත්හළ යුතුය. සමුදය සත්‍යය හේතු වචනයෙන් ඵල සිද්ධියෙන් ඔවුන්ගේ ඵල නිරොධ සත්‍ය දුක්ඛ සත්‍ය යැයි කියන ලද්දේම වෙයි. මෙසේ සාක්ෂාත් කළයුතුදෙය සාක්ෂාත් කරන ලද්දේය දතයුතු දෙය දන්නා ලද්දේය. මෙයද

මෙහි සංගෘහීතයයි චතුස්සච්ච භාවනාව සච්චභාවනා ඵලයද විමුත්තියද දක්වන්නේ අවබෝධකළ යුතුදෙය අවබෝධ කොට බුද්ධවීයයි හේතුයුක්ති සහිතව බුදුබව සාධනය කරයි. මෙසේ වෙනසක් නො කොට තමා හෙළිදරවු කොට තමා කෙරෙහි ඇති සැක දුරුකිරීම පිණිස බමුණා උත්සුක කරමින් **විනයස්සු** යන ගාථාතුන කීසේක. එහි **සල්ලකත්තො** රාගාදීහුල් කපා දමන. **අනුත්තරො** යම්සේ බාහිර වෛද්‍ය වරයකු විසින් සන්සිඳවනු ලැබූ රෝගයක් මේ ආත්මභාව යෙහිදීම කිපෙයිද මා විසින් සන්සිඳවනු ලැබූ රෝගය භවාන්තර යෙහිදී පවා නූපදියි. ඒනිසා මම අනුත්තර වෙමි යන අර්ථයි බ්‍රහ්මභූතො ශ්‍රේෂ්ඨ වූයේ. **අතිතුලො** මිනුම ඉක්මවා ගිය උපමා නොකළහැකිය යන අර්ථයි. **මාරසෙනප්පමද්දනො** කාමාතෙපඨමාසෙනා යැයි මෙසේ පැමිණි මාරසේනාව මර්දනය කරන. **සබ්බාමිත්තෙ** ස්කන්ධමාර, ක්ලේශමාර අභිසංස්කාර මාර, මෘත්‍යුමාර දේවපුත්‍රමාර සංඛ්‍යාත සියලු සතුරන් **වසීකත්වා** තමාගේ වසඟයෙහි තබා **අකුතොභයො** සැම දෙසින්ම බියරහිත මෙසේ කීකල්හි සේල බමුණා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි හටගත් ප්‍රසාද ඇත්තේ පැවිද්ද පිළිබඳ අපේක්ෂා ඇත්තේ ම **ඉමං භොනෙතා** යන ගාථාතුන කීය. එහි **කණ්හාභිජාතිකො** චණ්ඩාල ආදී නීචකුලයක උපන්නේ. ඒ මාණවකයෝද පැවිද්ද පිළිබඳ අපේක්ෂා ඇත්තෝව **එවං තෙ රුච්චති භොතො** යන ගාථාව කීහු. ඉක්බිති සේල ඒ මාණවකයන් කෙරෙහි තුටුසිත් ඇත්තේ ඔවුන්ද දක්වමින් පැවිද්ද ඉල්ලන්නේ **බ්‍රාහමණා** ආදි ගාථාව කීයේය. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ සේල බ්‍රාහ්මණයා අතීතයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි ඒ තුන් සියයක් පුරුෂයන්ට ගණශ්‍රේෂ්ඨව ඔවුන් සමග පිරිවෙනක් කොට දනාදී පින්කම් කොට ක්‍රමයෙන් දෙව්මිනිස් සැප අනුභව කරමින් පශ්චිම භවයෙහි ඔවුන්ගේම ගුරුවරයා වී, උපන්නේ විමුක්ති පරිපාකයෙන් මුහුකුරා ගිය එහි භික්ෂුභාවයට උපනිශ්‍රය වූ ඔවුන්ගේ ඒ කර්මය නිසා ඔවුන් සියලු දෙන එහි භික්ෂු පැවිද්දෙන් පැවිදිකරවන්නේ **සවාකඛාතං** යන ගාථාව කීය. එහි **සන්දිට්ඨිකං** තමාම දතයුතු ප්‍රත්‍යක්ෂ, **අකාලිකං** මාර්ගයට අනතුරුව ඵල උත්පත්තිය පිණිස, කාලාන්තරයකින් නොපැමිණිය යුතු ඵලය **යත්‍ථ** අමොසා යම් මාර්ග බ්‍රහ්ම චර්යයක අප්‍රමාදී පුද්ගලයාගේ ශික්ෂාත්‍රය පිරීමෙන් හික්වීම නිසා පැවිද්ද හිස් නොවේ. සඵලය යන අර්ථයි. මෙසේ **එථභික්ඛවො** යි භාග්‍යවතුන් වහන්සේ කීසේක් සියල්ලෝ පා සිවුරු දරුවෝ වී අහසින් අවුත් වස් සියයක් ඇති තෙරුන්

මෙන් සුවිනීතව භාග්‍යවතුන් වහන්සේ වැන්දහුය. මෙසේ ඔවුන්ගේ එහිභික්ෂුභාවය සඳහා **අලත්ථබො සෙලො** ආදිය කීසේක. ඉමාහි කේණියගේ මේ සිතට අනුකූල ගාථාවලින් එහි ගිනි පිදීමෙන් හැර බමුණන්ගේ යඥයක් නැති බැවින්. **අග්ගිහුත්තමුඛා යඤ්ඤ** යි කියන ලදී. අගගිහුතත මුඛ යනු ගිනි පිදීම ශ්‍රේෂ්ඨකොට ඇති ගිනි දැල්වීම ප්‍රධාන කොට ඇති යන අර්ථයි. වේදයන් සජ්ඣායනා කරන්නවුන් විසින් පළමුකොට සජ්ඣායනය කළ යුතු හෙයින් සාවිත්‍රි ඡන්දස ප්‍රධානයයි කියන ලදී. මනුෂ්‍යයන්ට ශ්‍රේෂ්ඨ බැවින් **රාජාමුඛං** යයි කියන ලදී. නදීන්ට ආධාරවන බැවින් **සාගරො මුඛං** යයි කියන ලදී. චන්ද්‍රයාගේ යෝගය අනුව අද කාර්තික (කැති) නැකතය, අද රොහිණී (රෙහෙණ) නැකතයැයි පෙනෙන බැවින්, ආලෝක කරන හෙයින් සෞම්‍ය බැවින් නැකැත් තරුවලට මුඛං **චන්‍දෙ** යයි කියන ලදී. බබලන්නවුන්ට අග්‍ර බැවින් **ආදිච්චො තපතං මුඛං** යැයි කියන ලදී. දක්ෂිණාර්හයන්ට අග්‍රවූ බැවින් විශේෂයෙන් එසමයෙහි බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා සඳහා පින් අපේක්ෂා කරන්වුන්ට. **සඞ්ඝො වෙ යජතං මුඛං** යැයි කියන ලදී. මෙයින් සංඝයා පිනට ආයමුඛයකැයි කියන ලදී. **යං තං සරණං** රහත්බව ප්‍රකාශ කරන ගාථාවක් එහි අර්ථය මෙසේය. පඤ්චචක්ෂුන්ගෙන් චක්ෂුමත්වූ භාග්‍ය වතුන් වහන්සේ අපි මින් අටවැනි දවස්හි උන්වහන්සේගේ සරණයට පැමිණිබැවින් රාත්‍රි සතකින් ඔබ වහන්සේගේ ශාසනයෙහි අනුත්තරවූ දමථයෙන් දැමුණම්හ, ඔබවහන්සේ සරණයාමෙහි අනුබාවය පුදුමයි. ඉන්පසුව ගාථා දෙකකින් ස්තුතිකොට තෙවැනි වැඳීම අයදිමින් **භික්ඛවො තිසතා** ඉමෙ යනාදිය කීය.

## දෙවැනි සේලසූත්‍රයයි

## 2.5.3

**එවමෙමසුතං** යනු අස්සලායන සූත්‍රයයි. එහි **නානා වෙරජ්ජ කානං** අංග මගධ ආදී නානාප්‍රකාර වෙනත් රාජ්‍යවලින් පැමිණියවුන්ගේ, ඒ ඒ රටවල ඉපදී වැඩුණුවුන්ගේ හෝ යන අර්ථයි. **කෙනච්දෙව** යඥයන්හි හිඳගැනීම් ආදී අනියමිත කාර්යයන් නිසා **චාතුවණ්ණී** චතුර්වර්ණයට සාධාරණ, අපි ස්නාන ශුද්ධියෙන් ද භාවනා ශුද්ධියෙන්ද බ්‍රාහ්මණයෝ

පරිශුද්ධත්වයට පත් වන්නෝයැයි කියමු. ශ්‍රමණ ගෞතමයෝ පරිශුද්ධත්වයට පත් වන්නෝයැයි කියමු. ශ්‍රමණ ගෞතමයන් අයුක්තක් කරතියි හඟිමින් මෙසේ සිතූහ. චුතනසිරො වැඩුණු හිස ඇත්තේ, ධම්මවාදී ස්වදවවාදී. දුප්පතිමන්තයා අපවැනි අධර්මවාදීන් විසින් දුකින් මන්ත්‍රණය කළයුතු වෙයි. ධර්මවාදියාට පරාජය කරන්නට නොහැකිය යයි දක්වයි. පරිබ්බාජකං ප්‍රව්‍රජ්‍යා විධානය, වේදත්‍රය ඉගෙන සියල්ලන්ට පසුව පැවදිවන්නෝ යම් මන්ත්‍රයකින් පැවිදිවෙත්ද, පැවිදිවූවාහු යම් මන්ත්‍ර පරිහරණය කරත්ද, යම් ආචාරයක හැසිරෙත්ද ඒ සියලු චරිතය භවත්හු විසින් හික්මන ලදී. ඒනිසා ඔබට පරාජයක් නැත. ඔබට ජයම වන්නේයයි හඟින්නාහු මෙසේ කීහ. දිස්සන්තෙ බොපන ආදිය ඔවුන්ගේ ලබ්ධිය බිඳීම පිණිස කියන ලදී. තත්‍ර බ්‍රාහ්මණියො බමුණන්ට පුත්‍රලාභය පිණිස ආවාහ විවාහ වශයෙන් කුලයෙන් ගෙනඑනු ලැබූ බැමිණියෝ දක්නට ලැබෙති. මොවුහු පසු කලෙක ඔසප් ඇත්තියෝ වෙති. වැඩිවියට පත්වූවෝය යන අර්ථයි. ශබ්භිනියො හටගත් ගැබ් ඇති, විජායමානා දූ පුතුන් උපදවන පායමානා දරුවන්ට තනකිරි පොවන්නියෝ, යොනිජාතා සමානා යෝනිමාර්ගයෙන් ඉපිද, එවමාහංසු මෙසේ කියත්. කෙසේද බමුණාම ශ්‍රේෂ්ඨ වර්ණ ඇත්තේද - පෙ - බ්‍රහ්මයාවිසින් දයාද කරන ලද්දහුද. ඉදින් ඔවුන්ගේ වචනය සත්‍ය වචනය වන්නේනම් බැමිණියගේ කුස මහාබ්‍රහ්මයාගේ පපුව විය යුතුය. බැමිණියන්ගේ යෝනිමාර්ගය මහා බ්‍රහ්මයාගේ මුඛය වියයුතුය. මෙපමණකින් අපි මහාබ්‍රහ්මයාගේ පපුවෙහි වැස මුඛයෙන් උපන්නවුන් යැයි කියන්නට නොලබාවායි. මෙය මුඛයෙන් උපන්බව බිඳ දමන වාරයයි. කියන ලදී. අය්‍යො හුත්වා දසො හොති ආර්යයා වී දසයා වෙයි. දසයාවී ආර්යයා වෙයි බමුණා භාර්යාව සහිත වූයේ වෙළෙඳමෙහි යොදවමින් යොන් රටට හෝ කාම්බෝජ රටට හෝ ගොස් කලුරිය කරයි. ඔහුගේ ගෙයි වැඩි වයසට පත් පුත්‍රයකු නැතිකල බැමිණිය දසයකු සමග හෝ කම්කරුවකු සමග සංවාස කරයි. එක් දරුවකු උපන්විට ඒ පුරුෂයා දසසයෙක්ම වෙයි. ඔහුට උපන් දරුවා දායාදයට හිමිකරු වෙයි. මව් පසින් පිරිසිදුය. පිය පසින් අපිරිසිදුය. හෙතෙමේ වෙළඳාමෙහි යෙදෙමින් මධ්‍යප්‍රදේශයට ගොස් බ්‍රාහ්මණ දූරියක ගෙන ඇගේ කුසයෙහි පුත්‍රයකු ලබයි. හෙතෙමේද මව්පසින් පිරිසිදුය. පියපසින් අපිරිසිදුය. මෙසේ බ්‍රාහ්මණ සමයෙහිම ජාති සම්භේදයක් වෙතියි දක්වීම පිණිස මෙය කියන

ලදී. **කිම්බලං** කො අස්සායො යම් තැනෙක ඔබ දාසයන් වද්දී සියලු දෙන දාසයෝ වවු. ආර්යයන් වද්දී සියලු දෙන ආර්යයෝ වවු. මෙහි බමුණෝම ශ්‍රේෂ්ඨවර්ණ ඇත්තෝ යයි කියවුනම් තොපට කවරශක්තියක්ද කවර ආස්වාදයක්දයි දක්වයි. **ඛත්තියොච** නුබො ආදිය ශුක්ල බව බිඳදමන වාර නම් වේ. චතුර්වර්ණ ඇත්තවුන්ගේ ශුද්ධිය දක්වන්නේ **ඉධරාජා** ආදීය කීය. **සාපානදෙණියා** බල්ලන් දිය බොන දෙණ, **අගගිකරණියං** ශීතල නැතිකරන අන්ධකාරය විධවංසනය කරන, බත් පිසන ආදී ගිනි කිස මෙහි **අස්සලායන** යනු මෙහි සියලු ගිනිකිස කෙරෙන කල්හි දූන් බමුණෝම චතුර්වර්ණීන් අතර ශුද්ධයයි කියත් මෙහි චතුර්වර්ණයයි නියමයක් නැත. පස්වැනි ඉන් එහා වර්ණයක්ද ඇතැයි කෙටියෙන් ඔවුන්ගේ වාදයෙහි දෙස් දක්වනු පිණිස **ඉධඛත්තිය කුමාරො** ආදිය කීය. එහි **අමුත්‍ර පනෙසානං** මෙහිද පෙරකී ක්‍රමයෙහි මේ මාණවකයන් ගේ කිසිදු වෙනස් බවක් නොදකිමියි කියයි. වෙනස්කම නම් ඔවුන්ට ඇත්තේමය. ක්ෂත්‍රිය කුමාරයකුට බ්‍රාහ්මණ කන්‍යාවකගෙන් උපන්නේ ක්ෂත්‍රිය පාරසක (ක්ෂත්‍රියයන්ට එහා) නම් අනිකා බ්‍රාහ්මණ පාරසක නම් මෙයින් උපන් මාණවකයෝ මෙසේ පස්වැනි වර්ණයක් ඇතිබැවින් චතුර්වර්ණ ශුද්ධියයි. මොවුන්ගේ වාදයෙහි දෙස් දක්වා දූන් නැවත චතුර්වර්ණ ශුද්ධියට දමන්නේ **තං කිංමඤ්ඤසි** ආදිය කීය එහි **සද්ධෙ** යනු මතක බතෙහි. ථාලිපාකෙ පඬුරුසඳහා පිසූ බතෙහි **යඤ්ඤෙ** යාග බතෙහි. පාහුණෙ ආගන්තුකයන් සඳහා පිසූ බතෙහි, **කිංහි** කිම මහත්ඵල වන්නේද. නොවන්නේදැයි දක්වයි. **භූතපුබ්බං** අස්සලායන මා ජාතියෙන් හීනතරද ඔබ ශ්‍රේෂ්ඨතර ද වී මා විසින් ජාති වාදය පිළිබඳ ප්‍රශ්නයක් විචාරන ලද්දේ පිළිතුරක් සපයන්ට නොහැකි වුයෙහිය. දූන් ඔබ හීනතරද ශ්‍රේෂ්ඨතරවූ බුදුවරයකුවන මා විසින් ස්වකීය ජාතිවාදයෙහි ප්‍රශ්නයක් විචාරන ලද්දේ කුමක්නිසා පිළිතුරක් සපයන්නෙහිද, මෙහි සිතුවිල්ලක් ඇතිකරගතයුතු නැතැයි මාණවකයාට උදව් වනසේක් මේ දේශනාව ආරම්භ කළසේක. එහි **අසිතො** යනු කලුපාට, දෙවලො ඔහුගේනම මෙයම භාග්‍යවතුන් වහන්සේ එසමයෙහි අටලියො පොට කීපයක් ඇති මිරිවැඩි **පණ්ණඩිලෙ** පන්සල මිදුලෙහි **කොනුබො කොහිදූයි**, **ගාමණ්ඩල** රූපො විය ගම්දරුවකු වැනිවූ, **සොබො** අහමෙහා හොමි ඒ මම ඒ අසන දේවල වෙමියි කියයි. එකල්හි බෝධිසත්වයෝ (කොණ්ඩ දමක) වී හැසිරෙති **අභිවාදෙතුං උපක්කමිංසු** වඳින්ට උපක්‍රම කළාහුය. එතැන් පටන්

වස් සියයක්වූ තාපසයෙක් වුවත් එදින උපන් බමුණු කුමරකු නොවඳින්නේ කොටනු ලැබුවේ බෙහෙවින් කොටනු ලැබුවේ වෙයි. ජනිමාතා යම් ස්ත්‍රියක් ඔබ වැදූවාද ඒ ස්ත්‍රිය ජනිකා මාතා නම් ජනිමාතු මවගේ මව, යොජනීපිතා යම් ජාතක කළ කෙනෙක් වේද ඒ පියා යො ජනිකො පිතාතෙව වා ජාතක කළ පුද්ගලයා පිතා ම වේයැයි පාඨයක් වේ. අසිතෙන පංචාභිඥාලාභී අසිතදේවල ඍෂිවරයා විසින්. නපුණෙණා දබ්බිශාහී ඒ ඍෂිවරුන් සත් දෙනාට හැන්දක් ගෙන කොළ තම්බා දෙන පුණණ නම් එතෙක් විය. හෙතෙමෙ හැන්ද අල්ලන ශිල්පය දනී. ඔබ ආචාර්යයා සහිත වූයේ ඔවුන්ට පුණණ නම් නොවේ. ඔහු විසින් දන්නාලද හැන්ද අල්ලන ශිල්ප මාත්‍රයවත් නොදන්නෙහිය. සෙස්ස සියලු තැන නොගැඹුරුමය. ඉෙ අස්සලායන ශ්‍රද්ධා ඇත්තෙක්විය. ප්‍රසන්න වුවෙකි. තමාගේ ගෙහි ඇතුළත චෛත්‍යයක් කරවීය. අද දවස දක්වා අසසලායන වංශයෙහි උපන්නෝ නිවසක් තනවා ඒ නිවස ඇතුළත චෛත්‍යයක්ද කරවත්මය.

### තෙවැනි අසසලායන සූත්‍රයයි.

### 2.5.4

එවමෙමසුතං යනු සොටමුඛ සූත්‍රයයි. එහි බෙම්යමබවනෙ එනම් ඇති අඹ වනයෙහි, ධමමිකො පරිබබාජො ධාර්මික පැවිද්ද, අදසසනා ඔබවැනි පණ්ඩිතයන් පවා නොදැකීමෙන්, යොවා පනෙතථ ධමෙමා මෙහි යම් ධර්මයක් - ස්වභාවයක් වේද එම ධර්මයෙහිවත් නොදැක්මෙන්. මෙහි අපගේ කථාව ප්‍රමාණවත් නොවේ. ධර්මයට ප්‍රමාණ වත්යැයි දක්වයි. ඉන්පසු තෙරුන් වහන්සේ නව පොහොය ගෙහි මෙන් මෙහි බොහෝ කටයුතු වියයුතුයයි සිතා සක්මනින් බැස පන්සලට පිවිස වැඩහුන්හ. එය දක්වන්ට එවං වුතෙත ආදිය කියන ලදී. චතතාරො මෙ බ්‍රාහමණා තෙරුන්ට මෙසේ සිතිණ. මේ බමුණා ධර්මික පැවිද්දට එළම්යේය. ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැතැයි කියයි. මොහු පුද්ගලයන් සතර දෙනාද දෙපිරිස්ද පෙන්වා සතරවැනි පුද්ගලයා කවර පිරිසක් බහුලව බලාදැයි අසන්නෙමි. දන්නේනම් අනගාරිය පිරිසයයි කියයි. මෙසේ සිය මුවින්ම ධාර්මික පරිබ්‍රාජකයෙක් ඇතැයි කියවන්නෙමියි මේ දේශනාව ඇරඹූසේක.

එහි සාරත්ත රත්තා මනාපේ ඇළුණු සානුග්ගහා භාසිතා - උදව්පිණිස කියන ලදී. මෙසේද කියන ලදී. අපගේ කථාව ප්‍රමාණවත් නොවේ. ධර්මයට ප්‍රමාණවත්යැයි මා විසින් කියන ලදී. ගිහියෝ නම් කැපදේද අකැපදේද කියතියි විවේචනය පිණිස විමසුසේක. කාරාපෙසි මැවීය. කරවා කලුරිය කොට ස්වර්ගයෙහි උපන්නේය. මොහු දන්නා ශිල්පයෙහි මවද පියාද ඝාතනය කොට තමාම බැබලිය යුතුයයි පැමිණෙයි. ශිල්පය දන්නේ ඔහු හැර ස්වර්ගයෙහි උපන්නෙක් නම් නැත. මොහු වනාහි තෙරුන් ඇසුරින් පින් කොට එහි ඉපදීද එම කර්මයෙන් මෙහි උපන්නේයයි ආවර්ජනය කොට පවත්නා තත්වය දන එක් දවසක් දිරාගිය බොජුන් හල ප්‍රති සංස්කරණය කරනු පිණිස සංඝයා රැස්වූ කල්හි මිනිස් වෙසින් අවුත් මෙසේ ඇසීය. ස්වාමීනි කුමක්නිසා සංඝයා රැස්වූයේද බොජුන්හල අළුත්වැඩියා කිරීමටය. මෙය කවුරුන් විසින් කරවන ලද්දක්ද ඝොටමුඛ විසින්ය. දූන් ඔහු කොහිද. කලුරිය කළේය. ඔහුගේ කිසියම් ඥාතියෙක් සිටීද, එක් සහෝදරියක් ඇත. ඇය කැඳවනු මැනවයි භික්ෂූහු ඇය කැඳවූහ. හේ ඇය කරා එළඹ මම ඔබගේ සොහොයුරා ඝෝටමුඛ මේ ශාලාව කරවා ස්වර්ගයෙහි ඉපිද අසුවල් අසුවල් තැන මා තැබූ ධනය ඇත. එය ගෙන මේ බොජුන් හල කරවන්න දරුවන්ද පෝෂණය කරන්නැයි කියා භික්ෂු සංඝයා වැඳ අහසට පැන දෙව්ලොවට ගියේය. සෙස්ස සියලු තන්හි නොගැඹුරුමය.

## සිව්වැනි ඝෝටමුඛ සූත්‍රයයි.

## 2.5.5

**එවමෙමසුතං** යනු චංකී සූත්‍රයයි. එහි **දෙවවනෙ සාලවනෙ** එහි දෙවියන්ට බිලියම් කෙරෙති. ඒනිසා එයට දේව වන සාලවනයයි කියනු ලැබේ. **ඔපසාදං අජ්ඣාවසති** ඔපසාද නම් බමුණුගමෙහි වසයි. අභිභවනය කොට වසයි ඔහුගේ ස්වාමියා වී යම් සීමාවක එහි විසිය යුතුනම් ඒ සීමාවෙහි වසයි. මෙහි උපසර්ග වශයෙන් ආධාර අර්ථයෙහි කර්ම විභක්ති වචනයයි දතයුතුයි. එය නොයෙදෙන බැවින්ම සෙසු පදයන්හි එහි ලක්ෂණ ශබ්දශාස්ත්‍ර වශයෙන් සොයා බැලිය යුතුය. **සත්තුස්සදං** සත්වයන් ගෙන් ගැවසුණු. උත්සන්න බොහෝ ජනයා ඇති. මිනිසුන් හෝ ආකීර්ණවූ

පෝෂණය කළයුතු ඇත් අස් මොනර මුව ආදි නොයෙක් සතුන්ගෙන් ආකීර්ණවූද යන අර්ථයි. යම් හෙයකින් එගම පිටත නොපෑගී උපන් ඇත් අස් ආදීන් කන තණකොළවලින්ද ගෙවල සෙවිලිකරන තණ කොළ වලින්ද යුතුය. එසේම දරකැබලි වලින්ද ගෙවල් ලීබඩු තනන ලීවලින්ද එහි ඇතුළත වටකුරු චතුරස්‍රාකාර බොහෝ පොකුණු ණු ජලජ පුෂ්පයන්ගෙන් විචිත්‍රය. පිටත නොයෙක් තඩාග ජලයෙන් නිතර පිරී පවතී. ඒනිසා **සතිණකට්ඨොදකං** යයි කියන ලදී. ධාන්‍ය සහිත **සධඤ්ඤං** පෙර අපර ආහාරභේද වූ බොහෝ ධාන්‍ය සංචිතයක්ය යන අර්ථයි. මේ අයුරින් එගම බ්‍රාහ්මණයා සේසත් ඔසවා රජකුගේ ස්වරූපයෙන් වාසයකරයි. ඔහුගේ සමෘද්ධි සම්පත්තිය දක්වන ලද්දේ වෙයි. රජුගෙන් ලද ධනය **රාජභොග්ග** නම්, කවුරුන් විසින් දෙන ලද ද? පසේනදි කෝසල රජු විසින් දෙනලද **රාජදය්‍යං** රජුගේ දයාදයක්වූ දැවැද්ද යන අර්ථයි. **බ්‍රහ්ම දෙය්‍යං** ශ්‍රේෂ්ඨයන්ට දියයුතු සේසත් ඔසවා රජකුමෙන් අනුභව කළයුතු යන අර්ථයි. නැතහොත් **රාජභොග්ගං** යනු සියලු මිනීමැරුම් අංග විකල කිරීම් ආදිය පාලනය කරමින් තොටුපළ පර්වත ආදීන්හි අයබදු ගෙන සේසත් පිළිගෙන ඔසවා රජකුවී භුක්ති විඳියයුතු එහි පසේනදි කොසොල් රජුවිසින් දෙනලද **රාජදය්‍යං** යනු රජු විසින් දෙන ලද බැවින් රාජදයවූ, දයකරජු දැක්වීම පිණිස ඔහුට පසේනදි කොසොල් රජු විසින් දෙන ලද යන අර්ථයි. බොහෝ බොහෝ වී සමුහ සමුහ වී එක් එක් දිසාවෙහි ඔවුන් සමුහය ඇතැයි සඞ්ඝී, පෙර ගමතුළ සමුහයක් නැත්තෝ පිටතට නික්මගොස් එක්වූවාහු ගණ සම්පන්න වූවාහු **ගණීභූතා** උතුරින් ඇති දෙරටු උත්තරදිසාභිමුඛ **ඛත්තං ආමන්තෙසි** ඛත්තායනු ඇසූ ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දීමෙහි සමර්ථ මහාමාත්‍රයා. ඔහු ඇමතිය. **ආගමෙන්තු** මොහොතක් ගරුකරත්වා හිඳගනිත්වායි කියන ලද්දේවෙයි. **නානා වෙරජ්ජකානං** අනික් නානාවිධ කාසිකෝසල ආදී රාජ්‍යයන්හි උපන්නෝ නිවිසන හෝ එයින් ආවේ යැයි නානා වෙරජ්ජකා. ඔවුන්ගේ කෙනච්දෙව නියම නොකරන ලද යඥයන්ට හිඳගැනීම් වැනි කිසියම් කාර්යයකින් ඔවුහු ඔහුගේ ගමන අසා මෙසේ සිතූහ. මේ උගත් චංකී බමුණා බොහෝ සෙයින් අනික් බමුණෝ ශ්‍රමණ ගෞතමයන් සරණ ගියාහුය. මොහු නොගියේය. මෙතෙමේ යම් හෙයකින් එහි යන්නේ නම් ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේ ආවර්තන මායාවෙහි දූවටී සරණ යන්නේය. ඉන්පසු මොහුගේ ගෙදරත් බමුණන්ගේ එකතුවීමක් නො

වන්නේ ය. මොහුගේ ගමනට අනතුරක් කරන්නෙමු නම් මැනවැයි මන්ත්‍රණය කොට එහි ගියහ. ඒ සඳහා අථබොතෙ බ්‍රාහමණා ආදිය කියන ලදී. **තසා උභතො** මව්පිය දෙපසින්, මොහුගේ මව් බැමිණිය මවගේ මව් බැමිණිය, ඇයගේද මව් බැමිණිය. පිය බමුණා, පියාගේ පියාවූ බමුණා, ඔහුගේ පියා වූ බමුණා මෙසේ මව්පසින්ද පියපසින්ද සුජාතය. **සංසුද්ධගහණිකො** ඔබගේ මව්කුස පිරිසිදුය යන අර්ථයි. **යාව සත්තමා පිතා මහ යුගා** මෙහි පියාගේ පියා පිතාමහය. ඔහුගේ යුගය පිතාමහ යුගයයි. යුගය යනු ආයු ප්‍රමාණයයි කියනු ලැබේ. මෙය කථාමාත්‍රයකි. අර්ථ වශයෙන් පිතාමහම පිතාමහ යුගයයි. ඉන් උඩට සියලු පූර්ව පුරුෂයෝ පිතමහ ග්‍රහණයෙන්ම ගන්නා ලද්දේය. මෙසේ සත්වැනි පුරුෂයා දක්වා පිරිසිදු කුස් ඇත්තේය. නැතහොත් **අක්ඛිත්තො අනුපකුට්ඨො ජාතිවාදෙන** යයි දක්වත්. **අක්ඛිත්තො** යනු මොහු ඉවතට ගනුව. මොහුගෙන් කවර වැඩක්ද යනුවෙන් මෙසේ ඉවත් නොකරන ලද්දේ ආක්‍රෝශයට හෝ නින්දවට නොගියවිරූ කවර කරුණකින්දයත්, ජාතිවාදයෙන් මොහු හීනජාතික යෙකියි මෙබඳු වචනයෙන් යන අර්ථයි. **ඉම්නාපඩ්ගෙන** මේ කරුණෙනුත්, **අඩ්ඪො** ප්‍රධාන, **මහද්ධනො** මහත්වූ ධනයෙන් යුත් ඔබගේ ගෙයි පොළොවෙහි පස්වැලි මෙන් බොහෝ ධනය ඇත. ශ්‍රමණ ගෞතමයෝ නිර්ධනීය. භික්ෂාවෙන් උදරය පුරවා ගෙන යැපෙතියි දක්වත් **මහා භොගො** පංචකාමගුණ වශයෙන් මහා උපභෝග සම්පත් ඇත්තෝය. මෙසේ යම්යම් ගුණයක් කියත්ද එයට ප්‍රතිපක්ෂ වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ අගුණම දක්වමුයි හඟිමින් කියත්. **අභිරූපො** අන් මිනිසුන්ට වඩා රූමත්. **දස්සනීයො** දවසක්ම බලන්වුන්ට අතෘප්තියක් ඇතිකරන හෙයින් දර්ශනයට යෝග්‍ය දර්ශනයෙන් ම පහන් සිත් ඇතිකරන ප්‍රසාද ජනකඃ **පොක්ඛරතා** යනු සුන්දර බවයි. වර්ණයෙහි සුන්දරබව වණ්ණ පොක්ඛරතා ඒ වර්ණ සුන්දර භාවයෙන් වර්ණ සම්පත්තියෙන් යන අර්ථයි. පොරාණයෝ පොක්ඛර යනුවෙන් ශරීරය හඳුන්වති. වර්ණය වර්ණය මය. ඔවුන්ගේ මතයට අනුව වර්ණය ද පොක්ඛරද වණ්ණපොක්ඛර ඒවා ඇතිබව වණ්ණපොක්ඛරතා මෙසේ **පරමාය වණ්ණ පොක්ඛරතාය** යනු උත්තම වූ පරිශුද්ධවූ වර්ණයෙන් මෙන්ම ශරීර පිහිටීම් සම්පතින් යන අර්ථයි. **බ්‍රහමවණ්ණී** ශ්‍රේෂ්ඨ වර්ණ ඇති, පරිශුද්ධ වර්ණයන් අතර ද ශ්‍රේෂ්ඨ වූ ස්වර්ණ වර්ණයෙන් යුක්තවූ යන අර්ථයි. **බ්‍රහමවච්චසී** මහා බ්‍රහ්මයාගේ

ශාරීරය වැනි ශාරීරයෙන් යුත්, අක්ඛුද්දාව කාසො දස්සනාය භවත්හුගේ ශරීරයෙහි දර්ශන අවකාශය සුළු නොවේ මහත්ය. ඔබගේ සියලු අඟපසඟ දර්ශනීයමය. ඒවාද මහත්යැයි දක්වයි. සීලය මොහුට ඇත්තේහුයි සීලවා වර්ධනය කරනලද සීලය මොහුට ඇත්තේහුයි වුද්ධසීලි වුද්ධසීලෙන වෘද්ධවූ වර්ධනය කළාවූ ශීලයෙන්, සමන්නාගතො යුක්ත වූ. මෙය වුද්ධසීල පදයටම වෙනත් වචනයකි. මේ සියල්ල පන්සිල් මාත්‍රයම සඳහා කියත්. කල්‍යාණවාචො ආදීතත්හි කල්‍යාණ වූ සුන්දරවූ පරිපූර්ණ පදව්‍යංජන ඇති වචන මොහුට ඇත්තේහුයි කල්‍යාණවාක්කරණො වාක්කරණ යනු ව්‍යවහාර ඝෝෂාවයි. ගුණ පිරිපුන් බැවින් පෙර වූයේ පොරී නගරයෙහි වූ බැවින්ද පොරී. නාගරික ස්ත්‍රියගේ සුඛුමාලබව මොහු හා සමානනුයි පොරී ඉන් පොරියා විස්සට්ඨාය අබාධිත, සන්දිග්ධ විලම්බිත යන දේෂ රහිත, අනෙලගළාය කෙළගැලීම් විරහිත සමහරුන් කථාකරන විට කෙළ ගලයි. කෙළ වැගිරෙයි. සෙම ද නික්මෙයි. ඔහුගේ වචන එලගළා නම් වේ. එයින් විපරීතවූ යන අර්ථයි. අත්ථස්ස විඤ්ඤාපනියා ආදි මධ්‍ය අවසාන ප්‍රකට කොට කියන ලද අර්ථය දැන් වීමෙහි සමත් මෙහි සෙස්ස බ්‍රාහ්මණ වර්ණයෙහි නොගැඹුරුමය. එවං වුතෙත ඒ බමුණන් විසින් මෙසේ කියන ලද කල්හි, චංකි මේ බමුණෝ තමන්ගේ වර්ණය කියන කල්හි කෝප නොවන කෙනෙක් නම් නැත. මොහුගේ වර්ණය ගැණ වළක්වන්නෙමුයි ජාති ආදියෙන් මාගේ වර්ණය කියති. තමාගේ වර්ණයෙහි ඇලීම මට යුතු නැත. මොවුන් ගේ වාදය බිඳ ශ්‍රමණ ගෞතමයන්ගේ මහත්බව දන්වා මොවුන් එහි යාම සිදුකරමි නම් මැනැවැයි සිතා එසේනම් පින්වත මා කියන්නක් අසන්න ආදිය කීය.

එහි යෙපිඋභතො සුජාතො ආදිය තමාගේ ගුණ හා සමාන ගුණ ඒවාද ශ්‍රමණ ගෞතමයන්ගේ ජාතිසම්පත්ති ආදී ගුණයැයිද තමාගේ ගුණයන්ට වඩා උත්තරීතරයයි හඟිමින් අන්‍යයන් ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ මහත්බව දක්වනු පිණිස ප්‍රකාශ කරයි.

මයමෙව අරහාම මෙසේ නියම කරන්නේ මෙය දක්වයි. ඉදින් ගුණමහත්බව නිසා එළඹියයුතු නම් වෙයි. යම්සේ මහමෙර සමග සසඳා අබ ඇටයද, මහා සමුද්‍රය සමග සසඳ ගවකුරවළදා සප්තමහා සාගර ජලය සමග සසඳා

පිණ්ඩිබිඳුවද සුළුය ළාමකය. එසේම ශ්‍රමණ ගෞතමයන්ගේ ජාතිසම්පත්ති ආදිගුණ සමග සසඳ අපගේ ගුණ සුළුය. ළාමකය. ඒනිසා අපිම සුදුසු වෙමු. ඒ භවත්ගෞතමයන් දකිනු පිණිස එළඹෙත්වා, භූමිගතඤ්ච වෙහාසට්ඨඤ්ච මෙහි රාජාංගණයෙහිද උද්‍යාන යෙහිද සුණු පිරියම්කළ මණ්ඩප ඇති පොකුණු සත්රුවනින් පුරවා බිම තැබු ධනය භූමිගත නම් ප්‍රාසාද ව්‍යුහ ආදිය පුරවා තැබු ධනය වෙහාසගතනම් මෙසේ කුලපරපුරින් ආයේය. තථාගතයන් වහන්සේ උපන් දිනයෙහිම සංඛ එල උත්පල පුණ්ඩරීක යන නිධාන සතරක් එළඹ සිටියේය. ඒවා අතර සංඛ නිධානය ගව්වක් විශාලය. එල නිධානය අඩ ගව්වකි. උත්පල නිධානය ගම් තුනකි. පුණ්ඩරීක නිධානය යොදුනකි. ඒවායෙහිද ගත්ගත් තැන් පිරේමය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ බොහෝ හිරණ්‍ය සුවර්ණයන් අත්හැර පැවිදිවූ සේකැයි දතයුතුයි. දහරොවා ආදිය යට විස්තරකරන ලද්දේමය. අකබුද්ධාච කාසො මෙහි භාග්‍යවතුන් වහන්සේගේ දර්ශනාවකාශය අප්‍රමාණයැයි දත යුතුය. මේ මෙහි කථාවයිඃ රජගහනුවර එක්තරා බමුණෙක් ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රමාණයක් ගන්ට නොහැකියැයි අසා භාග්‍යවතුන් වහන්සේ පිඩු පිණිස පිවිසෙන කල්හි රියන් හැටක් දිග උණගසක් ගෙන නගර දොරට පිටත සිට භාග්‍යවතුන් වහන්සේ පැමිණි කල්හි උණගස ගෙන සමීපයෙහි සිටියේය. උණගස භාග්‍යවතුන් වහන්සේගේ දණ පමණට පැමිණියේය. දෙවැනි දවසෙහි උණගස් දෙකක් එකට තබා සමීපයෙහි සිටියේය. භාග්‍යවතුන් වහන්සේ උණ ගස් දෙක මුදුනෙහි උණගසක් පමණට පෙණී සිටිමින් බමුණ කුමක් කරහි දැයි ඇසුසේක. ඔබ වහන්සේ ගේ ප්‍රමාණය ගනිමි. ඉදින් ඔබ සියලු සක්වළ ගැබ පුරා ඇති උණගස් ගෙන එකට තබා පැමිණෙන්නේ වුවද, මාගේ ප්‍රමාණය ගන්ට නොහැකි වන්නෙහිය. මා විසින් අසංඛ්‍ය කල්ප හාරලක්ෂයක් පාරමිතා පුරනුලැබුවේ නොවේද? මාගේ ප්‍රමාණය කෙසේ ගන්නද? බමුණ තථාගතයන් වහන්සේ අතුල්‍යයි අප්‍රමේයයි කියා ධම්මපදයෙහි ගාථාවක් කීසේක. ගාථාවගේ කෙළවර අසූහාරදහසක් ප්‍රාණීහු අමෘතය බීවාහුය. තවත් කථාවක් ඇතඃ රාහු අසුරේන්ද්‍රයා යොදුන් හාරදහස් අටසියයක් උසය. ඔහුගේ බාහු අන්තරය යොදුන් එක් දහස් දෙසියයකි. අතුල් පතුල් වල පළල යොදුන් තුන් සියයකි. ඇඟිලි පුරුක් යොදුන් පනසකි. ඇස්බැම් අතර යොදුන් පනසකි. නළල යොදුන් තුනකි. හිස යොදුන් නවසියයකි. ඒ මම උසවෙමි. නැමී ශාස්තෘන් වහන්සේ බලන්නට

නොහැකියයි නොයයි. හේ එක් දවසක් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ අසා කෙසේ හෝ බලන්නෙමියි පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ අදහස දැන ඉරියව් සතරින් කුමකින් දක්වම්දැයි සිතා මිටිපුද්ගලයා සිටගෙන සිටිනවිට උසට පෙනෙයි. වැදහෙවම තමා දක්වන්නෙමියි ආනන්ද ගඳකිළි මිදුලෙහි කුඩා ඇඳක් පනවයි කියා එහි සිංහ සෙය්‍යාව කළසේක. රාහු පැමිණ වැදහොත් භාග්‍යවතුන් වහන්සේ දෙස ගෙල නගා අහසමැද පූර්ණ චන්ද්‍රයා බලන්නාක් මෙන් බලයි. අසුරේන්ද්‍රය මේ මොකද්දැයි කීකල්හි භාග්‍යවතුන් වහන්සේ දෙස නැමී බලන්ට නොහැක්කෙමියි නොපැමිණියෙමි. අසුරේන්ද්‍රය මා විසින් පාරමිතාවන් පුරනුලැබුවේ යටබැලූ මුහුණින් නොවේ. දනයදුන්නේ උඩට අග් ඇතිවයි. එදවස රාහු සරණගියේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස සුළු අවකාශයක් ඇත්තේ නොවේ, චතුපාරිශුද්ධි ශීලයෙන් සිල්වත්ය. ඒ ශීලය වනාහි ආර්යය. උත්තරය පරිශුද්ධය එහෙයින් අරියසීලි ආදිය කීහ. මෙය නිවැරදි අර්ථයෙන් කුසලයි. එහෙයින් **කුසලසීලි** යයි කීහ. **කුසලෙන සීලෙන** යනුත් මෙයට වෙනත් වචනයකි. **බහුනනං ආචරිය පාචරියො** භාග්‍යවතුන් වහන්සේගේ එක් එක් ධර්ම දේශනාවෙන් අසූහතර දහසක් ප්‍රාණිහුද, අප්‍රමාණවූ දෙවිමිනිස්සුද මාර්ගඵල නමැති අමෘතය පානය කරති. ඒනිසා බොහෝ දෙනකුට ආචාර්ය වෙති. හික්මවියයුතු ශ්‍රාවකයන්ට ප්‍රාචාර්ය වෙති. **ඛීණ කාම රාගො** මෙහි භාග්‍යවතුන් වහන්සේගේ සියලු කෙලෙස් ක්ෂය වී ඇත. බමුණා ඒබව නොදනී. තමා දන්නා තැනදී පමණක් ගුණ කියයි. **විගතචාපලෙලා** පාත්‍රය හැඩගැන්වීම් සිවුර හැඩගැන්වීම් සෙනසුන් හැඩ ගැන්වීම් මේ කුණුකයට ආශා කිරීම නැවත ආශා කිරීමයි කියන ලද චපල බව නැති **අපාප පුරෙක්ඛාරො** පාපයන් නොවන නව ලෝකෝත්තර ධර්මයන් පෙරටු කොට හැසිරේ. **බ්‍රහමඤ්ඤාය පජාය** සැරියුත් මුගලන් මහකසුප් ආදී වශයෙන් බෙදුණු බ්‍රාහ්මණ ප්‍රජාවෙහි මේ පූජාවෙහි පිළිගැනීම. මේ ප්‍රජාව ශ්‍රමණ ගෞතමයන් පෙරටු කොට හැසිරේ යන අර්ථයි. එසේවුවත් පව්නොවන දේ පිළිගැනීම පාපය පෙරටු කොට හැසිරීම නොවේ. පාපය කැමති නොවේ යන අර්ථයි. ඔහුට බ්‍රහ්මයාගෙන් උපන් ප්‍රතිවිරුද්ධ බ්‍රාහ්මණ ප්‍රජාවට විරුද්ධනොවේ හිතසුව අපේක්ෂා කරන්නේමයැයි කියන ලද්දේවෙයි. **තිරොරට්ඨා** වෙනත් රටකින්, **තිරො ජනපද** වෙනත් ජනපදවලින් **සමපුච්ජිතුං ආගච්ජන්ති** ක්ෂත්‍රිය පණ්ඩිත

ආදීහුද බ්‍රහ්ම නාග ගන්ධර්ව ආදීහුද ප්‍රශ්න රැස්කොට ගෙන අසන්නෙමුයි පැමිණෙති. එහි කිසිවෙක් ඇසීමෙහි දෝෂයක් හෝ විසර්ජන සම්පටිච්ඡනයෙහි අසමත්බව සලකා නොඅසා නිශ්ශබ්දව හිඳගනිත්. සමහරෙක් අසති. සමහරුන්ට භාග්‍යවතුන් වහන්සේම ඇසීමට උත්සාහ උපදවා විසඳනසේක. මෙසේ ඒ සැමදෙනගේම විමතීහුනෙ රට පැමිණ මහාසමුද්‍රයව පැමිණෙන රළ මෙන් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ බිඳෙත්. මෙහි තථාගතයන් වහන්සේගේ සෙසු ගුණ නොගැඹුරු මය. **අතිථිනො හොනති** ඔවුහු අපගේ ආගන්තුකයෝ නවකයෝ ආහාරදියයුත්තෝ වෙති. යන අර්ථයි. **පරියාපුණාමි** දනිමි. අප්‍රමාණ ගුණ ඇත්තේයයි එබඳුම සර්වඥ කෙනකු විසින් අප්‍රමාණ ගුණ ඇත්තේයයි අපවැන්නවුන් ගැන කියනුම කවරේද්‍රයි දක්වයි කියන ලද්දේ මය.

**බුදෙධාපි බුද්ධසස භණෙයා වණණං**
**කපපමපි චෙ අඤඤම භාසමානො**
**ඛීයෙථ කපෙපා චිර දීඝ මනතරෙ**
**වණෙණා නඛීයෙථ තථාගතසස**

අන් දෙයක් නොකියාම
කල්පයක්වුව බුදුකෙනෙක්
බුදුකෙනෙකුගේ ගුණවණත් නම්
දිගුකලක් ගියතැන කල්පය ගෙවී ගිය ද
බුදුන්ගේ ගුණ නොගෙවේ.

මේ ගුණ කථාව අසා ඒ බමුණෝ මෙසේ සිතූහ. යම්සේ චංකී බ්‍රාහ්මණයා භවත්ගෞතමයෝ උතුම් ගුණ අත්තෝයයි ශ්‍රමණ ගෞතමයන්ගේ ගුණ කියයි. මෙසේ උන්වහන්සේගේ ගුණ දන්නා මොහු විසින් බොහෝ කලක් ඉවසන ලදී. ඔහු අනුව පවතින්නෙමුයි අනුව පවතිමින් **තෙනහි හොති** ආදිය කීහ. **ඔපාතෙති** ප්‍රවේශ කරවයි. **සමපුරෙකඛරොනති** දරුමුණුබුරන් සේ පෙරටු කොට ගෙන හැසිරෙත් **මනතපදං** මන්ඉම මන්ත්‍රපදනම්. වේදය යන අර්ථයි. **ඉතිහිතිහ පරමපරාය** මෙසේය මෙසේයයි පරපුරින් පරපුරට ආවේයයි දක්වයි. **පිටක සමපදය** වචන බන්ධන සම්පත්තියෙන්. සාවිත්‍රී ආදී

ඡන්දසින් බැඳුණු වර්ග බන්ධවලින් සම්පාදනය කොට ආවේයයි දක්වයි. **තස්ථව** ඒ මන්ත්‍රපදයෙහි, **පවත්තාරො** පවත්වන්නෝ, **යෙසං** යමකු සතු, **මන්තපදං** වේදසංඛ්‍යාත මන්ත්‍රපදයම **ගීතං** අෂ්ටක ආදී පැරණි බමුණන් විසින් ස්වර සම්පත්ති වශයෙන් සජ්ඣායනය කරන ලද. **පවුත්තං** අන්‍යයන්ට කියන ලද කියවන ලද යන අර්ථයි. **සමීහිතං** එකට එකතුකළ රැස්කරනලද, පිඬුකොට තබන ලද යන අර්ථයි. **තදනුගායන්ති** දූන් බමුණෝ එය ඒ සියල්ලන් විසින් ගැයුදෙය ඒ අනුව ගායනා කරති. අනුව සජ්ඣායනය කරති. **තදනුභාසන්ති** එය ඒ අනුව කියති. මෙය පෙර කියුදෙයට වෙනත් වචනයකි. **භාසිතමනුභාසන්ති** ඔවුන් විසින් අන්‍යයන්ට කියවූ දෙය ඒ අනුව කියවති. **සෙය්‍යථීදං** ඒ මොනවාද යන අර්ථයි. **අට්ටකො** ආදිය ඔවුන්ගේ නම්ය. ඔවුහු දිවැසින් බලා අනුන් නොනසා කාශ්‍යප සම්බුදු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සමග සන්සන්දනය කොට මන්ත්‍ර ගෙතූහ. තවතවත් බමුණෝ පාණාතිපාත ආදිය ප්‍රතික්ෂේප කොට ත්‍රිවේද බිඳ බුද්ධවචනයට විරුද්ධ කළහ. **අන්ධවෙණි** අන්ධ ප්‍රවේණිය, ඇස ඇති එකකු විසින් ගන්නා ලද යෂ්ටියෙහි කොන එක් අන්ධයෙක් ගනී. ඒ අන්ධයා අන්‍යයෙක්ද ඒ අන්ධයා අන්‍යයෙක්ද වශයෙන් මෙසේ පනහක් හැටක් අන්ධයෝ පිළිවෙළින් ගළපන ලද්දාහු අන්ධවේණී යයි කියනු ලබත්. **පරම්පරා සංසත්තා** ඔවුනොවුන් ලැගුණු යෂ්ටිය අල්ලා ගන්නා ඇස් ඇත්තා විසින් වාසය කරවන ලද යන අර්ථයි.

එක් ධූර්තයෙක් අන්ධ ගණයා දූක අසුවල් ගමෙහි කෑම බීම සුලභයය උනන්දුකරවා ඔවුන් විසින් ස්වාමීන් අප එහි ගෙනයන්න. ඔබලාට මෙය දෙමියි කීකල්හි අල්ලස්ගෙන අතරමැදි මගින් පිටපැන මහත්වූ පඳුරක් වට කොට ඉදිරියෙන් සිටි එකාගේ අතින් පසුව සිටි එකාගේ කිහිල්ල ගන්වා, මට කටයුත්තක් ඇත තොපි යවුයයි කියා පළා ගියේය. ඔවුහු දවසම ගොස් මාර්ගය නොදන්නාහු කෝ මාර්ගය කෝ මාර්ගයැයි හඬා වැළප මාර්ගය නොලැබ එහිම මියගියහ. ඔවුන් සඳහා **පරම්පරා සංසත්තා** යි කියන ලදී. **පුරිමොපි** පෙර බමුණන් දසදෙනාගෙන් එකෙක්වත් **මජ්ඣිමොපි** මැද ආචාර්ය ප්‍රාචාර්යයන් ගෙන් එකෙක්වත්. **පච්ඡිමොපි** දූන් බමුණන් ගෙන් එකෙක් වත් **පඤ්චබො** පාළියෙහි ආ දෙදෙනාගෙන් මෙබඳු අනෙක් තිදෙනෙක් ප්‍රතික්ෂේප කොට කියයි. **අවිධාවිපාකා** සිදුවූ විපාක සහ

නොසිදුවූ විපාක නාලමෙත්‍ථ භාරද්වාජ, සත්‍යය ආරක්ෂා කරන්නෙමියි පිළිපන්නාවූ නුවණැත්තහු විසින් යමක් මාවිසින් ගන්නා ලදද මෙයම සත්‍යයැයිද අනික හිස්යැයි ද මෙසේ එක් අංශයකින් නිෂ්ඨාවට යාම සුදුසු නොවේ යැයි තවත් විමසීමෙන් මාර්ගය විවර කර තැබීය. භාරද්වාජ මෙහි භික්ෂුහු ජීවක සූත්‍රයෙහි මෙන්ද මහාවච්ඡ සූත්‍රයෙහි මෙන්ද තමන්ම සඳහා කියයි.

**ලොභනීයෙසු ධම්මෙසු** ලෝභ ස්වභාවයන්හි, සෙසු පදදෙකෙහිද මෙම ක්‍රමය මැයි. **සද්ධං නිවෙසෙති** ඕකප්පනිය ශ්‍රද්ධාව වඩවාගනී. **උපසඞ්කමති** ළගට යයි. **පයිරුපාසති** අසලහිඳී **සොතං** සොතපපසාදය යොමුකරයි. **ධම්මං** දේශනා ධර්මය අසයි. **ධාරෙති** ප්‍රගුණ කොට දරයි. **උපපරික්ඛති** අර්ථවශයෙන්ද කාරණ වශයෙන්ද විමසයි. **නිජ්ඣානං ඛමන්ති** බැලීම ඉවසත්. මෙහි ශීලය කියන ලද්දේය මෙහි සමාධිය කියන ලද්දේයැයි අවබෝධකරගනිත් යන අර්ථයි. **ඡන්දො** - කත්තුකම්‍යතාව - කිරීමේ ආසාව **උස්සහති** වෑයම් කරයි. **තුලෙති** අනිත්‍යාදි වශයෙන් තීරණය කරයි. **පදහති** මාර්ග ප්‍රධානය අරඹයි. **කායෙනචෙව පරම සච්චං** සමග උපන් නාමකායෙන් ම නිවන සාක්ෂාත් කරයි. **ප්‍රඥවෙන්** කෙලෙස් බිඳහැර එම සත්‍යයම ප්‍රකටව දකී. **සච්චානුබොධො** මාර්ග අවබෝධය. **සච්චානුපත්ති** ඵල සාක්ෂාත් කිරීම. **තෙසඤ්ඤෙව** යට කිවූ දෙළොස් දීර්ඝමාර්ග වාද අනුවයයි. ඒනිසා මෙය අර්ථය නොවේ. මේ මෙහි අර්ථයයි. **තෙසඤ්ඤෙව** යනු මාර්ග සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ, **ප්‍රධානං** මාර්ග ප්‍රධානය. එය ඵල සාක්ෂාත් කිරීම් සාංඛ්‍යාත සත්‍යානුපත්තියෙහි උපකාරකයකි. මාර්ගය නැතිකල ඵලයක්ද නැති බැවිනි. මේ ක්‍රමයෙන් සියලු පදයන්හි අර්ථය දතයුතුය. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

**පස්වැනි චංකී සූත්‍රයයි.**

**2.6.6**

**එවමෙමසුතං** යනු එසුකාරි සූත්‍රයයි. එහි **බිලංබලෙගෙයවුං** කොටසක් තබා ගන්වත්. මෙයින් ගැල් ධර්මය පෙන්වයි. සාත්තුනායකයා

මහා කාන්තාරයට පිළිපන්නේ අතර මඟ ගොනු මළකල්හි මස් ගෙන සියලු සාත්තු වාහකයන්ට මෙය කා මෙපමණ මුදල් දියයුතුයයි කොටසක් තබාගනී. ගවමස් කන්නෝ ද ඇත. නොකන්නෝද ඇත. මුදල්ගෙවීමට හැක්කෝද වෙති. නොහැක්කෝද වෙති. සාත්තුනායකයා යම් මිලකින් ගොනා මිලට ගන්නා ලද්දේද එය පියවන තුරු සියලු දෙනාට බලාත්කාරයෙන් කොටසක් දී මුදල් ගනී. මෙය ගැල් ධර්මයනම් මේ අයුරින්ම බමුණෝද ලෝකයාගේ ප්‍රතිඥව නොගෙන තමාගේම ස්වභාවයෙන් හැසිරීම් ක්‍රම සතරක් පනවත් යැයි දක්වන්ට එවමෙවබො ආදිය කීය. **පාපියො අස්ස** පවක් වෙයි. **සෙය්‍යො අස්ස** යහපතක් වෙයි. නැතහොත් පාපියො යනු පව්කරන්නා, ළාමක ආත්මභාවයක් වෙයි. **සෙය්‍යො** ශ්‍රේෂ්ඨ උත්තම, **සෙය්‍යං සො** යහපත, **උච්චාකුලිනතා** උසස් කුල අතිබැවින් යහපත්, **පාපියංසො** පාපී. උසස් කුල ඇතිබැවින් ද ක්ෂත්‍රිය කුලය හා බ්‍රාහ්මණ කුලය යන කුලදෙක්හි වැඩෙයි. උදර ගුණ ඇතිබැවින් කුල තුනක වැඩෙයි. වෛශ්‍යයාද උදරගුණ ඇත්තෙක් වේ. මහත් භෝග සම්පත් ඇති හෙයින් කුලසතරෙහිද ශුද්‍රයාද අඩුවශයෙන් චණ්ඩාලයාද මහා භෝග ඇත්තෙක් වේමය. **භික්ඛා චරියං** කෝටියක් ධනය ඇති බ්‍රාහ්මණයා භික්ෂාවෙහි හැසිරිය යුතුය. පැරණි බමුණෝ අසූකෙළක් ධනය ඇත්තෝ වුවද එක් වේලක් භික්ෂාවෙහි හැසිරෙත් කුමක් හෙයින්ද දූප්පත් කල්හි හැසිරෙන්නවුන්ට දැන් භික්ෂාවෙහි හැසිරෙන්ට ආරම්භ කළහයි ගර්හාවක් නොවන්නේය. **අතිමඤ්ඤමානො** යමෙක් භික්ෂාචාර වංශය හැරදමා ආයුධවිකුණා ජීවත්වන කර්මයෙන් හා වෙළඳම ආදී කර්මයන්ගෙන් ජීවිකාව කරයිද මෙය අතිමඤ්ඤති නම් වේ. **ගොපොවා** යම්සේ ආරක්ෂකයා තමාවිසින් රකින ලද භාණ්ඩ සොරකම් කරන්නේ නොකට යුත්තක් කරන්නෙක් වේද එසේ යන අර්ථයි මේ ක්‍රමයෙන් සියලු වාරයන්හි අර්ථය දතයුතුය. **අසිත** ව්‍යාභඞ්ගී තණකොළ කපන දෑකැත්තද කදද. **අනුසසරතො** යම් තැනෙක උපන්නෙක් එහි පූරාණයෙහි මව්පියකුලවංශයන් සිහිකරන කල්හි යන අර්ථයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

**සවැනි එසුකාරී සූත්‍රයයි**

## 2.5.9

එවමෙමසුතං යනු ධානඤ්ජානි සූත්‍රයයි. එහි දක්ඛිණාගිරිසම්ං යනු ගිරි යනු පර්වතයයි. රජගහනුවර වටකොට සිටි පර්වතයෙහි දකුණු දිග්භාගයෙහි ඇති ජනපදයෙහි මේ නමයි. තණ්ඩුලපාලද්වාරායං රජගහනුවර මහදෙර තිස් දෙකක්ද, කුඩා දෙර හැටහතරක්ද විය. ඉන් එකක් තණ්ඩුලපල්ලදෙර නම් ඒ සඳහා මෙය කියන ලදි. රාජානං නිසසාය යව, මිනිසුන් නෙපෙළා දහසින් කොටස ගනුවයි රජුවිසින් යවන ලද්දේ ගොස් සියලු අස්වැන්න ගනී. ස්වාමීනි අප නොනසනු මැනවැයි කීකල්හිද රජගෙදර බඳු මඳය. මම රජු පැමිණෙන කල්හිම මෙසේ අණ ලැබුවෙමි. නොහඩවු මෙසේ රජුන්නිසා බමුණු ගෘහපතියන් සූරා කයි. ධාන්‍ය බොහොමයක් තමාගේ ගෙට යවා සුළු ප්‍රමාණයක් රජගෙදරට යවයි. කිමෙක්ද බමුණ ගෘහපතියන්ට පීඩාවක් නොකළේදැයි කියන ලද්දේ, එසේය මහරජතුමනි, මේ කන්නයෙහි කුඹුරුවල අස්වැන්න අඩුය. ඒනිසා නොපෙළා ගැනීමෙන් බොහෝවක් නැත. මෙසේ බමුණු ගෘහපතියන් නිසා රජුන් සූරාකයි.

පයො පීයයතෙ උණුකිරිදහර පානය කරාවා තාව භතතසස කිරිබී හිඳින විටම බතට කල්වන්නේය. අපගේ උදේ ආහාරය ගෙන එන්නාහු යැයි දක්වයි. මව්පිය ආදීන් අතර මහලු මව් පියෝ මෘදු ඇතිරිලි, පොරොනා, සියුම් වස්ත්‍ර මිහිරි බොජුන් සුවඳ මල්දම් ආදිය සොයා පෝෂණය කළයුත්තෝය. දූ දරුවන්ට නම් තබන මඟුල් ආදී සියලු කටයුතු කරන්නහු විසින් අඹුදරුවෝ පෝෂණය කළයුත්තෝය. මෙසේ නොකරන විට අවමානයක් ඇතිවෙයි මේ ක්‍රමයෙන් අර්ථය දතයුතුය. අධමමචාරී පංච දුශ්චරිත කර්මහෝ දශ දුස්සීල කර්ම හෝ මෙහි අධම්ම නම් උපකඩෙඩයූං පංචවිධ වධබන්ධන ආදී කර්ම කිරීම පිණිස ඒ ඒ නිරය වෙන්කෙරේ. ධමමචාරී ධාර්මික කෘෂි වාණිජ්‍ය ආදී කර්මාන්ත කරන පටික්කමනති බැසනොයත් නොපිරිහෙත්. අභික්කමනති පැතිරෙත් වැඩෙත්. සෙයෙයා වඩා උතුම්ය. හීනෙ නිහීන ළාමක. කාලකතො සාරි පුතතාවා මෙය භාග්‍යවතුන් වහන්සේ එහි ගොස් ඔහුට දේශනා කරනු මැනවැයි යන අදහසින් තෙරුන්ට කීසේක. තෙරුන් වහන්සේද ඒකෙණෙහිම ගොස් මහා

බ්‍රහ්මයාට ධර්මය දේශනාකරති. එතැන් පටන් සිව්පද ගාථාවක් කියන්නේ නමුදු චතුස්සත්‍යය විමුක්තවූදෙය නොකීහ.

## සත්වැනි ධානඤ්ජානි සූත්‍රයයි.

## 2.5.8

**එවමෙමසුතං** යනු වාසෙට්ඨ සූත්‍රයයි. එහි **ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ** ඉච්ඡානංගල ගමට නුදුරෙහි වනළැහැබෙහි චංකී ආදී පස්දෙන පසෙනදී කොසොල් රජුගේ පුරෝහිතයෝය. **අඤ්ඤෙච අභිඤ්ඤාතා** අන්‍යවූ බොහෝ ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෝ, ඔවුහු මාස හයකට වරක් දෙතැනක රැස්වෙති. යම් කලෙක ජාතිය පිරිසිදු කිරීමෙහි කැමැත්තෝ වෙත්ද එකල්හි පොකබරසාතීගේ සමීපයෙහි ජාතිය පිරිසිදු කිරීම පිණිස උකකටඨානුවර රැස් වෙති. යම් කලෙක මන්ත්‍ර පිරිසිදු කරනු කැමැත්තෝ වෙත්ද එකල්හි ඉච්ඡානංගල ගමෙහි රැස්වෙති. මේ කාලයෙහි මන්ත්‍රශෝධනය සඳහා එහි රැස්වූහ. **අයමන්තරා කථා** තමාගේ සහායභාවයව සුදුසුවූ යම්කථාවක් කරන්නේ අනුව හැසිරුණාහ. ඒ කථාව අතරතුර තවත් කතාවක් ඇතිවිය. **සීලවා** ගුණාවත්. **වත්තසම්පන්නො** ආචාර සම්පන්න **අනුඤ්ඤාත පටිඤ්ඤාතා** තෙපි හික්මෙවූ යයි මෙසේ ගුරුවරුන් විසින් අනුදන්නාලද, එසේය ගුරුතුමනි, හික්මුණෙමුයි මෙසේ තමාද ප්‍රතිඥාත වූහ. අසම වෙමු. **අහං පොක්ඛරසාතිස්සරු තාරුක්ඛස්සායං** මාණවො මම පොකබර රසාතිගේ දෙටු අතවැසියාය. අග්‍රශිෂ්‍යයාය මොහු තාරුකඛගේ අතවැසියායැයි දක්වයි. **තෙවිජ්ජානං** ත්‍රිවේදය දත් බමුණන්ගේ **යදක්ඛාතං** යමක් අර්ථවශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන්ද එක් පදයක්වත් කියන ලදී. එහි **කෙවලිනො සමසෙ** ඒ සියල්ල දන්නා නිසා එහි නිෂ්ඨාවට ගියෝ වෙමුයි යන අර්ථයි. දැන් ඒ කේවලභාවය එළිදරවු කරන්නේ පදකසමා ආදිය කීය. එහි **ජප්පෙ ආචරිය සදිසා** කථාකරන ස්ථානයෙහි අපි ගුරුවරයා බඳු වෙමු. **කම්මනා** දශකුශලකර්ම පථ කර්මයෙන් මොහු පෙර සප්තවිධවූ කායවචී කර්මය සඳහා යතො බො හො **සීලවාහොති** ආදිය කීය. ත්‍රිවිධ මනෝ කර්මය සඳහා **චිත්ත සම්පන්නො** යයිද එයින් යුත් තැනැත්තේ ආචාර සම්පන්න වෙයි. චක්ඛුමා පසැයින් ඇස්ඇති බැවින් භාග්‍යවතුන් වහන්සේ

අමතයි. බයාතීතං අධුබව ඉක්මගිය බව පරිපූර්ණය යන අර්ථයි. **පෙච එළඹ නමස්සන්ති** නමස්කාරකරති. **චක්ඛුං ලොකෙ සමුප්පන්නං** අවිද්‍යාන්ධාකාර ලෝකයෙහි ඒ අන්ධකාරය දුරුකර ලෝකයට දිට්ඨ ධම්මික ආදී අර්ථදර්ශනයෙන් ඇසක්වී මෙසේ වාසටඨ විසින් ස්තුතිකොට ඉල්ලාසිටින ලද. භාග්‍යවතුන් වහන්සේ දෙදෙනාටම සංග්‍රහ කරනසේක් **තෙසං වොහං ව්‍යාකඛිස්සන්ති** ආදිය කියූ සේක. එහි **ව්‍යාකඛිස්සං** ප්‍රකාශ කරන්නෙමි. **අනුපුබ්බං** බ්‍රාහ්මණ චිත්තාව තිබීයේවා තණ රුක් කීට පතඞග යන්ගේ පටන් පිළිවෙළින් කියන්නෙමි යන අර්ථයි. **ජාතිවිභඞගං** ජාති විස්තරය ජාතිහු අන්‍යොන්‍යය ඒ ඒ ප්‍රාණීන්ගේ ජාතීහු අන්‍යොන්‍යව නානාප්‍රකාරය යන අර්ථයි. **තිණරුක්ඛෙ** අනුපාදිණ්ණක ජාතිය කියා පසුව උපාදිණ්ණක ජාතිය කියන්නෙමි. මේ අයුරින් ඔහුට ජාතිභේදය ප්‍රකට වන්නේයයි මේ දේශනාව ආරම්භ කළ සේක. මහාසීවලි තෙරුන් වහන්සේ ස්වාමීනි. අනුපාදිණ්ණකය බීජ නානාත්වය නිසා නානා ප්‍රකාර වන්නේද කම්මනානා ත්වය නිසා වන්නේද එසේ කියන්ට නොවටී දැයි විචාරන ලද සේක් එසේය නොවටී කර්මයම නාහි සම්භවයෙහි දමයි. සම්භවයෙන් හටගත් මේ සත්වයෝ නානාවර්ණ ඇත්තෝ වෙති. **තිණරුක්ඛ** යනු මෙහි ඇතුළත එළයයි. පිටත හරයයි. යටත් පිරිසෙයින් තල්පොල් ආදිහු ද තෘණ වෙති. ඇතුළත හරය ඇත්තාහු පිටත එළයයි සියල්ලෝ රුක් නම් වෙති. **නචාපි පටිජානන්ති** අපි තෘණය අපි වෘක්ෂය, නැතහොත් මම තෘණය මම වෘක්ෂයයි කියා නොදනිත්. **ලිඞගං ජාතිමයං** නොදන්නවුන්ගේද ජාතිමයයයි සටහන් ඇත. තමාගේ මූලභූතවූ තෘණ සමානම වෙයි. කුමක් නිසාදයත් ජාතිහු අන්‍යොන්‍ය වෙති. යම් හෙයකින් තෘණ ජාතිය අනිකකි. වෘක්ෂජාතිය අනිකති. තෘණ අතරද තාලජාතිය අන්‍යය. නාළිකෙර ජාතිය අන්‍යය මෙසේ විස්තර කළ යුතුය. මෙයින් මෙය දක්වයි. යමක් ජාති වශයෙන් නානා ප්‍රකාර වේද, එය තමාට ප්‍රතිඥාවක්ද අන්‍යයන්ට උපදේශයක්ද නුවුවත් අන්‍යජාතිකයා විශේෂයෙන් ගැනේ. ඉදින් ජාතියෙන් බ්‍රාහ්මණයකු වන්නේ නම් හෙතෙමේද තමාට ප්‍රතිඥාවක්ද අන්‍යයන්ට උපදේශයක් මිස ක්‍ෂත්‍රිය වශයෙන් වෛශ්‍ය වශයෙන් ශුද්‍රවශයෙන් විශේෂ යෙන් ගැනේ. ඒනිසා ජාතියෙන් බමුණෙක් නොවේ. **පරතොපන යථා එතාය ජාතිසු** යන ගාථාවෙන් මේ අර්ථය වචනභේදයෙන්ම හෙළිකරන්නේය.

මෙසේ අනුපාදිණ්ණයන් අතර ජාතිය දක්වා උපාදිණ්ණයන් අත දක්වන්නේ ඉන්පසු කීටෙ ආදිය කීය. යාව කුන්ථකිපිලලිකෙ කුරුකුහුඹුවන් පර්යන්ත කොට යන අර්ථයි. මෙහිදී යමෙක් උඩපැන යත්ද, ඔවුහු පටඬ්ග (පළඟැටි) නම් වෙති. අඤ්ඤමඤ්ඤාහි ජාතියො ඔවුන් අතරද නිල්රතු ආදී වර්ණ වශයෙන් ජාතීහු නානා ප්‍රකාරවෙති. ඛුද්දකෙ බමර ආදීහු මහලලකෙ බළල් ආදීහු පාදූදරෙ උරගයන් යමෙකුගේ උදරයම පාදවේනම් ඔවුන්ගේ පාද දීඝපිට්ඨී සර්පයන්ගේ හිස සිට නගුට තෙක් පිටම වෙයි. එහෙයින් ඔවුහු දීඝපිටයී යයි කියනු ලබත් උදකෙ ජලයෙහි, ජලයෙහි උපන් පක්ෂි කුරුල්ලෝ ඔවුහුම පියාපත්වලින් යතියි පත්තයානා නම්, අහසින් යතියි වෙහෙංගම නම් මෙසේ ගොඩබිම ජලය ආකාශය ගෝචර කරගත් ප්‍රාණීන්ගේ ජාති භේදය දක්වා. දැන් කුමන අදහසින් එය දැක්වීද එය හෙළිදරවු කරන්නේ යථා එතාහු යන ගාථාව කීය. එහි අර්ථය මෙසේය. සංක්ෂේපයෙන් කියා ඇත. විස්තර වශයෙන් යමක් මෙහිදී කිවයුතුනම් එය තමාට දක්වන්නේ නකෙසෙහි ආදිය කීය. මේ මෙහි යෙදුමයි. යමක් කියන ලද නම් තසී මනුසෙසසු ලිඞ්ගං ජාතිමයං පුථු යනුවෙන් එබන්දක් නැතැයි දතයුතුය. ඒ කෙසේදයත් නකෙසෙහි බමුණන්ට එබඳු කෙස් ඇත. ක්ෂත්‍රියයන්ට මෙබඳුයයි නියමයක් ඇත. ඇත් අස් මුව ආදීන්ට ද මේ ක්‍රමයෙන් සියල්ල ගැළපියයුතුය. ලිඞ්ගංජාතිමයං නෙව යථා අඤ්ඤාසු ජාතිසු මෙය කියන ලද අර්ථයෙහි නිගමනයයයි දත යුතුය. එහි යෙදිම මෙසේය. යම්හෙයකින් මේ කෙස් ආදියෙන් ජාතිමය මහත් ලිංගයක් මිනිසුන් අතර නැද්ද. ඒනිසා යැයි මෙය දතයුතුය. බ්‍රාහ්මණ ආදී භේද ඇති මිනිසුන් අතර ලිඞගය ජාතිමය නොවේ. යථා අන් ජාතීන් අතරද දැන් ජාතිභේදයක් නැතිකලද බ්‍රාහ්මණ ක්ෂත්‍රිය යන මේ නානාත්වය ඇත. එය උපන් අයුරින් දක්වන්ට පච්චත්තං යන ගාථාව කිය. එහි වොකාරං යනු නානාත්වයයි. මෙය මෙහි සංක්ෂේප අර්ථයයි. තිරිසන් යෝනීන්ගේ ඇතිවීම මෙන්ම. කෙස් ආදී සටහනින් නානාත්වයක් වේද එසේ බ්‍රාහ්මණ ආදීන්ටද තම තමාගේ ශරීරයෙහි එය නැත. මෙසේ ඇති කල්හිත් බ්‍රාහ්මණ ක්ෂත්‍රිය යැයි නානාත්වයක් වේනම් ඒ නානාත්වය ද මනුෂ්‍යයන් සමග සසඳ කියනු ලැබේ. ව්‍යවහාර මාත්‍රයෙන්ම කියනු ලැබේ. මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේ භාරද්වාජ ගේ වාදයට නිග්‍රහකොට දැන් ජාතියෙන් බ්‍රාහ්මණ වන්නේ නම් ආජීව ශිල ආචාරයෙන් පිට පැත්තකුද බ්‍රාහ්මණයකු

වියයුතුය. පැරණි බ්‍රාහ්මණයෝ ඔහුගේ බ්‍රාහ්මණබව කැමති නොවෙති. ලෝකයෙහි අනිකුත් නුවණැති මනුෂ්‍යයෝ ඒනිසා වාසෙට්ඨගේ වාදය පිළිගනිමින් **යොහි කොචි මනුස්සෙසු** යන ගාථා අට කීහ. එහි **ගොරක්ඛං** කුඹුරු රැක්ම, කෘෂිකර්මයයි කියන ලද්දේවෙයි. ගො යනු පෘථුවියට නමකි. ඒනිසා කීය. **පුථු සිප්පෙන** රෙදිවිවීම් කර්මාන්ත ආදි නොයෙක් ශිල්පයෙන්. **වොහාරං** වෙළඳම **පරපෙස්සෙන** අනුන්ට බැලමෙහෙවර කිරීමෙන් **ඉස්සත්ථං** ආයුධ තැනීම. ඊතලය පිහිය දැයි කියන ලද්දේ වෙයි. **පොරොහච්චෙන** පුරෝහිත කර්මයෙන්, මෙසේ බ්‍රාහ්මණ ධර්මයෙන්ද ලෝක ව්‍යවහාරයෙන්ද ආජීව ශීලාචාරයන්ගෙන් පිටපැන්නහුගේ අබ්‍රාහ්මණ භාවය සෝදහැර මෙසේ ඇති තැනැත්තා ජාතියෙන් බ්‍රාහ්මණ නොවේ. ගුණයෙන්ම බ්‍රාහ්මණවේ. ඒනිසා කොතැනක හෝ කුලයක උපන්නේ ගුණවත් නම් හෝ බ්‍රාහ්මණයෙක්වේ. මේ මෙහි න්‍යායයැයි, මෙසේ න්‍යායය අර්ථ වශයෙන් ගොඩනගා දූන් එය වචීභේදයෙන් ප්‍රකාශ කරන්නේ **නචාහං බ්‍රාහ්මණං** ආදිය කීය. එහි අර්ථය මෙසේය : මම සතර යෝනීන් අතර යම් තැනක උපන්නේ එහිදීද විශේෂයෙන් බ්‍රාහ්මණයාට වර්ණනාකරන ලද මවුකුස හටගත්තේ එය මාතෘසම්භව යෝනියෙහි ඇතිවූවකි. යමක් දෙපසින් සුජාත වූ සේය ආදි ක්‍රමයෙන් බ්‍රාහ්මණයන් විසින් බ්‍රාහ්මණයාට පිරිසිදු උත්පත්ති සංඛ්‍යාත වූ යෝනියැයි කියන ලදී. **සංසුද්ධගහණිකො** මෙයින්ද ජාති සම්පත්තිය කියයි. එයින්ද ජාති සම්භව බැවින් **යොනිජො මත්ති සම්භවො** යැයි කියනු ලැබේ. එය යොනිජ මතතිසම්භව නම් මෙයින්ද යොනිජ මත්තිසම්භව මාත්‍රයෙන් බ්‍රාහ්මණයෙකැයි නොකියමි. කුමක් නිසාද යත් : යම් හෙයකින් පින්වත පින්වතැයි වචන මාත්‍රයෙන් අන් කරුණු වලින්ද විශේෂිත බැවින් ඔහු හෝවාදී නම් වෙයි. ඉදින් සකාරණ වේනම් පලිබෝධ සහිතනම් මොහු කිසියම් තැනක ඉපදුණත් රාගාදිකරුණු නැතිබැවින් අකිඤ්චනවේ. සර්වග්‍රාහ ප්‍රතික්ෂේපයෙන් ඇලීමක් නැත්තේ වේ. **අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං** යනු කුමක් නිසා කීවේද කුමක් නිසාදයත් පාපය බැහැරකරන ලද බැවින්, තවද **සබ්බ සඤ්ඤොජනං ඡෙත්වා** ආදී ගාථා විසිහතක් එහි **සබ්බසඤ්ඤොජනං** යනු සියලු දශවිධ සංයෝජන **න පරිතස්සති** තෘෂ්ණාවට බියෙන් නොතැවෙන්නේය. **සඞ්ගාතිගං** රාග බන්ධනාදිය ඉක්මවාගිය **විසඤ්ඤුත්තං** සියලු යෝනීන් ගෙන්. සියලු

කෙලෙසුන් ගෙන් හෝ වෙන්වූ, **නන්දිං** සතුරුබව **වරත්තං** තෘෂ්ණාව. **සන්දානං** යොතින් කළ මළපුඩුව දිට්ඨියෙන් නැගීසිටීම යන්නට සමාන වචනයකි. **සහනුක්කමං** අනුකකම යැයි කියන්නේ මළපුඩු වෙහි බැදෙන ගැටයයි. දිට්ඨානුසය යන්නට නමකි. **උක්ඛිත්ත පලිඝං** මෙහි පලිඝයනු අවිද්‍යාවයි. **බුද්ධං** චතුස්සත්‍ය බුද්ධ **තිතික්ඛති** ඉවසයි. **ඛන්තිබලං** ඉවසීමේ ක්ෂාන්ති බලය එය වරක් ඉපදුණද බල ඇත්තේ නොවේ. නැවත නැවත ඉපදුණ විට ඇතිවේ. එය ඇතිබැවින් බලානීක නම් වත **වත්තං** ධුතාංහ ඇති **සීලවන්තං** ගුණඇති **අනුස්සදං** යනු රාගආදී උස්සද විරහිත **අනුස්සුතං** යනුවෙන්ද පාඨයක් ඇත. නොවැගිරුණු යන අර්ථයි. **දන්තං** දැමුණු, **නලිප්පති** නොඇලේ. **කාමෙසු** ක්ලේශකාම වස්තු කාමයන්හි. දුක දනී. මෙහිම ක්ෂයද එහිම අර්හත් ඵලයද දුක් ක්ෂයවීමද අදහස් කරන ලදී. **පජානාති** අධිගම වශයෙන් දනී. **පන්නභාරං** බිමතැබූ බර, ස්කන්ධ ක්ලේශ අභිසංස්කාර කාමගුණ නමැති බර බිමතබා සිටි වෙන්වූ පදය මෙහි කියන ලද අර්ථ ඇත්තේමය. **ගම්භීරපඤ්ඤං** ගැඹුරු අරමුණුවල පැවති ප්‍රඥා ඇති **මෙධාවී** ප්‍රකෘති ප්‍රඥාවෙන් යුත් අනාගාරෙහි චූභයං අනාගාරිකයන් ගෙන්ද වෙන්වූ මේ දෙකින්ම වෙන්වීය යන අර්ථයි. **අනොකසාරිං** ඔකයනු පංචකාම ගුණ යන්හි ආලයයි. එහි නොඇලෙමින් යන අර්ථයි. **අප්පිච්ඡං** නොකැමති **තසෙසු** තෘෂ්ණ සහිත වූවත් කෙරෙහි **ථාවරෙසු** තෘෂ්ණා නැත්තවුන් කෙරෙහි, **අත්තදණ්ඩෙසු** ගත්දඬු ඇත්තවුන් කෙරෙහි **නිබ්බුතං** ක්ලේශ නිර්වාණයෙන් නිවුණු **සාදානෙසු** උපාදන සහිතයන් කෙරෙහි **ඔහිතො** වැටුණේ **අකක්කසං** නිර්දේශීවූ දෙස්සහිතවු රැකද සකක්කස යැයි කියනු ලැබේ. **විඤ්ඤාපනියං** අර්ථ දන්වන සුලු පිසුණ නොවූ **සච්චං** අවිසංවාදිකවූ **උදීරයෙ** කියයි. **යාය නාභිසජ්ජෙ** යම් වචනයකින් අනුන්ට අලංකරණයක් හෝ බාධාවක් නොකරයි. එබඳු පරුෂනොවූ වචන කියයි යන අර්ථයි **දීඝං** නුලෙන් බැඳි බඩු **රස්සං** විසිරී ගියබඩු **අණුං** කුඩා **ථූලං** මහත්වූ **සුභාසුභං** සුන්දර අසුන්දර **දීඝභණ්ඩ** වටිනාකමින් අඩුද මහාර්ය වූද බඩු රස්ස ආදියෙහිද මෙම ක්‍රමයයි. මෙසේ පෙමණකින් සියල්ල අවසන් නොකරන ලද්දේය. **සුභාසුභං** මෙයින් අවසන් කරන ලදදේ වෙයි. **නිරාසයං** තෘෂ්ණානැති. **ආලයා** තෘෂ්ණා ආලය **අඤ්ඤාය** දැන **අමතොගධං** අමෘතය අභ්‍යන්තරය **අනුප්පත්තං** නොපිවිසියේය. **උභොසඞ්ගං** මේ ඇලීම් දෙක පින ස්වර්ගයෙහි ලග්ගවයි. පාපය අපායෙහි ලග්ගවයි. මේ ඇලීම්

දෙකමයයි කියන ලදී. උපච්චගා අතීත අනාවිලං කැලඹීම් ඇති කරන කෙලෙස් රහිත නන්දීභවපරික්ඛීණං ක්ෂයවී ගිය ආශාව. ක්ෂයවීගිය භවය ඇත්තේ යොඉමං යන ගාථාවෙන් අවිද්‍යාවෙහි විසංවාදක අර්ථයෙන් බාධකයකි. ගමන් කිරීමට නොහැකි බැවින් දුග්ගං සංසරනඅර්ථයෙන් සංසාරො මෝහනය කරන අර්ථයෙන් මොහො යයි කියන ලදී. තිණ්ණො සතරඕඝයන් තරණය කළ පාරගතො නිවනට ගිය ඣායී ආරම්මණ ලක්ඛණ උපනිජ්ඣාන වශයෙන් ධ්‍යාන ඇති. අනෙජො තෘෂ්ණාව නැති අනුපාදය නිබ්බුතො කිසිදු ග්‍රහණයක් නොගෙන සියලු ක්ලේශ නිර්වාණයෙන් නිවුණු කාමෙ දෙවැදෑරුම් කාමය. අනාගාරො අගාරයක් නැතිව පරිබ්බජෙ ගිහිගෙන් නික්මෙයි. කාමභව පරික්ඛීණං ක්ෂීණවූ කාම ඇත්තේ ක්ෂීණවූ භව ඇත්තේ මානුසකංයොගං මානුෂපංච කාම ගුණ යෝගය. දිබ්බංයොගං දිව්‍යමය පංචකාම ගුන යෝගය සබ්බයොග විසං යුත්තං සියලු කෙලෙස් යෝගයන් ගෙන් මිදුණු රතිං පඤ්චකාම ගුණයෙහි ඇල්ම. අරතිං කුසලභාවනාවෙහි කලකිරුණු වීරං වීර්යවත්, සුගතං සොඳුරුතැනට ගිය. සොඳුරු පැවැත්මට ගිය ගතිං නිෂ්පත්තිය පුරෙ අතීතයෙහි පච්ඡා අනාගතයෙහි මජ්ඣෙ වර්තමානයෙහි කිඤ්චනං කිසිවක් කරන ක්ලේශය මහෙසිං මහත් ගුණයන් සොයන අර්ථයෙන් මහෙසිං විජිතාවිනං ජයග්‍රහණය විජය ඇති, මෙසේ භාග්‍යවතුන් වහන්සේ ගුණයෙන් ක්ෂීණාශ්‍රවයකුවූ බ්‍රාහ්මණයා දක්වා, යමෙක් ජාතියෙන් බ්‍රාහ්මණයෙකැයි ඇතුළත් කරත්ද ඔවුහු මෙය නොදන ඔවුන්ගේ ඒ දෘෂ්ටිය වැරදි දෘෂ්ටියකැයි දක්වන්නේ සමඤ්ඤාහෙසා යන ගාථාදෙක කීය. එහි අර්ථයනම් යම් හෙයකින් බ්‍රාහ්මණ යැයි. ක්ෂත්‍රියයාය. භාරද්වාජය වාසෙට්ඨයැයි නාමගෝත්‍ර සකස්කරන ලද්දේය. අභිසංස්කාර කරන ලද්දේය. මෙය සාමාන්‍යයෙන් ලෝකයෙහි ව්‍යවහාර මාත්‍රයකි යන අර්ථයි. කුමක් හෙයින්දයත් : යම හෙයකින් එක්ව පැමිණීම හොඳින් දන ආයේය. මෙසේ ඒ ඒ තැන උපන් කල්හීම ඔහුගේ ඥාති සොලොහිතයන් විසින් සකස් කරන ලද්දේය. නැතහොත් මෙසේ ඔහු සකස් කරන්නෝය කිසිවෙක් කිසිවක් නොදක මොහු බ්‍රාහ්මණයෙක. භාරද්වාජයෙකැයි දනගන්නේද, මෙසේ ඔහු සකස් කරන ලද්දේය. බොහෝ කලක් නිසලව පැවති දෘෂ්ටිගතය නොදන සකස් කරන ලද නාම ගෝත්‍රය. නාමගෝත්‍ර මාත්‍රයක් පමණකැයි ව්‍යවහාරය පිණිස සකස්කරන ලද්දකැයි නොදන්නා සත්වයන්ගේ හදවතෙහි නිසලව

පැවති දෘෂ්ටිගතයකි. එය නිහඬව පැවති බැවින් ඒ නාම ගෝත්‍රය නොදන්නාහු ජාතියෙන් බ්‍රාහ්මණයෙක් වේයයි නොකියත්. නොදන්නාහුම මෙසේ කියතියි කියන ලද්දේ වෙයි.

මෙසේ යමෙක් ජාතියෙන් බ්‍රාහ්මණයෙකැයි ඇතුළත් කිරීමක් කරත්ද, ඔවුහු මෙය ව්‍යවහාර මාත්‍රයක්යැයි නොදන්නාහු ඔවුන්ගේ ඒ දෘෂ්ටිය වැරදි දෘෂ්ටියකැයි දක්වා දූන් පිළිවෙළක් නැතිව ජාතිවාදය ප්‍රතික්ෂේප කරන්නේ කර්මවාදයද ප්‍රතිස්ථාපනය කරන්නේ නජච්චා ආදිය කීය එහි කම්මනා යනු ගාථා අර්ථය විස්තර කිරීම සඳහා කස්සකො කම්මනා ආදිය කියන ලදී. එහි කම්මනා යනු වර්තමානයෙහි කෘෂි කර්ම ආදිය නිපදවන චේතනා කර්මයෙන් පටිච්චසමුප්පාද දසා යැයි මේ කරුණින් මෙසේ වේයැයි මෙසේ පටිච්චසමුප්පදය දක්වන්නෝ කම්මවිපාක කොවිද සම්මාන අවමාන කළයුතු කුලයෙහි කර්ම වශයෙන් උත්පත්තිය වෙයි. වෙනත් හීන ප්‍රණීතතාවක් වේද හීනප්‍රණීත කර්මයන් විපාකදෙන කල්හි වෙතියි මෙසේ කර්ම විපාක දැක්වීමෙහි දක්ෂ, කම්මනා වත්තති යන ගාථාවෙන් ලෝකය කියාද. ප්‍රජාවකියාද, සත්වයා කියාද එකම අර්ථය වචන මාත්‍රයෙහි බෙදීමයි. මෙහි පෙර පදයෙන් බ්‍රහ්මයෙක් ඇත. ශ්‍රේෂ්ඨ මැවුම්කරු මහාබ්‍රහ්මයායයි දෘෂ්ටියෙහි ප්‍රතිෂේධය දතයුතුය. කර්මයෙන් එසේ ගතීන්හි ලෝකය පවතී. එයට මැවුම්කරු කවරෙක්ද? දෙවැනි පදයෙන් මෙසේ කර්මයෙන් නිපන්නේද පවතියි. අතීත වර්තමාන භේදයෙන් කර්මයෙන් පවතී සුවදුක් අනුභව කරන්නේ හීන ප්‍රණීත ආදී භේදයටද පැමිණෙන්නේ පවතීයයි දක්වයි. තෙවැන්නෙන් එම අර්ථයම නිගමනය කෙරේ. මෙසේ සෑම අයුරින්ම සත්වයෝ බන්ධනයෙන් හෝ කර්මයෙන් බැඳුණාහු වී පවතිත් අන් අයුරකින් නොවෙත්. සිව්වැන්නෙන් ඒ අර්ථය උපමාවකින් පැහැදිලි කෙරේ. යම්සේ රථස්ස යායතො ආණීති බන්ධනං ගමන් ගන්නාවූ රථයෙහි ආණී යනුවෙන් බන්ධනයක් වෙයි. එයින් නොබැඳුණහොත් නොයයි. මෙසේ ලෝකයෙහි උපන්නහුගෙන්ද පවත්නහුගෙන්ද කර්ම බැදීමක් ඇත. එයින් නොබැඳුණේ නූපදියි නොපවතියි. දූන් මෙසේ ලෝකය කර්මයෙන් බැඳුණේ යමක් නිසාද ඒනිසා ශ්‍රේෂ්ඨ වූ කර්මයෙන් ශ්‍රේෂ්ඨ බව දක්වන්නේ තපෙන යන ගාථාදෙක කීය. එහි තපෙන ධුතාංග තපසින් බ්‍රහ්මචරියෙන මෛථුන විරතියෙන්,

සංයමෙන ශීලයෙන්, දමෙන ඉන්ද්‍රිය දමනයෙන් එතෙන මේ ශ්‍රේෂ්ඨවූ පරිශුද්ධ වූ උතුම්වූ කර්මයෙන් බ්‍රාහ්මණයෙක් වෙයි. කුමක් හෙයින්ද යත් මේ උතුම්වූ බමුණා මෙසේ කර්මය උත්තම බ්‍රාහ්මණගුණයෙකැයි කියන ලද්දේවෙයි. බ්‍රහ්මානං යනුවෙන්ද පාඨයක් ඇත. මේ මෙහි වචනාර්ථයයි. බ්‍රහ්මයා ඉක්මවා නොයති, බ්‍රහ්මයාගේ බ්‍රාහ්මණ භාවය උසුළාතුයි කියන ලද්දේ වෙයි. දෙවැනි ගාථාවෙන් සනෙතා සත්කෙලෙස් බ්‍රහමා සකෙකා බ්‍රහ්මයාද ශක්‍රයාද යමෙක් මෙබඳු ද හේ හුදෙක් බ්‍රාහ්මණයෙක්ම නොව බ්‍රහ්මයාද ශක්‍රයාද නොවෙත්. හෙතෙමේ දන්නාවූ නුවණැත්තන්ට වාසෙටඨ මෙසේයයි දැනගනුවයි කියන ලද්දේ වෙයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

අට වැනි වාසෙටඨ සූත්‍රයයි.

## 2.5.9

**එවමෙමසුතං** යනු සුභ සූත්‍රයයි. එහි **තොදෙය්‍යපුතෙතා** යනු තුදි ගම්වැසි තොදෙය්‍ය බ්‍රාහ්මණයාගේ පුත්‍රයාය. **ආරාධකො හොති** සම්පාදකයෙක්ද පරිපූරකයෙක්ද වෙයි. **ඤායං ධමමං** කාරණය ධර්මය **කුසලං** නිවැරදි **මිචඡාපටිපතතිං** අනෛර්යානික අකුසල ප්‍රතිපදාව **සමමා පටිපතතිං** නෛර්යානික කුසල ප්‍රතිපදාව **මහටඨං** ආදී තන්හි බොහෝ වතාවත් කරන්නවුන් විසින් හෝ උපකරණ වලින් හෝ අර්ථයක් මෙහි ඇත්නුය **මහටඨං** මහත් වූ නම් තැබීම් මගුල් ආදී කටයුතු මෙහි ඇත්නුයි **මහාකිඩඩං** මෙය අද කළයුතුය. මෙය හෙට කළයුතුයයි මෙසේ මහත් වූ නියම කිරීම් සංඛ්‍යාත අධිකරණ මෙහි ඇත්නුයි **මහාධිකරණං** බොහෝ දෙනකුගේ කාර්ය යන්හි යෙදවීම් වශයෙන් පීඩා සංඛ්‍යාත කාර්ය මෙහි ඇත්නුයි **මහාසමාරමභං** **ඝරාවාස කම්මටඨානං** යනු ගෘහවාස කටයුතු මෙසේ සියලු වාරයන්හි අර්ථය දතයුතුය. මෙහි කෘෂිකර්මයෙහි නගුල්හිස් ආදි කොට ඇති උපකරණ සෙවීම් වශයෙන් මහත්බව වෙළඳාම සඳහා තිබුණු අයුරින්ම භාණ්ඩ ගෙන පරිවර්තන වශයෙන් අල්පස්ථ බව දත යුතුය. **විපජජමානං** වැසිනැතිකල සහ වැඩිවැසි ඇතිකල කෘෂිකර්මයද, මැණික් රන් ආදීයෙහි අදක්ෂකම් ආදියෙන්ද වාණිජ්‍ය කර්මය අල්ප ඵල ඇතිවෙයි.

මුදල් නාස්තියටද පත්වෙයි. වෙනස් කිරීම් වලින් චූල්ල අන්තේවාසිකයට මෙන් උපදින මහත්ඵල එවමෙව බො යම්සේ කෘෂිකර්මය අසාර්ථක වනවිට අල්ප ඵල වේද, එසේම ගෘහවාස කර්මය අල්පඵල ඇත්තේ වෙයි. යහපත් දෙයක් නොකරන ලද තැනැත්තේ කලුරිය කොට නිරයෙහි උපදියි.

මහා දත්ත සේනාපති නමැත්තා බ්‍රාහ්මණ භක්තිකයෙක් විය. ඔහු මියයන අවස්ථාවෙහි නිරය එළඹ සිටියේය. හෙතෙමේ බ්‍රාහ්මණයන් විසින් කුමක් බලාදැයි විචාරන ලද්දේ ලේගෙයක් යැයි කීය. පින්වත ඒ බ්‍රහ්ම ලෝකයයි. පින්වත බ්‍රහ්ම ලෝකය කොහිද උඩය, මට යට එළඹ සිටියේය. සමහර ඒවා යටින් එළඹසිටී. සමහර ඒවා උඩින් උඩින්යයි කලුරිය කොට නිරයෙහි උපන්නේය. මෙයින් අපගේ යාගයෙහි දෝෂයක් දෙනලද්දේයයි දහසක්දී ඉවත් කිරීමට දුන්හ. ඇතිවන ඵලය මහත්ය. කරන ලද යහපත් කටයුතු ඇත්තේ කලුරිය කොට ස්වර්ගයෙහි උපදී. සියල්ල ගුත්තිල විමාන කථාවෙන් දැක්විය යුතුය. යම්සේ වාණිජ්‍ය කර්මය වෙනස් වන විට අල්පඵල ඇත්තේ වේද එසේම සීලය සම්පූර්ණ නොකරන්නාවූ නොහොබිනා දෙයෙහි යුක්ත පුද්ගලයාට පැවිදි කිසද මෙබදුම වේ. ධ්‍යානාදී සැප හෝ ස්වර්ගමෝක්ෂ සම්පත් හෝ නො ලැබෙයි. ඇතිවන ඵලය මහත්ය. සිල් පුරා විදර්ශනා වඩන්නේ රහත්බවටද පැමිණෙයි. බ්‍රාහ්මණ හො ගොතම මෙහිදී කුමක් අසන්නෙම්දැයි අසයි. බමුණෝ මෙසේ කියති. පැවිද්දා මේ පංච ධර්ම පුරන්ට සමර්ථ නොවේ. ගිහියාද පුරයි. ශ්‍රමණ ගෞතම තෙමේ මාණවය මම ගිහියාගේද පැවිද්දාගේද වෙමියි පුන පුනා කියයි. පැවිද්දා පමණක් නොම්දෙයි. මා ඇසුවිට නොසලකතියි හඟිමියි සිතා ගැල් මාතෘකාවෙන් අසමියි අසයි. සචෙතෙ අගරු ඉදින් ඔබට බමුණන් පනවන්නාක් මෙන් මෙහිදී කථාකිරීම බරක් නොවේද, කිසියම් අපහසුවක් නොවේද එසේ කියනු මැනවි යන අර්ථයි. නබොමෙ හොති කුමක් සඳහා කීවේද? පණ්ඩිත ප්‍රතිරූපකයන් ඉදිරියෙහි කථාකිරීම දුකක් වෙයි. ඔවුහු පදයක් පදයක් පාසා අකුරක් අකුරක් පාසා දොස්ම කියති. නියම පණ්ඩිතයෝ කථාව අසාසිට හොඳින් කියූ දෙය පවසති. වැරදි ලෙස කියූවිට පාළිපද අර්ථ ව්‍යඤ්ජන යන්හි යම්යම් දෙයකට විරුද්ධ වේද ඒ ඒ දෙය පැහැදිලිකර දෙති. භාග්‍යවතුන් වහන්සේ සමාන නියම පණ්ඩිතයෙක් නම් නැත. එහෙයින් කීය. නබොවෙ හො ගොතම ගරු යත්‍රාසසු භවනෙතා වා නිසිනතා භවනත රූපවා යනුවෙන්.

සච්චං වචීසත්‍යය. තපං තපස් චර්යාව, බ්‍රහ්මචරියං මෛථුන විරතිය, අජ්ඣෙනං මන්ත්‍ර ඉගෙනීම චාගං ආමිෂ පරිත්‍යාගය පාපිතො භවිස්සති නොදනුවත් කම පාපියාගෙන් වන්නේය. එතදවොච භාග්‍යවතුන් වහන්සේ විසින් කණවැල් උපමාවෙන් නිග්‍රහ කරනු ලැබූ එය නැවත ගෙන ඒමට නොහැකිවන්නේ, දුර්වල සුනඛයකු මුවා ඩැහැගෙන ස්වාමියාගේ ඉදිරියෙහි තබා තමා ඉවත් වන්නාක් මෙන් ගුරුවරයා ගැන සඳහන් කරන්නේ බමුණා මෙසේයැයි ආදීවචන කීය.

එහි පොක්ඛරසාතී යනු ඔහුගේ නමයි. පොක්ඛරසාදී යයිද කියනු ලැබේ. ඔහුගේ සිරුර සුදු නෙළුම් මලක් වැන්න. දෙව්නුවර එසවූ රිදී තොරණක් මෙන් හොබී ඔහුගේ හිසකාළවර්ණය. ඉඳුනිල් මැණිකක් හා සමානය. රැවුල සඳමඬලෙහි කලුවලා කඩක් මෙන් පෙනේ. දැස් නිලුපුල් මෙනි. නාසය රිදී බටයක් මෙන් වටකුරුය පිරිසිදුය. අතුල් පතුල් ද මුහුණද ලා රසයෙන් පිරියම් කළාක් මෙන් හොබී. අතිශයින් සෞභාග්‍යයට පත් බමුණාගේ ආත්මභාවය රජු නැතිතැන රජ කරන්ට සුදුසුවූ මේ බමුණා මෙසේ සශ්‍රීකය. මෙසේ ඔහු නෙළුමක් හා සමාන බැවින් පොකබරසාදී යයි හඳුන්වති. ඔහු උපන්නේ නෙළුමක බැවින්ද මවුකුස නොවන බැවින්ද මෙසේ ඔහු නෙළුමක නිදාසිටිබැවින් පොකබරසාදී කියාද හඳුන්වති. ඔපමඤ්ඤො උපමන්‍යු ගෝත්‍ර ඇත්තේ. සුභගවනිකො උක්කට්ඨා නුවර සුභග වනයෙහි අධිපති හසසකංයෙව සිනාසිය යුත්තක් නාමකං යෙව ළාමක වූද, එය අර්ථයක් නැතිබැවින් හිස් බැවින් හිස් ද නිශා කටයුතුද වෙයි. දැන් භාග්‍යවතුන් වහන්සේ ඔහුට ගුරුවරයාට සමගම නිග්‍රහ කරනු පිණිස කිංපන මාණව ආදිය කීසේක එහි කතමා නෙසං සෙය්‍යො ඔවුන් කවර වචනයක් යෝග්‍යද, තවමත් වඩා උතුම්ය යන අර්ථයි. සමුච්චා සම්මුතියෙන් ලෝක ව්‍යවහාරයෙන් මනතා තුලනය කොට පරීක්ෂා කොට, පටි සංඛාය දැන, අත්‍ථසංහිතං කාරණාසහිත, එවං සනෙත ලෝක ව්‍යවහාරය නොමුදා තුලනය කොට දැන කරුණු සහිත කොට කියුදෙයෙහි සුදුසුබව ඇතිකල්හි, ආවුතො අවාරණය කරන ලද නිවුතො නිවාරණය කරන ලද ඔවුතො වැසුණු පරියොනද්ධා වෙළන ලද, ගපීතො ආදිය කියන ලද අර්ථ ඇත්තේමය සචෙතං භොගොතම ධානං ඉදින් කරුණක් ඇත්නම් සවාසස දුම් අළු ආදියක් නැති බැවින් එය වෙයි. ගිනිදැල්ලක්

මෙන්ද වර්ණ ඇත්තේද ප්‍රභාස්වර ද වේ. තදූපමාහං මාණව ඒහා සමාන මම; මෙය කියනලද්දේ වෙයි. තණ දර ආදි ද්‍රව්‍ය නිසා දැල්වෙන ගින්න දුම් අළු අඟුරු ඇති බැවින් දොස් සහිත වන්නාක් මෙන් පංචකාම ගුණයන් නිසා උපන් ප්‍රීතිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශෝකය ආදිය ඇතිබැවින් දොස් සහිතය. යම්සේ තණ දර ආදී ද්‍රව්‍ය නැතිවිට දුම් ආදිය නැති බැවින් පිරිසිදු වේද, එසේම ලෝකෝත්තර ධ්‍යාන දෙකින් යුතු ප්‍රීතිය ජාති ආදිය නැති බැවින් පිරිසිදුය යන අර්ථයි. බමුණන් විසින් ත්‍යාගය යටතේ සංග්‍රහකරන ලද පංච ධර්මයක් පනවන ලද්දාහුද ඒවාද පසක්ම වී නිශ්චලව නොපවතීද අනුකම්පා ස්වභාවය සමග පැමිණෙයි. ඒනිසා එහි දොස් දක්වන්ට **යෙතෙමාණවා** ආදිය කීහ. එහි **අනුකමපාජාතිකෙන** යනු අනුකම්පා ස්වභාවයයි.

එහි **බහුලං සමනුපසසී** භාග්‍යවතුන් වහන්සේ මේ පැවිද්දා මේ පස් දහම සම්පූර්ණ කිරීමට අසමර්ථ නම් ගිහියා සම්පූර්ණ කරයි දැයි ඇසූසේක. ඒනිසා පැවිදිවූ තැනැත්තේම මෙසේ දහම් සම්පූර්ණ කරයිනම් ගිහියා සම්පූර්ණ කිරීමට සමර්ථ නොවේ යයි ඒ කටින්ම කියවන්ට විමසන සේක. **නසතතං සමිතං සචචවාදී** ආදී තන්හි ගිහියා වෙනත් දෙයක් නැතිකල්හි පලපුරුදු මුසාවාදයම කෙරේමය. පැවිද්දෝ අසිපතින් ගෙලා සිඳින කල්හිත් කථා දෙකක් නොකියති. ගිහියාද තුන්මසක් වත් සිල් පදයක් රකින්ට නොහැක්කේය. පැවිද්දෝ දිවි ඇතිතෙක් බ්‍රහ්මචාරීහු වෙති. ගිහියා රතන සූත්‍රය මංගල සූත්‍රයක් පමණක්ම පොතක ලියා තබයි. පැවිද්දෝ එය සජ්ඣායනා කරති. ගිහියා සලාක බතවත් නොකඩ කොට දෙන්ට අසමත්ය. පැවිද්දෝ අන් දෙයක් නැතිකල්හි බලුකපුටු ආදීන්ට බත්පිඩක්වත් දෙති. භාණ්ඩ ගෙන යන දරුවාගේ පතෙහි වුවද තබත්මය. මෙසේ අර්ථය දතයුතුය. **චිතතසසානං** එතෙ මම මේ පස් දහම් මෛත්‍රී සිතෙහි පිරිවර ලෙස කියමි. යන අර්ථයි.

ජාතවදෙධා උපන්නේද වැඩුණේද, යමෙක් තනිව එහි ඉපිදී වෙනත් තැනක වැඩුණේවෙයි. ඔහු හාත්පස ගමේ මාර්ග සියල්ල ප්‍රත්‍යක්ෂ නොවේ. ඒ නිසා ජාතවද්ධ යනුවෙන් ජාත වෘද්ධයා වනාහි යමෙක් ගමින් ගොස් බොහෝකල් නම් ඔහුට සියල්ල ප්‍රකට නොවේ. ඒනිසා තාවදෙව අවසටං

ආදීය කීහ. ඒ ක්ෂණයෙහි නික්මීගිය යන අර්ථයි. අන්ධායිතත්තං මේකද මාර්ගය මේකද මාර්ගය යනුවෙන් සැකයෙන් පමාවන බව, විත්ථායිතත්තං යම්සේ සියුම් අර්ථ ඇතිදෙයක් වහා අසනු ලබුවහුගේ සිරුර තදබවක් ගනීද මෙසේ තදබව ගැනීමයි. නත්වෙව මෙයින් සර්වඥ බවෙහි අප්‍රතිහත භාවය දක්වයි. ඒනිසා ඒපුරුෂයාගේ මාරාවේශන වශයෙන් ඥාන පටිඝාතය වන්නේය. එයින් ඔහු පමාවන්නේය හෝ තදවන්නේය. සර්වඥතා ඥානය අප්‍රතිහතය. කිසිවකු විසින් එයට අනතුරක් සිදු කිරීමට නොහැකියයි දක්වයි. සෙය්‍යථාපි මාණව බලවා සඞ්ඛධමො එහි බලවා යනු බලසම්පන්න, සංඛධමො සක්පිඹින්නෙක්, අප්පකසිරෙන කරදරයකින් තොරව, අපහසුවකින් තොරව, දුර්වල සක් පිඹින්නා සක පිඹින්නේද සතර දිශාව ශබ්දයෙන් දන්වන්ට නොහැකිය. ඔහුගේ සක්හඬ සර්වාකාරයෙන් පැතිරී නොයයි. ශක්තිමත් සක් පිඹින්නාගේ සක්හඬ පැතිරී යන්නේවෙයි. ඒනිසා බලවා යයි කීහ. මෙත්තාය චෙතො විමුත්තිය මෙහි මෙත්තාය යනුවෙන් කීකල්හි උපචාරයද අර්පණාවද වැටෙයි. යං පමාණකතං කම්මං ප්‍රමාණීක කර්මය නම් කාමාවචරයයි කියනු ලැබේ. අප්‍රමාණී කෘත කර්මය නම් රූපාවචරයි. සෙස්සෙහිද මෙහි බ්‍රහ්මවිහාර කර්මයම අදහස් කරන ලදී. එය ප්‍රමාණය ඉක්මවා ඔදිස්සක - විශේෂ හා අනොදිස්සක - සාමාන්‍ය දිසා වරණ දිශාවන්හි පැතිරීම් වශයෙන් වඩා කරන ලද බැවින් අප්‍රමාණකයයි කියනු ලැබේ. නතං තත්‍රාවසිස්සති න තත්‍රාවතිට්ඨති ඒ කාමාවචර කර්මය එම රූපාවචර කර්මයෙහි අත් නොහැරේ. නොසිටී. මින් කුමක් කියන ලද්දේද: ඒ කාමාවචර කර්මය ඒ රූපාවචර කර්මය අතර ලැගීමට හෝ සිටීමට හෝ රූපාවචර කර්මය පුරා පැතිරී වසාගෙන තමාට අවකාශයක් ලබාගෙන බිහිවීමට නොහැකිය. ඉක්බිති රූපාවචර අරූපාවචර අතර හැසිරෙන කර්මයම කාමාවචරය මහාදිය කඳක් මෙන් සුළුප්‍රමාණයක ජලයෙහි පැතිර වසාගෙන තමාම අවකාශයක් ලබාගෙන සිටී. එහි විපාකය ඉවත් කොට තමාම බ්‍රහ්මයන්ගේ සහ වාසයට පමුණුවයි. සෙස්ස සියලු තැන නොගැඹුරුමය.

### නවවැනි සුභ සූත්‍රයයි

## 2.5.10

එවමෙමසුතං යනු සඞ්ගාරව සූත්‍රයයි. එහි මණ්ඩල කප්පෙ යනු එනම් ඇති කුඩාගමෙහි අභිප්පසන්නා නොසැලෙන ප්‍රසාද වශයෙන් පහන්වූ අවනාහි භාරද්වාජ ගෝත්‍රයෙහි බ්‍රාහ්මණයාගේ බිරියවූ සෝවාන්වූ ආර්ය ශ්‍රාවිකාවකි. ඒ බ්‍රාහ්මණයා පෙරදී කලින්කල බමුණන්ට ආරාධනා කොට ඔවුන්ට සත්කාර කරයි. මේ බැමිණිය ගෙදරට ගෙනවුත්, මහකුලයක රූමත් බැමිණියගේ සිත් කෝපගන්වන්ට නොහැකි වන්නේ බමුණන්ට සත්කාර කිරීමට නොහැකි විය. ඉකිබිති බමුණෝ දුටුදුටු තැන තී දූන් බ්‍රාහ්මණ ලබ්ධිකු තැනැත්තියක් නොවෙහිය. එක් දවසක් වත් බමුණන්ට සත්කාර නොකරන්නෙහියයි පීඩා ඇතිකරත්. හෙතෙමේ ගෙට අවුත් බැමිණියට ඒ බව දන්වා ඉදින් පින්වතිය එක් දවසක් කට රැකගන්ට හැකි වන්නීනම් බමුණන්ට එක් දවසක් භික්ෂාව දෙන්නෙමියි කීය. බමුණ, ඔබගේ දානය ඔබ කැමති තැනකට දෙන්න. මට මෙයින් වැඩක් නැතැයි කීවාය. හේ බමුණන් අමතා දිය අඩුවෙන් කිරිබත් පිසවා ගෙය අතුගා අසුන් පනවා බමුණා හිඳවීය. බැමිණිය මහසළුවක් හැඳ හැන්ද ගෙන වළඳවන්නී රෙදි කොනක පැටලී බමුණන් වළඳවමි යන හැඟීමක් නොකොට ආසේවන වශයෙන් ශාස්තෲන් වහන්සේම සිහිකොට උදන් ඇනුවාය. බමුණෝ උදානය අසා මේ බමුණා දෙපැත්තම ගත්තෙකි. ශ්‍රමණ ගෞතමයන්ගේ මිතුරෙකි. මොහුගේ දානය නොගන්නෙමුයි කෝපවුවාහු බොජුන් ඉවත දමා නික්මගියහ. බමුණා, මම පළමු කොටම මැයව අදටවත් කට රැකගන්නැයි කීවා නේද, මෙපමණක් කිරිත් සහලුත් විනාශ කළායැයි අතිශයින් කෝප වසඟයට පැමිණියේ. මේ වසලියට, අතන මෙතන මුඩු මහණාගේ ගුණ කියයි. දූන් මම මේ වසලිය ඒ ශාස්තෲගේ වාදය පටවන්නෙමියි කීය. ඉක්බිති බැමිණිය, යට බමුණ ගොස් ම දූන ගන්නෙහි යයි කියා, බමුණ මම දෙවියන් සහිත ලෝකයෙහි - පෙ - වාදාරෝපණය කළහැක්කෙක් නොදකිමි. හේ ශාස්තෲන් වහන්සේ කරා එළඹ

**කිංසු ඣත්වා සුඛං සෙති - කිංසු ඣත්වා න සොචති**
**කිස්සස්ස එක ධම්මස්ස - වධං රොචෙසි ගොතම**

ගෞතමයිනි,
කුමක් නසා සැපසේ හොවීද,
කුමක්නසා සෝක නොකෙරේද
කවර එක් කරුණක
නැසුම ඔබ රුචි කෙරෙහිද?

ප්‍රශ්නයක් ඇසීය ශාස්තෲන් වහන්සේ

කොධං ඣත්වා සුඛං සෙති - කොධං ඣත්වා න සොචති
කොධසස විසමුලසස - මධුරගගසස බ්‍රාහමණ
වධං අරියා පසංසනති - තංහි ඣත්වා න සොචති.

කොව දවා හොවී සැපසේ
කොව දවා සෝක නොකෙරේ
බමුණ, මුල විස අග මිහිරි
ක්‍රෝධය,
නැසුම ආර්යයෝ පසසත්
එයම නසා සෝක නොකෙරේ.

පිළිතුරු කීසේක. හෙතෙමේ පැවිදිව රහත්බවට පැමිණියේය. ඔහුගේ කනිටු බෑයා අක්කොසක භාරද්වාජ නම්වේ. මාගේ බෑයා පැවිදි වූයේ යැයි අසා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ අක්‍රෝශ කර භාග්‍යවතුන් වහන්සේ විසින් හික්මවනු ලැබුයේ පැවිදිව රහ්බවට පැමිණියේය. ඔහුගේ අතින් කනිටු බෑයා අසුන්‍දරික භාරද්වාජ නම් හේතෙමේද භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ ආක්‍රෝශ කොට භාග්‍යවතුන් වහන්සේ විසින් හික්මවනු ලැබුනේ පැවිදිව රහත් බවට පැමිණියේය. ඔහුගේ අතිත් කනිටු බෑයා පිඞ්ගලක භාරද්වාජ නම්. හෙතෙමේද භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ ප්‍රශ්නයක් අසා විසඳුම් අවසන පැවිදිව රහත්බවට පැමිණියේය. සඞගාරවො මානවො මේ ඔවුන් සියලු දෙනාට කනිටු බෑයාය. එදවස බමුණන් සමග එක් බත් හලක හුන්නේ අවභූතාව නොවැඩුණාහුය. අමංගලත් වුවාහුය. පරාභූතාව විනාශයට පත්වුවාහුය. විජ්ජමානානං ජීවත්වන්නවුන් අතර සිලපඤ්ඤානං ශීලයද ඥානයද නොදනී. දිට්ඨධම්මාභිඤ්ඤා වොසාන පාරමිප්පත්තා දිට්ඨ ධම්මෙ

මේ ආත්ම භාවයේදීම හොඳින් දැන වොසිතා අවසන් වී පාරමී සංඛ්‍යාත සියලු ධර්මයන්ගේ පරතෙරට ගියෙමු. නිර්වාණයට පැමිණියෙමුයි කියා ආදිබ්‍රහ්ම චර්යාව අනුම කරත් යන අර්ථයි. ආදිබ්‍රහම චරියං බ්‍රහ්මචර්යාවට මුල්වූවෝ උත්පාදකවූවෝ පියවරුවූවෝ පිළිගනිතියි කියන ලද්දේ වෙයි. **තක්කී** තර්ක ග්‍රාහී **වීමංසී** විමර්ශනය කරන්නා ප්‍රඥා හැසිරීම්හි හසුරුවා මෙසේ කියන, **තෙසාහමස්මි** ඒ සම්බුද්ධවරුන්ගේ මම එක්කෙනෙක් වෙමි. **අට්ඨිතවතා** අවශ්‍ය පදයෙහි ප්‍රධාන පදය සමග සත්පුරුෂපදය සමග මෙන් සම්බන්ධය.

මෙය කියන ලද්දේ වෙයි : භවත් ගෞතමයන්ගේ පැමිණි ප්‍රධාන පදයවිය සත්පුරුෂ ප්‍රධාන පදය විය.

**අත්ථිදෙවා** ථුටෙඨාසමානො යනු මේ මාණවකයා සම්මා සම්බුදු රජාණන් වහන්සේ නොදැක ප්‍රකාශ කළසේකැයි හැඟීමෙන් කීය. එවං සන්තෙ ඔබ නොදන්නා විට, **තුච්ඡං මුසාහොති** ඔබගේ කථාව ඵලරහිත නිෂ්ඵල වෙයි. මෙසේ මාණවකයා භාග්‍යවතුන් වහන්සේ මුසා වාදයෙන් නිග්‍රහ කරන්නේ නම්වේ. **විඤ්ඤුපුරිසෙන** නුවණැති මිනිසා විසින්, ඔබ නොදන්නාකම නිසා මා විසින් කියන ලද දෙයද නොදන්නෙහි යයි දක්වයි.

**උච්චෙව සම්මතං** උස් හඬින් සිතුදෙය මැනවින් ප්‍රකටය. **ලොකසම්මං අත්ථිදෙව** කුඩාදරුවෝද දෙවියෝ නම්වෙති. දෙවියෝනම්, දෙවියෝ නම් ලෝකයෙහි දේව, දේවී යන ලැබුනම් ඇති මනුෂ්‍යයන්ට අධික වූවෝය යන අර්ථයි.

දසවැනි සඞ්ගාරව සූත්‍රයයි
පස්වැනි වර්ගය නිමියේය.

**මේ අයුරින් පපඤ්චසූදනී නම්වූ මජ්ඣිමනිකාය අටුවාවෙහි**
**මජ්ඣිම පණ්ණාසක වර්ණනාව නිමියේය.**